# විදේශ කටයුතු අමාත්‍යාංශය
# ශ්‍රී ලංකාව

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# 2017

## විදේශ කටයුතු අමාත්‍යාංශය


| එටුන | පිටු අංක |
| --- | --- |
| 1. විදේශ කටයුතු අමාත්‍යාංශයේ මෙහෙවර, විෂයයන් සහ කාර්යයන් | 1 |
| 2. පෙරවදන | 3 - 6 |
| 3. අමාත්‍යාංශයේ සංවිධාන සටහන | 7 |
| 4. අංශවල ප්‍රගති වාර්තාව | |
| - අප්‍රිකා අංශය | 9 - 27 |
| - කොන්සියුලර් අංශය | 29 - 36 |
| - නැගෙනහිර ආසියා සහ පැසිෆික් අංශය | 37 - 94 |
| - ආර්ථික කටයුතු සහ වෙළෙඳ අංශය | 95 - 104 |
| - යුරෝපා සංගමය, බහු පාර්ශ්වීය ගිවිසුම් හා පොදු රාජ්‍ය මණ්ඩලීය අංශය | 105 - 113 |
| - මුදල් අංශය | 115 - 121 |
| - සාමාන්‍ය පාලන අංශය | 123 - 127 |
| - නීති අංශය | 129 - 135 |
| - මැද පෙරදිග සහ අප්‍රිකා අංශය | 137 - 164 |
| - සාගර කටයුතු ක්‍රමෝපායික ආරක්ෂාව හා දේශගුණික විපර්යාස පිළිබඳ අංශය | 165 175 |
| - විදේශ දූත මණ්ඩල පාලන අංශය | 177 - 185 |
| - විදේශගත ශ්‍රී ලාංකිකයන් පිළිබඳ අංශය | 187 - 191 |
| - ප්‍රතිපත්ති සැලසුම් අංශය | 193 - 196 |
| - සන්ධාන අංශය | 197 - 207 |
| - පොදු සන්නිවේදන අංශය | 209 - 212 |
| - දකුණු ආසියා සහ සාර්ක් අංශය | 213 - 229 |
| - එක්සත් ජාතීන්, බහු පාර්ශ්වික කටයුතු, මානව හිමිකම්, සම්මන්ත්‍රණ සහ සංහිඳියා අංශය | 231 - 240 |
| - ඇමෙරිකා එක්සත් ජනපද සහ කැනඩා අංශය | 241 - 242 |
| - බටහිර අංශය | 253 - 283 |
| 5. විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාල | 285 |
| 6. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින් එකතු කරන ලද ආදායම් -2017 | 287 - 290 |
| 7. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් සිදු කරන ලද කොන්සියුලර් කටයුතු - 2017 | 291 - 294 |

## දැක්ම

“ලොව සියලුම රටවල් සමඟ මිත්‍රශීලි සබඳතා පවත්වා ගනිමින් ජාත්‍යන්තර ප්‍රජාව තුළ වගකීම දරන රටක් බවට පත්වීම”

## මෙහෙවර ප්‍රකාශය

“ශ්‍රී ලංකා රජයේ විදේශ ප්‍රතිපත්තියට අනුකූලව ශ්‍රී ලාංකීය ජාතික අභිලාෂයන් ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීම, විදහා දැක්වීම, සුරක්ෂා කිරීම සහ ශ්‍රී ලාංකේය ජාතික අභිලාෂයන්ට අනුකූලව ජාත්‍යන්තර සබඳතා කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම”

## විදේශ කටයුතු අමාත්‍යාංශයේ විෂයයන් සහ කාර්යයන්

“විදේශ කටයුතු පිළිබඳ දේශපාලනික සැලසුම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,

විදේශ රටවලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම,

ජාත්‍යන්තර ගිවිසුම් සහ සම්මුතිවලට එළඹීම,

විදේශ රටවල ආණ්ඩු සහ ජාත්‍යන්තර සංවිධාන ශ්‍රී ලංකාවේ දී නියෝජනය කිරීම,

විදේශ රටවලදී සිදුකරන ප්‍රචාරණ කටයුතු,

රාජ්‍යතාන්ත්‍රික විනිර්මුක්තීන් හා වරප්‍රසාද සහ

කොන්සියුලර් කටයුතු”

## පෙරවදන

ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම පැවරී ඇති ආයතනය වන විදේශ කටයුතු අමාත්‍යාංශය ''කිසිවෙකුත් සමඟ සතුරු නොවී සියල්ලන් සමඟ මිතුරු වීම'' යන ඉතා වැදගත් වන විදේශ ප්‍රතිපත්තිය යටතේ දේශපාලන, ආර්ථික, සමාජයීය හා සංස්කෘතික පැතිකඩවල් මඟින් රටේ අභිලාෂයන් ප්‍රවර්ධනය කිරීම හා සුරක්ෂා කිරීම සඳහා අඛණ්ඩව කටුයතු කරයි. ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය, මානව හිමිකම්, නීතියේ ආධිපත්‍ය, සංහිඳියාව සහ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම උදෙසා සම්මුතිවාදී රජයේ ප්‍රතිපත්තිවලට අනුගත වෙමින්, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ප්‍රජාවේ වගකීම දරන සාමාජික රටක් වශයෙන් ඉදිරියට පැමිණාවීමටත්, ගෝලීය ප්‍රජාව අතර, මෙරටට හිමි වී ඇති ගරුත්වය හා තත්ත්වය ප්‍රයෝජනයට ගනිමින් ජනතාවට ප්‍රතිලාභ අත්කර දීමටත් ශ්‍රී ලංකාව නිරත වී ඇති ජාත්‍යන්තර කටයුතු පුළුල් කර තිබේ.

ඉහත සන්දර්භය තුළ, අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා හා ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා විසින් මුලපුරන ලද ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික කටයුතුවල ව්‍යාප්තිය, කලාපයේ පිහිටි බොහෝ රටවල් සමඟ අප පවත්වාගෙන යනු ලබන සබඳතා තර කිරීමෙහි මෙවලමක් වී තිබෙන අතර එමගින් අපගේ විදේශ සබඳතාවලදී නිශ්චිත හා යහපත් ප්‍රතිලාභ අත්කර දී තිබේ. අන්තර්ජාතික පාර්ශ්වකරුවන් සියල්ලම සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය හා යුරෝපා සංගමය වැනි සියලුම ජාත්‍යන්තර සංවිධාන සමඟ ශ්‍රී ලංකාව විවෘතභාවයෙන් හා විනිවිදභාවයෙන් යුතුව කටයුතු කිරීම තුළින් ශ්‍රී ලංකාව උනන්දුවක් දක්වන ක්ෂේත්‍ර රැසක ඉහළ සහයෝගිතා පාර්ශ්වකාරීත්වයක් ඇතිකර ගැනීමට හැකිවී තිබේ.

දකුණු ආසියාවේ අසල්වැසි රටවල් සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා පෝෂණය කිරීම සම්බන්ධයෙන් ඉහළ ප්‍රමුඛතාවක් ලබාදීමට ශ්‍රී ලංකාව අඛණ්ඩව කටයුතු කර ඇත. ඒ හේතු කොටගෙන, ඉහළම මට්ටමින් ක්‍රමවත් සබඳතා පවත්වා ගැනීමත් සමඟම ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර සබඳතාවල ඇතිවූ සුවිශේෂී වර්ධනය පුළුල් පරාසයක විහිද පවත්නා ක්ෂේත්‍ර රැසක සහයෝගිතාවයේ වර්ධනයට ද හේතු වී තිබේ. එමෙන්ම, පකිස්ථානය, බංග්ලාදේශය, නේපාලය, භූතානය, ඇෆ්ගනිස්ථානය හා මාලදිවයින යන රටවල් සමඟ අන්‍යොන්‍ය වශයෙන් සිදුකරන අන්තර්ජාතික කටයුතු වැඩිදියුණු වීම මගින් දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානයේ (SAARC) අප මිතුරු රටවල් සමඟ අන්‍යොන්‍ය විශ්වාසය ගොඩනගා ගැනීම හා උණුසුම් මිත්‍රත්වය යළි ශක්තිමත් කර ගැනීමට මං විවර වී තිබේ.

ශ්‍රී ලංකාව චීනයේත්, චීනය ශ්‍රී ලංකාවේත් ඉහළ මට්ටමේ සංචාරවල නිරතවීම මගින් දෙරට අතර ඓතිහාසික හා මිත්‍ර සබඳතා තවදුරටත් තරවී තිබෙන අතර එමගින් ආර්ථික ක්ෂේත්‍රය ඇතුළුව ක්ෂේත්‍ර රැසක සහයෝගිතාව වර්ධනය වී තිබේ. ජපානය හා ශ්‍රී ලංකාව අතර පරිපූර්ණ හවුල්කාරිත්වයක් ගොඩනගා ගැනීමත් සමඟම ජපානය සමඟ ශ්‍රී ලංකාව පවත්වන සබඳතා වැදගත් සංධිස්ථානයකට පැමිණ තිබේ. ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, තායිලන්තය, සිංගප්පූරුව, ඉන්දුනීසියාව, මැලේසියාව හා කොරියානු ජනරජය වැනි රටවල් සමඟ ශ්‍රී ලංකාව පවත්වාගෙන යන රාජ්‍යතාන්ත්‍රික සබඳතා, ක්ෂේත්‍ර සමූහයක සහයෝගිතාව පුළුල් කිරීමට හේතු වී තිබේ.

ශ්‍රී ලංකාව හා රුසියාව අතර සහයෝගිතාව තවදුරටත් පුළුල්වීමට දායක වී ඇති නව ව්‍යපෘතිවල ආරම්භයත් සමගම දෙරට අතර සබඳතා සම්බන්ධයෙන් උච්ච අවස්ථාවක් පෙන්නුම් කරයි.

2016 වසරේදී දෙරට අතර ඉහළ මට්ටමේ "පාර්ශවකාර සංවාදය" ස්ථාපනය කිරීමෙන් පහසුකම් සැලසුනු ක්ෂේත්‍ර රැසක ඇතිවූ සහයෝගිතා වර්ධනයත් අවබෝධයත් සමඟම ශ්‍රී ලංකාව හා ඇමරිකා එක්සත් ජනපදය අතර සබඳතා නව මාවතකට පිවිස තිබේ. ශ්‍රී ලංකාවේ සංහිඳියාව, සාමය හා සමාජ-ආර්ථික ප්‍රගතිය සඳහා සහාය ලබාදීමත් සමගම, දෙරට අතර ක්‍රමවත් පරිදි සිදුකරනු ලබන අන්තර් ක්‍රියා මගින් ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් වී තිබේ. බ්‍රසීලය හා කැනඩාව ඇතුළුව ඇමරිකානු හා ලතින් ඇමරිකානු කළාපයේ රටවල් සමඟ ශ්‍රී ලංකාව නිරන්තරයෙන් සිදුකරන අන්තර් ක්‍රියාකාරකම් මගින් එම රටවල ඉහළ මට්ටමින් නිරත වූ සංචාර සංඛ්‍යාව ඉහළ යාමත් අන්‍යොන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අත්කරගත් සහයෝගිතාව තවදුරටත් පුළුල් වීමත් සිදු විය.

එක්සත් රාජධානිය, ජර්මනිය, ඔස්ට්‍රියාව, ස්වීඩනය, ඉතාලිය, ප්‍රංශය, ස්ලෝවේනියාව, නෝර්වේ, ස්විස්ටර්ලන්තය හා පෝලන්තය වැනි යුරෝපීය රටවල් සමඟ ද්වීපාර්ශ්වික සබඳතා වර්ධනය කර ගැනීමට පියවර ගැනීමත් සමඟම යුරෝපා රටවල් සමඟ ශ්‍රී ලංකාව සිදුකරන කටයුතු වලින් නිශ්චිත ප්‍රතිඵල අත්වන බව පෙනී ගොස් තිබේ. යුරෝපා සංගමයෙන් (ජී. එස්. පී +) පහසුකම නැවත ලබාගැනීම, සමාලෝචනයට බඳුන් වන කාලය තුළදී විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා අත්කර ගන්නා ලද ප්‍රධාන ජයග්‍රහණයකි.

වෙළෙඳ සහ සංචාර කටයුතු හා කොන්ත්‍රාත්තුවලට එළඹුන ප්‍රධාන ශ්‍රමිකයන් සඳහා රැකියා ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම අපේක්ෂාවෙන් ඉහළ මට්ටමින් සංචාරවල නියැලෙමින්, මැදපෙරදිග රටවල් සමඟ විශේෂයෙන් සෞදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍ය, කටාර් රාජ්‍ය, කුවේට් යන රටවල් සමඟ ශ්‍රී ලංකාව සිදුකරන කටයුතුවල වපසරිය සැළකිය යුතු මට්ටමකින් වැඩිදියුණු වී තිබේ. ශ්‍රී ලංකාව අප්‍රිකානු රටවල් සමඟ දිගින් දිගටම සමීප සබඳතා පවත්වාගෙන ගිය අතර දකුණු අප්‍රිකාව සමඟ ශ්‍රී ලංකාවේ සබඳතා සම්න්ධයෙන් විශිෂ්ට ප්‍රගතියක් අත්කරගෙන තිබේ. ශ්‍රී ලංකාව අප්‍රිකානු සංගමයේ නිරීක්ෂක තත්තවය ලබා ඇති සාමාජික රටක් වන හෙයින් ද අප්‍රිකානු කළාපය සමඟ ශ්‍රී ලංකාව පවත්වන බහුපාර්ශ්වීය සහයෝගීතාව තවදුරටත් තර වී තිබේ.

බහුපාර්ශ්වීය රාජ්‍යතාන්ත්‍රික කටයුතු, ක්ෂේත්‍රය පිළිබඳව සලකා බලන කළ, නව රජය, සියලුම රටවල් සමඟ යහපත් සබඳතා පවත්වාගෙන යාමට සහ එක්සත් ජාතින්ගේ සංවිධානය හා වෙනත් ජාත්‍යන්තර සංවිධාන සමඟ ශ්‍රී ලංකාවේ සහයෝගිතාවය වැඩිදියුණු කිරීමට ඇප කැපවීමෙන් යුතුව කටයුතු කර තිබේ. මෙම ප්‍රයත්නයේදී එක්සත් ජාතින්ගේ සංවිධානයේ විවිධ සංසදවලට ක්‍රියාකාරී සහභාගීත්වයක් ලබාදෙමින් අප රටට උපරිම ප්‍රතිලාභ අත්කරදීමෙහිලා සැළකිය යුතු ප්‍රගතියක් අත්කර ගනිමින් සිටියි.

"ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම හා මානව හිමිකම්" පිළිබඳ 2015, 30/1 හා 2017 මාර්තු 34/1 යෝජනා සම්මුති සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයට පැවරී ඇති වගකීම් ඉටු කිරීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය කටයුතු කරමින් සිටියි. සම්භවය, ස්ත්‍රී පුරුෂ භාවය, සමාජ තත්ත්වය, වයස හා වෙනත් අනන්‍යතා නොසලකමින්, ගැටුම හේතුවෙන් රටේ සියලුම පුරවැසියන්ට එල්ලවූ

බලපෑම හඳුනා ගනිමින්, වින්දිතයන් කේන්ද්‍රකොටගෙන ප්‍රවේගයක් සහිතව සත්‍ය, හානිපූරණය, සාධාරණය හා ගැටුම් යළිත් ඇති නොවීම ඇතුළුව රජයේ සංහිඳියා න්‍යාය පත්‍රයට අදාළවන කරුණු අඛණ්ඩව සම්බන්ධීකරණය කරයි.

අප රට වසර ගණනාවක් පුරා ඇප කැපවී කටයුතු කරන විවිධ මානව හිමිකම් සම්මුතීන්ට ශ්‍රී ලංකාවේ ඇති බැඳීම් ඉටුකරලීම සඳහා අනෙකුත් රේඛීය නියෝජිතායතන හා අමාත්‍යාංශ සමඟ එක්ව, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ද සහිතව විදේශ කටයුතු අමාත්‍යාංශය, අමාත්‍ය මණ්ඩලය විසින් ස්ථාපිත කරන ලද මානව හිමිකම් පිළිබඳ අන්තර් අමාත්‍ය කමිටුවක කාර්ය රාමුව යටතේ 2017-2021 ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම (NHRAP) සම්පාදනය කර තිබේ.

දශක කිහිපයක් පුරා ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සාමසාධක කටයුතුවලට දායකත්වයක් ලබාදී තිබෙන අතර එමගින් ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සාමසාධක කටයුතුවලට ලබාදෙනු ලබන දායකත්ව වැඩි කිරීමට ඇති කැපවීම තහවුරු කර තිබේ. සාම සාධක මෙහෙයුම්වල සුවිශේෂී සහභාගිත්වය ලබාදෙන බවට ශ්‍රී ලංකාව ප්‍රතිඥා දෙයි. වර්තමානයේ ,ලොව පුරා ඇති එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් 08 ක හමුදා නිලධාරීන් 328 දෙනෙකු සේවයේ යොදවා ඇත. තවද, අප්‍රිකාවේ එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් 02 ක, පොලිස් නිලධාරීන් 32 කු ද සේවයේ යොදවා තිබේ. නිව්යෝර්ක් හි පිහිටි එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේ හමුදා නිලධාරීහු දෙදෙනෙක් සේවය කරමින් සිටිති. පොදුවේ උන්නදුවක් දක්වන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් සහෝදර රටවල් සමඟ ශ්‍රී ලංකාව සිදුකරන කටයුතු වර්ධනය කිරීමට ද ශ්‍රී ලංකාව පියවර ගෙන ඇත.

ගෝලීය සැපයුම් හා වාණිජ කටයුතු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඉන්දියානු සාගරයේ කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව සතු උපායමාර්ගික වැදගත්කම සැළකිල්ලට ගනිමින්, අප රට පිහිටා ඇති ආකාරයෙන් උපරිම ප්‍රතිලාභ ගැනීම සඳහා ඉන්දියානු සාගරයේ අන්‍යොන්‍ය වශයෙන් සිදුකරනු ලබන සාමකාමී කටයුතු පිළිබඳ දැක්ම ප්‍රවර්ධනය කිරීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය රාජ්‍යතාන්ත්‍රික වශයෙන් පියවර කිහිපයක් ගෙන තිබේ. මේ සඳහා ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානයේ (IORA) හා බහු ආංශික හා ආර්ථික සහයෝගීතාව සඳහා බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල සංවිධානයේ (BIMSTEC) රැස්වීම් කිපයකදීම ශ්‍රී ලංකා රජයේ ක්‍රියාකාරී සහභාගීත්වය ඉහළ නැංවීම නිසා මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් රටේ අරමුණු ඉදිරිපත් කිරීම සඳහා ඵලදායී ඉඩප්‍රස්ථාවක් ලැබී තිබේ.

ආර්ථිකය සවිමත් කිරීම සඳහාත් සංවර්ධන කටයුතු වැඩිදියුණු කිරීම සඳහාත් විදේශීය ආයෝජකයන් හා වෙළෙඳුන් අප රටට ආකර්ෂණය කර ගැනීම සඳහාත් අප රට සාමකාමී හා ආරක්ෂිත රටක් ලෙස එහි ප්‍රතිරූපය ඉදිරියට පැමිණවීමට මෙම අමාත්‍යාංශය අඛණ්ඩව කටයුතු කර තිබේ. රජය විසින් ගනු ලබන වෙළෙඳ හා ආර්ථික ප්‍රතිපත්ති, විශේෂයෙන්, කළාපයේ ප්‍රධාන ආර්ථික කළාපවලදී ගෝලීය වටිනාකම් දාමය සමඟ සබඳතා ඇතිකර ගැනීමට හඳුනාගත් ක්‍රියාකාරී ආර්ථිකයන් සමඟ නිදහස් වෙළෙඳ ගිවිසුම් පිළිබඳව පවත්වනු ලබන සාකච්ඡාවලට අදාළව, ක්‍රියාත්මක කිරීමේ කර්තව්‍යය පැවරී ඇති ජාත්‍යන්තර වෙළෙඳ නියෝජිතායතන සමඟ ද විදේශ කටයුතු අමාත්‍යාංශය සහයෝගීතාවයෙන් යුතුව කටයුතු කරයි.

උසස් තත්ත්වයෙන් යුතු වඩාත් කාර්යක්ෂම කොන්සියුලර් සේවාවක් ලබාදීම සඳහා එම අංශයේ කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදුකරන ලද අතර, 2017 මුල භාගයේදී නව ඩිජිටල් ක්‍රමයක්

හඳුන්වා දෙන ලදී. මෙම වැඩසටහනේ ප්‍රතිඵලයක් ලෙස, ආර්ථිකයේ හා රටේ යහපත උදෙසා විදේශ විනිමය උපයන ජනතාවට පරිගණක ආශ්‍රයෙන් කරනු ලබන සැලසුම් කිරීම් මගින් ස්වයං ක්‍රියාකරනය සහිත අප්‍රමාද හා කාර්යක්ෂම මෙන්ම අන්තර් ක්‍රියාකාරිත්ව සහිත සේවාවන් ලබාදෙනු ලැබේ. ඓතිහාසික පියවරක් ලෙස, මෙම අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශයේ ශාඛාවක් උතුරු පළාතේ ස්ථාපනය කරන ලද අතර දකුණු පළාතේද ශාඛාවක් විවෘත කිරීමට කටයුතු සැළසුම් කරනු ලබමින් සිටියි. මෙම පළාත්වල වෙසෙන ජනතාවගේ අවශ්‍යතා ඉටුකරලීම මෙහි අරමුණ වෙයි.


විශේෂයෙන් සංක්‍රමණික සේවකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා ලබාදෙනු ලබන කොන්සියුලර් සේවාවන් වැඩිදියුණු කිරීම අරමුණු කරගත් වැඩසටහනක් ද මෙම අමාත්‍යාංශ විසින් ක්‍රියාත්මක කරන ලදී. විදේශ කටයුතු අමාත්‍යාංශයට 2017 වසරේ පළමු මාස නවය තුළදී වන්දි මුදල් ද වන්දි හා ලැබිය යුතු වෙනත් මුදල් වශයෙන් පවුල්වල සාමාජිකයන්/ වින්දිතයන් අතර බෙදාදීම සඳහා ශ්‍රී ලංකා රුපියල් මිලියන 252 ක් පමණ විදේශ රටවලින් ලබාගැනීමට හැකිවිය. මේ අනුව පවුල් 122 ක් අතරේ මිලියන 195 ක මුදලක් බෙදා දී තිබේ. විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය ඉටුකරන සේවාවන් පිළිගැනීමට ලක්කරමින් 2017 ඔක්තෝබර් මස පැවති 19 වැනි ජාතික විශිෂ්ට තත්ත්වයේ තොරතුරු හා සන්නිවේදන සම්මාන උළෙලේදී රාජ්‍ය අංශයේ වඩාත් කැපී පෙනෙන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ජයග්‍රහණ සම්මානය (Public Sector Most Outstanding ICT Achievement Award) හා රාජ්‍ය අංශයේ රන් සම්මානය (Gold Award in the Government & Public Sector Category) ප්‍රදානය කරන ලදී.

2015 වසරේදී ඉතාලියේ මිලාන්හි කොන්සියුලර් කාර්යාලයක් හා 2016 ඔක්තෝබර් හිදී ඉතියෝපියාවේ අඩිස් අබාබා හි දී නේවාසික දූත මණ්ඩලයක් විවෘත කිරීමට අමතරව සයිප්‍රස්හි නිකෝසියා හිදී නව කොන්සල් ජනරාල් කාර්යාලයක් අනාගතයේ දී විවෘත කිරීම මගින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික ජාලය පුළුල් කිරීමට ද මෙම අමාත්‍යාංශය සැලසුම් කරයි.

විදේශ රටවල සිටින ශ්‍රී ලාංකිකයන්ගේ අභිලාෂයන් ප්‍රවර්ධනය කිරීමට හා ආරක්ෂා කිරීමට මෙන්ම ශ්‍රී ලංකාවේ ජාතික අභිලාෂයන්, ස්වෛරීභාවය හා අනන්‍යතාව සහ විදේශ රටවලට යන හා එම රටවල වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ අභිලාෂයන් සුරක්ෂා කිරීමට මෙම අමාත්‍යාංශය තවදුරටත් කටයුතු කරනු ඇත. ශ්‍රී ලංකාවට හා එහි ජනතාවට සමෘද්ධිය උදාකරලනු පිණිස කටයුතු කිරීමේ ශ්‍රී ලංකා රජයේ ඉලක්කයට මෙම මූලික හා ඉතා වැදගත් පියවර මගින් පිටිවහලක් ලැබෙනු ඇත.

විදේශ කටයුතු අමාත්‍යාංශය
ජනරජ ගොඩනැගිල්ල
කොළඹ 01

# විදේශ කටයුතු අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය



# අප්‍රිකා අංශය

## අප්‍රිකා කටයුතු අංශය

මෙම අංශය අප්‍රිකානු කලාපය තුළ රටවල් 54ක් සමඟ ද්විපාර්ශ්වීය සබඳතාවයන්ට අදාළ කරුණු සමඟ කටයුතු කරයි.

මෙම කලාපයේ රටවල දේශපාලන සහ සමාජ ආර්ථික ප්‍රවනතා පිළිබඳ තොරතුරු ලබාදීමේ කාර්යය මෙම අංශයට පැවරී ඇත.

දේශපාලන, ආර්ථික, ආරක්ෂක, අධ්‍යාපනික හා සමාජ වටපිටාව තුළ මෙම රටවල් සම්බන්ධයෙන් ලංකාවේ විදේශ ප්‍රතිපත්තිවලට මග පෙන්වයි. ද්විපාර්ශවීය, කලාපීය හා බහු පාර්ශවීය සබඳතා ඔස්සේ තාක්ෂණික සහයෝගිතාවය සහ සංවර්ධන සහය, ආයෝජන සබඳතා, සංචාරක හා සංස්කෘතික ප්‍රවර්ධනය මෙම අංශයේ රාජකාරීන්වල කොටසකි.

අප්‍රිකාවේ පවතින ස්වාධීන රාජ්‍යයන් 54 ක් අතරින් රටවල් 43ක් සමග නිල රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කරගැනීමට ලංකාවට හැකිවී ඇති අතර, ඉතිරි රටවල් 11 ද සමගාමී බවට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

| නේවාසික දූත මණ්ඩලය | සමගාමී අක්තගැන්වීම |
| --- | --- |
| • ඊජිප්තුව | එරිත්‍රියාව, ලිබියාව, සුඩාන ජනරජය |
| • කෙන්යාව | කොංගෝ ජනරජය, කොංගෝ ප්‍රජාතාන්ත්‍රික ජනරජය (DRC), උගන්ඩාව, රුවන්ඩාව, UNEP, UN-HABITAT |
| • නයිජීරියාව | බෙනින්, බර්කිනා, ෆසෝ, කෝට් ඩි අයිවරි, ගැම්බියාව, ගිනියාව, ගිනියා බිසව්, ලයිබීරියාව, මාලි, මොරිටේනියාව, සියරා ලියෝන්, ටෝගෝ, මැඩගස්කරය |
| • දකුණු අප්‍රිකාව | ඇන්ගෝලාව, ලෙසොතෝ, මොසැම්බික්, මලාවි, නැම්බියාව, ස්වාසිලන්තය, සැම්බියාව, සිම්බාබ්වේ |
| • ඉතියෝපියාව (2016 ඔක්. 24 දින විවෘත කෙරිණි.) | ජිබුටි, සෝමාලියාව, දකුණු සුඩානය, අප්‍රිකානු සංගමය |
| • ලිබියාව | 2011 මාර්තු සිට ස්ථිර ලෙස වසා ඇත. |
| • උගන්ඩාව | 2016 මාර්තු 31 සිට ස්ථිර ලෙස වසා ඇත. |

**අනේවාසික තානාපතිවරුන් අක්තගැන්වීමේ යෝජනාව හේතුවෙන් සමගාමී අක්තගැන්වීමක් නොමැති රටවල්**

මොරිසිය, ඝානාව, සෙනගලය, ටැන්සානියාව, බොට්ස්වානා, ඇල්පීරියාව, මොරොක්කෝව, ටියුනීසියා.

**නිර්වේතනික කොන්සල් නියෝජනය**

බොට්ස්වානාව, දකුණු අප්‍රිකාව, (ඩර්බන් හා කේප් ටවුන්), මලාවි, ටියුනිසියාව, සුඩානය, සෙනගලය, මොරිසිය, මොසැම්බික්, සැම්බියාව හා නැම්බියාව යන රටවල ලංකාවට නිර්වේතනික කොන්සල් නියෝජනයන් ඇත.

**ප්‍රධාන ක්‍රියාකාරකම් /මෙම අංශයේ කාර්යය සාධනය**.

- අප්‍රිකානු මහද්වීපය තුළ දේශපාලන හා ආර්ථික ප්‍රවනතා නිරීක්ෂණය කිරීම.
- මෙම කලාපය තුළ නේවාසික ලංකා දූත මණ්ඩලය හා කොන්සල් කාර්යාලයේ වැඩ කටයුතු සම්බන්ධීකරණය හා පාලනය කිරීම.
- ද්විපාර්ශවීය ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් සම්පාදනය කිරීම හා අත්සන් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය.
- කළාපීය සංවිධාන සමඟ ලංකාවේ සබඳතාවය සම්බන්ධීකරණය.
- මෙම රටවල් සමඟ රාජ්‍ය නායකයන්, රාජ්‍ය අමාත්‍යාංශ හා රජයේ නිල මට්ටමේ ප්‍රධානීන්ගේ මෙරට සහ එරට නියලුන සංචාර සහ පසු විපරම් කටයුතු තහවුරු කිරීම.
- අප්‍රිකානු රටවල් සමඟ ලංකාවේ සබඳතාවයන්ට අදාල කරුණු සම්බන්ධයෙන් අදාල රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් දේශිය නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය සිදුකිරීම.
- කොළඹ සහ අනෙකුත් අනේවාසික දූත මණ්ඩල පිහිටි කළාපයේ මෙම රටවල විදේශ රාජතාන්ත්‍රික දූත මණ්ඩල සමඟ ද්විපාර්ශවීය සබඳතා සම්බන්ධීකරණ හා එක්ව කටයුතු කිරීම.

අප්‍රිකානු රටවල් සමඟ ලංකාවේ සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් 2014 අප්‍රේල් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි අප්‍රිකානු නොවන රාජ්‍යයක් ලෙස ලංකාව අප්‍රිකානු සංගමයේ පිළිගැනීමේ තත්ත්වය ලබා ගත්හ.

1. ඊජිප්තුව

අ. ද්විපාර්ශ්වික සබඳතා

i. 2018 - 2021 කාලසීමාව සඳහා සියලුම සංක්‍රමණික සේවකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අයිතීන් සුරක්ෂා කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුව සඳහා ලංකා අපේක්ෂකත්වය (ප්‍රසාද් කාරියවසම් මහතා) සඳහා ඊජිප්තුවේ සහාය පළ විය.

ii. 2017 - 2019 කාලසීමාව සඳහා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ සහ 2017 - 2022 කාලසීමාව සඳහා මානව හිමිකම් කමිටුවේ සාමාජිකත්වය සඳහා ඊජිප්තු අපේක්ෂකත්වයට ලංකාව විසින් සහාය ලබාදෙන ලදී.

iii. තැපැල්, තැපැල් සේවා සහ මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යය ගරු එම්.එච්.ඒ. හලීම් මැතිතුමා ඊජිප්තුවේ පිහිටි ඉස්ලාම් කටයුතු සඳහා වු සුපිරිම් කවුන්සිලයේ 27 වැනි වාර්ෂික සමුළුවට සහභාගි විය.

iv. ජාතික ඒකාබද්ධතා හා සංහිඳියා රාජ්‍ය අමාත්‍ය ගරු ඒ.එච්.එම්. ෆවුසි මැතිතුමා ඊජිප්තුවේ සිනයි යනු "ආගමික සංචාරක කර්මාන්තයේ අගනුවර" සම්බන්ධයෙන් වු සමුළුවකට සහභාගි විය.

v. 2017 නොවැම්බර් 5 සිට 9 දක්වා ෂර්ම් එල් ෂෙයික් හිදී ලෝක තරුණ සංසදය පැවැත්වුණි. රටවල 140 ක තරුණ නියෝජිතයන් මෙම සමුළුවට සහභාගි විය. එක්සත් ජාතීන්ගේ තරුණ නියෝජිත ජයත්මා වික්‍රමනායක මිය හා හිටපු එක්සත් ජාතීන්ගේ තරුණ සම්මාන ජයග්‍රාහිකාවක වු අනෝකා අබේරත්න මිය යන ලංකිකයන් දෙදෙනාට මෙම සංසදය සඳහා ආරාධනා ලැබුණි.

vi. 2017 දෙසැම්බර් 18 සිට 19 දක්වා එරිත්‍රියා රාජ්‍යයේ ජනාධිපති අතිගරු ඉෂායික් අෆ්වර්කි මැතිතුමාට අක්ත පත්‍ර ඉදිරිපත් කිරීම සඳහා මදාරා යෝගරාජන් මහත්මිය හා දෙවන ලේකම් (වාණිජ) ඩී.එම්.එස්.එන් අබේරත්න මහත්මිය කැටුව තානාපතිවරයා එරිත්‍රියාවේ සංචාරය කළේය.

ආ. ආර්ථික සබඳතා

i. කෘෂිකාර්මික කළමනාකරණයේ විවිධ ක්ෂේත්‍ර පිළිබඳ මාස තුනක පුහුණු කාලයක් සඳහා ලාංකික කෘෂිකර්ම නිලධාරීන්ට ඊජිප්තු ජාත්‍යන්තර කෘෂිකර්ම මධ්‍යස්ථානය මගින් ශිෂ්‍යත්ව පිරිනමයි.

ii. ඊජිප්තුවේ තේ වෙළඳුන්ගේ සහභාගීත්වයෙන් කයිරෝ හි රැම්සස් හිල්ටන් හෝටලයේදී ගෝලිය තේ සාදය පැවැත්වුණි.

iii. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් මෙහෙයවන ලද කුටියක් සමගින් මාර්තු මාසයේදී කයිරෝ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය - 2017 ට ශ්‍රී ලංකාව සහභාගි විය.

iv. විශ්ව විද්‍යාල තුනකදී තරුණයන් සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් සංචාරක ප්‍රවර්ධනය සිදුකරන ලදී. මෙහිදී කයිරෝහි බ්‍රිටිෂ් විශ්ව විද්‍යාලයේදී වෙළඳ ප්‍රදර්ශනයක්

සංවිධානය කරන ලද අතර ඔක්තෝම්බර් 6 වැනි දින කයිරෝ විශ්ව විද්‍යාලයේදී හා පාරාඩයික් ගම්මානයේදී පැවැත්වුණි.

ඇ. **වෙළඳාම**

2016 වර්ෂයේදී ශ්‍රී ලංකාවෙන් සිදු කළ අපනයන - මි. 36.88

2016 වර්ෂයේදී ඊජිප්තුවෙන් සිදු කළ ආනයන - මි. 27.59

ඈ. **සංචාරක කර්මාන්තය**

2017 සමස්ත වර්ෂය පුද්ගලයන් 3,466.

ඉ. කෘෂිකාර්මික කළමනාකරණයේ විවිධ ක්ෂේත්‍රයන් හා මාස තුනක කාලසීමාවක පුහුණුවක් සඳහා ශ්‍රී ලාංකික කෘෂිකාර්මික නිලධාරීන් වෙත ඊජිප්තු ජාත්‍යන්තර කෘෂිකර්ම මධ්‍යස්ථානය මගින් ශිෂ්‍යත්ව ප්‍රදානය කරයි. 2017 දෙසැම්බර් මාසයේදී පාඨමාලා සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් කෘෂිකර්ම නිලධාරීන් දෙදෙනෙකු තම සහතික පත්‍ර ලැබීය.

ඊ. **සංස්කෘතික සබඳතා**

i. 2017 අප්‍රේල් මස පැවති බෙරකරුවන් හා සම්ප්‍රදායික කලා කටයුතු සඳහා ජාත්‍යන්තර උළෙලට ශ්‍රී ලංකා යුධ හමුදා සංස්කෘතික කණ්ඩායමේ බෙරකරුවන් හා නැට්ටුවන් 13 දෙනෙකුගේ කණ්ඩායමක් සහභාගි විය.

ii. ජනවාරි 08 වැනි දිනට යෙදී ඇති අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ පදවිප්‍රාප්තිය, සංස්කෘතික මධ්‍යස්ථානයක් විවෘත කරමින් තානාපති කාර්යාලය විසින් සමරන ලදී.

iii. පෙබරවාරි මස ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සහභාගිත්වයෙන් තානාපති කාර්යාලය විසින් නිදහස් දින සැමරුම පවත්වන ලදී. රාජ්‍යතාන්ත්‍රික ප්‍රජාව, වෙළෙඳ, කර්මාන්ත, සංචාරක නියෝජිතයින් හා මාධ්‍යයේ සහභාගිත්වයෙන් රිට්ස් කාල්ටන් හෝටලයේදී මහජනයා පිළිගැනීමේ උත්සවයක් පවත්වන ලදී.

iv. ශ්‍රී ලාංකික ප්‍රජාවේ සාමාජිකයින් විශාල සංඛ්‍යාවකගේ සහභාගිත්වයෙන් සිංහල හා දෙමළ, අලුත් අවුරුද්ද, වෙසක් උත්සව හා ඉෆ්තාර් වැඩසටහන සංවිධානය කරන ලදී.

v. 2018 නොවැම්බර් මාසයේදී කයිරෝ හි පිහිටි කොන්රාඩ් හෝටලයේ දී ඊජිප්තුවේ පිහිටි ආසියානු තානාපතිවරුන්ගේ කලත්‍ර සංගමය මගින් පුණ්‍ය කටයුතු පිළිබඳ වෙළඳපළක් සංවිධානය කළේය. ශ්‍රී ලාංකික කුටිය මගින් ශ්‍රී ලාංකික කෙටි ආහාර හා පැණි රසැති ආහාර ප්‍රදර්ශනය කළේය. වෙනම සකස් කරන ලද කුටියක් මගින් සාම්ප්‍රදායික බීරළු ක්‍රමය ඔස්සේ රේන්ද සම්ප්‍රදාය ප්‍රදර්ශනය කළේය. බීරළු වියන්නන් හට සිය නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අවස්ථාව ලබාදුනි. සිලෝන් ඩිල්මා තේ සමාගමේ අනුග්‍රාහකත්වයෙන් සියලුම අමුත්තන්හට තේ සංග්‍රහයක් පිළිගැන්විණි.

vi. නත්තල් උත්සවය, දෙදින වැඩසටහනකින් සමරන ලදී. කොළඹ ශාන්ත තෙරේසා දේවස්ථානයේ සංජීව කුමාර පෙරේරා පියතුමාගේ සහභාගිත්වයෙන් 20 වැනි දින තානාපති කාර්යාලයේ නත්තල් දේව මෙහෙය සමරන ලදී. මෙහිදී රාත්‍රී භෝජන සංග්‍රහයක් ලබාදුනි. ප්‍රජා සාමාජිකයන් විසින් නත්තල් ගසකින් හා ගව ලෙනකින් තානාපති කාර්යාලය සරසන ලදී. සාම්ප්‍රදායික "පව් පාපොච්චාරණය", සුව සේවය හා නත්තල් ක්‍රීඩා මෙම සැමරීමේ කොටසක් විය. ප්‍රජා සාමාජිකයන්ගේ කණ්ඩායමක් විසින් නත්තල් කැරෝල් ගීත ගායනා කළ අතර ශිවනාත් අබේරත්න මහත්මිය (දෙවන ලේකම් - වාණිජ) සමග මදාරා යෝගරාජන් මහත්මිය ඕගන් වාදනය සිදුකරන ලදී.

උ. **කම්කරු සුභසාධනය**

i. 2016 නොවැම්බරයේ දී ඊජිප්තුවේ බලය බෙදාහැරීමෙන් පසුව එහි ශ්‍රමිකයන් සඳහා ඊජිප්තුවේ තත්ත්වය අස්ථායී වී තිබේ. ගෘහ සේවක සේවිකාවන්ට ගෙවන ලද ඩොලර් 600-700ක වැටුප පහත හෙළීම හෝ පැරණි අනුපාතයක් යටතේ පවුම්වලට පරිවර්තනය කිරීම කරන ලදී. මේ හේතුවෙන් ඊජිප්තුවේ රැකියාවේ නියැලී සිටි ශ්‍රී ලාංකික ගෘහ සේවක සේවිකාවෝ ආපසු ශ්‍රී ලංකාවට පැමිණියහ. වීසා බලපත් නොමැතිව ඊජිප්තුවේ අමතර කාලයක් රැඳී සිටීම වෙනුවෙන් ලබාදෙන දඩමුදල් ද ඊජිප්තු රජය විසින් වැඩි කරන ලදී. නීත්‍යනුකූල නොවන අන්දමින් වීසා බලපත් නොමැතිව ඊජිප්තුවේ රැකියාවේ නියැලී සිටි ශ්‍රී ලාංකිකයන් වැඩි පිරිසකගේ ආපසු පැමිණීමට මෙයද හේතු වී තිබේ.

ii. පිළිකා ප්‍රතිකාර කර ගැනීම සඳහා කේ.වී. කුසුමාවති මහත්මිය වෙත රුපියල් 500,000/- ක මුදලක් ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශය මගින් පරිත්‍යාග කළේය.

iii. කිසිදු ලේඛනයක් නොමැතිව ඊජිප්තු ජාතිකයකු විවාහ කරගත් ඊජිප්තුවේ විසූ වසන්ති මහත්මියට සිය උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත් අංකය හා නව විදේශ ගමන් බලපත්‍රයක් ලබා ගැනීමට සහය ලබා දෙන ලදී.

iv. කයිරෝ හි පිහිටි ජාත්‍යන්තර සංක්‍රමණ සංවිධානයේ සහයෝගයෙන් මොරොක්කෝ හි අතරමං වී සිටි ශ්‍රී ලාංකිකයන් සිව් දෙනෙකු ආපසු ශ්‍රී ලංකාවට පැමිණීමට සහාය විය.

2. **ඉතියෝපියාව**

අ. **ද්විපාර්ශ්වික සබඳතා**

i. ශ්‍රී ලංකා හා ඉතියෝපියා විදේශ අමාත්‍යවරුන් විසින් 2017 පෙබරවාරි 02 දින දූත මණ්ඩලය නිල වශයෙන් විවෘත කරන ලදී. මේ සඳහා අඩිස් අබාබා හි වෙසෙන රාජ්‍යතාන්ත්‍රික ප්‍රජාව, ඉතියෝපියා රජයේ හා අප්‍රිකා සංගමයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු හා ඉතියෝපියාවේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාවේ සාමාජිකයෝ හා මාධ්‍ය නියෝජනය කරමින් අමුත්තෝ 120 දෙනෙක් පමණ සහභාගී වූහ.

ii. හිටපු විදේශ කටයුතු අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමා, 2017 ජනවාරි 30- පෙබරවාරි 03 දිනවලදී ඉතියෝපියාවේ නිල සංචාරයක නියැලිණි. මෙය ශ්‍රී ලංකා විදේශ

අමාත්‍යවරයෙකු ඉතියෝපියාවේ නිරත වූ පළමු නිල සංචාරය විය. මෙම සංචාරය අතරතුර දී, විදේශ අමාත්‍යවරයා විසින් ඉතියෝපියා සම්භාවනීය පිරිස සමඟ (ඉතියෝපියාවේ අතිගරු ජනාධිපති, ගරු කතානායක, ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා, විදේශ ආයෝජන විෂය භාර ගරු අමාත්‍යතුමා) නිල රැස්වීම් පවත්වන ලදී.

iii. ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යවරයාගේ නිල සංචාරය අතරතුර දී, ශ්‍රී ලංකාව හා ඉතියෝපියාව අතර සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම සඳහා වූ ගිවිසුමට හා ශ්‍රී ලංකාව හා ඉතියෝපියාව අතර රාජ්‍යතාන්ත්‍රික උපදේශන පැවැත්වීම පිළිබඳ අවබෝධතා ගිවිසුමට එළඹෙන ලදී.

iv. විමසුම් කාලසීමාව තුළදී, ශ්‍රී ලංකාව හා ඉතියෝපියාව අතර සිදුකිරීමට නියමිත අතිවිශේෂ පුද්ගලයන්ගේ සංචාර ඇතුලුව ද්විපාර්ශවීය සබඳතා ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ආසියා හා සාගර කටයුතු අංශයේ අධ්‍යක්ෂ ජනරාල් සමඟ තානාපතිවරයා රැස්වීමක් පවත්වන ලදී.

v. සමාලෝචනයට බඳුන්වන කාලය තුලදී, අදාළ අප්‍රිකානු රටවල් සමඟ ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික සබඳතා වැඩිදියුණු කිරීම සඳහා අඩිස් අබාබා හි සිටින අප්‍රිකානු තානාපතිවරයා සමඟ රැස්වීම් රැසක් දූත මණ්ඩලය විසින් පවත්වන ලදී.

vi. ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයේ තාක්ෂණික සහයෝගීතා වැඩසටහන යටතේ සැප්තැම්බර් 18-29 දිනවලදී ශ්‍රී ලංකාවේ පැවති රාජ්‍යතාන්ත්‍රික පුහුණු වැඩසටහනට ඉතියෝපියානු විදේශ සේවා නිලධාරියෙකු සහභාගී විය.

**ආ. බහු පාර්ශ්වීය සබඳතා**

i. ශ්‍රී ලංකාවේ හිටපු විදේශ අමාත්‍යවරයා 2017 පෙබරවාරි 02 දා නියැලුණ ඉතියෝපියානු නිල සංචාරය අතරතුරදී, අප්‍රිකා සංගම් කොමිෂන් සභාවේ සභාපතිවරයා සමඟ රැස්වීමක් පැවැත්විය.

ii. අඩිස් අබාබා හි අප්‍රිකා සංගමයේ ශ්‍රී ලංකා නේවාසික නිත්‍ය නියෝජිතවරයා වශයෙන් තානාපතිවරයා, අප්‍රිකා සංගමයේ සභාපතිවරයා/ නියෝජ්‍ය සභාපතිවරයා සහ කොමසාරිස්වරුන් සමඟ රැස්වීම් පැවැත්විය.

iii. අප්‍රිකා සංගමයේ සාමාජික නොවන රටක (පාර්ශවකාර කණ්ඩායම) නිත්‍ය නියෝජිතවරයා ලෙස තානාපතිවරයා 2017 ජනවාරි - ජුනි කාලසීමාව තුළදී පැවති අප්‍රිකා සංගම් සමුළුවලදී සහ අප්‍රිකා සංගමය මාතෘකා රැසක් යටතේ පවත්වන ලද සමුළු, වැඩමුළු හා සාකච්ඡා වලදී ශ්‍රී ලංකාව නියෝජනය කළේය.

iv. අප්‍රිකානු සංගමයේ නොවන සාමාජිකයෙකු ලෙස 2018 ජනවාරි මාසයේදී පැවැත්වීමට නියමිත අප්‍රිකානු සංගමයේ සමුළුවේදී අප්‍රිකානු සංගම් කොමිසම සහ ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සමගින් ශ්‍රී ලංකාවේ සබඳතා ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා අප්‍රිකානු සංගම් කොමිසමේ නියෝජ්‍ය සභාපති, අතිගරු ක්වේෂී ක්වාර්ට් මැතිතුමා සමඟ රැස්වීමක් අප්‍රිකානු සංගමයේ තානාපතිවරයා පවත්වන ලදී.

## ඇ. ආර්ථික සබඳතා හා විදේශ ආයෝජන

i. හිටපු විදේශ කටයුතු අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමා 2017 පෙබරවාරි 02 වන දින ඉතියෝපියානු ආයෝජන කොමිෂන් සභාවේදී ඉතියෝපියාවේ අමාත්‍ය හා විදේශ ආයෝජන පිළිබඳ අග්‍රාමාත්‍යවරයාගේ විශේෂ උපදේශක ආචාර්ය අරකෙබේ ඔකුබේ මැතිතුමා සමඟ හමුවක් පැවැත්විය.

ii. වෙළඳ හා ආර්ථික සබඳතා වර්ධනය කර ගැනීම සඳහා ඉතියෝපියානු ආයෝජන කොමිෂන් සභාව සමඟ තානාපතිවරයාද රැස්වීම් රැසක් පවත්වන ලදී.

iii. 2017 ජුනි 20 වන දින, සීමාසහිත ඉසබෙලා මේස් නිෂ්පාදන සමාගම සහ සීමාසහිත හයිඩ්‍රාමනී ඇඟලුම් සමාගම යන ශ්‍රී ලාංකික වෙළඳ සමාගම් දෙකෙහි නිෂ්පාදන මෙහෙයුම ඉතියෝපියාවේ හවාස්සා කැරවාන උද්‍යානයේ දී ඉතියෝපියානු තානාපතිවරයා හා ශ්‍රී ලංකා තානාපතිවරයා විසින් සමාරම්භනය කරන ලදී.

iv. වර්තමානයේ ශ්‍රී ලංකා වෙළඳ සමාගම් කිහිපයක් පිහිටුවා ඇති ඉතියෝපියාවේ ශ්‍රී ලාංකිකයෝ 350ක් පමණ සේවය කරමින් සිටිති.

v. ශ්‍රී ලංකා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂවරයාගේ නායකත්වයෙන් යුතු සාමාජිකයන් 09කින් සමන්විත ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමක් ඉතියෝපියානු මැණික් කර්මාන්තයේ නියැලීමට ඇති හැකියාව සොයා බැලීම සඳහා 2017 ජුනි මස පළමු සතියේදී ඉතියෝපියාව බලා පිටත්විය.

vi. ඩේවිඩ් පීරිස්, ස්මාර්ට් ෂර්ට්, සීමාසහිත සචින්ද එන්ටර්ප්‍රයිසස් සමාගම, ගාමිණී ජෙම් ඇන්ඩ් ජුවලරි ආදී ශ්‍රී ලාංකික වෙළඳ සමාගම් රැසක් නියෝජනය කරමින් නියෝජිත කණ්ඩායමක්, එම සමාගම්වල ව්‍යාපාරික කටයතු ඉතියෝපියාවේ දි ස්ථාපනය කිරීමට ඇති ඉඩකඩ පිළිබඳව සොයාබැලීමට ඉතියෝපියාවේ සංචාරයක නියැලිනි.

vii. ඉතියෝපියානු වෙළඳ සමාගම් රැසක නියෝජිතයෝ ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික හවුල්කාරීත්ව ඇතිකිරීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණියහ.

viii. කොළඹ සහ අඩිස් අබාබා අතර ඉතියෝපියන් එයාර් ලයින් සමාගමට සෘජු ගුවන් ගමන් මෙහෙයවීමට ඇති හැකියාව පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා තානාපතිතුමා විසින් 2017 ජූලි 26 වැනි දින ඉතියෝපියාවේ සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්තුමා සමඟ රැස්වීමක් පවත්වන ලදී.

ix. ශ්‍රී ලංකාව හා ඉතියෝපියාව අතර වෙළඳ සබඳතා තවදුරටත් වර්ධනය කිරීම සඳහා ප්‍රධාන පෙළේ ඉතියෝපියානු වෙළඳ මණ්ඩලවල නිලධාරීන් සමඟ (අඩිස් අබාබා වාණිජ මණ්ඩලයේ හා ආංශික සංගමයේ මහලේකම්, වාණිජ හා කර්මාන්ත අප්‍රිකානු මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂ ඉතියෝපියානු වාණිජ හා ආංශික සංගම් මණ්ඩලයේ මහ ලේකම්) තානාපතිවරයා රැස්වීම් පවත්වන ලදී.

x. 2018 වර්ෂයේදී ඉතියෝපියාවේ ශ්‍රී ලංකිකයන් සඳහා වැඩි වශයෙන් රැකියා අවස්ථා ලබා ගැනීමට ඉතියෝපියානු ආයෝජන කොමිසමේ නියෝජ්‍ය සභාපතිවරයා සමඟ රැස්වීමක් මෙම දූත මණ්ඩලය විසින් පවත්වන ලදී.

### ඈ. සංස්කෘතික සබඳතා

i. දූත මණ්ඩලයේ මගපෙන්වීම යටතේ, ඉතියෝපියාවේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව, 2017 මැයි 02 වන දින හවාස්සා හි දී සිංහල, හින්දු අලුත් අවුරුදු උත්සවයක් සංවිධානය කරන ලදී.

ii. 2017 දෙසැම්බර් 28 වන දින නසිල නිවසේදී නත්තල් සැමරීමේ උත්සවයක් මෙම දූත මණ්ඩලය පවත්වන ලදී. ඉතියෝපියානු විදේශ අමාත්‍යාංශයේ නිලධාරීන්, ශ්‍රී ලාංකික ප්‍රජාවේ සාමාජිකයන් මෙම ආරාධිතයන් අතර විය.

### ඉ. කම්කරු සුභසාධනය

i. දැනට ශ්‍රී ලාංකිකයෝ 350ක් පමණ ඉතියෝපියාවේ සේවය කරමින් සිටිති. ශ්‍රී ලාංකිකයින්ගේ සුභසාධන පහසුකම් වැඩිදියුණු කරලීම සහ ඉතියෝපියාවේ වෙසෙන හා සේවය කරන ශ්‍රී ලාංකික ප්‍රජාවට අදාළ වෙනත් ගැටලු පිළිබඳව, ඉතියෝපියානු ආයෝජන කොමිෂන් සභාව හා වෙනත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ මෙම දූත මණ්ඩලය සාකච්ඡා රැසක් පැවැත්විය.

ii. 2017 මාර්තු මස 3වැනි සතිය තුළදී, සෝමාලියානු කොල්ලකරුවන් විසින් “Airs 13” යාත්‍රාව හා එහි සිටි ශ්‍රී ලාංකික කාර්ය මණ්ඩලය පැහැරගනු ලැබීය. සෝමාලියානු කොල්ලකරුවන්ගෙන් ශ්‍රී ලංකික කාර්ය මණ්ඩලය නිදහස් කරගැනීමට සෝමාලියානු රජය හා අදාළ නියෝජිතායතන සමඟ මෙම දූත මණ්ඩලය විසින් සාකච්ඡා පවත්වන ලදී.

iii. 2017 ජුනි 30 වෙනි දින, අඩිස් අබාබා හි බොලේ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ රැඳවා සිටි අතරමං වූ ශ්‍රී ලාංකික සාම සාධක හමුදා කණ්ඩායමට (නිලධාරීන් 48) මෙම දූත මණ්ඩලය විසින් අවශ්‍ය සහාය සලසන ලදී.

### ඊ. වෙනත්

2017 ඔක්තෝම්බර් 08 වැනි දින කොළඹදී පැවැති කොළඹ මැරතන් වැඩසටහනට ඉතියෝපියානු ක්‍රීඩකයන් සහභාගි විය.

## 3. කෙන්යාව

### අ. ද්විපාර්ශ්වික සබඳතා

i. මහකොමසාරිස් කාර්යාලය විසින් ගනු ලැබූ පියවරකට අනුව, 2017 පෙබරවාරි මස කෙන්යා ක්‍රීඩා අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා මධ්‍යම දුර හා දිගු දුර පුහුණුකරුවන් සඳහා වූ පුහුණු වැඩමුළුවකට සාමාජිකයින් 17 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත කණ්ඩායමක් සහභාගී විය.

ii. ''අප්‍රිකානු ගැහැණු දරුවා'' පිළිබඳව කණ්ඩායම් සාකච්ඡාවක් 2017 ජුනි 10 වන දින රිආරා විශ්වවිද්‍යාලය හා මහ කොමසාරිස්වරයා විසින් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ආදි කර්තෘ වෛද්‍ය හිරන්ති විජේමාන්න මහත්මිය එහි ආරාධිත දේශකයා විය.

iii. කෙන්යා රජයේ ආරාධනයකට අනුව, 2017 නොවැම්බර් මස 28 වන දින කෙන්යා ජනරජයේ ජනාධිපති අතිගරු උහුරු කෙන්යටා මැතිතුමාගේ දිවුරුම් දීමේ උත්සවයේදී විදේශ කටයුතු

රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානායක මැතිතුමා ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් පෙනී සිටියේය. කෙන්යා ජනාධිපතිවරයා බැහැදුටු අවස්ථාවේදී, නියෝජ්‍ය ජනාධිපති ගරු විලියම් රුටෝ සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ අමාත්‍ය මණ්ඩල ලේකම් ගරු අමිනා මොහොමඩ් මැතිතුමා රාජ්‍ය මන්දිරයේදී හමුවිය. මෙම සංචාරයේදී, එතුමා ශ්‍රී ලාංකික ප්‍රජාව හමු විය.

iv. 2017 නොවැම්බර් මාසයේදී ටැන්සානියාවට ඇතුල්වීම සඳහා වීසා ලබා ගැනීමේදී ශ්‍රී ලාංකිකයන් මුහුණදුන් අපහසුතා විසඳීම සඳහා ටැන්සානියා මහ කොමසාරිස්වරයා සමඟ මෙම දූත මණ්ඩලය සාකච්ඡා පවත්වන ලදී.

**ආ. බහුපාර්ශ්වික සබඳතා**

i. මෙම මහකොමසාරිස් කාර්යාලය, එක්සත් ජාතීන්ගේ හැබිටැට් සංවිධානය හා එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන සඳහා අක්තගන්වා ඇති අතර එය වසර මුළුල්ලේම නයිරෝබි හි පිහිටි එක්සත් ජාතීන්ගේ කාර්යාලය විසින් සංවිධානය කරනු ලබන රැස්වීම් සඳහා අදාළ ජේබීය නියෝජිතායතනය සමඟ කටයුතු සම්බන්ධීකරණය කරමින් සහභාගී වෙයි.

ii. 2017 මැයි 1 - 5 දිනවලදී නයිරෝබි හි දී පැවති ආසියා - අප්‍රිකා නීති උපදේශාත්මක සංවිධානයේ (AALCO) 56 වැනි සැසිවාරයට සහභාගී වූ ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායමේ නායකත්වය උසුලන ලද්දේ අධිකරණ නියෝජ්‍ය අමාත්‍ය, ගරු සාරති දුෂ්මන්ත මිත්‍රපාල මැතිතුමා විසිනි.

iii. එක්සත් ජාතීන්ගේ හැබිටැට් සංවිධානයේ පාලක සභාවේ 26 වැනි සැසිවාරය 2017 මැයි 8 - 12 දිනවලදී නයිරෝබි හි දී පවත්වන ලදී. ඊට සහභාගී වූ ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායමේ නායකත්වය උසුලන ලද්දේ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම්, ඩබ්.කේ.කේ. අතුකෝරල මහතා විසිනි.

iv. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ විදේශ සබඳතා අධ්‍යක්ෂ දීපා ලියනගේ මිය, නීල හරිත ආර්ථික මුල්‍ය පහසුකමේ ප්‍රධාන විධායක නිලධාරී ධර්මකීර්ති ක්‍රිස්ටෝපර් මහින්ද තිලකසිරි මහතා සහ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ අන්සුල් ජාන් මිය, 2017 නොවැම්බර් 28 දින සිට දෙසැම්බර් 01 දින දක්වා නයිරෝබියේ පැවැති එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ නිත්‍ය නියෝජිත රැස්වීමට සහභාගි විය.

v. නයිරෝබි නිවැරදි 2017 දෙසැම්බර් 4 - 6 දක්වා පැවැති එක්සත් ජාතීන්ගේ පරිසර සමුළුවේ තුන්වන සැසියට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම් අනුර දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් වූ ශ්‍රී ලංකා නියෝජිත පිරිසක් සහභාගි විය. මෙම රැස්වීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ විදේශ සබඳතා අධ්‍යක්ෂ දීපා ලියනගේ මිය, නීල හරිත ආර්ථික මුල්‍ය පහසුකමේ ප්‍රධාන විධායක නිලධාරී ධර්මකීර්ති ක්‍රිස්ටෝපර් මහින්ද තිලකසිරි හා නයිරෝබි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ අන්සුල් ජාන් මිය සහභාගි විය.

මෙම සමුළුවේදී පහත ක්‍රියාමාර්ග ගන්නා ලදී.

- සම්මුති යෝජනා දෙකකට ශ්‍රී ලංකාව සම අනුග්‍රාහකත්වය ලබාදුන්හ. පරිසර හා සෞඛ්‍ය හා සමුද්‍රීය කසළ හා ක්ෂුද්‍ර ප්ලාස්ටික් ආත සම්මුතිය.

- මෙම රැස්වීම අතරවාරයේදී, චිලි, ඕමානය හා දකුණු අප්‍රිකාව සමඟ ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ පරිසර ආරක්ෂණියේ "මුහුද පිරිසිදුකිරීමේ ව්‍යාපාරයට" සහභාගි විය.
- විධායක අධ්‍යක්ෂ එරික් සෝල්හයිම් මහතා, කර්මාන්ත හා තාක්ෂණ, තාක්ෂණික අංශයේ අධ්‍යක්ෂ, ඩෙච්ලිගියා නොරොන්හා මිය, එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ ප්‍රධාන විද්‍යාඥ පියාන් ලිව් මහතා හා අනෙකුත් නිළධාරින් අතර රැස්වීම් සඳහා මෙම දූත මණ්ඩලය පහසුකම් සැලසීය.
- ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායම විසින් නයිරෝබි හි පිහිටි එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් සැලේ වර්ක් සිව්ඩා මිය බැහැ දුටුවේය. ඔවුන් විසින් ලෝක කෘෂි වනාන්තර මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් ටොන් සයිමන් මහතා හා ඔහුගේ කණ්ඩායම මුණ ගැසීය. හරිත දේශගුණික අරමුදලේ සිට, මෙම නියෝජිත පිරිස විසින් අධ්‍යක්ෂ ආචාර්ය පේරි වෙලෙක්ස් සහ ජ්‍යෙෂ්ඨ පරිසර පද්ධති කළමනාකරණ විශේෂඥ පැට්රික් වෑන් ලාකේ මහතා ද හමු විය.

vi. 2017 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ වාසභූමි හා එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අදාළ අමාත්‍යාංශ සමඟ මෙම දූත මණ්ඩලයේ නිලධාරීන් සම්බන්ධීකරණ කටයුතු සිදුකළේය.

**4. නයිජීරියාව**

**අ. ද්විපාර්ශ්වික සබඳතා**

i. - 2017 අගෝස්තු මස පැවති ආරක්ෂක සමුළුවලට හමුදා නිලධාරීන් දෙදෙනෙකුගේ සහභාගීත්වය.

-ශ්‍රී ලංකාවේ හිටපු ඛනිජ තෙල් ගරු අමාත්‍යවරයා, නයිජීරියාවෙන් බොරතෙල් මිලදීගැනීමට ඇති හැකියාව පිළිබඳව සොයාබැලීම සඳහා නයිජීරියාවේ නියැලුන සංචාරය.

-උසස් අධ්‍යාපන හා පුහුණු කටයුතු සඳහා නයිජීරියාවේ සන්නද්ධ හමුදා නිලධාරීන් ශ්‍රී ලංකාවේ නියැලුන සංචාරය සඳහා අවශ්‍ය පහසුකම් දූත මණ්ඩලය විසින් සලසන ලදී.

ii. මහ කොමසාරිස්වරයා, විදේශ කටයුතු අමාත්‍ය, විදේශ ලේකම් හා සන්ධාන ප්‍රධානී හමුවී ශ්‍රී ලංකාවේ වර්තමාන ප්‍රවණතා පිළිබඳව ඔවුන්ව දැනුම්වත් කළේය.

1970 වර්ෂයේදී රාජතාන්ත්‍රික සබඳතා විධිමත් වුදා පටන්, දෙරට අතර ද්විපාර්ශවිය සබඳතා වඩාත් යහපත් වී ඇත. එවැනි විශිෂ්ට සබඳතාවයන් සහයෝගිතාවයේ බොහෝ නව විෂයන් ආවරණය කරමින් තවදුරටත් ශක්තිමත් වෙයි. සන්නද්ධ බලකා ද්විත්වය අතර උපායමාර්ගික සහයෝගිතාවය එක් උදාහරණයකි.

**විශේෂ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.**

i. මහ කොමසාරිස්වරයා නයිජීරියාවේ සෙනෙට් මණ්ඩලයේ සභාපතිවරයා හමුවූ අතර ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රධාන ධනාත්මක ප්‍රවනතා සම්බන්ධයෙන් ඔහු වෙත කෙටියෙන් පැහැදිලි කළේය.

ii. දූත මණ්ඩල ප්‍රධානියා විසින් විදේශ කටයුතු ලේකම්වරයා හා සන්ධාන ප්‍රධානී හමුවූ අතර ශ්‍රී ලංකාවේ සියලුම වැදගත් ප්‍රවනතා සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කළේය.

iii. එවකට ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් අමාත්‍යවරයාට නයිජීරියාවේ සංචාරයට මෙම දූත මණ්ඩලය පහසුකම් සැලසීය.

iv. වැඩිදුර පුහුණු වැඩසටහන් හා උසස් අධ්‍යාපන කටයුතු සඳහා ශ්‍රී ලංකාවේ සංචාරයක නියලීමට නයිජීරියානු හමුදා බලකායන් සඳහා මෙම දූත මණ්ඩලය විසින් කටයුතු සැලසුම් කළේය.

v. මෙම දූත මණ්ඩලය විසින් නයිජීරියානු ප්‍රවාහන අමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා සංචාරය සම්බන්ධීකරණය කළේය.

vi. නයිජීරියාවේ අබියා මණ්ඩලය හා කොළඹ වාණිජ මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට මෙම දූත මණ්ඩලය කටයුතු සැලසුම් කළේය.

vii. වාණිජ සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් අබියා මණ්ඩලයේ ව්‍යාපාරිකයන් කිහිප දෙනෙකුගේ ශ්‍රී ලංකා සංචාරය සඳහා මෙම දූත මණ්ඩලය පහසුකම් සැලසීය.

**ආ. බහු පාර්ශවීය සබඳතා**

i. නයිජීරියාව සහ ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ, පොදුරාජ්‍ය මණ්ඩලයේ, ලෝක වෙළඳ සංවිධානයේ හා නොබැඳි ව්‍යාපාරයේ සාමාජිකයෝ වෙති.

ii. මෙම ආයතන වලදී නයිජීරියාව හා ශ්‍රී ලංකාව එකිනෙකා සමඟ කටයුතු කරන අතර එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා විශාල භට පිරිසකගෙන් දායකත්වය ලබා දෙයි.

iii. මෙම කාලසීමාව තුළදී සහයෝගය ලබා දීමේ පරමාර්ථයෙන් විවිධ එක්සත් ජාතීන්ගේ ඡන්ද විමසීම්වලදී එකිනෙකාගේ අපේක්ෂකයන් සඳහා නයිජීරියාව හා ශ්‍රී ලංකාව සහයෝගය ලබා දුන්හ.

**ඇ. ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන**

i. මහ කොමසාරිස් කාර්යාලය, ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයට වසර 150ක් සපිරීම නිමිත්තෙන් උත්සව සංවිධානය කරන ලද අතර ලංකා තේ පිළිබඳව නයිජීරියාවේ දී දැනුම්වත් කිරීමකද නියැලුනේය.

ii. ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සම්බන්ධයෙන් පරිපූර්ණ වෙළඳපළ සමීක්ෂණයක දූත මණ්ඩලය නියැලුනේය. නයිජීරියාවේදී ශ්‍රී ලාංකික නිෂ්පාදන ප්‍රචලිත කිරීම සඳහා ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට සහාය ලබාදීමක් වශයෙන් මෙය සංවිධානය කරන ලදී.

iii. 2014 දී දෙරට අතර සමස්ථ වෙළඳාම එක්සත් ජනපද ඩොලර් මිලියන 4 ක් වූ අතර පසුගිය වර්ෂ දෙක තුළදී නයිජීරියාවේ ආර්ථික අවපාතයන් පැවතියත් සමස්ත වෙළඳාම එක්සත් ජනපද ඩොලර් මිලියන 9 ට කිට්ටු වී ඇත.

iv. ව්‍යාපාරික, සංචාරක, අධ්‍යාපන සහ වෛද්‍ය ප්‍රතිකාර සඳහා නයිජීරියානු ජාතිකයින් 1000 ක් පමණ ශ්‍රී ලංකාවේ සංචාරය කර ඇත.

v. ශ්‍රී ලංකාවේ තේ පිළිබඳව වසර 150 සැමරීම සංවිධානය කිරීමේදී මෙම දූත මණ්ඩලය උපකාරී විය.

vi. මෙම මහ කොමසාරිස් කාර්යාලය විසින් පරිපූරක වෙළඳපල සමීක්ෂණයක් සිදුකළ අතර අපනයන සංවර්ධන මණ්ඩලය වෙත වාර්තාවක් යවන ලදී.

vii. සලකා බැලීම සඳහා දෙරට අතර ඒකාබද්ධ කොමිසමක් වෙනුවෙන් මෙම දූත මණ්ඩලය විසින් යෝජනාවක් ඉදිරිපත් කළ අතර ප්‍රතිචාරයක් බලාපොරොත්තුවෙන් සිටියි.

viii. මෙම දූත මණ්ඩලය වෙළඳ පරීක්ෂණ 25 කට අධික ප්‍රමාණයකට ප්‍රතිචාර දක්වන ලදී. එම නිසා ඇතැම් නයිජීරියානු වෙළෙඳුන් විසින් ශ්‍රී ලාංකික අපනයනකරුවන් සමඟ සාර්ථක වෙළඳ ගනුදෙනු සිදුකරන ලදී. උදාහරණයක් ලෙස, මෙම දූත මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ බිස්කට් හා තේ ආනයනය කිරීමට නයිජීරියානුවෙකුට සහය දැක්විය.

ix. මහ කොමසාරිස්වරයා විසින් නයිජීරියානු කෝටිපතියකු හා ආයෝජකයකු වූ දන්ගොට් මහතා හමුවූ අතර ශ්‍රී ලංකාවේ පවතින ධනාත්මක ආයෝජන වාතාවරණය සම්බන්ධයෙන් ඔහුට කරුණු පැහැදිලිකරමින් ශ්‍රී ලංකාවේ ආයෝජනය සිදුකරන මෙන් කියා සිටියේය.

x. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ සමහරක් වෘත්තිකයන් බඳවා ගැනීම සඳහා ඔහු සිය කැමැත්ත පළකර සිටියේය. සැබැවින්ම පළමු පියවර ලෙස ඇතැම් ශ්‍රී ලාංකික ඉංජිනේරුවන් බඳවා ගැනීම සඳහා කටයුතු සිදුකරමින් යයි.

xi. ශ්‍රී ලාංකික වෘත්තිකයන් බඳවා ගැනීමේ අරමුණින්, දන්ගොට් කණ්ඩායම විසින් කෙටි කලකින් ශ්‍රී ලංකාවේ වෙළඳ දැන්වීම් පළකරනු ඇත.

**ඈ. සංස්කෘතික සබඳතා**

i. මෙම සම්බන්ධතා ස්වරූපය මෙතෙක් ආරම්භක අවධියේ පවතින අතර මෙතෙක් පූර්ණ ශක්තිමත් භාවයට එළඹී නොමැත. ශ්‍රී ලාංකිකයකු විසින් සංවිධානය කළ කලා ප්‍රදර්ශනයක් සඳහා මහ කොමසාරිස්වරයා සහභාගි විය. මෙය බොහෝ මාධ්‍ය අවධානයට පාත්‍ර විය.

ii. මෙම දූත මණ්ඩලය විසින් නයිජීරියාව සමඟ සංස්කෘතික ගිවිසුමක් යෝජනා කර ඇත. මෙම රාමුගත ගිවිසුම ස්ථාපනය කළ විගස, ශ්‍රී ලාංකික සංස්කෘතියේ සාරවත් බව හා විවිධත්වය නිරාවරණය කිරීමට ඇතැම් සංස්කෘතික ක්‍රියාකාරකම් සිදුකරනු ඇත.

iii. රටක් බාහිර ලෝකය වටහාගන්නා ආකාරය කෙරෙහි සංස්කෘතිය හා කලාව ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි. එමනිසා, අනාගතයේදී සංස්කෘතික උපායමාර්ගය වඩාත් ප්‍රබල උපකරණයක් ලෙස භාවිත කිරීමට මෙම දූත මණ්ඩලය බලාපොරොත්තු වෙයි.

ඉ. **කම්කරු සුභසාධනය**

i. නයිජීරියාවේ, ශ්‍රී ලාංකික සේවකයෝ විශාල සංඛ්‍යාවක් සේවයේ නොයෙදෙති. නොගෙවූ වැටුප් ලබාගැනීම සඳහා මෙම දූත මණ්ඩලය මැදිහත් වූ අවස්ථා අල්පය. අතරමං වූ කිහිපදෙනෙකු නැවත ශ්‍රී ලංකාවට යැවීම සඳහා අවස්ථා කිහිපයක දී පහසුකම් සැලසීය.

ii. අවස්ථා දෙකකදී අතරමං වූ යාත්‍රිකයන් කීපදෙනෙකු බෙනින් හි සිට ශ්‍රී ලංකාවට එවීමට අවශ්‍ය සියලුම කටයුතු මෙම දූත මණ්ඩලය විසින් ඉටු කරන ලදි.

iii. නයිජීරියාවේ ශ්‍රී ලාංකිකයන් 50ක් පමණ පදිංචිව සිටිති. ඔවුන්ගේ බොහෝ දෙනෙක් වෘත්තිකයන් වන අතර ආගන්තුක සත්කාර හා ඉදිකිරීම් කර්මාන්තයේ ඔවුන් සේවයේ නිරතව සිටිති.

iv. මෙම කාලය තුලදී එවැනි සහයෝගයක් අවශ්‍ය වූ අවස්ථාවන්හිදී මෙම දූතමණ්ඩලය ඔවුන් වෙත සහයෝගය ලබා දුන්හ. අවස්ථාවන් කිහිපයකදී මෙම දූත මණ්ඩලය මැදිහත් වී ඇති අතර සිය නොගෙවූ අයවිය යුතු වැටුප ලබා ගැනීම සඳහා ඔවුන්ට උදව් කරන ලදී.

v. අනෙකුත් අවස්ථාවන් හිදි ඇතැම් අතරමං වූ ශ්‍රී ලාංකිකයන් සිය රටට ගෙන්වා ගැනීමට හා ඔවුන් වෙත රැකියා අවස්ථා සොයා ගැනීමට මෙම දූතමණ්ඩලය පහසුකම් සැලසීය.

vi. මෙම දූත මණ්ඩලය විසින් අවස්ථාවන් දෙකකදී බෙනින් හි අතරමං වූ ශ්‍රී ලාංකික නැවියන් සිය රටට ගෙන්වන ලදී. 2017 දී මහ කොමසාරිස් කාර්යාලය මගින් බටහිර අප්‍රිකාවේ අතරමං වූ සරණාගතයින් 5 දෙනෙක් පමණ සිය රටට ගෙන්වා ගත්හ.

5. **සීෂෙල්ස්**

අ. **ද්විපාර්ශ්වික සබඳතා**

i. සීෂෙල්ස් හි ජනාධිපති අතිගරු ඩැනී ෆවුරේ මැතිතුමා ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නියැලුන අතර එහිදී සංචාරක කටයුතු, කෘෂිකර්මය, ධීවර, අධිකරණ හා නීති කටයුතු යන ක්ෂේත්‍රවල සහයෝගීතාව වැඩි දියුණු කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සමඟ සාකච්ඡා පැවැත්වීය.

ii. සීෂෙල්ස් හි උප ජනාධිපති ගරු වින්සන්ට් මෙරිටොන් මැතිතුමා මත්ද්‍රව්‍ය ජාවාරම, කලාපීය ආරක්ෂාව, අධ්‍යාපනය, සංචාරක කටයුතු හා නීතිය හා සාමය වැනි මාතෘකා පිළිබඳව ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා සමඟ සාකච්ඡා පැවැත්වීය. මේ සම්බන්ධව ඒකාබද්ධ කොමිෂන් සභාවක් පත් කරන ලෙස සීෂෙල්ස් උප ජනාධිපතිතුමා කළ ඉල්ලීමට එකඟතාව පළවිණි.

iii. 2017 පැවති එක්සත් ජාතීන්ගේ වෙසක් දින සැමරුම් සඳහා සහභාගී වීමට යෞවන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය ඉඩින් ඇලෙක්සැන්ඩර් මැතිණියගේ ප්‍රධානත්වයෙන් යුතු සීෂෙල්ස්හි නියෝජිත කණ්ඩායමක් ශ්‍රී ලංකාවට පැමිණියේය.

ආ. බහුපාර්ශ්වීය සබඳතා

i. ශ්‍රී ලංකාවේ කොළඹ පැවති 2 වැනි ඉන්දියානු සාගර සමුළුවට (IOC) සහභාගී වීම සඳහා සීෂෙල්ස්, මුරුසිය හා මැඩගස්කරය යන රටවලින් ඉහළ පෙළේ නියෝජිත කණ්ඩායමක් ශ්‍රී ලංකාවට පැමිණියේය.

ii. සෝමාලියා වෙරළෙන් ඔබ්බෙහි වූ කොල්ලකෑම පිළිබඳ 20 වන කණ්ඩායම් රැස්වීම සඳහා මහ කොමසාරිස්වරයා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී විය.

ඇ. ආර්ථික සබඳතා හා විදේශීය ආයෝජන

i. සතියකට සිව් වතාවක් ශ්‍රී ලංකාව වෙතට මෙහෙයවනු ලබන සෘජු ගුවන් ගමන් භාවිතා කරමින් සංචාරක කටයුතු/ ශ්‍රී ලංකාවේ පාර්ශ්වකාර රෝහල් සමඟ එක්ව බෞද්ධ සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම.

ii. සීෂෙල්ස්හි සෞඛ්‍ය අමාත්‍යංශය විසින් පූර්ණ වශයෙන් ශ්‍රී ලංකාවට අයත් "ෆියුචර් හෝල්ඩින්ග්ස්" නම් සීමාසහිත සමාගම විද්‍යාගාර කටයුතු පිටතින් කරවා ගැනීම සඳහා පහසුකම් සැලසීමට පත්කරනු ලැබීම.

iii. වෛද්‍ය, සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා, සීමාසහිත ද මෙඩිකල් ටුවරිසම් සමාගම, සීෂෙල්ස් හි සෞඛ්‍ය අමාත්‍යංශය සමඟ එක්ව ශ්‍රී ලාංකික වෛද්‍ය විශේෂඥයින් යොදා ගනිමින් එහි රෝගීන් සඳහා නොමිලයේ සායන රැසක් පැවැත්වීම සංවිධානය කිරීම.

iv. සීමාසහිත හේමාස් රෝහල් හා සීමාසහිත මෙඩිකල් ටුවරිසම් සමාගම එක්ව සීෂෙල්ස්හි එක්ස් කිරණ තාක්ෂණවේදීන් දෙදෙනෙකුට සති දෙකක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පුහුණුවක් ශ්‍රී ලංකාවේදී ලබාදීම.

v. ශ්‍රී ලංකාවේ හා සීෂෙල්ස් හි ව්‍යාපාරිකයින් විසින් අත්සන් තබන ලද කේවල ව්‍යාපාරික ගිවිසුම් (ශ්‍රී ලංකාවේ මිනිස් බලය බඳවා ගැනීම, කෘෂිකාර්මික හා ඉදිකිරීමේ යන්තසූත්‍ර/ උපකරණ සීෂෙල්ස් වෙත අපනයනය කිරීම හා කුලී පදනම මත ලබාදීම, පරිභෝජනය කළ හැකි හා ගෘහයන්ට අවශ්‍ය වන නිෂ්පාදන සීෂෙල්ස් වෙත ආනයනය කිරීම හා තොග බෙදාහැරීම, දේශීය ධීවරයින්ගෙන් නිෂ්පාදන මිලට ගැනීම සඳහා සහ ශ්‍රී ලාංකික වෙළඳ සමාගමක් හරහා ශ්‍රී ලංකාවට අපනයනය කිරීමට අයිස් පිරියතක් සහ ශීතකරණ කාමර සංකීර්ණයක් සහිත දේශීය ධීවර කලාපයක් ඇතිකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම).

vi. වෙළෙඳ හා ව්‍යාපාර කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය ගරු දයා ගමගේ මැතිතුමාගේ නායකත්වයෙන් යුතු නියෝජිත කණ්ඩායමක් මැඩගස්කරයේ නියලුන සංචාරය සඳහා දූත මණ්ඩලය විසින් පහසුකම් සලසන ලදී.

ඈ. සංස්කෘතික සබඳතා

i. කොළඹ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ආරියරත්න කලුආරච්චි මැතිතුමාගේ නායකත්වයෙන් යුතු වෘත්තීය නැටුම් ශිල්පී කණ්ඩායමක් විසින් මෙම වසරේ නිදහස් දින සැමරුම්වලදී සාම්ප්‍රදායික නැටුමක් ඉදිරිපත් කරන ලදී.

ii. කොළඹ සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ සිතුවම් කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානී හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු විසින් සීෂෙල්ස්හි සිතුවම් හා මෝස්තර පිළිබඳ ආයතනයේ (JIAD) ශිෂ්‍ය ශිෂ්‍යයාවන් සඳහා එක් සතියක විශේෂ වැඩමුළුවක් පවත්වන ලදී.

iii. සීෂෙල්ස් හි බෞද්ධ සංගමය විසින් සංවිධානය කරන ලද භාවනා වැඩසටහන ඇතුළුව ශ්‍රී ලාංකික බෞද්ධ භික්ෂුන්වහන්සේලාගේ සහභාගීත්වයෙන් වෙසක් සහ පොසොන් පෝය දිනවලදී සීෂෙල්ස් හිදී ආගමික කටයුතු පවත්වන ලදී.

**ඉ. කම්කරු සුභසාධනය**

i. සීෂෙල්ස් හි සිටින ශ්‍රී ලාංකික ශ්‍රම බලකායේ සුභසාධනය තහවුරු කරලීම සඳහා මහ කොමසාරිස් කාර්යාලය රැකියා අමාත්‍යංශය සමඟ සමීපව කටයුතු කළේය.

ii. ශ්‍රී ලාංකික ශ්‍රම බලකාය සීෂෙල්ස් වෙත බඳවාගැනීමේ ප්‍රධාන පෙළේ සමාගමක් සමඟ ගිවිසුමකට අත්සන් තබන ලදී.

**6. දකුණු අප්‍රිකාව**

**අ. ද්විපාර්ශ්වික සබඳතා**

i. - කේප් ටවුන් හි පැවති පාර්ලිමේන්තු උත්සවය සමාරම්භ කිරීම.

- දකුණු අප්‍රිකාවේ විදේශ අමාත්‍යවරයා විසින් සහභාගීත්වය උසුලන "ඩිප්ලොමැටික් බ්‍රන්ච්" හා වාර්ෂික "ubuntu" සම්මාන උළෙල.
- ආසියානු දූත මණ්ඩල ප්‍රධානීන්ගේ රැස්වීම.
- ප්‍රිටෝරියාහි විදේශ දූත මණ්ඩල හා ප්‍රිටෝරියා විශ්වවිද්‍යාලය මඟින් සංවිධානය කරන ලද ජාතික දින උත්සව සංස්කෘතික අංග.
- දකුණු අප්‍රිකාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු මයිටේ න්කොආනා මෂබේන් මහතාගේ ආරාධනයෙන් කේප් ටවුන්හිදී පැවති අයවැය කථාව.
- අප්‍රිකා ජාතික කොන්ග්‍රසය (ANC) හා දකුණු අප්‍රිකාවේ ජනාධිපතිතුමා විසින් පවත්වන ලද උත්සවය අංගයක්.
- ජාත්‍යන්තර සබඳතා හා සහයෝගීතා දෙපාර්තමේන්තුවේ (DIRCO) ගරු අමාත්‍ය මයිටේන්කොආනා මෂබේන් මැතිතුමා විසින් සංවිධානය කරන ලද පුමලන්ගා ප්‍රාන්තයේ පැවති "නෙල්සන් මැන්ඩෙලා" දිනය සඳහා මහ කොමසාරිස් කාර්යාලය සහභාගී විය.

ii. ජ්‍යෙෂ්ඨ නිලධාරී මට්ටමින් පවත්වන ලද පාර්ශ්වකාර සංසදයේ හයවැනි වටය 2017 අප්‍රේල් 07 වැනි දින වික්ටෝරියාහි දී පවත්වන ලදී.

iii. දකුණු අප්‍රිකාවේ විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුවේ විදේශ ද්විපාර්ශවික සහයෝගීතාව පිළිබඳ අධ්‍යක්ෂවරයා, 2017 ජූලි මස ශ්‍රී ලංකාවට පැමිණියේය.

iv. ශ්‍රී ලංකාව හා දකුණු අප්‍රිකාව අතර ද්විපාර්ශ්වික සබඳතා සම්බන්ධයෙන් උබුන්ටු ගුවන් විදුලියේ සම්මුඛ සාකච්ඡාවකට මහ කොමසාරිස්වරයා සහභාගී විය.

## ආ. බහුපාර්ශ්වීය සබඳතා

i. බහුපාර්ශ්වීය සබඳතා වැඩිදියුණු කිරීමේ අරමුණින්, එක්සත් රාජධානියේ මහ කොමසාරිස්වරයා විසින් පවත්වන ලද පොදු රාජ්‍ය මණ්ඩලයීය දින සැමරුම්වලට මහකොමසාරිස්වරයා සහභාගී විය. ප්‍රිටෝරියාහි පැවති 8 වැනි ප්‍රංශ ජාතිකයන්ගේ උළෙලේදී පවත්වන ලද පිළිගැනීමේ උත්සවයට සහභාගී විය.

ii. සියලුම සංක්‍රමණික සේවකයින්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ කමිටුව - (2018-2020) සඳහා ශ්‍රී ලංකාවේ අපේක්ෂකත්වය සම්බන්ධයෙන් තොරතුරු පල කර හරින ලදී.

iii. ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධාන (IORA) රැස්වීම්වලට ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සඳහා සුදානම් වීමේ කටයුතු (2017 ඔක්තෝම්බර් 17-22 දිනවලදී දකුණු අප්‍රිකාවේ ඩර්බන් නුවරදී පැවති අමාත්‍යංශ ජ්‍යෙෂ්ඨ නිලධාරින්, ව්‍යාපාරික සංසදය සහ විද්වත් සංසදය) පවත්වන ලදී.

## ඇ. ආර්ථික සබඳතා හා විදේශීය ආයෝජන

i. - ජොහැන්නස්බර්ග් හිදී පැවති වෙළෙඳ හා ආයෝජන ප්‍රවර්ධන සමුළුව.

- "Hostex 2017 හා SAITEX-2017" යන ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශන.
- ප්‍රිටෝරියා හිදී පැවති ලංකා තේ රසබැලීමේ හා නියැදි ලබාදීමේ ප්‍රවර්ධන වැඩසටහන.
- ලංකා තේ කර්මාන්තයට වසර 150ක් සපිරීම නිමිතිකොටගෙන ඩර්බන්හිදී පවත්වන ලද ගෝලීය තේ සාදය.
- සැන්ඩ්ටන් හිදී පවත්වන ලද ලංකා තේ ප්‍රවර්ධන සතිය.
- 2017 ජූලි 26 වන දින ජොහැන්නස්බර්ග් වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේදී "ශ්‍රී ලංකාව සමඟ ව්‍යාපාරවල නිරතවීම" මැයෙන් පැවති සමුළුවක් දූත මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී.

ii. ශ්‍රී ලාංකික සමාගම් 6කට දකුණු අප්‍රිකාවට යාමටත් දකුණු අප්‍රිකානු සමාගම් 4කට ශ්‍රී ලංකාවට ඒමටත් මෙම දූත මණ්ඩලය විසින් පහසුකම් සලසන ලදී.

iii. ප්‍රදර්ශන 10ක් ප්‍රවර්ධනය කරන ලද අතර ශ්‍රී ලාංකික මෙන්ම දකුණු අප්‍රිකානු සමාගම් වලින් ලද වෙළෙඳ හා ආයෝජන විමසුම් 24කට පිළිතුරු ලබාදෙන ලදී.

iv. සීමාසහිත Curringee Export සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂ හෙක්මැට් කරින්ගී මහතා හමුවූ මහ කොමසාරිස්වරයා දකුණු අප්‍රිකාව හා ශ්‍රී ලංකාව අතර අපනයනය හා ආනයනය පිළිබඳව සාකච්ඡා පැවැත්වීය.

v. දකුණු අප්‍රිකානු තානාපති කාර්යාලය මඟින් 2017 අගෝස්තු 3 දින සංවිධානය කරන ලද ව්‍යාපාරික සංසදයකදී මහ කොමසාරිස්වරයා ශ්‍රී ලංකාව නියෝජනය කළේය.

**ඈ. සංස්කෘතික සබඳතා**

i. ජොහැන්නස්බර්ග් (තායිලන්ත) බෞද්ධ භාවනා මධ්‍යස්ථානය (JMC), ශ්‍රී ලාංකික ප්‍රජාව සමඟ එක්ව සංවිධානය කරනු ලබන සියලුම වැඩසටහන්වලට මහ කොමසාරිස්වරයා සහභාගී විය.

ii. ශ්‍රී ලාංකිකයන් හා රාජ්‍යතාන්ත්‍රික ප්‍රජාව සඳහා ජාතික දින උත්සවයක් සංවිධානය කරන ලදී.

iii. වෙසක් දින නිමිත්තෙන් ආගමික/ සංස්කෘතික උත්සවයක් සංවිධානය කරන ලදී.

iv. එහි පැමිණි පාසැල් ක්‍රිකට් කණ්ඩායම වෙනුවෙන් කේප්ටවුන් හිදී පවත්වන ලද උත්සවයකට මහ කොමසාරිස්වරයා සහභාගී විය.

v. ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික කලත්‍රයින්ගේ සංගමය (IDSA) මගින් සංවිධානය කරන ලද ප්‍රිටෝරියාහි පැවති "පුණ්‍යායතන බසාර්" සඳහා දූත මණ්ඩලය සහාය විය. ලංකා තේ ප්‍රවර්ධනය කිරීම සඳහා තේ වෙළෙඳ කුටියක් සංවිධානය කරන ලදී.

vi. "ක්‍රිකට් සවුත් ඇෆ්රිකා" විසින් සංවිධානය කරන ලද සම්මාන ප්‍රදානය කිරීමේ උත්සවයකට 2017 මැයි මස සහභාගී විය.

vii. අධිකරණ හා වැරදි නිවැරදි කිරීමේ සේවා අමාත්‍යාංශය මමෙලොඩි සුසානභූමියේදී ආරම්භ කරන ලද පරික්ෂණ සඳහා මෘත දේහ ගොඩගැනීමේ ව්‍යාපෘතියට මහ කොමසාරිස්වරයා සහභාගීවිය. මෙම මෘතදේහ යළිත් වරක් ගොඩගන්නා ලද්දේ සත්‍ය හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිෂන් සභාවේ ක්‍රියාපටිපාටිය යටතේය. ශ්‍රී ලංකාවේ දී මීට සමගාමීව මෙම කොමිෂන් සභාව ක්‍රියාත්මක වෙයි.

**ඉ. වෙනත්**

i. ඇන්ගෝලාව, ස්වාසිලන්තය, මොසැම්බික් හා මලාවි යන රටවල් සඳහා මහ කොමසාරිස්වරයා අක්තපත්‍ර ප්‍රදානය කළේය.

ii. ස්වාසිලන්ත රජතුමා විසින් පවත්වන ලද උත්සවයකට මහ කොමසාරිස්වරයා සහභාගී විය.

****

# කොන්සියුලර් අංශය

## කොන්සියුලර් අංශය

1. මෙරට තුල හා විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකික පුරවැසියන්ට සහයෝගය ලබා දෙන විදේශ කටයුතු අමාත්‍යාංශයේ මහජන මුහුණත කොන්සියුලර් අංශයයි.

2. 1981 අංක 04 දරණ කොන්සියුලර් කාර්යය පනත හා අනතුරුව 2006 අංක 18 දරණ සංශෝධන පනතට අනුව, මෙම අංශයේ තානාපති කාර්යාල, මහ කොමසාරිස් කාර්යාල, කොන්සියුලර් ජනරාල් කාර්යාල, විදේශයන්හි පිහිටි නිර්වේතනික කොන්සියුලර් කාර්යාල මෙන්ම අනෙකුත් දේශිය හා විදේශිය ආයතන/බලධාරීන් ඔස්සේ විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ අයිතිවාසිකම් හා අභිලාෂයන් ආරක්ෂා කිරීම හා සිය රටට ගෙන්වාගත් ශ්‍රී ලාංකිකයන්ගේ සුභ සාධනය තහවුරු කිරීම මෙම කොන්සියුලර් කටයුතු අංශයේ අපේක්ෂාවයි.

3. නෛතික ලිපිලේඛන සත්‍යාපනය කිරීම ආශ්‍රිත සේවාවන්, විදේශයන්හි අතරමං වූ ශ්‍රී ලාංකිකයන් සියරටට ගෙන්වා ගැනීම, ඥාතීන්ගේ මිනිස් දේහයන් ගෙන්වා ගැනිම හා විදේශයන්හි දී ආපදාවට ලක් වූ හෝ වින්දිතයන් සඳහා වන්දි ලබාදීම සඳහා එක් එක් වැඩකරන දිනයන් හිදී ආසන්න වශයෙන් පුද්ගලයන් පන් සියයක් පමණ කොන්සියුලර් කටයුතු අංශයට පැමිණෙති. කොන්සියුලර් අංශය මගින් 2017.01.26 දින යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ප්‍රාදේශීය කාර්යාල විවෘත කරන ලදී. එම නිසා, උතුරේ පදිංචි මහජනතාව සඳහා කොළඹට නොපැමිණ කොන්සියුලර් සේවාවන් ලබාගත හැකිය. හඳුනාගත් ප්‍රධාන අංශ පහක් (5) ක් ඔස්සේ කොන්සියුලර් කටයුතු අංශය මගින් එහි කොන්සියුලර් කාර්යයන් සිදුකරයි. එනම් (1) ලිපි ලේඛන සත්‍යාපනය කිරීම, (2) සිය රටට ගෙන්වා ගැනීමේ අංශය, (3) වන්දි අංශය, (4) මරණ අංශය, (5) විවිධ කටයුතු අංශයයි.

### (අ) ලිපි ලේඛන සත්‍යාපනය කිරීමේ අංශය

1. විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් කටයුතු අංශයේ ලිපි ලේඛන සත්‍යාපනය කිරීමේ අංශය යනු, විවිධ ලිපි ලේඛන විදේශයන්හි භාවිත කිරීම සඳහා එම ලිපි ලේඛන සත්‍යාපනය කර ගැනීම සඳහා දෛනිකව විශාල පුද්ගලයන් පිරිසක් පැමිණෙන ප්‍රමුඛ පෙළේ අංශයකි. මහජනතාව වෙත ගුණාත්මක හා සීඝ්‍රගාමී සේවා ලබාදීම සඳහා මෙම අංශය මගින් විද්‍යුත් ලිපි ලේඛන සහතික කිරීමේ ක්‍රමයක් හඳුන්වා දී ඇත.වැඩි වශයෙන් සත්‍යාපනය කෙරෙන ලිපි ලේඛන අතර උපත්,විවාහ, මරණ, වෛද්‍ය, අධ්‍යාපන සහතික ආදිය පවතියි. මෙම අංශය මගින් සත්‍යාපනය කරන ලිපි ලේඛන අතර පොලිස් නිශ්කාෂණ වාර්තා, දිවුරුම් පෙත්සම්, ඇටෝනි බලපත්‍ර නෛතික හා වාණිජ ලිපි ලේඛන පවතියි.

2. සතියේ දිනවල දෛනිකව අයදුම්කරුවන් 600 කට අධික පිරිසක් කොන්සියුලර් අංශයට පැමිණෙන අතර ලිපි ලේඛන 1000 කට අධික ප්‍රමාණයක් සහතික කරයි. 2017 පෙරවාරි 06 දින හඳුන්වාදුන් විද්‍යුත් මාධ්‍යයෙන් ලිපි ලේඛන සහතික කිරීමේ ක්‍රමය ((e-DAS) ඔස්සේ නවෝත්පාදන ඩිජිටල් තාක්ෂණය භාවිත කරමින්, මෙම සත්‍යාපනය කිරීමේ අංශය මගින් ලිපි ලේඛන සහතික කිරීමේ සේවය ලබා දෙයි.

3. 2017 නොවැම්බර් මාසයේදී, 7 වැනි ඉ-ස්වාභිමානි 2017 ත්‍යාග ප්‍රදානෝත්ස්වයේදී "රජය සහ පුරවැසි සබඳතා" කාණ්ඩය යටතේ විද්‍යුත් මාධ්‍යයෙන් ලිපි ලේඛන සහතික කිරීමේ

ක්‍රමය (e-DAS) සඳහා සම්මානයක් දිනාගත්හ. රාජ්‍ය අංශයේ වඩාත්ම කැපී පෙනෙන තොරතුරු සන්නිවේදන තාක්ෂණ ජයග්‍රාහණ සම්මානය මෙම විද්‍යුත් මාධ්‍යයෙන් ලිපි ලේඛන සහතික කිරීමේ ක්‍රමය (e-DAS) වෙනුවෙන් පිරිනමන ලදි. තවද 19 වැනි වඩාත්ම ගුණාත්මක ජාතික තොරතුරු සන්නිවේදන තාක්ෂණ සම්මාන ප්‍රධානෝත්සවයේදී රාජ්‍ය සහ පුද්ගලික අංශයේ කාණ්ඩය යටතේ රන් සම්මානය පිරිනැමූ අතර ඩිජිටල් රාජ්‍යයක් සඳහා ආසියානු කලාපයේ පරිගණක කර්මාන්ත සංවිධානයට හිමි සම්මානයද දිනාගන්නා ලදි.

4. ලිපි ලේඛන සත්‍යාපනය කිරීම සඳහා රජය මගින් කවුන්ටරයකට අමතරව ණයවර /බැරපත් වලින් ගෙවීමේ ක්‍රමයක් ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ආයතනවල පළමු වතාවට හඳුන්වාදුනි. මහජනයා විසින් මෙම ක්‍රමය පුළුල් ලෙස ඇගයීමට ලක් කර ඇත.

5. 2017 ජනවාරි 1 වන දින සිට 2017 සැප්තැම්බර් 30 දක්වා කාලසීමාව සඳහා ආසන්න වශයෙන් ශ්‍රී ලංකා රුපියල් 88,865,605.00 ක (යාපනය ප්‍රාදේශීය කාර්යාලය ද ඇතුළුව) සමස්ත ආදායමක් සත්‍යාපනය කිරීමේ අංශය වෙත ලැබී ඇති අතර අදාළ කාලසීමාව තුළදී ආසන්න වශයෙන් සත්‍යාපනය කළ ලිපි ලේඛන ගණන 197,755 කි.

**(ආ) සිය රටට පෙරළා ගෙන්වා ගැනීමේ අංශය**

6. විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් කටයුතු අංශයේ සිය රටට පෙරළා ගෙන්වා ගැනීමේ අංශයේ ප්‍රධාන වගකීම වනුයේ ළඟම ඥාතීන්ගේ ඉල්ලීම මත, අතරමං වූ සිරගත කළ, හා පිටුවහල් කරන ලද ශ්‍රී ලාංකිකයන් සිට රටට ගෙන්වා ගැනීමට කටයුතු කිරීමයි. ශ්‍රී ලංකාවට ඔවුන් කළින් නිදහස් කර ගැනීමට / සිය රටට පෙරළා ගෙන්වා ගැනීමට පහසුකම් සැලසීම සඳහා අදාළ බලධාරීන් සමඟ සම්බන්ධීකරණය සිදුකිරීමට විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ කාර්යාල වලට උපදෙස් ලබා දෙමින්, ඔවුන් සිට රටට ගෙන්වා ගැනීමට පියවර ගැනීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සියරටට ගෙන්වා ගැනීමේ අංශය මැදිහත් වෙයි.

7. ගිවිසුම් කාලසීමාව සම්පූර්ණ නොකර හා /හෝ රැකියා ගිවිසුම් සහ රටේ නීතිය උල්ලංඝණය කරමින් සේවා යෝජකයාගෙන් පලායන සංක්‍රමණික ශ්‍රමිකයන් සිට රටට ගෙන්වා ගැනීමේදී සිට රටට ගෙන්වා ගැනීමේ අංශය අපහසුතාවයන්ට මුහුණපායි. මෙම සන්දර්භය තුළදී, ශ්‍රී ලංකාව සහ ඉරානයේ ඉස්ලාමීය ජනරජය අතර ද්විපාර්ශවීය සිරකරුවන් හුවමාරු කර ගැනීමේ ගිවිසුමක් අත්සන් කළ අතර දෙරට අතර දඬුවම් නියමු පුද්ගලයන් හුවමාරු කර ගැනීමට පහසුකම් සලසමින් එහි බලකාය කටයුතු කරමින් සිටිති.

8. තවද, විදේශයන් හිදී විවිධ වැරදි සිදු කිරීම වෙනුවෙන් සිරගත කළ හෝ දඬුවම් ලබාදුන් ශ්‍රී ලාංකිකයන්ගේ ළඟට ඥාතීන්ගෙන් මෙම අංශයට අභියාචනා ලැබෙයි. කොන්සියුලර් කටයුතු අංශය විසින් අදාළ බලධාරීන් සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සඳහා විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට වරින් වර උපදෙස් ලබාදෙන අතර, නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට හා ඔවුන් කලින් නිදහස් කර ගැනීමට පහසුකම් සලසයි.

9. මෙම නඩුවලින්, අතරමංවූ ශ්‍රී ලාංකිකයන් 102 ක් හා සිරගත කළ ශ්‍රී ලාංකිකයන් 48 ක් 2017 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා සිය රටට ගෙන්වා ගත්හ. මීට අමතරව, 2017 ජූලි මාසයේදී

පිළිවෙලින් කුවේට් හා ලෙබනනයෙන් සංක්‍රමණික ශ්‍රමිකයන් 51 ක් හා 33 ක් සිය රටට ගෙන්වා ගත්හ.

10. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී නොමැති, ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන් සිය රටට ගෙන්වා ගැනීමට බලය ලබා දී තිබුණත්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් අවශ්‍ය සහය ලබා ගැනීමට අපොහොසත් වූ ළඟම ඥාතීන්ගේ ඉල්ලීම මත මානුෂීය හේතුන් මත විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ලබාදී ඇති බලයට එහා යමින් සිට රටට ගෙන්වා ගැනීමේ අංශය මගින් සිය රටට ගෙන්වා ගැනීමේ කටයුතු සිදුකර ඇත.

11. 2017 මාර්තු මාසයේදී, සෝමාලියානු මුහුදේදී සෝමාලියානු කැරලිකරුවන් කණ්ඩායමක අත්අඩංගුවේ සිටි ශ්‍රීලාංකික නාවික කණ්ඩායම් සාමාජිකයන් නිදහස් කර ගැනීම සඳහා කොන්සියුලර් අංශය විසින් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

12. සිය රැකියා ගිවිසුම නොපිළිපදිමින් ශ්‍රමිකයන් සිය රටට ගෙන්වා ගැනීමේ අසීරු කටයුත්තට කොන්සියුලර් කටයුතු අංශය මුහුණපායි. සිය නෛතික ගිවිසුමට පරිබාහිරව ඔවුන් විසින් රැකියාවන් අපේක්ෂා කරන බැවින් ඔවුන් නිතරම රටේ නීතිය උල්ලංඝණය කරති. එමනිසා, වීසා රෙගුලාසි හෝ ගිවිසුම්ගත රැකියා නීතිය උල්ලංඝණය කිරීම වෙනුවෙන් අදාළ නිලධාරීන් විසින් මෙම ශ්‍රමිකයන්ට චෝදනා ගොනු කරන අතර සිරගත කිරීමට දඬුවම් නියම කරයි.

13. තවද, සිය රටට ගෙන්වූ ශ්‍රීලාංකිකයන් අතර මිනිස් ජාවාරමට හසු වූ වින්දිතයන් කිහිප දෙනෙක් සිටිති. මිනිස් ජාවාරම් සිද්ධි අතර, එක්සත් අරාබි එමීර් රාජ්‍ය හරහා ඕමානය වෙත බොහෝ මිනිස් ජාවාරම් සිදුවෙයි.

14. ශ්‍රී ලාංකිකයකු විසින් ගිවිසගත් රැකියා කොන්ත්‍රාත් කාලසීමාව සම්පූර්ණ කර නොමැති නම්, අනුග්‍රාහකයාගේ එකඟතාවය සමඟ පමණක් සිය රටට ගෙන්වා ගැනීමේ ක්‍රියාවලිය සිදුවිය හැකිය. ගිවිසගත් කාලසීමාවට පෙර සේවකයකු ආපසු පැමිණීමේදී සේවකයා බඳවාගැනීම සඳහා දරා ඇති වියදම් අනුග්‍රාහකයන් විසින් නිතරම ඉල්ලා සිටින බවට සඳහන් කර ඇත.

**(ඈ) විවිධ කටයුතු පිළිබඳ අංශය**

15. විමසුම් කාලසීමාව තුළදී මෙම සිට රටට ගෙන්වා ගැනීමේ අංශය මගින් කටයුතු කරන ලද විශේෂ සිද්ධීන් කිහිපයක් අතරින් (1) ඩුබාහි කොන්සල් කර්යාලයේ සම්බන්ධී කරණයෙන් එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සර්ජා දේශභූමියේ ජලයේ නැංගුරම්ලා තිබූ M/T ඔමෙගා යාත්‍රාවේ අතරමං වූ ශ්‍රී ලාංකික නැව් කාර්ය මණ්ඩල සාමාජිකයන් සිය රටට ගෙන්වා ගැනීම, (11) ඉස්ලාම්බාද් හි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ සම්බන්ධීකරණයෙන්, වසර ගණනාවක් දිගු කාලීන ගැටළුවක්ව පැවැති, පාකිස්තානයෙන් මාස්ටර්සයද් අබ්දුල්ලාන් හුසේන් සිට රටට ගෙන්වා ගැනීම, (111) බහ්රේන් පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් 2017 දෙසැම්බර් 01 දින බහරේන් හි ලෙඩ ඇඳක සිටි රෝගියෙකු ශ්‍රී ලංකාවට ගෙන්වා ගන්නා ලදී.ආරක්ෂාව,රැකවරණය සහ අනාගත සුභ සාධනය සැලසීම සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුව සමඟ (බස්නාහිර පළාත) සිය රටට ගෙන්වා ගැනීමේ අංශය මගින් අවශ්‍ය කටයුතු සිදු කරන ලදි.

16. මෙම අංශය මිනිස් ජාවාරමේ වින්දිතයන් සිට රටට ගෙන්වා ගැනීම හා සම්බන්ධව කටයුතු කරන අතර ඔවුන්ගෙන් බහුතරයක් එක්සත් අරාබි එමීර් රාජ්‍යය හරහා ඕමානයට ජාවාරම් කරයි. මොවුහු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී නොමැත. ස්වකීය රටවල ශ්‍රී ලාංකික දූත මණ්ඩල සහ සංක්‍රමණික බලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන්, ශ්‍රී ලාංකික ජාතිකයන් බවට තහවුරු කර ගැනීමටත්, ඔවුන් හැකි ඉක්මනින් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සඳහා පහසුකම් සැලසීමටත් බල්ගේරියාවේ (04) හා ඩෙන්මාර්කයේ (01) රඳවා සිටි නීති විරෝධී සංක්‍රමණික කණ්ඩායම් සමග ස්කයිප් තාක්ෂණය ඔස්සේ සම්මුඛ සාකච්ඡාවක් සිදුකිරීමට කටයුතු සැලසුම් කරන ලදී.

**(ඈ) වන්දි අංශය**

17. විදේශයන්හි මියගිය පුද්ගලයන්ගේ ළඟම ඥාතීන්, ප්‍රධාන වශයෙන් සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා සහනයන් ලබාගැනීම සඳහා මෙම අංශය පහසුකම් සලසයි. ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩලවල සහයෝගයෙන් නෛතික ක්‍රියාමාර්ග ඔස්සේ මෙම හිමිකම්වලින් බොහෝමයක් ලබාගන්නා ලදී.

18. විදේශයන්හි පීඩාවට පත්වූ වින්දිතයන් සඳහා නොගෙවූ වැටුප් හා අනෙකුත් අයවීම් ලබාගැනීම සඳහා කොන්සියුලර් අංශය විසින් සහයෝගය සපයයි. මීට අමතරව, සිය විශ්‍රාම ප්‍රතිලාභ ලබාගැනීම සඳහා විදේශයන්හි සිටින කලින් සිටි සේවකයන් මෙම අංශය වෙත පැමිණෙයි. විදේශ රටවල විශේෂයෙන්ම මැද පෙරදිග සිදුවී ඇති ඝාතනයකදී, චූදිතයාගෙන් 'වන්දි මුදලක් ' ලෙස සහනයක් ලබාදීම වන්දි අංශය මගින් තහවුරු කරයි. විදේශයන්හිදී වැටුප්/අනෙකුත් ගෙවිය යුතු මුදල් නොගෙවීම සම්බන්ධයෙන් සංක්‍රමණික ශ්‍රමිකයන්ගෙන් නිරන්තරයෙන්ම පැමිණිලි ලැබෙති. එලෙස නොගෙවූ ගෙවිය යුතු මුදල් ලබාගැනීම තහවුරු කිරීම සඳහා අදාළ දූත මණ්ඩල ඔස්සේ ඔවුන්ගේ දුක්ගැනවිලි වෙනුවෙන් පෙනී සිටිති.

19. 2017 පළමු මාස නවයේදී වන්දි මුදල් හා අයවිය යුතු අනෙකුත් මුදල් ලෙස පවුලේ සාමාජිකයන්/වින්දිතයන් අතර බෙදාහැරීම සඳහා ආසන්න වශයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 252 ක් අයකරගෙන ඇත. ඒ අනුව, රුපියල් මිලියන 195 ක මුදලක් පවුල් 122 ක් අතර බෙදාහරින ලදී.

20. විදේශයක සිදුවූ මරණයකදී නීත්‍යානුකූල ළඟම ඥාතියා හඳුනාගැනීම සහ විදේශ දූත මණ්ඩල හා අදාළ පාර්ශවයන්ගේ සහයෝගයෙන් හැකි ඉක්මනින් දේහය සිය රටට ගෙන්වා ගැනීම/භූමදානය කිරීම හෝ ආදාහනය කිරීම මෙම අංශයේ ප්‍රධාන වගකීමකි. විවිධ අභිලාෂයන් නිසා බොහෝ අයදුම්කරුවන් දේහයට අයිතිවාසිකම් කීම සඳහා කොන්සියුලර් අංශයේ පෙනී සිටිති. එමනිසා, දේහය සඳහා පාර්ශ්වයන් කිහිපයක් අයිතිවාසිකම් කීමේදී නීත්‍යානුකූල පාර්ශ්වය තීරණය කිරීම ප්‍රවේශමෙන් සළකා බලයි.

**(ඉ) මරණ අංශය**

21. මරණ අංශයේ ප්‍රධාන වගකීමවනුයේ මරණය විදේශයකදී සිදුවුව හොත්, විදේශයන්හි දූත මණ්ඩල/ කාර්යාල හරහා අදාළ පාර්ශ්වයන්ගේ සහයෝගයෙන් හැකි ඉක්මනින්ම දේහය සිය රටට ගෙන්වා ගැනීම / භූමදානය කිරීම හෝ ආදාහනය කිරීම සඳහා නීතියානුකූල ළඟම ඥාතීන් හඳුනා ගැනීමයි. පුද්ගලික ලාභ ප්‍රයෝජන හේතුවෙන් දේහයට අයිතිවාසිකම් කියපෑමට

කොන්සියුලර් කටයුතු අංශයේදී බොහෝ අපේක්ෂකයන් පෙනී සිටින එම නිසා දේහයන් සඳහා අයිතිවාසිකම් කියාපෑමට පාර්ශවයන් කිහිපයක් සිටින අවස්ථාවන්හිදී, නීත්‍යානුකූල පාර්ශවය තීරණය කිරීමේදී බොහෝ ප්‍රවේශමෙන් සළකා බලනු ලැබේ. ළඟම ඥාතීන් විසින් ලබා දෙන අවසරය පරිදි, මිනිස් දේහය සිය රටට ගෙන්වා ගැනීමට/ භූමදානය සිදුකිරීමට හෝ ආදාහනය කිරීමට කොන්සියුලර් කටයුතු අංශය මගින් දූත මණ්ඩල වෙත උපදෙස් ලබා දෙයි.

22. 2017 ජනවාරි 01 දින සිට 2017 දෙසැම්බර් 31 දක්වා මරණ පිළිබඳ අංශය වෙත විදේශයන්හි සිදුවූ සමස්ත මරණ 458 ක් වාර්තා විය. ඉහත සමස්ත සංඛ්‍යාවෙන් 229 ක් පිරිමින් වූ අතර 105 ක් කාන්තාවන් විය. 458 දෙනා ගෙන් 52 ක් අනතුරුවලින්, 247 ක් අසනීප ආශ්‍රිතවද, 9 දෙනෙක් ඝාතනයවීම්ද, 22 ක් සියදිවිනසා ගැනීම්ද හා 4 ක් හඳුනා නොගත් මරණ විය. මරණ පිළිබඳව අංශය මගින් මරණ සහතික ලබාගැනිමට හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයෙන් රක්ෂණ ගෙවීම සඳහා පහසුකම් සලසයි.

23. වලංගු වීසා නොමතිව විදේශයේ රැදී සිටි සංක්‍රමණික ශ්‍රමිකයන් පස් දෙනෙකුගේ දේහයන් සිය රටට එවීමට/භූමදානය කිරීමට සහ ආදාහනය කිරීම සඳහා ආසන්න වශයෙන් ශ්‍රී ලංකා රුපියල් 1,271,950.00 ක මුදලක් විදේශ කටයුතු අමාත්‍යාංශයට දැරීමට සිදුවී ඇත.

2017 ජනවාරි 01 දින සිට 2017 දෙසැම්බර් 31 දක්වා කාලසීමාව සඳහා සැපයූ කොන්සියුලර් ආධාර පිළිබඳව විස්තර

| | |
|---|---|
| ලිපි ලේඛන සත්‍යාපනය කිරීමේ අංශය විසින් එකතුකළ මුළු ආදායම | ශ්‍රී ලංකා රු. 88,865,605.00 |
| ලිපි ලේඛන සත්‍යාපනය කිරීමේ අංශය වෙත පැමිණි අයදුම්කරුවන් ගණන | 109,607 |
| පවුලේ සාමාජිකයන්/වින්දිතයන් අතර බෙදාහළ වන්දි හා අනෙකුත් ගෙවිය යුතු මුදල් | ශ්‍රී ලංකා රු. 195,155,687.80 |
| වාර්තා වූ මරණ ගණන | 458 |
| සිය රටට ගෙන්වාගැනීම සඳහා සහයෝය ඉල්ලා ලැබුණු පැමිණිලි ගණන | 431 |
| රඳවාගැනීමේ සිද්ධි සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි ගණන (විදේශීය සිර මැදිරි/පොලිසිය/සංක්‍රමණිකයන් රඳවාගැනීමේ මධ්‍යස්ථාන) | 129 |
| ශ්‍රී ලංකා දූත මණ්ඩලවලින් ලැබුණු උප්පැන්න සහතික ගණන | 854 |

| | |
|---|---|
| ලැබුණු උප්පැන්න ලියාපදිංචි කිරීමේ පැමිණිලි පිළිබඳව විස්තර | 48 |
| විදේශයන්හි පොලිස් නිෂ්කාෂණ අයදුම්පත් සකස් කිරීම පිළිබඳව විස්තර | 407 |
| වන්දි ලබාදුන් පවුල් ගණන | 209 |
| ලබාදුන් වන්දි මුදල | 371,000,000 |
| විවිධ පැමිණිලි (ලිඛිත) | 164 |
| ගෙන්වා ගන්නා ලද ශ්‍රී ලංකා ධීවරයින් ගණන | 40 |
| විදේශයන්හිදී හසුවූ ධීවර බෝට්ටු සංඛාව | 6 |
| විදේශ දූත මණ්ඩල වලින් ලැබුණු TPN | 84 |
| විදේශ දූත මණ්ඩල වලින් ලිපි ලේඛන සත්‍යාපනය කිරීමේ අංශය වෙත ලැබුණු අධ්‍යාපන සහතික | 18 |

27. ඉහත වාර්තා කළ මරණයන්ට අමතරව, විදේශයන් හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල වෙත සෘජුවම වාර්තා කළ තවත් මරණ 10 ක් තිබුණි. මෙම සියලුම මරණ සඳහා සත්කාරක රටවල් හි පිහිටි දූත මණ්ඩල/ කාර්යාල ඔස්සේ තම අවසරය ලබා දෙමින් ශ්‍රී ලංකාව වෙත දේහය ගෙන්වා ගැනීම සඳහා පවුලේ සාමාජිකයන් කටයුතු කර ඇත.

28. ප්‍රධාන ලේඛනාගාරයෙන් සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් මරණ සහතිකය ලබා ගැනීමටත්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් රක්ෂණ ගෙවීම් සිදුකිරීමටත් මරණ අංශය මගින් ළඟම ඥාතීන්ට පහසුකම් සළසයි.

29. මියගිය පුද්ගලයා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි නොවූ අවස්ථාවකදී, ළඟම ඥාතීන්ට මානුෂීය හේතුන් මත සහයෝගය ලබා දෙනු ලැබේ. 2017 වර්ෂය තුළදී, විවිධ හේතු නිසා විදේශයන් හිදී මිය ගිය ශ්‍රී ලාංකිකයන් 09 දෙනෙකුගේ දේහයන් සියරටට ගෙන්වා ගැනීමට / භූමදානය කිරීමට සහ ආදාහනය කිරීමට ආසන්න වශයෙන් රු. 3,640,185.00 ක මුදලක් විදේශ කටයුතු අමාත්‍යාංශය දරන ලදී.

****

# නැගෙනහිර ආසියා හා පැසිෆික් අංශය

## නැගෙනහිර ආසියා හා පැසිෆික් අංශය

**ආවරණය වන රටවල්** : ඕස්ට්‍රේලියාව, බෘනායි, දරුස්සලාම්, චීනය, කාම්බෝජියාව, ප්‍රජාතාන්ත්‍රික මහජන කොරියානු ජනරජය, (DPRK) ෆීජි, ඉන්දුනීසියාව, ජපානය, කොරියා ජනරජය, ලාඕසය, මැලේසියාව, මොන්ගෝලියාව, මියන්මාරය, නවසීලන්තය, පිලිපීනය, පැපුවා නිව්ගිනියාව, සිංගප්පූරුව, තායිලන්තය, වියට්නාමය, වනුආටු, නාවුරු හා ටොංගෝ, සොලමන් දූපත්, ටිමෝර ලෙස්තේ, කිරිබටී, සැමෝආ, ටුවාලු

**නේවාසික දූත මණ්ඩල සංඛ්‍යාව** - 11 (ඕස්ට්‍රේලියාව, චීනය, ඉන්දුනීසියාව, ජපානය, කොරියාව, මැලේසියාව, මියන්මාරය, පිලිපීනය, සිංගප්පූරුව, තායිලන්තය, වියට්නාමය)

**කොන්සල් කාර්යාල සංඛ්‍යාව** - 04 (ඕස්ට්‍රේලියාව - සිඩ්නි සහ මෙල්බන්, චීනය - ෂැංහායි සහ ගුවාන්ෂු )

**සමගාමීව අක්තගැන්වීම්**

| | | |
|---|---|---|
| ඕස්ට්‍රේලියාව (කැන්බරා) | - | ෆීජි, නවසිලන්තය, පැපුවා නිව්ගිනියාව,<br>වනුආටු, සොලමන් දූපත් |
| චීනය | - | කොරියානු ප්‍රජාතන්ත්‍රවාදී මහජන ජනරජය,<br>මොන්ගෝලියාව |
| සිංගප්පූරුව | - | බෘනායි, දරුස්සලාම් |
| තායිලන්තය | - | කාම්බෝජියාව, ලාඕසය |

**බහුපාර්ශ්වීය/කලාපීය සංවිධාන සංඛ්‍යාව**

ආසියාන් කලාපීය සංසදය (ARF), ෂැංහයි සහයෝගිතා සංවිධානය (SCO)

**ආවරණය කරනු ලබන වෙනත් සංවිධාන සංඛ්‍යාව**

බාලි ප්‍රජාතාන්ත්‍රික සංසදය, ෂැංග්‍රි - ලා සංවාදය

**නැගෙනහිර ආසියා හා පැසිෆික් අංශයේ ප්‍රධාන කාර්ය කටයුතු පුළුල් ලෙස පහත පරිදි වර්ගීකරණය කළ හැකිය.**

i. භූගෝලීයමය කලාපයේ රටවල්වලට අදාළව ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සැකසීම.

ii. රජයේ ප්‍රතිපත්තිමය තීරණ පිළිබඳව මෙම භූගෝලීයමය කලාපයේ පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට උපදෙස් දීම හා ඔවුනට පවරා තිබෙන රටවලදී ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ධනාත්මක වශයෙන් ප්‍රවර්ධනය කිරීම හා ප්‍රක්ෂේපණය කිරීම.

iii. ආර්ථික, රාජ්‍යතාන්ත්‍රික කටයුතු හා පොදු රාජ්‍යතාන්ත්‍රික කටයුතුවල ක්‍රියාකාරීව නියැලෙන ලෙස මෙම කලාපයේ ඇති ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට මඟ පෙන්වීම ලබාදීම සහ ශ්‍රී ලාංකිකයින්ට සහ ශ්‍රී ලාංකික සම්භවයක් ඇති පුද්ගලයන්ට සහාය ලබාදීම.

iv. ශ්‍රී ලංකාවේ සංචාරවල නියැලෙන/විදේශීය රටවල සංචාරවල නියැලෙන සම්භාවනීය පුද්ගලයන්ගේ සංචාර සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම/අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

v. මෙම භූගෝලීයමය කලාපයේ රටවල් හා සංවිධාන සමඟ ද්වීපාර්ශ්වික ගිවිසුම්/අවබෝධතා ගිවිසුම්වලට අත්සන් තැබීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

vi. ආසියාන් කළාපීය සංසදය, ෂැංහයි සහයෝගීතා සංවිධානය, බාලි ක්‍රියාදාමයට අදාළ කටයුතු සම්බන්ධීකරණය.

vii. කොළඹ පිහිටි නැගෙනහිර ආසියා සහ පැසිෆික් කළාපයේ ශ්‍රී ලංකා විදේශීය දූත මණ්ඩල සමඟ සමීප හා සුහද සබඳතා පවත්වාගෙන යාම.

### 1. ඕස්ට්‍රේලියාව

කැන්බරාහි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය, මෙල්බර්න් හි කොන්සල් ජනරාල් කාර්යාලය හා සිඩ්නිහි කොන්සල් ජනරාල් කාර්යාලය යනුවෙන් ශ්‍රී ලංකාව ඕස්ට්‍රේලියාවේ නේවාසික දූත මණ්ඩල තුනක් පවත්වාගෙන යනු ලැබේ.

#### i. කැන්බරා හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය

ඕස්ට්‍රේලියාවේ මහ කොමසාරිස් කාර්යාලය, නවසීලන්තය, ෆීජී, සොලමන් දූපත්, සැමෝආ, වනවාටු හා පැපුවා නිව්ගිනියා යන රටවල් සඳහා සමගාමීව අක්තගන්වා තිබේ.

**(අ) ද්වීපාර්ශ්වික සබඳතා**

ශ්‍රී ලංකාව හා ඕස්ට්‍රේලියාව අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීමේ 70 වැනි සංවත්සරය 2017 වසරට යෙදී තිබේ. මෙම සංවත්සරය සැමරීම් කටයුතු මෙසේය.

i. අතිගරු ජනාධිපතිතුමා 2017 මැයි මසදී ඕස්ට්‍රේලියාවේ රාජ්‍ය සංචාරයක නියැලුණු අතර ශ්‍රී ලාංකික රාජ්‍ය නායකයකු ඕස්ට්‍රේලියාවේ නියැලුණු ප්‍රථම රාජ්‍ය සංචාරය මෙය විය. මෙම සංචාරය අතරතුරදී, නිදන්ගත වකුගඩු රෝගය වැළැක්වීම පිළිබඳ කාර්ය සාධන බලකාය හා ඕස්ට්‍රේලියානු න්‍යෂ්ටික විද්‍යා හා තාක්ෂණික සංවිධානය අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබූ අතර, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය හා

''පියෝසයන්සන් ඕස්ට්‍රේලියා'' අතර අභිමතාර්ථ ලිපියක් හුවමාරු කර ගන්නා ලදී. දෙරට අතර ද්වීපාර්ශ්වික සබඳතා වැඩිදියුණු කරමින්, වැඩිදියුණු කළ සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශයකට අත්සන් තබන ලදී. මේ යටතේ, ආරක්ෂක හා රාජ්‍ය ආරක්ෂක සහයෝගීතාව, ආර්ථික සබඳතා, සංවර්ධන සහයෝගීතාව, අධ්‍යාපනය හා දෙරටේ ජනතාව අතර සබඳතා යන ක්ෂේත්‍රවලට ප්‍රමුඛත්වයක් අත්කර දෙයි.

ii. දෙරට අතර ද්වීපාර්ශ්වික සබඳතා ස්ථාපනය කිරීමේ 70 වැනි සංවත්සරය සනිටුහන් කරමින් 2017 පෙබරවාරි මස ශ්‍රී ලංකාවේ ගරු අග්‍රාමාත්‍යවරයා ඕස්ට්‍රේලියාවේ සංචාරයක නිරත විය. ද්වීපාර්ශ්වික සාකච්ඡාවලින් අනතුරුව ඒකාබද්ධ ප්‍රකාශයක් නිකුත් කරන ලදී. එහි නිගමනය පිළිබඳ හා මිනිසුන් නීතිවිරෝධී ලෙස ප්‍රවාහනය කිරීමේ ගැටලු, අධ්‍යාපනය, දෙරටේ ජනතාව අතර සබඳතා, කලාපීය වෙළඳාම ගොඩනැගීම සඳහා සාමූහිකව කටයුතු කිරීමට ඇති ඇප කැපවීම, ආරක්ෂක සහයෝගීතාව, සංවර්ධන සහයෝගීතාව හා ක්‍රීඩා යන ක්ෂේත්‍ර මේ යටතේ අවධාරණය කරන ලදී. සංවර්ධන සහයෝගිතාව, පාර්ශ්වකාරීත්වය පිළිබඳව හා ක්‍රීඩා ක්ෂේත්‍රයේ දී සහයෝගිතාව පිළිබඳව අවබෝධතා ගිවිසුම් දෙකකට අත්සන් තබන ලදී.

iii. ඉහත ඉහළ මට්ටමේ සංචාරවලට අමතර වශයෙන් නියෝජ්‍ය විදේශ කටයුතු අමාත්‍යවරයා මාර්තු මාසයේදී ඕස්ට්‍රේලියාවේ සංචාරයක නියැලිණ. මෙම සංචාරයේදී කර්මාන්ත, නවෝත්පාදන හා පතල් සිතියම්ගත කිරීමේ විද්‍යාව පිළිබඳ ඕස්ට්‍රේලියානු අමාත්‍යවරයාගේ සහාය ඉල්ලා සිටිමින් සාකච්ඡා පවත්වන ලදී. ඕස්ට්‍රේලියානු න්‍යෂ්ටික විද්‍යා හා තාක්ෂණ සංවිධානය (ANSTO) සමඟ රැස්වීමක් පැවැත්වූ අතර එමගින් ශ්‍රී ලංකාවේ නිදන්ගත වකුගඩු රෝගය සම්බන්ධව විද්‍යාත්මක පර්යේෂණ සහයෝගිතාව තවදුරටත් වැඩිදියුණු කරගැනීම සඳහා අඩිතාලම සකසන ලදී.

iv. සැප්තැම්බර් 06 වැනි දින, මිනිස් ජාවාරම හා දේශසීමා ඉක්මවා සිදුකරනු ලබන අපරාධ පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමේ 04 වන සැසිවාරය පවත්වන ලදී. මේ සඳහා සහභාගී වූ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ නායකත්වය දරන ලද්දේ ආරක්ෂක ලේකම්තුමා විසිනි. මෙම සැසිවාරයට සමගාමීව ආරක්ෂක අමාත්‍යාංශය හා විගමන හා දේශසීමා ආරක්ෂාව පිළිබඳ දෙපාර්තමේන්තුව අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තබන ලදී.

**v.** විදේශ අමාත්‍යාංශය හා විදේශ කටයුතු හා වෙළඳ දෙපාර්තමේන්තුව අතර විදේශ කාර්යාල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සාකච්ඡාවල දෙවැනි සැසිවාරය නොවැම්බර් 16 වැනි දින කැන්බරාහි දී පවත්වන ලදී. මීට සහභාගි වූ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ ප්‍රධානත්වය අතිරේක ලේකම් සුමිත් නාකන්දල මහතා විසින් හොබවන ලද අතර විදේශ කටයුතු හා වෙළඳ දෙපාර්තමේන්තුවේ දකුණු හා නැගෙනහිර ආසියාව සඳහා පළමු සහකාර ලේකම් කැනී ක්ලුග්මාන් මහත්මිය විසින් ඕස්ට්‍රේලියානු නියෝජිත කණ්ඩායමේ ප්‍රධානත්වය උසුලන ලදී.

**vi.** මහ කොමසාරිස් කාර්යාලය විසින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදන , ආහාර ,කලාව හා සංස්කෘතිය ප්‍රවර්ධනය කරමින් නොවැම්බර් 25 වන දින චාන්සරි පරිශ්‍රයේ දී දෙවැනි "ශ්‍රී ලංකා උළෙල" සංවිධානය කරන ලදී. දෙරට අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා වර්ධනය

කිරීමේ 70 වැනි සංවත්සරය නිමිත්තෙන් පැවති උළෙලේදී කලා අධ්‍යක්ෂ රවිබන්ධු විද්‍යාපති මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු රාජ්‍ය නැටුම් කණ්ඩායම රැඟුම් ඉදිරිපත් කළේය. මෙම නැටුම් කණ්ඩායම සඳහා අනුග්‍රාහකත්වය දක්වන ලද්දේ ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර කටයුතු , වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසිනි.

**(ආ) ආර්ථික සබඳතා හා විදේශීය ආයෝජන**

i. ආර්ථික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව ඉහළ පෙළේ සංචාර අතරතුරදී අවධාරණය කරන ලද අතර බලශක්ති, ඛණිජ වැලි හා ග්‍රැනයිට් යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියානු ආයෝජන ආරම්භ කර තිබේ.

ii. කොළඹ කොටස් හුවමාරුව (CSE) සහ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සමඟ එක්ව ආයෝජන සංසදයක් සඳහා පහසුකම් සලසන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස, ඕස්ට්‍රේලියාවෙන් ආයෝජන වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට ගලා එන බව වාර්තා වී තිබේ.

iii. මහ කොමසාරිස් කාර්යාලය විසින්, කැන්බරාහි සිදුකෙරෙන සංචාරක කටයුතු හා සංචාරක නියෝජිතයින් , සංචාරක හා වන සතුන් කෙරෙහි උනන්දුවක් දක්වන කණ්ඩායම් හා මහජනයා ඉලක්ක කර ගනිමින් සංචාරක ප්‍රවර්ධන සාකච්ඡා රැසක් ආරම්භ කළ අතර ශ්‍රී ලංකා සංචාරක කටයුතු හා අලිඇතුන් (මාර්තු) හා මැමේලියාවන් හා කුරුල්ලන් (සැප්තැම්බර්) කෙරෙහි අවධානය යොමු කරමින් වනසතුන් පිළිබඳ විශේෂඥයන් විසින් පවත්වන ලද සාකච්ඡා දෙකක් ද මීට ඇතුළත් විය.

iv. නොවැම්බරයේ පැවති සාකච්ඡාවලදී, ආර්ථික සබඳතා වැඩි දියුණු කිරීමේ හැකියාවන් පිළිබඳව වැඩිදුරටත් සාකච්ඡා කරන ලදී. මෙය සිදුකරනු ලබන්නේ නොවැම්බරයේ අත්සන් තබන ලද වෙළඳ හා ආයෝජන රාමුගත වැඩ පිළිවෙල යටතේ වන අතර මෙහි පළමු රැස්වීම 2018 මුල් භාගයේදී කැන්බරාහිදී පැවැත්වීමට අපේක්ෂා කෙරේ.

**(ඇ) සංස්කෘතික සබඳතා**

I. කැන්බරාහි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය, තේ හා සංචාරක කටයුතු ප්‍රවර්ධන කුටියක් සංවිධානය කරමින් වාර්ෂික කැන්බරා බහුපාර්ශ්වීය උළෙලට සහභාගී විය.

II. රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කර වසර 70 ක් සපිරීම නිමිත්තෙන් ගරු අග්‍රාමාත්‍යවරයා නිරත වූ සංචාරයට සමගාමීව, ශ්‍රී ලංකාව හා ඕස්ට්‍රේලියාව අතර සුහද ක්‍රිකට් තරඟයක් කැන්බරාහි දී පවත්වන ලදී.

III. නොවැම්බරයේ පැවති "ශ්‍රී ලංකා උළෙලේදී " රාජ්‍ය නැටුම් කණ්ඩායම සිය රංගනයන් ඉදිරිපත් කළ අතර මෙල්බර්න්, බ්‍රිස්බේන් හා සිඩ්නි යන නගරවලදී ද එම කණ්ඩායම නැටුම් රඟ දැක්විය.

**(ඈ) කම්කරු සුභසාධනය**

ෆීජි හි ශ්‍රී ලාංකියන්ට ලබාදිය හැකි රැකියා ඉඩ ප්‍රස්ථා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් අසන ලද ප්‍රශ්නවලට මහකොමසාරිස් කාර්යාලය පිළිතුරු ලබාදෙන ලදී. සොලමන් දූපත් හි සංචාරක කටයුතු, පොල් සංවර්ධන හා ආගන්තුක සත්කාර අංශයේ ශ්‍රී ලාංකික පෞද්ගලික ආයෝජන සිදු කිරීමට ඇති

ඉඩකඩ පිළිබඳව සොයා බැලීමට සොලමන් දූපත් හි නිර්වේතනික කොන්සල්වරයා සමඟ මහ කොමසාරිස් කාර්යාලය අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.

(ඉ) වෙනත්

ශ්‍රී ලාංකික ප්‍රජාව නියැලෙන කටයුතු :- කැන්බරා හි මහ කොමසාරිස් කාර්යාලය හා සිඩ්නි හා මෙල්බර්න් හි කොන්සල් ජනරාල් කාර්යාල ශ්‍රී ලාංකිකයන් අතර සබඳතා ගොඩනැගීමෙහි ලා හා ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියේදී ශ්‍රී ලංකා රජය සමඟ කටයුතු ලෙස දිරිගැන්වීමෙහිලා එහි වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව සමඟ අඛණ්ඩව කටයුතු කරමින් සිටියි.

**ii. කොන්සල් ජනරාල් කාර්යාලය/මෙල්බර්න්**

**(අ) ද්විපාර්ශ්වික සබඳතා - සංචාර**

පහත සඳහන් ශ්‍රී ලාංකික අමාත්‍යවරුන්/නිලධාරීන්ගේ සංචාර හා සිඩ්නි හි සිටින රාජ්‍ය දේශපාලන සම්භාවනීය පුද්ගලයන්/නිලධාරීන් සමඟ පැවති රැස්වීම් මගින් ද්විපාර්ශ්වික දේශපාලනික සබඳතා ශක්තිමත් කර තිබේ.

i. ගරු නිරෝෂන් පෙරේරා මැතිතුමා, ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍ය - 2017 මාර්තු 22-25

ii. ශ්‍රී ලංකාවේ නියෝජ්‍ය විදේශ කටයුතු අමාත්‍ය ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා - 2017 මාර්තු 30-අප්‍රේල් 01

iii. ශ්‍රී ලංකාවේ ජාතික සහජීවන, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍ය ගරු මනෝ ගනේෂන් මැතිතුමාගේ සංචාරය - 2017 ජුනි 25-28

iv. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතාගේ සංචාරය - 2017 ඔක්තෝම්බර් 30 - නොවැම්බර් 04

**(ආ) ආර්ථික සබඳතා හා විදේශ ආයෝජන - වෙළෙඳ හා ආයෝජන**

i. ශ්‍රී ලංකා ගරු අග්‍රාමාත්‍යවරයා හා පාර්ලිමේන්තු මන්ත්‍රී හා වික්ටෝරියාහි කුඩා ව්‍යාපාර, නවෝත්පාදන හා වෙළෙඳ අමාත්‍ය ගරු ෆිලිප් ඩලිඩාකිස් මැතිතුමා අතර 2017 පෙබරවාරි 16 වැනිදා පැවති හමුව සඳහා අවශ්‍ය පහසුකම් සලසන ලදී.

ii. ශ්‍රී ලංකාවේ හිටපු නියෝජ්‍ය විදේශ කටයුතු අමාත්‍ය ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා සමඟ පැවති පහත සඳහන් රැස්වීම් සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී. (2017 මාර්තු 30-අප්‍රේල් 01)

- මෙල්බර්න් හි ''ඒසියා ලින්ක්'' විශ්ව විද්‍යාලයේ පැවති වටමේස සාකච්ඡාව.

- ඕස්ට්‍රේලියාවේ  ව්‍යාපාරික කවුන්සලය සමඟ පැවති රැස්වීම.
- ඕස්ට්‍රේලියාවේ කාන්තා විලාසිතා කර්මාන්ත ආයතනයක් වන “KOOKAI” නැරඹීමට යාම.
- වික්ටෝරියා හි වෙළෙඳ නියෝජ්‍ය ලේකම් පේ මීක් මහතා හමුවීම.

**(ඇ) සංචාරක කටයුතු ප්‍රවර්ධනය**

සමාලෝචනයට බඳුන්වන කාලය තුළදී පහත සඳහන් ප්‍රධාන රැස්වීම් හා උත්සවාංග පවත්වන ලදී.

i. ශ්‍රී ලංකා සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලාංකික උළෙල - 2017 පෙබරවාරි 26

ii. ගරු අග්‍රාමාත්‍යවරයාගේ ඔස්ට්‍රේලියා සංචාරය අතරතුරදී සංවිධානය කරන ලද ව්‍යාපාරිකයින්ගේ දිවා භෝජන සංග්‍රහයේ දී ශ්‍රී ලංකාව සංචාර සඳහා/සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම - 2017 පෙබරවාරි 16

iii. මෙල්බර්න් හි අරමුදල් පිළිබඳ කළමනාකරුවන් සඳහා පැවති ආයෝජන සංසදයේ දී ශ්‍රී ලංකාව සංචාර සඳහා/සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම

iv. 2017 නොවැම්බර් 23  දින පැවති ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මාර්ග සංදර්ශනය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.

v. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ නිලධාරීන්  සඳහා "විසිට් වික්ටෝරියා" හි සාමාන්‍යාධිකාරී නිකී කෙන්යෝන් මහත්මිය සමඟ හමුවක් සංවිධානය කිරීම.

**iii. කොන්සල් ජනරාල් කාර්යාලය/සිඩ්නි**

**(අ) ද්විපාර්ශ්වික සබඳතා - සංචාර**

i. නියෝජ්‍ය විදේශ කටයුතු අමාත්‍ය ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමාගේ ඕස්ට්‍රේලියානු සංචාරයෙහි දී එතුමා සිඩ්නි වෙත ද පැමිණියේය - 2017 මාර්තු 25 - අප්‍රේල් 02

ii. ජාතික සහජීවන, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍ය ගරු මනෝ ගනේෂන් මැතිතුමාගේ ඕස්ට්‍රේලියා සංචාරයේදී, එතුමාට සිඩ්නි හි සිටින ඕස්ට්‍රේලියා බලධාරීන් හා ශ්‍රී ලාංකික ප්‍රජාවේ සාමාජිකයින් සමඟ රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදි. 2017 ජුනි 21-28

iii. උප අද්මිරාල් ටී.ඩබ්.බාරෙට් මැතිතුමාගේ ආරාධනයෙන් 2017 සමුද්‍රිය බල සමුළුවට සහභාගි වීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ උප අද්මිරාල් ට්‍රාවිස්

සින්නයියා මැතිතුමා 2017 සැප්තැම්බර් 30- ඔක්තෝම්බර් 6 දිනවලදී බ්‍රිස්බේන් හා සිඩ්නි බලා පිටත් විය.

iv. සිඩ්නි නුවර පැවති "2017 - ප්ලෑනින් කොන්ෆරන්ස් ඔෆ් එක්සසයිස් කාකඩු" සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරීහු දෙදෙනෙක් සහභාගි වූහ.

v. අතිගරු ජනාධිපතිතුමාගේ ඕස්ට්‍රේලියානු රාජ්‍ය සංචාරයේදී නිල වශයෙන් පැවති රැස්වීම්වලට අමතරව , එහි ප්‍රජා සංගම්වල නියෝජිතයින් ඇතුළුව සිඩ්නි නුවර වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව හමුවිය.

vi. කොන්සාල් කාර්යාලය, විදේශ කටයුතු හා වෙළඳ දෙපාර්තමේන්තුව සමග 2017 වර්ෂය තුළදී පහත සඳහන් කටයුතුවල නියැලිණි.

- විදේශ කටයුතු හා වෙළඳ දෙපාර්තමේන්තුවේ රාජ්‍ය කාර්යාලය විසින් ඕස්ට්‍රේලියාවේ සම්මාන ලබා සිඩ්නි හි අධ්‍යාපනය ලබන ශ්‍රී ලාංකික ශිෂ්‍යාවන් සමඟ සැඳෑ තේ සාදයක් සංවිධානය කරන ලදී.
- 2017 මාර්තු 6 වැනි දින ජාත්‍යාන්තර කාන්තා දිනය සැමරීමට දිවා භෝජන සංග්‍රහයකට සහභාගි වීම.
- මාර්තු 22 දින පැවති "විදේශීය ආයෝජන ප්‍රතිපත්ති පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහනට" සහභාගි වීම.
- ඕස්ට්‍රේලියාවේ මහ කොමසාරිස් බ්‍රේස් හුට්චෙසන් මැතිතුමා සහ සිඩ්නි හි වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව අතර 2017 අගෝස්තු 10 වෙනි දින රැස්වීමක් සංවිධානය කරන ලදි. මේ සඳහා සංගම් 8 ක් සහභාගි විය.
- දේශීය වශයෙන් බඳවාගත් කාර්ය මණ්ඩලය හා පෞද්ගලික ගෘහ සේවක සේවිකාවන් රැකියාවේ නියුක්ත කරවීම පිළිබඳව විදේශ කටයුතු හා වෙළඳ දෙපාර්තමේන්තුවේදී පැවති කරුණු පැහැදිලි කිරීමේ රැස්වීමට සහභාගි විය.
- ඕස්ට්‍රේලියාවේ පළමු ජාත්‍යාන්තර සයිබර් කටයුතු පිළිබඳව ක්‍රමෝපාය විසින් සිඩ්නි හිදී පවත්වන ලද දිවා භෝජන සංග්‍රහයට සහ 2017 ඔක්තෝම්බර් 8 වැනි දින රජයේ සෞඛ්‍යය වැඩසටහන මගින් බ්‍රිස්බේන්හි දී සංවිධානය කරන ලද දිවා භෝජන සංග්‍රහයට සහභාගි විය.

**(ආ) ආර්ථික සබඳතා හා විදේශ ආයෝජන - වෙළෙඳ හා ආයෝජන**

i. සිඩ්නි හි පිහිටි සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සමඟ එක්ව ''ඉන්වෙස්ට් ශ්‍රී ලංකා ඉන්වෙස්ටර් ෆෝරම්'' සංවිධානය කරන ලද අතර එහිදී ශ්‍රී ලංකාව සඳහා විදේශීය සෘජු ආයෝජන ප්‍රවර්ධනය කරන ලදී.

ii. මෘදුකාංග, අරමුදල් කළමනාකරණය, තොරතුරු තාක්ෂණය පිළිබඳ නිෂ්පාදන, මාධ්‍ය උපකරණ හා අධ්‍යාපනික තරඟ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ

ආයෝජන කිරීමට ඉදිරිපත් වන ඕස්ට්‍රේලියානු ආයෝජකයන්ට ශ්‍රී ලංකාවේ ශාඛා කාර්යාල/ව්‍යාපාර පිහිටුවීම සඳහා අවශ්‍ය සහය කොන්සල් කාර්යාලය විසින් සලසන ලදී.

iii. ඕස්ට්‍රේලියා - ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ අට සාමාජික නියෝජිත කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලුණු අතර ශ්‍රී ලාංකික තොරතුරු තාක්ෂණ සමාගම් සමඟ කොන්ත්‍රාත්තුවලට අත්සන් තබන ලද අතර ඒවායේ වටිනාකම ඕස්ට්‍රේලියානු ඩොලර් 500,000 පමණ වේ. එමඟින් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා 15 ක් උත්පාදනය කරන ලදී.

iv. කොන්සල් කාර්යාලය විසින් තොරතුරු තාක්ෂණය, අරමුදල් කළමනාකරණය සහ සංචාරක කර්මාන්තය ඇතුළුව  විවිධ ක්ෂේත්‍රවල ආයෝජනය කරනු ලැබීමට හැකියාවක් ඇති ඕස්ට්‍රේලියානු ආයෝජකයන් කළ විමසීම් වලදී කොන්සාල් ජනරාල් කාර්යාලය ප්‍රමාණවත් තොරතුරු සෘජුවම ඔවුන් වෙත සපයන ලදි.

v. මෙම කොන්සාල් ජනරාල් කාර්යාලය විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා පොල් සංවර්ධන අධිකාරිය හා එක්ව , 2017 සැප්තැම්බර් 11-14 දිනවලදී සිඩ්නි හිදී පැවති ආහාර ප්‍රදර්ශනයේදී ශ්‍රී ලංකාව සඳහා ප්‍රදර්ශන කුටියක් පැවැත්වීමේ කටයුතු සංවිධානය කරන ලදී.

vi. කොන්සාල් ජනරාල් කාර්යාලය විසින් 2017 සැප්තැම්බර් 12 වෙනි දින තේ මණ්ඩලය සමඟ එක්ව ශ්‍රී ලංකා තේ වෙළඳාම සඳහා ව්‍යාපාරික ජාලකරන වැඩසටහනක් ද සංවිධානය කරන ලදී. තේ ව්‍යාපාරිකයන්, නිව් සවුත් වේල්ස් ව්‍යාපාරික මණ්ඩලයේ, ඕස්ට්‍රේලියා - ශ්‍රී ලංකා ව්‍යාපාරික මණ්ඩලයේ, ඕස්ට්‍රේලියාවේ ආහාරපාන සැපයීමේ හා ආපනශාලා කර්මාන්ත සංගමයේ ඕස්ට්‍රේලියාවේ අපනයන මණ්ඩලයේ සාමාජිකයින් හා තෝරාගත් මාධ්‍යවේදීන් ඇතුළුව 35 දෙනෙක් මෙම ජාල ගතවීමේ සැසිවාරයට සහභාගි වූහ.

**ඇ) සංචාරක කටයුතු**

- 2017 ජූලි මස 13 වන දින "පැරඩයිස් අයිලන්ඩ් ලේෂර් " සංචාරක සමාගමේ සහයෝගයෙන් ටැටර්සෝල්ස් ක්ලබ් " හිදී ශ්‍රී ලාංකික සංචාරක ප්‍රවර්ධන උත්සවයක් කොන්සල් ජනරාල් පවත්වන ලදි.
- මෙම කොන්සාල් ජනරාල් කාර්යාලය විසින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමඟ එක්ව ශ්‍රී ලංකා සංචාරක පාරිභෝගික ප්‍රවර්ධන වැඩසටහනක් වන, 2017 නොවැම්බර් 25-26 දිනවලදී සිඩ්නි නුවර පැවති "2017 ශ්‍රී ලංකා ආහාර හා සංස්කෘතික උළෙල''  සංවිධානය කරන ලදී.
- සාමාජිකයින් 35 දෙනෙකුගෙන් සමන්විත වන ශ්‍රී ලංකාවේ සිට පැමිණි සංචාරක වෙළඳ නියෝජිත කණ්ඩායමක් සඳහා මෙම කොන්සාල් ජනරාල් කාර්යාලය ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන මණ්ඩලය සමඟ එක්ව 2017 නොවැම්බර් 27 වැනි දින සිඩ්නි හි හේට්  රීජන්සි

හෝටලයේදී ව්‍යාපාරික ජාලගත ප්‍රදර්ශනයක් ද සංවිධානය කළේය. නිව් සවුත් වේල්ස්හි සිටින පිටපළාත් සංචාරක මෙහෙයවන්නන්, තොග හා සිල්ලර වෙළඳුන් ඇතුළුව 150 දෙනෙක් මේ සඳහා සහභාගි වූහ.

**2. චීන මහජන සමූහාණ්ඩුව**

ශ්‍රී ලංකාව විසින් චීනයේ නේවාසික දූත මණ්ඩල/ දූත කාර්යාල තනතුරු ත්‍රිත්වයක් පවත්වාගෙන යනු ලබයි. බීජිං හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ගුවන්ග්ෂෝ සහ ෂැන්හයි හි කොන්සල් ජනරාල් කාර්යාලය මීට අයත් වෙයි.

**i. බීජිං**

**(අ) ද්විපාර්ශ්වික සබඳතා**

i. ද්විපාර්ශ්වීය සබඳතා ඉහළ නැංවීම සඳහා විවිධ පළාත්වල එක් තීරයක් එක් මාවතක් වැඩසටහන අත වැඩසටහන් තානාපති කාර්යාලය විසින් සංවිධානය කළේය.

ii. 2017 මැයි මාසයේදී බීජිං හි පැවැති ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා එක් තීරයක් එක් මාවතක් සංසඳයට ශ්‍රී ලංකාවේ ගරු අග්‍රාමාත්‍යවරයා සහභාගී විය.

iii. දිළිඳුභාවය අඩු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අත්දැකීම් හුවමාරු කර ගැනීමේ සම්මන්ත්‍රණයක් බීජිං හිදී සංවිධානය කෙරිණි.

iv. ශ්‍රී ලංකාව, සමුද්‍රික සේද මාවත හා සම්බන්ධ බැවින් තානාපති කාර්යාලයට එක් මාවතක් එක් තිරයක් අංගය සඳහා ආරාධනා කරනු ලබන අතර අවශ්‍ය අවස්ථාවලදී තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදි.

v. මොන්ගෝලියාවේ උලන්බටා හි ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල්වරයකු ලෙස ඔර්ගිල්මා ඩොලොන්ජින් මහත්මිය පත්කර ගනු ලැබීම හා සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය සහ මොන්ගෝලියානු පාර්ශවය අතර අවශ්‍ය ලියකියවිලි හුවමාරු කිරීමේ කටයුතු මෙම තානාපති කාර්යාලය විසින් සිදු කරන ලදි. කොරියානු මහජන සමූහාණ්ඩුවේ ප්‍රවණතා පිළිබඳව අධීක්ෂණය කර විදේශ කටයුතු අමාත්‍යාංශයට වාර්තා කිරීම සිදු කරන ලදී.

vi. ශ්‍රී ලංකාව හා චීනය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීමේ 60 වෙනි සංවත්සරයට හා දෙරට අතර ආර්ථික සබඳතාවල 65 වැනි සංවත්සරයට සහභාගිවීම සඳහා, විදේශ කටයුතු අමාත්‍ය ගරු තිලක් මාරපන මැතිතුමා ඔක්තෝම්බර් 29 වැනි දින බීජිං බලා පිටත් විය. චීනයේ විදේශ කටයුතු අමාත්‍ය ගරු වෑන්ග් යී මැතිතුමා විසින් කරන ලද ආරාධනයකට අනුව අමාත්‍යවරු දෙපළ 2018 ඔක්තෝම්බර් 30 වැනි දින ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වූහ. ගරු අමාත්‍යවරයා, චීන උප අග්‍රාමාත්‍ය ගරු වෑන්ග් යෑන් මැතිතුමා නොවැම්බර් 1 වැනි දින , බීජිං හි සිග්යුයැන්ග්හි හි සොන්ස්හැන්හයි හි දී හමුවිය.

vii. ශ්‍රී ලංකාවේ අනන්‍යතා හා ආර්ථික කළාපය තුළ සියැන්ග් යෑන්ග් හොන්ග් 03 නම් චීන විද්‍යාත්මක පර්යේෂණ යාත්‍රාව විසින් කරන ලද "සමුද්‍රීය විද්‍යාත්මක පර්යේෂණය"

පිළිබඳව රැස්වීමකට කපිතාන් පී.කේ.වර්ණකුලසූරිය මහතා හා නාවික හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු සහභාගි වූ අතර එය පවත්වන ලද්දේ 2017 නොවැම්බර් 5-11 දිනවලදී බීජිං හිදීය.

viii. චීනයේ බීජිං නාගරික මහජන ආරක්ෂක කාර්යාංශ දෙපාර්තමේන්තුව විසින් 2017 නොවැම්බර් 28-29 දිනවලදී සංවිධානය කරන ලද "චීන දකුණු ආසියා හා අසල්වාසී රටවල අගනගරවල නීතිය බලාත්මක කිරීමේ සහයෝගිතා සමුළුවට පොලිස් මූලස්ථානයේ වැඩබලන නියෝජ්‍ය පොලිස්පති ඩී.අර්.එල්. රණවීර මහතා හා පොලිස් අධිකාරීන් දෙදෙනෙකු සහභාගි වූහ.

ix. ගුවන් කොමදෝරු ආර්.එච්.කේ.පී. රණසිංහ මහතා සහ ගුවන් හමුදාවේ තවත් නිලධාරීන් සිව්දෙනෙකු 2017 දෙසැම්බර් 16-24 දිනවලදී බීජිං හිදී පැවති "2017 AOF ව්‍යාපෘතියේ 4 වැනි PMR රැස්වීම සඳහා සහභාගි වූහ .

x. යුධහමුදා සංස්කෘතික කණ්ඩායම චීනයේ සංචාරයක නියැලුණු අතර එය තානාපති කාර්යාලයේ ආරක්ෂක අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී.

**ශ්‍රී ලංකාවේ නියැලුණු සංචාර**

i. චීන PLA නාවික හමුදාවේ නැගෙනහිර මුහුදු කණ්ඩායමේ නියෝජ්‍ය කපිතාන් රෙයාර් අද්මිරාල් කුයි යුසෝන්ග් මහතා ගාලු සංවාදයට සහභාගි විය. මෙම ජාත්‍යන්තර සාමුද්‍රික සමුළුව, කොළඹ ගාලු මුවදොර හෝටලයේදී 2017 ඔක්තෝම්බර් 09 -10 දිනවලදී පවත්වන ලදී.

ii. මේජර් ජනරාල් ෂි සොන්ග් වූ මහතා සහ PLA නිලධාරීන් 20 ක්, 2017 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ හමුදා කඳවුරුවල අධ්‍යයන සංචාරයක නියැලුණහ.

**ක්‍රීඩා**

i. චීන මේස පන්දු වෘත්තීය පුහුණුකරුවන් දෙදෙනෙකු ශ්‍රී ලංකාවට එවන ලද අතර මෙම සංචාරය තානාපති කාර්යාලයේ ආරක්ෂක අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී.

ii. ආරක්ෂක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ බාලදක්ෂයින් දෙදෙනෙක් ඉහළ මට්ටමේ පුහුණු සඳහා චීනය බලා පිටත්වූහ. එය සම්බන්ධීකරණය කරන ලද්දේ මෙම තානාපති කාර්යාලයේ ආරක්ෂක අංශය විසිනි.

**වෙනත් සංචාර**

i. සමාජ සවිබලගැන්වීමේ , සුභසාධන හා උඩරට උරුමය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සමන් දේවප්‍රිය උඩවත්ත මහතා හා නිලධාරීහු 04 දෙනෙක් 2017 ඔක්තෝම්බර් 18-27 දිනවලදී බීජිං හිදී පැවති 2013-2022 ආබාධිත පුද්ගලයන්ගේ ආසියානු හා පැසිපික් දශකයේ අන්තර් මාධ්‍ය සමාලෝචනය පිළිබඳ රැස්වීමට සහභාගවීම සඳහා බීජිං බලා පිටත් වූහ.

ii. නාගරික සැලසුම් හා ජලපවාහන අමාත්‍යාංශයේ ලේකම් සරත් චන්ද්‍රසිරි විතාන මහතා සහ නිලධාරීහු 09 දෙනෙක් , චීන ශ්‍රී ලංකා නිදන්ගත වකුගඩු රෝග ඒකකයේ පර්යේෂණ ප්‍රදාන ව්‍යාපෘතිය යටතේ බීජිං හි සංචාරයක නියැලුණහ.

අදාළ විමසුම් කාලසීමාව තුළදී පහත ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් අත්සන් කරන ලදී.

- ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය හා චීනයේ රාජ්‍ය වනාන්තර පරිපාලනය අතර ස්වාභාවික සම්පත් ක්ෂේත්‍රයන්හි අවබෝධතා ගිවිසුම.
- දක්ෂිණ අධිවේගී මාර්ගය දිගු කිරීම පිළිබඳ උපදේශන සේවා හා මහනුවර උතුර පාතදුම්බර ජල සැපයුම් ව්‍යාපෘතිය සඳහා ණය සැපයීම සදහා වූ රාමුගත ගිවිසුම.
- ආයෝජනය, ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාවය සදහා මධ්‍යකාලීන හා දිගුකාලීන සංවර්ධන සැලැස්ම පිළිබඳව දළ සැලැස්ම.
- චීන යුවාන් මිලියන 400ක ප්‍රතිපාදන සඳහා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම.
- ආයෝජනය, ආර්ථික හා තාක්ෂණික සහයෝගිතාවය සඳහා රාමුගත ගිවිසුම.
- මොණරාගල හා චීනයේ ෂැන්ෂි පළාතේ පිෂාන් අතර සහෝදර නගර සබඳතා පිහිටුවීම සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුම.

**(ආ) බහුපාර්ශවීය සබඳතා**

උණ හා වේවැල් පිළිබඳ ජාත්‍යන්තර ජාලය ( INBAR)

- තානාපති කාර්යාලය , බීජිං හි පිහිටි උණ හා වේවැල් පිළිබඳ ජාත්‍යන්තර ජාල ලේකම් කාර්යාලය සමඟ ක්‍රමවත් සබඳතා පවත්වාගෙන යන අතර එම ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරනු ලබන රැස්වීම් / අංගවලට සහභාගි වෙයි.
- එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනයේ නිරීක්ෂක තත්වය ලබා ගැනීම සඳහා උණ හා වේවැල් පිළිබඳ ජාත්‍යන්තර ජාල ලේකම් කාර්යාලයට ශ්‍රී ලංකාවේ සහාය ලබාදීම පිළිබඳව විදේශ කටයුතු අමාත්‍යාංශය හා එම ලේකම් කාර්යාලය අතර හුවමාරු වු ලියකියවිලි පිළිබඳ කටයුතු තානාපති කාර්යාලය විසින් සිදු කරන ලදී.

**ආසියාව හා පැසිෆික් කලාප සඳහා ආර්ථික හා සමාජයීය කොමිෂන් සභාව (ESCAP)**

- සමාජ සවි බලගැන්වීම් , සුභසාධන හා උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශයේ නියෝජිතයින් සමඟ 2017 නොවැම්බර් 27- දෙසැම්බර් 01 දින දක්වා බීජිංහි පැවති 2013-2022 ආබාධිත පුද්ගලයන්ගේ ආසියානු හා පැසිපික් දශකයේ මධ්‍ය වාර සමාලෝචනය පිළිබඳව ඉහළ පෙළේ අන්තර් ආණ්ඩු රැස්වීමට තානාපති කාර්යාලය සහභාගි විය.

(ඇ) ආර්ථික සහ ආයෝජනය

### i. වෙළඳාම

- තේ, මැණික් හා ස්වර්ණාභරණ හා අත්කම් නිර්මාණ ප්‍රවර්ධනය කරමින් වෙළඳ ප්‍රදර්ශන කිහිපයකට තානාපති කාර්යාලය සහභාගී විය.

- 2017 ඔක්තෝම්බර් / නොවැම්බර් මාසවලදී බීජිං හිදී පැවති 2017 චීන ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳපළ සඳහා වෙළඳ සමාගම් 20 කගේ සහභාගීත්වය සඳහා අවශ්‍ය පහසුකම් සලසන ලදී.

### ii. සංචාරක කර්මාන්තය

- 2017 සැප්තැම්බර් මාසය තෙක් චීන සංචාරකයන් 268,952 ක් ශ්‍රී ලංකාවට පැමිණියහ. ගුවන්ග්ෂෝ, ලෙෂන්, ෂැන්හයි හා බීජිං හි සංචාරක ප්‍රදර්ශනවලට ශ්‍රී ලාංකික සමාගම් 15-20ක් පමණ සහභාගී විය..

- තානාපති කාර්යාලය විසින් සංවිධානය කරන ලද සංචාරක වෙළඳපලවල් හා මාර්ග දැක්මවල් විශාල ප්‍රමාණයකට ශ්‍රී ලාංකික සාගර නියෝජිතයින් 20 දෙනෙකු සහභාගි විය. මීට අමතරව, චීන මාධ්‍යයට හා සංචාරක ක්ෂේත්‍රයට ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කරන ලද වීඩි දර්ශන රැසක් ද පැවැත්විය:
    - 2017 බීජිං ජාත්‍යන්තර වෙළඳපල හා බීජිං වීථි දර්ශනය
    - 2017 වුහාන් ජාත්‍යන්තර වෙළඳ එක්ස්පො - ශ්‍රී ලංකා සංචාරක කටයුතු මහජනතාවට ප්‍රවර්ධනය කරන ලදී- බාහිර ප්‍රවර්ධන දර්ශනය
    - චැන්ග්ෂා ශ්‍රී ලංකා සංචාර මාර්ග දර්ශනය
    - චෙන්ග්ඩු ජාත්‍යන්තර සංචාරක එක්ස්පො -2017

### iii. ආයෝජනය

විශේෂයෙන්ම කෘෂිකර්ම, තාක්ෂණික හා නිෂ්පාදන ක්ෂේත්‍රයන්හි ආයෝජන අවස්ථා ගවේෂණය කිරීම සඳහා ආයෝජන නියෝජිත පිරිස් මෙන්ම තනි පුද්ගල සමාගම් කිහිපයක් ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

- තානාපති කාර්යාලය විසින්, දෙරට අතර ද්විපාර්ශ්වික සැමරුම් සඳහා ගරු විදේශ අමාත්‍යවරයා චීනයේ නියැලුණු සංචාරය අතරතුරදී, 2017 නොවැම්බර් 1 වැනි දින ආයෝජන සමුළුවක් සංවිධානය කරන ලදී.

- ශ්‍රී ලංකාවේ වෙළඳ සංචාරක හා ආයෝජන ඉඩ ප්‍රස්ථා අවධාරණය කරමින් ශ්‍රී ලංකාව පිළිබඳ සමරු සංග්‍රහයක් ද්විපාර්ශවික සැමරුම් අතරතුරදී පළ කිරීම සඳහා ආයෝජන උපදේශාත්මක සමාගමක් වන "ලුක්වි" සමඟ තානාපති කාර්යාලය අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කරන ලදී. මෙම සමරු සංග්‍රහය ව්‍යාපාරික ප්‍රජාව හා පාරිභෝගිකයන් අතර බෙදා හරිනු ලබමින් සිටියි.

- රෙදිපිළි ක්ෂේත්‍රයේ බහුවිධ වූ රෙදිපිළි කර්මාන්තපුර හා පුහුණු ආයතන ස්ථාපනය කිරීම සඳහා වූ ව්‍යාපෘති යෝජනාවක් පිළිබඳව සාකච්ඡා කිරීමට 2017 දෙසැම්බර් මස දී චීන රෙදිපිළි සංගමයේ නියෝජිත කණ්ඩායම ශ්‍රී ලංකාවේ නියැලුණ සංචාරය තානාපති කාර්යාලය විසින් සංවිධානය කරන ලදී.
- ආයෝජන හා ව්‍යාපෘති සහයෝගිතාව පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා 2017 දෙසැම්බර් මස වයඹ පළාත් සභාවට පැමිණි "CCPIT Qinghai" හි නියෝජිත කණ්ඩායමකගේ සංචාරය තානාපති කාර්යාලය විසින් සංවිධානය කරන ලදී.

**iv සංවර්ධන සහාය**

- චීනයේ අපනයන - ආනයන බැංකුවේ නිල නියෝජිත කණ්ඩායමක් 2017 දෙසැම්බර් 22 වැනි දින ශ්‍රී ලංකාවේ නිරත වූ සංචාරයේදී, තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය මහනුවර උතුරු - පාතදුම්බර සමෝධානික ජලාපවාහන ව්‍යාපෘතිය හා දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීම පිළිබඳ සිවිල් කටයුතු අධීක්ෂණය සඳහා උපදේශක සේවා පිළිබඳ මූල්‍ය ගිවිසුම්වලට අත්සන් තබන ලදි.

**ඈ) සංස්කෘතික සබඳතා**

- ශ්‍රී ලංකාවේ සංස්කෘතිය හා සම්ප්‍රදායන් චීනයේදී ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් තානාපති කාර්යාලය සංස්කෘතික අංග රැසක් පිළිබඳව ක්‍රියාකාරීව කටයුතු කරයි.
- ශ්‍රී ලංකාව හා චීනය අතර රාජතාන්ත්‍රික සබඳතා හා ආර්ථික සබඳතා ස්ථාපනය කිරීමේ 65 වැනි සංවත්සරය 2017 ඔක්තෝම්බර් 31 වැනි දින සමරන ලදී. මෙම අවස්ථාවට , විදේශ කටයුතු අමාත්‍ය ගරු තිලක් මාරපන , චීනයේ විදේශ කටයුතු සහකාර අමාත්‍ය ගරු ෂෙන් ෂියාඕ ඩොන්ග් හා චීනයේ ශ්‍රී ලංකා තානාපති ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු යන මැතිතුමන්ලා සහභාගි වූහ.
- චීනයේ "ඩිප්ලොමැට්" සඟරාව විසින් 2017 නොවැම්බර් 26 වැනි දින සංවිධානය කරන ලද 2017 "ඩිප්ලොමැට් නැෂනල් කොස්ට්යුම්" තරඟයේදී විශිෂ්ට නිර්මාණශීලිත්වයට හිමි සම්මානය බීජිං හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය දිනා ගත්තේය.

**ඉ) වෙනත්**

**i. දේශීය මාධ්‍ය සමඟ අන්‍යෝන්‍ය වශයෙන් සිදුකරනු ලබන කටයුතු**

තානාපති කාර්යාලය විසින් සංවිධානය කරනු ලබන විවිධ අංග සඳහා ප්‍රචාරය ලබාගැනීමට සහ ශ්‍රී ලංකාවේ වෙළඳ හා සංචාරක කටයුතු, ආයෝජනයන් සංස්කෘතියේ ප්‍රවර්ධනය කිරීම සඳහා තානාපති කාර්යාලය, චීන මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය සමඟ සමීපව කටයුතු කරයි.

මෙම තානාපති කාර්යාලය විවිධ පුහුණු වැඩසටහන් හා වැඩමුළු සම්බන්ධීකරණය කළ අතර 2018 නොවැම්බර් 28 පැවැත්වීමට නියමිත ආසියා සහයෝගිතා සංවාදය සඳහා පුහුණු ජල සම්පත් කළමනාකරණය, චීන, අප්‍රිකා පුවත් මාධ්‍ය මධ්‍යස්ථාන

වැඩසටහන හා 2017 දෙසැම්බර් 5 වැනි දින චීනයේ පැවති චීන දකුණු ආසියා හා දකුණු නැගෙනහිර ආසියා පුවත් මාධ්‍ය මධ්‍යස්ථාන වැඩසටහන හා 2017 නොවැම්බර් 5-9 දිනවල පැවති 1 වැනි චීන දකුණු ආසියා සාහිත්‍ය සංසදය වැනි තානාපති කාර්යාලයේ සහභාගිත්වය අවශ්‍ය වන වැඩසටහන් සඳහා සහභාගි විය.

ii. කුන්මිං මැරතන් ධාවන තරඟය

ෂැන්හායි සහයෝගිතා සංවිධානය හා යුනෑන් පළාත් ආණ්ඩුව විසින් 2017 දෙසැම්බර් 31 වැනි දින සංවිධානය කරන ලද ෂැංහයි සහයෝගිතා සංවිධානයේ කුන්මිං ජාත්‍යන්තර මැරතන් තරඟය සඳහා සහභාගිවීමට ධාවකයන් දෙදෙනෙකුට අවශ්‍ය පහසුකම් තානාපති කාර්යාලය විසින් සලසන ලදී. මෙම තරඟකරුවන් දෙදෙනා අතරින් වේලු ක්‍රිෂාන්තනී මෙනවිය මැරතන් තරඟයේ (කි.මී.42.195) සිවු වැනි ස්ථානය හිමිකර ගත්තාය.

**ii. ගුවන්ෂු**

**(අ) ද්විපාර්ශවික සබඳතා - සංචාර**

කොන්සල් කාර්යාලය මගින් පහත ශ්‍රී ලංකා සංචාර සඳහා පහසුකම් සලසන ලදී:

i. 2017 මැයි 17-20 දක්වා චීන කොමියුනිස්ට් පක්ෂයේ ලේකම් සහ ගුවන්ෂු මහජන කොංග්‍රසයේ ස්ථාවර කමිටුවේ සභාපති ගරු ෆෙන්ග් වින්ග්හුවා සහ පස් සාමාජික නියෝජිත පිරිස.

ii. විද්‍යාත්මක සහයෝගීතාවය සඳහා නාරා ආයතනය සමග සහයෝගිතා වැඩ සටහනක් ගවේෂණය කිරීම සදහා 2017 මැයි මාසයේ 23-25 දක්වා චීනයේ විද්‍යා ඇකඩමියේ අධ්‍යාපනික හා පර්යේෂණ සඳහා චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ මධ්‍යස්ථානයේ මහාචාර්ය ඩොන්ග් ෂියා ඕ ගේ ප්‍රධානත්වයෙන් යුත් නියෝජිත පිරිසක්.

**(ආ) ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජනය**

පහත අවස්ථාවන්හි දී කොන්සල් ජනරාල් කාර්යාලය විසින් ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කළේය:

i. ශ්‍රී ලාංකික සංචාරක හා චාරිකා මෙහෙයවන්නන් 19 සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය 2017 පෙබරවාරි 23-25 දක්වා ගුවන්ෂු ජාත්‍යන්තර සංචාරක ප්‍රදර්ශනයට සහභාගී වූහ. මෙම වෙළඳපළට සමගාමීව ෂෙන්සෙන් හා ගුආන්ග්ෂුහි සංචාරක මාර්ග දර්ශන දෙකක් පවත්වන ලදි.

ii. ව්‍යාපාරික ප්‍රජාව හා නෑංහයි කාර්යංශයේ රාජ්‍ය නිලධාරින් සඳහා 2017 පෙබරවාරි 8 වැනි දින ගුවැංඩොන් පළාතේ නෑංහයි හිදී ආයෝජන ප්‍රවර්ධන ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

iii. මාර්තු 15 වන දින දකුණු ආසියානු වෙළෙඳ හා ආයෝජන සංධානය පිහිටුවීම.

iv. 2017 මාර්තු 25 වන දින පිරිසිදු ලංකා කුරුඳු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීම.

v. 2017 මැයි මස 26 -29 දක්වා AQUARAMA වෙළෙඳ ප්‍රදර්ශනයට සහභාගී වීම.

vi. 150 වැනි ලංකා තේ සංවත්සරය හා ගුවැන්සි පළාතේ නැංනිං හිදී සැප්තැම්බර් මාසයේ 12-15 දක්වා චීන-ආසියානු වෙළෙඳ ප්‍රදර්ශනයට ශ්‍රී ලංකාවේ සහභාගීත්වය.

vii. සැප්තැම්බර් 21-24 දක්වා 21 වැනි ශතවර්ශයේ සමුද්‍රීය සේදමාවත ජාත්‍යන්තර ප්‍රදර්ශනය ග්වංඩොග් හි දී ශ්‍රී ලාංකික සමාගම් 7ක සහභාගීත්වයෙන් සංවිධානය කරන ලදී.

**ඈ. සංස්කෘතික සබඳතා**

i. ශ්‍රී ලංකාව හා චීනය අතර 60 වසරක රාජ්‍යතාන්ත්‍රික සබඳතා සැමරීම හා ශ්‍රී ලාංකික ලේඛකයන් විසින් කතෘත්වය දරන ග්‍රන්ථ 260 කට අධික ප්‍රමාණයක් තැබිය හැකි ගුවංෂු මහජන පුස්තකාලයේ ශ්‍රී ලංකා අංශය 2017 මාර්තු 23 වන දින පිහිටුවනු ලැබූ අතර ද්විපාර්ශ්වික සබඳතා නිරූපනය කරන "ශ්‍රී ලංකාව පිළිබඳව කෙටි සටහනක්" මැයෙන් ඡායාරූප ප්‍රදර්ශනයක් සංවිධානය කෙරිණි.

ii. සුප්‍රසිද්ධ ශ්‍රී ලංකික ළමා කතෘ නූරි විතාචි මහතා සමඟ ළමා වැඩමුළුවක් 2017 අප්‍රේල් 02 වන දින සංවිධානය කෙරිණි.

**iii. ෂැංහයි**

**(අ) ආර්ථික සබඳතා**

i. ෂීජියැන්ංගේ පළාතේ ප්‍රධාන නගරය වන හැන්ග් ෂු හිදී මැයි මාසයේදී ශ්‍රී ලංකා චීන ව්‍යාපාර කවුන්සිලය පිහිටුවන ලදී.

ii. ඇන්හුයි පළාතේ සහ ෂැන්හයි හිදී ශ්‍රී ලංකා මුහුදු ආහාර හා අපනයන ප්‍රවර්ධන වැඩ සටහනක් සංවිධානය කරන ලදී.

**(ආ) සංස්කෘතික සබඳතා**

i. වින්‍යාස නාට්‍ය කණ්ඩායම ෂැන්හයි හිදී රඟදැක්වීම හා සංචාරය කිරීම.

**(ඇ) තේ සහ සංචාරක ප්‍රවර්ධනය**

කොන්සල් ජනරාල් කාර්යාලය විසින් මගින් සංචාරක මාර්ග දැක්ම, ෂැන්හයි ලෝක සංචාරක ප්‍රදර්ශනය, ගෝලීය තේ සාදය-2017, ෂුවාෂන් හිදී ජාත්‍යන්තර දූපත් සංචාරක ප්‍රදර්ශනය - 2017 සඳහා පහසුකම් සලසා දෙන ලදී.

**3. ඉන්දුනීසියාව**

**(අ) ද්විපාර්ශවීය සබඳතා**

i. අතිගරු ජනාධිපති ජෝකෝ විඩෝඩෝ ගේ ආරාධනය පරිදි 2017 මාර්තු 08 දින අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ඉන්දුනීසියානු රාජ්‍ය සංචාරය සිදු විය.

දේශපාලන, ආර්ථික, සංස්කෘතික හා ආරක්ෂාව ආත ක්ෂේත්‍රවල සබඳතාවයන් සඳහා ද්විපාර්ශවික සාකච්ඡාවන්ගේ ප්‍රතිඵල මගින් වැදගත් දිශානතියක් ලබා දෙන ලදි.

ii. සංචාරයේදී පහත අවබෝධතා ගිවිසුම් අත්සන් තබන ලදී.

- ශ්‍රී ලංකා ජාතික කලා ශිල්ප සභාව හා කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකත්ව සහ සහයෝගිතාවය සඳහා වූ අළෙවිකරණ සේවා නියෝජිතායතනය අතර, සහ
- ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සහ ඉන්දුනීසියාවේ සමුද්‍රිය හා ධීවර අමාත්‍යාංශය විසින් සමුද්‍රිය හා ධීවර සහයෝගීතාවය සම්බන්ධයෙන් අත්සන් කළ අවබෝධතා ගිවිසුම.

iii. නීතිවිරෝධී, නියාමනය නොකළ, වාර්තා නොවූ ධීවර කටයුතු වැලැක්වීම හා තිරසර ධීවර පාලනය ප්‍රවර්ධනය සඳහා ජාත්‍යන්තර ස්වේච්ඡා සහයෝගීතාවය සම්බන්ධ ඒකාබද්ධ නිවේදනය නිකුත් කරන ලදී.

iv. ආරක්ෂක සහයෝගිතාවය: ආරක්ෂාව ආත පාඨමාලා හා සම්මන්ත්‍රණවලට නිලධාරීන් කිහිප දෙනෙකුගේ සහභාගීත්වයට අවශ්‍ය පහසුකම් සලසන ලදී.

v. අතිගරු ජනාධිපතිතුමාගේ ඉන්දුනීසියානු සංචාරයේ පසු විපරම් කටයුත්තක් ලෙස විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානායක මැතිතුමා, 2017 දෙසැම්බර් 07 වැනි දින ජකර්තාහිදී අතිගරු රෙට්නෝ මර්සුඩි මැතිතුමා සමග ද්විපාර්ශවික සාකච්ඡාවල නියැලිණි.

vi. විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානායක මහතා සඳහා ද්විපාර්ශවික හමුවක් සංවිධානය කරන ලද්දේ බෲනායි දරුසලාම් හි නියෝජිත කණ්ඩායම් නායකයින් හා කසකස්ථානය, ජෝර්දානය, ටිමෝර්, ලෙස්ටේ සහ සමෝආ යන රටවල අමාත්‍යවරුන් සමඟ සාකච්ඡා සංවිධානය කරන ලදී.

**(ආ) බහුපාර්ශවීය සබඳතා**

i. ජකර්තා හිදී ඉන්දියානු සාගර වටද්දර සංගමයේ 20 වැනි සංවත්සර නායක සමුළුව සඳහා අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා 2017 මාර්තු 07 දින සහභාගී විය.

ii. IORA කවුන්සිලයේ අමාත්‍යවරුන්ගේ රැස්වීමේදී, හිටපු විදේශ කටයුතු අමාත්‍ය ගරු මංගල සමරවීර මහතා සහ නියෝජිත පිරිසගේ සහභාගීත්වය සඳහා පහසුකම් සපයන ලදී .

iii. පහත උත්සවයන් සඳහා තානාපතිතුමා සහභාගී විය.

IORA ජ්‍යෙෂ්ඨ නිලධාරී හමුව- (2017 මාර්තු 05)/ දෙවන IORA අමාත්‍යාංශ නිල් ආර්ථික සමුළුව - 2017 මැයි 09/ ආසියානු අප්‍රිකානු සමුළුවේ 62වන සංවත්සරය - 2017 අප්‍රේල් 18/ආසියානු අප්‍රිකානු කොඩි එසවීමේ උත්සවය හා "ප්‍රාරම්භක කමිටුව 2017

උදෙසා" න්‍යෂ්ටික අවි තහනම් කිරීමේ ගිවිසුම සම්බන්ධයෙන් කලාපීය කතිකාවත හා උපදේශනය - 2017 මාර්තු 13-14

iv. ගරු වසන්ත සේනානායක මැතිතුමා විසින් බාලි ප්‍රජාතන්ත්‍රික සංසදයේදී ශ්‍රී ලංකාව නියෝජනය කරන ලද අතර කළමනාකරණය, විවිධත්වය ආරක්ෂාව, සමානාත්මතාව හා සමාජ සාධාරණය තේමා කොටගත් අමාත්‍යවරුන්ගේ සැසියට එතුමා සහභාගි විය.

**(ඇ) ආර්ථික සබඳතා හා විදේශ ආයෝජන**

i. ශ්‍රී ලංකාව හා ඉන්දුනීසියානු නිදහස් වෙළෙඳ ගිවිසුම/ වරණාත්මක වෙළඳ ගිවිසුමට අනුව 2017 අගෝස්තු 24 වන දින කොළඹදී පැවැති ද්විපාර්ශවීය සාකච්ඡා හා ලංකා වාණිජ මණ්ඩලයේදී පැවැති ව්‍යාපාර සංසඳය ආත සාකච්ඡා සම්බන්ධීකරණය කරන ලදී. (2017 මාර්තු 23 වැනි දින)

ii. වෙළඳ ප්‍රදර්ශනයඃ ශ්‍රී ලාංකික සමාගම් 7ක් සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය එක්ව ASTINDO සංචාරක ප්‍රදර්ශනයට ශ්‍රී ලංකාවේ සහභාගිත්වය - 2017 මාර්තු 24-26

iii. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය හා සමාගම් 7ක් එක්ව ජකර්තා හි පැවැති ජාත්‍යන්තර ස්වර්ණාභරණ කාර්යාංශයට ශ්‍රී ලංකාව සහභාගී විය -2017 අප්‍රේල් 20-23 මෙහිදී ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමග සාකච්ඡා පැවැත්වීම සඳහා FACETS ප්‍රදර්ශනය සඳහාත් ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලුණු ඉන්දුනීසියානු රන් කරුවන් හා ස්වර්ණාභරණ සංගමයේ ව්‍යාපාරික සාමාජිකයන් 11 දෙනෙකුට පහසුකම් සැලසීය.

iv. ශ්‍රී ලංකාවේ ෂෙලින් කණ්ඩායම සහ PT සැමුදෙරා හා ඉන්දුනීසියානු සමුද්‍රීය පුහුණු ආයතනය අතර සහයෝගිතා ව්‍යාපාර සහ ආයෝජන සංවාද ඇති කර ගන්නා ලදි.

v. සංචාරක, ආහාර හා ආපන ශාලා, සමුද්‍රීය හා සැපයුම්, ගෘහස්ථ ගුවන්සේවා ආදී විවිධ ක්ෂේත්‍රයන්හි ආයෝජනය සම්බන්ධයෙන් ව්‍යාපාරික සාකච්ඡා පැවැත්වුණි.

vi. ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ නියෝජිත කණ්ඩායමක් 2017 ඔක්තෝම්බර් මස පැවති ඉන්දුනීසියා එක්ස්පො 2017 සඳහා සහභාගි වූ අතර ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසන ලදී.

vii. මේ සඳහා සහභාගි වූ ශ්‍රී ලංකා වෙළඳ සමාගම් සඳහා ව්‍යාපාරික සැසිවාරයක් සංවිධානය කරන ලදි.

viii. ව්‍යාපාරික සහයෝගිතාව වැඩි දියුණු කිරීම සඳහා සහ ඉන්දුනීසියාවේ අතිගරු ජනාධිපතිතුමාගේ රාජ්‍ය සංචාරය තුළදී අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා "KADIN ඉන්දුනීසියා" හා ලංකා වාණිජ මණ්ඩලය අතර සාකච්ඡාවල නියැලිණි.

ix. ද්විපාර්ශ්වික PTA/FTA සඳහා නිර්දේශිත කාර්ය සැලැස්ම පිළිබඳව ඉන්දුනීසියානු නියෝජිතායතන සමග ද වෙළඳාම හා අයෝජන පිළිබඳව ක්‍රියාකාරි කණ්ඩායම සමඟ ද සාකච්ඡා පැවැත්වීම.

x. 2017 නොවැම්බර් මස පැවති "ජාත්‍යන්තර WIC බසාර්" හිදී ශ්‍රී ලංකාවේ තේ හා අත්කම් පිළිබඳව ඉදිරිපත් කිරීමක් කරන ලදී.

**(ඈ) ව්‍යාපාර හා වෙළඳ පහසුකම් සැලසීම**

- නැවුම් ආහාර හා ශාකවලින් සම්භවය ලත් ආහාර විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ තේ සම්බන්ධයෙන් නව ඉන්දුනීසියානු රෙගුලාසි යටතේ ආහාර හා සුරක්ෂිතතා ලියාපදිංචි කිරීමේ වඩාත් ඉහළ තාක්ෂණික ක්‍රියාවලියක් ලබා ගැනීමට තානාපති කාර්යාලය පහසුකම් සැලසීය. ඒ අනුව වසර තුනක දීර්ඝ කළ හැකි කාලසීමාවක් සඳහා තේ සඳහා විශේෂ වූ සහතික නිකුත් කිරීමට SGS සමාගමට සහ ශ්‍රී ලංකා තේ මණ්ඩල පර්යේෂණාගාරයට බලය පවරා ඇත.
- බණිජ වැලි, මාර්ග සංවර්ධන, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ ගුවන්තොටුපල හෝටලය, ටුටිකොරින් කොළඹ බෝට්ටු සේවය, රජයේ වෘත්තිකයින්ගේ නිල නිවාස, දුම්රිය, මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති , මුදු ජලයේ ලවණ බැහැර කිරීම පිළිබඳව ශ්‍රී ලංකාවේ වැඩසටහන් හා ටෙන්ඩර්පත් ප්‍රවර්ධනය කරන ලදී.

**(ඉ) සංස්කෘතික සබඳතා**

- ශ්‍රී ලාංකික ප්‍රජාව සමඟ එක්ව 2017 ජනවාරි 09 වන දින ජාතික සංහිඳියා දිනය සමරන ලදී.

විවිධත්වය සැමරීම: ශ්‍රී ලංකාවේ විවිධත්වය හා එකමුතුභාවය හා අවබෝධය ගොඩනැගීම සැමරීම සඳහා දිගින් දිගටම ක්‍රියාත්මක කරන වැඩසටහනක් ලෙස 2017 මැයි මස වෙසක් උත්සවය හා 2017 ජූනි මස රාමසන්/ ඉෆ්තාර් සැමරීමෙන් පසුව තානාපති කාර්යාලය 2017 ඔක්තෝම්බර් 21 වැනි දින දීපවාලි උත්සවය සැමරීම සඳහා ද 2017 දෙසැම්බර් 03 වැනි දින නත්තල් උත්සවය සැමරීම සඳහා ද එක්විය.

**(ඊ) කොන්සියුලර් හා කම්කරු සුභසාධනය**

ශ්‍රී ලාංකික සරණාගතයන් 17 දෙනෙකු හා මීඩන් හි රඳවා සිටි ශ්‍රී ලාංකික නීති විරෝධී සංක්‍රමණිකයන් 28 දෙනෙකු සියරටට ගෙන්වා ගැනීමට පහසුකම් සැලසීය.

## 04. ජපානය

**(අ) ද්විපාර්ශවීය සබඳතා**

i. 2017 අප්‍රේල් 10-16 දක්වා දක්වා ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍යවරයා ජපානයේ සංචාරය කළේය. "ජපානය හා ශ්‍රී ලංකාව අතර පුළුල් හවුල්කාරිත්වය ශක්තිමත් කිරීම හා ප්‍රසාරණය කිරීම" මැයෙන් ඒකාබද්ධ ප්‍රකාශනයක් නිකුත් කරන ලදී. මීට අමතරව "ඉස්මතුවන කලාපයන්හි ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය" සහ "කළුගඟ

ජල සැපයුම පුළුල් කිරීමේ ව්‍යාපෘතිය" මෙන්ම ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන පිළිබඳව ආධාර ප්‍රදාන ව්‍යාපෘතීන්ට අදාළ සටහන්වලට අත්සන් තැබූ අතර හුවමාරු කර ගන්නා ලදී.

ii. ජපාන අග්‍රාමාත්‍යවරයාගේ විශේෂ උපදේශකවරයෙකු වන ආචාර්ය හිරොතෝ ඉසුමි, ප්‍රමුඛ නියෝජිත පිරිසක් 2017 අගෝස්තු මස ශ්‍රී ලංකාවට පැමිණ ශ්‍රී ලංකා ආණ්ඩුවේ නිලධාරීන් සමඟ ද්විපාර්ශ්වික සහයෝගිතාව පිළිබඳ සාකච්ඡා පැවැත්වීය.

iii. ජපානයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ආරාධනයකට අනුව, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය ගරු රුවන් විජේවර්ධන මැතිතුමා 2017 නොවැම්බර් 2-8 දිනවලදී ටෝකියෝ හි නිල සංචාරයක නිරත විය. අදාළ අමාත්‍යවරු සමඟ සංවාද පැවැත්වීම තුලින් ජපානය පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම මෙම ආරාධනාවේ අරමුණ විය.

iv. මෙම සංචාරය අතරතුරදී, රාජ්‍ය අමාත්‍යවරයා 2017 නොවැම්බර් 6 වැනි දින ජපානයේ ආරක්ෂක අමාත්‍ය ටිසුනොරි ඔනෝඩෙරා මහතා හමු වූ අතර ආරක්ෂක ක්ෂේත්‍රයේ විශේෂයෙන්, සමුද්‍රීය ආරක්ෂක සහයෝගිතාව පිළිබඳව අන්‍යොන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන කරුණු මෙහිදී සාකච්ඡා කළේය. සමුද්‍රීය රටවල් දෙක අතර ප්‍රබල ආරක්ෂක සහයෝගිතාවක් පවත්වා ගැනීමේ වැදගත්කම ද අමාත්‍යවරු දෙපළ මෙහිදී සාකච්ඡා කළහ.

v. අමාත්‍යවරයා මෙහිදී විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය කසුයුකි නාකනේ මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී හිරොයුකි මියාසාවා මහතා සහ ජපාන වෙරළාරක්ෂක අණදෙන නිලධාරී අද්මිරාල් සටොෂි මහතා සහ පාර්ලිමේන්තු මන්ත්‍රි හා ජපාන - ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ලීගයේ සාමාජික යුකො ඔබුචි මහතා හමුවිය.

vi. ජපාන රජය විසින් ශ්‍රී ලංකා වෙරළාරක්ෂක හමුදාවට පරිත්‍යාග කරන ලද මීටර් 30 වර්ගයේ මුර යාත්‍රාව දියත් කිරීමේ සමාරම්භක උත්සවය සඳහා රාජ්‍ය අමාත්‍ය විජේවර්ධන මහතා සහභාගි විය.

vii. මෙම සංචාරයේදී රාජ්‍ය අමාත්‍යවරයා සහ නියෝජිත කණ්ඩායම කියෝටො , හිරෝෂිමා ඔනොමිචි නැව් තටාංකගය හා ජපාන සමුද්‍රීය ස්වයං ආරක්ෂක බලකා කඳවුර ද නැරඹීමට ගියහ.

viii. ඉඩම්, යටිතල පහසුකම්, ප්‍රවාහන හා සංචාරක කටයුතු අමාත්‍ය කෙයිචි ඉෂි මැතිතුමාගේ 2017 දෙසැම්බර් 24-29 දිනවල දී නියැලුණ ශ්‍රී ලංකා සංචාරය සඳහා අවශ්‍ය පහසුකම් මෙම දූත මණ්ඩලය විසින් සලසන ලදී. අමාත්‍යවරයා සමඟ පැමිණි නියෝජිත කණ්ඩායමේ අරමුණ වූයේ ප්‍රතිපත්තිමය සාකච්ඡා පැවැත්වීමය.

**(ආ) ආර්ථික සබඳතා සහ විදේශ ආයෝජන**

ගරු අග්‍රාමාත්‍යතුමා ජපානයේ නිරත සංචාරය අතරතුරදී, දෙපාර්ශවයේ නායකයින් දෙපළ, 2015 ඔක්තෝබර් මස ජපානය සහ ශ්‍රී ලංකාව අතර ඇතිකර ගත් ඒකාබද්ධ විස්තීරණ හවුල්කාරිත්වය (JCP) සඳහා වන තම කැපවීම තවදුරටත් ශක්තිමත් කිරීමට අදිටන් කර ගත්හ. විස්තීරණ

හවුල්කාරිත්ව ආර්ථික න්‍යාය පත්‍රය යටතේ 2017 වසර මුළුල්ලේ ප්‍රධාන රැස්වීම් (03)ක් පැවැත්වීමට කටයුතු යෙදිණි.

- **විදේශීය ආයෝජන, සමුළු හා ප්‍රවර්ධන කටයුතු:**

2017 වසරේ අවසාන භාගයේදී අප දෙරට අතර වාණිජ හා ආර්ථික සබඳතා තවදුරටත් වර්ධනය කිරීමේ අරමුණින් මෙම තානාපති කාර්යාලය, ජපාන බලධාරීන් හා ව්‍යාපාර සඳහා සහායක ආයතන, වෙළඳ මණ්ඩල හා ව්‍යාපාරික සභා සමඟ දිගින් දිගටම අදාළ කටයුතුවල නියැලී තිබේ.

2017 අවසාන භාගයේදී දැනට ජපානයෙන් ශ්‍රී ලංකාවට පැමිණ ඇති විශාලතම ව්‍යාපාරික කණ්ඩයමට අවශ්‍ය පහසුකම් සැලසීය. මෙම සංචාර සිදුවුනේ 2018 ජනවාරි මසදීය.

ජපානයේ මුදල් අමාත්‍යාංශයේ දත්තවලට අනුව ශ්‍රී ලංකාවේ ආනයන 2017 ඔක්තෝම්බර් දෙසැම්බර් කාලසීමාව තුලදී, 2016 වසරේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව 1% කින් වර්ධනය වී තිබේ. එම දත්තවලට අනුව, වාර්ෂික අපනයන වර්ධනය 2016-2017 වර්ෂයෙහි 7.9% ක් ලෙස වාර්තා වි තිබේ. (2017 වසරේදී යෙන් බිලියන 2ක් අපනයන එක්විමෙන්) ආයෝජණ මණ්ඩල දත්තවලට අනුව, 2017 වසරේ මුල් කාර්තු තුනේදි, ජපානයේ සෘජු විදේශීය ආයෝජනවල වටිනාකම ඇ.ඩො. මිලියන 30 ක් ලෙස වාර්තා වී තිබේ. 2016 වර්ෂයේදී ජපානයෙන් ලද සමස්ත සෘජු විදේශ ආයෝජනවල වටිනාකම ඇ.ඩො.මිලියන 30 කි.

**(ඇ) ආයෝජන ප්‍රවර්ධන**

දූත මණ්ඩලය විසින් පහත අවස්ථා සංවිධානය/ පහසුකම් සැළසීම සිදු කරන ලදී.

i. ටෝකියෝ, නගෝයා, චිබා සහ යමනෂි නගරවල ආයෝජන ප්‍රවර්ධන සමුළු.

ii. ශ්‍රී ලංකාවේ සංචාරක, ධීවර සහ මූල්‍ය ක්ෂේත්‍රවල ප්‍රධාන ශක්‍යතාවලින් හෙබි සමාගම් 04ක සංචාරය කිරීම.

iii. ජපානයේ පැවති ශ්‍රී ලංකා උළෙල සහ ගෝලීය ලංකා තේ සාදය.

iv. ටෝකියෝහි පැවති දෙවන ශ්‍රී ලංකා මැණික් උළෙල.

v. ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන 04කදී ශ්‍රී ලංකා සහභාගීත්වය සහ ශ්‍රී ලංකාවේ PPP නියෝජිතායතනයේ ධාරිතා සංවර්ධනය සහ ධීවර යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කාර්මික ආධාර ව්‍යාපෘති දෙකක්.

vi. වෙළඳ හා ආයෝජනවලට අදාළ විමසීම් හැත්තෑවකට පමණ සහ වෙළඳ පැමිණිලි දෙකකට ප්‍රතිචාර දැක්වීම සහ අවධානය යොමු කිරීම.

vii. මෙම දූත මණ්ඩලය විසින්, පැමිණීමට සිටින ව්‍යාපාරික කණ්ඩායම් හා පිටවීමට සිටින ව්‍යාපාරික දූත කණ්ඩායම් සඳහා අවශ්‍ය පහසුකම් සලසන ලදි.

viii. මෙම තානාපති කාර්යාලය විසින් වෙළෙඳ සම්මන්ත්‍රණ සඳහා පහසුකම් සලසන ලද අතර ආයෝජන හා ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය හා ඒ සඳහා පහසුකම් සැලසීම සිදු කරන ලදී.

ix. "PPP ධාරිතා සංවර්ධනය හා හරිත බලශක්තිය " පිළිබඳ තාක්ෂණික සහාය ලබාදීමේ වැඩසටහන් දෙකක් (02) සඳහා ද මෙම දූත මණ්ඩලය පහසුකම් සැලසීය.

x. වෙළෙඳ කටයුතු වලදී සහාය ලබාදෙන ආයතන හයක් (06 ) සමඟ කටයුතු කළ අතර වෙළෙඳ / ආයෝජන විමසුම් විසිහතරකට (24) සහභාගි වී ඒවායේ පසු විපරම් කටයුතු සම්බන්ධයෙන් ද අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

**05. මැලේසියාව**

**(අ) ද්විපාර්ශ්වික සබඳතා**

මෙලකා හි ප්‍රධාන අමාත්‍ය ඩටුක් සෙරි උටමාඉර් හිජ් ඉඩ්රිස් බින් හිජ් හාරෝන් මැතිතුමා 2017 මාර්තු මස මහකොමසාරිස්වරයා විසින් හමුවන ලදී. මෙලාකා නගරය සහ හම්බන්තොට අතර සමීප සහයෝගීතාවට අදාළ ද්විපාර්ශ්විකව වැදගත් වන කාරණා පිළිබඳව සාකච්ඡා කළ අතර ප්‍රධාන අමාත්‍යවරයා 2017 සැප්තැම්බර් මස යෙදීමට නියමිත ශ්‍රී ලංකා සංචාරය සංවිධානය කෙරිණි.

**(ආ) වෙළඳ හා ආර්ථික සබඳතා**

ගෝලීය තේ සාදය, 2017 ජූලිඃ මැලේසියානු තේ වෙළඳ සංගමය සමඟ ඒකාබද්ධව සංවිධානය කෙරිණි.

මහ කොමසාරිස් කාර්යාලය පහත අවස්ථා සඳහා පහසුකම් සැලසීයඃ

i. 2017 අගෝස්තු මස පැවති මැලේසියා ජාත්‍යන්තර ආහාර සහ පාන වර්ග සල්පිලට ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ අපනයන සමාගම් 6ක් සහභාගී කරවීම.

ii. 2017 අප්‍රේල් මස, මැලේසියානු ජාත්‍යන්තර හලාල් ප්‍රදර්ශනයේ (MIHAS) ශ්‍රී ලංකා නියෝජිත පිරිසේ සහභාගීත්වය.

iii. ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පවත්වාගෙන යාම පිළිබඳ MINE (ව්‍යවසායකයින්ගේ එක් මැලේසියාවක් ජාලය) සමඟ සම්බන්ධවීමට අදාළ දැනුවත් කිරීමේ වැඩසටහනට සහභාගී වීම.

**(ඇ) සංස්කෘතික සබඳතා**

මැලේසියාවත් ශ්‍රී ලංකාවත් අතර රාජතාන්ත්‍රික සබඳතාවල 60වැනි සංවත්සරය නිමිත්තෙන් මහ කොමසාරිස් කාර්යාලය විසින් පහත අවස්ථා සංවිධානය කෙරිණි :

i. රටවල් 21 ක සහභාගීත්වය ඇතිව, මැලේසියාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ ජාතික කෞතුකාරයේදී සංස්කෘතික උළෙලක් සංවිධානය කිරීම.

ii. 2017 අගෝස්තු මස ශ්‍රී ලංකාවේ තරුණ කඳවුර සහ 2017 ජූලි මාසයේදී දෙවැනි ගෝලීය බෞද්ධ කොංග්‍රසය සහ ලෝක බෞද්ධ සංඝ තරුණ සමුළුව.

**(ඈ) කම්කරු සුභසාධනය**

සේවායෝජකයින්, බඳවාගැනීම් නියෝජිතායතන සහ සේවාදායකයින් කළ පැමිණිලි මහ කොමසාරිස් කාර්යාලයේ අවධානයට යොමු වූ අතර ඒවා විසඳීමට කටයුතු කරන ලදී.

**(ඉ) සංචාරක ප්‍රවර්ධනය**

i. SLTPB සහ ශ්‍රී ලංකා ගුවන්සේවය සමඟ එක්වූ ශ්‍රී ලාංකික සංචාරක නියෝජිතයින් 12 දෙනෙක්, 2017 වසරේ MATTA සල්පිළට සහභාගී වූහ.

ii. 2017 සැප්තැම්බර් මස ක්වාලාලම්පූර් හි පැවති සංචාරක වැඩමුළුවට ශ්‍රී ලාංකික සංචාරක නියෝජිතයින් 12 දෙනෙකු සහභාගී වූහ.

**06. මියන්මාර්**

**(අ) ද්විපාර්ශ්වික සබඳතා: සංචාර**

පහත නියෝජිත කණ්ඩායම් මියන්මාරයේ යෙදුණු සංචාර සඳහා තානාපති කාර්යාලය විසින් පහසුකම් සලසන ලදී.

i. සෞඛ්‍යය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය, ගරු දොස්තර රාජිත සේනාරත්න මහතා ප්‍රමුඛ නියෝජිත පිරිසක් 2017 මාර්තු 07-10 දිනවල පැවති ඩිජිටල් සෞඛ්‍ය සම්මේලනයට සහභාගී වීම.

ii. බුද්ධශාසන හා අධිකරණ අමාත්‍ය ගරු අචාර්ය විජේදාස රාජපක්ෂ මහතා 2017 මාර්තු 14-15 දිනවල එහි කළ සංචාරය.

iii. 2017 අගෝස්තු 06 දින බුද්ධශාසන නියෝජ්‍ය අමාත්‍ය එස්. දුෂ්මන්ත මහතා "සාමය, සමගිය හා ආරක්ෂාව සඳහා වූ කතිකාව" අවස්ථාවට සහභාගී වීම.

iv. මියන්මාර රජය විසින් සංවිධානය කරන ලද මියන්මාරයේ පැවති "ජාතික සංහිඳියා හා සාම ක්‍රියාවලිය" සඳහා සහභාගිවීමේ කටයුතු.

**(ආ) ආර්ථික සබඳතා හා විදේශ ආයෝජන**

මියන්මාරයේ ප්‍රධාන පෙළේ නැව් භාණ්ඩ ප්‍රවාහන සමාගම් කිහිපයක් සහ ජනාධිපතිතුමාගේ ආර්ථික උපදේශකවරයා සමග සාකච්ඡා පවත්වමින් ශ්‍රී ලංකාවට සෘජු නැව් භාණ්ඩ ප්‍රවාහනයන් ආරම්භ කරන ලෙස ඉල්ලා සිටින ලදී.

**(ඇ) සංස්කෘතික සබඳතා**

තානාපති කාර්යාලය විසින් පහත සඳහන් අවස්ථාවලට පහසුකම් සලසන ලදී :

i. 2017 මැයි මාසයේ ශ්‍රී ලංකාවේදී පවත්වන්නට යෙදුණු එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර වෙසක් දින සැමරුමට මියන්මාර නියෝජිත කණ්ඩායම සහභාගී කරවීම.

ii. අනුරාධපුරයේ සම්බුද්ධ ජයන්ති මහා විහාරයට පූජා කිරීම පිණිස අඩි 05ක කිරි ගරුඬ බුද්ධ ප්‍රතිමාවක් ශ්‍රී ලංකාවට එවීම.

iii. ශ්‍රී ලංකාවේ "බෞද්ධයා" මාධ්‍ය ජාලයේ 10 වැනි සංවත්සරය නිමිත්තෙන් පැවති බෞද්ධ උත්සවය, යැන්ගොන් හි ස්වෙදගොන් විහාරයේදී සංවිධානය කිරීම.

iv. මියන්මාරයේ ඇත් පැටවකු නුවර දළදා මාලිගාව වෙත පූජා කිරීම.

v. බෞද්ධ සම්බන්ධතා ශක්තිමත් කිරීමේ අරමුණෙන් යැන්ගොන් හි ෂ්වෙඩගොන් විහාරයත් නුවර දළදා මාලිගාවත් අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම.

vi. මියන්මාරයේ කැපී පෙනෙන සිද්ධස්ථානයක් වන පූජනීය ෂ්වෙඩගන් දාගැබේ අනුරුවක්, මියන්මාරයේ අතිපූජ්‍ය අවුන්ග් සා බු හා බැතිමතුන්ගේ පරිත්‍යාගයෙන් ශ්‍රී ලංකාවේ මාතලේදී ඉදි කරනු ඇත. මෙම පරිත්‍යාගය 2017.11.28 වැනි දින ශ්‍රී ලංකාවේ අති පූජ්‍ය මුදුගුනුවෙල අනුරාධ හිමියන්ට තානාපති කාර්යාලයේදී භාර දෙන ලදී.

## 07. පිලිපීනය

**(අ) ද්විපාර්ශ්වික සබඳතා: සංචාර**

- 24 වැනි ආසියාන් (ASEAN) කලාපීය සංසදයට සහ ආසියාන් සංගමයේ (ASEAN) 50 වැනි සංවත්සරයට සහභාගී වීමට විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු වසන්න සේනානායක මහතා පිලිපීනයේ සංචාරය කළේය. පිලිපීනයේ ජනාධිපති අතිගරු රොඩ්‍රිගෝ රෝ ඩුටර්ටේ සමඟ කෙටි සුහද හමුවක් පැවැත්වීමේ අවස්ථාව ගරු වසන්ත සේනානායක අමාත්‍යවරයාට ලබා දීමට තානාපති කාර්යාලය කටයුතු කළේය. පිලිපීනයේ අමාත්‍යවරුන් සහ බලධාරීන් සමඟ ද්විපාර්ශවික හමු පැවැත්වීමට ද එතුමාට අවස්ථාව උදා විය.

- 2017 නොවැම්බර් 17 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍යතාන්ත්‍රික හා නිල විදේශ ගමන් බලපත්‍ර හිමියන් වීසා බලපත් ලබාගැනීමෙන් නිදහස් කිරීම පිළිබඳ ගිවිසුම බලාත්මක කිරීම ( 2016 ඔක්තෝම්බර් 07 වැනි දින අත්සන් තබන ලදි.)

- කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව පිලිපීනය සමඟ පවත්නා සහයෝගිතාව වැඩිදියුණු කිරීම හා ශාබ අභිජනන කෘෂිකර්ම ආර්ථික විද්‍යාව සහ ඊට අදාළ වෙනත් විෂයන් පිළිබඳව "පිලිපීන්ස් ලොස් බානොස් විශ්ව විද්‍යාලයේදී" ආචාර්ය හා විද්‍යාපති උපාධි මට්ටමින් අධ්‍යයන කටයුතු සිදු කිරීමට ශ්‍රී ලාංකික විද්‍යාඥයින්ට ඉඩකඩ ලබාදීමේ කටයුතු අවසාන කිරීම. මෙය 2018 වසරේ සිට ආරම්භවනු ඇත.

- ශ්‍රී ලංකාවේ වනජීවීන් පිළිබඳව වාර්තාමය වැඩසටහනක් නිෂ්පාදනය කිරීම සඳහා " බෝන් ටුබී වයිල්ඩ්" කණ්ඩායමට අයත් "GMA නෙට්වර්ක් ෆිලිපීන්ස්" සමඟ දිගින් දිගටම සාකච්ඡා පැවැත්වීම.

**(ආ) බහුපාර්ශ්වීය සබඳතා**

i. කොළඹ ක්‍රමයේ කාර්ය මණ්ඩල විද්‍යාලයේ (CPSC) සභාපතිධුරය ශ්‍රී ලංකාව හෙබවීමේ ප්‍රතිඵලයක් ලෙස, එහි පාලක මණ්ඩලයට, CPSC වැඩසටහන් 40ක් දක්වා වැඩි කිරීමේ හැකියාව ලැබුණු අතර එමගින් 3,270ක ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් බිහිවිය. එසේම අඩු ආදායම්ලාභී ශ්‍රී ලාංකික සමෘද්ධි ලාභීන් සඳහා කෙටිකාලීන කුසලතා සංවර්ධන

වැඩසටහන් අවස්ථා ලබා දෙන ලෙසට කොළඹ ක්‍රමයේ මණ්ඩල විද්‍යාලය සමඟ සාකච්ඡා ද ආරම්භ කෙරිණි.

ii. ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනය (IRRI) සහ ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත අමාත්‍යාංශය අතර ගිවිසුමට එළඹීම සඳහා වූ සාකච්ඡා පැවැත්විණි.

iii. ආසියන් සංවිධානයේ අංශික සංවාදකරුවකු ලෙස අයදුම්කිරීමේ ශ්‍රී ලංකාවේ අභිලාෂය සම්බන්ධයෙන් ආසියන් සාමාජික රටවල දූත මණ්ඩල ප්‍රධානීන් සියල්ලම සමඟ පසුවිපරම් සාකච්ඡා පැවැත්වීම.

iv. ශ්‍රී ලාංකිකයෙකු ප්‍රථමවතාවට නව පාලක සභාව සඳහා පත්කරගන්නා ලදී. කොළඹ ක්‍රමය පිළිබඳ මණ්ඩලික විද්‍යාලයේ (CPSC) උපදේශන පීඨය සමඟ කටයුතුවල නියැලිණි. CPSC ජාත්‍යන්තර පළපුරුද්ද පිළිබඳ වෘත්තීය සීමාවාසික වැඩසටහන සඳහා ශ්‍රී ලංකාව තෝරා ගන්නා ලදී.

v. 2017 ඔක්තෝබර් මස මැනිලාහිදි පැවති සංක්‍රමණික වන සත්ව විශේෂ සංරක්ෂණය පිළිබඳ පාර්ශව සමුළුවේදී (CMS COP12) සංක්‍රමණික මෝරුන් සංරක්ෂණය පිළිබඳව අවබෝධතා ගිවිසුමට ශ්‍රී ලංකාව අත්සන් තැබීය.

**(ඇ) ආර්ථික සබඳතා**

i. පිලිපීනයේ වෙළඳ හා කර්මාන්ත දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පවත්වමින් තානාපති කාර්යාලය විසින්, 1980 දී පිලිපීනයත් ශ්‍රී ලංකාවත් අතර අත්සන් තැබුණු වෙළඳ ගිවිසුම, දැනට පවතින ද්විත්ව බදුකරණය වැළැක්වීමේ සහ අදායම් මත බදු සම්බන්ධයෙන් පැනවෙන මූල්‍ය පැහැර හැරීම වැළැක්වීම පිළිබඳ ගිවිසුම යළි ශක්තිමත් කිරීමේ පියවර ගනු ලැබීය.

ii. තානාපති කාර්යාලය විසින් Rezostar Inc නම් පිලිපීන සමාගම සමඟ සහ A F Jones ලංකා තේ ආයතනය (ශ්‍රී ලංකා සමාගම) සමඟ වෙළඳ සාකච්ඡා පවත්වමින් ජෝන්ස් (Jones) තේ පිලිපීනයට අපනයනය කිරීමට කටයුතු සකස් කෙරිණි.

iii. 2017 ජූලි මස 27-28 දිනවල පැවති මේට්‍රෝ මැනිලා ව්‍යාපාරික සම්මේලනයේ 25 වැනි සැසිවාරයට සහභාගී විය. පිලිපීනයේ ජෝර්ජ් ස්ටුවර්ට්ස් සමාගම 2017 මාර්තු 16-18 දිනවල Nothern Luzon, Vigan, Ilocos Sur හි පැවති ලෝක ආහාර ප්‍රවර්ධන වැඩසටහනට සහභාගී වෙමින් (WOFEX) ලංකා තේ ප්‍රවර්ධනයට කටයුතු කළේය.

iv. 2017 වසරේදී සමස්ත ද්විපාර්ශ්වික වෙළෙඳාම ඇ.ඩො. මිලියන 60 ක් දක්වා වර්ධනය වී තිබෙන අතර එම වර්ෂයේදී කලින් පැවති අගය දෙගුණවීමක් පෙන්නුම් කරයි.

v. 2017 වසරේ ශ්‍රී ලංකාවට පැමිණි පිලිපීන ජාතිකයන්ගේ සංඛ්‍යාවේ වර්ධනයක් පෙන්නුම් කරන අතර එය 32.1% ක වර්ධනයකි. 2017 වසරේ අවසාන කාර්තුවේදී සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර තිබේ.

vi. දැනට පවත්නා ප්‍රතිමානයන්ට හා පරිචයන්ට අනුව හා නෛතික බැඳීම්වලට අනුව , 1980 දී අත්සන් තබන ලද පිලිපීන - ශ්‍රී ලංකා වෙළෙඳ ගිවිසුම හා ද්විත්ව බදුකරණය වැළැක්වීම හා ඇගයීම මත බදු මුදල් සම්බන්ධයෙන් පැහැර හැරීම පිළිබඳව දැනට පවත්නා ගිවිසුම ප්‍රාණවත් කිරීම සඳහා පිලිපීනයේ වෙළඳ කර්මාන්ත දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පවත්වන ලදී.

vii. පිලිපීනය හා දකුණු ආසියානු කළාපය අතර වෙළඳාම හා ආයෝජන කටයුතු පුළුල් කිරීමේ විධික්‍රම පිළිබඳව සාකච්ඡා පැවැත්වීම සඳහා 2017 නොවැම්බර් මස දී පිලිපීන දකුණු ආසියා ආර්ථික වටමේස සාකච්ඡාවට සහභාගි විය.

viii. ශ්‍රී ලංකාවෙන් නිෂ්පාදන ආනයනය කරනු ලබන පාර්ශව හඳුනාගැනීම සඳහා, 2017 ආසියාන් ව්‍යාපාරික හා ආයෝජන සමුළුවට හා 2017 කෘෂිසබඳතාව/ ආහාර සබඳතාව/ ජලජීවී සබඳතාවට සහභාගි විය.

ix. "George Steuarts Philippines and Basilur Tea"හි හවුල්කාරිත්වයෙන් 2017 නොවැම්බර් මස පැවති 51 වැනි ජාත්‍යන්තර බසාර් හිදී "ලංකා තේ" පිළිබඳ ප්‍රදර්ශනයක් පවත්වන ලදී.

x ආයෝජන මණ්ඩල ගුඉනොගුලාන් සම්මාන හා "ඉන්වෙස්ට් පිලිපීනය" සඳහා සහභාගි වූ අතර එහි අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ ආයෝජන සිදුකිරීමට කැමැත්තක් දක්වන ආයෝජකයන් හඳුනාගැනීමයි.

**(ඈ) විදේශීය ආයෝජන**

සෙන්ට් ඇන්තනී සමාගම සමඟ BPO සහෝදර කණ්ඩායමක් ස්ථාපනය කිරීම සඳහා ට්‍රාන්ස්කොම් වර්ල්ඩ් වයිඩ් හි කලාපීය ප්‍රධාන කළමනාකරු ගේ මූලික එකඟතාව ලබා ගන්නා ලදී.

**(ඉ) සංචාරක කර්මාන්තය**

i. සංචාරක හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය ගරු ජෝන් අමරතුංග මහතා 2017 ජූනි 20 දින පිලිපීනයේ සංචාරයක නිරත වෙමින්, පිලිපීනයේ සංචාරක දෙපාර්තමේන්තුවේ ලේකම් වැන්ඩා කොරේසන් මල්ෆෝ - ටෝ හමු වූ අතර එහිදී ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ පුහුණුවට අදාළ කාරණා පිළිබඳ සාකච්ඡා කරන ලදී.

ii. පිලිපීන බලධාරීන් සමඟ එක්ව තානාපති කාර්යාලය විසින් ප්‍රවාහන ගිවිසුම පිළිබඳ කටයුතු නිම කරන ලදී.

iii. ශ්‍රී ලංකාවේ වන ජීවීන් සහ ශ්‍රී ලංකා සංස්කෘතිය පිළිබඳව වාර්තා වැඩසටහන් දෙකක් නිෂ්පාදනය කිරීම සඳහා තානාපති කාර්යාලය හා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් පිලිපීන GMA ජාලයේ ජනමාධ්‍යවේදීන්ගෙන් සැදුම්ලත් කණ්ඩායම් දෙකක් ශ්‍රී ලංකාවට එවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

(ඊ) සංස්කෘතික සබඳතා

i. ගැටුමේ හා ප්‍රචණ්ඩත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් අතිවූ මානසික වද වේදනාවලින් මුදවා ජීවිත නැවත ගොඩනැගීම පිළිබඳව සුවිශාල මෙහෙයක් ඉටුකිරීම වෙනුවෙන් ගෙත්සේ ෂන්මුගම් මහත්මියට 2017 වසරේ කීර්තිමත් රාමන් මැග්සේසේ සම්මානය ප්‍රදානය කරන ලදී.

ii. ශ්‍රී ලංකාව හා පිලිපීනය අතර සංස්කෘතික සහයෝගිතාව පිළිබඳ විධායක වැඩසටහනේ පසු විපරම් කටයුත්තක් ලෙස 2016 නොවැම්බර් මස පැවති දේශපාලන උපදේශනවල පළමු වටයට සමගාමීව බෞද්ධ දර්ශනය ඇටිනියෝ ඩි මැනිලා විශ්ව විද්‍යාලයේදී පළමු වරට දියත් කරන ලදී.

iii. බුද්ධශාසන හා තිරසාර සංවර්ධන හා වනසත්ව අමාත්‍යවරු 2017 ඔක්තෝබර් මසදී මැනිලා හිදී "යුනිවර්සල් විස්ඩම්" පදනමට සමාධි බුද්ධ ප්‍රතිමාවක් පරිත්‍යාග කළහ.

iv. 2017 දෙසැම්බර් මස මැනිලාහිදී පිලිපීනයේ ඇඩම්සන් විශ්ව විද්‍යාලය විසින් සංවිධානය කරන ලද "Taste of the world at adamson" හිදී ශ්‍රී ලංකාවේ පෝෂණය වී ඇති ඉවුම් පිහුම් උරුමය විදහා දක්වන ලදී.

v. පිලිපීනයේ විදේශ කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2017 දෙසැම්බර් මස සංවිධානය කරන ලද "Colours of Asia Pacific" මෝස්තර සංදර්ශනයේදී ශ්‍රී ලංකාව විසින් පාරම්පරික අත් යන්ත්‍ර රෙදි ප්‍රදර්ශනය කරන ලදී.

(උ) කම්කරු සුභසාධනය

i. විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානායක මහතා පිලිපීනයේ කම්කරු හා රැකියා දෙපාර්තමේන්තු ලේකම් (අමාත්‍ය) ගරු සිල්වෙස්ටර් එච්. බෙලෝ III විදේශීය ශ්‍රමිකයින්ගේ සුභසාධන පරිපාලන (OWWA) ආයතනයේ නිලධාරීන්, පිලිපීනයේ විදේශීය රැකියා පරිපාලන ආයතනයේ (POEA) සහ කාර්මික අධ්‍යාපන සහ කුසලතා සංවර්ධන අධිකාරියේ (TESDA) නිලධාරීන් හා පැවැත්වූ සාකච්ඡා සඳහා තානාපති කාර්යාලය විසින් පහසුකම් සලසන ලදී.

ii. 2017 මැයි 23-24 දිනවල මැනිලා හි පැවති අර්බුද අවස්ථාවකදී විදේශීය රටවල සිටින ශ්‍රී ලාංකික ජාතිකයින් ආරක්ෂා කිරීම පිළිබඳ කොළඹ ක්‍රියාදාමයේ කාලාපීය වැඩමුළුවට ශ්‍රී ලංකා සහභාගීත්වය සඳහා පහසුකම් සළසන ලදී.

(ඌ) වෙනත්

රටේ වර්තමාන ප්‍රවනතා පිළිබඳ විශේෂ අවධානය යොමු කෙරෙන "ශ්‍රී ලංකාව: ඉන්දියන් සාගරයේ මුතු ඇටය" පිළිබඳ පිලිපීන ලයිසියම් විශ්ව විද්‍යාලයේ සහ පිලිපීනයේ මිරියම් විද්‍යාලයේ සිසුන් සඳහා සම්මන්ත්‍රණයක් සංවිධානය කෙරිණි.

**i. ආරක්ෂක සබඳතා**

මැනිලා නුවර පැවති 24 වැනි ආසියාන් කලාපීය සංසදයට (ARF) සමගාමීව විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානයක මහතා 2017 අගෝස්තු 3 වැනි දින පිලිපීනයේ නිරත රාජ්‍ය සංචාරය අතරතුරදී, පිලිපීන ජාතික ආරක්ෂාව පිළිබඳ උප ලේකම් ගරු කැඩෝසෝ එම් ලූනා මහතා හමු වූ අතර එම දෙපොළ අන්‍යොන්‍ය වශයෙන් වැදගත් ආරක්ෂක කාරණා පිළිබඳ සාකච්ඡා කළහ.

**ii. අධ්‍යාපන**

කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නියැලී සිටින ශ්‍රී ලාංකිකයන්ට පිලිපීන විශ්වවිද්‍යාලයේ විද්‍යාපති හෝ අචාර්ය උපාධිය හැදෑරීමට ශිෂ්‍යත්ව ලබා දීම සම්බන්ධයෙන් එම විශ්ව විද්‍යාලයේ උපකුලපතිතුමා සමඟත් හා නැවියන් පුහුණුකිරීම හා සුහසාධන පහසුකම් වැඩිදියුණු කිරීමෙහිලා පිලිපීනයෙන් ලබා ගත හැකි සහාය පිළිබඳව විදේශ කටයුතු දෙපාර්තමේන්තුව සමඟත් තානාපති කාර්යාලය විසින් සාකච්ඡා පවත්වන ලදී.

**08. කොරියානු ජනරජය**

**(අ) ද්විපාර්ශ්වික සබඳතා**

ශ්‍රී ලංකාවේ ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් කොරියානු ජනරජයේ නියැලුණු රාජ්‍ය සංචාරය

i. කොරියානු ජනරජයේ ජනාධිපති අතිගරු මුන් ජායි ඉන් මැතිතුමාගේ ආරාධනයෙන් ශ්‍රී ලංකාවේ ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා 2017 නොවැම්බර් 28-30 දිනවලදී කොරියානු ජනරජයේ සංචාරයක නියැලිණි.

ii. ජනාධිපති මූන් මැතිතුමා, 2017 මැයි මාසයේදී සිය ධූරයේ රාජකාරි භාර ගැනීමෙන් අනතුරුව, කොරියානු ජනරජයේ රාජ්‍ය සංචාරයක නිරත වූ තෙවැනි රාජ්‍ය නායකයා ජනාධිපති සිරිසේන මහතා වීම සුවිශේෂී වෙයි. රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීමේ 40 වැනි සංවත්සරය දෙරට විසින්ම සමරනු ලැබීමෙන්, මූන් පරිපාලනය විසින් දකුණු ආසියාවට හා ශ්‍රී ලංකාවට ලබා දී ඇති වැදගත්කම පිළිඹිබු වෙයි.

iii. රාජ්‍ය නායකයන් දෙපළ අතර සමුළු රැස්වීමක්, රාජ්‍ය රාත්‍රී භෝජන සංග්‍රහයක්, කොරියාවේ ප්‍රධාන ව්‍යාපාරික සංගම් හතරක (Kbiz , KCCI , FKI , KITA , හා AHPEK) සම සත්කාරකත්වයෙන් නිල ව්‍යාපාරික දිවා භෝජන සංග්‍රහයක්, ජොග්යේසා විහාරස්ථානය නැරඹීමට යාම හා කොරියා ජනරජයේ ජොග්යේ නිකායේ ප්‍රධාන භික්ෂූන් වහන්සේ වන අතිපූජ්‍ය සිඔල්ජිඔන්ග් ස්වාමීන් වහන්සේ සමඟ හමුවක් පැවැත්වීම ( මෙම විහාරස්ථානය නැරඹීමට යාම සඳහා ජනාධිපති මූන් මැතිතුමා ද එක්විය), කොරියානු ජනරජයේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව සමඟ රැස්වීමක්, සහ "සෝල් මෙට්‍රොපොලිටන්" කාර්යාලය නැරඹීමට යාම, සෝල් නගරයේදී ගරු කටයුතු පුරවැසි සම්මානය අතිගරු ජනාධිපති සිරිසේන මැතිතුමාට ප්‍රදානය කළ සෝල් හි නගරාධිපති ගරු පාර්ක් මැතිතුමා සමඟ හමුවක් පැවැත්වීම හා සෝල් නගරය විසින් පවත්වාගෙන යනු ලබන ආසියාවේ පළමු පරිගණක යෙදවුම් ආත ප්‍රවාහන පද්ධතිය පිළිබඳව කරුණු

පැහැදිලි කිරීමේ අවස්ථාවකට සහභාගිවීම මෙම රාජ්‍ය සංචාරයට අයත් වූ අංග අතර විය.

iv. කොරියානු - ශ්‍රී ලංකා මිත්‍රත්ව කණ්ඩායමේ සභාපති ගරු ජන්ග් සන්ග් - හෝ මැතිතුමා හා එහි සාමාජිකයින් හා ICAPP කොරියානු පාර්ලිමේන්තු සංගමයේ සභාපති ගරු පාර්ක් යන්ග් සන්ග් මැතිතුමා හා ජනාධිපතිතුමා අතර සුහද පිළිසඳරවල් පැවැත්වීමට අවශ්‍ය කටයුතු මෙම දූත මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී.

v. බූසාන්හි ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල්වරයා ලෙස වසර 11 ක් සේවය කළ එහෙත් එම තනතුරින් නික්ම යන පින් ජන්ග් ටෙයික් මැතිතුමාට එතුමා කළ සේවය ඇගයීමට ලක්කරමින් ජනාධිපතිතුමා විසින් සමරු ඵලක පිරිනමනු ලැබීමට හා බූසාන්හි නව නිර්වේතනික කොන්සල්, කොරියාවේ ධීවර සහයෝගිතා ජාතික බලමණ්ඩලයේ (NFFC) සභාපති වූ කිම් ඉම් ක්වොන් මැතිතුමාට ජනාධිපතිතුමා බැහැදැකීමේ අවස්ථාවට අවශ්‍ය කටයුතු සලසන ලදී.

vi. නොවැම්බර් 29 වන දින පැවති සමුළු රැස්වීමේදී හා රාජ්‍ය රාත්‍රී භෝජන සංග්‍රහයේදී, රාජ්‍ය නායක දෙපළ, එම දෙපළ අතර ඇති මිත්‍රත්වය වැඩිදියුණු කරගත් අතර ද්විපාර්ශ්වික සබඳතා වැඩි දියුණුකිරීමේ ක්‍රම පිළිබඳව සාකච්ඡා පැවැත්වූහ.

vii. දේශපාලන , ආර්ථික හා සංස්කෘතික ක්ෂේත්‍ර සමබන්ධයෙන් වූ වැදගත් සාකච්ඡා ක්ෂේත්‍ර සංචාරයට පසුව නිකුත් කරන ලද ඒකාබද්ධ ප්‍රවෘත්ති නිවේදනයක ඇතුළත් කරන ලදී. පහත සඳහන් කරුණු සඳහා අවධානය යොමු කළ හැකිය.

viii. දෙරටේ ඉහළ පෙළේ රාජ්‍ය නිලධාරීන් හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ හුවමාරු වැඩි කිරීම.

- කලාපීය සංවාද හුවමාරු කිරීම හා කළාපීය සංවාදවලදී සහයෝගිතාව ඇතුළුව ආරක්ෂක කටයුතු පිළිබඳව සහයෝගිතාව තවදුරටත් ශක්තිමත් කිරීම.
- ආර්ථික ක්ෂේත්‍රයේ සහයෝගිතාව ශක්තිමත් කිරීම ද්විපාර්ශ්වික ආයෝජන වෙළෙඳාම හා සංචාර කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා ඒකාබද්ධ කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම සඳහා විධිවිධාන සලසන ආර්ථික සහයෝගිතාව පිළිබඳව ගිවිසුමට හා ආයෝජන තවදුරටත් පුළුල් කිරීම සඳහා BOI හා KOTRA අතර අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම.
- බස්නාහිර කලාපීය මහනගර ව්‍යාපෘතිය යටතේ සහයෝගිතාව සහ ශ්‍රී ලංකාවේ ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘතිවල කොරියානු වෙළෙඳ සමාගම්වලට ආයෝජන ඉඩ ප්‍රස්ථා.
- EDCF සමඟ හා KOICA සමඟ වැදියුණු කළ කටයුතු යටතේ සංවර්ධන සහයෝගිතාව පුළුල් කිරීම.
- රැකියා බලපත් ක්‍රමය (EPS) යටතේ සහයෝගිතාව

- ICT හා වෛද්‍ය විද්‍යා, විද්‍යා, තාක්ෂණ, නවෝත්පාදන හා ICT, කෘෂිකර්මය හා ධීවර ක්ෂේත්‍ර පිළිබඳ සහයෝගිතාව.
- සංචාරක කටයුතු යටතේ සහයෝගිතාව හා සම්බන්ධතාව වර්ධනය කිරීම.
- අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහයෝගිතාව.
- එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාවලිවලට අනුකූලව උතුරු කොරියා ගැටලුවේ සාමකාමී විසඳුම.
- කොරියානු ජනරජය විසින් සත්කාරකත්වය ලබා දුන් "Pyeonychang Winter" ඔලිම්පික් ක්‍රීඩා.
- සමෘද්ධිය ඇතිකළ හැකි ප්‍රධාන සාධක පිළිබඳ ජනාධිපති මූන්ගේ නව දක්ෂිණ ප්‍රතිපත්තිය පිළිබඳව හා දකුණු ආසියාව හා ආසියාන් රටවල් සමඟ "ජනතාව කේන්ද්‍ර කොටගත්" සබඳතා පිළිබඳව සාකච්ඡා කිරීම ඇතුළු කළාපීය කටයුතු.
- බහුපාර්ශවීය සහයෝගීතාව.
- ශ්‍රී ලංකාවේ සංහිඳියා ක්‍රියාවලියට සහාය ලබාදීම.
- ප්‍රතිපත්තිමය උපදේශන.
- අන්‍යෝන්‍ය වශයෙන් පහසු දිනයකදී ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලෙන ලෙස ජනාධිපති මූන් මැතිතුමාට ආරාධනා කිරීම.

ix. විදේශ කටයුතු අමාත්‍ය ගරු තිලක් මාරපන, විශේෂ කාර්යය පිළිබඳ අමාත්‍ය ගරු ආචාර්ය සරත් අමුණුගම, සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍ය ගරු මලික් සමරවික්‍රම, අධිකරණ හා විදේශ රැකියා අමාත්‍ය ගරු තලතා අතුකෝරල, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය ගරු දයා ගමගේ යන අමාත්‍යවරුන්ගෙන් හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් ජනාධිපතිතුමාගේ නියෝජිත කණ්ඩායම සමන්විත විය.

x. විවිධ වූ ක්ෂේත්‍ර රැසක් සම්බන්ධයෙන් වූ සංවර්ධන සහයෝගිතාව පිළිබඳව කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (KOICA) හා කොරියානු එක්සිම් බැංකුව - ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල (EDCF) සමඟ තානාපති කාර්යාලය විසින් කටයුතුවල නියැලෙන ලදී. දූත මණ්ඩලය විසින් ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල සමඟ නව රාමුගත ගිවිසුමකට අත්සන් තැබීම අනුව කටයුතු රැසක් පිළිබඳව අඛණ්ඩව කටයුතු කරන ලදී.

xi. කොරියානු පාර්ලිමේන්තුවේ නව කොරියා ශ්‍රී ලංකා මිත්‍ර කණ්ඩායමක් 2017 මාර්තු මසදී ස්ථාපනය කරන ලදී.

xii. තානාපති කාර්යාලය විසින් දෙරට අතර ඇතිවෙමින් පවතින සහයෝගිතාවය යටතේ ඉහළ පෙළේ සංචාර, පුහුණු/ නුවමාරු වැඩසටහන් සඳහා ශ්‍රී ලංකාවේ හා කොරියානු ජනරජයේ අදාළ ආරක්ෂක ආයතන සමඟ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.

xiii. විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන (STI) සහයෝගිතාව (STI) සම්බන්ධයෙන් විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පිළිබඳ ආයතනය (STEPI) සමග කටයුතු දූත මණ්ඩලය විසින් සම්බන්ධීකරණය කරන ලදී.

xiv. අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහයෝගිතාව යටතේ 2017 අගෝස්තු මස පැවති කොරියාවේ අධ්‍යාපන අමාත්‍යාංශය, වාර්ෂික විද්‍යුත් අධ්‍යයන ගෝලීයකරණ වැඩසටහනට සහභාගී විය. මෙම වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ ගුරුවරුන් 25ක් පුහුණු කරන ලදී.

xv. කොරියාවේ පිහිටි අදාල විශ්ව විද්‍යාල හා කොරියානු ආයතන සමග තානාපති කාර්යාලය කටයුතු සම්බන්ධීකරණය කරමින් ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීය. 2017 සැප්තැම්බර් 09 වැනි දින තානාපති කාර්යාලයේ පැවති දකුණු කොරියාවේ සිටින ශ්‍රී ලාංකික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමට සමගාමීව කොරියානු පාර්ශවයේදී ශ්‍රී ලාංකික වෘත්තිකයන්ගේ රැස්වීමක් තානාපති කාර්යාලය විසින් සංවිධානය කරන ලදී.

xvi. තානාපති කාර්යාලය කොරියානු ජනරජයේ පාර්ලිමේන්තු මන්ත්‍රීන් ඇතුළුව අදාළ කොරියානු අමාත්‍යාංශ හා ඒවායේ අනුබද්ධිත ආයතන, කොරියානු ආයතන, ව්‍යාපාරික ආයතන, මෙන්ම දේශපාලන නායකත්වය සමග මනා සබඳතා පවත්වාගෙන යයි.

xvii. කොරියානු ජනරජයේ දේශපාලන වෙනස්කම් හා ආර්ථික ප්‍රවණතා පිළිබඳව තානාපති කාර්යාලය මනා ලෙස අධීක්ෂණය කර ඒවායේ වත්මන් තත්ත්වය පිළිබඳව ක්‍රමවත් පරිදි කොළඹ විදේශ කටයුතු අමාත්‍යාංශය හා අදාළ වෙනත් බලධාරීන් දැනුවත් කරන ලදී.

xviii. කොරියාවේ ජාතික දේශපාලනික තත්ත්වය පිළිබඳව පවත්නා ප්‍රවණතා, නව රජයේ විදේශීය ප්‍රතිපත්තිය හා උතුරු කොරියා මිසයිල හා න්‍යෂ්ටික අත්හදා බැලීම් නිසා වැඩිවෙමින් පවත්නා ආතතිය පිළිබඳව මෙම දූත මණ්ඩලය විසින් විදේශ කටයුතු අමාත්‍යාංශය ක්‍රමවත් ලෙස දිගින් දිගටම දැනුම්වත් කරන ලදී.

xix. ආසියාන් හා ඉන්දියාව මෙන්ම ශ්‍රී ලංකාව ඇතුළුව දකුණු ආසියාව කෙරෙහි අවධානය යොමුකළ ජනාධිපති මූන්ගේ නව දක්ෂිණ ප්‍රතිපත්තිය පිළිබඳව මෙම දූත මණ්ඩලය අවධියෙන් පසුවෙයි.

xx. 2017 නොවැම්බර් 14 වැනි දිනට යෙදී තිබූ රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීමේ 40 වැනි සංවත්සරය සැමරුම සම්බන්ධයෙන් වූ ප්‍රවර්ධන කටයුතු ද මෙම දූත මණ්ඩලය විසින් දිගින් දිගටම සිදු කරන ලදී.

**ද්විපාර්ශ්වික සහයෝගිතාවේ වෙනත් පැතිකඩවල් :**

- යටිතල පහසුකම්, පාලනය, අධ්‍යාපනය, කර්මාන්ත, ධීවර, බලශක්ති, කෘෂිකර්මය, මානව සම්පත් සංවර්ධනය හා රාජ්‍ය පරිපාලනය ඇතුළුව ක්ෂේත්‍ර රැසක් සම්බන්ධයෙන් සංවර්ධන සහයෝගිතාවට අදාළව තානාපති කාර්යාලය, කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (KOICA) සහ කොරියානු එක්සිම් බැංකුව - ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල (EDCF) සමග සමීපව කටයුතුවල නියැළිණි.

- මීළඟ වසර 3 සඳහා ඇ.ඩො. මිලියන 500 ක් සඳහා වූ නව මූලික ගිවිසුමට අත්සන් තැබීම ඇතුළුව EDCF සමඟ මෙම දූත මණ්ඩලය විසින් දිගින් දිගටම කටයුතු කරන ලදී. (දැනට පවත්නා වටිනාකම ඇ.ඩො. මිලියන 300 ක් වන අතර එය ඇ.ඩො. මිලියන 200 කින් වැඩි වී තිබේ)

- දැනට ඇති කරගෙන යනු ලබන සහයෝගිතාව යටතේ ඉහළ මට්ටමේ සංචාර, පුහුණු / වැඩසටහන් හුවමාරුව සඳහා ශ්‍රී ලංකාවේ සහ කොරියානු ජනරජයේ රාජ්‍ය ආරක්ෂාව හා සම්බන්ධ ආයතන සමඟ තානාපති කාර්යාලය විසින් කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.

- විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන (STI) සහයෝගිතාව සම්බන්ධයෙන්, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය, විද්‍යාව, තාක්ෂණය හා නවෝත්පාදනය පිළිබඳ සම්බන්ධීකාරක ලේකම් කාර්යාලය (COSTI) හා විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතනය (STEPI) සමඟ මෙම දූතමණ්ඩලය දිගින් දිගටම සහයෝගිතාවයෙන් යුතුව කටයුතු කළේය.

- අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහයෝගිතාව යටතේ, මෙම දූතමණ්ඩලය, 2017 ඔක්තෝබර් 27 වැනි දින කොරියාවේ ජාත්‍යන්තර අධ්‍යාපන ජාතික ආයතනයේ සභාපති, සෝන්ග් කි ඩොන්ග් මහතා හමුවී "ග්ලෝබල් කොරියා" ශිෂ්‍යත්ව වැඩසටහන (KGSP) යටතේ වූ සහයෝගිතාව පිළිබඳව සාකච්ඡා කරන ලදී. මීට උපාධිධාරී වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවට ලබාදෙන ශිෂ්‍යත්ව ඉඩ ප්‍රස්ථා ප්‍රමාණය වැඩිකිරීම හා පසුගිය වසර දෙක තුළ දී KGSP මගින් ශ්‍රී ලංකාවේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ප්‍රදානය කරන ලද ශිෂ්‍යත්ව ප්‍රමාණය අඩුවීම පිළිබඳ සාකච්ඡා මීට ඇතුලත් විය.

- මෙම තානාපති කාර්යාලය විසින් කොරියාවේ පවතින ශිෂ්‍යත්ව වැඩසටහන් හා පුහුණු ඉඩප්‍රස්ථා 4 ක් සාමාජික ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා අනෙකුත් ශ්‍රී ලාංකික ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා අදාළ විශ්ව විද්‍යාල ඇතුළු ශ්‍රී ලංකා රජයේ ආයතන වෙතත් කොරියාවේ ශ්‍රී ලංකා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සංගමය වෙතත් ඉදිරිපත් කර තිබේ.

- මෙම තානාපති කාර්යාලය, කොරියාවේ ශ්‍රී ලංකා ශිෂ්‍ය සංගමය සමඟ සාකච්ඡා කිරීමෙන් හා තානාපති කාර්යාලය සෘජුව ලද අයදුම්පත් සමාලෝචනය කිරීමෙන් අනතුරුව, වුහුන්ගේ ශිෂ්‍යත්ව සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් නම් කරන ලදී.

- 2017 සැප්තැම්බර් 9 වැනි දින තානාපති කාර්යාලයේ දී කොරියාවේ ශ්‍රී ලංකා ශිෂ්‍ය සංගමයේ 7 වැනි වාර්ෂික මහා සභා රැස්වීමෙන් අනතුරුව, එහිදී සාකච්ඡාවට බඳුන්කළ ශිෂ්‍ය සංගමයට උපදෙස් ලබාදීමට හා අවශ්‍ය අවස්ථාවලදී සහාය ලබාදීමට වෘත්තීය ශ්‍රී ලාංකිකයන්ගෙන් සමන්විතවන උපදේශන සභාවක් පිහිටුවීමේ යෝජනාවේ පසු විපරම් කටයුතු සම්බන්ධයෙන්

මෙම තානාපති කාර්යාලය, ශ්‍රී ලංකාවේ ශිෂ්‍ය සංගමය සමඟ කටයුතු කරන ලදී.

- පර්යේෂණ සහයෝගිතාව යටතේ කොරියානු ජනරජයේ KNDA හා ශ්‍රී ලංකාවේ BIDTI අතර 2017 මාර්තු මාසයේදී අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීමෙන් අනතුරුව, තානාපති කාර්යාලය විසින් දිගින් දිගටම එම ආයතන දෙක අතර සහයෝගිතා කටයුතු සිදුකරන ලදී.
- කොරියානු ජනරජයේ විදේශ කටයුතු හා ජාතික ආරක්ෂක ආයතනය (IFANS) හා ශ්‍රී ලංකාවේ BIDTI හා LKI අතර සහයෝගිතා කටයුතු ද දූතමණ්ඩලය විසින් සිදු කරන ලදී.
- ශ්‍රී ලංකාවේ නාරා ආයතනය හා වෙනත් ආයතන හා සාගර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ කොරියානු ආයතනය ( KIOST) සමඟ එක්ව , සමුද්‍රිය විද්‍යාව හා තාක්ෂණික ධාරිතාව සංවර්ධනය කිරීම හා පර්යේෂණ සහයෝගිතාව ශක්තිමත් කිරීම සඳහා තානාපති කාර්යාලය කටයුතු කළේය.
- ශ්‍රී ලංකාවේ නිර්වේතනික කොන්සල්වරුන් හා ඔවුන්ගේ කාර්යාල සමඟ මෙම තානාපති කාර්යාලය අඛණ්ඩ කටයුතු කරමින් සිටියි. Hueseung Fisheries සමාගමේ හා කොරියාවේ ධීවර සමුපකාර ජාතික බලමණ්ඩලයේ (NFFC) සභාපතිවරයා වන බුසාන් හි නව ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල්වරයා වන කිම් ඉක් ක්වොන් මැතිතුමා 2017 ඔක්තෝබර් මස පත් කරන ලදී. ගයිඔන්ග්සාන්නාම් ප්‍රාන්තය සඳහා වන නිර්වේතනික කොන්සල්වරයකු එනම් Hwasin Shipping and Aircargo පුද්ගලික සමාගමේ තානාපතිවරයා වන සි ඔමින්ජා මහතා නම් කිරීම හා සම්බන්ධ කටයුතු තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලංකාවේ හා කොරියානු ජනරජයේ විදේශ අමාත්‍යාංශ සමඟ සිදු කරනු ලබයි.
- දූතමණ්ඩලයේ වාර්ෂික විගණන කටයුතු 2017 නොවැම්බර් 13-22 දිනවලදී සිදුකරන ලද අතර මේ සඳහා අවශ්‍ය පහසුකම් සලසන ලදී.
- 2017 නොවැම්බර් 13-22 දිනවලදී විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද දූතමණ්ඩලයේ විගණන කටයුතුවලට අවශ්‍ය සහාය දූත මණ්ඩලය විසින් ලබා දෙන ලදී.

xxi. කොරියානු ජනරජයේ නියැලුන ඉහළ මට්ටමේ සංචාරඃ

- විදේශ රැකියා ඇමතිනි ගරු තලතා අතුකෝරළ මැතිණිය 2017 ජූනි 17-20 දිනවලදී කොරියානු ජනරජයේ සංචාරයක නියැලුණු අතර එහිදී කොරියානු බලධාරීන් සමඟ රැස්වීම් කිහිපයක් පැවැත්වීය.
- මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමා, 2017 ජූනි 15-17 දිනවලදී පැවති ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ (AIIB) ආණ්ඩුකාරවරුන්ගේ 2වැනි වාර්ෂික රැස්වීමට සහභාගී වීම සඳහා සංචාරයක නිරත විය.

- කොරියානු ජනරජයේ ජාතික ආරක්ෂක අමාත්‍ය ගරු සොන්ග් යොන්ග් මූ මැතිතුමාගේ ආරාධනයෙන්, ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ගරු රුවන් විජේවර්ධන මැතිතුමා ගුවන් ගමන් අවකාශ හා ආරක්ෂක ප්‍රදර්ශනය (ADEX 2017) ට සහභාගිවීම සඳහා ඔක්තෝබර් 16-18 දිනවලදී කොරියානු ජනරජයේ සංචාරයක නියැලිනි. මෙම සංචාරය අතරතුර දී විජේවර්ධන මැතිතුමා ඔක්තෝබර් 17 වැනි දින කොරියානු ජනරජයේ ආරක්ෂක අමාත්‍යවරයා සමග ද්විපාර්ශ්වික හමුවක් පැවැත්විය. හුවමාරුකිරීම හා පුහුණු ඉඩ ප්‍රස්ථා මෙන්ම ශ්‍රී ලංකා ක්ෂේත්‍රයේ සහයෝගිතාව තවදුරටත් ශක්තිමත් කිරීමට දෙපාර්ශවයම මෙහිදී  එකග වූහ.

- 2017 නොවැම්බර් 15-17 දිනවලදී සෝල් නුවරදී පැවති ආසියානු හා ශාන්තිකර රටවල් සඳහා ADB/OECD දූෂණ විරෝධී වැඩසටහනේ කළාපීය දූෂණ විරෝධී සමුළුවට සහභාගිවීම සඳහා රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍ය ගරු රංජිත් මද්දුමබණ්ඩාර මැතිතුමා කොරියානු ජනරජයේ සංචාරයක නියැලිනි. ශ්‍රී ලංකාවේ අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ නියෝජිත පිරිසක් ද මෙම සමුළුවට සහභාගි විය.

xxii. ශ්‍රී ලංකාවේ නිරත වූ ඉහළ මට්ටමේ සංචාර:

- කොරියානු ජනරජයේ විදේශ කටයුතු අමාත්‍ය ගරු යුන් බයියුන්ග්-සේ මැතිතුමා 2017 මාර්තු 15-16 දිනවලදී ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නියලිනි. කොරියා ජනරජයේ විදේශ අමාත්‍යවරයෙකු, වසර 31කින් පසුව ශ්‍රී ලංකාවේ නියැලුණු පළමු ද්විපාර්ශ්වික සංචාරය මෙය විය.

- කොරියාවේ මානව සම්පත් සංවර්ධන සේවාවේ සභාපති මහාචාර්ය පාර්ක් යුන්ග්-බම් මහතා, 2017 ජූනි 28-29 දින වලදී ශ්‍රී ලංකාවට පැමිණියේය.

- කොරියානු ජාතික රාජතාන්ත්‍රික ඇකඩමියේ (KNDA) කුලපති හා විදේශ කටයුතු පිළිබඳ උප අමාත්‍ය ගරු චො බයියුන්ග්-ජේ මැතිතුමා, 2017 අගෝස්තු 31-සැප්තැම්බර් 02 දිනවලදී කොළඹ පැවති ඉන්දියා සාගර සමුළුවට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණියේය.

xxiii. ශ්‍රී ලංකාව හා කොරියානු ජනරජය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීමේ 40 වන සංවත්සරය:

දූත මණ්ඩලය රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීමේ 40වැනි සංවත්සරය සැමරීම සඳහා පහත සඳහන් ප්‍රවර්ධන අංග සංවිධානය කරන ලදී.

- "Sri Lanka: The Treasure Island" මැයෙන් ශ්‍රී ලංකා ඡායාරූප ප්‍රදර්ශනයක් පවත්වන ලදී - 2017 මැයි 11-30

- රවිබන්දු විද්‍යාපති ගේ සහ ඔහුගේ නැටුම් කණ්ඩායමේ රංගනයන් දෙකක් සෝල් නුවර පිහිටි ජාතික රංග ශාලාවේදී හා ගුවැන්ග්ෂු හි ආසියා සංස්කෘතික මධ්‍යස්ථානයේදී පිළිවෙලින් මැයි 19 හා 21 යන දෙදින රඟ දක්වන ලදී.

- ආසියානු සංස්කෘතික මධ්‍යස්ථානය (ACC) සත්කාරකත්වය ලබා දුන් ආසියානු සංස්කෘතික ආයතනය (ACI) විසින් නිෂ්පාදනය කරන ලද 2017 අගෝස්තු 31- ඔක්තෝබර් 29 දක්වා දිනවලදී ග්වැන්ග්ෂුහිදී පැවති "ශ්‍රී ලංකාවේ ගෘහනිර්මාණ ශිල්පයේ නව ක්‍රම: පියෝරේ බාවා - වැලන්ටයින් ගුණසේකර" සඳහා සහාය ලබා දෙන ලදී.
- ශ්‍රී ලංකා හා කොරියා ජනරජය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීමේ 40 වැනි සංවත්සරය සමරනු වස් 2017 නොවැම්බර් 14 වැනි දින කොරියානු තැපෑල හා ශ්‍රී ලංකා තැපෑල විසින් සමගාමීව සැමරුම් මුද්දර නිකුත් කරන ලදී. (මෙම කර්තව්‍යය සඳහා මුලපුරන ලද්දේ කොළඹ පිහිටි කොරියානු තානාපති කාර්යාලය විසිනි)

xxiv. පහත සඳහන් ද්විපාර්ශ්වික ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම්වලට අත්සන් තැබීම සඳහා තානාපති කාර්යාල විසින් අවශ්‍ය පහසුකම් සලසන ලදි.

- කොරියානු ජාතික රාජ්‍යතාන්ත්‍රික ඇකඩමිය හා බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජතාන්ත්‍රික පුහුණු ආයතනය අතර සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම - 2017 මාර්තු 15
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය හා කොරියාවේ රාජ්‍ය ප්‍රතිපත්ති හා කළමනාකරණය පිළිබඳ KDI පාසැල අතර සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම - 2017 සැප්තැම්බර් 21 යන අවබෝධතා ගිවිසුම් වලට අත්සන් තැබීම සඳහා අවශ්‍ය පහසුකම් තානාපති කාර්යාලය විසින් සලසන ලදී.
- ශ්‍රී ලංකාව හා කොරියානු ජනරජය අතර ආර්ථික සහයෝගිතාව පිළිබඳ ගිවිසුම.
- ඇ.ඩො. මිලියන 500 සඳහා මූලික ගිවිසුම. (EDCF සහයෝගිතාව කොරියානු එක්සිම් බැංකුව)
- සංස්කෘතික, කලා, අධ්‍යාපන, තරුණ කටයුතු හා ක්‍රීඩා යන ක්ෂේත්‍රවල සහයෝගිතාව පිළිබඳ ගිවිසුම.
- කොරියා ජනරජයේ විදේශ රැකියා හා කම්කරු අමාත්‍යාංශය හා ශ්‍රී ලංකාවේ විදේශ රැකියා අමාත්‍යාංශය අතර රැකියා බලපත් ක්‍රමය (EPS) යටතේ කොරියානු ජනරජයට සේවකයන් යැවීම හා ලබාගැනීම පිළිබඳ අවබෝධතා ගිවිසුම.
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) සහ කොරියානු වෙළෙඳ ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතනය (KOTRA) අතර අවබෝධතා ගිවිසුම.
- කොළඹ කොටස් හුවමාරුව (CSE) හා කොරියානු කොටස් හුවමාරුව (KRX) අතර අවබෝධතා ගිවිසුම.

(ආ). **බහු පාර්ශ්වික සබඳතා:**

i. තානාපති කාර්යාලය විසින්, බහුපාර්ශ්විය ගැටලු පිළිබඳ සහයෝගිතාවට අදාළ කටයුතු, කොරියානු ජනරජයේ විදේශ කටයුතු අමාත්‍යාංශය මෙන්ම වෙනත් කොරියානු රජයේ ආයතන හා බහුපාර්ශ්වීය ආයතන සමග එනම්, UNESCAP, Green Climate Fund (GCF), Global Green Growth institute (GGGI), අදාළ තානාපති කාර්යාල, සමග සම්බන්ධීකරණය කරන ලදී.

ii. කොළඹ මහනගර සභාව 2017 නොවැම්බර් 05-08 දිනවලදී කොළඹදී 2017 සිටිනෙට් කොන්ග්‍රසය සබඳතා සත්කාරකත්වය ලබාදීම සම්බන්ධයෙන් "Seoul MetroPolitan Government" හි මූලස්ථානය පිහිටි "සිටිනෙට් ලේකම් කාර්යාලය සමග කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.

iii. තානාපති කාර්යාලය, GGGI හි අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ෆ්රැන්ක් රිජ්ස්බර්මෑන් සමග සමීප සබඳතා පවත්වා ගනිමින් එතුමා 2017 නොවැම්බර් මස නියැලුණු ශ්‍රී ලංකා සංචාරයේදී අදාල ශ්‍රී ලංකා විද්වතුන් සමග රැස්වීම පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සලසන ලදී. දැනට සිදු කෙරෙමින් පවතින ශ්‍රී ලංකාවට GGGI හි සාමාජිකත්වය ලබාගැනීම පිළිබඳ සාකච්ඡා ද මීට ඇතුලත් විය.

iv. GCF සඳහා DFCC අක්ත ගැන්වීමේ ක්‍රියාවලියේ පසු විපරම් කටයුතු මෙම දූත මණ්ඩලය සිදු කරන අතර මේ සඳහා අයදුම්පත ඉදිරිපත් කර තිබේ.

v. උතුරු කොරියානු න්‍යෂ්ටික ගැටලුව පිළිබඳව හා ඉන් ඇතිවන බලපෑම හා කොරියානු අර්ධද්වීපයේ ආතතිය වර්ධනය වීම පිළිබඳව අවධානයෙන් පසුවෙමින් කොළඹ විදේශ කටයුතු අමාත්‍යාංශය ඒ පිළිබඳව දැනුවත් කිරීම.

vi මෙම දූත මණ්ඩලය විසින් 2017 නොවැම්බර් 05-08 දිනවලදී කොළඹ මහ නගර සභාව විසින් කොළඹදී පවත්වන ලද "සිටි නෙට්"කොන්ග්‍රසය-2017 සම්බන්ධයෙන් සෝල් අගනගර පාලන ආයතනයේ "සිටි නෙට්" මූලස්ථාන ලේකම් කාර්යාලය සමග අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කරන ලදී. මෙම කොන්ග්‍රසය සඳහා රටවල් 16 කින් 350 දෙනෙකු සහභාගී වූ අතර ඊට UNESCAP, UNHABITAT, ADB, AIIB හා GGGI වැනි ජාත්‍යන්තර සංවිධාන 85 ක් ද ඇතුළත් විය. මේ සඳහා සහභාගී වූවන්ට වීසාබලපත් නිකුත් කිරීම ඇතුළුව කොන්ග්‍රසයේ කටයුතු සම්බන්ධීකරණය කරමින් තානාපති කාර්යාලය "සිටි නෙට්" ලේකම් කාර්යාලයට සහාය දැක්වීය. සෝල් නුවර නගරාධිපති, "සිටි නෙට්" ලේකම් කාර්යාලයේ සභාපති ගරු පාර්ක් වොන් සූන් මැතිතුමා මේ සඳහා සහභාගී වීමට ශ්‍රී ලංකාවට පැමිණියේය. මෙහිදී එතුමා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව බැහැ දුටු අතර අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ද හමුවිය.

vii තානාපති කාර්යාලය විසින් හරිත දේශගුණික අරමුදල (GCF) හා ශ්‍රී ලංකා රජය අතර වරප්‍රසාද පිළිබඳ කෙටුම්පත් ගිවිසුමේ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී. සංශෝධන ද ඇතුළත්ව මෙම යෝජිත ගිවිසුමේ කටයුතු ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සිදු කරමින් පවතියි.

**(ඇ) ද්විපාර්ශ්වික ආර්ථික සබඳතා හා විදේශ ආයෝජන**

ද්විපාර්ශ්වික ආර්ථික සහයෝගිතාවයේ නව මාර්ග පිළිබඳව සොයා බැලීම සඳහා ශ්‍රී ලංකාව හා කොරියා ජනරජය අතර ආර්ථික සහයෝගිතාව පිළිබඳ ඒකාබද්ධ කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීමට අදාළව 2017 වසරේදී දිගින් දිගටම සාකච්ඡා පවත්වන ලදී.

i. කොරියානු ආනයනකරුවන්ගේ සංගමය (KOIMA), තානාපති කාර්යාලයේ සහාය ඇතිව 2017 අප්‍රේල් 18 වැනි දින ශ්‍රී ලංකා වෙළඳ ප්‍රවර්ධන පාර්ශවකාර කමිටුවක් (TPPC) ස්ථාපනය කරන ලදී.

ii. කොරියානු ආනයනකරුවන්ගේ සංගමයේ සාමාජිකයින් 16 දෙනෙකුගෙන් යුතු නියෝජිත කණ්ඩායමක් එහි සභාපති මයොයුන්ග් ජින් ෂින් මහතාගේ නායකත්වය යටතේ 2017 සැප්තැම්බර් 5-7 දින වලදී ශ්‍රී ලංකාවට පැමිණියේය.

ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය ගරු දයා ගමගේ මැතිතුමාට 2017 ජුලි 06-09 දිනවලදීත් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු නිරෝෂන් පෙරේරා මැතිතුමාට 2017 සැප්තැම්බර් 04-07 දිනවලදිත් ලොට් ඉංජිනේරු හා ඉදිකිරීම් ව්‍යාපාරික සමාගම සහ "SK එනර්ජි" ව්‍යාපාරික සමාගම ජ්‍යේෂ්ඨ උප සභාපති/ උප සභාපති මට්ටමින් හමුවීමට අවශ්‍ය පහසුකම් දූත මණ්ඩලය විසින් සලසන ලදී. මෙම හමුවීම්වල අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ ව්‍යාපෘතිවල නියැලීම සහ ආයෝජන සිදු කිරීමයි.

iii. දූත මණ්ඩලය, සූර්ය කෝෂ නිෂ්පාදන අංශයේ අයෝජන ශ්‍රී ලංකාවේ සිදු කිරීම සම්බන්ධයෙන් "ෆොටෝවෝල්මැයික්" කර්මාන්ත සංගමයේ සභාපති සහ OCI හි සභාපති හා ප්‍රධාන විධායක නිලධාරියා හමු විය.

iv. තේ, කුරුඳු හා ඖෂධ පැළෑටි ක්ෂේත්‍රයේ සහයෝගිතාව සඳහා කොරියාවේ පෞද්ගලික වෙළඳ සමාගම් හා රාජ්‍ය සංවිධාන සමග ජාලකරණ සැසිවාරයක්, 2017 අගෝස්තු 07 වැනි දින සංවිධානය කරන ලදී.

v. 2017 ජනවාරි මස සිට කොරියා ජනරජයට ධීවර නිෂ්පාදන අපනයනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කොරියාවේ ආහාර හා ඖෂධ ආරක්ෂාව පිළිබඳ අමාත්‍යාංශය සමග එක්ව අවශ්‍ය පහසුකම් සලසන ලදී.

vi. 2017 ජූනි මාසයේදී සෝල් නුවර පිහිටි ජාත්‍යන්තර ආසියානු හා බටහිර ශාන්තිකර කොන්ත්‍රාත්කරුවන්ගේ සංගම් ජාත්‍යන්තර බල මණ්ඩල සම්මුතියේ සංවිධායකයන්ට, මෙම සම්මුතිය සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සම්බන්ධයෙන් දූත මණ්ඩලය සහාය ලබා දී තිබේ. ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්තයේ නියෝජිතයන් 150 දෙනෙකුට අධික සංඛ්‍යාවක් මෙම අවස්ථාවට සහභාගී විය.

vii. කොළඹ දී ඉදිකිරීමට යෝජිත විද්‍යා හා තාක්ෂණ නගරය පූර්ණවශයෙන් සැලසුම් කිරීම සඳහා වූ සහයෝගිතාව පිළිබඳව සාකච්ඡා කිරීමට 2017 මැයි 19 සිට සති දෙකක කාලසීමාවකදී කොරියානු විශේෂඥ කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ නියැලෙන සංචාරයට අවශ්‍ය පහසුකම් ද දූත මණ්ඩලය විසින් සලසන ලදී. ශ්‍රී ලාංකිකයින් 10 දෙනෙකුගේ කණ්ඩායමක්, මේ පිළිබඳව පසු විපරම් කටයුතු සිදු කිරීම සඳහා 2017 ජූලි මාසයේදී කොරියාවට පැමිණියේය.

viii. ශ්‍රී ලංකාවේ "මයික්‍රො" කාර් හෝල්ඩින් සමාගම ශ්‍රී ලංකාවේ දී පළමු කාර්මික මෝටර් රථය සෑදීම සඳහා කොරියාවේ ඉහළ ව්‍යාපාරික සමාගමක් වන SK සමූහ ව්‍යාපාරය සමඟ හවුල්කාරිත්වයක් ඇතිකරගෙන තිබේ. මෙම වසරේදී ඇ.ඩො. මිලියන 30 ක් ද ඉන් අනතුරුව ඉදිරි වර්ෂ දෙක තුළදී ඇ.ඩො. මිලියන 20 ක් ද ශ්‍රී ලංකාවේ "මයික්‍රො" හි ආයෝජනය කිරීම සැළසුම් කර තිබේ.

ix. 2017 ජූනි 27 වන දින කොරියානු වෙළඳ හා ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතනයේදී ආයෝජකයින්ගේ සංසදයඃ ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ඉඩ ප්‍රස්ථා සංවිධානය කිරීමෙහි ලා කොරියානු වෙළඳ හා ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතනයට (KOTRA) මෙන්ම 2017 ජූලි 21 වැනි දින සෝල් නුවර ව්‍යාපාරික සංසදයක් සංවිධානය කිරීමට කොරියානු ඉඩම් හා නිවාස සහයෝගිතා සංවිධානයට ද දූත මණ්ඩලය සහාය ලබා දුන්නේය.

x. සංචාරක කටයුතු සම්බන්ධයෙන් තානාපති කාර්යාලය ලබා දෙන ලද සහාය පිළිබඳ සලකා බැලීමේදී, 2017 ජූනි මාසයේදී "Nexus" මගින් පළකරන ලද ජනප්‍රිය "Enjoy" නම් කොරියාවේ සංචාර මාලාව යටතේ ශ්‍රී ලංකාව පිළිබඳව කොරියානු භාෂා "Enjoy Sri Lanka" සංචාර මාර්ගෝපදේශය පළ කිරීම සඳහා අවශ්‍ය සහාය තානාපති කාර්යාලය විසින් ලබා දෙන ලදී.

xi. කොරියාවේ පැවති ජාත්‍යන්තර රෙදිපිළි වෙළඳපළ, ගොයදාන්ග් හි පැවති ජාත්‍යන්තර උද්‍යාන විද්‍යා ප්‍රදර්ශනය, කොරියානු ජාත්‍යන්තර සංචාරක දැක්ම, සෝල් ආහාර ප්‍රදර්ශනය, කොරියා ආනයන භාණ්ඩ වෙළඳපළ, සෝල් මිත්‍රත්ව වෙළඳපළ, කොරියා ලෝක සංචාර වෙළඳපළ (KOTFA), G උළෙල, සෝල් ජාත්‍යන්තර බෞද්ධ එක්ස්පෝ සහ මයියුන්ග්වොන් ජාත්‍යන්තර තේ එක්ස්පො යන අංශවලට ශ්‍රී ලංකාවේ සහභාගීත්වයට අවශ්‍ය සහාය තානාපති කාර්යාලය විසින් සපයන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ කොරියා රාජ්‍ය සංචාරයේදී ආර්ථික කටයුතුවලට අදාළව සිදුකරනු ලැබූ කාර්ය කටයුතුඃ

- අතිගරු ජනාධිපතිතුමාගේ 2017 රාජ්‍ය සංචාරයට සාමාජිකයන් 37 දෙනෙකුගෙන් සමන්විත ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමක් සහභාගි විය. කොරියානු වාණිජ හා කර්මාන්ත මණ්ඩල ඒකාබද්ධව, 2017 නොවැම්බර් 29 වැනි දින සෝල් නුවර ග්‍රෑන්ඩ් හේට් හෝටලයේදී පවත්වන ලද ව්‍යාපාරික සංසදයට මෙම නියෝජිත කණ්ඩායම සහභාගි විය. මෙම රාජ්‍ය සංචාරය නිමිති කර ගනිමින් කොරියානු ජනරජයේ අදාළ නියෝජිතායතන සමඟ එක්ව දූත මණ්ඩලය විසින් සංවිධානය

කරන ලද ආර්ථිකයට අදාළ කාර්ය කටයුතු විස්තරාත්මක වශයෙන් පහත දැක්වේ.

- කොරියාවේ කුඩා හා මධ්‍යම ව්‍යාපාරික බලමණ්ඩලය (KBIZ),2017 නොවැම්බර් 29 වැනි දින, කොරියානු වාණිජ හා කර්මාන්ත මණ්ඩල (KCCI),කොරියානු කර්මාන්ත බලමණ්ඩලය (FKI) කොරියානු ජාත්‍යන්තර වෙළෙඳ සංගමය(KITA) හා කොරියාවේ "හයි පොටෙන්ෂල් එන්ටප්‍රයිසස් " (AHDEK) සමඟ එක්ව ව්‍යාපාරික දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීය. ඉහත සඳහන් කල එක් එක් වෙළෙඳ සංවිධාන නියෝජනය කරමින් කොරියාවේ ඉහළ පෙළේ වෙළෙඳ සමාගම් රාශියක් මෙම අවස්ථාවට සහභාගි විය.
- මෙම දිවා භෝජනයෙන් පසුව කොරියානු සමාගම් හා කොරියාවට ගොස් සිටින ශ්‍රී ලාංකික වෙළෙඳ සමාගම් අතර B2B පවත්වන ලදි.(KOTRA) 2017 නොවැම්බර් 29 වැනි දින සවස පැවති සංවිධානය කරන ලද්දේ කොරියානු ආනයනකරුවන්ගේ සංගමය(KOIMA) සමඟ එක්ව කොරියානු වෙළෙඳ ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතනය විසිනි. ශ්‍රී ලංකාවේ ආයෝජන මණ්ඩලය,ආර්ථික සංවර්ධන බැංකුව හා මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ පුද්ගලික අංශ වෙළෙඳ සමාගම් 24 ක ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත වූ ව්‍යාපාරික නියෝජිත කණ්ඩායම සාමාජිකයින් 37 දෙනෙකුගෙන් සමන්විත විය. (ලංකා වාණිජ මණ්ඩලයේ හා ශ්‍රී ලංකා - කොරියා ආර්ථික සහයෝගිතා කමිටුවේ සාමාජිකයින්) කොරියානු සමාගම් නියෝජිතයින් 70 කට ආසන්න පිරිසකගේ සහභාගිත්වයේ මෙම B2B සැසිවාරය සාර්ථකව පවත්වන ලද අතර දෙදෙනෙකුගේ සහභාගිත්වයෙන් පවත්වන ලද ව්‍යාපාරික රැස්වීම් රැසක් ද පවත්වන ලදී. ද්විපාර්ශ්වික හා ජාතින් සබඳතා ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යාපාරික සබඳතා ඇතිකර ගැනීමට කොරියානු සමාගම්වලට සහ සංචාරයේ නිරත වූ ශ්‍රී ලාංකික සමාගම්වලට ඉඩ ප්‍රස්ථා ලබාදීම මෙම ව්‍යාපාරික රැස්වීම්වල අරමුණ විය.

**xii ශ්‍රී ලංකා ආණ්ඩුව හා කොරියානු ජනරජය අතර ආර්ථික සහයෝගිතාව පිළිබඳ ගිවිසුම**

වෙළඳාම ආයෝජන හා සංචාරක කටයුතු ඇතුළුව ද්විපාර්ශ්වික ආර්ථික සහයෝගීතාවයේ නව මාර්ග පිළිබඳව තවදුරටත් සොයාබැලීම සඳහා ශ්‍රී ලංකාව හා කොරියානු ජනරජය අතර ආර්ථික සහයෝගිතාව පිළිබඳ ඒකාබද්ධ කොමිෂන් සභාවක් පිහිටුවීම අරමුණ කර ගනිමින් කොරියානු ජනරජයේ විදේශ කටයුතු අමාත්‍යාංශය හා ශ්‍රී ලංකාවේ සංවර්ධන උපායමාර්ගික හා ජාත්‍යාන්තර වෙළෙඳ අමාත්‍යාංශය සමඟ මෙම දූත මණ්ඩලය සාකච්ඡා පැවැත්වීය. මෙම ප්‍රයත්නවල ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකා අතිගරු ජනාධිපතිතුමාගේ කොරියානු ජනරජ රාජ්‍ය සංචාරයේදී ශ්‍රී ලංකාවේ සංවර්ධන උපායමාර්ගික හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාවරයා සහ කොරියානු ජනරජයේ විදේශ කටයුතු අමාත්‍යවරයා

විසින් ශ්‍රී ලංකාව හා කොරියානු ජනරජය අතර ආර්ථික සහයෝගිතාව පිළිබඳ ගිසුමට අත්සන් තබන ලදී.

**xiii EDCF සහයෝගීතාව**

2017 වර්ෂයේදී සාකච්ඡා සඳහා පහසුකම් සලසන ලද අතර ශ්‍රී ලංකා අතිගරු ජනාධිපතිතුමාගේ කොරියානු රාජ්‍ය සංචාරයේදී මූලික ගිවිසුමට අත්සන් තැබීමට අවශ්‍ය කටයුතු අවසන් කිරීමට මැදිහත් වී කටයුතු කළේය. මෙම ගිවිසුමට එළඹෙන ලද්දේ දැනට පවත්නා ඇ.ඩො. මිලියන 300ක කොරියානු එක්සිම් බැංකු ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල (EDCF) මීළඟ අවුරුදු තුන( 2017-2019) සඳහා ඇ.ඩො.මිලියන 500 ක් දක්වා වැඩි කිරීම සඳහාය.

**අවබෝධතා ගිවිසුම්**

- ආයෝජන ප්‍රවර්ධන සහයෝගිතාව සඳහා ශ්‍රී ලංකාවේ ආයෝජන මණ්ඩලය(BOI) හා කොරියාවේ වෙළෙඳ-ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතන (KOTRA ) අතර රාජ්‍ය සංචාරය අතරතුරදී දෙරටේ ආයෝජන නියෝජිතායතන දෙකෙහි ප්‍රධානීන් අතර අත්සන් තැබුණු අවබෝධතා ගිවිසුමකට අවශ්‍ය පහසුකම් දූතමණ්ඩලය විසින් සලසන ලදී.
- ශ්‍රී ලංකාවේ හා කොරියාවේ ප්‍රධාන වෙළෙඳපල කර්මාන්ත සංවර්ධනය සඳහා දෙරටේ කොටස් හුවමාරු ආයතන අතර සහයෝගිතා සබඳතාවක් ඇතිකිරීමට 2017 නොවැම්බර් 20 වැනි දින සෝල් නුවර කොරියානු කොටස් වෙළෙඳපළේදී( KRX ) කොරියානු කොටස් හුවමාරුව (KRX) හා කොළඹ කොටස් වෙළෙඳපල (CSE) අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තබන ලදී. කොරියා ජනරජයේ ශ්‍රී ලංකා තානාපතිවරයා ඉදිරිපිටදී සොල් නුවරදී කොරියානු කොටස් වෙළෙඳපල සභාපති පිවොන් ජන්ග් මහතා හා කොළඹ කොටස් වෙළෙඳපල සභාපති රේ අබේවර්ධන මහතා විසින් මෙම අවබෝධතා ගිවිසුමට අත්සන් තබන ලදී. මෙම කාර්ය සඳහා අවශ්‍ය පහසුකම් දූතමණ්ඩලය විසින් සලසන ලදී.

**xiv ප්‍රවර්ධන කටයුතු**

i. ශ්‍රී ලංකාවේ දී පවත්වන ලද පාරම්පරික ඌනපූරක ඖෂධ, අධ්‍යාපනික ප්‍රදර්ශනය හා වෙළෙඳ ප්‍රදර්ශනය - Tramed International-2017 සඳහා සහභාගිවීම සඳහා කොරියානු ජනරජයේ ආහාර පර්යේෂණ ආනයනකරුවන්, මහාචාර්යවරුන් / විද්වතුන් හා තේ කර්මාන්තකරුවන් ඇතුළුව කොරියානු නියෝජිතයින් 10 දෙනෙකුගේ කණ්ඩායමකගේ සංචාරය සඳහා අවශ්‍ය පහසුකම් සලසන ලදී. සෞඛ්‍ය,

පෝෂණ හා දේශීය ඖෂධ අමාත්‍යාංශය විසින් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, හා ලෝක සෞඛ්‍ය සංවිධානය සමඟ එක්ව 2017 නොවැම්බර් 23-25 දිනවල කොළඹ දී මෙය සංවිධානය කරන ලදී. මීට අමතරව, ලංකා තේ සහ ලංකා කුරුඳු නිස්සාරණය පිළිබඳව ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය හා කොරියානු ජනරජය අතර පුද්ගලික රාජ්‍ය හවුල්කාරිත්වයක් ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසින් ආරම්භ කරනු ඇත.

ii. සමාලෝචනයට බඳුන්කල කාලය තුළදී, 2017-ජෙජේවිය කර්මාන්ත වෙළෙඳපල, Jeollanam –do ජාත්‍යන්තර කෘෂිකර්ම ප්‍රදර්ශනය, ජාවාහි සෝල් ජාත්‍යන්තර කැෆේ ප්‍රදර්ශනය, වර්ල්ඩ් ෆුඩ් එක්ස්පො කොරියා, Seongbuk ලෝක බීර උළෙල හා Itaewon ගෝලීය ගම්මාන උළෙල සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වයට අවශ්‍ය පහසුකම් දූතමණ්ඩලය විසින් සලසන ලදී.

iii. මහනගර හා බස්නාහිර කළාප සංවර්ධන කටයුතු සඳහා කොරියානු ඉඩම් ද යටිතල පහසුකම් හා ප්‍රවාහන අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය අතර 2016 මැයි මස අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමට අනුව, ඉඩම්, යටිතල පහසුකම් හා ප්‍රවාහන අමාත්‍යාංශය (MOLIT) විසින් පත්කරන ලද විශේෂඥ කණ්ඩායමක් කීපවතාවක් ශ්‍රී ලංකාවට පැමිණි අතර හෝමාගම විද්‍යා හා තාක්ෂණ පුරවරය (Techcity Homagama) සඳහා ප්‍රධාන සැලස්මක් සකසන ලදී. මහා නගර හා බස්නාහිර සංවර්ධන ගරු අමාත්‍යවරයාගේ සහභාගිත්වයෙන් 2017 නොවැම්බර් 6 වැනි දින කොළඹ දී පැවති උත්සවයකදී මෙම සැලැස්ම දියත් කරන ලදී.

iv. සමාලෝචනයට බඳුන්වන කාලසීමාව තුළදී මෙම දූතමණ්ඩලය, කොරියාවේ වාණිජ කර්මාන්ත මණ්ඩලයේදී (KCCI) කොරියා - ශ්‍රී ලංකා ආර්ථික සහයෝගිතා කමිටුව යළි ස්ථාපනය කරන ලදී. මෙහි සභාපතිත්වය දරනු ලබන්නේ "Kolon Global" නම් ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කටයුතු සිදුකිරීමට විශාල වශයෙන් කැමැත්තක් දක්වන කොරියාවේ කැපීපෙනෙන සමාගමක් විසිනි. මේ අනුව, Kolon Global හි සභාපතිත්වය කොරියා - ශ්‍රී ලංකා ආර්ථික සහයෝගිතා කමිටුවේ සභාපතිත්වය ද වන අතර 2017 නොවැම්බර්යේදී අතිගරු ජනාධිපතිතුමා නියැලුණු සංචාරයට ගරු කිරීමක් වශයෙන් පවත්වන ලදී. ව්‍යාපාරික දිවා භෝජන සංග්‍රහයේදී එතුමා කොරියානු වාණිජ හා කර්මාන්ත මණ්ඩලය නියෝජනය කරන ලදී. 2018 වසරේදී ව්‍යාපාරික ප්‍රවර්ධන කටයුතු සංවිධානය කිරීම සඳහා කොරියා - ශ්‍රී ලංකා ආර්ථික සහයෝගිතා කමිටුව සමඟ සාකච්ඡා පවත්වමින් සිටියි.

**(ඈ) සංස්කෘතික සබඳතා**

i. ශ්‍රී ලංකාව විසින් පවත්වන ලද 14 වැනි එක්සත් ජාතීන්ගේ වෙසක් දින සැමරුම්වලට සහභාගිවීම සඳහා සමාජ කටයුතු අධ්‍යක්ෂ පූජ්‍ය ජන්ග් මූන් ස්වාමීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් යුතු කොරියානු බෞද්ධ ආගමේ ජොග්යේ නිකායේ සත් සාමාජික නියෝජිත කණ්ඩායමකගේ සංචාරය සඳහා අවශ්‍ය පහසුකම් තානාපති කාර්යාලය විසින් සලසන ලදී. මෙම රාජ්‍ය සංචාරය අතරතුරදී සංස්කෘතිය, කලාව, අධ්‍යාපනය, තරුණ කටයුතු හා ක්‍රීඩා පිළිබඳ ගිවිසුමට අත්සන් තැබීම සඳහා අවශ්‍ය කටයුතු සලසන ලදී.

ii. 2017.10.27 වැනි දින කොරියාවේ ජාතික කෞතුකාගාරයේදී "ශ්‍රී ලංකාවේ බෞද්ධ උරුමය ආරක්ෂා කිරීම: ඉතිහාසය හා අභියෝග" මැයෙන් දේශනයක් පවත්වන ලෙස ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය ජගත් වීරසිංහ මහතාට කොරියාවේ ජාතික කෞතුකාගාරය විසින් ආරාධනා කරන ලදී.

iii. 2017 ඔක්තෝබර් 07 හා 08 දිනවලදී ඩේගු නගරයේ පිහිටි "ශ්‍රී ලංකාරාමය" විහාරස්ථානයේ (පූජ්‍ය විජිතවංශ හිමියන් ගේ නායකත්වයෙන් යුතු) කඨින මහා පිංකමට ශ්‍රී ලංකා තානාපතිවරයා සහභාගි විය. මේ සඳහා ඩේගු නුවරට පැමිණි තානාපතිවරයා " Donghwasa " හා "Seobongsa" විහාරස්ථාන ද වැඳ පුදාගත් අතර මෙම විහාරස්ථාන දෙකේ විහාරාධිපතීන් වහන්සේලා ද හමුවිය. " Donghwasa " විහාරස්ථානය කොරියානු බුද්ධ ධර්මයේ ජොග්යේ නිකායේ නමවැනි දිස්ත්‍රික්කයේ ප්‍රධාන විහාරස්ථානය වන අතර එය Mt. Palgong – san හි පිහිටා තිබේ. "Seobongsa" විහාරස්ථානය ජොග්යේ නිකායේ ඩේගු හි පිහිටි වාසස්ථානයක් වන අතර එය බෞද්ධ සංස්කෘතික දේපළ ආරක්ෂා කිරීම සඳහා ප්‍රකට විහාරස්ථානයකි. මීට අමතරව, තානාපතිවරයා, 2017 ඔක්තෝබර් 29 වැනි දින Pyeongtaek හි පිහිටි මහා විහාරයේ වාර්ෂික කඨින පිංකම සඳහා ද සහභාගි විය. මෙහි විහාරාධිපතීන් වහන්සේ පූජ්‍ය ධම්මකිත්ති හිමියන් ය.

iv. ශ්‍රී ලංකාවේ, අනුරාධපුර අවුකන විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය ධම්මකිත්ති හිමියන් තානාපති කාර්යාලයට වැඩම කළ අතර එහිදී උන්වහන්සේ තානාපතිතුමා හා කාර්ය මණ්ඩලය සමඟ ඉදිරි සහයෝගිතා පිළිබඳව සාකච්ඡා කළහ.

v. 2017 ඉමේවොන් ගෝලීය ගම්මාන උළෙලට ශ්‍රී ලංකාව සහභාගි වූ අතර වෙනත් දෑ අතර ලංකා තේ, ශ්‍රී ලාංකික ඔසු හා විලවුන් හා අලේපන වර්ග ප්‍රදර්ශනය කරමින් එහි පවත්වාගෙන ගිය ප්‍රදර්ශන කුටිය වෙතට කොරියානු ජාතිකයෝ විශාල සංඛ්‍යාවක් ඇදී ආහ. මෙම ප්‍රදර්ශනය පවත්වන ලද්දේ 2017 ඔක්තෝබර් 14-15 යන සති අන්තයේදීය.

vi. ප්‍රජා සබඳතා: මෙම තානාපති කාර්යාලය, අතිගරු ජනාධිපතිතුමාගේ කොරියානු ජනරජ රාජ්‍ය සංචාරයට සමගාමීව 2017.11.28 වැනි දින ප්‍රජා රැස්වීමක් සංවිධානය කළේය. අතිගරු ජනාධිපතිතුමා හා ශ්‍රී ලංකාවේ කැබිනට් අමාත්‍යවරු 6 දෙනෙක් මෙම අවස්ථාවට සහභාගි වූහ. කොරියාව පුරා විසිරී ඇති බෞද්ධ විහාරස්ථාන නියෝජනය කරමින් ශ්‍රී ලාංකික බෞද්ධ භික්ෂූන් වහන්සේලාට අමතරව EPS සේවා නියුක්තිකයන්, ශ්‍රී ලාංකික වෘත්තිකයින්, ශ්‍රී ලංකා ව්‍යාපාරික ප්‍රජාව සහ කොරියාවේ ශ්‍රී ලාංකික ශිෂ්‍ය සංගමය ඇතුළුව ශ්‍රී ලාංකිකයින් 125 ක්

පමණ මෙම අවස්ථාවට සහභාගි වූහ. ශ්‍රී ලංකා තානාපති කාර්යාල වෙබ් අඩවියේ සිංහල අංශය අතිගරු ජනාධිපතිතුමා විසින් මෙම රැස්වීම අතරතුරදී දියත් කරන ලදී.

vii. කොරියාවේ වෙසෙන ශ්‍රී ලාංකික සේවකයන්ට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සහාය ලබාදීම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා 2017 ඔක්තෝබර් 13 වැනි දින තානාපති කාර්යාලයේදී ශ්‍රී ලංකාවේ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සභාපති හා මහා කළමනාකාර/ ප්‍රධාන විධායක නිලධාරී හා ඔවුන්ගේ නියෝජිතයන් හමුවිය. ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලාංකික සේවකයන් සඳහා සංවිධානය කරනු ලබමින් සිටින නැවත සමෝධානිකරණ වැඩසටහන් සඳහා සහාය ලබාදීම මෙහි ප්‍රධාන අරමුණ වෙයි. කොරියානු ජනරජයේ වෙසෙන ශ්‍රී ලාංකික සේවකයන් සඳහා දූතමණ්ඩලය විසින් සංවිධානය කරනු ලබන "දිරියමඟ" දැනුවත් කිරීමේ වැඩසටහනහට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සම්පත්දායකයන්ගේ සහාය ඉදිරියේදී ලබාදීමට මෙහිදී එකඟතාවය පළ විය.

viii. 2018 පෙබරවාරි මාසයේදී ඩේගු නගරයේදී ශ්‍රී ලංකාවේ 70 වැනි නිදහස් සංවත්සර සැමරුම් සංවිධානය කිරීම පිළිබඳව ඩේගු නගරයේ පිහිටි ශ්‍රී ලංකාරාමය හා එම නගරයේ පිහිටි " HamgehanamSesang " නම් කොරියානු සංගමය සමඟ දූතමණ්ඩලය දිගින් දිගටම සාකච්ඡා පැවැත්වීය.

ix. දූතමණ්ඩලය, කොරියානු ජනරජයේ ශ්‍රී ලාංකික ප්‍රජාව එහි නියෝජිතයින් හා ශ්‍රී ලාංකික සංගම් සමඟ අඛණ්ඩව කටයුතු කර තිබේ.

**(ඉ) කොන්සියුලර් කටයුතු**

i. තානාපති කාර්යාලයේ කොන්සියුලර් අංශය, විදේශ ගමන් බලපත්‍ර/ රටකින් රටකට ගමන් කිරීම සඳහා හදිසියේ ලබා දෙන ලියකියවිලි නිකුත්කිරීම, විදේශ ගමන් බලපත්‍ර අලුත් කිරීම, උප්පැන්න හා මරණ ලියාපදිංචිය, විවාහ සිදුකිරීම, රියදුරු බලපත්‍ර සහතික කිරීම, නෛතික ලේඛනවලට අත්සන් තැබීම හා වීසා බලපත් නිකුත්කිරීම වැනි කොන්සියුලර් සේවා සලසාලයි. (කොන්සියුලර් සේවා ලබාදෙන වේලාව සඳුදා - සිකුරාදා තෙක් පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා සහ සෙනසුරාදා ප.ව. 2.00 - ප.ව. 5.00 දක්වා)

ii. සමාලෝචනයට බඳුන්වන කාලය තුළදී මෙම දූත මණ්ඩලය සෝල් නුවරින් පිට තෝරාගත් ප්‍රදේශවලදී රජයේ නිවාඩු දින හා සති අන්තවලදී ජංගම කොන්සියුලර් සේවාවන් හතරක් (04) පැවැත්වීය. කොරියාවේ වෙසෙන ශ්‍රී ලාංකිකයින්ට නිකුත්කරන ලද අධිකරණ නොතිසි / ලේඛන 04ක් බෙදාහැරීමට අවශ්‍ය කටයුතු සලසන ලදී.

iii. සමාලෝචනයට බඳුන්වන කාලසීමාව තුළදී, මියගිය ශ්‍රී ලාංකික සේවකයන්ගේ මෘතදේහ 5 ක් ශ්‍රී ලංකාවට යැවීමට අවශ්‍ය කටයුතු තානාපති කාර්යාලය විසින් සලසන ලදී. සාකච්ඡා තුළින් මේ සඳහා වැයවන මුදල් ද ආවරණය කරන ලදී. මීට අමතරව මේ කාලසීමාව තුළදී වාර්තා වී ඇති ධීවරයින් 02 ගේ අතුරුදහන් වීම පිළිබඳව කටයුතු සිදුකරනු ලබමින් සිටියි.

iv. ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ (කොන්සියුලර් අංශයේ) උපදෙස් මත සමාලෝචනයට බඳුන්වන කාලසීමාව තුළදී, e-das ක්‍රමය දූතමණ්ඩලය විසින් දිගින් දිගටම ක්‍රියාත්මක කළේය.

v. තානාපති කාර්යාලයේ නව වෙබ් අඩවිය (ඉංග්‍රීසි අංශය) 2017 මැයි 25 වැනි දින දියත් කරන ලදී. මෙම වෙබ් අඩවිය කොරියානු හා සිංහල භාෂාවලින් අංශ සකස් කරමින් පවතියි.

vi."බ්ලූ හවුස් මීඩියා" (ජනාධිපති කාර්යාලය) ඇතුළුව කොරියානු මාධ්‍ය මගින් අතිගරු ජනාධිපතිතුමාගේ රාජ්‍ය සංචාරය ආවරණය කරන ලදි. Arirang TV news , Yonhap News වැනි ඉතා ජනප්‍රිය රූපවාහිනී නාලිකා හා කොරියා ටයිම්ස්, කොරියා හෙරල්ඩ් හා Hankookilbo වැනි ප්‍රවෘත්ති පත්‍ර මීට අයත් වෙයි. අතිගරු ජනාධිපතිතුමා සමඟ මෙහි පැමිණි නිල මාධ්‍ය නියෝජිත කණ්ඩායමට අවශ්‍ය සහාය ද මෙම දූතමණ්ඩලය විසින් ලබා දෙන ලදී.

vii. තානාපති කාර්යාලයේ නව වෙබ් අඩවිය, 2017.11.28 වැනි දින ප්‍රජා රැස්වීමේදී අතිගරු ජනාධිපතිතුමා විසින් දියත් කරන ලද අතර එම වෙබ් අඩවියට දැන් ඉංග්‍රීසි, සිංහල හා කොරියානු භාෂාවලින් පිවිසිය හැකිය. තවද , ජංගම දුරකථනවලට ගැලපෙන වෙබ් අඩවියක්, සැකසීමෙහි ද නිරත වී සිටියි.

viii. කොරියාවේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව සමඟ අන්‍යෝන්‍ය වශයෙන් කටයුතු කිරීමට සහ කොන්සියුලර් හා රැකියා සුභසාධනයට අදාළ තොරතුරු පතල කර ගැනීමට සිංහල භාෂාවෙන් තානාපති කාර්යාලයේ මුහුණු පොත යාවත්කාලීන කිරීමට මෙම දූත මණ්ඩලය දිගින් දිගටම කටයුතු කරයි. ශ්‍රී ලාංකික වෙළෙඳාම, ආයෝජන, සංචාරක කටයුතු හා සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම තානාපති කාර්යාලය ට්විටර් ගිණුමක් හා යූ ටියුබ් වීඩියෝ ගිණුමක් ද පවත්වාගෙන යයි. මෙම ගිණුම් තානාපති කාර්යාලය විසින් දිගින් දිගටම යාවත්කාලීන කරයි.

සමාලෝචනය බඳුන්වන කාලය තුළදී, රැකියා බලපත් ක්‍රමය යටතේ කොරියාවේ නිෂ්පාදන, ධීවර, ඉදිකිරීම් හා කෘෂිකර්ම ක්ෂේත්‍රවල කුඩා - හා මධ්‍යම පරිමාණයේ සමාගම්වල කම්කරු හා ඒ ඇතුළත රැකියා සඳහා සේවකයා යැවීමේ කාර්යයෙහි ශ්‍රී ලංකාව දිගින් දිගටම නිරතව සිටියේය. 2017 දෙසැම්බර් 31 වැනි දින වනවිට ශ්‍රී ලාංකිකයන් 27,000 ක් කොරියානු සේවායෝජකයන් යටතේ සේවය කරන බව ගණන් බලා තිබේ. මෙම අංශවල සේවය කරන බහුතර සේවකයෝ සුදුසු සේවා තත්ත්ව යටතේ සේවය කරති. කෙසේ වෙතත් ශ්‍රී ලාංකිකයෝ 30,000 ක් පමණ රැකියා සඳහා කොරියාවේ වෙසෙති. කොරියාවේ රැකියා හා කම්කරු අමාත්‍යාංශය සහ කොරියාවේ මානව සම්පත් සංවර්ධන සේවය (HRD) වැනි අදාළ කොරියානු නියෝජිතායතනය සමඟ දූතමණ්ඩලය සමීපව කටයුතු කරමින් රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ කොරියාවේ සේවය කරන ශ්‍රී ලාංකික සේවකයන්ගේ සුභසාධනය සම්බන්ධයෙන් කටයුතු සම්බන්ධීකරණය කරයි. 2017 ඔක්තෝබර් 1 සිට දෙසැම්බර් 31 දක්වා කාලසීමාව තුළදී කොරියානු නගරය වෙත පැමිණි සේවාදායකින් සංඛ්‍යාව 3460 ක් විය.

**ඊ). සුභසාධනය**

2017 ඔක්තෝබර් 1 - දෙසැම්බර් 31 දක්වා වූ කාලසීමාව තුළදී තානාපති කාර්යාලයේ රැකියා හා සුභසාධන අංශය විසින් සිදුකරනු ලබන සමස්ත සුභසාධන කටයුතු පහත දැක්වෙන සංඛ්‍යාලේඛනවලින් පෙන්නුම් කෙරේ.

| | |
|---|---|
| සේවාවන්ට අදාළව සේවකයින් විසින් කරනු ලැබ<br>ඇති පැමිණිලි සංඛ්‍යාව | - 394 |
| රෝහල්ගතවී ඇති සංඛ්‍යාව | - 27 |
| බන්ධනාගාරගත වී ඇති සංඛ්‍යාව (බන්ධනාගාරයේ පසුවන ශ්‍රී ලාංකිකයන්) | - 11 |
| ධීවර අංශයේ අතුරුදහන් වී ඇති පුද්ගලයින් | - 02 |
| රැකියා හා සුභසාධන ජංගම සේවා සංඛ්‍යාව | - 12 |

iii. **දැනුවත් කිරීමේ වැඩසටහන්**

- සමාලෝචනය බඳුන්වන කාළය තුළදී තානාපති කාර්යාලයේ රැකියා හා සුභසාධන අංශයේ නිළධාරිහු කොරියාවේ මානව සම්පත් සංවර්ධන සේවය (HRD) හා සංක්‍රමණික සේවකයන් සඳහා සහාය මධ්‍යස්ථාන සමඟ එක්ව කොරියාවේ විවිධ ප්‍රදේශවල සිටින ශ්‍රී ලාංකික සේවකයන් සඳහා "දිරිය මඟ" දැනුම්වත් කිරීමේ හා උපදේශක වැඩසටහන් තුනක් (03) පැවැත්වූහ. මෙම ව්‍යාපාර කේන්ද්‍ර කොටගත් වැඩසටහන, හඳුන්වා දෙනු ලබන්නේ, ආපසු පැමිණෙන සේවකයන් යළිත් වරක් ශ්‍රී ලාංකික කම්කරු බලකායට මනා ලෙස එක්වීමේ තහවුරු කරලීමට ඔවුන් අතර ඵලදායි ව්‍යාපාරික හා ව්‍යවසායික කුසලාන වැඩිදියුණු කිරීම සඳහාය.
- තානාපති කාර්යාලයේ රැකියා හා සුභසාධන අංශය කොරියාවේ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත බල මණ්ඩලය (KBiz) ජාතික ධීවර සමුපකාර බලමණ්ඩලය (NFFC) හා කොරියාවේ ඉදිකිරීම් සංගමය (CEK) සමඟ එක්ව සමාලෝචනයට බඳුන්වන කාලසීමාව තුළදී පුහුණු මධ්‍යස්ථානවලදී කොරියාවට අලුතෙන් පැමිණි ශ්‍රී ලාංකික සේවාදායකයන් සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් නමයක් (09) ද පවත්වන ලදී. මෙම වැඩසටහනට ඇතුළත්වන තොරතුරු, විශේෂයෙන්, කොරියාවේ නීති විරෝධී ලෙස රැඳී සිටීම වැළැක්වීම ඇතුළුව අනාගත අරමුණු ඉටුකර ගැනීමට ඔවුන්ව දිරිමත් කිරීමේ අරමුණින් පතලකර හරිනු ලැබේ.

iii. **සංචාර**

- රාජ්‍ය නායකයින් දෙපළ අතර 2017 නොවැම්බර් 29 වැනි දින පැවති සමුළුවකදී, ශ්‍රී ලංකා ජනාපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා, රැකියා බලපත්‍ර ක්‍රමය යටත් ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ට කොරියාවේ රැකියා ඉඩප්‍රස්ථා ලබාදී තිබීම පිළිබඳව සිය ප්‍රශංසාව පුද කළේය. දෙරටේ ආර්ථිකයන්ට ශ්‍රී ලාංකික සේවකයින් ලබාදී ඇති දායකත්වය පිළිගැනීමට ලක් කරමින් රැකියා බලපත් ක්‍රමය යටතේ වූ සහයෝගිතාව තවදුරටත් වර්ධනය කිරීමට රාජ්‍ය

නායක දෙපළ එකඟ වූහ. මෙම බලපත්‍ර ක්‍රමය යටතේ, ශ්‍රී ලාංකිකයන්ට තවතවත් රැකියා ඉඩප්‍රස්ථා ලබාදෙන ලෙස අතිගරු ජනාධිපතිතුමා කළ ඉල්ලීම පිළිබඳව සලකා බැලීමට කොරියානු රජය එකඟ විය.

- මෙම සමුළු රැස්වීමට අනතුරුව, නොවැම්බර් 29 වැනි දින පැවති අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීමේ උත්සවයෙහි දී, රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ කොරියානු ජනරජයේ සේවකයන් යැවීම හා ලබාගැනීම පිළිබඳ අවබෝධතා ගිවිසුමට ශ්‍රී ලංකාවේ විදේශීය රැකියා අමාත්‍ය ගරු තලතා අතුකෝරළ මැතිණිය හා කොරියානු ජනරජයේ රැකියා හා කම්කරු අමාත්‍ය ගරු කි යන්ග් ජූ මැතිතුමා රාජ්‍ය නායකයන් දෙපළ ඉදිරියේ අත්සන් තැබූහ.

iv. **රැස්වීම්:**

රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ, ශ්‍රී ලාංකික සේවකයන් සඳහා රැකියා ඉඩප්‍රස්ථා වැඩි ප්‍රමාණයක් ලබාගැනීම සඳහා හා ශ්‍රී ලාංකික සේවකයන්ගේ සුභසාධන කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා කොරියානු ජනරජයේ රැකියා හා කම්කරු අමාත්‍යාංශය සමඟ රැස්වීම් දෙකක් (02) පවත්වන ලදී.

v. **රැකියා ප්‍රවර්ධනය :**

සමාලෝචනය බඳුන්වන කාලසීමාව තුළදී, රැකියා ප්‍රවර්ධන උපාය මාර්ගයක් ලෙස සමාගම් තිස් නමයක් (39) වෙත ගොස් ඇගයීමේ ඵලක හා සිහිවටන ප්‍රදානය කළේය.

vi. **ධීවර ක්ෂේත්‍රය සඳහා වැඩසටහන්**

ශ්‍රී ලාංකික සේවාදායකයින් ධීවර අංශයට බඳවා ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා හා පිටත්වීමට පෙර ලබාදෙන පුහුණු වැඩසටහන්වල විස්තර ලබාගැනීම සඳහා ප්‍රදේශීය පවත්නා ධීවර සංගම් තුළින් ධීවර කර්මාන්තය සිදුකරන ප්‍රදේශවල රැකියා මධ්‍යස්ථාන හා NFFC ප්‍රාදේශීය ශාඛා වෙත තානාපති කාර්යාලයේ රැකියා හා සුබසාධන අංශය අවස්ථා දෙකකදී (02) ගිය අතර එහිදී මෙම අංශයේ කම්කරුවන්ට අදාළව පවත්නා ගැටලු පිළිබඳව සාකච්ඡාවට බඳුන් වූ අතර ශ්‍රී ලාංකික ධීවර අංශ සේවකයින් හමුවීමට ද අවස්ථාව උදා විය.

vi. **SLBFE ලියාපදිංචිය**

2017 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා කාලසීමාව තුළදී , SLBFE පනත යටතේ SLBFE ලියාපදිංචි ගාස්තු ලෙස කොරියානු වොන් (KRW) 2,016,000 ක(ශ්‍රී ලංකා රු. 220,800.00 සමස්ත ආදායමක් උපයා ගන්නා ලදි. SLBFE ලියාපදිංචි 12 දෙනෙකුගේ සේවා ස්ථානය වෙනස් කිරීම් (KRW 1, 368,000) හා SLBFE ලියාපදිංචිය අලුත්කිරීමේ (KRW 648 ,000) මීට ඇතුළත් විය.

vii. **ආරක්ෂක පියවර පිළිබඳ තොරතුරු**

නිෂ්පාදන හා ධීවර අංශවලට විශේෂ අවධානයක් යොමුකරමින් , කර්මාන්ත හා වෙනත් හදිසි අනතුරු වැළැක්වීම සඳහා ශ්‍රී ලාංකික සේවාදයකයින් විසින් අනුගමනය කළ

යුතු ආරක්ෂක පියවර පිළිබඳ තොරතුරු මෙම දූතමණ්ඩලය විසින් දිගින් දිගටම පතල කර හරින ලදී. මෙය දැනුම්වත් කිරීමේ වැඩසටහන් හරහා සහ දූතමණ්ඩලයේ මුහුණු පොත හරහා සිදුකරන ලදී. සේවාදායකයන් විසින් මෙම තොරතුරු පුළුල් වශයෙන් බෙදා හදාගත් අතර මේ සඳහා විශාල ප්‍රචාරයක් ලැබිණි. එමගින්, මෙම උපාය මාර්ගයේ සාර්ථකත්වය පිළිඹිබු විය.

**දැනුවත් කිරීමේ වැඩසටහන්:**

**ආපසු ශ්‍රී ලංකාවට පැමිණීමට ලබා දෙනු ලබන සහාය පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහන.**

"HRD Korea" හා සංක්‍රමණික සේවකයින් සඳහා සහාය සැලසීමේ මධ්‍යස්ථාන සමඟ සහයෝගීත්වයෙන්, කොරියානු ජනරජයේ විවිධ පළාත්වල සේවය කරන ශ්‍රී ලාංකික සේවාදායකයන් සඳහා "දිරිය මඟ" නම් දැනුම්වත් කිරීමේ හා උපදෙස් ලබාදීමේ වැඩසටහන් දහතුනක් පවත්වන ලදී.

i. කොරියාවට අලුතින් පැමිණි සේවාදායකයන් සඳහා වැඩසටහන

කුඩා කර්මාන්ත ව්‍යවසාය කොරියානු බලමණ්ඩලය, ධීවර සමුපකාර ජාතික බලමණ්ඩලය හා කොරියාවේ ඉතිරිකිරීමේ සංගමය සමඟ එක්ව තානාපති කාර්යාලය, අලුතෙන් පැමිණි සේවකයන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් හතලිස් එකක් (41) ක් පවත්වන ලදී.

ශ්‍රී ලාංකික සේවාදායකයන් වැඩිපිරිසක් ගෙන්වා ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා ධීවර කර්මාන්තයේ නියැලි සිටින විවිධ කලාපවල ඇති ධීවර සමූපකාර ජාතික බලමණ්ඩලයේ කලාපීය ශාඛාවලට හා රැකියා මධ්‍යස්ථානවලට දූත මණ්ඩලයට හත් (07) වතාවක් යාමට සිදුවිය.

ii. රැකියා හා සුභසාධන සබඳතා රැස්වීම්

වැඩි රැකියා ඉඩප්‍රස්ථා, සුභසාධන පියවර ප්‍රවර්ධනය කිරීම සඳහා සහ ශ්‍රී ලාංකික සේවකයන්ගේ ආරක්ෂාව හා සුභසාධනය තහවුරු කිරීම සඳහා කොරියානු බලධාරීන් සමඟ රැස්වීම් හයක් (06)ක් පවත්වන ලදී.

**9. සිංගප්පූරුව**

**අ). ද්විපාර්ශ්වීය සබඳතා**

දූත මණ්ඩල විසින් පහත සංචාර සඳහා පහසුකම් සලසන ලදී.

i. සිංගප්පූරු විදේශ කටයුතු අමාත්‍යවරයා 2017 ජුලි 17-20 දිනවල ශ්‍රී ලංකාවේ කරන ලද සංචාරයේ දී ලංකා රතු කුරුස සංවිධානයත් සිංගප්පූරුවේ රතු කුරුස සංවිධානයත් අතර ශ්‍රී ලංකාවේ සහන සහ පුනරුත්ථාපන වැඩසටහන් සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබිණ.

ii. කොළඹ දී පැවති 2 වැනි ඉන්දියානු සාගර සම්මේලනයේ සම-සභාපතිවරයෙකු වශයෙන් සහභාගී වීමට බාලක්‍රිෂ්ණන් අමාත්‍යවරයා 2017 අගෝ. 31- සැප්.01 දිනවල ශ්‍රී ලංකාවේ කළ සංචාරය.

iii. සිංගප්පූරුවේ වෙළඳ හා කර්මාන්ත අමාත්‍ය ගරු එස්. ඊශ්වරන් මහතා 2017 මැයි/ජුනි ශ්‍රී ලංකාවේ කළ සංචාරය ශ්‍රී ලංකාවේ ඉඩප්‍රස්ථා පිළිබඳ සොයා බැලීමට අමාත්‍යවරයාගේ කණ්ඩායම සමඟ සිංගප්පූරුවේ ජාත්‍යන්තර ව්‍යවසාය (IE) සහ සිංගප්පූරු ව්‍යාපාර බලමණ්ඩලය (SBF) යන ආයතන ප්‍රමුඛ සිංගප්පූරු සමාගම් 28 ක නියෝජිතයන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් ද සංචාරයට එක් විය.

iv. විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා 2017 ජනවාරි 9 දින සිංගප්පූරුවේ කළ සංචාරය.

v. සිංගප්පූරුවේ විදේශ කටයුතු පිළිබඳ දෙවෙනි නිත්‍ය ලේකම් ඇල්බර්ට් චු ආ මහතාගේ ශ්‍රී ලංකා සංචාරය - 2017 මැයි.

vi. ශ්‍රී ලංකාවේ මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා 2017 දෙසැම්බර් මස සිංගප්පූරුවේ නියැලුණු සංචාරය සඳහා දූත මණ්ඩලය අවශ්‍ය පහසුකම් සැලසීය.

vii. මහා කොමසාරිස්වරයා, 2017 ඔක්තෝබර් 30 වැනි දින සිට නොවැම්බර් 1 දක්වා දිනවලදී බෲනායි දරුස්සලාම් හි නිල සංචාරයක නියැලුණු අතර බෲනායි දරුස්සලාම් හි අග්‍රාමාත්‍ය කාර්යාලයේ අමාත්‍ය හා විදේශ කටයුතු හා වෙළෙඳ දෙවෙනි අමාත්‍ය ගරු පෙහින් ඩාටෝ ලිම් ජොක් සෙන්ග් මැතිතුමා හමුවී අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන ක්ෂේත්‍ර රැසක් පිළිබඳව සාකච්ඡා පවත්වා සහයෝගිතාව තවදුරටත් වර්ධනය කිරීම සඳහා දෙරටේ විදේශ කටයුතු අමාත්‍යාංශ අතර දේශපාලන උපදේශනය පිළිබඳ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීමට යෝජනා කළේය.

viii. ශ්‍රී ලංකාවේ රජයේ සේවය සඳහා ලද අරමුදල් වලින් වැඩි ප්‍රමාණයක් ලබා දී ඇති සිංගප්පූරුව සමඟ ශ්‍රී ලාංකික රජයේ නිලධාරීන් සඳහා පරිපූර්ණ රාජ්‍ය අංශ පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවේ මීට අදාළ ආයතන වන අග්‍රාමාත්‍ය කාර්යාලය (PMO) හා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) හා සිංගප්පූරුවේ සිවිල් සේවා කොලීජිය හා Temasek International යන සිංගප්පූරු ආයතන සමඟ මෙම දූත මණ්ඩලය කටයුතු කළේය.

**ආ. බහුපාර්ශ්වීය සබඳතා**

සිංගප්පූරුවේ පැවති IISS ආසියා ආරක්ෂක සමුළුව, ෂැංග්‍රිලා කතිකාව, ආසියානු නැව්වලට එරෙහි මුහුදු කොල්ලකෑම් සහ ආයුධ සන්නද්ධ මංපැහැරීම් මැඩලීම පිළිබඳ කලාපීය සහයෝගීතා ගිවිසුමේ රැස්වීම් (Re CAAP) සහ ආරක්ෂාවට අදාල IMDEX ආසියානු සම්මේලනය ආදී බහුපාර්ශ්වීය වශයෙන් වැදගත් සංසද කිහිපයක ශ්‍රී ලංකා නියෝජනය දූත මණ්ඩලය විසින් තහවුරු කරන ලදී.

ඈ). ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන

i. දූත මණ්ඩලය, නිදහස් වෙළඳ ගිවිසුම් සාකච්ඡා වට කිහිපයක් සඳහා පහසුකම් සැලසීය.

ii. ශ්‍රී ලංකාවේ ආයෝජන ඉඩප්‍රස්තා සහ ව්‍යාපාර හවුල්කාරිත්වය පිළිබඳ සාකච්ඡා කිරීමට ගරු අමාත්‍යවරයා සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් හමුවීමට 2017 පෙබරවාරි 22-25 ශ්‍රී ලංකාවට පැමිණි සුර්බානා ජුරොන්ග් (SJ) ප්‍රමුඛ සිංගප්පූරු නියෝජිත පිරිස දූත මණ්ඩලය විසින් සම්බන්ධීකරණය කරන ලදි. එම සංචාරයෙන් අනතුරුව සිංගප්පූරු SJ සහ ශ්‍රී ලංකා BOI අතර ඒකාබද්ධ කටයුතු ගිවිසුමට අත්සන් තැබිණ.

iii. IE හි අධ්‍යක්ෂක මණ්ඩලයට ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට අවශ්‍ය පහසුකම් දූත මණ්ඩලයේ සම්බන්ධීකරණයෙන් යුතුව සිංගප්පූරු ජාත්‍යන්තර ව්‍යවසාය (IE) විසින් සංවිධානය කරන ලදි. -2017 අප්‍රේල් 24-25

iv. මෙම මහ කොමසාරිස් කාර්යාලය, IE Singapore, සිංගප්පූරු ව්‍යාපාරික බලමණ්ඩලය හා සිංගප්පූරු ඉන්දියා වාණිජ මණ්ඩලය සමඟ එක්ව 2017 නොවැම්බර් 8-10 දිනවලදී වෙළෙඳ/ ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් තුනක් සඳහා පහසුකම් සලසන ලදී.

v. ශ්‍රී ලංකා කන්වෙන්ෂන් කාර්යාංශය විසින් සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය හා ශ්‍රී ලංකා එයාර් ලයින්ස් සමඟ එක්ව, 2017 ඔක්තෝබර් 11 වැනි දින සිංගප්පූරුවේ Orchard Hotel හිදී "MICE Promotion event" සංවිධානය කරන ලදී.

ඇ. සංස්කෘතික සබඳතා

සිංගප්පූරු ජාතික කලා මණ්ඩලයේ අනුග්‍රහය ඇතිව නර්තන කණ්ඩායමක් 2017 මාර්තු මස ශ්‍රී ලංකාවට පැමිණීමේ අවස්ථාව සඳහා පහසුකම් සැලසීම.

## 10. තායිලන්තය

### අ). ද්විපාර්ශ්වික සම්බන්ධතා

i. තායිලන්තයේ සිදුකළ සංචාර

එක්සත් ජාතීන්ගේ වෙසක් දින සැමරුමට තායිලන්තයේ රජතුමා, රැජිණ සහ අතිගරු අමාත්‍යවරයා සඳහා ආරාධනා කිරීමට හිටපු අධිකරණ හා බුද්ධශාසන අමාත්‍යවරයා කළ සංචාරය.

ii.තායිලන්ත ජාතිකයින් ශ්‍රී ලංකාවේ සිදුකළ සංචාර

iii. ආගමික කටයුතු භාරව තායිලන්ත අග්‍රාමාත්‍ය කාර්යාලයට අනුයුක්ත කොට ඇති ගරු අමාත්‍යවරයා නියෝජිත පිරිසක් සමග 2017 GM ජාත්‍යන්තර වෙසක් සැමරුමට සහභාගී විය.

iv. දෙරටේ අදාළ බලධාරීන් අතර ජූලි මැදභාගයේ දී සහල් මිලදී ගැනීම සම්බන්ධයෙන් පැවති මූලික සාකච්ඡා සංවිධානය කිරීමේ දී දූත මණ්ඩලය ඊට සහාය සැපයීය.

v. ඩෙංගු වසංගතය මැඩලීමට තායිලන්ත ආධාර අපේක්ෂාවෙන් දෙරටේ සෞඛ්‍ය අමාත්‍යවරුන් අතර පැවති සන්නිවේදනවලට පහසුකම් සැලසීම. ඒ අනුව මෙම කාරණය සඳහා තායිලන්ත විශේෂඥයින් දෙදෙනකු සතියක කාලයක් ලංකාවට එවීමේ කටයුතු සංවිධානය කෙරිණි.

vi. ශ්‍රී ලාංකික කාර්මික ශිල්ප කණ්ඩායමක් කෘතිම වර්ෂාව ඇතිකිරීමේ තාක්ෂණය පිළිබඳ පුහුණු කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් තායිලන්ත රාජකීය වර්ෂාව ඇතිකිරීමේ කාර්යංශය සමඟ සාකච්ඡා පැවැත්වෙමින් තිබේ.

vii. රාජකීය ආදාහන උත්සවයට සහභාගිවීම සඳහා ඔක්තෝබර් 26 වැනි දින ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා නිරත වූ සංචාරයට අවශ්‍ය පහසුකම් සලසන ලදී.

ආරක්ෂක සංචාර : තායිලන්තය වෙත

i. COBRA GOLD අභ්‍යාසය සඳහා නිරීක්ෂකවරුන් වශයෙන් ජේෂ්ඨ හමුදා නිළධාරීන් 2 දෙනෙකු සහභාගී විය.

ii. ආරක්ෂක සේවා බලඇණිය නියෝජනය කරමින් සාමාජිකයින් 15 දෙනෙකු සහ කාර්ය මණ්ඩල විද්‍යාලයීය නියෝජිත පිරිස.

iii. බුද්ධිමය තොරතුරු හුවමාරු සම්මේලනයට නාවික හමුදා නිලධාරියකු සහභාගී වීම.

iv. බාලි ක්‍රියාදාමයේ රැස්වීමට නාවික හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීහූ දෙදෙනෙක් සහභාගී වීම.

v. 2017 , ආරක්ෂක සමුළුව , ප්‍රදර්ශනය හා ජාලකරණ වැඩසටහන සඳහා ජ්‍යෙෂ්ඨ යුධ හමුදාහි නිලධාරියෙකුගේ සහභාගිවීම.

vi. ආසියාන් ජාත්‍යන්තර නැව් හමුදා සමාලෝචනයේ 50 වැනි සංවත්සරයට "SLMS Sayurala" හි සහභාගිත්වය.

**ආ. බහුපාර්ශ්වීය සබඳතා**

පහත සංචාර/ රැස්වීම් සඳහා පහසුකම් සලසන ලදී.

i. ශ්‍රී ලංකා කර්මාන්ත හා වාණිජ අමාත්‍යවරයා ප්‍රමුඛ නියෝජිත පිරිස 2017 ජනවාරි 13 දින ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුමේ (APTA) අමාත්‍ය මණ්ඩලය හතරවැනි සැසියට

සහභාගී වීම සහ තායිලන්ත වාණිජ අමාත්‍යවරයා ශ්‍රී ලංකාවට පාරිභෝගික භාණ්ඩ සපයන්නන්, Mitr phol සීනි සංස්ථාව සහ OTOP උපදේශකවරුන් ආදී පිරිස් සමග පැවැත්වූ රැස්වීම් සඳහා පහසුකම් සැළසීම.

ii. විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යවරයා ප්‍රමුඛ නියෝජිත පිරිස ජනවාරි මාසයේ දී බලශක්තිය පිලිබඳව පළමු කමිටු රැස්වීමට සහභාගී වීම.

iii. තිරසාර සංවර්ධනය සහ වනජීවී ගරු අමාත්‍යවරයා සහ නියෝජිත පිරිස මාර්තු මාසයේ දී තිරසාර සංවර්ධනය සඳහා ආසියා ශාන්තිකර සංසදයට (APFSD) සහභාගී වීම.

iv. ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යවරයා ද මෙම සමුළුවට සහභාගී වූ අතර තායිලන්ත ආයෝජකයින් සහ වෙළඳ මණ්ඩලයේ සාමාජිකයින් සමග රැස්වීම් පැවැත්වීම.

v. අප්‍රේල් මාසයේ දී සංවර්ධනය සඳහා මුදල් යෙදවීම පිළිබඳ හතරවැනි ඉහළ පෙළේ කතිකාව සංවිධානය කිරීම සහ මුදල් අමාත්‍යවරයා ප්‍රමුඛ සාමාජිකයින් 6 දෙනෙකුගෙන් යුතු නියෝජිත පිරිස ඊට සහභාගී වීම.

vi. UNESCAP 73 වැනි කොමිසම් සැසියට ශ්‍රී ලංකා නියෝජිත පිරිස සහභාගී වීම.(මැයි)

vii. UNESCAP රැස්වීම්වලට සහභාගි වීම සඳහා අවශ්‍ය පහසුකම් සලසන ලදී.

viii. වෙළෙඳාම හා ආයෝජනය පිළිබඳ 5 වැනි කමිටුවට ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ ගරු රාජ්‍ය අමාත්‍යවරයා සහභාගි විය.(නොවැම්බර්)

ix. RECI පිළිබඳ 2 වැනි අමාත්‍ය සමුළුවට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු ගරු නියෝජ්‍ය අමාත්‍යවරයා සහභාගි විය.

x. ආරක්ෂිත, විධිමත් හා ක්‍රමවත් සංක්‍රමණ සඳහා ගෝලීය ගිවිසුමට අදාළ ආසියා ශාන්තිකර කළාපීය පෙර සූදානම් රැස්වීම ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමක් සහභාගි විය.

**(ඇ) ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

දූත මණ්ඩල විසින් පහත සංචාර/අවස්ථා/රැස්වීම් සඳහා පහසුකම් සැලසීම/සම්බන්ධීකරණය කිරීම හෝ ඊට සහභාගිවීම සිදු කරන ලදී.

i. සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාවරයා සහ නියෝජිත පිරිස පෙබරවාරි මාසයේ තායිලන්තයේ සංචාරය කිරීම, නියෝජිත පිරිස තායිලන්ත ආර්ථික කටයුතු භාර නියෝජ්‍ය අග්‍රාමාත්‍යවරයා, අනෙකුත් අමාත්‍යවරුන් සහ පුද්ගලික තායිලන්ත ආයෝජකයින් හමුවූ අතර කර්මාන්ත පුරවල සංචාරයේද යෙදුනේය. ද්වීපාර්ශ්වික ETA කඩිනම් කිරීමටත් උපායමාර්ගික ආර්ථික හවුල්කාරිත්වයක් (SEP) අත්සන් තැබීමටත් තායිලන්තය කළ යෝජනාව පිළිගන්නා ලදී.

ii. ජුනි මස පැවති ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර වෙළඳ කාරණා පිළිබඳ අනුකමිටුවේ 2 වැනි හමුව අතරවාරයේ දී SEP සඳහා වු කෙටුම්පත තායි පාර්ශ්වය විසින් ලබා දෙන ලදී.

iii. (i) 59 වැනි බැංකොක් මැණික් හා ස්වර්ණාභරණ සල්පිල - පෙබරවාරි

(ii) තායිලන්ත කලා හා ශිල්පීය ජාත්‍යන්තර මධ්‍යස්ථානයට සහයෝගය දැක්වීම (SACICT) සල්පිල 2017 මාර්තු

(iii) Thai Fex – ආසියානු ආහාර එකතුව 2017 (මැයි/ජුනි)

(iv) 60 වැනි බැංකොක් මැණික් හා ස්වර්ණාභරණ සල්පිල - සැප්තැම්බර්

යන අවස්ථාවන්ට ශ්‍රී ලාංකික වෙළෙඳුන් , ව්‍යාපාරිකයන් සහභාගි වීම.

iv. (i) සැපයුම් සේවා (ii) ඉලෙක්ට්‍රොනික් හා විද්‍යුත් යන අංශවලට ශ්‍රී ලාංකික නියෝජිතයන් කරන ලද සංචාර සහ B2B රැස්වීම් සංවිධානය කිරීම.

v. ශ්‍රී ලංකාවේ පැවති (i) ශ්‍රී ලංකාව නම් රට (අගෝස්තු/සැප්තැම්බර්) (ii) ශ්‍රී ලංකා ආයෝජන සහ ව්‍යාපාර හමුව 2017 (මැයි/ජුනි) යන අවස්ථාවන්ට තායි නියෝජිතයින් සහභාගී කරවීම.

vi. UNCTAD හි හිටපු මහ කොමසාරිස් සහ WTO හි අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුපාචායි පනිච්පක්ඩි මහතා ශ්‍රී ලංකාව පිළබඳ සංසඳයට සහභාගී වීම සහ ප්‍රධාන දේශනය පැවැත්වීම. (සැප්තැම්බර්)

vii. තේ, කුරුඳු, මැණික්, ස්වර්ණාභරණ, අත්කම්, පාවහන්, උපාය මාර්ගික ආර්ථික හවුල්කාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා තානාපති කාර්යාලය රතු කුරුස වෙළඳ පොළට සහභාගී වීම (පෙබරවාරි) දෙරට විසින් ඉදිරිපත් කළ BIMSTEC සහ ලැයිස්තු භාවිත කිරීම සම්බන්ධයෙන් තායි යෝජනාව පිළිබඳව සහ EDB විසින් ඉදිරිපත් කළ කෙටුම්පත් ලියවිල්ල පිළිබඳව නිරීක්ෂණ දූත මණ්ඩලය විසින් ලබාදෙන ලදී.

පහත ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීම/සම්බන්ධීකරණය කරන ලදී.

i. ශ්‍රී ලංකා BOI හා Rojana Industrial Park නම් තායිලන්ත සමාගම අතර 2017 අගෝස්තු මාසයේදී අභිමථාර්ථ ලිපියක් අත්සන් තැබුණු අතර එමගින් ඇ.ඩො මිලියන 500ක ආයෝජන අවස්ථා ඇතිකරන අතර අක්කර 400ක කර්මාන්ත පුරයක් ස්ථාපනය කෙරෙනු ඇත.

ii. "One Tambon - One Product" (OTOP) ක්‍රියාත්මක කිරීමේ තාක්ෂණික සහයෝගීතාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවත් තායිලන්තයත් අතර අවබෝධතා ගිවිසුමක් (MOU) ආරම්භ වුණු අතර නිරීක්ෂණ අපේක්ෂා කරයි.

iii. ප්‍රාථමික කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන සඳහා අගය එකතු කිරීමට අදාළ තාක්ෂණික සහයෝගීතාව පිළිබඳව ශ්‍රී ලංකාවේ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය හා තායිලන්තයේ කසෙට්සාට් විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු සම්පූර්ණ කෙරිණි.

iv. ධාරිතා සංවර්ධනය, ඒකාබද්ධ වැඩමුළු සහ පුහුණු වැඩසටහන් පිළිබඳ අවබෝධතා ගිවිසුමකට ශ්‍රී ලංකාවේ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයත් තායිලන්තයේ කෘෂිකර්මාන්ත බැංකුව සහ කෘෂිකර්මාන්ත සමුපකාර අතර සැප්තැම්බර් මාසයේදී අත්සන් තැබීය.

v. ශ්‍රී ලංකාවත් තායිලන්තයත් අතර විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අභ්‍යන්තර පරිපාටීන් ශ්‍රී ලංකාව විසින් සපුරා තිබේ.

vi. තේ, කුරුඳු, මැණික් හා ස්වර්ණාභරණ, ආයුර්වේද නිෂ්පාදන, පාවහන්, බිස්කට් ප්‍රවර්ධනය, විකිණීම සඳහා ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හා ශ්‍රී ලංකා සමාගම්වල තායිලන්ත නියෝජිතයින් YWCA Diplomatic Charity Bazaar සඳහා සහභාවීම (නොවැම්බර්)

vii. විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායම්වල සංචාර සඳහා පහසුකම් සැලසීම හා B2B රැස්වීම් සංවිධානය කිරීම (නොවැම්බර්)

viii. කෘෂිකර්ම විද්‍යාඥයින් සඳහා වූ MSC හා PHD වැඩසටහන් පිළිබඳව සොයා බැලීමට අදාළ තායිලන්ත විශ්වවිද්‍යාල හා ශ්‍රී ලංකාවේ CARD නිලධාරීන් හමුවීමට අවශ්‍ය පහසුකම් සලසා සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදි. (ඔක්තෝබර්)

ix. කෘෂිකර්ම අමාත්‍යාංශ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහනක් පිළිබඳ කටයුතු අවසන් කිරීමට කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යවරයාගේ AIT සංචාරය සංවිධානය කරන ලදි.

**(ඈ) සංචාරක ප්‍රවර්ධන**

i. 20 වැනි තායිලන්ත ජාත්‍යන්තර සංචාරක සල්පිලට ශ්‍රී ලාංකික සාම්ප්‍රදායික නර්ථන කණ්ඩායමක් සමඟ පෙබරවාරි මාසයේදී SLTPB සහභාගී කරවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය.

ii. බෞද්ධ සිද්ධස්ථාන ආතව සංචාරයේ නියැලීමට 2017 පෙබරවාරි මාසයේදී භික්ෂූන් වහන්සේ, සාමනේරවරුන්, නිලධාරීන් සහ ගිහි පිරිසගෙන් යුතු 250ක කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ කළ සංචාරය සඳහා උපදෙස් හා අවශ්‍ය පහසුකම් සපයාදීම දූත මණ්ඩලය විසින් සිදු කරන ලදි.

iii. තායි සංචාරයක නියෝජිතයින්/චාරිකා මෙහෙයවන්නන් පිළිගැනීමේ උත්සවයක් සංවිධානය කිරීම.

**ඉ. සංස්කෘතික සබඳතා**

තායිලන්ත මාධ්‍යය ආවරණය සහිතව දූත මණ්ඩලය ජනවාරි මාසයේ දී Watarun රාජකීය බෞද්ධ සිද්ධස්ථානයේ දී, නැසී ගිය භූමි බොල් අඩුල්යාල් රජු සිහිකරමින් පින් පැමිණ වීමේ ත්‍රයි මාසික පුණ්‍යකර්මය සංවිධානය කළේය.

**11. කාම්බෝජය**

**අ. ද්වීපාර්ශ්වික සබඳතා**

i. එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර වෙසක් දින උළෙල සඳහා කාම්බෝජ නිලධාරීන් හට ආරාධනා කිරීමට එවකට අධිකරණ හා බුද්ධශාසන අමාත්‍යවරයා මාර්තු මස තුළ සංචාරයට අවශ්‍යය පහසුකම් සැළසීම.

ii. කාම්බෝජයට යන ශ්‍රී ලාංකිකයන් හට පනවා ඇති සීමා ඉවත් කරන ලෙසට වසර ගණනක් මුළුල්ලේ කරන ලද ඉල්ලීම් වල ප්‍රතිඵලයක් ලෙස 2017 ජුනි මස සිට කාම්බෝජ රජය විසින් ශ්‍රී ලාංකිකයන් සඳහා ඉලෙක්ට්‍රොනික් වීසා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

iii. විදේශ අමාත්‍යාංශ කාර්මික සහයෝගීතා වැඩසටහන යටතේ වාර්ෂික රාජ්‍යතාන්ත්‍රික පුහුණු වැඩසටහන 2017 සඳහා සහභාගී වූ කාම්බෝජ නියෝජිත පිරිසකට පහසුකම් සැළසීම.

**12. ලාඕස් PDR**

**(අ). ද්වීපාර්ශ්වික සබඳතා**

i. එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර වෙසක් දින සැමරුමට සහභාගී වන ලෙස ලාඕස නියෝජිතයන්ට ආරාධනා කිරීමට තානාපතිවරයා සමඟ හිටපු අධිකරණ හා බුද්ධ ශාසන අමාත්‍යවරයා නිරත එක් දින සංචාරයට පහසුකම් සැළසීම.

ii. මැයි මස එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර වෙසක් දින සැමරුමට සහභාගී වූ ලාඕස නිල නියෝජිත කණ්ඩායම සහ බෞද්ධ ආගමික නායකයන් හට සහය වීම.

iii. ශ්‍රී ලංකා - ලාඕස පාර්ලිමේන්තු මිත්‍රත්ව කණ්ඩායමේ ශ්‍රී ලාංකික සාමාජිකයන් හත් දෙනෙකුගෙන් සමන්විත නියෝජිත පිරිස ජුනි මස ලාඕසයේ නිරත සංචාරයට පහසුකම් සැළසීම.

iv. ලාඕ PDR හි ජනාධිපති කාර්යාලයේ ප්‍රධානී, හිටපු අමාත්‍ය ගරු පොන්සවන් බවුෆා මහතා ශ්‍රී ලංකාවේ පැවති දෙවැනි ඉන්දියානු සාගර සම්මේලනයට සහභාගී වීමට පැමිණි සංචාරය සම්බන්ධීකරණය කිරීම.

v. ද්වීපාර්ශ්වික දේශපාලනික උපදේශනය පිළිබඳ අවබෝධතා ගිවිසුම සහ රාජ්‍ය තාන්ත්‍රික හා නිල ගුවන් ගමන් බලපත්‍රලාභීන්ට වීසා රහිතව සංචාරය කිරීමේ

අවස්ථාව ලබාදීම පිළිබඳ ගිවිසුම යන ගිවිසුම්වලට එළඹීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.

## 13. වියට්නාමය

### (අ). ද්විපාර්ශ්වික සබඳතා - සංචාර

i. ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා අප්‍රේල් 16-18 දිනවල වියට්නාමයේ කළ සංචාරයට අවශ්‍ය කටයුතු සූදානම් කිරීම. එම සංචාරය අතරතුර අධ්‍යාපනික සහයෝගිතාව පිළිබඳ ගිවිසුමක් සහ කෘෂිකාර්මික සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබිණ.

ii. වියට්නාම සමුපකාර පද්ධතිය පිළිබඳ වැඩමුළුවකට සහභාගී වීමට මාර්තු 11-18 දිනවල සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍ය ගරු මහීපාල හේරත් මහතා කළ සංචාරයට පහසුකම් සැලසීම.

iii. එක්සත් ජාතීන්ගේ 14 වැනි වෙසක් දින සැමරුමේ ආරාධනා පත්‍රය වියට්නාමයට භාරදීම සඳහා හිටපු අධිකරණ හා බුද්ධශාසන අමාත්‍යවරයා මාර්තු 16-19 දිනවල කළ සංචාරය සංවිධානය කිරීම.

iv. ආසියා පැසිෆික් සහයෝගීතාවයේ 10 වැනි අමාත්‍ය මණ්ඩල සම්මන්ත්‍රණයට සහභාගී වීමට අප්‍රේල් 17- 20 දින වල හා නෝයි වෙත ගිය කර්මාන්ත හා වාණිජ අමාත්‍ය ගරු රිෂාද් බදියුදීන් මහතාගේ සංචාරය සංවිධානය කිරීම.

v. විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානායක මහතා ජූලි 29 - අගෝස්තු 02 දිනවල වියට්නාමයේ කළ සංචාරයට පහසුකම් සැලසීම.

vi. මහඉලුප්පල්ලම FCRDI හි, ආචාර්යය ඩබ්.එම්.ඩබ්.වීරකෝන් මහතා මාර්තු 22 - 23 දිනවල පැවති කලාපීය ආහාර සුරක්ෂිතතාව පිළිබඳ සම්මේලනයට සහභාගී වීමේ අවස්ථාව සංවිධානය කිරීම.

vii. ශ්‍රී ලංකාවේ පැවති තරුණ පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ගේ කලාපීය රැස්වීමට සහභාගී වීමට අප්‍රේල් 25-26 දිනවල පැමිණි වියට්නාම NA හි FAC වර්තමාන සාමාජික මැයෙන් යුත් ටුවාන් මහතාගේ සංචාරය සූදානම් කිරීම.

viii. ශ්‍රී ලංකාවේ පැවති 14 වැනි එක්සත් ජාතීන්ගේ වෙසක් දින සැමරුමට සහභාගී වීමට 18 දෙනෙකුගෙන් යුතු සංස්කෘතික කණ්ඩායමට සහ GCRA හි පස් සාමාජික නියෝජිත පිරිසට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම.

ix. ශ්‍රී ලංකාවේ සාමාජිකයින් 12 දෙනෙකුගෙන් යුතු නියෝජිත පිරිස අගෝස්තු 09-21 දින වියට්නාමයේ කළ අධ්‍යයන චාරිකාව සංවිධානය කිරීම.

x. වියට්නාමයේ ජාතික ආරක්ෂක ඇකඩමිය විසින් 2018 ඔක්. 30- නොවැ. 17 දිනවලදී සංවිධානය කරන ලද "4 වැනි ජාත්‍යන්තර ආරක්ෂක නිලධාරී පුහුණු පාඨමාලාව"

සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාවෙන් මේජර් ජනරාල් අජිත් කාරියකරවන මහතාගේ ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් ලුතිනන් කර්නල් නාලද සපුගස්තැන්න මහතා සහභාගි වූ අතර ඒ සඳහා පහසුකම් සලසන ලදි.

xi. 2017 අප්‍රේල් මස අත්සන් තබන ලද අධ්‍යාපනික සහයෝගිතාව පිළිබඳ ගිවිසුම යටතේ 2017/2018 අධ්‍යයන වසරේදී උපාධි අපේක්ෂක අධ්‍යයන සඳහා ශ්‍රී ලාංකික ශිෂ්‍ය ශිෂ්‍යාවන් 04 දෙනෙකුගෙන් යුතු නව කණ්ඩායමක් ඔක්තෝබර් මැද භාගයේදී හැනෝයි වෙත පැමිණියේය.

**(ආ) ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

i. ගරු අග්‍රාමාත්‍යවරයා වියට්නාමයේ කළ සංචාරය අතරතුරදී වියට්නාම සමාගම් 40කට වැඩි සංඛ්‍යාවක සහභාගීත්වයෙන් ශ්‍රී ලංකා වියට්නාම ආයෝජන සංසදය සංවිධානය කිරීමට දූත මණ්ඩලය කටයුතු කළ අතර අග්‍රාමාත්‍යතුමා ප්‍රමුඛව පිරිස වියට්නාම ඉහළ නිලධාරීන් සහ විදේශීය CEO සමඟ පැවැත්වූ හමුවීම් සංවිධානය කළේය.

ii. ලංකා කුරුඳු හා ලංකා තේ ප්‍රවර්ධන උළෙලක් ජූනි 01 දින සංවිධානය කෙරිණ.

iii. ශ්‍රී ලංකාවේ ඩග්ලස් සහ පුත්‍රයෝ පුද්ගලික සමාගමේ GT සම්මාන ප්‍රදානෝත්සවය 2017 ජූලි 22 දින රාත්‍රි පැවැත්වීමට සහාය ලබාදුනි.

iv. විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා Dinh Vu කර්මාන්ත කලාපයේ නිලධාරීන් JSC (Deepc) නිලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්වූ අතර Hung Yen ගෙතුම් හා සායම් සමාගම සහ (වියට්නාම) සමාගම නිරීක්ෂණය කළේය.- ජූලි 31

v. වියට්නාමයේ MOIT මගින් සංවිධානය කළ නියෝජිතයින් 20 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායම අගෝස්තු 10-14 දිනවල ශ්‍රී ලංකාවේ කළ සංචාරය සඳහා පහසුකම් සැලසීම.

vi. ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රෝනික / විද්‍යුත් කර්මාන්තය නියෝජනය කරමින් සැප්තැම්බර් 04 සිට 06 දින දක්වා සාමාජිකයින් 12 දෙනෙකුගෙන් යුතු SLEDB නියෝජිත කණ්ඩායම වියට්නාමයේ කළ සංචාරය SLEDB සමඟ සම්බන්ධීකරණය කිරීම.

vii. Asia Nordic Consultant හි ප්‍රධාන විධායක නිලධාරී CEO සලේ අහමඩ් මහතා සහ කණ්ඩායම, ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය පිරියතක් සහ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක් ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් ඊට අදාළ ශ්‍රී ලංකා නියෝජිතායතනය හමුවීමට සැප්තැම්බර් 13-16 දිනවල ශ්‍රී ලංකාවේ කළ සංචාරයට දූත මණ්ඩල අවශ්‍ය පහසුකම් සැලසීය.

viii. HCMC හි රෙක්ස් හෝටලයේදී "ශ්‍රී ලංකාව ඃ ඉන්දියානු සාගරයේ කේන්ද්‍රස්ථානය, ව්‍යාපාරික ඉඩ ප්‍රස්ථා බහුල ප්‍රදේශය" යන තේමාව යටතේ 2017 නොවැම්බර් 3 වෙනි දින ව්‍යාපාරික හමුවක් සංවිධානය කරන ලදී. මාධ්‍යය හා වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව

හා ශ්‍රී ලංකා වෘත්තිකයන්/ ව්‍යවසායකයන් ඇතුළුව වියට්නාමයේ ව්‍යාපාරික ප්‍රජාවේ 100 ක අධික පිරිසක් මෙම අවස්ථාවට සහභාගි වූහ.

ix. ශ්‍රී ලංකාවේ "සන්රේ" මැණික් හි අයිතිකරුවන සමන්ත වික්‍රමාරච්චි මහතා 2017 නොවැම්බර් 29- දෙසැම්බර් 05 දිනවලදී වියට්නාමයේ නියැලුණ සංචාරයට පහසුකම් සැලසීය. හැනෝයි හි මැණික් හා ස්වර්ණාභරණ ගැණුම්කරුවන් හා එතුමා අතර එනම් ව්‍යාපාරිකයන් දෙකොටස අතර රැස්වීම් සංවිධානය කරන ලදී.

x. ශ්‍රී ලංකාවේ එයිට්කෙන් ස්පෙන්ස් ට්‍රැවල් හි කළමනාකරණ අධ්‍යක්ෂ නලින් ජයසුන්දර මහතාගේ 2017 නොවැම්බර් 29- දෙසැම්බර් 01 දිනවලදී නියැලුණු සංචාරයට පහසුකම් සලසන ලදී. වියට්නාම සංචාරක නියෝජිතයන් සමඟ එනම් ව්‍යාපාරික දෙකොටස අතර රැස්වීම් ද මීට ඇතුළත් විය.

**ඇ). සංස්කෘතික සබඳතා**

i. දූත මණ්ඩලය විසින් අගෝස්තු 02-10 දිනවල වියට්නාමයේ Nhan Dan TV හි මාධ්‍ය කණ්ඩායමක් ශ්‍රී ලංකාවට එවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළේය.

ii. ඔක්තෝබර් 20 වැනි දිනට යෙදී තිබූ වියට්නාම කාන්තා දිනයට සමගාමීව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අංගයක් සංවිධානය කරන ලදී. වියට්නාමයේ විවිධ ක්ෂේත්‍රවල දක්ෂතා පෙන්වන වියට්නාම කාන්තාවෝ 50 කට අධික ප්‍රමාණයක් මීට සහභාගි වූහ.

iii. 2017 නොවැම්බර් 17 වැනි දින හැනෝයි හි "ඕල්ඩ් කුවාටර් සංස්කෘතික මධ්‍යස්ථානයේදී ශ්‍රී ලංකා සම්ප්‍රදාය තුල ඇඳුම් පැළඳුම් ප්‍රදර්ශනය කරමින් VN සංස්කෘතික උරුම දිනයේ 13 වැනි සංවත්සරයේ සමාරම්භක අවස්ථාවට සහභාගි විය.

iv. හෝයි ඇන් හි පැරණි නගරයේදී ශ්‍රී ලාංකික සම්ප්‍රදායික කලා/ චිත්‍ර හා පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීය. මෙය සංවිධානය කරන ලද්දේ ඩා හැන්ඩ හි APEC සමුළුව සමඟ එක්ව " Almanity Hoi An Wellness Resort " විසිනි - නොවැම්බර් 18-20

v. දෙසැම්බර් 05 වැනි දින තානාපතිතුමාගේ නිල නිවසේදී පැවති " Stories of career changes and choices " පිළිබඳව 16 වැනි " Women's Story telling salon " හිදී අමුත්තන් සමඟ තම වෘත්තීය ජීවිතයේ සිදුවීම් පිළිබඳව කථාබස් කිරීමට VCCI හි ප්‍රතිපත්ති පිළිබඳ උපදේශක තාඕ න් ගුයෙන් - ග්‍රිෆින්ස් මහත්මිය සමඟ සහභාගිවන ලෙස තානාපතිවරයාට ආරාධනා කරන ලදී.

vi. හැනෝයි හි " Van Phuc Diplomatic Compound" හි පැවති 5 වැනි ජාත්‍යන්තර ආහාර උළෙලට සහභාගි විය. වියට්නාමයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් සඳහා වන සේවා දෙපාර්තමේන්තුව විසින් මෙය සංවිධානය කරන ලදී.

****

# ආර්ථික කටයුතු හා

# වෙළෙඳ අංශය

## ආර්ථික කටයුතු හා වෙළෙඳ අංශය

1. ආර්ථික කටයුතු හා වෙළෙඳ අංශය වෙත ද්විපාර්ශ්වීය හා බහු පාර්ශ්වීය ආර්ථික සහයෝගිතාව සම්බන්ධයෙන් කටයුතු පැවරී ඇත. අනෙකුත් රටවල් මෙන්ම සංවිධාන සමඟ ද්විපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය සබඳතා පවත්වා ගැනීම තුළින් ශ්‍රී ලංකාවට ප්‍රතිලාභ අත්වන බව තහවුරු වන ආකාරයෙන්, වෙළෙඳ ආයෝජන, තාක්ෂණික සහයෝගීතාව, සංචාරක කර්මාන්තය, තේ ප්‍රවර්ධනය සහ සංවර්ධන අනුග්‍රහය යන ක්ෂේත්‍ර සමඟ සමීපව සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මගින් මෙහෙයවනු ලැබේ.

2. ව්‍යාපාරික/ආයෝජන කටයුතුවලට අදාළ රැස්වීම් සංවිධානය කිරීම මගින් ජාත්‍යන්තර ආර්ථික සම්බන්ධතා ඉහළ මට්ටමින් පවත්වාගෙන යාම හා සෘජු විදේශ ආයෝජන (FDI) කිරීම සඳහා පෙළඹවීම් කිරීමෙහි ලා අනෙකුත් අමාත්‍යාංශ ගන්නා උත්සාහයන්හි දී සිය සහය පළකරමින් මෙම අංශය කැපී පෙනෙන භාරයක් ඉටුකරයි.

**සමාලෝචනයට භාජනයවන කාලසීමාව තුළ දී අංශයෙන් ඉටුවන ප්‍රධාන කාර්යයන්**

3. අමාත්‍යාංශයීය ජාත්‍යන්තර ආර්ථික වැඩසටහන සඳහා පහසුකම් සැලසීමේදී මූලික වශයෙන් කටයුතු කරන ආර්ථික කටයුතු හා වෙළෙඳ අංශය විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා අදාළ රටවල් සමඟ ද්විපාර්ශවීය වෙළෙඳ සහ ආයෝජන ප්‍රවර්ධන කාර්යයන් සම්බන්ධීකරණය කරයි. වෙළෙඳ ප්‍රවර්ධනය, අයෝජනය, සංචාරක කර්මාන්තය සහ වෙනත් ආර්ථික ක්‍රියාකාරකම්වලට අදාළ ප්‍රධාන රාජ්‍ය ආයතන සමඟද මෙම අංශය කටයුතු කරයි.

4. 2017 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ ජෝර්දානය, ඉරානය, ජෝජියාව, තුර්කිය, රුසියාව, හන්ගේරියාව, චීනය, සිංගප්පූරුව සහ ජර්මනිය යන රටවලින් මෙරටට පැමිණි ඉහළ පෙලේ නියෝජිතයන් පුද්ගලයින් විසින් කරන ලද සංචාර 09ක් සඳහා මෙම අංශය පහසුකම් සලසා දී  තිබේ.

5. ඒ අතරට, බංග්ලාදේශය, රුසියාව, ස්වීඩනය, තායිලන්තය, බෙල්ජියම, කුවේටය, එක්සත් ආරාබි එමීර් රාජ්‍යය සහ පිලිපීනය යන රටවලට අප රටේ ප්‍රමුඛ පෙලේ පුද්ගලයන් විසින් කරන ලද සංචාර 08ක් ද මෙම අංශයේ මැදිහත්වීමෙන් සිදුවිය.

6. කැනඩාව, ඕමානය, නවසීලන්තය, ස්වීඩනය, තායිලන්තය, ලෙබනනය, දකුණු අප්‍රිකාව, ඕස්ට්‍රේලියාව, බ්‍රසීලය, චීනය සහ නේපාලය යන රටවලින් ව්‍යාපාර කටයුතු වෙනුවෙන් මෙරටට කළ සංචාර 11 ක් සමගම මොසැම්බික්, බෙල්ජියම, නවසීලන්තය හා තායිලන්තය යන රටවල ශ්‍රී ලංකික නියෝජිතයින් යෙදුණු ව්‍යාපාරික සංචාර 04 ක් ද මෙම අංශය මගින් සම්බන්ධීකරණය කෙරිණි.

7. සේවාවන්, ආර්ථික හා තාක්ෂණික සහයෝගිතාව සහ ආයෝජන ක්ෂේත්‍ර පිළිබඳව ETA සහ ETFAසමඟ පවත්වන ලද සාකච්ඡාවලට අමාත්‍යාංශයීය නැගෙනහිර ආසියා හා පැසිෆික් අංශයේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් සහ සහකාර නීති උපදේශකවරිය සහභාගී වූහ.

8. වෙළෙඳාම පිළිබඳ ගිවිසුම් සහ නිදහස් වෙළෙඳ කටයුතු වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් කෙරෙන කටයුතුවලදී ජාත්‍යන්තර ආර්ථික සංවිධාන සමඟ සමීපව කටයුතු කිරීමට මෙම අංශය වගබලා ගනී.

9. ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO) ට සම්බන්ධවන කටයුතුවලදී ආර්ථික කටයුතු හා වෙළඳ අංශය කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය (NIPO) සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකලේය.

බුද්ධිමය දේපළ පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවේදී විදේශ කටයුතු අමාත්‍යාංශය නියෝජනය කරනු ලබන්නේ මෙම අංශය මගිනි. මෙම ජාතික මෙහෙයුම් කමිටුව පිහිටුවීමේ අරමුණ වූයේ ජාතික බුද්ධිමය දෙපළ පනත ක්‍රමවත් කිරීමයි.

10. (WIPO) සමග ගනුදෙනු කිරීමට කරුණු 10 කින් යුතු ක්‍රියාකාරී සැළැස්මක් සකස් කරන ලදී.

“බුද්ධිමය දේපළ, සංචාරක කර්මාන්ත සහ සංස්කෘතික” යන CDIP ව්‍යාපෘතිය ක්‍රියාත්මක නියමු රටවල් හතරෙන් එකක් බවට ප්‍රථම වරට තේරී පත්වීමට ශ්‍රී ලංකාවට හැකියාව ලැබිණි. මෙම ක්‍රියාකාරී සැළැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2017 අප්‍රේල් මාසයේදී සාම්ප්‍රදායික දැනුම සහ සාම්ප්‍රදායික අදහස් ප්‍රකාශනය මැයෙන් ජාතික වැඩමුළුවක් ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට හැකියාව ලැබිණි.

(WIPO) හා (NIPO) අතර කටයුතු සම්බන්ධීකරණය කරන මෙම අංශය, පේටන්ට් බලපත්‍ර, වෙළෙඳ සන්නාම, හිමිකම්, කාර්මාන්තමය විලාසිතා සහ බලගැන්වීම්, ලිස්බන් ක්‍රමය, මැඩ්‍රිඩ් ගිවිසුමට අදාළ කාරණා ආදි වසර පුරා පැවැත්වෙන විවිධ WIPO උත්සව අවස්ථා සඳහා ශ්‍රී ලංකා නියෝජනය වෙනුවෙන් පහසුකම් සළසයි.

11. එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කොමිසමේ ආසියා හා පැසිෆික් අංශය (UNECAP) ට අදාළ ගැටළු පිළිබඳව අමාත්‍යාංශයීය වශයෙන් කටයුතු කරන ප්‍රධාන අංශය ආර්ථික කටයුතු හා වෙළෙඳ අංශයයි. වර්තමානයේ ශ්‍රී ලංකාව ආසියා හා පැසිෆික් කලාපයේ සංඛ්‍යා ලේඛණ ආයතනය (SIAP) තිරසාර කෘෂිකාර්මික යාන්ත්‍රණය පිළිබඳ මධ්‍යස්ථානය (CSAM) තිරසාර කෘෂිකර්මාන්තය තුළින් දරිද්‍රතාව තුරන් කිරීමේ මධ්‍යස්ථානය (CASPA) තාක්ෂණවේදය මාරු කිරීම සඳහා වූ ආසියා හා පැසිෆික් මධ්‍යස්ථානය (APCTT) සහ ආසියා හා පැසිෆික් ආපදා තොරතුරු කළමනාකරණය සංවර්ධනය කිරීමේ මධ්‍යස්ථානය (APDIM) වැනි ESCAP මගින් පාලනය වන ආයතන පහ (05) ක සාමාජිකත්වය දරයි.

12. UNECAP හි 73 වැනි සැසිය 2017 මැයි 15-19 දිනවල බැංකොක්හි දී පැවැත්විණි. විදුලිබල හා බලශක්ති නියෝජ්‍ය අමාත්‍ය ගරු අජිත් පී. පෙරේරා මහතා ජාතික නියෝජිත කණ්ඩායමේ නායකත්වය දැරූ අතර, සමාජ සව්බල ගැන්වීමේ හා සුභසාධන අමාත්‍ය ගරු එස්. බී දිසානායක මහතා සමාජ සංවර්ධනය පිළිබඳව ඉහත සැසියට සමගාමීව පැවති උත්සව අවස්ථාවකම මුලසුන හෙබවීය.

මෙම 73 වැනි සැසිවාරයට නියෝජිතයින් සහභාගීකරවීම සහ ජාතික ප්‍රතිපත්ති ක්‍රමවත් කිරීම ආදී කරුණුවලට අදාළව සම්බන්ධීකරණ කටයුතුවලට මෙම අංශය සිය දායකත්වය සපයා ඇත. මීට අමතරව UNECAP ආශ්‍රිත රැස්වීම්, සම්මේලන හා වැඩමුළු ආදී නොයෙක් අවස්ථාවන්හිදී ශ්‍රී ලාංකික නියෝජනය සම්බන්ධීකරණය කිරීම මෙම අංශයේ කාර්යයන් අතරට ගැනේ.

13. රටවල් 15 කණ්ඩායම (G-15) රටවල් 77 කණ්ඩායම (G-77) කණ්ඩායමට අයත් සියලුම කටයුතු මෙම අංශය මගින් සම්බන්ධීකරණය වන අතර 2010-2017 කාල සීමාවේ (G-15) හි සහභාගීත්වය ශ්‍රී ලංකාවට ලබා ගැනීම සම්බන්ධයෙන් ජිනීවා හා නිව්යෝර්ක්හි ස්ථිර දූත මණ්ඩල හා සම්බන්ධීකරණය කළේය. ආර්ථික කටයුතු හා වෙළෙඳ අංශය, කොළඹ ක්‍රියාදාමයේ කේන්ද්‍රස්ථානය වන විදේශ රැකියා අමාත්‍යාංශය හා සමග කොළඹ ක්‍රියාවලියේ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.

14. ආර්ථික කටයුතු හා වෙළෙඳ අංශය කොළඹ ක්‍රියාදාමයේ කේන්ද්‍රස්ථානය වන විදේශ රැකියා අමාත්‍යාංශය හා සමඟ කොළඹ ක්‍රියාවලියේ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.

15. ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය ආදී ඒවායේ නිලධාරීන්ට කෙටිකාලීන සංචාර සඳහා වීසා නිකුත් කිරීම සම්බන්ධීකරණය කරනු ලබන්නේ ආර්ථික කටයුතු හා වෙළෙඳ අංශය වන අතරම විවිධ රජයේ නියෝජිතායතන මගින් සංවිධානය කරන වැඩමුළු සහ සම්මන්ත්‍රණවලට නියෝජිතයින් සහභාගීකරවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය ද කරයි.

2016 සැප්තැම්බර් සිට 2017 ජනවාරි දක්වා නිකුත් කරනු ලැබූ වීසා බලපත්‍ර සංඛ්‍යාව

| **වීසා වර්ගය** | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **කෙටි කාලීන ග්‍රාටිස් වීසා** | | **කෙටි කාලීන ව්‍යාපාරික වීසා** | | **බහු ඇතුලු වීම් / දිගු කාලීන වීසා** | | **පදිංචි ස්ථානය** | |
| කාටද යන වග | වීසා බලපත්‍ර සංඛ්‍යාව | කාටද යන වග | වීසා බලපත්‍ර සංඛ්‍යාව | කාටද යන වග | වීසා බලපත්‍ර සංඛ්‍යාව | කාටද යන වග | වීසා බලපත්‍ර සංඛ්‍යාව |
| ADB/ආසියානු සංවර්ධන බැංකුව | 119 | NAIPO | 05 | EDB | 02 | ADB/ආසියානු සංවර්ධන බැංකුව | 25 |
| ලෝක බැංකුව | 400 | | | Ukrinmash | 02 | ලෝක බැංකුව | 61 |
| JICA/ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය | 91 | | | | | JICA/ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය | 114 |
| මහ බැංකුව | 05 | | | | | කොළඹ ක්‍රමය | 44 |
| වාණිජ දෙපාර්තමේන්තුව | 60 | | | | | IMF | 01 |
| වෙනත් | 409 | | | | | IFC | 04 |

16. කොළඹ ක්‍රමය යටතේ ශ්‍රී ලාංකික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට, වෘත්තීය වේදීන්ට සහ රාජ්‍ය නිලධාරීන්ට කෙටි කාලීන මෙන්ම දිගු කාලීන ශිෂ්‍යත්ව ප්‍රදානය කෙරිණ. සිංගප්පූරු කාර්මික සහයෝගිතා වැඩසටහන, මැලේසියානු තාක්ෂණික සහයෝගිතා වැඩසටහන, UNECAP, කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (KOICA) සහ ඉන්දියානු රාජ්‍ය එසේ ශිෂ්‍යත්ව ප්‍රදානය කළ ආයතන වේ.

17. කොළඹ ක්‍රමය යටතේ පවතින ගැටළු පිළිබඳව කටයුතු කිරීමද මෙම අංශය මගින් සිදු කරන අතර, කොළඹ ක්‍රමයේ 66 වන සංවත්සරය පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සලසන ලදී. කොළඹ ක්‍රමයේ 289, 291, 292 විශේෂ සැසිවාර වලට මෙම අංශය සහභාගී වූ අතර එහිදී කුලී පදනමෙන් තොර ඉඩම් කොටසක් ශ්‍රී ලංකාව විසින් කොළඹ ක්‍රමය ලේකම් කාර්යාලයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ලබාදෙන ලදී.

18. අමාත්‍යාංශයීය තාක්ෂණ සහයෝගිතා වැඩසටහන යටතේ, ආර්ථික කටයුතු සහ වෙළෙඳ අංශය බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය (BIDTI) සමඟ ඒකාබද්ධව ආසියානු හා අප්‍රිකා රටවල් 23 ක කණිෂ්ඨ රාජ්‍ය තාන්ත්‍රිකයින් පිරිසක් සඳහා 2017 සැප්තැම්බර් 17 සිට 29 දින දක්වා පුහුණු වැඩසටහනක් සංවිධානය කළේය.

19. 2017 ජනවාරි 17-20 දින දක්වා ස්විස්ටර්ලන්තයේ ඩාවෝස්හි පැවති ලෝක ආර්ථික සමුළුවේ(WEF) වාර්ෂික සැසිවාරයට නියෝජිත පිරිසක් සමඟ ශ්‍රී ලංකා ගරු අග්‍රාමාත්‍යවරයා සහභාගී විය. ලෝක ආර්ථික සමුළුවට (WEF) අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීමටත් ගරු අග්‍රාමාත්‍යවරයා එම සමුළුවේදී පවත්වන ලද හමු සඳහා සාකච්ඡා කරුණු ආදිය සකස් කිරීමටත් මෙම අංශය කටයුතු කළේය.

20. ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා 2017 සැප්තැම්බර් 21 දින නිව්යෝර්ක් නුවර පැවති 72 වැනි එක්සත් ජාතීන්ගේ මහා සභාවේ සමුළුවට සමගාමීව පැවති ආසියානු සහයෝගීතා සංවාදයේ (ACD) අමාත්‍ය මණ්ඩල හමුවට සහභාගී විය.

21. ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා අන්තර් නියෝජිතායතන කාර්ය සාධන බලකායක් ස්ථාපනය කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ, වෙළෙඳ, ආයෝජන, සංචාරක සංවර්ධන ආධාර කලාපීය හා ජාත්‍යන්තර කණ්ඩායම් සහ අනෙකුත් ජාත්‍යන්තර ආර්ථික ක්‍රියාකාරකම් ඇතුළු ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවයට අදාළ සියලුම ගැටලු ඵලදායි ලෙස එක්කොට සම්බන්ධීකරණය කිරීමට සහය පළ කරමින් අන්තර්ජාතික ආර්ථික ප්‍රයන්තයන්හි ප්‍රතිලාභ උපරිම කිරීමට හැකිවන පරිදි සියලුම ජාතික පාර්ශවකරුවන් එකම වේදිකාවක් මතට ගෙන ඒමේ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීමයි.

22. ආර්ථික රාජ්‍ය තාන්ත්‍රිකභාවය ඇති කිරීමේ දැනුම් ලබාදීමේ වේදිකාව මෙහි ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාව සහ සම්බන්ධ වෙළෙඳ ආයෝජන සහ අනෙකුත් ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකාවේ විදේශීය දූත මණ්ඩල සඳහා අවශ්‍ය තොරතුරු සපයාදීමයි.

23. මේ සම්බන්ධයෙන් ගත් කළ, දැනුම් වේදිකාව සඳහා අන්තර්ගතය සැකසීමේ කොන්ත්‍රාත්තුවේ සම්පත් දායකයා විසින් Veriti Research ට අදාළ පහත කාර්යයන් සම්පූර්ණ කරන ලදී.

Power Point ඉදිරිපත් කිරීම Voice- over පහසුකම සමඟ

i. ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම

ii. දකුණු ආසියාවේ නැගීඑන ආර්ථිකයක් වන ශ්‍රී ලංකාව

iii. ශ්‍රී ලංකාව සමඟ වෙළෙඳ කටයුතු පවත්වා ගැනීම

කරුණු පැහැදිලි කිරීමේ සටහන්

i. සාමුද්‍රික සහ සැපයුම් සේවා කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවේ වැදගත්කම

ii. ශ්‍රී ලංකාවේ වෙළෙඳ ගිවිසුම්

iii. ශ්‍රී ලංකාවේ ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති සහ ඉඩප්‍රස්ථා හා විදේශ ආයෝජන

iv. EU G S P + ශ්‍රී ලංකාව වෙත ලබාගැනීම

ප්‍රශ්න සහ පිළිතුරු සටහන්

i. ශ්‍රී ලංකාවේ වාණිජ කේන්ද්‍රස්ථානමය නියාමනයන්

ii. පාලන රෙගුලාසි හුවමාරු කිරීම

iii. ශ්‍රී ලංකාවේ ආයෝජන රෙගුලාසි

iv. ශ්‍රී ලංකාවේ වෙළෙඳ බදු සහ වෙළෙඳ නියාමනයන්

v. BREXIT සහ ශ්‍රී ලංකාවට එහි ඇති බලපෑම

24. ඉහත සඳහන් කළ ලේඛන අපගේ දූත මණ්ඩලවල, රැගෙන කියවීමට පහසුවන අයුරින් තබා ඇත.

25. Verite Research විසින් එම ඉදිරිපත් කිරීම, කරුණු දැක්වීම් සහ ප්‍රශ්න සහ පිළිතුරු සටහන් දෙවතාවක්ම යාවත්කාලීන කරන ලදී. මෙම ලේඛනවල අන්තර්ගත කරුණු පිළිබඳ දැනුවත්වීමට සහ ඒවා ඵලදායී ලෙස උපයෝගී කොට ගැනීමට තනාපති කාර්යාල දැනුවත් කරන ලදී. මෙම තොරතුරු අවබෝධ කර ගැනීම සහ ඒවා පරිහරණය කිරීම සම්බන්ධයෙන් පළමු පියවරේදී දූත මණ්ඩල සඳහා සහයෝගය දැක්වීම Verite Research විසින් සිදු කරනු ඇත.

කොන්ත්‍රාත්තුවෙන් එකඟතාවට පැමිණ ඇති පරිදි Power Point කරුණු දැක්වීමේ සහ සටහන්වල අවසන් යාවත්කාලීන කිරීම් Verite Research විසින් 2017 නොවැම්බර්

මාසයේදී සම්පූර්ණ කළ යුතුව තිබේ. (අවසන් ඉදිරිපත් කිරීම් මේ වන විට සැකසෙමින් පවතී)

## ඇ. BIMSTEC

**BIMSTEC හි 20 වැනි සංවත්සරය සඳහා සිදුකරන ලද ක්‍රියාකාරකම්**

26. අතිගරු ජනාධිපති ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා සහ BIMSTEC හි මහලේකම්වරයා විසින් නිකුත් කරන ලද පණිවිඩ 2017 ජූනි 06 වැනි දින Daily News පුවත්පතේ පිටුභාග අතිරේකයක් ලෙස පළ කෙරිණි.

27. 2017 ජූලි 22-26 දිනවල ඩකා හිදි පැවති BIMSTEC චිත්‍රපට උළෙලේදී 'මධුර චාරිකා' නම් සිංහල චිත්‍රපටිය තිරගත කෙරිණි.

28. මෙම අමාත්‍යාංශයේ ආර්ථික කටයුතු හා වෙළඳ අංශය විසින් ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයේ සහයෝගය ඇතිව බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල විද්‍යාත්මක, තාක්ෂණික හා ආර්ථික කටයුතු පිළිබඳ ආයතනයේ (BIMSTEC) අනාගත ප්‍රමුඛතා පිළිබඳ සාකච්ඡාවක් 2017 දෙසැම්බර් මස 28 වන දින පවත්වන ලදී.

**BIMSTEC හි 15 වැනි අමාත්‍ය මණ්ඩල හමුව සහ 18 වැනි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ හමුව**

29. නේපාලයේ කත්මණ්ඩු නුවර, 2017 අගෝස්තු මස 11 වැනි දින පැවති BIMSTEC 15 වන අමාත්‍ය මණ්ඩල හමුවට සහභාගී වු ශ්‍රී ලංකික නියෝජිත පිරිසේ නායකත්වය ගරු විදේශ කටයුතු රාජ්‍ය ඇමතිතුමාට හිමිවිය.එම හමුව අවසානයේ BIMSTEC සංවිධානය තවත් ශක්තිමත් කිරීමට ඵලදායී කිරීමට සහ කාර්යක්ෂම කිරීමට අවශ්‍ය කරුණු ඇතුළත් ඒකාබද්ධ ප්‍රකාශයක් නියෝජිත පිරිසේ නායකවරුන් විසින් නිකුත් කරන ලදී.

30. අතිරේක ලේකම්/ EA & T, ME & A සහ අධ්‍යක්ෂ EA & T, BIMSTEC ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ 18 වැනි හමුවට සහභාගී විය.

31. 2017 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා පැවැත්වුණු පහත සඳහන් BIMSTEC රැස්වීම්වලට සහභාගී වුණු ශ්‍රී ලාංකිකයන්ට අදාළ රේඛීය අමාත්‍යාංශ හා සම්බන්ධීකරණ කටයුතු ආර්ථික හා වෙළෙඳ කටයුතු අංශය මඟින් සිදුකරන ලදී.

    i. BIMSTEC ජාතික ආරක්ෂක ප්‍රධානීන්ගේ පළමු වාර්ෂික හමුව, 2017 මාර්තු 21 - නවදිල්ලිය.

    ii. BIMSTEC හි තුන්වන හමුව, 2017 අප්‍රේල් 22-23, බංග්ලාදේශයේ ඩකා අගනුවර

    iii. නෛතික හා නීතිය බලාත්මක කිරීමේ ගැටළු පිළිබඳ BIMSTEC අනු කණ්ඩායමේ 7 වැනි හමුව, 2017 මාර්තු 22-23 මියන්මාරයේ යැන්ගොන් නගරය.

    iv. ත්‍රස්තවාදයට මුදල් යෙදවීම මැඩලීමේ BIMSTEC අනු කාණ්ඩයේ නවවැනි රැස්වීම, 2017 අප්‍රේල් 26-27 මියන්මාරයේ යැන්ගොන් නුවර.

v. චාරිකා මෙහෙයවන්නන්ගේ BIMSTEC ජාලයේ ප්‍රථම රැස්වීම, 2017 ජූලි 07 - නවදිල්ලිය.

vi. BIMSTEC වාර්ෂික ආපදා කළමනාකරණ ව්‍යායාම පිළිබඳ පළමු හමුව සඳහා වූ පෙර සූදානම් වීමේ හමුව, 2017 අගෝස්තු 08-09 - ඉන්දියාවේ, නවදිල්ලිය

vii. BIMSTEC ආරක්ෂණ සංවාද සමුළුව ප්‍රථම සටහන 1.5 2017 සැප්තැම්බර් 22 - ඉන්දියාවේ නවදිල්ලි නුවර

viii. BIMSTEC රටවල ආපදා කළමනාකරණ ප්‍රථම වාර්ෂික ව්‍යායාමය 2017 ඔක්තෝබර් 10-13, නවදිල්ලි නුවර

ix. 2017 ඔක්තෝබර් 10 සිට 13 වන දින දක්වා කාලය තුළ නවදිල්ලියේ දී පවත්වන ලද පළමුවන බිම්ස්ටෙක් (BIMSTEC) ආපදා කළමනාකරණ අභ්‍යාසය

x. 2017 නොවැම්බර් 22-23 දිනවල තායිලන්තයේ බැංකොක් නගරයේ දී පවත්වන ලද බිම්ස්ටෙක්හි ප්‍රවාහන සම්බන්ධතා නමැති දෙවන රැස්වීම

xi. 2017 නොවැම්බර් 22-23 දිනවල බංග්ලාදේශයේ ඩකා නගරයේ දී පවත්වන ලද නිල් අර්ථිකය පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව

xii. වෙරළාසන්න රටවල නැව් කටයුතු පිළිබඳ ගිවිසුමේ කෙටුම්පත් පාඨ බිම්ස්ටෙක් සාමාජික රටවල සාකච්ඡාවට භාජනය කිරීම සඳහා 2017 නොවැම්බර් 27-28 දිනවල නවදිල්ලියේ දී පවත්වන ලද පළමුවන කාරක කණ්ඩායම් රැස්වීම

xiii. 2017 දෙසැම්බර් 12-16 දිනවල තායිලන්තයේ චෑන්රායි හිදී පවත්වන ලද ආර්ථික සහයෝගිතාව පිළිබඳ බිම්ස්ටෙක් විශේෂඥයින්ගේ කණ්ඩායමේ හයවන රැස්වීම

**පහත සඳහන් බිම්ස්ටෙක් රැස්වීම් ශ්‍රී ලංකාවේ සත්කාරකත්වය යටතේ පවත්වන ලදී.**

i. බිම්ස්ටෙක් තාක්ෂණික භුවමාරු පහසුකම් ස්ථාපනය කිරීම පිළිබඳ බිම්ස්ටෙක් විශේෂඥ කණ්ඩායමේ හතරවන රැස්වීම 2017 නොවැම්බර් 21-22 දිනවල කොළඹ දී.

ii. දිළිඳුකම තුරන් කිරීම පිළිබඳ තුන්වන බිම්ස්ටෙක් අමාත්‍ය රැස්වීම හා දිළිඳුකම තුරන් කිරීම පිළිබඳ නිලධාරීන්ගේ රැස්වීම 2017 දෙසැම්බර් 19-20.

**ශ්‍රී ලංකාව මගින් කරනු ලැබීමට නියමිත පහත සඳහන් කටයුතු ගැන බිම්ස්ටෙක් ලේකම් කාර්යාලය වෙත දැනුම් දී ඇති**

i. බිම්ස්ටෙක් ජාල අන්තර් සම්බන්ධතා ස්ථාපනය කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුමේ කෙටුම්පත නිමාවට පත්කිරීම.

බිම්ස්ටෙක් ජාල අන්තර් සම්බන්ධතා ස්ථාපනය කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සඳහා සූදානම්ව තිබෙන බව දැනුම් දී ඇත.

ii. බිම්ස්ටෙක් ජාල ගමන් මෙහෙයුම්කරුවෝ

2018 බිම්ස්ටෙක් ජාල ගමන් මෙහෙයුම්කරුවන්ගේ ඒකාබද්ධ රැස්වීම සම්බන්ධයෙන් සත්කාරක කටයුතු කිරීමට ශ්‍රී ලංකාව එකඟත්වය පළ කර ඇත.

iii. බිම්ස්ටෙක් ඒකාබද්ධ කාරක කණ්ඩායමේ අටවන රැස්වීම 2018.

බිම්ස්ටෙක් ඒකාබද්ධ කාරක කණ්ඩායමේ අටවන රැස්වීම සම්බන්ධ සත්කාරක කටයුතු කරන්නේ ශ්‍රී ලංකාවයි.

**ආ). ඉන්දියානු සාගරය ආශ්‍රිත රටවල සංවිධානය (IORA)**

32. එම සංවිධානයේ 20 වැනි සංවත්සරය සමරමින් 2017 මාර්තු 5-7 දෙදින පුරා ඉන්දුනීසියාවේ ජකර්තා හිදී ප්‍රථම (IORA) නායක සමුළුව පැවැත්වීය. එම අවස්ථාවට අතිගරු ජනාධිපති, ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා, විදේශ කටයුතු අමාත්‍යාංශ ජ්‍යේෂ්ඨ නිලධාරීහු සහභාගී වූහ.

33. (IORA) ජ්‍යේෂ්ඨ නිලධාරීන්ගේ කමිටුවේ (CSO) අර්ධ වාර්ෂික රැස්වීම ඉන්දුනීසියාවේ බාලි නුවර දී 2017 අගෝස්තු 02-03 දිනවල පැවැත්වුණු අතර ඒ සඳහා ආර්ථික කටයුතු අංශයේ ජ්‍යේෂ්ඨ නිලධාරීහු දෙදෙනෙක් සහභාගී වූහ.

34. ඉන්දුනීසියාවේ ජකර්තා හිදී (IORA) හි දෙවන අමාත්‍ය මණ්ඩල නිල ආර්ථික සම්මන්ත්‍රණය 2017 මැයි 08-10 යන දිනවල පැවැත්විණි. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ගරු රාජ්‍ය අමාත්‍යවරයා සහ ධීවර අමාත්‍යාංශය හා විදේශ කටයුතු අමාත්‍යාංශ ජ්‍යේෂ්ඨ නිලධාරීහු පිරිසක් ද ඊට සහභාගී වූහ.

35. විදේශ කටයුතු අමාත්‍යවරයා ඇතුළු එම අමාත්‍යාංශ ජ්‍යේෂ්ඨ නිලධාරීන් සහභාගී වු (IORA) හි 17 වන අමාත්‍ය මණ්ඩල හමුව සහ ඊට අදාළ රැස්වීම් 2017 ඔක්තෝබර් මස 14-18 දිනවල දකුණු අප්‍රිකාවේ ඩර්බර් හි පැවැත්විණි.

****

# යුරෝපා සංගමය, බහු පාර්ශ්වීය ගිවිසුම් හා පොදු රාජ්‍ය මණ්ඩලීය අංශය

## යුරෝපා සංගමය, බහු පාර්ශ්වීය ගිවිසුම් හා පොදු රාජ්‍ය මණ්ඩලීය අංශය

### 1. යුරෝපා සංගමය සමඟ ශ්‍රී ලංකාවේ සබඳතා

යුරෝපා සංගමය සමඟ ශ්‍රී ලංකාවේ සබඳතා ප්‍රකාරව පසුගිය මාස 12 තුළ මෙම අංශයේ ප්‍රධාන ජයග්‍රහණ ක්‍රියාකාරකම් පහත ඇතුළත් වෙයි.

(අ) යුරෝපා සංගමයේ GSP+ වෙළෙඳ පහසුකම නැවත ලබාගැනීම. 2017 වර්ෂයේදී ශ්‍රී ලංකාව හා යුරෝපා සංගමය අතර ද්විපාර්ශ්වීය සබඳතා අඛණ්ඩව වර්ධනය විය. ආර්ථික අභිලාෂයන් පිළිබඳව වැදගත් ක්ෂේත්‍ර දෙකක රජය සමඟ යුරෝපා සංගමය අඛණ්ඩව කටයුතු කරයි.

i. ශ්‍රී ලංකාවේ ධීවර අපනයන තහනම ඉවත් කිරීමෙන් පසු පසුවිපරම් කටයුතු සිදුකිරීම

ii. ශ්‍රී ලංකාවට යුරෝපා සංගමයේ GSP පහසුකම සැපයීම.

ශ්‍රී ලංකාවේ ධීවර අපනයන තහනම ඉවත් කිරීම සඳහා යුරෝපා සංගමයේ තීරණය ශ්‍රී ලංකාවේ දේශපාලන හා ආර්ථික වටිනාකම්වල වැදගත් සංවර්ධනයක් විය.

ද්විපාර්ශ්වීය සබඳතා සඳහා තවදුරටත් ප්‍රවර්තක ශක්තියක් එක් කරමින්, එම ප්‍රතිසංස්කරණ සඳහා දිරිගැන්වීමක් ලෙස, යුරෝපානු වෙළෙඳපළට බදු රහිතව නිෂ්පාදන අපනයනය කිරීම සඳහා ශ්‍රී ලංකාවට ඉඩකඩ සලසා දෙමින් ජී. එස්.පී. ප්ලස් සහනය නැවත ලබාදීම සඳහා 2017 මැයි 19 වන දින යුරෝපා සංගමය තීරණය කළේය.

2010 වර්ෂයේදී ශ්‍රී ලංකාවට අහිමි වූ වෙළෙඳ පහසුකම නැවත ලබාගැනීම සඳහා ඉතාමත් වැදගත් වූ ජී. එස්. පී. ප්ලස් වලට අදාළ ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුතිය ක්‍රියාත්මක කිරීමට අදාළ කරුණු කතාබහ කිරීමේ ක්‍රියාවලියට විදේශ කටයුතු අමාත්‍යාංශය මඟ පෙන්වීය. ජී. එස්. පී. ප්ලස් පහසුකම නැවත ලබාගැනීමත් සමඟ, 2017 මැයි 19 වෙනිදා සිට ක්‍රියාත්මක වෙන පරිදි සැලකිය යුතු අඩු තීරු බද්දක් යටතේ, යුරෝපා සංගම් වෙළෙඳපළ වෙත ශ්‍රී ලාංකික නිෂ්පාදනවලට ප්‍රවේශය සපයා දී ඇත.

ශ්‍රී ලංකාවට ජී. එස්. පී. ප්ලස් සහනය ලබාදීමෙන් ශ්‍රී ලංකාවේ අපනයන විවිධාංගීකරණය වන බවටත්, විරැකියා අනුපාතය පහත වැටෙන බවටත්, සමාජයේ සියලුම අංශ වෙත ආර්ථික ප්‍රතිලාභ ගලාගෙන යන බවටත්, කුඩා හා මධ්‍යම පරිමාණ අංශය තවදුරටත් සංවර්ධනය වන බවටත් ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරයි.

(අ) ජී. එස්. පී. ප්ලස් සහනයට අදාළ විධානයන්ට අනුකූලව කටයුතු කිරීම සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රධානත්වයෙන් මෙහෙයුම් යන්ත්‍රණයක් 2017 දී පිහිටුවන ලදී. මෙම මෙහෙයුම් යාන්ත්‍රණය ස්ථාපනය කිරීමේ ක්‍රියාවලියේදී අමාත්‍යංශයේ සහයෝගය ලබා දෙන ලද අතර ජී. එස්. පී. ප්ලස් සහනය පිළිබඳ ජාතික කේන්ද්‍රස්ථානය සංවර්ධන උපාය මාර්ග ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යංශය සමඟ

කටයුතු සමායෝජනය කරමින් මෙම ජී. එස්. පී. ප්ලස් පිළිබඳ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමෙහිලා අමාත්‍යංශයේ සහයෝගය ලබා දෙනු ලැබේ.

(ආ) 2017 ජනවාරි මාසයේදී යුරෝ මිලියන 50 ක සහනදායී ණය සඳහා ශ්‍රී ලංකා රජය සමඟ යුරෝපානු ආයෝජන බැංකුව විසින් ගිවිසුමකට එළඹීය. මෙම ණය පහසුකම මඟින් මහ කොළඹ අපජලය කළමනාකරණ ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීමට හා පුළුල් කිරීමට සහයෝගය අපේක්ෂා කරයි. ඉහළ මට්ටමේ සංචාර හා කතිකාවන් හුවමාරු කරගැනීම අත්‍යවශ්‍යය.

(ඇ) සිය සංවර්ධන සහකාර වැඩසටහන තුළ නව ස්ථම්භයක් ලෙස යුරෝපා සංගමය සඳහා ප්‍රජාතන්ත්‍රවාදය හා සංහිඳියාව ඇතුළත් කරන ලදී. රජයේ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය හා ශ්‍රී ලංකාවේ ආර්ථික දියුණුව සඳහා යුරෝපා සංගමයේ සහයෝගය පිළිබඳව මෙය වැදගත් සංඥාවකි. 2016-2020 බහු වාර්ෂික දර්ශක වැඩසටහන යටතේ යුරෝපා සංගමය විසින් වෙන්කළ යුරෝ මිලියන 210 ක මුදල 2007-2013 (යුරෝ මිලියන 110 ක්) සඳහා වෙන්කළ මුදල මෙන් දෙගුණයකි.

(ඈ) මෑත කාලීන ගංවතුර හා නායයෑම් සඳහා ශ්‍රී ලංකාව වෙත යුරෝ 300,000 (ආසන්න වශයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 55) ක් වටිනා මූල්‍ය ආධාර යුරෝපා සංගමයෙන් සපයන ලදී.

(ඉ) කලාපීය හා යුරෝපීය වෙළෙඳපළෙහි ශ්‍රී ලංකාවේ වෙළෙඳ තරඟකාරීත්වය වැඩිකර ගැනීමට උපකාරී වන යුරෝ මිලියන 8 ක (ශ්‍රී ලංකා රුපියල් බිලියන 1.3 ක්) ව්‍යාපෘතියක් යුරෝ සංගමය විසින් මෑතකදී දියත් කරන ලදී. ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය සහ එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය විසින් වසර 4 කට වැඩි කාලසීමාවක් මෙම ව්‍යාපාතිය ක්‍රියාත්මක කරනු ලබයි. එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය ක්‍රියාත්මක කිරීමේ හවුල්කරුවෙක් වුවත්, යුරෝපා සංගමය විසින් අරමුදල් සපයයි.

(ඊ) මෙම අංශය මගින් පහත සංචාර සඳහා අවශ්‍ය යෙදවුම් සැපයීම හා පහසුකම් සැලසීම.

i. ගරු අග්‍රාමාත්‍යවරයා විසින් 2016 ඔක්තෝබර් මාසයේදී බ්‍රසල්ස් නුවර නිල සංචාරයක නිරත විය. යුරෝපා සංගමයේ ඉහළ නිලධාරීන් සමඟ පැවැත්වූ සාකච්ඡා මඟින් ජී. එස්. ජී. සහනය නැවත ලබාදීම සඳහා වෙළෙඳ ආයෝජන සහ ආර්ථික සබඳතා තවදුරටත් පුළුල් කිරීම හා සමහරක් විශේෂ අවශ්‍යතා සම්බන්ධයෙන් ප්‍රගතිය කඩිනම් කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කළේය.

ii. යුරෝපා සංගමයේ ආසියා-ඕසියානු දේශපාලනික සම්බන්ධිකයන්ගේ කමිටුව විසින් 2017 ජූනි 5-9 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. මෙම කමිටුවේ සාමාජිකයින් විසින් යුරෝපා සංගමය සඳහා විශේෂ

සබඳතා සහිත රටවලට කාලීන සංචාර සිදුකරයි. ජී. එස්. පී. ප්ලස් සහනය සම්බන්ධයෙන් මෙම සංචාර විශේෂයෙන්ම වැදගත් වෙයි. මෙම කමිටුව විසින් ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්වීය. කමිටුව විසින් යුරෝපා කවුන්සියලයට හිතෛෂී වාර්තාවක් බාරදී ඇති බවට වාර්තා විය.

iii. 2017 ජනවාරි මස බ්‍රසල්ස්හි සංචාරයක නියැලුණු එවකට ගරු මුදල් අමාත්‍ය හා ගරු සංවර්ධන උපායමාර්ගික හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යවරයාගේ ආරාධනයකට අනුව යුරෝපානු ආයෝජන බැංකුවේ උප සභාපති ගරු ඇන්ඩෲ මැක් ඩොවෙල් මැතිතුමාගේ නායකත්වයෙන් යුත් ඉහළ මට්ටමේ යුරෝපානු ආයෝජන බැංකු නියෝජිත පිරිසක් විසින් 2017 මාර්තු මාසයේ ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. නියෝජිත කණ්ඩායම ගරු අග්‍රාමාත්‍යවරයා හමු වූ අතර එවකට මුදල් අමාත්‍යවරයා සමඟ පසු විපරම් සාකච්ඡාවක් පැවැත්වීය. විශේෂයෙන්ම යුරෝපා සංගමයේ ශ්‍රී ලංකාවේ ආයෝජන සංවාදයේදී යුරෝපා සංගමයේ හා ශ්‍රී ලංකාවේ හවුල්කාරිත්වය ශක්තිමත් කිරීම සඳහා එය දායක වන බැවින් යුරෝපානු ආයෝජන බැංකුවේ සංචාරය කාලෝචිත විය.

iv. ජී. එස්. පී. ප්ලස් සහනයට අදාළ ජාත්‍යන්තර සම්මුතීන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය විමසීම සඳහා 2017 සැප්තැම්බර් මාසයේදී යුරෝපානු කොමිසමේ නිරීක්ෂණ දූත පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. සංචාරය සඳහා පහසුකම් සලසමින් සහ නිරීක්ෂණ දූත පිරිස සමඟ කොටස්කරුවන්ගේ සාකච්ඡාවල නියැළෙමින් මෙම අමාත්‍යාංශය විසින් සංවර්ධන උපායමාර්ගික හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයට හා ජී. එස්. පී. ප්ලස් සහනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයට සහයෝගය ලබාදුන්හ.

v. ද්විපාර්ශ්වීය සබඳතා මෙන්ම සංවර්ධන සහයෝගීතාවය හා යුරෝපා සංගමයේ ජී. එස්. පී. ප්ලස් සහනයේ පොරොන්දු සම්බන්ධයෙන් ප්‍රගතිය විමසුම සඳහා සිය නිල දූත පිරිසේ අංගයක් ලෙස 2017 ඔක්තෝබර් 31 වැනි දින සිට යුරෝපා පාර්ලිමේන්තුවේ දකුණු ආසියානු පාර්ලිමේන්තු නියෝජිත පිරිස විසින් ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

(උ) යුරෝපා සංගමයේ ශ්‍රී ලංකා සබඳතාවයන්ට අදාළ පහත ප්‍රධාන රැස්වීම් මෙම අංශය විසින් සැළසුම් කර, සම්බන්ධීකරණය කර සහභාගී විය.

i. 2017 මාර්තු 13 සිට 17 දක්වා මානව හිමිකම් නීතියේ ආධිපත්‍ය සම්බන්ධයෙන් යුරෝපා සංගමයේ හා ශ්‍රී ලංකාවේ කෘත්‍යාධිකාරී කණ්ඩායමේ දෙවැනි රැස්වීමට ශ්‍රී ලංකා රජය විසින් සත්කාරකත්වය ලබාදෙන ලදී. බලහත්කාරයෙන් අතුරුදහන් කරවීමෙන් සියලුම පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා වූ සම්මුතිය අපරානුමත කිරීම, ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන්

සම්මුතිය අපරානුමත කිරීම, තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත සම්මත කිරීම, අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධ කාර්යාලය සම්බන්ධ නීති රීති සම්මත කිරීම හා සංහිඳියාව වැඩිදියුණු කිරීමට ගත් අනෙකුත් සංකේතාත්මක පියවර ගැනීම ඇතුළුව විවිධ ක්ෂේත්‍රයන්හී ශ්‍රී ලංකා රජය විසින් සිදුකළ ප්‍රගතිය යුරෝපා සංගමය විසින් හඳුනාගන්නා ලදී.

ii. ශ්‍රී ලංකාව හා යුරෝපා සංගමය විසින් 2017 වර්ෂයේ සිට ආයෝජන කතිකාවතක් ආරම්භ කර ඇත. ආයෝජනය ආශ්‍රිත කරුණු, නීතීන්, දිරිගැන්වීම් ආදිය පැහැදිලි කරමින් එක් අතකින් රාජ්‍ය නිලධාරීන් හා අනෙක් අතට අයෝජන මණ්ඩලය සම්බන්ධයෙන් යුරෝපා සංගමයේ නියෝජිත පිරිස හා ඉදිරි ආයෝජකයන් අතර සාකච්ඡා රාශියක් සිදුවී ඇත.

iii. 2017 ජූනි මාසයේදී, බ්‍රසල්හිදී වෙළෙඳාම හා ආර්ථික සබඳතා සහයෝගීතාවය සම්බන්ධයෙන් යුරෝපා සංගම් ශ්‍රී ලංකා කෘත්‍යාධිකාරී කණ්ඩායම පැවැත්වුණි.

**2. බහු පාර්ශ්වීය ගිවිසුම්**

(අ) 2017-2021 සඳහා මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී සැළැස්ම සම්පාදනය කිරීම සහ එහි කටයුතු අවසන් කිරීම. කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන්, රජයේ අමාත්‍යාංශ/නියෝජිතායතන, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම, සිවිල් සමාජ සංවිධාන, පොදු ජනතාව හා කොළඹ පිහිටි ප්‍රධාන ජාත්‍යන්තර සංවිධාන සම්බන්ධ වූ සවිස්තරාත්මක, බලවත් හා ශක්තිමත් ජාතික ක්‍රියාවලියක් ඔස්සේ 2017-2021 සඳහා ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැළැස්ම සම්පාදනය කිරීමේ ක්‍රියාවලියට එක්සත් ජාතීන්ගේ අංශයේ සහයෝගයෙන් මෙම අංශය මූලිකත්වය දුන්හ.

NHRAP 2017-2021 ක්‍රියාකාරී සැළැස්ම සම්පාදනය කිරීමට මගපෙන්වීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අන්තර් අමාත්‍ය කමිටුවක් පත්කරමින් ස්වෙච්ඡා, සියලුම අංශවල සහභාගීත්වයෙන් මෙම ක්‍රියාවලිය 2016 මැයි 2 වැනි දින ආරම්භ විය. ගරු නීතිපතිවරයාගේ සහභාගීත්වයෙන් යුත් පාලන කමිටුවක් හා රජයේ නියෝජිතයන් සඳහා හා සිවිල් සමාජ සංවිධාන වෙනුවෙන් සම්බන්ධීකරණ කමිටු 2 ක් හා අමාත්‍යංශ හා නියෝජිතායතනවල නිලධාරීන් හා විශේෂඥයන්ගෙන් සමන්විත කෙටුම්පත් කරන කමිටු 10 ක් මෙන්ම යෙදවුම් සම්බන්ධයෙන් කටයුතු කරන සිවිල් සමාජ නියෝජිතයන් සම්බන්ධ වන බහු තල උපදේශන යාන්ත්‍රණයක් ඔස්සේ එය පැවැත්වුණි.

ක්‍රියාකාරී සැළැස්ම සම්බන්ධයෙන් කටයුතු ආරම්භ කිරීමට පෙරාතුව, ජාතික පුවත්පත් හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළමු දැන්වීම් ඔස්සේ මහජනතාවගෙන් හා සිවිල් සමාජයෙන් මත විමසුම් හා නිරීක්ෂණ කැඳවීය. නව නිර්දේශ කෙටුම්පත් කිරීමේදී, කෙටුම්පත් කමිටු 10 මගින් සළකා බැලූ කරුණු තම කෙටුම්පතට ඇතුලත් කෙරිණි. පාලන කමිටුව විසින්

නිශ්කාෂණය කිරීමෙන් පසු, මෙම ක්‍රියාවලිය ඔස්සේ සංවර්ධනය කරගත් කෙටුම්පත 2016 නොවැම්බර් 23 දින මහනුවරදී අමාත්‍යාංශය විසින් සංවිධානය කළ මහජන කතිකාවත සඳහා විවෘත කරනු ලැබීය. ශ්‍රී ලංකාවේ අනෙකුත් කොටස්කරුවන් සමඟ විශේෂයෙන්ම මානව හිමිකම් කොමිසම සමඟ මෙය සාකච්ඡා කෙරුණි. මානව හිමිකම් සමඟ අනුකූලතාවය තහවුරු කිරීම සඳහා නිල නොලත් මට්ටමෙන් කීර්තිමත් ශාස්ත්‍රීය උගතුන් හා ක්‍රියාකාරීන් විසින් මෙම කෙටුම්පත් පරීක්ෂා කරනු ලබයි.

සමස්තයක් ලෙස, මෙම ක්‍රියාවලියේදී උපරිම සහභාගීත්වයක් ලබාගැනීමේ හා කෙටුම්පත් කළ ක්‍රියාකාරී සැළැස්ම තුළ සියලුම මත විමසුම් හා සංකල්ප ප්‍රත්‍යාවර්තනය වන බව තහවුරු කිරීමේ අරමුණින් කොළඹ හා ඉන් පිටත විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් රැස්වීම් හා සාකච්ඡා 40 ක් පමණ සංවිධානය කරන ලදී.

මෙලෙස කටයුතු අවසන් කළ ක්‍රියාකාරී සැළැස්ම 2017 ඔක්තෝබර් 3 වන දින කැබිනට් මණ්ඩලය විසින් පිළිගන්නා ලදී. අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත, අමාත්‍යාංශය විසින් කටයුතු අවසන් කළ NHRAP ක්‍රියාකාරී සැළැස්ම භාෂා 3 ටම පරිවර්තනය කිරීමට හා සැළසුම් නිර්මාණය කර මුද්‍රණය කිරීම සඳහා පහසුකම් සළසන ලදී. ගරු අග්‍රාමාත්‍යවරයා විසින් NHRAP ජාතික ක්‍රියාකාරී සැළැස්ම 2017 නොවැම්බර් 1 වන දින පාර්ලිමේන්තුවේදී දියත් කරන ලදී.

(ආ) එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ගිවිසුම් ආයතන සමඟ සම්බන්ධ වීම.

එක්සත් ජාතීන්ගේ ගිවිසුම් ආයතන යටතේ ශ්‍රී ලංකාවේ වාර්තා කිරීමේ වගකීම් සම්බන්ධයෙන් මෙම අංශය පහත කාර්යයන් ඉටුකළේය.

1. උපග්‍රන්ථ බාරදීම, ගැටළු ලැයිස්තුවට ප්‍රතිචාර දැක්වීම, පහත ගිවිසුම් ආයතන විසින් පසු විපරම් ප්‍රශ්න නැගීම

- එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව
- ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් සම්බන්ධ එක්සත් ජාතීන්ගේ කමිටුව
- කාන්තාවන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස් ලෙස සැලකීම තුරන් කිරීම සම්බන්ධ එක්සත් ජාතීන්ගේ කමිටුව
- ළමා අයිතිවාසිකම් සම්බන්ධ එක්සත් ජාතීන්ගේ කමිටුව
- වධහිංසා පැමිණවීම හා අනෙකුත් කුරිරු, අමානුෂික හෝ පහත් ලෙස සැලකීම පිටුදැකීමේ එක්සත් ජාතීන්ගේ කමිටුව
- ළමා අයිතීන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුව

**(ඇ) පහත සඳහන් ජාත්‍යන්තර මානව හිමිකම් ලේඛන යටතේ ශ්‍රී ලංකාවේ කාලීන වාර්තා විමසුමේදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම/ශ්‍රී ලංකා නියෝජනයට පහසුකම් සැළසීම.**

i. ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳව ජාත්‍යන්තර ගිවිසුම

ii. කාන්තාවන්ට එරෙහිව සියලුම ආකාරයේ වෙනස් ලෙස සැලකීම් තුරන්කිරීම සම්බන්ධ සම්මුතිය

iii. වදහිංසා පැමිණවීම හා අනෙකුත් කුරිරු, අමානුෂීය හෝ පහත් ලෙස සැළකීමට එරෙහි සම්මුතිය.

**(ඈ) එක්සත් ජාතීන්ගේ දූෂණ පිටුදැකීමේ සම්මුතිය සම්බන්ධයෙන් පසුවිපරම් සිදුකිරීම.**

දූෂණ පිටුදැකීමේ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ (ii) සහ (v) පරිච්ඡේද යටතේ ස්වයං තක්සේරුකරණ පිරික්සුම් ලැයිස්තුවේ කටයුතු අවසන් කිරීමට සහයෝගය දැක්වීම ඇතුළුව දූෂණය පිටුදැකීමේ එක්සත් ජාතීන්ගේ සම්මුතිය ආශ්‍රිත සමුළුවලදී ශ්‍රී ලංකා නියෝජනයට මෙම අංශය විසින් පහසුකම් සැළසීය. 2017 ජූනි මාසයේදී වියානා හි පැවති එක්සත් ජාතීන්ගේ දූෂණය පිටුදැකීමේ සම්මුතිය යටතේ ක්‍රියාත්මක කිරීම් විමර්ශන කණ්ඩායමට හා 2017 අගෝස්තු මාසයේදී පැවති නිවාරණය හා වත්කම් නැවත ලබාගැනීම සම්බන්ධ කෘත්‍යාධිකාරී කණ්ඩායමේ ඵලදායී සහභාගීත්වය එමගින් තහවුරු විය. දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැළැස්මේ කෙටුම්පත පිළිබඳව දළ සටහන සම්බන්ධයෙන් කොටස්කරුවන් සමඟ මෙම අංශය සාකච්ඡා ආරම්භ කළේය.

**3. පොදු රාජ්‍ය මණ්ඩලය**

(අ) ලන්ඩනයේ පිහිටි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය හරහා විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ඉදිරියේදී ලන්ඩනයේ පැවැත්වෙන CHOGM සමුළුවේ සියලුම සහභාගීත්ව කරුණු සම්බන්ධයෙන් එහි 2018 වර්ෂයේ පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක හමුවේ ප්‍රධාන විධායක නිලධාරීවරයා හා එක්සත් රජධානි කාර්යාලයේ අනෙකුත් නිලධාරීන් සමඟ එක්ව කටයුතු කිරීම.

(2018 අප්‍රේල් මාසයේදී ලන්ඩනයේදී පැවැත්වීමට නියමිත 2018 CHOGM සමුළුව සඳහා අතිගරු ජනාධිපතිවරයාගේ සහභාගීත්වය තහවුරු කර ඇත.)

(ආ) ලන්ඩනයේ පිහිටි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලයේ සහයෝගය ඇතිව, මෙම අමාත්‍යාංශය විසින් ව්‍යවස්තාව කෙටුම්පත් කිරීම සම්බන්ධයෙන් තාක්ෂණික සහයෝගය සැපයීම සඳහා පාර්ලිමේන්තු ව්‍යවස්ථා සභාව විසින් ආරාධනය කළ දකුණු අප්‍රිකාවේ කලින් සිටි නියෝජ්‍ය අගවිනිසුරු සහ විනිසුරු ඩික්ගැන්ග් මොෂිනිකිගේ සංචාරය (2017 ජූනි) ඇතුළුව අදාළ කාලසීමාව තුළ ශ්‍රී ලංකාවේ සියලුම පොදුරාජ්‍ය මණ්ඩලීය සංචාර සඳහා පහසුකම් සැළසීය.

(ඇ) පොදුරාජ්‍ය මණ්ඩලීය වෙළෙඳ අමාත්‍යවරුන්ගේ හමුව ඇතුළුව පොදුරාජ්‍ය මණ්ඩලීය රැස්වීම්වලට සහභාගීවීම සඳහා මෙම අමාත්‍යාංශය විසින්

අමාත්‍යාංශ සංචාර සඳහා පහසුකම් සළසයි. ජනවාරි මාසයේදී සිය ලන්ඩන් සංචාරයේදී කලින් සිටි විදේශ අමාත්‍යවරයා හා පොදුරාජ්‍ය මණ්ඩලයේ මහලේකම්වරයා අතර ද්විපාර්ශ්වීය සාකච්ඡාවක් සඳහා මහකොමසාරිස් කාර්යාලය විසින් කටයුතු සැළැස්වීය.

(ඈ) පොදුරාජ්‍ය මණ්ඩලීය තරුණ ක්‍රීඩා, කාන්තාවන්, නීතිය, සෞඛ්‍ය ආදිය වැනි අනෙකුත් අමාත්‍යාංශ රැස්වීම් සඳහා අමාත්‍යාංශ විසින් සම්බන්ධීකරණය කළ අතර ශ්‍රී ලංකාව ඇතුළුව පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල් අතර සහයෝගීතාවය හා උපකාරයට උපකාරී වන ප්‍රතිඵල ලබාදුන් ලේඛන සමඟ මෙම අමාත්‍යවරුන්ගේ රැස්වීම්වලදී සාකච්ඡා කළහ.

(ඉ) 2018 CHOGM සඳහා මුල්වන පොදුරාජ්‍ය මණ්ඩලය සඳහා වූ තේමාවන් හා අනෙකුත් ප්‍රමුඛතාවයන් සාකච්ඡා කළ නිව්යෝර්ක්හිදී 2017 සැප්තැම්බර් මාසයේදී පැවති පොදුරාජ්‍ය මණ්ඩලීය විදේශ කටයුතු අමාත්‍යවරුන්ගේ රැස්වීමේදී ශ්‍රී ලංකා රජය නියෝජනය කළේය.

(ඊ) පොදුරාජ්‍ය මණ්ඩලය හරහා ශ්‍රී ලංකා රජය විසින් වැඩිදියුණු කරන මූලෝපායන් අතර අභ්‍යන්තරික පොදුරාජ්‍ය මණ්ඩලීය වෙළෙඳ හා ආර්ථික රාමුව දියුණු කිරීම සයිබර් ආරක්ෂාව, නීති විරෝධි වනජීවී වෙළෙඳාම අන්තගාමී හිංසනයට එරෙහිව කටයුතු කිරීම හා නාගරීකරණය ආදිය පවතියි.

(උ) ලන්ඩනයේ පිහිටි මාර්ල්බරා හවුස් හා විදේශ හා පොදුරාජ්‍ය මණ්ඩලීය මහලේකම් කාර්යාලයේ සියලුම පොදුරාජ්‍ය මණ්ඩලීය සම්බන්ධතා සක්‍රීයව සිදුකිරීම සඳහා පොදුරාජ්‍ය මණ්ඩලීය මහලේකම් කාර්යාලය හා විදේශ කටයුතු අමාත්‍යාංශය අතර ප්‍රධාන සම්බන්ධීකරණ කාර්යාලයක් ලෙස මහකොමසාරිස් කාර්යාලයට අමාත්‍යාංශය විසින් සහයෝගය ලබා දුන්හ.

****

# මුදල් අංශය

## මුදල් අංශය -2017

### ශිර්ෂඅංක. 112 - විදේශ කටයුතු අමාත්‍යාංශය

1. අමාත්‍යාංශයේ සංවර්ධන කටයුතු පිළිබඳ කළමනාකරණය සහ මූල්‍ය සැලසුම්කරණය සඳහා සහය සේවාවන් සපයාදීමේ වගකීම මුදල් අංශය වෙත පැවරේ. එම අංශය, අමාත්‍යාංශයේ සහ විදේශීය දූත මණ්ඩල වල/ දූත කාර්යාල වල මුදල් ගනුදෙනුවලට අදාළව ගිණුම් වර්ග දෙකක් පවත්වාගෙන යන අතර ඒවා සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයට වාර්තා කළ යුතුය.

2. මුදල් අංශයේ ප්‍රධාන කාර්යයන් අතරට පහත ඒවා අන්තර්ගතවේ:-

   i. අවශ්‍ය මූල්‍යමය වගකීම් ඉටුකිරීම සඳහා අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වන විදේශ කටයුතු ලේකම්ට සහායවීම.

   ii. වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම, අයවැය සාකච්ඡා වලට සහභාගී වීම සහ ඒවා සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම.

   iii. මෙහෙයුම් කටයුතු හා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පවතින මූල්‍ය සම්පත්වලට අනුකූල වන ලෙස සහ රාජ්‍ය වගවීම තහවුරු වන අන්දමෙන් මූල්‍ය සැලසුම් සකස් කිරීම.

   iv. වියදම් පියවීම සඳහා වූ අක්මුදල්, අමාත්‍යංශයේ කටයුතු, රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල/ දූත කාර්යාල සඳහා ක්‍රමවත් පදනමෙන් වෙන් කොට වියදම් කිරීම.

   v. අමාත්‍යාංශයේ සහ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල/ දූත කාර්යාලවල සමස්ත ගෙවීම් සහ ඒවායේ වාර්තාකරණ කටයුතු මුදල් රෙගුලාසි හා අනෙකුත් ව්‍යවස්ථාමය අවශ්‍යතාවලට අනුකූලව සිදුකෙරෙන බව තහවුරු කරමින් සම්පූර්ණ මූල්‍ය වාර්තාකරණය පාලනය කිරීම.

   vi. විගණන විමසුම්, විගණන වාර්තා සහ අනෙකුත් අනාවරණ සම්බන්ධයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව සමග කටයුතු සම්බන්ධීකරණය කිරීම.

මුදල් අංශයේ අනු අංශ පහත පරිදි වේ.

i. අමාත්‍යාංශ ගෙවීම් ඒකකය

ii. අයවැය පාලන ඒකකය

iii. දූත මණ්ඩල ගිණුම් ඒකකය

112 - විදේශ කටයුතු අමාත්‍යාංශය

1) 2017 වසරේ ප්‍රතිපාදන අනුව වියදම පහත පරිදි වේ:-

අ) පුනරාවර්තන:-

| විස්තරය | 2017.12.31 දිනට මුළු ප්‍රතිපාදන<br>රු. | 2017.12.31 දිනට මුළු වියදම<br>රු. | ප්‍රතිපාදන මත වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|
| පුද්ගලික පඩිනඩි | 5,696,862,450 | 5,696,049,915 | 100 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 3,980,368,990 | 3,926,935,451 | 99 |
| **එකතුව** | **9,677,231,440** | **9,622,985,366** | **99** |

ආ) ප්‍රාග්ධනය:-

| විෂයය | විස්තරය | 2017.12.31 දිනට මුළු ප්‍රතිපාදන<br>රු. | 2017.12.31 දිනට මුළු වියදම<br>රු. | ප්‍රතිපාදන මත වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | **ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම** | | | |
| 2001 | ගොඩනැගිලි සහ ව්‍යුහයන් | 98,718,700 | 48,708,002 | 49 |
| 2002 | පිරියත, යන්ත්‍ර හා උපකරණ | 12,200,000 | 3,413,603 | 28 |
| 2003 | මෝටර් රථ | 29,000,000 | 6,995,011 | 24 |
| | **ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීම** | | | |
| 2101 | මෝටර් රථ | 82,969,000 | 78,226,45 | 94 |
| 2102 | ලී බඩු හා කාර්යාල උපකරණ | 84,898,300 | 69,856,713 | 82 |

| | | | | |
|---|---|---|---|---|
| 2103 | පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 19,683,400 | 15,763,411 | 80 |
| 2104 | ගොඩනැගිලි සහ ව්‍යුහයන් | 923,853,500 | 78,959,999 | 9 |
| 2105 | ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම් | 10,000,000 | 4,972,095 | 50 |
| 2106 | මෘදුකාංග සංවර්ධනය | 1,000,000 | 1,000,000 | 100 |
| | **ප්‍රාග්ධන හුවමාරු කිරීම්** | | | |
| 2201(01) | ජාත්‍යන්තර සම්බන්ධතා සහ උපායමාර්ගික අධ්‍යයන සඳහා ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය(LKIIßS) | 5,500,000 | 4196676 | 76 |
| 2201(02) | ජාතික සාගර කටයුතු කමිටු ලේකම් කාර්යාලය (NOAC) | 2,000,000 | | |
| | **ධාරිතා සංවර්ධනය** | | | |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණුව | 5,000,000 | 4,280,891 | 86 |
| | **වෙනත් ප්‍රාග්ධන වියදම්** | | | |
| | UNCLÐ LKAසඳහා ශ්‍රී ලංකාවේ කරුණු දැක්වීම තහවුරු කිරීමට තාක්ෂණික සහය පිළිබඳ ගිවිසුම වෙනුවෙන් නෝර්වීජියානු තානාපති කාර්යාලය | 9,820,165 | 9,820,165 | 100 |
| 1-2509 | ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය පිළිබඳ මූලික පියවර ගැනීම (EDI) | 50,000,000 | 1 | 1 |
| | **එකතුව** | **1,334,643,065** | **326,192,971** | **24** |
| **සම්පූර්ණ එකතුව (අ +ආ)** | | **11,011,874,505** | **9,949,178,337** | **90** |

**2) අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් නියමිත සීමාවන් අනුව තථ්‍ය වියදම (රු)**

| විස්තරය | උපරිම හර | අවම බැර | උපරිම හර ශේෂය |
|---|---|---|---|
| නියමිත සීමාව | 35,000,000 | 28,000,000 | 130,000,000 |
| 1120011-2017.09.30 දක්වා තත්‍ය ප්‍රමාණය | 23,226,919 | 29,115,693 | 100,100,002 |

**3) ආදායම (රු)**

**අ) අමාත්‍යාංශය (රු)**

(රු)

| විස්තරය | ආදායම් කේතය | 2017.12.31 දක්වා තත්‍ය ප්‍රමාණය |
|---|---|---|
| රජයේ ගොඩනැගිලි සහ නිවාස සඳහා කුලී | 2002-01-01 | 3,399,135 |
| වෙනත් පොලී | 2002-02-99 | 3,600,612 |
| කොන්සියුලර් ගාස්තු | 2003-02-99 | 135,700,978 |
| වෙනත් ලැබීම් | 2003-99-00 | 12,289,720 |
| සමාජ ආරක්ෂණ දායකත්වයන් - (මධ්‍යම රජය) | 2004-01-00 | 11,476,243 |
| **එකතුව** | | **166,466,694** |

**ආ) විදේශීය දූත මණ්ඩල:-(රු)**

| විස්තරය | ආදායම් කේතය | 2017.12.31දක්වා තථ්‍ය ප්‍රමාණය |
|---|---|---|
| රජයේ ගොඩනැගිලි සහ නිවාස සඳහා කුලී | 2002-01-01 | 510,983 |
| වෙනත් පොලී | 2002-02-99 | 2,115,789 |

| | | |
|---|---|---|
| ගමන් බලපත්‍ර, වීසා සහ ද්විත්ව පුරවැසිභාවය පිළිබඳ ගාස්තු | 2003-02-07 | 1,322,509,500 |
| විභාග සහ වෙනත් ගාස්තු | 2003-02-13 | 565,409 |
| කොන්සියුලර් ගාස්තු | 2003-02-99 | 318,288,951 |
| වෙනත් ලැබීම් | 2003-99-00 | 190,299,249 |
| සමාජ ආරක්ෂණ දායකත්වයන් - (මධ්‍යම රජය) | 2004-01-00 | 7,425,668 |
| සමාජ ආරක්ෂණ දායකත්වයන් - (පළාත් සභා) | 2004-02-00 | 635,813 |
| ප්‍රාග්ධන වත්කම් විකිණීම | 2006-02-00 | 9374,381 |
| **එකතුව** | | **1,854,375,299** |
| **සම්පූර්ණ එකතුව (අ +ආ)** | | **2020,841,993** |

****

# සාමාන්‍ය පාලන අංශය

## සාමාන්‍ය පාලන අංශය

### ඇ. හැඳින්වීම

1. විදේශ කටයුතු අමාත්‍යාංශයේ සාමාන්‍ය පාලන අංශය, යනු මානව සම්පත් කළමනාකරණය, පාර්ලිමේන්තු ප්‍රශ්න, අමාත්‍ය මණ්ඩලයීය සංදේශ, සැපයුම් සේවා, ගොඩනැගිලි හා උපකරණ නඩත්තු කිරීම, ප්‍රසම්පාදන, ප්‍රවාහන සේවා සැපයීම, සන්නිවේදනය පහසුකම්, හැකියා සංවර්ධන වැඩසටහන් සහ අමාත්‍යාංශයේ අනෙකුත් අන්‍යෝන්‍ය සම්බන්ධතා ඇති කටයුතුවලට අදාළ වගකීම දරන ප්‍රධාන අංශයයි.

### ආ. මානව සම්පත් කළමනාකරණය

2. මානව සම්පත් කළමනාකරණ කටයුතුවලදී (ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් හැරුණු විට) අමාත්‍යාංශයට අවශ්‍ය අනෙකුත් සියලුම තරාතිරම්වලට අයත් නිලධාරීන් ලබාගෙන ඔවුන්ගේ කුසලතා වර්ධනය කිරීමේ කටයුතු වර්ෂය තුළදී සාමාන්‍ය පාලන අංශය මගින් සිදුකරන ලදී. කාර්යාල කාර්ය සේවයේ නිලධාරීන් 51 දෙනෙකුගේ හා රියදුරන් 60 දෙනෙකුගේ දැනුම හා ආකල්ප දියුණු කිරීම අරභයා ඔවුන් පුහුණු කිරීම සඳහා සීමාන්තික පුහුණු වැඩසටහන් දෙකක් සාමාන්‍ය පාලන අංශය මගින් පැවැත්වින. කාර්ය මණ්ඩලයේ දැනට පවතින හිගය මගහරවා ගැනීමේ අරමුණින්, සංවර්ධන නිලධාරීන්ගේ සේවක සංඛ්‍යාවේ පැවති පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් කටයුතු කරන ලදී. මෙයට අමතරව, අමාත්‍යාංශයේ වැඩිවී තිබෙන වැඩ සම්භාරය ඉටු කිරීම සඳහා, අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කරන ලද නියමයන්ට අනුකූලව, අවශ්‍ය යෝග්‍යතා සපුරා ඇති පුද්ගලයින්, එනම් වත්මන් තොරතුරු විශ්ලේෂකයින් දෙදෙනෙකු, ලඝුලේඛකයින් දෙදෙනෙකු හා භාෂා පරිවර්ථකයින් හතර දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අංශය මගින් කටයුතු කර ඇත.

3. අමාත්‍යාංශය සඳහා මාධ්‍ය ඒකකයක් ස්ථාපනය කිරීමේ අවශ්‍යතාව පැන නැගී තිබූ හෙයින් ඒ සඳහා වහාම කටයුතු කරන ලදී. ඒ අනුව ප්‍රවෘත්ති නිලධාරියෙකු, ප්‍රවෘත්ති සංස්කාරක කර්තෘවරයෙකු, වීඩියෝ ශිල්පියෙකු, ඡායාරූප ශිල්පියෙකු හා සහකාර ප්‍රවෘත්ති සංස්කාරක නිලධාරියෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට සාමාන්‍ය පාලන අංශය මගින් කටයුතු කර ඇත. කොන්ත්‍රාත් පදනම මත රියදුරන් පස්දෙනෙකු බඳවා ගෙන ගරු රාජ්‍ය අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලයට අනුයුක්ත කරන ලද අතර පවත්නා කාර්ය මණ්ඩල හිගය මගහරවා ගැනීම සඳහා කාර්යාල සේවක සේවයේ පුරප්පාඩු පහක් සම්පූර්ණ කරන ලදී.

### ඇ. සැපයුම් සේවා සහ වෙනත් සේවා

4. නම් කරන ලද විදේශ තානාපතිවරුන් සහ මහා කොමසාරිස්වරුන්ගේ අක්ත පත්‍ර ප්‍රධානය කිරීමේ උත්සව සඳහා ප්‍රවාහන පහසුකම් සහ ඊට අදාළ සැපයුම් සේවා සම්පාදනය කිරීම මෙන්ම අතිශය වැදගත් පුද්ගලයින්ගේ රාජ්‍ය සංචාර සහ විදේශීය නියෝජිත කණ්ඩායම් සඳහා පහසුකම් සැලසීම සාමාන්‍ය පාලන අංශය මගින් සිදුකර ඇත. 2017 වර්ෂය තුළදී රාජ්‍ය සංචාර 30ක්, අක්ත පත්‍ර ප්‍රදානය කිරීමේ උත්සව 20ක්

හා ශ්‍රී ලංකාවේ පැවති වෙනත් වැදගත් උත්සව අවස්ථා සඳහා සාමාන්‍ය පාලන අංශය මගින් පහසුකම් සලසා දෙන ලදී.

**ඈ. තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය**

5. 2017 වසරේ දී තොරතුරු තාක්ෂණ සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් සාමාන්‍ය පාලන අංශය මගින් දියත් කරන ලදී. අමාත්‍යාංශයේ උසස් නිලධාරීන් හා විදේශ දූත මණ්ඩල දූත කාර්යාල අතර සන්නිවේදන කටයුතු සුරක්ෂිතව කිරීම සඳහා සන්නිවේදන වේදිකාවක් ස්ථාපනය කිරීමට සැලසුම් කර ඇත. එකී ව්‍යාපෘතියට ටැබ්ලට් පරිගණකයක්, ජංගම ක්‍රමයේ කළමනාකරණ මෘදුකාංග සහ සුරක්ෂිත සන්නිවේදන වේදිකාවක් අයත් ය. තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන නියෝජිතායතනයේ (ICTA) සහයෝගය ඇතිව මෙම ව්‍යාපෘතිය 2017 නොවැම්බර් අවසානය වන විට නිම කරනු ලැබීමට නියමිතය. අමාත්‍යාංශය තුළ අලුතෙන් ස්ථාපනය කරන ලද ලෝකල් ඒරියා නෙට්වර්ක් (LAN) හි කාර්යයන් උපරිම කාර්යක්ෂම තත්ත්වයට ගෙන ඒම සඳහා නවතම තාර්කික ජාලයක් (Logical Network) උපයෝගී කර ගන්නා ලදී. ඒ අනුව අමාත්‍යාංශයේ අන්තර්ජාලය භාවිතා කරන්නන්හට එහි මන්දගාමී බව අවම කරමින් 20 Mbps සීග්‍රතාවකින් යුතු අන්තර්ජාල සබඳතාවක් අමාත්‍යාංශ ජාලය තුළ ක්‍රියාත්මක වේ. මේ අතර සයිබර් ප්‍රහාර අවම කිරීම සඳහා අමාත්‍යාංශයීය ඉලෙක්ට්‍රොනික තැපැල් සේවයේ ආරක්ෂාව තර කිරීම සාමාන්‍ය පාලන අංශය මගින් අමතර පියවරක් ගෙන ඇත.

   තව ද අමාත්‍යාංශයේ වාහන ධාවනයේ තත්ත්වය දැනගැනීම අරභයා වාහන මග සෙවීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කෙරෙමින් පවතී. මේ අතර සයිෆර් අංශයේ කටයුතු ස්වයංක්‍රීය කිරීම සඳහා උසස් මට්ටමින් ක්‍රියාත්මක වන පරිලෝකන යන්ත්‍ර මිලට ගෙන ඇත.

6. මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව හයිබ්‍රිඩ් මෝටර් රථ දහයක් මිලට ගැනීමට සාමාන්‍ය පාලන අංශයට හැකි විය. මෙම වාහන දැනට අමාත්‍යාංශයේ වාහන සංචිතයට එකතු කර ඇත. මෙයට අමතරව ගරු විදේශ කටයුතු අමාත්‍යවරයාගේ පරිවාර වාහනයක් වශයෙන් පාවිච්චි කිරීම සඳහා ඩබල් කැබ් වාහනයක් මිලට ගෙන තිබේ.

7. 2017 ජනවාරි මාසයේ දී ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලයක් යාපනයේ විවෘත කිරීමට සාමාන්‍ය පාලන අංශය පහසුකම් සැලසීය. යාපනයේ ප්‍රාදේශීය කොන්සියුලර් කාර්යාලයේ කාර්ය මණ්ඩලය ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ එක් නිලධාරියෙකු, සංවර්ධන නිලධාරීන් තිදෙනෙකු සහ රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගැනීමට සාමාන්‍ය පාලන අංශය මගින් කටයුතු කරන ලදී. කොන්සියුලර් අංශය 2017 පෙබරවාරි මාසයේ දී නවීන කාර්යාල පරිසරයකින් යුත් සෙලින්කෝ මන්දිරයේ ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහාත් අවශ්‍ය යටිතල පහසුකම් සහ ප්‍රමාණවත් මානව සම්පත් ලබාදීම සඳහාත් සාමාන්‍ය පාලන අංශය මගින් කටයුතු කරන ලදී.

## ඉ. නඩත්තු වැඩ

8. අවශ්‍ය ඉඩකඩ පහසුකම් නොමැතිවීම හා ජනරජ ගොඩනැගිල්ල ව්‍යාප්ත කළ නොහැකිවීම නිසා විදේශ කටයුතු අමාත්‍යාංශය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ජාවත්තෙන් ඉඩම් කැබැල්ලක් මිලදී ගැනීමෙහි ලා අවශ්‍ය කටයුතු කරන ලදී. තව ද ජනරජ ගොඩනැගිල්ලට යාබදව පිහිටි අංක 11 දරන ගොඩනැගිල්ල විදේශ කටයුතු අමාත්‍යාංශය සඳහා ලබාගෙන අමාත්‍යාංශයේ අංශ කීපයක් එම ගොඩනැගිල්ලෙහි පවත්වාගෙන යාම සඳහා සාමාන්‍ය පාලන අංශය මගින් කටයුතු කරන ලදී. එම ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ කටයුතු දැනට කෙරෙමින් පවතී.

9. අමාත්‍යාංශයීය නඩත්තු කටයුතු ආරම්භ කරමින් ජනරජ ගොඩනැගිල්ලේ පැරණි දැව තට්ටු ඉවත් කිරීමේ කටයුතු සාමාන්‍ය පාලන අංශය මගින් සම්පූර්ණ කර ඇති අතර නවීන පහසුකම්වලින් යුත් ජාල කුටියක් ඉදිකිරීමට හා අමාත්‍ය කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගෙන ඇති අතර භෝජනාගාර සේවාවන් ලබාගන්නා කාර්ය මණ්ඩලය සඳහා පහසුකම් සලසමින් අමාත්‍යාංශයීය සුභසාධක සංගමයේ ඉල්ලීම පරිදි භෝජනාගාරය පිළිසකර කිරීමේ කටයුතු නිම කොට ඇත. තව ද නාවික හමුදාවේ සහයෝගය ඇතිව කොළඹ පිහිටි පලස්තීන තානාපති කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර ඇත.

## ඊ. පාර්ලිමේන්තු සහ අමාත්‍ය මණ්ඩල කටයුතු

10. අමාත්‍ය මණ්ඩල හා පාර්ලිමේන්තු කටයුතුවලදී සාමාන්‍ය පාලන අංශය මගින් අමාත්‍ය මණ්ඩල සංදේශ 63ක් ඉදිරිපත් කරනු ලැබ ඇති අතර පාර්ලිමේන්තු ප්‍රශ්න 5කට පිළිතුරු සපයා ඇත.

****

# නීති අංශය

## නීති අංශය

### (අ) නීති අංශයේ ක්‍රියාකාරකම්වල ප්‍රධාන විෂයයන් පිළිබඳව සාමාන්‍ය විස්තරයක්

1. විදේශ කටයුතු අමාත්‍යාංශයේ නීති අංශය 1967 වර්ෂයේදී පිහිටුවන ලදී. අමාත්‍යාංශයේ ලේකම්වරයා හරහා අමාත්‍යවරයා වෙත විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනෙකුත් අංශ වෙත, ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩල වෙත, ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ දූත මණ්ඩල වෙත, මෙන්ම අනෙකුත් අමාත්‍යාංශ වෙත ජාත්‍යන්තර නීතිය පිළිබඳව කරුණු සම්බන්ධයෙන් නෛතික උපදෙස් සැපයීම නීති අංශයේ කාර්යයකි. නීති අංශය ශ්‍රී ලංකා රජයේ ගිවිසුම් සුරක්ෂිතාගාරයක් ලෙස කටයුතු කරයි.

### (ආ) මෙම අංශය විසින් උපදෙස් ලබාදෙන ප්‍රධාන විෂයන් ක්ෂේත්‍ර

2. සියලුම ප්‍රතිපත්ති තීරණවල නෛතික ස්වරූපයන් සම්බන්ධයෙන් නීති අංශය මගින් උපදෙස් ලබාදෙන අතර විශේෂයෙන්ම දේශ භූමි අයිතීන් හා සීමා මායිම්, ගිවිසුම් සබඳතා හඳුනාගැනීම, රාජතාන්ත්‍රික මුක්තීන් හා වරප්‍රසාද ආදිය වැනි කාලයෙන් කාලයට පැන නඟින ජාත්‍යන්තර ගැටළු සම්බන්ධයෙන් කටයුතු කරයි.
3. නැව් කටයුතු, සිවිල් ගුවන් සේවා, ජාත්‍යන්තර වෙළෙඳාම, ආයෝජනය, සංචාර හා විගමනය ආදී පුළුල් පරාසයක විෂයන් ආවරණය කරමින් විදේශ ගණුදෙනුවල නියැලෙන අනෙකුත් සෑම අමාත්‍යාංශ වලට හා දෙපාර්තමේන්තුවලට ජාත්‍යන්තර නීතිය පිළිබඳව කරුණු සම්බන්ධයෙන් නීති අංශය විසින් උපදෙස් ලබා දෙනු ලැබේ. තවද, සාකච්ඡා පැවැත්වීම, කැඳවීම හා විදේශයන්හි සිටින්නවුන් සිය රටට ගෙන්වා ගැනීම, අපරාධ සිවිල් හා වාණිජ කටයුතු යන අන්‍යොන්‍ය නීති ආධාර ලබාදීම, ද්වි බදු ගණනය කිරීම, වළක්වාගැනිම, ආයෝජනය, ආරක්ෂණය හා ප්‍රවර්ධනය, සිරකරුවන් හුවමාරු කරගැනීම, නැවත ඇතුළත් කරගැනීම, සංක්‍රමණය, කම්කරු හා මිනිස් බලය හා මුහුදු නීතිය ආදිය සම්බන්ධයෙන් ද මෙම අංශය කටයුතු කරයි.
4. ශ්‍රී ලංකාවේ විදේශ සේවය හා අදාළ අමාත්‍යාංශයේ උපදෙස් මාලාව අර්ථකථනය කිරීම, ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල විසින් එළඹි ගිවිසුම් හා එකඟතාවන්, අපගේ දූත මණ්ඩල විසින් දේශීය කම්කරුවන් බඳවා ගැනීම, රජ්‍යතාන්ත්‍රික හා කොන්සියුලර් වරප්‍රසාද හා ශ්‍රී ලංකාවේ විදේශ රටවල දූත මණ්ඩල වල මුක්තීන් මෙන්ම ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ රටවල දූත මණ්ඩල ආශ්‍රිත ගැටළු ආදිය මෙම අංශය විසින් සාකච්ඡාවට ගැනෙන විෂයන් කිහිපයකි.
5. විදේශ කටයුතු අමාත්‍යාංශයේ සෑම ද්විපාර්ශ්වීය රැස්වීමකදීම නීති අංශය මගින් වැදගත් හා සක්‍රීය භූමිකාවක් ඉටුකරන අතර ආයෝජන ප්‍රවර්ධන හා ආරක්ෂණය, ද්විත්ව බදුකරණය, ගුවන් සේවා, නැවත ප්‍රවේශ වීම හා වීසා නිදහස් කිරීම වැනි විෂයන් සම්බන්ධයෙන් ද්විපාර්ශ්වික සාකච්ඡා වලට මූලිකත්වය දෙනු ලැබේ.

**( ඇ) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා ප්‍රකාශයට පත් කිරීම**

6. සමූල විනාශකාරී අවි ව්‍යාප්තවීම හා ප්‍රජාතාන්ත්‍රික උතුරු කොරියානු සමූහාණ්ඩු ජනරජය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ VII වන පරිච්ඡේදය යටතේ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය විසින් පිළිගන්නා ලද විසඳුම් යෝජනාවලිය ප්‍රකාශයට පත්කිරීම සඳහා 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වන වගන්තිය යටතේ පහත සඳහන් රෙගුලාසි ශ්‍රී ලංකාව විසින් ප්‍රකාශයට පත්කරන ලද අතර 2017 ඔක්තෝබර් 17 වන දින ගැසට් පත්‍රිකාව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.
7. 2017 ඔක්තෝබර් 6 වැනි දිනැති අංක 2039/31 දරන අතිවිශේෂ ගැසට් පත්‍රිකාවේ ප්‍රකාශයට පත් කළ න්‍යෂ්ටික රසායනික හෝ ජීව විද්‍යාත්මක අවි ව්‍යාප්ත වීමට අදාළ සම්බාධක සම්බන්ධයෙන් වූ 2017 රෙගුලාසි මගින් සමූල විනාශකාරී අවි ව්‍යාප්තිය මැඩලීම සඳහා එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා විසඳුම්වලිය.
8. 2017 ඔක්තෝම්බර් 6 වැනි දිනැති අංක 2039/32 දරන අතිවිශේෂ ගැසට් පත්‍රිකාවේ ප්‍රකාශයට පත් කළ උතුරු කොරියානු ප්‍රජාතාන්ත්‍රික සමූහාණ්ඩු ජනරජයට අදාළ සම්බාධක සම්බන්ධයෙන් රෙගුලාසි 2017 මගින් උතුරු කොරියානු ප්‍රජාතාන්ත්‍රික සමූහාණ්ඩු ජනරජය සම්බන්ධයෙන් වූ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාවලිය.

**( ඈ ) ගුවන් සේවාවන්**

9. දැනට පවතින ගුවන් සේවා ආධිපත්‍යය සංශෝධනය කිරීම සඳහා කොරියානු ජනරජය, ඇමරිකා එක්සත් ජනපදය, භූතානය, කැනඩාව, කටාර්, එක්සත් අරාබි එමීර් රාජ්‍යය ආදි රටවල් සමඟ සාකච්ඡා කරගෙන යාම.
10. දැනට පවතින ගුවන් සේවා ආධිපත්‍ය සංශෝනය කිරීම සඳහා දකුණු කොරියාව, භූතානය, කැනඩාව, කටාර් රාජ්‍යය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය ආදී රටවල් සමඟ සාකච්ඡා කරගෙන යනු ලැබේ.
11. 2017 දෙසැම්බර් මාසයේදී කොළඹදී පවත්වන ලද ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ රැස්විම අතරවාරයේදී ජැමෙයිකාව, එක්සත් ජනපදය,මුරුසිය,රුවන්ඩා සහ බ්‍රසීලය යන රටවල් සමඟ ගුවන් සේවා ගිවිසුම් ඇති කරගෙන අත්සන් කරන ලදී.
12. තායිලන්තය, බහමාස්, කටාර්, සිම්බාවේ, චිලි, ඇෆ්ගනිස්ථානය, ඩොමිනිකන් ජනරජය, හෙලන්නික් ජනරජය සහ ඉතාලිය සමඟ ගුවන් සේවා ගිවිසුම් කතිකා කරගෙන 2017 ජාත්‍යන්තර සිවිල්ගුවන් සේවා සංවිධානයේ රැස්වීමේදී සමාරම්භය කරන ලදී.
13. ඉන්දියාව, රුසියානු සමූහාණ්ඩුව, ඕමානය, කසකස්ථානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, දකුණු අප්‍රිකාව, එක්සත් රාජධානිය සහ චෙක් සමූහාණ්ඩුව සමඟ ගුවන් සේවා ක්ෂේත්‍රයේ අවබෝධතා ගිවිසුම් ගණනාවක් පිළිබඳ එකඟත්වයට එළඹ අත්සන් කරන ලදී.

**(ඉ) ආයෝජන ප්‍රවර්ධනය**

14. ශ්‍රී ලංකාව හා එක්සත් අරාබි එමීර් රාජ්‍ය අතර ආයෝජන ප්‍රවර්ධන ගිවිසුම පිළිබඳව පළමු වටයේ සාකච්ඡා, 2017 පෙබරවාරි වලදී කොළඹදී පැවැත්වුණි.

15. ශ්‍රී ලංකාව හා ඕමානය අතර ආයෝජන ප්‍රවර්ධන ගිවිසුම පිළිබඳව දෙවන වටයේ සාකච්ඡා 2017 මැයි මාසයේදී කොළඹ දී පැවැත්වුණි. ආයෝජන ආරක්ෂණ ගිවිසුම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව හා බෙලාරුසය අතර පවතින ගැටළු ලිපි හුවමරුව ඔස්සේ සාකච්ඡා කරමින් පවතියි.

16. නිදහස් වෙළෙඳ ගිවිසුම් යටතේ ඉන්දියාව, සිංගප්පූරුව හා චීනය සමග ආයෝජන කාල පරිච්ජේදය අවසන් කිරීම හා සාකච්ඡා සඳහා සහාය දැක්වීම.

**(ඊ) බුද්ධිමය දේපළ**

17. බුද්ධිමය දේපළ සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තිය කෙටුම්පත් කරමින් පවතින අතර, මේ සම්බන්ධයෙන් නීති අංශය සහය දක්වයි.

18. තවද, සාම්ප්‍රදායික දැනුම පිළිබඳව කෙටුම්පතට එළඹීමේ රැස්වීම් මෙම වසරේදී ශ්‍රී ලංකාවේදී පැවැත්වුණි. තවද සංචාරක කර්මාන්තයේ බුද්ධිමය දේපළ සම්බන්ධයෙන් කරගෙන යනු ලබන වැඩ කටයුත්ත සඳහා නීති අංශයෙන් ද සහයෝගය ලැබෙයි.

**(උ) නැවත ප්‍රවේශවීම**

19. යුරෝපා කොමිසම බලාත්මක කරන සන්ධානය හා ශ්‍රී ලංකාවේ නැවත ප්‍රවේශ වීමේ ගිවිසුම ඔක්තෝබර් මාසයේදී මෝල්ටාව සමඟ අත්සන් කළ අතර පෝලන්තය හා රොමේනියාව සහ නෙදර්ලන්තය සමග සන්ධානය අත්සන් කිරීම සඳහා කටයුතු සම්පාදනය කරන ලදී.

20. යුක්රේනය හා රුසියාව සමඟ කෙටුම්පත් ගිවිසුම් පිළිබඳ නිගමනයට එළඹීම සඳහා කතිකා කර ගන්නා ලදී.

**(ඌ) නැවත ප්‍රවේශ වීම පිළිබඳව ජාතික සම්බන්ධීකරණ කමිටුව**

21. අත්සන් කිරීමට නියමිත නැවත ප්‍රවේශ වීමේ ගිවිසුම් සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ සන්ධාන පිළිබඳව නිරීක්ෂණ කටයුතු අවසන් කිරීම හා නැවත ප්‍රවේශ වීම සම්බන්ධයෙන් අනෙකුත් කරුණු සළකා බැලීම සඳහා නැවත ප්‍රවේශ වීම පිළිබඳව ජාතික සම්බන්ධීකරණ කමිටුවේ රැස්වීම් කැඳවීමේ කටයුතු මෙම අංශය මගින් කරගෙන යනු ලැබේ.

**(එ) සමුද්‍රීය/මුහුදු නීතිය. ශ්‍රී ලංකාවේ මහද්වීපික තටකය පිළිබඳව සැළකර සිටීම.**

22. මහද්විපික තටාකයන්ගේ සීමාවන් සම්බන්ධ කොමිසම මඟින් ලංකාව මගින් ඉදිරිපත් කරන ලද කරුණු සළකා බැලීම සඳහා උප කමිටුවක් පිහිටුවා ඇති අතර ඉදිරිපත් කර ඇති කරුණු සනාථ කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

23. උප කමිටුව සමඟ රැස්වීම් පිළිවෙලින් 2017 පෙබරවාරි හා අගෝස්තු මාසයන්හදී නිව්යෝර්ක් හිදී පවත්වන ලදී. විදේශ කටයුතු අමාත්‍යාංශයේ නීති අංශය යටතේ පවතින ජාතික සාගර කටයුතු කමිටුව විසින් පවතින ගැටළු අවසන් කිරීම සඳහා නීති අංශය සමඟ කටයුතු කරමින් සිටී.

**(ඌ) සංක්‍රමණය**

24. 2016 දෙසැම්බර් හිදී දෙරට අතර අත්සන් කරන ලද ද්විපාර්ශ්වීය සංක්‍රමණ සහයෝගිතා ගිවිසුම පරිදි ශ්‍රී ලංකාව හා ස්විස්ටර්ලන්තය අතර පළමු වටයේ විශේෂඥ සාකච්ඡා 2017 අප්‍රේල් මාසයේදී කොළඹදී පැවැත්විණි. දෙවන වටයේ විශේෂ සාකච්ඡා 2017 ඔක්තෝබර් මස 25 වැනි දින පැවත්වන ලදී.

25. ජාත්‍යන්තර සම්මත වලට අනුකූල වන පරිදි ආගමන හා විගමන පනත සංශෝධනය කිරීම සඳහා පවත්වන ලද සාකච්ඡා වලට නීති අංශයේ සහභාගිත්වය ලබා දෙන ලදී. නිති විරෝධී බඩු ජාවාරම පිළිබඳ මූලපත්‍ර අපරානුමත කිරීම සඳහා නව නීති වලට අලුත් ජේදයක් එකතු කරන ලදී.

**(ඔ) අධිකරණ සහයෝගීතාවය, අපරාධ කරුණු පිළිබඳව අන්‍යෝන්‍ය නීතිමය ආධාර, දඬුවම් නියම වූ පුද්ගලයන් මාරු කර ගැනීම සහ උද්ර්පනය.**

26. දඬුවම් නියම වූ පුද්ගලයන් හුවමාරු කර ගැනීම සම්බන්ධ ගිවිසුමකට එළඹීම සඳහා ශ්‍රී ලංකාව හා තායිලන්තය අතර සාකච්ඡා 2017 සැප්තැම්බර් මාසයේදී කොළඹ දී පැවැත්විණි.

27. අපරාධ කරුණු පිළිබඳව අන්‍යෝන්‍ය වශයෙන් නීති ආධාර ලබාදීම සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුමකට එළැඹීම සඳහා ශ්‍රී ලංකාව හා ස්විස්ටර්ලන්තය අතර සාකච්ඡා 2017 පෙබරවාරි මාසයේදී බර්න් හිදී පවත්වන ලදී. අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සඳහා කටයුතු නිමකර ඇත.

**(ඕ) අන්‍යෝන්‍ය නිතමය ආධාර**

**i. චීනය සමඟ අන්‍යෝන්‍ය නීතිමය ආධාර ලබාදීමේ ගිවිසුම**

28. අපරානුමත කිරීමේ ලේඛන 2017 සැප්තැම්බර් 29 වන දින බීජිංහිදී හුවමාරු කරගන්නා ලදී.

**ii. යුක්රේකනය සමඟ අන්‍යෝන්‍ය නීති ආධාර ලබාදීමේ ගිවිසුම**

29. ශ්‍රී ලංකාව හා යුක්රේනය අතර අන්‍යෝන්‍ය නීති ආධාර හා සන්ධාන ගිවිසුම් ආධාර යන ද්විත්වය අපරානුමත කිරීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර නීති පිළිවෙත් ශ්‍රී ලංකාව විසින් සම්පූර්ණ කර ඇති අතර යුක්රේනයේ බලධාරීන්ට ඒ බව දන්වා යවන ලදී.

**(ක) උද්දර්පණ ගිවිසුම**

iii. රුසියාව සමඟ උද්දර්පණ ගිවිසුම

30. දෙපාර්ශ්වය විසින්ම මෙම ගිවිසුම අපරානුමත කිරීම සඳහා අදාළ ආයතනික පිළිවෙත් සම්පූර්ණ කර ඇත. මෙම ගිවිසුම 2017 නොවැම්බර් 6 වන දින සිට බලාත්මක වීමට නියමිතය.

31. චීනය, යුක්රේනය හා වියට්නාමය යන රටවල සිටින අපරාධ කරුවන් මෙරටට ගෙන්වා ගැනීමේ ගිවිසුම් අපරානුමත කිරීම සඳහා අවශ්‍ය ආයතනික පිළිවෙත් සම්පූර්ණ කර ඇති අතර චීනය, යුක්රේනය හා වියට්නාමය අදාළ බළධාරීන්ට ඒ බව දන්වා යවා ඇත.

32. අපරානු මත ක්‍රියාවලිය බලාත්මක වීම සඳහා ලියකියවිලි හුවමාරු කර ගැනීම සඳහා ප්‍රතිචාර අපේක්ෂාවෙන් පසු වේ.

**(ග) පොදු ගිවිසුම්**

33. 2017 වර්ෂය තුළදී ශ්‍රී ලංකාව වෙනත් විදේශ රටවල් 32 ක් සමඟ පොදු ගිවිසුම් පිළිබඳ නිගමන වලට එළඹී ඒවා අත්සන් කර ඇත.

****

# මැද පෙරදිග අංශය

## මැද පෙරදිග අංශය

**අංශයේ කාර්යයන්**

1. අතිගරු ජනාධිපති, ගරු අග්‍රාමාත්‍ය සහ විදේශ කටයුතු අමාත්‍යවරයා සහ අමාත්‍ය මණ්ඩල සාමාජිකයන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කළ ද්විපාර්ශ්වික සංචාර සම්බන්ධීකරණය කිරීම,
2. එවැනි ඉහළ පෙළේ සංචාර, අක්ත පත්‍ර භාරදීමේ උත්සව සහ වෙනත් සියලුම රැස්වීම් සඳහා සාකච්ඡා සටහන් සහ රට පිළිබඳ විස්තර සකස් කිරීම,
3. එළැඹීමට නියමිත අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් සකස්කොට අවසන් කිරීම.
4. අමාත්‍ය මණ්ඩල සංදේශ සකස්කිරීම සහ අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම,
5. අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන ශෝක පණිවිඩ, ජාතික දින පණිවිඩ, ශුභාශිංසන පණිවිඩ එම උත්සව වලදී පවත්වන කථා සහ ශුභ ප්‍රාර්ථනා පණිවිඩ සකස් කිරීම,
6. මැද පෙරදිග හා අප්‍රිකා කලාපීය රටවලින් ශ්‍රී ලංකාවට පත් කරනු ලැබ සිටින තානාපතිවරුන්/මහ කොමසාරිස්වරුන් සමඟ අභ්‍යන්තර රැස්වීම් පැවැත්වීම සඳහා පහසුකම් සැලසීම,
7. මැද පෙරදිග හා අප්‍රිකා කලාපය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම, කාර්යසාධන වාර්තාව සහ අයවැය වාර්තා ආදිය සකස් කිරීම,
8. එදිනෙදා කාර්යයන් වලදී විදේශීය රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල, කොළඹ පිහිටි මැද පෙරදිග හා අප්‍රිකා කලාපීය රටවල දූත මණ්ඩල, රේඛීය අමාත්‍යංශ/දෙපාර්තමේන්තු සහ වෙනත් නියෝජිතායතන සමඟ කටයුතු සම්බන්ධීකරණය කිරීම,

**මැද පෙරදිග කලාපය : දේශ භූමි ආවරණය**

අ) රටවල් 16 - බහරේන්, ඉරානය, ඉරාකය, ඊශ්‍රායලය, ජෝර්දානය, කුවේට්, ලෙබනන්, ඕමාන්, පලස්තීනය, කටාර්, සෞදි අරාබියාව, සිරියාව,එක්සත් අරාබි එමීර් රාජ්‍යය, අසර්බයිජානය, ටර්ක්මෙනිස්ථානය, යේමනය.

ආ) නේවාසික දූත මණ්ඩල/දූත කාර්යාල සංඛ්‍යාව

i. **තානාපති කාර්යාල 11** :

මැනමා (බහරේනය), ටෙහෙරාන් (ඉරානය), බැග්ඩෑඩ් (ඉරාකය) , ටෙල් අවිව් (ඉශ්‍රායලය), අම්මාන් (ජෝර්දානය), කුවේට් (කුවේට්), බේරූට් (ලෙබනනය), මස්කට්

(ඕමානය), දෝහා (කටාර්), රියාද් (සෞදි අරාබියාව), අබුඩාබි (එක්සත් අරාබි එමීර් රාජ්‍යය)

ii. **කොන්සල් ජනරාල් කාර්යාල 02** :

ඩුබායි- එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ජෙඩා (සෞදි අරාබියාව)

iii. **නියෝජිත කාර්යාල 01** :

රාමල්ලා නගරය-පලස්තීනය

iv. **සමගාමී අක්තගැන්වීම් 04 :**

සිරියාව (ලෙබනනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය), යේමනය (ඕමානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය), ටර්ක්මෙනිස්ථානය (ඉරානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය), අසර්බයිජානය (ඉරානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය)

v. **නිර්වේතනික කොන්සල් නියෝජනයක්**:

ඊශ්‍රායල රාජ්‍යය (ජෙරුසෙලම) පලස්තීන රාජ්‍යය (බෙත්ලෙහෙම)

1. **බහරේනය**

**අ. ද්විපාර්ශ්වික සබඳතා**

i. තානාපතිවරයා විසින් විවිධ අවස්ථාවලදී, බහරේනයේ අමාත්‍ය මණ්ඩලය, රාජෝත්තමයාණන් වහන්සේ, අග්‍රාමාත්‍යවරයා, ඔටුන්න හිමි කුමරුවන් හා නියෝජ්‍ය අග්‍රාමාත්‍යවරුන් බැහැ දැක ඇත.

ii. 2017 ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකාව අබු-ඩාබි සංවාදයේ(ADD) සභාපතිත්වයට පත් වූ අතර කම්කරු හා සමාජ සංවර්ධන අමාත්‍ය ගරු ආචාර්ය ජමීල් බින් මොහොමඩ් අල් හමයිඩීන් ශ්‍රී ලංකාවේ සංචාරය කළේය.

iii. අබුඩාබි සංවාදයේ සභාපතිවරයා වශයෙන් විදේශ රැකියා හා අධිකරණ අමාත්‍ය ගරු තලතා අතුකෝරල මැතිණිය ප්‍රමුඛ නියෝජිත කණ්ඩායමක් 2017 සැප්තැම්බර් මැද භාගයේ දී බහරේනයේ සංචාරක නිරත විය. එහි දී එතුමිය අමාත්‍ය මණ්ඩලය සහ එහි විදේශ රැකියා අමාත්‍යවරයා හමු විය.

**ආ. ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

i. බහරේන ආසියානු වෙළඳ කමිටුවේ (BATC) සහ බහරේන කර්මාන්ත වාණිජ මණ්ඩලයේ(BCCI) නියෝජිත පිරිසක් 2017 මැයි 30 සිට ජුනි 01 දක්වා පැවති "2017 ශ්‍රී ලංකා ආයෝජන සහ ව්‍යාපාර හමුව" ට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණියේය.

ii. 2017 ජනවාරි සිට සතියකට ගුවන් ගමන් වාර 5ක් වන ලෙසින්, බහරේනයේ ජාතික ගුවන් සමාගම, ගල්ෆ් එයාර් සමාගම, කොළඹ බණ්ඩාරනායක ගුවන් තොටුපොළ වෙත සෘජු ගුවන් කටයුතු ආරම්භ කළේය.

iii. ගල්ෆ් එයාර් ගුවන් සමාගමේ සභාපති (ප්‍රධාන විධායක නිලධාරී)අවස්ථා කිහිපයකදී හමු වූ තානාපතිවරයා නිරන්තර ගමන්වාර සංඛ්‍යාව වැඩි කරන ලෙසත් සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කරන ලෙසත් ඉල්ලමින් සාකච්ඡා පැවැත්වීය. ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය නංවාලීම සඳහා තානාපති කාර්යාලය ශ්‍රී ලංකා සංගමය සමග එක්ව වෛද්‍ය වැඩසටහන්, ආහාර ප්‍රවර්ධන වැඩසටහන් සහ වෙනත් නොයෙක් ව්‍යාපෘති සංවිධානය කළහ.

iv. තානාපතිවරයා සංචාරක හා චාරිකා සඟරාවල පෙරවදන සඳහා සම්මුඛ සාකච්ඡාවලට සහභාගීවී, ලංකාව පිළිබඳ දේශන සහ කතා පැවැත්වීය.

v. ශ්‍රී ලංකාව සතු “මෘදු බලය” ප්‍රචලිත කිරීමේ අරමුණෙන් තානාපතිවරයා ආරම්භක දේශකයෙකු ලෙස හෝ සභාපති මඩුල්ලේ සාමාජිකයෙකු ලෙස, ව්‍යාපාර මණ්ඩල හා ආයතන, තරුණ සභාපතිවරුන්ගේ සංවිධානය (YPO) අධ්‍යයන ආයතන හා විශ්වවිද්‍යාල ටෝස්ට්මාස්ටර් ක්ලබ් මගින් සංවිධානය කරන ලද ශ්‍රී ලාංකික නොවන සමුළු හා සම්මන්ත්‍රණවලදී මෙන්ම ජාත්‍යන්තර හා ජාතික උසස් පාසල් ආරම්භ කිරීමේ / උපාධි ප්‍රදානෝත්සව සහ පුහුණු වැඩසටහන් හා සම්මන්ත්‍රණ ආදියට සහභාගීවෙමින් දේශන පැවැත්වීය.

**ඈ. සංස්කෘතික සබඳතා**

i. බහරේනයේ ශ්‍රී ලංකා සංගමය සහ ශ්‍රී ලාංකික සංවිධානය විසින් සංවිධානය කෙරුණු සංස්කෘතික ක්‍රියාකාරකම් (වෛද්‍ය කඳවුරු/සායන, ලේ දන්දීම්, තෛපොංගල්, සිංහල හින්දු අලුත් අවුරුද්ද, වෙසක් සහ පොසොන් උත්සව, ඊඩ්-උල්-ෆිතර් සහ ඊඩ්-උල්-අල්හා වැනි උත්සව සැමරුම්) සඳහා දූත මණ්ඩලය මගින් පහසුකම් සලසන ලදී.

**ඇ. කම්කරු සුභසාධනය**

i. විදේශ රැකියා හා අධිකරණ අමාත්‍ය ගරු තලතා අතුකෝරල මැතිණිය බහරේන් රාජධානියේ රුකියා සහ බඳවාගැනීමේ නියෝජිතයින් 40 දෙනෙකු පමණ හමුවී සාකච්ඡා පැවැත් වූවාය.

**ඉ. වෙනත්**

i. ශ්‍රී ලංකා නාවික හමුදාවේ (SLN) විවිධ මට්ටම්වල නියෝජිත පිරිස් කිහිපයක් ඒකාබද්ධ නාවික බලකාය වෙත CMF ගොස් සාකච්ඡා, පුහුණු වැඩසටහන්, දේශන, සම්මන්ත්‍රණ ආදියට සහභාගී වූහ. කොළඹ දී වාර්ෂිකව පවත්වන “ගාලු කතිකාව” ට ඒකාබද්ධ නාවික බලකායේ කටයුතු වලට CMF අඛණ්ඩව සහභාගී වන අතර, කලාපයේ සංචාරය කරන ශ්‍රී ලාංකික නැව් සඳහා අනුග්‍රහය සහ ආරක්ෂාව සපයයි.

2. ඉරානය

අ. ද්වීපාර්ශ්වික සබඳතා

i. ඉරානයට සම්බාධක පැනවීමෙන් පසුව ශ්‍රී ලංකාව පවත්වන සබඳතා වල වැදගත්කම සැලකිල්ලට ගනිමින්, දෙරට අතර පවත්නා ද්විපාර්ශ්වික සම්බන්ධතා තව දුරටත් ප්‍රවර්ධනය කිරීමට පියවර ගැනේ.

ii. විද්‍යා සහ තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා 2016 ජනවාරි 14 වැනි දා ඉරානයේ සංචාරය කළ අතර, විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීය.

iii. පාර්ලිමේන්තුවේ ගරු කතානායක කරු ජයසූරිය මැතිතුමා 2017 මාර්තු 03 - 06 ඉරානයේ සංචාරය කළේය.

iv. සබරගමු පළාතේ ප්‍රධාන අමාත්‍ය ගරු මහීපාල හේරත් මැතිතුමා 2017 ජූලි 21 - 27 දිනවල ඉරානයේ සංචාරය කළේය.

v. ඉරානයේ ජනාධිපති ධූරයට දෙවනවරටත් තේරී පත් වූ ආචාර්ය හසන් රොව්හානි ගේ දෙවන ධූර කාලය ආරම්භ කිරීමේ උත්සවයට සහභාගීවීමට 2017 අගෝස්තු 04-07 දින වල පාර්ලිමේන්තුවේ කතානායක ගරු කරු ජයසූරිය මැතිතුමා ඉරානයේ සංචාරය කළේය.

vi. 2017 සැප්තැම්බර් 18-20 දිනවල ටෙහෙරානයේ පැවති ඉරානයේ 4 වැනි ජීව තාක්ෂණික ප්‍රදර්ශණය 2017 ට Iran Biotech Expo 2017 සඳහා ශ්‍රී ලාංකික නියෝජිත පිරිසක් සහභාගී විය.

ආ. බහුපාර්ශ්වීය සබඳතා

i. ටෙහෙරානයේ විද්‍යා හා තාක්ෂණ මාරුකිරීම් පිළිබඳ ඉන්දියානු සාගරය ආත රටවල සංවිධාන කලාපීය මධ්‍යස්ථානයේ උපදේශන කවුන්සිලයට (RCSTT) තානාපති කාර්යාලයේ සහභාගීත්වය ලබා දෙන ලදී.

ii. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ IAEA හි පාලන මණ්ඩලයෙහි සාමාජිකත්වය සඳහා පැවති නිලවරණයේ ඉරාන අපේක්ෂකත්වයට ශ්‍රී ලංකා සහයෝගය පළවිය.

ඇ. ආර්ථික සබඳතා

i. (RE 8) ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය : උමා ඔය බහුකාර්ය ව්‍යාපෘතිය වැනි ඉරානයේ මූල්‍ය අනුග්‍රහය මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති වලට අදාළ කටයුතු තානාපති කාර්යාලය විසින් සිදු කරගෙන යනු ලැබේ.

ii. ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය කිරීමට හා භාවිතය වැඩි කිරීමට ඉරානයේ තේ ආනයනකරුවන් ආකර්ෂණය කරගැනීමට දූත මණ්ඩලය අඛණ්ඩ රැස්වීම් පවත්වයි.

iii. ඉරානයේ ප්‍රධාන පෙළේ චාරිකා මෙහෙයවන්නන් හා අදාළ බලධාරීන් සමඟ දූත මණ්ඩලය සාකච්ඡා පැවැත් වූ අතර, 2017 සැප්තැම්බර් 06 දින සංචාරක ප්‍රවර්ධන වැඩසටහනක් ද සංවිධානය කෙරිණි.

3. **අසර්බයිජානය (ඉරානය වෙත අක්ත ගන්වා ඇත)**

සියලුම සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතීන් සුරක්ෂිත කිරීමේ කමිටුවේ (CMW) 2018-2021 වාරයට යළි තේරී පත්වීම සඳහා වූ ශ්‍රී ලංකා අපේක්ෂකත්වයට අසර්බයිජානයේ සහාය හිමිවිය.

4. **ඉරාකය**

අ. **ද්විපාර්ශ්වික සබඳතා**

i. ඉරාකයේ ග්‍රීන් සෝන් හි හමුදා බලකා දිනය සමරමින් පුෂ්පෝපහාර දැක්වීමේ උත්සවයට, ඉරාක පාර්ලිමේන්තුවේ සහ බැග්ඩෑග් විශ්වවිද්‍යාලයේ දී පැවති BGD සංවාදය - "ජයග්‍රහණයෙන් පසු විකල්ප" සැසියට සහ අල්-හකීම්ගේ කාර්යාල පරිශ්‍රයේ පැවති ජාතික සංහිඳියා මූලික පියවර සහ සම්මන්ත්‍රණයට තානාපතිවරයා සහභාගී විය.

ii. කුර්දිස්ථානයේ අර්බිල් හි නිව්රෝස් සැමරුම (කුර්දි නව වසර) ට සහභාගීවීමට තානාපතිවරයා කුර්දිස්ථාන කලාපයට ගියේය.

iii. කුර්දිස්ථානයේ අර්බිල් හි දී තානාපතිවරයා විසින් විදේශ සබඳතා අමාත්‍යවරයා, කුර්දිස්ථාන් කලාපයේ ජනාධිපති, කුර්දිස්ථාන් කලාපීය ශ්‍රී ලංකා ගරු කටයුතු කොන්සල්වරයා (නම් කරන ලද) හමුවන ලදී.

iv. තානාපතිවරයා, ආසියා හා ඕස්ට්‍රේලියා අධ්‍යක්ෂ ජනරාල් තානාපති අයි-ජාෆ්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ සංධාන ප්‍රධානී සහ ආරක්ෂක අමාත්‍ය අර්ෆත් අයි-හියැලි යන අය හමුවිය.

v. බැග්ඩෑගයේ ග්‍රීන් සෝන් හි දී, "මොසොල් යුද්ධයේ ජයග්‍රාහි පෙරහැර" සඳහා තානාපතිවරයා හමුවිය.

vi. දූත මණ්ඩලය බැග්ඩෑග් හි ජාත්‍යන්තර වෙළඳ සල්පිලට සහභාගීවිය.

vii. බෑග්ඩෑග් හි විදේශ කටයුතු අමාත්‍යාංශයත්, අමාත්‍ය මණ්ඩලයත්,ඉරාකයේ කුර්දිස්ථාන් කලාපයේ අර්බිල් හි ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල්වරයා වශයෙන් ආචාර්ය අහමඩ් ජේලාදීන් මුස්තෆා මහතා පත්කිරීමට අනුමැතිය ලබාදුනි.

viii. තානාපතිවරයා, බැග්ඩෑග් ජනාධිපති මැදුරේදී අතිගරු ජනාධිපති අල්-සලාම් හමුවිය.

ix. රාජ්‍ය තාන්ත්‍රික හා අනෙකුත් නිලධාරින් 78 දෙනෙකුට මරු කැඳවමින් බැග්ඩෑගයේ විදේශ කටයුතු අමාත්‍යාංශයට එල්ලවූ බෝම්බ ප්‍රහාරයෙන් පසු වසර 8ක් ගතවීමේ අවස්ථාවට තානාපතිවරයා සහභාගීවිය.

ආ. ආර්ථික සබඳතා හා විදේශීය ආයෝජන

i. ඉරාක වෙළඳ අමාත්‍යාංශයේ විදේශීය ආර්ථික සබඳතා අධ්‍යක්ෂ ජනරාල්වරයා හා තානාපතිවරයා අතර හමුවක් පැවැත්විණ.

ii. තානාපති කාර්යාලය සහ ඉරාකයේ චාරිකා සහ සංචාර නියෝජිතයින්ගේ සමිතිය සමග එක්ව බැග්ඩෑග් හි ඉෂ්තාර් ශෙරටන් හෝටලයේ දී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන වැඩසටහන සංවිධානය කළේය.

iii. ඉරාකයේ උම් ක්වාස වරායට පැමිණි මුහුදු පරීක්ෂණ ගමනේ යෙදුන ශ්‍රී ලාංකික නැව් 10ක් සම්බන්ධයෙන් කොළඹ ඩොක්යාර්ඩ් පීඑල්සී සමාගමට සහාය දැක්වීමට තානාපති කාර්යාලය මගින් කටයුතු කරන ලදී.

iv. 2018 ජනවාරි සිට ක්‍රියාත්මක වන පරිදි බැග්ඩෑගයේ සිට කොළඹ බලා සතියකට වරක් කුලී පදනම මත ගුවන් යානයක් පියාසර කරවීම සම්බන්ධයෙන් වාසර් සැලී මහතා සමග තානාපතිවරයා සාකච්ඡා කළේය.

v. ඉරාක අමාත්‍ය මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, ශ්‍රී ලංකාවේ හා ඉරාකයේ සංචාරය කරන සංචාරකයින් සංඛ්‍යාව වැඩිකිරීම සහ සෘජු ගුවන්ගමන් වාරයක් සූදානම් කිරීම සම්බන්ධයෙන් තානාපතිවරයා සමග සාකච්ඡා කළේය.

vi. ගෝලීය තේ සාදය තානාපති කාර්යාලයේ දී පැවැත්වුන අතර, රටවල් 49ක් ආවරණය වන ලෙස රූපවාහිනී විකාශය වොයිස් ඔෆ් ඇමරිකා මාධ්‍ය මගින් සිදු කෙරිණි.

vii. තානාපතිවරයා ඉරාකයේ චාරිකා හා සංචාර සමිතියේ නියෝජිතයන් කිහිප දෙනෙකු හමුවිය.

viii. ශ්‍රී ලංකාවත් ඉරාකයත් අතර ඉහළ මට්ටමක පවතින තෙල් හා තේ ආදිය පිළිබඳ වෙළඳ සබඳතා ගැන සාකච්ඡා කිරීමට ගරු කාමෙල් අයි-ග්‍රේරි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාත්, ඉංජිනේරු හයිඩර් මහතාත් තානාපතිවරයා හමුවූහ.

ඇ . කම්කරු සුභසාධනය

i. ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන් හට ඉරාකයේ කුර්දිස්ථාන කලාපයේ රැකියා අවස්ථා 1,385ක් පිළිබඳව සාකච්ඡා කළ තානාපතිවරයා, අවසන් තීරණයට එළඹ ශ්‍රී ලංකාව වෙත ප්‍රතිලාභ ලබාගැනීමට කටයුතු කළේය.

5. ඊශ්‍රායලය

අ. ද්විපාර්ශ්වික සබඳතා

i. සංචාරක සංවර්ධන, ක්‍රිස්තියානි කටයුතු සහ ඉඩම් අමාත්‍ය ගරු ජෝන් අමරතුංග මැතිතුමා, 2017 පෙබරවාරි 05-08 දිනවල ඊශ්‍රායලයේ පැවති 23 වැනි ජාත්‍යන්තර මධ්‍යධරණී සංචාරක වෙළඳපොල (IMTM) සඳහා සහභාගී විය.

ii. රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍ය ගරු ආර්.එම්.ආර්. මද්දුම බණ්ඩාර මහතා 2017 පෙබරවාරි මස 15-20 දිනවල ඊශ්‍රායලයේ සංචාරය කරමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ අවස්ථා ගවේෂණය කිරීමේ අධ්‍යයන චාරිකාවකට සහභාගීවිය.

iii. ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය ගරු දයා ගමගේ මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු සාමාජිකයින් 17 දෙනෙකුගේ නියෝජිත කණ්ඩායමක් 2017 සැප්තැම්බර් 11-17 දිනවල ඊශ්‍රායලයේ පැවති කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ අවස්ථා ගවේෂණය කිරීමේ අධ්‍යයන චාරිකාවට සහභාගී වූහ.

iv. වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු නවීන් දිසානායක මැතිතුමා තේ ව්‍යාපාරික සමාගම් හමුවීමේ අරමුණෙන් ඊශ්‍රායලයේ සංචාරය කළේය.

v. 2017 ජුනි 06-08 දිනවල ඊශ්‍රායලයේ පැවැති 8 වැනි ජාත්‍යන්තර ආරක්ෂක සහ HLX Expo 2017 (ISDEF) සඳහා ශ්‍රී ලංකා නාවික හමුදා නියෝජිත කණ්ඩායමක් සහභාගී විය.

vi. මේජර් ජනරාල් එන්.ඒ.පී.සී. නාපාගොඩ මහතා ප්‍රමුඛ නියෝජිත කණ්ඩායමක් 2017 සැප්තැම්බර් 01-10 දිනවල ඊශ්‍රායලයේ සංචාරයක නිරත විය.

vii. ශ්‍රී ලංකා ගුවන් හමුදාපති ප්‍රමුඛ නියෝජිත කණ්ඩායමක් ඊශ්‍රායලයේ සංචාරයක නිරත විය.

viii. 2017 සැප්තැම්බර් 10-14 දිනවල ඊශ්‍රායලයේ කෘෂිකර්මාන්තය ආත අධ්‍යයන චාරිකාවකට නියෝජිත පිරිසක් එක්විය.

**ආ. බහුපාර්ශ්වීය සබඳතා**

i. විවෘත රාජ්‍ය හවුල්කාරීත්ව මෙහෙයුම් කමිටුවේ 2017-2020 වාරය සඳහා ශ්‍රී ලංකා අපේක්ෂකත්වයට පක්ෂව ඊශ්‍රායල සහාය ලබා ගැනීමට දූත මණ්ඩලය කටයුතු කරන ලදී.

**ඇ. ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

i. ඊශ්‍රායලයේ සිට ශ්‍රී ලංකාව වෙත සංචාරක පැමිණීම් ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් ශ්‍රී ලංකාව සහ ඊශ්‍රායලය අතර කුලී පදනම මත ගුවන් ගමන් මෙහෙයවීම සම්බන්ධයෙන් ඊශ්‍රායල සමාගම් දෙකක් සමඟ දූත මණ්ඩලය සාකච්ඡා පැවැත්වීය.

ii. ශ්‍රී ලංකාවේ බිංදු වාරි කර්මාන්තයේ ආයෝජනයන් පිළිබඳ සොයාබැලීමටත් ආයෝජන වැඩි කිරීමටත් රිවුලිස් වාරි ලිමිටඩ් සහ මූල්‍ය සහ සංවර්ධන හවුල්කාරීත්වය (PFD) සමග දූත මණ්ඩලය සාකච්ඡා පැවැත්වීය. (ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ නවීකරණය පිළිබඳ අංක P 156049 - ඩොලර් මිලියන 125 ක ව්‍යාපෘතිය)

iii. උසස් තාක්ෂණික කාබනික හා ජීව ක්‍රියාකාරී කෘෂිකාර්මික ව්‍යාපෘති සම්බන්ධයෙන් ආයෝජන අරමුදල් සමාගම සමඟ දූත මණ්ඩලය සාකච්ඡා පැවැත්වීය. [කෘෂිකාර්මික සේවා හා පුහුණු මධ්‍යස්ථානය සඳහා මුදල් සැපයීමේ පැකේජය (ASTC)]

ඈ. **සංස්කෘතික සබඳතා**

i. ඊශ්‍රායලයේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව සමඟ එක්ව දූත මණ්ඩලය විසින් ජාතික දිනය, සිංහල හා හින්දු අලුත් අවුරුද්ද, වෙසක්, පොසොන් ආදී සංස්කෘතික උත්සව සැමරීමේ අවස්ථා සංවිධානය කරන ලදී.

ii. දූත මණ්ඩලයේ ආරාධනයකට අනුව, ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ චිත්‍ර හා අත්කම් නිෂ්පාදන සමාගමක් වන "රන්රුවන්" සමාගම, 2017 අගෝස්තු මස 07-19 දිනවල ජෙරුසෙලමේ පැවති "ජාත්‍යන්තර චිත්‍ර හා අත්කම්" 42 වෙනි උළෙලට සහභාගී විය.

ඉ. **කම්කරු සුභසාධනය**

i. ජනගහන ආගමන හා සීමා බලාධිකාරයේ (PIBA) නිලධාරීන් සමඟ වාරි කෘෂිකාර්මික ශ්‍රමිකයින්ගේ ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීමට ශ්‍රී ලංකා විදේශීය රැකියා නියෝජිත ආයතනයේ (SLFEA) සභාපති ලක්ෂ්මන් අබේගුණරත්න මහතා ප්‍රමුඛ නියෝජිතයන් පිරිසක් 2017 අප්‍රේල් 03-07 දිනවල ඊශ්‍රායලයේ සංචාරය කළේය.

ii. ශ්‍රී ලාංකික කෘෂිකාර්මික ශ්‍රමිකයින් 500ක් පමණ එරට ගොවියන් විසින් 2017 වර්ෂයේදී බඳවාගැනීමට අපේක්ෂා කරන බව ඊශ්‍රායල බලධාරීන් දන්වා ඇත.

iii. G2G නියමු ව්‍යාපෘතිය යටතේ රැකියා ලබාදීම සඳහා රැකබලාගන්නන් 26 දෙනෙකු තෝරාගෙන ඇති අතර, ඉන් 13 දෙනෙකු දැනටමත් ඊශ්‍රායලයට ගොස් සිටිති.

iv. සංක්‍රමණික ශ්‍රමිකයින් හට අනුග්‍රහය දක්වමින් දූත මණ්ඩලය විසින් PIBA , අදාළ සේවා නියෝජිතයින්, SLFEA සහ SLBFE සමඟ සම්බන්ධීකරණ කටයුතු මෙහෙයවන ලදී. (ක්ෂේත්‍ර/ගුවන්තොටුපල සංචාර 43, රෝහල් ආත ශ්‍රමිකයින් 9, පැමිණිලි විසඳීම් 211, විමසීම්වලට ප්‍රතිචාර දැක්වීම් 4,050) සිදුකරන ලදී.

v. අනෙක් රටවල් 40 ක විශාල සංචාරක සමාගම් සමඟ තානාපති කාර්යාලය 2017 IMTM 23 වැනි වෙළඳපොලට (ජාත්‍යන්තර මධ්‍යධරණී සංචාරක වෙළඳපොල 2017) ට සහභාගී විය.

vi. ෂෙරටෝන් ටෙල්අවිව් හෝටලය සමඟ තානාපති කාර්යාලයත් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයත් එක්ව ප්‍රථම වරට ශ්‍රී ලංකා සාම්ප්‍රදායික ආහාර උත්සවය 2017 මැයි 07-18 දින වල ටෙල්අවිව් හි දී සංවිධානය කරන ලදී.

vii. ඊශ්‍රායලය - ශ්‍රී ලංකා වාණිජ මණ්ඩල සභාපති, ඊශ්‍රායලයේ සිටින ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල්වරයා සහ අනෙකුත් ආයෝජකයන් හමු වූ තානාපතිවරයා, ශ්‍රී ලංකාවේ ආයෝජන පරිසරය, ප්‍රවාහනය, සංචාරක කර්මාන්තය සහ යටිතල පහසුකම් ආදිය පිළිබඳ ඔවුන් දැනුවත් කළේය.

6. ජෝර්දානය

අ. ද්විපාර්ශ්වික සබඳතා

i. ජෝර්දානයේ විදේශ අමාත්‍යවරයා විසින් දූත මණ්ඩල ප්‍රධානී වෙත 2017.07.19 දින ඊශ්‍රායල/පලස්තීන Al-Aqsha Masjith ගැටළුව සම්බන්ධයෙන් පැවත්වන ලද දැනුවත් කිරීමට තානාපතිවරයා සහභාගීවිය.

ii. ජෝර්දාන කෘෂිකර්මාන්ත අමාත්‍ය අතිගරු ඉංජිනේරු කලීඩ් හනීෆා හමු වූ තානාපතිවරයා, ශ්‍රී ලංකා කෘෂිකාර්මික නිෂ්පාදන ජෝර්දානයට අපනයනය කිරීම පිළිබඳව සාකච්ඡා කළේය. ඇතැම් ශ්‍රී ලාංකික කෘෂිකාර්මික නිෂ්පාදන ජෝර්දානයට අපනයනය කිරීමේ සම්බාධක පනවා ඇත.

ආ. බහුපාර්ශ්වීය සබඳතා

i. කලාපීය හා ගෝලීය ගැටළු පිළිබඳ සාකච්ඡා කෙරෙන, අරාබි චින්තන කතිකාවට තානාපතිවරයා සහභාගී විය.

ii. 2017 සැප්තැම්බර් 28 - 29 දිනවල පැවති අරාබි - අප්‍රිකා ආර්ථික සංසදයට තානාපතිවරයා සහභාගී විය.

iii. අම්මාන් හි සිට සැතපුම් 80ක් දුරින් පිහිටා ඇති සාටාරි හි සිරියානු සරණාගත කඳවුරට ශ්‍රී ලංකා රු.250,000ක වටිනාකමකින් යුතු ලංකා තේ තොගයක් ප්‍රදානය කළේය.

ඇ. ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන

i. ජෝර්දානයේ සාකා වාණිජ මණ්ඩලය සමඟ තානාපති කාර්යාලය විසින් 2017.08.23 දින ලැයිස්තු පත්‍රිකා ප්‍රදර්ශනයක් සංවිධානය කරන ලද අතර, එහිදී ශ්‍රී ලංකා සමාගම් 50ක් පමණ හඳුන්වා දෙන ලදී.

ii. අම්මාන් වාණිජ මණ්ඩල සභාපති සහ සාමාජිකයන් හමු වූ තානාපතිවරයාට ශ්‍රී ලංකාවේ නිෂ්පාදනවලට පමණක් සීමා වූ ප්‍රදර්ශනයක් ජෝර්දානයේ දී සංවිධානය කිරීමේ අවස්ථාවට තානාපති කාර්යාලයට අම්මාන් වාණිජ මණ්ඩලයේ සහය හිමිවන බව පැවසීය.

iii. "ගෝලීය ලංකා තේ සාදය" නමින් තානාපති කාර්යාල පරිශ්‍රයේ දී ලෝක පූජිත ලංකා තේ 150 වැනි සංවත්සරය සමරන ලදී.

iv. වෙළඳ සබඳතා තවදුරටත් පුළුල් කිරීම සම්බන්ධයෙන්, ජෝර්දාන් වාණිජ මණ්ඩල සභාපතිවරයා සමඟ තානාපතිවරයා සාකච්ඡා කළේය.

v. ජෝර්දානය පදනම වශයෙන් ක්‍රියාත්මක වන ඉරාක ව්‍යාපාර සංගමයේ සාමාජිකයින් හට තානාපති කාර්යාලයේ දී, ආයෝජන සහ වෙළඳ සංසදයක් සංවිධානය කෙරිණි.

vi. ජෝර්දාන සංචාරක ඇමති සහ ජෝර්දාන සංචාරක මණ්ඩලයේ සභාපතිවරයා සමඟ තානාපතිවරයා සාකච්ඡා පැවැත්විය.

vii. තානාපතිවරයා විසින් 2017 මාර්තු 05 වන දින ජෝර්දාන සංචාරක මණ්ඩල සභාපතිවරයා හමු වූ අතර, 2017 මාර්තු 12 වැනි දින ජෝර්දාන චාරිකා නියෝජිතායතන සංගමයේ ප්‍රධානී හමුවිය.

viii. ජෝර්දාන සංචාරක අධිකාරියේ ආරාධනයකට අනුව ශ්‍රී ලාංකික මාධ්‍ය කණ්ඩායමක් අප්‍රේල් මාසයේ දී ජෝර්දානයේ සංචාරයක නිරත විය.

**ඈ. සංස්කෘතික සබඳතා**

i. 2017 ජාතික දින සැමරුමේ දී ශ්‍රී ලාංකික සංස්කෘතික නර්තනාංග ඉදිරිපත් කෙරිණි.

ii. සංහිඳියාව 2017 සඳහා වූ ජාතික සතිය පවත්වන ලදී.

iii. සිංහල හින්දු අලුත් අවුරුද්ද, වෙසක්, පොසොන් හා ඊස්ටර් උත්සව දූත මණ්ඩලය විසින් සමරන ලදී.

**ඉ. කම්කරු සුභසාධනය**

i. ජෝර්දානයේ කම්කරු අමාත්‍යවරයා හමු වූ තානාපතිවරයා ''ශ්‍රමය අපනයනය හා ආනයනය කිරීම සම්බන්ධයෙන් පවතින ගැටළුවලට පිළියම් සෙවීමේ මාර්ග වැඩි දියුණු කිරීම සහ එවැනි ශ්‍රමය කොන්ත්‍රාත්මය සංවර්ධනයේ දී යොදාගැනීම'' පිළිබඳ ගිවිසුම අලුත් කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කළේය.

ii. ජෝර්දානයේ ඇගළුම් කම්හල් කිහිපයක සංචාරය කළ දූත පිරිස ඒවායේ අයිතිකරුවන් /ජ්‍යෙෂ්ඨ කළමනාකරණය හමුවී ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ට ඔවුන් සපයන සුභසාධනය සහ පහසුකම් පිළිබඳ විමසා බැලූ අතර, ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් පවතින නව රැකියා අවස්ථා පිළිබඳව ද සොයා බැලීය.

iii. ජෝර්දාන බලධාරීන් සමඟ සාර්ථකව සිදු කළ සාකච්ඡාවලින් අනතුරුව ජෝර්දානයේ සිටි ශ්‍රී ලාංකිකයින් යලි මව්රටට ගෙන්වා ගැනීමට දූත මණ්ඩලයට හැකිවිය.

iv. තානාපතිවරයා සිරකඳවුරට ගොස් එහි බලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්වීය.

v. ජෝර්දානයේ දී ICRC, IOM සහ ILO මගින් සංවිධානය කළ සංසඳවලට දූත මණ්ඩලය සහභාගී විය.

vi. ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් සඳහා තානාපති කාර්යාලය විසින් විශේෂ සෞඛ්‍ය කඳවුරක් සංවිධානය කරන ලද අතර, ජෝර්දානයේ සිටින ශ්‍රී ලාංකික වෛද්‍යවරුන් විසින් එය මෙහෙයවන ලදී.

**7. කුවේට්**

**අ. ද්විපාර්ශ්වික සබඳතා**

2017 ජනවාරි මස 23 - 24 දිනවල කොළඹ පැවති අබුඩාබි කතිකාවේ 4වැනි අමාත්‍ය මණ්ඩල උපදේශනයට සහභාගීවීමට මෙහි පැමිණි සමාජ කටයුතු සහ කම්කරු හා ආර්ථික කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු හින්ඩ් සුබායි බරක් අල් සුබායි මැතිණියගේ ප්‍රධානත්වයෙන් යුතු සාමාජිකයින් 5 දෙනෙකුගෙන් යුතු නියෝජිත කණ්ඩායම සඳහා පහසුකම් සලසන ලදී.

2017 අගෝස්තු 13-16 දිනවල විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍ය ගරු මනුෂ නානායක්කාර මැතිතුමා කුවේට් හි සංචාරය කළේය. එතුමා, මිනිස්බල රාජ්‍ය අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, ගෘහස්ථ ශ්‍රමිකයින්ගේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ පුනරුත්ථාපන හා නීතිය බලාත්මක කිරීමේ උපලේකම් වරයා හමුවී සංක්‍රමණික සේවකයින් හට බලපාන ගැටළු විසඳීම සම්බන්ධයෙන් සාකච්ඡා කළේය.

**ආ. බහුපාර්ශ්වීය සබඳතා**

දූත මණ්ඩලය විසින් පහත ආකාරයෙන් ආසියා සහයෝගීතා කතිකාවේ අවස්ථා සම්බන්ධීකරණය කරන ලදී.

ACD 15 වැනි අමාත්‍ය මණ්ඩල හමුව :-2017 ජනවාරි 15-17 අබුඩාබි

2 වැනි ACD සංචාරක අමාත්‍ය මණ්ඩල හමුව :-2017 ජුනි 10-14, සීම් රීප්, කාම්බෝජය

බලශක්ති ආරක්ෂාව සහ තිරසර බව උදෙසා ACD සම්මේලනය, ACD බලශක්ති කාර්ය කණ්ඩායම සහ 1 වැනි නැගෙනහිර ආසියානු බලශක්ති සංසදයː- 2017 අගෝස්තු 7-10, බොහෝල්, පිලිපීනය

2017 සැප්තැම්බර් 21 දින නිව්යෝර්ක් හි පැවති 72 වැනි UNGA සමුළුවට සමගාමීව පැවති ACD විදේශ අමාත්‍ය මණ්ඩල හමුව.

**ඇ. ආර්ථික සබඳතා හා විදේශීය ආයෝජන**

i. රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය ගරු කබීර් හෂීම් මහතා 2017 පෙබරවාරි 25 දින කුවේට් හි ව්‍යාපාර නායකයින් සහ ආයෝජකයින් හමුවිය.

ii. 2017 නොවැම්බර් 08-09 දිනවල දෙවැනි ඒකාබද්ධ වෙළඳ කමිටු රැස්වීම පැවැත්වීම සම්බන්ධයෙන් ආර්ථික කටයුතු නියෝජ්‍ය සහකාර විදේශ අමාත්‍යවරයා සමඟ සැප්තැම්බර් 20 දින දූත මණ්ඩලය සාකච්ඡා කළේය.

iii. කුවේට් වෙළඳුන් ශ්‍රී ලංකාවට පැමිණ ශ්‍රී ලංකා අපනයනකරුවන් හමුවීමේ අවස්ථාවන් දූත මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී.

iv. තේ වෙළඳ හවතුන් 20 දෙනෙකු සහ මාධ්‍ය ආයතන නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් ගෝලීය තේ සාදය 2017 ජුලි 06 දින තානාපතිවරයාගේ නිවසේ දී පැවැත්විණි.

**ඈ . සංස්කෘතික සබඳතා**

i. කුවේට් හි සංස්කෘතික, කලා හා අක්ෂර පිළිබඳ ජාතික කවුන්සිලයක් ශ්‍රී ලංකන් ගුවන් සමාගම සමඟ එක්ව තානාපති කාර්යාලය විසින් 2017 පෙබරවාරි 04-12 දිනවල සංස්කෘතික සතිය සංවිධානය කරන ලදී. එහිදී ප්‍රදීප් රත්නායක සංගීතවේදියා සහ චන්දන වික්‍රමසිංහ හා 20 දෙනෙකුගෙන් යුත් නර්තන කණ්ඩායම ගීත හා නර්තන ඉදිරිපත් කළේය.

ii. ජාතික දින සැමරුම ක්‍රවුන් ප්ලාසා හෝටලයේ බරකා බෝල්රූම් ශාලාවේ දී පෙබරවාරි 09 දින පැවැත්විය.

iii. ක්‍රවුන් ප්ලාසා හෝටලයේ සිල්ක් ශාලාවේ දී පෙබරවාරි 10 දින ආහාර උත්සවයක් සංවිධානය කෙරිණි. පෙබරවාරි 12 දින ශමියා රඟහලේදී සංස්කෘතික සංදර්ශනයක් ද පැවැත්විණි.

iv. ජාතික දින උත්සවයට සමගාමීව ශ්‍රී ලාංකික සංස්කෘතික ශිල්පී කණ්ඩායමේ රැඟුම් ''කුවේට් TV2'' මාධ්‍යයෙන් සහ ජාතික පුවත්පත්වලින් විකාශයට හා ප්‍රකාශයට පත් කෙරිණි.

v. දින දෙකක වෙසක් උත්සව සැමරුමක් සහ පොසොන් උත්සවය තානාපති කාර්යාලය විසින් සංවිධානය කෙරිණි.

**ඉ . කම්කරු සුභ සාධනය**

i. දූත මණ්ඩලය විසින් විදේශ කටයුතු අමාත්‍යාංශය, මිනිස් ශ්‍රමය සඳහා වූ රාජ්‍ය අධිකාරි දෙපාර්තමේන්තුව වෙත කරුණු ඉදිරිපත් කළේය.

ii. ගෘහස්ථ ශ්‍රමය පිළිබඳ දෙපාර්තමේන්තුව, කුවේට් හි IOM කාර්යාලය සහ කුවේට් හි පිහිටි විවිධ තානාපති කාර්යාල නියෝජනය කරන ලදී.

iii. ඔවුන්ට මුහුණ පෑමට සිදුවූ විවිධ බාධක සහ අභියෝග ජය ගැනීමට දූත මණ්ඩලය විසින් සංක්‍රමණික සේවකයින් විශාල පිරිසකට අවකාශය සලසන ලදී.(කාන්තාවන් 180 - පිරිමින් 537)

iv. විවිධ පාර්ශ්ව සහ බලය ලත් අධිකාරය සමග පවත්වන සාකච්ඡා තුලින් ඇතැම් සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ හිඟ වැටුප් යළි ලබා ගැනීමට දූත මණ්ඩලය විසින් කටයුතු කළේය. (51 ක්වූ සංක්‍රමණික සේවකයින්ගේ ශ්‍රී ලංකා රුපියල් මිලි.**11**ක හිඟ වැටුප් (KD21,999,629.29)

v. ආරක්ෂිත නිවාස වල සිටින 574 දෙනෙකු මෙම කාල සීමාවේදී යළි මව් රටට එවීමට කටයුතු කෙරිණි. දූත මණ්ඩල සහය අපේක්ෂා කළ නීත්‍යානුකූල නොවන සංක්‍රමණික ශ්‍රමිකයින් 420 දෙනෙකු යළි සිය රට බලා පිටත් කිරීමට දූත මණ්ඩලය කටයුතු කළේය.

vi. දූත මණ්ඩලයේ මැදිහත් වීමෙන් රෝහල් ගාස්තු ගෙවා දැමීමෙන් අනතුරුව රෝගීන් 25 දෙනෙකු යළි සිය රට බලා පිටත් කිරීමට කටයුතු කළේය.

vii. දූත මණ්ඩලය විසින් මධ්‍යම සිර කඳවුරු සහ රැඳවුම් කඳවුරු වල නිරීක්ෂණයේ යෙදෙන ලදී.

viii. ඔවුන්ගේ සිරගත කාල සීමාවේ ඉතිරිය ශ්‍රී ලංකාවේ සිර කඳවුරක ගත කරවීම සඳහා වන අවසරය සිර කරුවන් හුවමාරු කිරීමේ ගිවිසුම මත ලබා ගැනීමට ශ්‍රී ලාංකික සිර කරුවන් 140 දෙනෙකුගේ අයදුම්පත් දූත මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලදී.

8. ලෙබනනය

අ. ද්විපාර්ශ්වික සබඳතා

i. විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානායක මහතා ලෙබනනයේ සංචාරය කරමින් 2017 අගෝස්තු 16-19 දිනවල අතිගරු ජනාධිපති මිෂෙල් අවුන්, ගරු අග්‍රාමාත්‍ය සාද් හාරි, විදේශ කටයුතු අමාත්‍ය ගරු ජෙබ්රාන් බැසිල්, කථානායක හබී බෙරි සහ ඉහළ නිළධාරින් හමු විය.රාජ්‍ය අමාත්‍යවරයා දේශපාලන, ආර්ථික, කම්කරු, කොන්සියුලර් සහ සංස්කෘතික සහයොගිතාව පුළුල් කිරිමේ සාකච්ඡා වල නිරත වූ අතර අතිගරු ජනාධිපතිතුමන්ට, ගරු අග්‍රාමාත්‍යතුමන්ට හා ගරු විදේශ කටයුතු අමාත්‍යතුමන්ට ශ්‍රී ලංකාවේ සංචාරයක් සඳහා පැමිණෙන ලෙසට ආරාධනා කළේය.

ආ. ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන

i. රාජ්‍ය අමාත්‍යවරයා ගේ 2017 අගොස්තු මස සංචාරයට සමගාමීව ව්‍යාපාර සංසදයක් සංවිධානය කෙරිණි. ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයින් 30 දෙනෙකු පමණ ලෙබනන් ආණ්ඩුවේ නිලධාරිහු එම අවස්ථාවට සහභාගී වූහ.

ii. ශ්‍රී ලංකා රජයේ ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික භාවය පිලිබඳ මූලික කටයුතු යටතේ ලෙබනනයේ ජීවත් වන ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සහයෝගය ඇතිව 2017 සැප්තැම්බර් 24 වන දින තානාපති කාර්යාල පරිශ්‍රයේ දී ශ්‍රී ලංකා වෙළඳ ප්‍රදර්ශනය සහ ආහාර සල්පිළ පැවැත්විණ.

ඇ. සංස්කෘතික සබඳතා

i. 2017 පෙබරවාරි 04 දින 69 වැනි ජාතික දින උළෙල දූත මණ්ඩලය විසින් සමරන ලදී.

ii. 2017 මාර්තු 19 වැනි දින ලෙබනනයේ ශ්‍රී ලංකා කාන්තා සංගම් සභාපතිනි මාලනී කන්දෙආරච්චි මහත්මිය විසින් මෙහෙයවන ලද කාන්තා දින සැමරුමට දූත මණ්ඩලය සහභාගි විය.

iii. ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සහභාගිත්වය ඇතිව සිංහල හින්දු අලුත් අවුරුදු උළෙල, වෙසක් උත්සවය, පොසොන් උත්සවය, සහ ඉෆ්තාර් වැඩසටහන සංවිධානය කෙරිණි.

iv. අප්‍රේල් 23 දින බෙකා හිදී පැවැති සංස්කෘතික දින උළෙලට සහ අබේ හි ලෙබනන් විශ්වවිද්‍යාලයේ දී ජූලි 8-9 දින වල පැවැති අබේ උරුමයන්ගේ උළෙලට දූත මණ්ඩලය සහභාගී විය.

ඈ කම්කරු සුභසාධනය

i. තානාපතිවරයාගේ ඉල්ලීමකට අනුව ලෙබනනයේ සිටින නිත්‍යානුකූල නොවන සංක්‍රමණික ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ගෙවිය යුතු දඩ මුදලින් අඩක් ගෙවීමෙන් පසු යළි මව් රටට ගෙන්වා ගත හැකි වන පරිදි යෝජනාවක් සම්මත කිරීමට ලෙබනන රජය පියවර ගත්තේය. මෙම යෝජනාවලිය යටතේ එවැනි ශ්‍රී ලාංකිකයින් 81 දෙනෙකු මේ වන විටත් සිය රටට ගෙන්වා ගෙන තිබේ.

ii. විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානායක මහතා 2017 අගෝස්තු මස ලෙබනනයේ ප්‍රධාන ආරක්ෂක සමග සාකච්ඡා පැවැත්වීය.

**9. ඕමානය**

**අ. ද්විපාර්ශ්වික සබඳතා**

i. ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය ගරු දයා ගමගේ මැතිතුමා 2017 ජනවාරි මස ඕමානයේ සංචාරය කරමින් ශ්‍රී ලාංකික නිෂ්පාදන සඳහා වෙළඳපොළ ප්‍රවර්ධනයට ඉඩප්‍රස්තා ගවේෂණය කළේය.

ii. හමාඩ් බින් හමිස් මහතා 2017 ජනවාරි 23-24 ශ්‍රී ලංකාවේ සංචාරයේ නිරත වූ අතර, කොළඹ පැවති අබුඩාබි කතිකාවේ අමාත්‍ය මණ්ඩල උපදේශනයට සහ ජ්‍යෙෂ්ඨ නිළධාරී හමුවට සහභාගී විය.

iii. ඉන්දියානු සාගර කලාපයේ ජර්මානු තානාපතිවරුන්ගේ සම්මේලනයට සහභාගී වීමට 2017 අප්‍රේල් මස 5-7 දිනවල ඕමානයේ රාජ්‍ය තාන්ත්‍රික කටයුතු පිළිබඳ උපලේකම් ගරු ආචාර්ය මොහොමඩ් බින් අවාඩ් අල් හසන් ශ්‍රී ලංකාවට පැමිණියේය. එතුමා ඒ අතරතුර හිටපු විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය ගරු රිෂාද් බදියුදීන් යන මහත්වරුන් හමු විය.

iv. 2017 මැයි 9-11 දිනවල ඕමානයේ සංචාරය කළ කර්මාන්ත හා වාණිජ අමාත්‍ය ගරු රිෂාද් බදියුදීන් මහතා හම්බන්තොට පිහිටුවීමට අපේක්ෂිත ලංකා තෙල් පිරිපහදු ව්‍යාපෘතියේ ආයෝජනය කරමින් ඕමානයේ තෙල් හා ගෑස් අමාත්‍යාංශයේ සහයෝගය ඒ සඳහා ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් එම අමාත්‍යවරයා හා සාකච්ඡා පැවැත්වීය.

v. ඉතිහාසයේ ප්‍රථම වරට ඕමාන රජය මගින් ශ්‍රී ලාංකික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ කාර්යය දූත මණ්ඩලය විසින් සම්බන්ධීකරණය කරන ලදී. ඕමාන ශිෂ්‍යයින්ට ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලයේ අධ්‍යාපනය හැදෑරීම සඳහා අවසර ලබාදීමේදී දූත මණ්ඩලය එම පහසුකම් සැලසුවේය.

**ආ. ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

දූත මණ්ඩලය පහත සඳහන් අවස්ථා වලදී පහසුකම් සැළසීය.

i. ඕමාන ව්‍යාපාරික නියෝජිතයින් පිරිසක් 2017 මැයි 15 - 16 දිනවල ශ්‍රී ලංකාවේ කරන ලද සංචාරය සඳහා EDB සමග එක්ව පහසුකම් සැළසීම.

ii. කෘෂිකාර්මික ව්‍යාපෘතියක් සඳහා උතුරු පළාත් සභාව විසින් ලබාදී තිබෙන ඉඩම් කැබැල්ලක් නිරීක්ෂණය කිරීමට 2017 පෙබරවාරි මස ශ්‍රී ලංකාවට පැමිණි අල් තමාර් ජාත්‍යන්තර කෘශිකර්ම ආයතනයේ ("Al ThamerInternational Development of Agriculture LLC")හි ඕමාන ආයෝජකයින් කණ්ඩායමට පහසුකම් සැලසීම.

iii. ලුලු කණ්ඩායම (LuLu Group) මගින් කටුනායක අපනයන සැකසුම් කලාපයේ අලුතින් අරඹන ලද Y.A.S පුද්ගලික සමාගම යටතේ 2017 මැයි මස ආරම්භ කරන ලද

ඇමරිකානු ඩොලර් මිලියන 20 ක් වටිනා අපනයන හා ආහාර සැකසුම් පහසුකම ස්ථාපනය කිරීම.

iv. සුපිරිසිදු ශ්‍රී ලංකා තේ සමඟ 2017 පෙබරවාරි 06 වැනිදින මස්කට් හිදී ප්‍රථම තේ කලාපය ආරම්භ කෙරිණි.

v. 2018 ඔක්තෝබර් මාසයේදී රෝඩ්ෂෝ (Road Show) සංවිධානය කිරීමේ කටයුතු සඳහා අදාළ පාර්ශ්වකරුවන් සමග සම්බන්ධ වීම. මාධ්‍ය දැනුවත් කිරීම සහ SLTBP සමඟ සංස්කෘතික අංග ඉදිරිපත් කිරීමේ කණ්ඩායමක් සකස් කිරීම ආදියට අදාළ වැඩ කටයුතු.

vi. Link Publication සඳහා ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය පිළිබඳව හා ශ්‍රී ලංකා විවාහ සබඳතා පිලිබඳ විශේෂාංගයක් සම්පාදනය කිරීම.

**ඇ. සංස්කෘතික සබඳතා**

i. ශ්‍රී ලංකාවේ 69 වැනි නිදහස් දින සැමරුම නිමිත්තෙන් රාජ්‍ය තාන්ත්‍රික සංග්‍රහයක් පැවැත්විණි.

ii. ඕමානයේ වෙසෙන ශ්‍රී ලාංකිකයින් සමග දූත මණ්ඩලය විසින් තෛපොංගල් හින්දු අලුත් අවුරුද්ද වෙසක් දිනය පළමු මුහරම් වාස් සහ කඨින උත්සවය 2017 වසරේදී සමරන ලදි.

iii. 2017 මාර්තු 16-17 දිනවල පැවැති සංගීත සංදර්ශනයට ශ්‍රී ලාංකික ශිල්පීහු සහභාගි වූහ. 'සිහිනයකි රෑ' රූපවාහිනී වැඩසටහනේ නිෂ්පාදක වරයා එම වැඩසටහනේ රූ ගත කිරීම් කොටස් දෙකක් ඕමානයේ පටිගත කිරීමට ඕමානයට පැමිණි සංචාරයට දූත මණ්ඩලය ද සහභාගිවිය.

iv. ''එතෙර අපි'' සංවිධානය සමග එක්ව කැළණිය විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යාව පිළිබඳ මහාචාර්ය රාජ් සෝමදේව මහතා ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිලිබඳව ඕමානයේදී 2014 අප්‍රේල් 28 වන දින පැවැත්වූ විවෘත දේශනය සංවිධානය කිරීම දූත මණ්ඩලය මගින් සිදු කෙරිණ.

v. ''සෝහාර'' හි මහජන දිනයක් ජනවාරි 13 වන දින සහ ශ්‍රී ලාංකික ප්‍රජාව වෙනුවෙන් නොමිලයේ වෛද්‍ය කඳවුරක් මැයි 19 දින පවත්වන ලදී.

vi. දූත මණ්ඩල පරිශ්‍රයේ දී දහම් පාසලක් පැවැත්වීමට කටයුතු යෙදීම.

**ඈ. කම්කරු සහසාධනය**

i. විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍ය ගරු මනුෂ නානායක්කාර මහතා 2017 අගෝස්තු 10-13 දිනවල ඕමානයේ සංචාරය කළේය. වෘත්තීයවේදීන් ඇතුළු ශ්‍රී ලාංකිකයින් 3,000 ක් පමණ හමුවූ අතර කම්හල් කීපයක සංචාරය කළේය. 2017 අගෝස්තු 11 වන දින ජංගම කොන්සියුලර් සේවාවක් පැවැත්විණි. මිනිස් බල අමාත්‍යංශයේ වැඩ බලන උප ලේකම් ෂලීම් නසීර් මහතාද හමුවිය.

ii. විදේශ රැකියා අමාත්‍යංශයේ සහ විදේශ සේවා නියුක්ති කාර්යංශයේ නියෝජිත පිරිසක් 2017 ජූලි 16 ඕමානයේ සංචාරයක නිරත විය. එක්සත් අරාබි එමීර් රාජ්‍යය හරහා ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන් නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට මගපාදන බඳවා ගැනීමේ අක්‍රමිකතා සම්බන්ධයෙන් ඕමානයේ මිනිස් බල අමාත්‍යංශය සමග සාකච්ඡා කරන ලදී.

iii. ඕමානයේ විදේශ රැකියා නියෝජිතායතනය සමග දූත මණ්ඩලය පැවැත්වූ සාකච්ඡා වලදී ශ්‍රී ලාංකික පුහුණු ශ්‍රමිකයින් හට ඕමානයේ රැකියා අවස්ථා තවදුරටත් ප්‍රවර්ධනය කිරීම පිළිබඳව අවධානය යොමු කෙරිණි.

iv. රැකියා ගිවිසුම් 3674 ක් ලියාපදිංචි කිරීම රැකියා අවස්ථා 148 ක් අනුමත කිරීම් ලියාපදිංචි කිරීම් 451 ක් ආරක්ෂක නිවස්නයට කාන්තා ශ්‍රමිකයින් 258 ක් පැමිණීම සිරකඳවුරු සංචාර 16 ක් රෝහල් සංචාර 57 ක් සහ උසාවි සංචාර 41 ක් වැඩබිම් සංචාර 9 නඩු පැවරීම් 47 ක් සිදු කිරීම.

**10. යේමනය (ඕමානයට අක්ත ගන්වා ඇත)**

**අ. ද්විපාර්ශ්වික සබඳතා**

තානාපතිවරයා විසින් යේමන ජනරජයේ ජනාධිපති අතිගරු අබ් රබ්බු මන්සෝර් හඩි ඉදිරියේදී යේමනයට අක්ත ගන්වන ලද නේවාසික නොවන තානාපති වරයා ලෙස අක්ත පත්‍ර ප්‍රදානය කරන ලදී.

**ආ. කම්කරු සුභසාධනය**

2016 සැප්තැම්බර් සිට යේමනයේ අල් හුදෙයිදා හි කැරළි පරිපාලනය මගින් රඳවා තබා ගෙන සිටි ශ්‍රී ලාංකික මුහුදු වෙළඳුන් නිදහස් කිරීම සහ සිය රට ගෙන්වා ගැනීම සම්බන්ධ කටයුතු දූත මණ්ඩලය සිදු කළේය.

**11. පලස්තීනය**

**අ. ද්විපාර්ශ්වික සබඳතා**

i. පලස්තීන සිසුන් සඳහා ප්‍රථම උපාධි / පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව තුනක් 2016 /2017 අධ්‍යයන වර්ෂ සඳහා ප්‍රදානය කිරීම සම්බන්ධීකරණය.

ii. පහත නිලධාරීන් සමග ශ්‍රී ලාංකික නියෝජිතයෝ හමුවූහ.

- ආසියා සහ අප්‍රිකා අංශයේ ප්‍රධානී ආචාර්යය මේසන් ෂමියා.
- පලස්තීන ශ්‍රී ලංකා මිත්‍රත්ව සංගමයේ සභාපති ඉංජිනේරු මහමුඩ් අබ්දුල්ලා සහ සාමාජිකයින්.
- ආචාර්ය නබිල් ෂාත්. ෆාටා හි විදේශ සබඳතා කොමිසමේ හිටපු කොමසාරිස් ජනරාල්.
- අරාබි හා ජාත්‍යන්තර සබඳතා ප්‍රධානී කර්නල් ආචාර්ය මහමුඩ් සලාහල් දීන් සමග යුධමය පුහුණුව හුවමාරු කිරීම පිළිබඳව සාකච්ඡා කරන ලදී.

- විදේශ කටයුතු අමාත්‍යාංශයේ සන්ධාන ප්‍රධානී අබීර් රාමාහී මහත්මිය හමුවී නියෝජිතයන් වෙත පලස්තීන රාජ්‍ය තාන්ත්‍රික කාඩ්පතක් නිකුත් කිරීම පිළිබඳව සාකච්ඡා කෙරුණි.
- විදේශ කටයුතු හා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ජනාධිපති උපදේශක ආචාර්ය නබීල් ෂාත්.

iii. 2017 අගෝස්තු මස පලස්තීන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (PICA) අධ්‍යක්ෂ ජනරාල් ඉමාඩ් සුහසිරි මහතා ශ්‍රී ලංකාවට පැමිණියේය.

iv. 2017 අප්‍රේල් මස 21 දින ජ්‍යෙෂ්ඨ නිලධාරී මට්ටමේ දේශපාලන හා උපදේශන වල පළමු වටය කොළඹ විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී පැවැත්විණි.

v. මීගමුව සහ බෙත්ලෙහෙම් නගර ඒකාබද්ධ කිරීමේ කටයුතු.

**ආ. ආර්ථික සබඳතා හා විදේශ ආයෝජන**

i. පහත නිලධාරීන් සමග ශ්‍රී ලාංකික නියෝජිතයෝ හමු විය.

- ආර්ථිකය හා වෙළඳාම සංවර්ධනය කිරීම සඳහා ජාතික ආර්ථිකය පිළිබඳ අමාත්‍ය අබීර් ඕඩේ මැතිණිය.
- කෘෂිකර්ම අමාත්‍ය ආචාර්ය සුෆියන් සුල්තාන්
- පලස්තීන කෘෂිකර්මාන්ත දෙපාර්තමේන්තුවේ නිලධාරීන්
- විදේශ කටයුතු අමාත්‍යාංශයේ පලස්තීන ව්‍යාපාරිකයෙකු හා කොන්ත්‍රාත්කරුවෙකු
- නැබ්ලස් වාණිජ මණ්ඩලයේ සභාපති ඕමාර් තසෙම් මහතා
- බෙත්ලෙම් නගරයේ මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනයක් පැවැත්වීම පිළිබඳව සාකච්ඡා කිරීමට බෙත්ලෙහෙමේ හිටපු නගරාධිපති බේරා බැබුන් මිය.
- ශ්‍රී ලංකා කාන්තා සංගම් සහයෝගිතාව සම්බන්ධයෙන් බීටුනියා කාන්තා සංගමයේ ප්‍රධානී ලීනා මෆීෂ් මිය.

ii. නියෝජිතයෝ Pure Olive Soap කර්මාන්ත ශාලාවේ සංචාරය කළ අතර, වෙළඳ සබඳතා ආරම්භ කෙරිණ.

iii. ශ්‍රී ලංකාවේ සංචාරක කටයුතු හා ව්‍යාපාර ආයෝජන ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ජාතික දින අවස්ථාවේ ඓතිහාසික වැදගත්කම සම්බන්ධයෙන් පලස්තීන ජාතික රූපවාහිනිය ශ්‍රී ලාංකික නියෝජිතයා සම්මුඛ සාකච්ඡාවකට කැඳවමින් සාකච්ඡා කළේය. පලස්තීන චාරිකා නියෝජිතයින් සමගද සාකච්ඡා පැවැත්විණ.

iv. නත්තල් වෙළඳපොළේ කුටි දෙකක් බටහිර ඉවුරේ හා ගාසා තීරයේ දී ලංකා තේ ප්‍රවර්ධනය කරන්නන් හට ප්‍රදානය කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

v. පලස්තීන රාජ්‍යයේ ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකා තේ වෙළඳුන් හා සංචාර මෙහෙයවන්නන්ට සහාය දැක්වීම.

**ඇ. සංස්කෘතික සබඳතා**

ග්‍රෑන්ඩ් පාර්ක් හෝටලයේ දී ශ්‍රී ලංකා 69 වැනි ජාතික දිනය සමරන ලද අතර ඉෆ්තාර් සැමරුම සහ විශේෂ රාමදාන් පූජාවක් පැවැත්විණි.

**ඈ. කම්කරු සුභසාධනය**

පලස්තීනයේ සේවය කරන ශ්‍රී ලාංකිකයින් සමඟ ශ්‍රී ලාංකික නියෝජිතයෝ රැස්වීම් පැවැත්වූ අතර ඔවුන් මුහුණපාන ගැටළු සම්බන්ධයෙන් අදාළ බලධාරීන්ට දැනුම්දෙන ලදී.

**12. කටාර්**

**අ. ද්විපාර්ශ්වික සබඳතා**

i. මධ්‍යම පළාත් ආණ්ඩුකාර ගරු නිලූකා ඒකනායක මහත්මිය 2017 අප්‍රේල් 19-21 කටාර් රාජ්‍යයේ සංචාරය කරමින් දෝහා හි ස්ටැෆර්ඩ් ශ්‍රී ලංකා විද්‍යාලය ද නිරීක්ෂණය කළාය.

ii. විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානායක මැතිතුමා 2017 ජූලි 04 දින දෝහා නගරයේ සංචාරය කළේය.

iii. හිටපු විදේශ කටයුතු අමාත්‍ය ගරු රවී කරුණානායක මැතිතුමා 2017 ජූලි 08-09 කටාරයේ සංචාරය කළේය. එතුමා අතිගරු එමීර්වරයා, අග්‍රාමාත්‍යවරයා, අභ්‍යන්තර අමාත්‍යවරයා, විදේශ කටයුතු අමාත්‍යවරයා සහ කටාර ගුවන් සමාගමේ CEO හමුවිය.

iv. අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහයෝගීතාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශයත් කටාර් රාජ්‍යයේ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයත් අතර 2017 මැයි 23 දින සාකච්ඡා පැවැත්විණි.

v. ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකයෙකු විසින් පළමු වරට කටාර් රාජ්‍යයේ සිදුකරන රාජ්‍ය සංචාරයක හා අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එම ධූරයට පත්වීමෙන් පසු එතුමා මැද පෙරදිග කලාපයේ සිදුකරන ප්‍රථම රාජ්‍ය සංචාරයේ කටයුතු සූදානම් කිරීම 2017 ඔක්තොම්බර් 25-26 දිනවල සිදු කෙරිණි.

**ආ. ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

i. ජාත්‍යන්තර කණ්ඩායම් කළමනාකරණ අධ්‍යක්ෂ සහ සභාපති යූසුෆ් අලි MA මහතා 2017 මැයි 18 දින ශ්‍රී ලංකාවේ සිදුකළ සංචාරයේ කටයුතු දූත මණ්ඩලය සම්බන්ධීකරණය කළ අතර කොළඹ දී ඔවුන්ගේ රාජ්‍යයේ සැපයුම් සේවා හා ඇසුරුම් කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීමට අදාළ කටයුතු එම සංචාරයේ අරමුණ වේ.

**ඇ. සංස්කෘතික සබඳතා**

i. ඕමානයේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව සමඟ 2017 වසරේ ජාතික දින උළෙල, වෙසක් උළෙල, තෛපොංගල් දිනය හා ඉෆ්තාර් දිනය ආදී සංස්කෘතික අංග දූත මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී.

ඈ. කම්කරු සබඳතා

i. ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන් බඳවාගැනීමේ ක්‍රියාවලිය ප්‍රමුඛ කොට ඒ සඳහා අවශ්‍ය මගපෙන්වීම් බඳවාගැනීමේ නියෝජිතයින්ට සමාගම්වලට සහ සේවායෝජකයන්ට අනුග්‍රහය දැක්වීම කම්කරු අංශය මගින් සිදු කරයි.

ii. ගෘහ සේවිකාවන්/ ළදරුවන් රැකබලාගන්නන්/ නැනී සහ සේවිකාවන්ගෙන් සමන්විත කාන්තා ගෘහාත සේවාදායකයින් 122 පමණ අදාළ කාලසීමාව තුළ තානාපති කාර්යාලයට පැමිණ ඇත.

iii. පිරිමි සේවාදායකයින්ගෙන් අදාළ කාල සීමාව තුළ කම්කරු පැමිණිලි 1548ක් ලැබී ඇත.

iv. නිශ්චිත කාලයකට වරක් සිර කඳවුරු / රැඳවුම් මධ්‍යස්ථාන වෙත ගොස් මූලික අවශ්‍යතා සපුරාගැනීමට අවශ්‍ය උපාංග සපයන ලදී.

v. දූත මණ්ඩල රැකවල් නිවස්නයේ සිටින ළදරුවන්ට ළදරු ආහාර ද්‍රව්‍ය සපයන ලදී.

vi. ශ්‍රී ලංකා තානාපති කාර්යාල රැඳවුම්භාරයේ සිටින ශ්‍රී ලංකාවට ආපසු යාමට උපකාර අපේක්ෂා කරන කාන්තාවන්ට ගුවන් ටිකට්පත් ලබා ගැනීමට අවශ්‍ය වියදම් ලබා දෙන ලදී.

13. සෞදි අරාබිය

අ. ද්විපාර්ශ්වික සබඳතා

i. විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම් ජී.එස්. විතානගේ මහතාගේ නායකත්වයෙන් යුතු නිල නියෝජිත කණ්ඩායමක් 2017 ජනවාරි මස පැවති ශ්‍රමික සැපයුම පිළිබඳ ඒකාබද්ධ කොමිෂන් සභා රැස්වීමට සහභාගිවීම සඳහා සෞදි අරාබි රාජධානිය වෙත ගියේය.

ii. ගරු අමාත්‍ය රාවුෆ් හකීම් මැතිතුමා 2017 මාර්තු මසදී සෞදි අරාබි රාජධානියේ සංචාරය නියැලිණි. එහිදී එතුමා පරිසර, ජල හා කෘෂිකර්ම ගරු අමාත්‍ය අබ්දුල් රහමන් අබ්දුල් මොහ්සෙන් අල් ෆාඩ්ලි මැතිතුමා හමුවිය.

iii. පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා හා පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කේ. කාදර් මස්තාන් මැතිතුමාද සෞදි අරාබිය බලා පිටත් වූහ.

iv. අල් වලීඩ් ටලාල් මානව හිතවාදී පදනමේ ආදී කතෘ අල්වලීඩ් ටේන් ටලාල් බින් අබ්දුල් අසීස් රජ කුමරු 2017 ජූලි 4 වන දින ශ්‍රී ලංකාවට පැමිණි අතර එහිදී අතිගරු ජනාධිපති තුමා,ගරු අග්‍රාමාත්‍යතුමා හා ගරු විදේශ අමාත්‍යතුමා හමුවිය.

v. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සුනිල් හෙට්ටිආරච්චි මහතා ජෙඩා හා රියාද් නගරවල සංචාරයක නියැලුණේය. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ඉහළ මට්ටමේ නියෝජිත කණ්ඩායමක් සෞදි අරාබි රාජධානියේ සංචාරයක නිරත විය.

ආ බහුපාර්ශ්වීය සබඳතා

i. ඉස්ලාමීය සහයෝගිතා සංවිධානයේ දී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා විශේෂ නියෝජිතයකු පත් කිරීමට තානාපති ටරීග් අලි බක්හීට් මැතිතුමා හා දේශපාලන කටයුතු

කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සමග අතිගරු තානාපතිවරයා සාකච්ඡා පවත්වා තිබේ.

**ඈ. ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

i. පෙබරවාරි මස යෙදී තිබූ 69 වැනි නිදහස් දිනයේදී ශ්‍රී ලාංකික අපනයන නිෂ්පාදන ප්‍රදර්ශනයක් සංවිධානය කරන ලදී.

ii. මුදල් අමාත්‍යාංශයේ නියෝජිත පිරිසක් 2017 මාර්තු මසදී සෞදි අරාබි රාජධානියේ සංචාරයක නියැලුණ අතර එම සංචාරය අතරතුරදී සංවර්ධනය සඳහා සෞදි අරමුදල සමග සාකච්ඡා පැවැත්වීය. සංවර්ධනය සඳහා අරමුදලේ (SFD) නියෝජිත කණ්ඩායමක් 2017 අප්‍රියෙල් මසදී, මුදල් අමාත්‍යංශය සමග රැස්වීමකට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණියේය.

iii. සෞදි අරාබි රාජධානියේ අල් ජසීරා පුවත්පතෙන් තෝරා ගත් එක් පුවත්පත් කලාවේදියෙක්, 2017 අගෝස්තු මසදී කොළඹ පැවති පුවත්පත් කලාවේදී වැඩසටහනකට සහභාගී විය.

iv. දූත මණ්ඩලය විසින් 2017 ජූලි මස රියාද් හි දී ගෝලීය ලංකා තේ සාදයක් සංවිධානය කරන ලදී. සංචාරක සමාගම් 15 ක් ජෙඩාහි දී පැවති 2017- JTTX සංචාරක වෙළෙඳපළට සහභාගී වූ අතර රියාද් හි පැවති 2017 රියාද් සංචාරක වෙළෙඳපළට සංචාරක සමාගම් 12 ක් සහභාගී විය.

2017 මාර්තු හා මැයි මාස වලදී, සෞදි අරාබි රාජධානියෙන් ව්‍යාපාරික නියෝජිතයින් දෙදෙනෙක් ශ්‍රී ලංකාවට පැමිණි අතර ඔවුහු ආයෝජන මණ්ඩලය, ලංකා වාණිජ මණ්ඩලය හා ව්‍යාපාරික හා ආයෝජන අරමුණු සහිත සමාගම් සමග සාකච්ඡා පැවැත්වීය.

**ඇ. සංස්කෘතික සබඳතා (රියාද්හි)**

69 වැනි නිදහස් දිනය සැමරීම සඳහා 2017 පෙබරවාරි 4 වෙනි දින දූත මණ්ඩල

i. පරිශ්‍රයේදී උත්සවයක් පවත්වන ලදී. වෙළෙඳාම, සංචාරක කටයුතු හා ආයෝජන පිළිබඳව ප්‍රවෘත්ති පත්‍ර අතිරේක දෙකක් අරාබි හා ඉංග්‍රීසි බසින් පළ කරන ලදී. තානාපති කාර්යාලය විසින් 69 වැනි ජාතික දින සංවත්සරය 2017 පෙබරවාරි 27 වැනි දින ටුවෙයික් හිදී ද සමරන ලදී.

ii. සිංහල/දෙමළ අලුත් අවුරුදු උත්සවය සැමරීම සඳහා දූත මණ්ඩලය සහය ලබා දුන් අතර වෙසක් සහ සීල ව්‍යාපාරය ඇතුළුව බෞද්ධාගමික අංග 20ක්,කතෝලික ආගමික අංග 15ක් තෛපොංගල් ඇතුලුව හින්දු ආගමික අංග 40ක් හා 37 වැනි වාර්ෂික උත්සවය, දහම් පාසැල් වැඩසටහන් (බෞද්ධ හා කතෝලික) 28ක් සංවිධානය කළේය. 2017 මාර්තු මස ශ්‍රී ලංකා මුස්ලිම් සංස්කෘතික වැඩසටහන පැවැත්වීය.

iii. ජෙඩාහි ශ්‍රී ලංකා කොන්සල් කාර්යාලය ශ්‍රී ලාංකික හජ්ජි වන්දනාකරුවන් 3,750කගේ වැඩකටයුතු සිදුකරන ලදී. ගරු අමාත්‍ය ඒ.එච්.එම්.ෆවුසි මැතිතුමා

සමග පැමිණි හජ්ජි නියෝජිත කණ්ඩායමේ නායකත්වය උසුලන ලද්දේ තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍ය ගරු ඒ.එච්.එම් හලීම් මැතිතුමා විසිනි.

**ඉ. කම්කරු සුභසාධනය**

i. ශ්‍රී ලංකා ආර්ථිකයට, සෞදි අරාබි රාජධානියේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාවේ සුභසාධනය වැඩිදියුණු කිරීමට සහ ශ්‍රී ලාංකිකයන්ට ලබාදෙන තානාපති සේවාවල ප්‍රමිතිය වැඩි දියුණු කිරීමට සෞදි අරාබි රාජධානියෙන් ලබාදෙන දායකත්වය වැඩි කිරීම සඳහා 2020 දැක්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මාර්තු මස ආරම්භ කරන ලදී.

ii. තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන්ට සහාය ලබාදීමට ජංගම සේවා 09 ක් පවත්වන ලදී (රියාද්).

iii. පොදු ක්ෂමා කාලය තුළදී ශ්‍රී ලාංකිකයන් 4,200 ක ට පමණ ශ්‍රී ලංකාවට පැමිණීමට හැකි විය. (රියාද් 3,000 හා ජෙඩා 1,200)

iv. පිරිමි සේවකයන්ගෙන් පැමිණිලි 680 ක් තානාපති කාර්යාලය (රියාද්) වෙත ලැබී ඇති අතර ඉන් 392 ක් සඳහා විසඳුම් ලබාදෙන ලදී. ගමන් 188 ක් සඳහා පහසුකම් සලසන ලදී.

v. ජෙඩාහි කොන්සල් කාර්යාලය පිරිමි සේවකයන්ගෙන් පැමිණිලි 269 ක් ලද අතර ඉන් 80% ක් සඳහා විසදුම් ලබාදෙන ලදී. 70 දෙනෙකුගේ ගමන් සඳහා පහසුකම් සලසන ලදී.

vi. ශ්‍රී ලාංකිකයන්ට පහසුකම් සැලසීම සඳහා කාන්තා සුභසාධන/ සමාජයීය රැකවරණ මධ්‍යස්ථාන වලට 417 වරක් යාමට රියාද් තානාපති කාර්යාලයට සිදුවිය. තවද, තානාපති කාර්යාලය ශ්‍රමිකයන් පිළිබඳ නඩු 40ක කටයුතු සිදුකරන ලද අතර රෝහල් වලට විශේෂයෙන් 11 වරක් සහ පොලිස් ස්ථානවලට 72 වරක් යාමට සිදුවිය. මෙම දූත මණ්ඩලය විසින්, ආරක්ෂක නිවස්නයෙහි රැඳවියන් 84 ක් පමණ නඩත්තු කරනු ලැබේ. මෙමගින් රැකවරණය ලබාදුන් සමස්ථ රැඳවියන් ගණන 913 කි.

vii. ශ්‍රී ලාංකිකයන්ට පහසුකම් සැළසීම සඳහා කාන්තා සුභසාධන/ සමාජයීය රැකවරණ මධ්‍යස්ථාන වලට 70 වරක් යාමට ජෙඩාහි කොන්සල් ජනරාල් කාර්යාලයට සිදුවිය. කොන්සල් ජනරාල් කාර්යාලය ශ්‍රමිකයන් පිළිබඳ නඩු 15 ක කටයුතු සිදුකළ අතර බරපතල තත්ත්වයේ පසු වූ රෝගීන් බැලීම සඳහා රෝහල් වලට 20 වරක් යාමට සිදුවිය. ආරක්ෂක නිවස්නයේ සාමාන්‍යයෙන් රැඳවියන් 05 දෙනෙකු නඩත්තු කරන අතර එහි රැකවරණය ලබාදුන් සමස්ථ රැඳවියන් ගණන 45 කි.

**14. එක්සත් අරාබි එමීර් රාජ්‍යය**

**i. අබුඩාබි හි තානාපති කාර්යාලය**

**අ. ද්විපාර්ශ්වික සබඳතා**

i. 2017 ජනවාරි 15 - 17 දිනවලදී අබුඩාබි හි දී පැවති ආසියා සහයෝගිතා සංවාදයේ 15 වැනි අමාත්‍ය මට්ටමේ රැස්වීම (ACD) ට ශ්‍රී ලංකාව සහභාගි විය.

ii. 2017 මැයි 23 - 24 දිනවලදී අබුඩාබි හි දී පැවති 13 වැනි IRENA රැස්වීමට දූත මණ්ඩලය සහභාගි විය.

iii. ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය රුවන් විජේවර්ධන මැතිතුමා 2017 පෙබරවාරි 19 - 23 දිනවලදී අබු-ඩාබි හි දී පැවති ජාත්‍යන්තර ආරක්ෂක ප්‍රදර්ශනය හා සමුළුව 2017 සඳහා සහභාගි විය.

iv. ජනවාරි 12 - 21 දිනවලදී පැවති අබුඩාබි තිරසාර සතිය - 2017 (ADSW 2017) සඳහා දූත මණ්ඩලය සහභාගි විය.

v. ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සාමාජිකයින් 20 දෙනෙකුගෙන් යුතු ජ්‍යෙෂ්ඨ හමුදා නියෝජිත කණ්ඩායමක් 2017 අගෝස්තු 10 -22 දිනවල දී එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ අධ්‍යයන චාරිකාවක නිරත විය.

vi. විදේශ රැකියා හා අධිකරණ අමාත්‍ය ගරු තලතා අතුකෝරල මැතිනියගේ නායකත්වයෙන් යුතු නියෝජිත කණ්ඩායමක් අබුඩාබි සංවාදයට සහභාගි වීම සඳහා 2017 සැප්තැම්බර් 13 වැනි දින එක්සත් එමීර් රාජ්‍යයේ සංචාරයක නියැලුණ අතර එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ මානව සම්පත් හා එමීර්කරණය පිළිබඳ අමාත්‍යවරයා හමුවිය.

**ආ. ආර්ථික සබඳතා සහ විදේශීය ආයෝජන**

i. මෙම දූත මණ්ඩලය, ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමඟ එක්ව, 2017 මැයි 4 - 6 දිනවලදී පැවති සංචාරක ප්‍රවර්ධන වැඩසටහනක් වන “Destinations 2017 – Travel and Tourism Expo, Abu Dhabi” සංවිධානය කළේය. මෙම වැඩසටහනට සහභාගි වූ ඉන්දියාව, ඉන්දුනීසියාව, තායිලන්තය, මැලේසියාව ඇතුළු රටවල් 7ට ශ්‍රී ලංකාව ද ඇතුළත් විය. තවද, ශ්‍රී ලාංකික ළමා කණ්ඩායමක් විසින් රඟ දක්වන ලද සංස්කෘතික නැටුමකින් මෙය උත්කර්ෂවත් විය.

ii. ලංකා තේ- වසර 150 සපිරීම සැමරීම සඳහා 2017 ජූලි 06 වැනි දින ඩුබායි හි දී ගෝලීය ලංකා තේ සාදය පවත්වන ලදී.

**ඇ. සංස්කෘතික සබඳතා**

i. ශ්‍රී ලංකාවේ 69 වැනි නිදහස් දිනය, 2017 පෙබරවාරි 17 වැනි දින “Abu Dhabi Folclore” රංග ශාලාවේ දී සමරන ලදී.

ii. ඕමානයේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව සමග එක්ව, මෙම දූත මණ්ඩලය, 2017 සිංහල හා හින්දු අලුත් අවුරුද්ද, වෙසක් දිනය හා ඉෆ්තාර් සමරනුවස්, සංස්කෘතිකාංග සංවිධානය කළේය.

iii. දූත මණ්ඩලයට අනුයුක්තව පවත්වාගෙන යනු ලබන සිකුරාදා දහම් පාසැල මගින් ද උත්සවාංග කීපයක් සංවිධානය කරන ලදී.

iv. මෙම දූත මණ්ඩලය, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ දී ගංවතුර හා නායයෑම් ආධාර එකතු කිරීමේ පරිශ්‍රමයක නියැලුණ අතර, එහිදී ශ්‍රී. ලං. රු.15,655,257.02 ක මුදලක්

(එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ “ලුලු ඉන්ටර්නැෂනල්” ලබා දුන් ශ්‍රී. ලං. රු.15,297,024.00 ක මුදල් පරිත්‍යාගය මීට ඇතුළත් වෙයි) එක්රැස් කර ගැනීමට හැකි විය. එහි දී එක් රැස් කළ ද්‍රව්‍ය අතර ආහාර ද්‍රව්‍ය, ඇඳුම් පැළඳුම්, සනීපාරක්ෂක ද්‍රව්‍ය ආදිය ද රැස්විය.

**ඈ. කම්කරු සුභසාධනය**

i. මෙම දූත මණ්ඩලය විසින්, සෑම මසකම, අබුඩාබි නගරයෙන් කි.මී. 260 ක් දුරින් පිහිටි අල් එයින් පළාතේ කොන්සියුලර් හා කම්කරු ජංගම සේවාවන් පවත්වනු ලැබේ.

ii. ආරක්ෂණ නිවස්නයේ රැකවරණය පැතූ ගෘහ සේවිකාවන් 32ක් ශ්‍රී ලංකාවට පිටත් කොට යවන ලදී.

**ii. එක්සත් අරාබි එමිරේඩ් ඩුබායි කොන්සල් ජනරාල් කාර්යාලය**

**අ. ආර්ථික සබඳතා හා විදේශීය ආයෝජන**

i. ආර්ථික සංවර්ධන බැංකුව හා (EDB) හා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය (SLTB) සමග එක්ව, 2017 පෙබරවාරි 26 - මාර්තු 2 දිනවල දී පැවති “Gulf Food 2017”ට සහභාගී වීම සඳහා ශ්‍රී ලාංකික ආහාර හා පාන වර්ග අපනයනය කරනු ලබන වෙළෙඳ සමාගම් රාශියකට අවශ්‍ය පහසුකම් සලසන ලදී.

ii. ශ්‍රී ලංකා තේ කර්මාන්තයට වසර 150ක් සපිරීම සනිටුහන් කරමින් ගෝලීය තේ සාදය ඩුබායි හි ක්‍රවුන් ප්ලාසා හෝටලයේදී උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී.

iii. ශ්‍රී ලංකාවේ 69 වැනි නිදහස් දිනය සමරනු වස්, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ප්‍රධාන පෙළේ ඉංග්‍රීසි ප්‍රවෘත්ති පත්‍රයක් වන බලීජ් ටයිමස් හි විශේෂ ප්‍රවෘත්ති පත්‍ර අතිරේකයක් 2017 පෙබරවාරි 04 වැනි දින පළ කරන ලදී. ශ්‍රී ලංකාවේ අපනයන, සංචාරක අභිලාෂයන්, ශ්‍රී ලංකන් එයාර් ලයින් ආදිය සඳහා පුළුල් ප්‍රචාරයක් ලබාදීම මෙහි අරමුණ විය.

iv. එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ක්‍රියාත්මක වන ව්‍යාපාරික රෙගුලාසි පිළිබඳ ව්‍යාපාරික නායකයන් දැනුමවත් කිරීම සඳහා ඩුබාහි පිහිටි ශ්‍රී ලංකා ව්‍යාපාරික කවුන්සිලය සමඟ එක්ව ව්‍යාපාර ජාලකරණ අංගයක් සංවිධානය කරන ලදී.

v. එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඇති ආහාර ක්ෂේත්‍රයේ ප්‍රධාන පෙළේ සමාගමක් වන බරකත් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා සමඟ ශ්‍රී ලාංකික කෘෂිකර්ම අපනයන එක්සත් අරාබි එමීර් රාජ්‍යයට එවීම වැඩිදියුණු කිරීම සඳහා යෝග්‍ය වැඩ පිළිවෙළකට එළඹීමට ඇතිහැකියාව පිළිබඳව සාකච්ඡා කරන ලදී.

vi. සමාලෝචනය බඳුන් වූ කාලය තුළදී අමාත්‍යවරුන් 8 දෙනෙකුගේ ඩුබායි සංචාර හා පහසුකම් සලසන ලදී.

vii. තේ කුළු බඩු, පොල් නිෂ්පාදන, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ නිෂ්පාදන ආදිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව නගන ලද වෙළෙඳ ප්‍රශ්න 27 කට

ව්‍යාපාරික සබඳතා ගොඩනගා ගැනීමට කැමැත්තක් දක්වන ආනයනකරුවන් පිළිබඳ විස්තර ලබාදෙමින් පිළිතුරු සපයන ලදී.

viii. ශ්‍රී ලාංකික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලාංකික අපනයනකරුවන් 35 දෙනෙකු ඩුබායි බලා පිටත් විය.

ix. ශ්‍රී ලංකාවේ ඇති ශ්‍රී ලාංකික වෙළෙඳ සමාගමකට අයත් තට්ටු නිවාස ස්වභාවයේ දේපළ ප්‍රවර්ධනය කිරීම සඳහා දේපළ ප්‍රවර්ධන වැඩසටහනක් පවත්වන ලදී. ඩුබායි වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාවේ සාමාජිකයින් හා විදේශිකයන් විශාල සංඛ්‍යාවක් මෙම අවස්ථාවට සහභාගි වූහ.

x. ඇ. ඩො. මිලියන 10 ක ට අධික මුදල් ප්‍රමාණයක් ආයෝජනය කරමින් කටුනායක කෘෂිකර්ම නිෂ්පාදන රැස්කරන හා ආහාර සැකසීමේ මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා, එක්සත් අරාබි එමිර් රාජ්‍යයේ හා මැද පෙරදිග පිහිටි සුවිශාල ඉන්දියානු හයිපර්මාකට් එකට සහාය ලබාදෙන ලදී.

මෙම වෙළෙඳ සමාගම දැනටමත් ඔවුන්ගේ වාණිජ කටයුතු ශ්‍රී ලංකාවේදී ආරම්භ කර ඇති අතර ඉදිරි වර්ෂ කීපය තුළදී ඇ. ඩො බිලියන 11 දක්වා ඔවුන්ගේ ආයෝජන පුළුල් කිරීමට සැලසුම් සකසමින් සිටියි.

xi. කර්මාන්ත හා වාණිජ අමාත්‍ය ගරු රිෂාඩ් බදියුදීන් මැතිතුමා බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා, සහ කෘෂිකර්ම, ඉඩම් වාරිමාර්ග අමාත්‍යතුමාගේ ලේකම් එන්. නිල්වලා මහතා සමග, 2017 අප්‍රියෙල් 2 - 4 දිනවලදී ඩුබායි හි පැවති වාර්ෂික ප්‍රධාන ආයෝජන ප්‍රවර්ධන වැඩසටහනක් වනAIM වැඩසටහනට සහභාගීවීම සඳහා ඩුබායි බලා පිටත් විය.

xii. ශ්‍රී ලංකාවේ ඇ.ඩො. මිලියන 2කට අධික ආයෝජන සිදු කිරීමට කැමැත්ත ලබා ගැනීම සඳහා කැපූ මල් සඳහා හා එක්සත් අරාබි එමිර් රාජ්‍යයේ සහ GCC හි සමස්ථ වෙළෙඳපළ කොටස්වලින් 50%කට අධික කොටස් හිමි ප්‍රධාන වෙළෙඳ පළ වනබිලාක් ටියුලිප් ෆ්ලවර්ස් වෙළෙඳ සමාගමේ විදේශ මෙහෙයුම් අධ්‍යක්ෂවරයා සමග සාකච්ඡා පවත්වන ලදී.

xiii. සංචාරක හෝටලයක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම පිළිබඳව සලකා බැලීමට කැමැත්තක් දක්වන "ඇම්බිෂන් ගෲප් ඔෆ් කම්පැනීස් හි සභාපතිවරයා හා අධ්‍යක්ෂවරයකු සමග රැස්වීමක් පවත්වන ලද අතර ඔහුගේ ශ්‍රී ලංකා සංචාරය හා අදාළ ආයෝජන මණ්ඩල නිලධාරීන් හා වෙනත් බලධාරීන් හමුවීම පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී. ඇ. ඩො. මිලියන 3 - 5 ක සමස්ථ ආයෝජනයක් සිදුකිරීමෙන් සංචාරක හෝටලයක් ආරම්භ කිරීම සඳහා අහුන්ගල්ලේ දැනට පවත්නා සංචාරක දේපළක් සමඟ මෙම සමාගම කොන්ත්‍රාත්තුවකට අත්සන් තබන ලදී.

xiv. සිනමාශාලා හා වෙනත් සේවා පහසුකම් සහිත විශාල පරිමාණයේ නවීන හයිපර් වෙළඳපළක් කොළඹ දී ඉදිකිරීම සඳහා සුදුසු ඉඩම් කැබැල්ලක් සොයා ගැනීම

පිළිබඳව අගාමාත්‍ය කාර්යාලයේ ශ්‍රී ලංකා ව්‍යාපෘති නිලධාරීන් හා නියෝජිතයින් සමග එක්ව ලුලු හයිපර්මාකට් හි කණ්ඩායම් අධ්‍යක්ෂකවරයා සමග හමුවක් පවත්වන ලදී. මෙම ආයෝජනයේ සමස්ත ඇස්තමේන්තු ගත වටිනාකම ඇ. ඩො. මිලියන 1 ක් පමණ වනු ඇත.

ආ. සංස්කෘතික සබඳතා

i. ශ්‍රී ලාංකික ප්‍රජාව සමග එක්ව, මෙම තානාපති කාර්යාලය, ජාතික දිනය, වෙසක් දිනය හා පොසොන් දිනය සනිටුහන් කරමින් සංස්කෘතික අංග සැමරුම සංවිධානය කරන ලදී

ii. ඩුබායි හි අභිනවයෙන් ඉදි කළ ලංකාරාමය විහාරස්ථානයේදී මාසිකව සිදුකරනු ලබන බෞද්ධ ආගමික කටයුතු.

iii. සෑම සිකුරාදා දිනකම කොන්සල් ජනරාල් කාර්යාලයීය පරිශ්‍රයේ දහම් පාසැලක් පැවැත්වීම.

ඇ. කම්කරු සුභසාධනය

i. රැකියා කොන්ත්‍රාත්තු 326 ක් ක්‍රියාත්මක කරන ලද අතර නව රැකියා 111 ක් ප්‍රදානය කරන ලදී.

ii. දුෂ්කරතාවලට මුහුණදුන් ශ්‍රී ලාංකික සේවාදායකයන් 30 දෙනෙකු සාර්ථකව ශ්‍රී ලංකාවට ආපසු එවන ලදී.

iii. ශ්‍රී ලංකාවේ දිළිඳු පුද්ගලයන්ට අවශ්‍ය සහාය ලබාදීම සඳහා ඩුබායි හා උතුරු එමිරේටයේ සිටින ආගමන හා පොලිස් නිලධාරීන් හමුවීම සඳහා 85 වාරයක් යෑමට සිදු විය.

iv. බලධාරීන්ගේ ඉල්ලීම්වලට අනුව ශ්‍රී ලාංකිකයන්ගේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා කම්කරු කඳවුරු කීපයකට යාමට සිදු විය.

v. සිරභාරයේ පසුවන ශ්‍රී ලාංකිකයන්ගේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා 17 වරක් බන්ධනාගාරවලට යෑමට සිදු විය.

vi. ශ්‍රමිකයන් බඳවා ගැනීමේ නියෝජිතායතනවලට එරෙහිව පැමිණිලි 104 ක් ලැබී ඇති අතර ඒවාට විසඳුම් ලබා දීම සඳහා කටයුතු කරන ලදී.

vii. ශ්‍රී ලාංකිකයන් විසින් වන්දි මුදල් ඉල්ලා සිටීම්ඃ ආරක්ෂක නිවස්න රැඳවියන්ගේ අවශ්‍යතාඃ මෘත දේහ ශ්‍රී ලංකාවට එවීම පිළිබඳව ප්‍රමුඛත්වය ලබාදෙමින් ඒ පිළිබඳව කටයුතු කරන ලදී.

viii. විපතට පත් ශ්‍රී ලාංකිකයන්ගේ සුභසාධනය උදෙසා ඩුබායි හා උතුරු එමිරේටයේ ඇති රෝහල්වලට 16 වතාවක් යාමට සිදු විය.

***

# සාගර කටයුතු ක්‍රමෝපායික ආරක්ෂාව හා දේශගුණික විපර්යාස පිළිබඳ අංශය

**සාගර කටයුතු ක්‍රමෝපායික ආරක්ෂාව හා දේශගුණික විපර්යාස පිළිබඳ අංශය**

1. 2016 ජනවාරි 25 දිනැති, ''ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ වාර්තාවේ'' දක්වා ඇති නිර්දේශ පදනම් කරගනිමින් විදේශ කටයුතු අමාත්‍යාංශයේ සාගර කටයුතු, ක්‍රමෝපායික ආරක්ෂාව හා දේශගුණික විපර්යාස පිළිබඳ මෙම අංශය 2016 පෙබරවාරි 15 වැනි දින ස්ථාපනය කරන ලදී. මෙම අංශය සඳහා කාර්ය මණ්ඩලය පත් කිරීමත් සමගම 2017 මාර්තු මාසයේ දී මෙම අංශය පූර්ණ වශයෙන් සිය කාර්යය කටයුතු ආරම්භ කර ඇත.

2. සාගර කටයුතු ක්‍රමෝපායික ආරක්ෂාව හා දේශගුණික විපර්යාස යන ක්ෂේත්‍ර සුවිශේෂී වැදගත් කමකින් යුතු හා ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය තුළ මෙතෙක් විශේෂ අවධානයක් යොමු නොකළ ක්ෂේත්‍රයන්ය. මෙම අමාත්‍යාංශයේ අංශ කීපයක් මගින් දැනට ආවරණය කරනු ලබමින් තිබෙන එකිනෙක බැඳී පවතින ගැටලු මෙම ක්ෂේත්‍ර මගින් ආවරණය වෙයි. මීට අමතරව, රේඛීය අමාත්‍යාංශ හා නියෝජිතායතන කීපයකට මෙම විෂයයන් සම්බන්ධයෙන් සෘජු වගකීමක් පැවරී ඇත. කෙසේ වෙතත්, ජාත්‍යන්තර සබඳතා පවත්වාගෙන යාමේදී මෙම ක්ෂේත්‍රවලට ලබා දී ඇති ප්‍රමුඛතාව හේතුකොට ගෙන අමාත්‍යාංශය තුළ දී මෙම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍ය වන බව හැඟී ගිය හෙයින් මෙම නව අංශය ස්ථාපනය කරන ලදී. මෙම අංශයේ කාර්යය කටයුතු වලදී ප්‍රධාන වශයෙන් පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කෙරේ.

   i. සාගර කටයුතු, උපාය මාර්ගික ආරක්ෂාව හා දේශගුණික විපර්යාස කෝණයකින් බලන කළ අදාළ වන ව්‍යාපෘති / වෙනත් කටයුතු හඳුනා ගැනීම හා ඒවා හැකි තරමින් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ බලධාරීන්ගේ අවධානයට යොමු කිරීම,

   ii. සාගර කටයුතු, උපාය මාර්ගික ආරක්ෂාව හා දේශගුණික විපර්යාස වලට අදාළ සංවාද/ සමුළු/ වැඩමුළු සඳහා වේදිකාවක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම,

   iii. සාගර කටයුතු, උපාය මාර්ගික ආරක්ෂාව හා දේශගුණික විපර්යාස වලට අදාළ ගැටලු පිළිබඳව විදේශ ප්‍රතිපත්ති ආකල්පයකින් යුතුව අදාළ බලධාරීන්ට යෙදවුම් ලබාදීම,

   iv. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය කෙරෙහි සාගර කටයුතු, උපායමාර්ගික ආරක්ෂාව හා දේශගුණික විපර්යාස මගින් සිදුවන බලපෑම පිළිබඳව පර්යේෂණ කිරීම සහ ප්‍රතිපත්ති සකසන්නට යෙදවුම් ලබාදීම,

   v. සාගර කටයුතු, උපායමාර්ගික ආරක්ෂාව හා දේශගුණික විපර්යාස පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් කටයුතු කරන පාර්ශ්වකරුවන්ට යෙදවුම් කිරීම සඳහා යෝග්‍ය ආකාරයේ පහසුකම් සැලසීම,

   vi. සාගර කටයුතු, උපායමාර්ගික ආරක්ෂාව හා දේශගුණික විපර්යාසවලට අදාළව ශ්‍රී ලංකාව මගින් සිදුකරනු ලබන කටයුතු විශේෂයෙන්, මේවා ජාත්‍යන්තර වශයෙන් සිදු කිරීමේ දී, එම කටයුතු පිළිබඳ සම්බන්ධීකරණය හා සහයෝගිතාව තහවුරු කිරීම හා ප්‍රවර්ධනය කිරීම,

vii. සාගර කටයුතු, උපායමාර්ගික ආරක්ෂාව හා දේශගුණික විපර්යාසවලට අදාළ ජාත්‍යන්තර සමුළු /වැඩමුළුවලට ලංකාවේ නියෝජනය සිදුවන බව තහවුරු කර ගැනීම.

viii. ශ්‍රී ලංකාවේ භූ උපායමාර්ගික ශක්තිය ප්‍රවර්ධනය කරමින් සන්නිවේදන කටයුතු/ වාර්තා/ සංකල්ප පත්‍රිකා සැකසීම.

ix. සාගර කටයුතු, උපාය මාර්ගික ආරක්ෂාව හා දේශගුණික විපර්යාස ක්ෂේත්‍රයේ දී හමුවන, කලාපීය හා ගෝලීය අභියෝග හඳුනා ගැනීමේදී ලංකාවේ ධනාත්මක දායකත්වය ලබා දිය හැකි අවස්ථාවලදී ඒ සඳහා පහසුකම් සැලසීම.

x. සාගර කටයුතු, උපාය මාර්ගික ආරක්ෂාව හා දේශගුණික විපර්යාස යන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ පද්ධතිය තුළ දී සිදුවන කටයුතු ඇතුළුව ජාත්‍යන්තර වශයෙන් සැලසුම් කොට දැනට සිදු කරනු ලබන කටයුතු වලට, සහයෝගීතාව ලබාදිය හැකි ක්ෂේත්‍ර හඳුනා ගැනීමේ අරමුණෙන් නිරතුරුවම එම කටයුතු වලට දායකත්වය ලබාදීම.

xi. සාගර කටයුතු, උපාය මාර්ගික ආරක්ෂාව හා දේශගුණික විපර්යාස වලට අදාළ කටයුතු වලදී අත්දැකීම් හා පළපුරුද්ද, උසස් පරිචයන්, මෙවලම් හා ක්‍රමවේද හා උගත් පාඩම් බෙදාහදාගැනීම ඇතුළුව අන්තර්-නියෝජිතායතන තොරතුරු හුවමාරුව සඳහා පහසුකම් සැලසීම.

xii. උපාය මාර්ගික ආරක්ෂාව පිළිබඳ ආකල්පයකින් බලන කළ, විදේශ කටයුතු හා රාජ්‍ය ආරක්ෂාව අතර ඇති සබඳතා සැළකිල්ලට ගනිමින් විදේශ රටවල පිහිටි හඳුනාගත් ලංකා දූත මණ්ඩල හා වෙනත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ එක්ව ආරක්ෂක අමාත්‍යාංශයෙන් කරනු ලබන ආරක්ෂක රාජ්‍යතාන්ත්‍රික කටයුතුවලට පහසුකම් සැලසීම හා සහාය දැක්වීම.

xiii. ආරක්ෂක ආයතන, නීතිය බලාත්මක කිරීමේ නියෝජිතායතන හා ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන විද්වත් මණ්ඩල සමග සබඳතා ස්ථාපනය කිරීම හා පවත්වාගෙන යාම.

xiv. සාමුද්‍රික අවකාශ සැලසුම් කිරීම, සාමුද්‍රික ආරක්ෂක උපායමාර්ගය හා සාමුද්‍රික උපාය මාර්ගයක් ඇතුළත් කරමින් ලංකාව සඳහා සමෝධානික සාමුද්‍රික ප්‍රතිපත්තියක් සැකසීම සඳහා පහසුකම් සැලසීම.

xv. විවිධ රටවල භාවිත වෙමින් පවතින දේශගුණික විපර්යාස අඩුකිරීමේ නව තාක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳව දේශගුණික විපර්යාස පිළිබඳ ලේකම් කාර්යාලය හා වෙනත් අභ්‍යන්තර පාර්ශ්වකරුවන් සමඟ තොරතුරු හුවමාරු කර ගනිමින් ඒ සඳහා සහාය ලබාදීම හා පහසුකම් සැළසීම.

xvi. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය, තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය, දේශගුණික විපර්යාස පිළිබඳ ලේකම් කාර්යාලය, විද්වත් මණ්ඩල, සිවිල් සමාජ සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන,

එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, කලාපීය හා ගෝලීය සංවිධාන හා දේශගුණික විපර්යාස කටයුතු කරන පෞද්ගලික අංශ සමාගම් සමඟ සබඳතා ස්ථාපනය කිරීම සහ පවත්වා ගැනීම.

සමාලෝචනයට බඳුන් කරනු ලැබූ කාල සීමාව තුළදී මෙම අංශය මගින් ඉටු කරන ලද කාර්ය කටයුතු මෙසේය:-

1. නිව්යෝර්ක් හි එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේ දී 2017 ජූනි 5-9 දිනවලදී පැවැති තිරසාර සංවර්ධන ඉලක්කවල 14 වැනි ඉලක්කය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය ලබාදීමට එක්සත් ජාතීන්ගේ ඉහළ මට්ටමේ සමුළුවට ලංකා නියෝජිත කණ්ඩායමේ සහභාගීත්වය ලබා දීම සඳහා පෙර සූදානම් කටයුතු සිදුකිරීම 2017 මැයි 25-26 දිනවලදී ලංකාවේ පැවැති තිරසාර සංවර්ධන ඉලක්ක 14 සඳහා සහාය ලබාදීමේ එක්සත් ජාතීන්ගේ ඉහළ මට්ටමේ සමුළුව සඳහා ජාතික උපදේශන සංවිධානය කිරීම පිළිබඳ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී. පෙර සූදානම් වීමේ රැස්වීම් පැවැත්වීම, න්‍යාය පත්‍ර දේශන ආදිය සැකසීම මීට අදාළව සිදු විය.

2. 2017 අගෝස්තු 30 සැප්තැම්බර් 02 දක්වා ලංකාවේ කොළඹ දී පවත්වන ලද දෙවන ඉන්දියානු සාගර සමුළුව - අග්‍රාමාත්‍ය කාර්යාලය හා ඉන්දියානු අරමුදල සමඟ එක්ව මෙම සමුළුව සංවිධානය කිරීමේ දී සහාය දක්වමින් පහසුකම් සලසන ලදී. ඉහළ මට්ටමේ නියෝජනයක් සහිතව රටවල් 32කට අධික සංඛ්‍යාවක නියෝජිතයෝ 300 දෙනෙක් පමණ මෙම සමුළුවට සහභාගී වූහ.

3. ඉන්දියානු සාගර ආචාරධර්ම සංග්‍රහය පිළිබඳ රැස්වීම සඳහා පෙර සූදානම් කටයුතු(මෙම රැස්වීම 2018 අග භාගයේදී පැවැත්වීමට තාවකාලිකව නියම කරගෙන ඇත)

   ඉන්දියානු සාගරයේ යාත්‍රා නිදහස පිළිබඳ ආචාර ධර්ම සංග්‍රහයක් පිළිබඳ මූලික සමුළු 2 ක් හා ප්‍රධාන රාජ්‍යතාන්ත්‍රික තත්කාර්ය සමුළුවක් සංවිධානය කිරීමට අග්‍රාමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ කාර්ය සාධන බලකායේ වැඩකටයුතු සඳහා සහාය ලබාදීම. ශ්‍රී ලංකාව සඳහා ස්වෛරී ඉලක්ක සලකා බැලීම සහ කාර්ය සාධන බලකායේ වැඩ කටයුතු සඳහා කාර්ය නිර්දේශයේ කෙටුම්පත් මෙම අංශය විසින් සකසා දී තිබේ.

4. අපගේ සාගර සමුළුව, 'අපගේ සාගරය සහ ජීවය සඳහා සාගරයක්' යන්න 2017 ඔක්තෝබර් 5-6 දිනවලදී මෝල්ටාවේ දී පවත්වන ලදී. මෝල්ටාවේ පැවති අපගේ සාගර සමුළුවට විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානායක මැතිතුමාගේ නායකත්වයෙන් යුතු ශ්‍රී ලංකාවේ නියෝජිත කණ්ඩායමේ සහභාගීත්වයට අවශ්‍ය පහසුකම් සලසන ලදී. දේශන සැකසීම, ද්විපාර්ශ්වික රැස්වීම් සහ අදාළ පාර්ශ්වකරුවන්ගෙන් ලද යෙදවුම් සම්බන්ධීකරණය මීට ඇතුලත් විය.

5. එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ සම්මුති සමුළුව :- ගෝලීය සමුද්‍රික සම්පත් කළමනාකරණය සඳහා විසඳුම් 2017 ඔක්තෝබර් 4-6 පෝට් බ්ලෙයාර්, අන්දමන් හා නිකොබා දූපත්, ඉන්දියාව; මෙම සමුළුව සඳහා වූ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමාගේ සුභපැතුම් කථාවේ කෙටුම්පත පිළියෙළ කරන ලදී.

6. සාගර කටයුතු, උපායමාර්ගික ආරක්ෂාව හා දේශගුණික විපර්යාස වලට අදාළ ගැටළු පිළිබඳව කටයුතු කරන විදේශ කටයුතු අමාත්‍යාංශයේ තොරතුරු ඒකකය ලෙසද මෙම අංශය කටයුතු කරයි. එහිදී ගරු අමාත්‍යවරයාට ගරු රාජ්‍ය අමාත්‍යවරයාට හා ජාත්‍යන්තර හා දේශීය මට්ටමින් ශ්‍රී ලංකාව නියෝජනය කරන ඉහළ මට්ටමේ නියෝජිත කණ්ඩායම්වලට අවශ්‍ය වන හා ඉල්ලා සිටින තොරතුරු මෙම ඒකකය විසින් ලබාදෙනු ලැබේ.

7. සමාලෝචනයට බඳුන්වන කාලසීමාව තුළදී ද්වීපාර්ශ්වික, බහු පාර්ශ්වික රැස්වීම්/සමුළු හා වෙනත් අවස්ථා රැසක් සඳහා කථා/යෙදවුම්/සාකච්ඡා කරුණු සපයන ලදී.

8. 2017 ඔක්තෝබර් 9-13 දිනවලදී සිංගප්පූරුවේ පැවති අප ජලය කළමනාකරණය හා කරදිය කුණුරොඩු පාලනය කිරීම පිළිබඳ කළාපීය පුහුණු වැඩසටහන සඳහා තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ ලේකම්, ආර්. එම්. ඩී. බී. මීගස්මුල්ල මහතා ද සහ 2017 සැප්තැම්බර් 15 බැංකොක් නුවර පැවති නිත්‍ය මුහුදු ගමන් පිළිබඳව කටයුතු කිරීම සඳහා පූර්ණ වශයෙන් ප්‍රවේශවීමේ වැඩසටන් මාලාව සඳහා කෙටුම්පත් ද්‍රව්‍ය පිළිබඳ බාලි ක්‍රියාදාමයේ උපදේශන රැස්වීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සිවිල් ආරක්ෂාව හා සංවර්ධනය) එන්ජී. පණ්ඩිතරත්න මහතා සහභාගී කරවීම සඳහා අවශ්‍ය පහසුකම් සලසන ලද්දේ මෙම අංශය මගිනි.

9. ජාත්‍යන්තර, කලාපීය හා ජාතික මට්ටම්වලදී විදේශ කටයුතු අමාත්‍යාංශය නියෝජනය කරන මෙම අංශය නගර කටයුතු, දේශගුණික විපර්යාස හා උපායමාර්ගික ආරක්ෂාවට අදාළ ගැටළු සම්බන්ධයෙන් මෙන්ම රේඛීය අමාත්‍යාංශ, නියෝජිතායතන හා ආයතන සමග ද කටයුතු කරයි.

10. සාගර කටයුතු, උපායමාර්ගික ආරක්ෂාව හා දේශගුණික විපර්යාස සමබන්ධයෙන් ශ්‍රී ලංකාවේ කාර්යසාධනය ශක්තිමත් කිරීමේ අරමුණෙන් මෙම අංශය මගින් පර්යේෂණ කටයුතු ආරම්භ කර තිබේ. ගෝලීය බල මාරුව හා ජාත්‍යන්තර දේශපාලන තත්ත්වයේ ඇතිවී ඇති සුවිශාල වෙනස්කම් හේතුකොට ගෙන සියලුම මට්ටම්වලදී, සාගර කටයුතු, දේශගුණික විපර්යාස හා උපායමාර්ගික ආරක්ෂාව සහ ක්‍රමවේදයේ වැදගත්කම මෙම අංශය හඳුනාගනියි.

11. මෙම අංශය ආරක්ෂක අමාත්‍යාංශයේ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සමඟ සහයෝගීතාවයෙන් යුතුව කටයුතු කරමින් පාර්ශ්වකාර සිතියමක් සැකසීමේ ක්‍රියාවලියේ නියුක්තව සිටියි. ඉන්දියානු සාගර කටයුතු සම්බන්ධයෙන් ස්ථාපනය කොට ඇති ජාත්‍යන්තර සංවිධාන/ගිවිසුම්/සංගම්/තත්කාර්ය වැඩපිළිවෙළවල් පදනම් කර ගනිමින් මෙම ඩිජිටල් පාර්ශ්වකාර සිතියමේ පළමු අදියරේ වැඩකටයුතු නිම කොට තිබේ.

12. සමුද්‍රයට අදාළ කරුණු සම්බන්ධයෙන් රටවල් ගණනාවක් සමඟ සම්බන්ධකම් ඇතිකර ගෙන මෙම අංශයේ කටයුතු කරගෙන යන ලදී. 2017 වර්ෂය මුළුල්ලේ ප්‍රංශය, ජර්මනිය, නෝර්වේ, ජපානය, එක්සත් ජනපදය ඉන්දියාව සහ ඕස්ටේ්‍රලියාව යන රටවල නියෝජිතයන් සමඟ විශේෂයෙන් සාකච්ඡා පැවැත්විණ.

13. 2017 දෙසැම්බර් මාසයේදී නෝර්වීජියානු රජය සමඟ විදේශ කාර්යාලයේදී පවත්වන ලද උපදෙස් සාකච්ඡාවේදී කරන ලද ඉල්ලීම් වලට ප්‍රතිචාරාත්මකව පහත සඳහන් පරිශ්‍රමයන්හිදී සහයෝගය සලසා දීමට නෝර්වීජියානු පාර්ශවයේ කැමැත්ත පළ විය :-

(අ) ශ්‍රී ලංකාව මහද්වීපික තටාක කොමිසන් සභාව වෙත ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳ ඉදිරි කටයුතු වලදී නෝර්වීජියානු විශේෂඥ ඥාණය මගින් තව දුරටත් සහය සලසා දීමට (මෙය 2017 ජූනි 19 වන දින අත්සන් කරන ලද ගිවිසුම යටතේ "ශ්‍රී ලංකාවේ ඉදිරිපත් කිරීම් වලට පක්ෂව තාක්ෂණික සහාය ලබාදීම " පිළිබඳ ව්‍යාපෘතිය යටතේ තානාපති කාර්යාලය මගින් ලබාදෙන ලද ආධාර ඉදිරියට ගෙන යාමකි.)

(ආ) 2018 දී ශ්‍රී ලංකාවේ සමුද්‍රීය අවකාශ කළමනාකරණය යන ජාතික වැඩමුළුව පැවැත්වීම සඳහා නෝර්වීජියානු විශේෂඥ දැනුම ලබාදීමට

(ඇ) වර්ෂයේදී විදේශ කටයුතු වලට අමාත්‍යංශය මගින් දියත් කරන ලද "නෝර්වේ විදේශ හා සංවර්ධන ප්‍රතිපත්තිය තුළ සාගරවලට හිමි තැන" යන මුල්ම ධවල පත්‍රිකාව කෙටුම්පත් කිරීමේදී අත්දැකීම් බෙදා හදා ගැනීම සඳහා නිලධාරීන් /විශේෂඥයන් යැවීමට.

(ඈ) ඩොක්ටර් ෆ්‍රිඩ්ටි ඔෆ් නේෂන් නෞකාව යොදා පැවැත්වීමට නියමිත මත්ස්‍ය තොග ඇතුළු සමුද්‍රීය සම්පත් පිළිබඳ සමීක්ෂණයට සමගාමීව තිරසර සංවර්ධන ඉලක්ක 14 (දිය යට ජීවීන්) ගැන විශේෂ අවධානයෙන් යුතුව "නිල් තිරසර සංවර්ධන ඉලක්ක" පිළිබඳ රැස්වීම හා ධීවර සම්පත් පිළිබඳ තිරසර කළමනාකරණය සම්බන්ධයෙන් 2018 ජුනි මාසයේදී පවත්වන රැස්වීම් වලදි සත්කාරක රට වශයෙන් කටයුතු කිරීමට.

(ඉ) ඉහත සඳහන් ප්‍රශ්න සම්බන්ධයෙන් සාගර කටයුතු හා දේශගුණික විපර්යාස අංශය අදාළ දේශීය පාර්ශවකරුවන් හා නෝර්වීජියානු අංශය සමඟ කටයුතු කරගෙන යයි.

14. 2017 වර්ශයේ පවත්වන ලද පහත සඳහන් ඉහළ පෙළේ ද්විපාර්ශික සංචාර/ සම්මන්ත්‍රණ කථා සකස් කරදීම හා කරුණු සපයා දීම කරන ලදී.

(අ) 2017 ඔක්තෝබර් 5/6 දින වලදී අපේ සාගර සම්මේමලනය සඳහා විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානායක මහතා කළ ප්‍රකාශය.

(ආ) 2017 ඔක්තෝබර් 9/10 දිනවල පැවැති ගාලු සංවාදයේදී විදේශ කටයුතු අමාත්‍යංශයේ ලේකම්වරයා ගාලු සංවාදයේ වැදගත්කම හා සමුද්‍රික සුරක්ෂාතාව වැඩිවීමේ අවශ්‍යතාව යන මැයෙන් කළ කතාව සඳහා දළ සැලැස්මක් සකස් කර දීම.

(ඇ) 2017 ඔක්තෝබර් 4/6 දිනවල ඉන්දියාවේදී ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා වෙනුවෙන් "පොදු ගෝලීය සමුද්‍රීය ප්‍රශ්න වලට විසඳුම්" යන සමුද්‍ර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනයේදී පැවැත්වූ ශුභාශීර්වාදාත්මක දේශනය.

(ඈ) 2017 ඔක්තෝබර් 13 සිට 20 දක්වා කාලය තුළ රුසියාවේ ශාන්ත පීටර්ස්බර්ග්හි පවත්වන ලද 137 වන රැස්වීම සහ අදාළ වෙනත් රැස්වීම් සඳහා යෙදවුම් සැපයීම.

(ඉ) 2017 නොවැම්බර් 15 වනදා කැන්බරාහිදී පැවැති ඕස්ට්‍රේලියා- ශ්‍රී ලංකා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ දෙවන වටයේ සාකච්ඡා සඳහා යෙදවුම් සැපයීම.

(ඊ) 2017 නොවැම්බර් මාසයේදී නැගෙනහිර ආසියා හා පැසිෆික් අංශයට උතුරු නැගෙනහිර උපාය මාර්ගික ආරක්ෂාව පිළිබඳ විස්තර තොරතුරු සැපයීම.

(උ) 2017 දෙසැම්බර් 11 වන දින විදේශ කටයුතු අමාත්‍යංශයේ ලේකම් නෝර්වේ පාර්ශවය සමග විදේශ කාර්යාලයේදී පවත්වන ලද උපදෙස් සාකච්ඡා සඳහා සටහන් සැපයීම.

15. අන්තර් ජාතික මට්ටමේ නියෝජිතයන්හිදී ගරු අමාත්‍යවරයාට, ගරු රාජ්‍ය අමාත්‍යවරයාට හා ලේකම් වරයාට අවශ්‍ය හා ඉල්ලා සිටින සාගර කටයුතු හා දේශගුණික විපර්යාස පිළිබඳ තොරතුරු සැපයීමෙහිලා තොරතුරු සැපයීමේ අංශය වශයෙන් මෙම අංශය කටයුතු කරයි.

**බහු පාර්ශ්වීය සබඳතා**

16. 2017 ඔක්තෝබර් 18 වන දින දකුණු අප්‍රිකාවේ ඩර්බින් හිදී පැවැති ඉන්දියන් සාගර වටද්දර රටවල සංවිධානයේ අමාත්‍ය රැස්වීමට සහභාගී වූ ශ්‍රී ලංකා නියෝජිත පිරිස අංශය මගින් ඉදිරිපත් කරන ලද නිර්දේශ වලට අනුව කටයුතු කිරීමෙන් ඉන්දියන් සාගර වටද්දර රටවල සංවිධානයේ සමුද්‍රීය ආරක්ෂාව හා සුරක්ෂිතභාවය පිළිබඳ සාකච්ඡා වලට ඉහළ මට්ටමින් කටයුතු සමායෝජනය කොට ප්‍රමුඛස්ථානයට එළඹීමට සමත් විය.ඉන්දියන් සාගර වටද්දර රටවල සංවිධානයේ සමුද්‍රීය ආරක්ෂාව හා සුරක්ෂිතභාවය පිළිබඳ මූලික කණ්ඩායම් (ඉන්දියාව, ඕස්ට්‍රේලියාව, ඉන්දුනීසියාව, එක්සත් අරාබි එමිරේඩ් රාජ්‍යය, දකුණු අප්‍රිකාව සහ මැඩගස්කරය ආදී) වෙනත් රටවල ස්ථාපනය කිරීමෙහිලා කටයුතු අංශය මගින් දැනට කරගෙන යනු ලැබේ.තවද කාරක කණ්ඩායම ස්ථාපනය කිරීම සඳහා ප්‍රාරම්භක රැස්වීමක් ශ්‍රී ලංකාවෙහි පැවැත්වීම සඳහාද අංශය මගින් කටයුතු කරනු ලැබේ. සමුද්‍රීය ආරක්ෂාව හා සුරක්ෂිතභාවය පිළිබඳව ක්ෂේත්‍රයේදී ඉන්දියන් සාගර කලාපයේ රාජ්‍යවල සහක්‍රියා කටයුතු ප්‍රවර්ධනය කිරීම අංශය මගින් කරගෙන යනු ලැබේ.

17. ගරු අග්‍රාමාත්‍යවරයාගේ ආරම්භයක් අනුව වෙරළාසන්න රාජ්‍යවල හා සාගරයෙන් ප්‍රයෝජන ලබන්නන්ගේ අභිවෘධිය අරභයා ඉන්දියන් සාගරයේ යාත්‍රා නිදහස ආරක්ෂාකොට තහවුරු කර ගැනීමෙහිලා අංශය මගින් දැනට කටයුතු කරගෙන යනු ලැබේ.ප්‍රථම මාර්ගෝපදේශක සාකච්ඡා සභාව මැල්බන්හි ඩේකින් විශ්ව විද්‍යාලය මගින් 2018 අප්‍රේල් 30-මැයි 1 දිනවල පවත්වනු ලැබේ. එය ශාස්ත්‍රීය සාකච්ඡා සම්මේලනයේ

දෙවන අදියරයි. මේ පිළිබඳ විස්තර http://www.deakin.etu.av about deakin /events/man යන සම්බන්ධතා පුරුකෙන් ලබාගත හැකිය.

- දෙවන මාර්ගෝපදේශක සාකච්ඡා සභාව 2018 ජුනි 21-22 දිනවල කොළඹදී පැවැත්වේ. මෙම සාකච්ඡා සභාව එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලයේ සහයෝගය ඇතිව ජාත්‍යන්තර සබඳතා හා උපායමාර්ගික අධ්‍යයනය පිළිබඳ ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය මගින් සංවිධානය කරනු ලබන අතර එය එම ක්‍රියාවලියේ 1-5 වන අදියර වේ.මෙම ආරම්භක සාකච්ඡාවාර දෙකට අනතුරුව 2018 නොවැම්බර් මාසයේදී රාජ්‍යතාන්ත්‍රික යථායෝගය සාකච්ඡා සභාවක් ලංකාවේදී පවත්වනු ලැබේ.

- අග්‍රාමාත්‍ය කාර්යාලයේ උපදේශකත්වය හා මේ සඳහා අග්‍රාමාත්‍යවරයා විසින් පත් කරනු ලැබ සිටින කාර්ය බලකායේ සහය ඇතිව සංකල්පික රාමුව සකස් කිරීම හා පාර්ශවකරුවන්ට පහසුකම් සලසාදීම ඇතුළුව ඉහත සඳහන් සාකච්ඡා පිළිබඳ මූලික කටයුතු මෙම අමාත්‍යාංශය මගින් ආරම්භ කරනු ලැබේ.

18. සී ෂෙල්ස් හි ලංකා මහා කොමසාරිස්වරයාගේ නිර්දේශවලට අනුව සෝමාලියාවේ වෙරළින් ඔබ්බෙහි සිදුවන මුදුකොල්ලකෑම් පිළිබඳව කටයුතු කරන කණ්ඩායම සමග ලංකාවේ වැඩි සම්බන්ධතා පවත්වා ගැනීමට අංශය මගින් කටයුතු කර ඇත. විශේෂයෙන් සෝමාලියාවේ වෙරළින් ඔබ්බෙහි සිදුවන මුදුකොල්ලකෑම් සම්බන්ධයෙන් මෙහෙයුම් කටයුතු කරන කාර්ය කණ්ඩායමේ ලේකම් කාර්යාල කටයුතු කිරීමට ශ්‍රී ලංකාව ඉදිරිපත් වී ඇත.මේ සඳහා ආරක්ෂක අමාත්‍යංශය මගින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමේ කටයුතු වලට අංශයේ සහාය ලබාදෙන ලදී.අමාත්‍ය මණ්ඩල සන්දේශයේ කෙටුම්පත සකස් කිරීම හා මුහුදේ ආරක්ෂක කටයුතු පිළිබඳ කේන්ද්‍රස්ථානය වන කාරක කණ්ඩායමේ ලේකම් කාර්යාලයේ සේවය සඳහා ශ්‍රී ලංකාව නාවික හමුදාව යෙදවීමට අනුමැතිය ලබා ගැනීම මෙම කටයුතු අතර වැදගත් කාර්යයන් වේ.සෝමාලියා වෙරළින් ඔබ්බෙහි සිදුවන මුදුකොල්ලකෑම් වැළැක්වීමෙහිලා සිදුකරන ජාත්‍යන්තර පරිශ්‍රමයන්ට මහඟු දායකත්වයක් සලසාදීමට ශ්‍රී ලංකාවට හැකිවන අතර එය ඉන්දියන් සාගර කටයුතු වලදී ශ්‍රී ලංකාව වැදගත් කාර්යභාරයක් ඉටුකරන බව පිළිබිඹු කිරීමකි.සමුද්‍රිය කටයුතු පිළිබඳ කාර්ය කණ්ඩායමේ පාර්ශවකරුවන් සමඟ කටයුතු කිරීමෙන් සමුද්‍රිය බල ප්‍රදේශ පිළිබඳව රාජ්‍යයන් දැනුවත් කිරීමෙහිලා කටයුතු කිරීමෙන් හා තොරතුරු බෙදා හදා ගැනීමෙන් ශ්‍රී ලංකාවට වාසි සහගත තත්වයක් උදා වේ.

**වැඩමුළු / සාකච්ඡා සභා / සම්මන්ත්‍රණ**

19. එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ අබුඩාබි හි දී 2017 ඔක්තොම්බර් 9/10 දින වල පවත්වන ලද හතරවන ඉන්දියන් සාගර සංවාදයට ශ්‍රී ලංකා නාවික හමුදාවේ කපිතාන් ඩබ්.එච්.යූ අබේරත්න මහතා සහභාගී කරවීමෙන් අංශයේ සහභාගීත්වය සලසා දෙන ලදී.

20 2017 ඔක්තෝබර් 09-13 දින වල සිංගප්පූරුවේදී පවත්වන ලද අපද්‍රව්‍ය කළමණාකරණය හා සමුද්‍රිය කසළ සීමා කිරීම පිළිබඳ සිංගප්පූරු නෝර්වේ තුන්වන රාජ්‍ය පුහුණු වැඩ සටහනට

තිරසර සංවර්ධනය හා වනජීවී අමාත්‍යංශයේ ලේකම්, ආර්. එම්. ඩී. බී. මීගස්මුල්ල මහතා සහභාගී කරවීමෙන් අංශයේ දායකත්වය සලසා දෙන ලදී.

21 2017 ඔක්තෝබර් 16 වන දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් නිශ්චය කරගත් දායකත්ව පිළිබඳ විශේෂඥ සංවාදයට සාගර කටයුතු හා කාළගුණ විපර්යාස පිළිබඳ අධ්‍යක්ෂ ජෙනරාල් සසිකලා ප්‍රේමවර්ධන මහත්මිය සහභාගී කරවා අමාත්‍යංශයේ දායකත්වය ලබා දෙන ලදී.

22 2017 ඔක්තෝබර් 16-17 දිනවල පවත්වන ලද දේශගුණික විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය සාර්ක් ආසියා සංවර්ධන මණ්ඩල වැඩමුළුවට සාගර කටයුතු හා දේශගුණික විපර්යාස අංශයේ සහකාර අධ්‍යක්ෂ හා සාගර කටයුතු හා දේශගුණික විපර්යාස පර්යේෂණ නිලධාරීන් සහභාගී කරවන ලදී.

23. සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීම පිළිබඳ ගෝලීය ක්‍රියාකාරී වැඩසටහනේ 4 වන අන්තර් ආණ්ඩු සමාලෝචනය රැස්වීම 2017 ඔක්තෝබර් 25-27 දිනවල ඉන්දුනීසියාවේ බාලි නගරයේ දී පවත්වන ලද අතර ඊට සහභාගී වීමට මහවැලි සංවර්ධන හා පාරිසරක අමාත්‍යංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) ජේ. එම්. බී .එස්. බී. ජයවීර මහතාට පහසුකම් සලසා දෙන ලදී.

24. 2017 නොවැම්බර් 6 සිට 9 දක්වා කාලය තුළ බොන්හිදී COP 13 පවත්වන ලද අතර මහවැලි සංවර්ධන හා පාරිසරික නියෝජ්‍ය අමාත්‍ය ගරු අනුරුද්ධ ජයරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් ශ්‍රී ලංකා නියෝජිත පිරිසකගේ සහභාගීත්වය ලබාදීමට අංශය මගින් කටයුතු කරන ලදී.

25. ඉන්දියන් සාගර වටද්දර රටවල සමුද්‍රීය ආරක්ෂාව සාගර කටයුතු හා සුරක්ෂිත භාවය පිළිබඳ විශේෂඥයින්ගේ දෙවන රැස්වීම 2017 නොවැම්බර් 7-8 දිනවල ඉන්දියාවේ නවදිල්ලියේදී පවත්වන ලදී. මෙම රැස්වීමට ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකායේ අණදෙන නිලධාරී එම් එම් පී යූ ආර් ගමගේ මහතාගේ සහ ලුතිනන් කොමාන්ඩර් ආර් ලියනගේ මහතාගේ සහභාගීතාවය ලබාදීමෙහිලා සහාය සලසා දෙන ලදී. මෙම රැස්වීමේදී සාගර කටයුතු හා දේශගුණික විපර්යාස අංශයේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා විදේශ කටයුතු අමාත්‍යංශය නියෝජනය කළේය.

26. 2017 නොවැම්බර් මාසයේ 22, 23 දිනවල බංගලාදේශයේ ඩකා නගරයේදී පවත්වන ලද නිල් ආර්ථිකය පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව සඳහා පහසුකම් සලසා දෙන ලදී. විදේශ කටයුතු අමාත්‍යංශයේ සාගර කටයුතු හා දේශගුණික විපර්යාස අංශයේ වැඩබලන අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙයට සහභාගී විය.

27. එක් ග්‍රහතාරකා සමුළුව 2017 දෙසැම්බර් 12 වන දින ප්‍රංශයේ පැරිස් නගරයේදී පවත්වන ලදී. අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ නියෝජිතයා වශයෙන් කටයුතු කිරීම සඳහා පත් කරන ලද මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු එරාන් වික්‍රමරත්න මහතාගේ නායකත්වයෙන් යුත් ලංකා නියෝජිත කණ්ඩායමක් සහ මුණසිංහ සංවර්ධන ආයතනයේ ආරම්භක සභාපති, නොබෙල් සම්මානලාභී, ජනාධිපති උපදේශක මොහාන් මුණසිංහ මහතා සමුළුවට සහභාගී කරවීමෙන් එහි කටයුතු සමායෝජනය කොට පහසුකම් සලසා දෙන ලදී. ග්‍රහතාරකා

සමුළුවට පත්කරන ලද මුදල් රාජ්‍ය අමාත්‍ය එරාන් වික්‍රමරත්න මහතාගේ නායකත්වයෙන් හා පරම සම්මානනීය මොහෝන් මුණසිංහ මහතාගේ හා සංවර්ධනය පිළිබඳ ආයතනයේ ප්‍රාරම්භක සාමාජික ජනාධිපති උපදේශක මොහෝන් මුණසිංහමහතාගේ සාමාජිකත්වයෙන් යුත් ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායම පත් කිරීමෙන් ඒ සඳහා සහාය සලසා දෙන ලදී.

28. මාසික ආරක්ෂක සමාලෝචන වාර්තා 2017 ඔක්තෝබර් මාසයේ සිට අදාළ ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල වලින් මාසික ආරක්ෂක සමාලෝචන වාර්තා ගෙන්වා ගෙන ඒවා ආරක්ෂක කාර්ය මණ්ඩල ප්‍රධානියා වෙත ඉදිරිපත් කිරීමේ කටයුතු අංශය මගින් කරනු ලැබේ.

29. පුහුණු වැඩ සටහන්

2017 ඔක්තෝබර් 23 සිට නොවැම්බර් 04 දක්වා කාලය තුළ කොරියාවේ යුසු නගරයේ යුසු අභ්‍යාස ආයතනයේ පැවැති සාගර කටයුතු හා දේශගුණික විපර්යාස පිළිබඳ පුහුණු වැඩටහනට සාගර කටයුතු හා දේශගුණික විපර්යාස අංශයේ සහකාර අධ්‍යක්ෂ සහභාගී කරවන ලදී.

****

# විදේශ දූත මණ්ඩල

# පාලන අංශය

## විදේශ දූත මණ්ඩල පාලන අංශය

විදේශ දූත මණ්ඩල පාලන අංශයේ මූලික කාර්යභාරය වන්නේ මූල්‍ය පහසුකම්, මානව සම්පත් සහ එදිනෙදා කටයුතු සඳහා උපදේශකත්වය ඇතුළු අවශ්‍ය සම්පත් සැපයීමෙන්, රටින් බැහැරව පිහිටා ඇති ශ්‍රී ලංකා දූත මණ්ඩල / කාර්යාලවල යහපැවැත්ම සඳහා පහසුකම් සැපයීමයි. එම දූත මණ්ඩල කාර්යාලවල චංචල සහ නිශ්චල වත්කම් කළමනාකරණය කිරීම සහ අමාත්‍යාංශය සහ ලොව පුරා විහිදී ඇති දූත මණ්ඩල ජාලය අතර සිදුවන දෛනික සන්නිවේදන කටයුතු අධීක්ෂණය කිරීමද මෙම අංශයට පැවරී ඇති වගකීම් අතරින් කොටසකි.

වර්තමානයේ රටින් බැහැරව, ලංකාව මගින් පහත සඳහන් දූත මණ්ඩල සහ ඒකක පවත්වාගෙන යනු ලැබේ:-

| | | |
|---|---|---|
| තනාපති / මහකොමසාරිස් කාර්යාල | - | 51 |
| එක්සත් ජාතීන්ගේ ස්ථිර දූත මණ්ඩල | - | 02 |
| නියෝජ්‍ය මහකොමසාරිස් කාර්යාල | - | 01 |
| නියෝජිත කාර්යාල | - | 01 |
| කොන්සල් ජනරාල් කාර්යාල | - | 11 |
| **එකතුව** | **-** | **66** |

සයිප්‍රස්හි නිකෝසියාවේ කොන්සල් ජෙනරාල් කාර්යාලයක් ළඟදී ස්ථාපනය කරනු ලැබීමට නියමිතය.

### 1. විදේශීය වත්කම් අත්පත් කරගැනීම සහ පවත්වාගෙන යෑම

#### (අ) නිශ්චල දේපල

ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩල/දූත කාර්යාල සමග සාකච්ඡාකර සෑම වර්ෂයකම අපගේ විදේශ දූත මණ්ඩලවල භාවිතය සඳහා අඩුකරමින් නව දේපළ ද්විත්වයක් මිලදී ගනු ලැබේ. මෙම වසරේදී පවතින දේපළ නවීකරණය කිරීම/ඉදිකිරීම කෙරෙහි අවධානය යොමු වී ඇත. මේ සම්බන්ධයෙන් ශ්‍රී.ල.රු. 93,155,041.4 ක මුලු පිරිවැයක් දරා දේපළ 5 ක් නවීකරණය කරන ලදී. රජයේ තීරණය පරිදි මේ සඳහා අවශ්‍ය අරමුදල් භාණ්ඩාගාරය, මහ බැංකුව හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය ඔස්සේ ලබා ගැනීමට කටයුතු කර ඇත.

**2017 වර්ෂයේදී සිදුකළ ඉදිකිරීම්/නවීකරණය කරීම් පිළිබඳ විස්තර**

| | විස්තරය | ප්‍රමාණය (ශ්‍රී ල.රු.) |
|---|---|---|
| 01 | ලන්ඩනයේ කාර්ය මණ්ඩල නිවාස නවීකරණය කිරීම/අළුත්වැඩියා කිරීම | 86,000,000.00 |
| 02 | බිජිංහි චාන්සරි ගොඩනැගිල්ලේ බාහිර නවීකරණ | 5,310,297.72 |

| | | |
|---|---|---|
| | කටයුතු කිරීම | |
| 03 | ප්‍රිටෝරියා හි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලයේ දේපළවල විදුලි වැට නවීකරණය කිරීම | 964,743.70 |
| 04 | නයිරෝබි හි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලයේ නිල නිවාසය නවීකරණය කිරීම | 880,000.00 |
| 05 | ලන්ඩන් හි පිහිටි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලීය ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම | 3,851,300.00 |
| | **එකතුව** | **93,155,041.42** |

ජනවාරි මාසයේ සිට දෙසැම්බර් දක්වා කාලසීමාව තුළදී, ශ්‍රී ලාංකික ප්‍රජාව වෙත ලබාදෙන සේවාවන් ශක්තිමත් කරමින් හා වඩාත් යහපත් වැඩ තත්ත්වයකට පහසුකම් සලසාදෙමින් පැරිස්, හේග්, ඔස්ලෝ, මාලේ හා ක්වාලාලම්පූර්හි පිහිටි තානාපති ගොඩනැගිලි ප්‍රතිස්ථානගත කිරීම අවසන් කරන ලදී. තවද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අත්පත් කරගත් නිව්යෝර්ක් හා බ්‍රසීලියා හි පිහිටි තානාපති ගොඩනැගිලි, අනාගතයේදී සිදුවිය හැකි මෙහෙයුම් පිරිවැය කපා හැරීමට අමාත්‍යාංශයට හැකිවන පරිදි, අමාත්‍යාංශයට පවරා දීමේ කටයුතු අවසන් කරන ලදී. මෙම අලුත් අත්පත් කර ගැනීම් හේතු කොට ගෙන ලංකා රජය සතුව විදේශ වල තිබෙන දේපළවල සංඛ්‍යාව 20 දක්වා වැඩි වී තිබේ.

**(ආ) චංචල දේපළ**

**i. වාහන**

ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩල/දූත කාර්යාල සඳහා වාහන අවශ්‍ය වූ විට හෝ තිබෙන වාහන මාරු කළ යුතු විට මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡා කර විදේශ දූත මණ්ඩල පාලන අංශය විසින් අවශ්‍ය දූත මණ්ඩල/දූත කාර්යාල සඳහා අලුතින් වාහන මිලදී ගැනීමට හෝ මාරු කිරීමට පහසුකම් සලසයි. විදේශයන්හි පිහිටි දූත මණ්ඩලවල භාවිතය සඳහා අදාළ කාලසීමාව තුළදී රු. 69,441,404.55 වාහන 14 ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දී ඇත.

**ii. අනෙකුත් ප්‍රාග්ධන වත්කම්**

විදේශයන්හි පිහිටි විදේශ දූත මණ්ඩල කිහිපයක් විසින් කරන ලද ඉල්ලීම් මත, 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා රුපියල් 62,039,032/52 ක පිරිවැයකින් යුත් කාර්යාලීය උපකරණ හා දැව භාණ්ඩ, පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අත්පත් කර ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබාදී ඇත.

## 3. විගණන පරීක්ෂණ

අභ්‍යන්තර විගණන අංශය සමග සාකච්ඡා කර විදේශයන්හි පිහිටි දූත මණ්ඩල/දූත කාර්යාල විධිමත් විගණන පරීක්ෂණ පැවැත්වීම සඳහා මෙම අංශය විසින් පහසුකම් සපයන ලදී. ලන්ඩනයේ පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලයේ විගණන පරීක්ෂණයක් පැවැත්වීමේ කාර්යය විගණන අංශය විසින් භාරගනු ලැබ ඇත.

## 4. නිල සංචාර සඳහා පහසුකම් සැලසීම

විදේශ දූත මණ්ඩල යටතේ පවතින සංචාරක අංශය මගින් 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා 2017 වර්ෂය තුළ අමාත්‍යාංශයේ නිල සංචාර 317 ක් සඳහා වීසාපත් ලබාදීමට හා අවශ්‍ය සංචාරක දීමනා හා අනෙකුත් ගෙවීම් සිදු කිරීමට කටයුතු කර තිබේ. විවිධ ආයතන වලින් රජයේ නිලධාරීන් සඳහා වීසා පහසුකම් සැලසීමට තෙවන පාර්ශ්වීය සටහන් 2066 ක් නිකුත් කර ඇත.

## 5. ආරක්ෂක තැපැල් අංශය

ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩල/දූත කාර්යාල රාජ්‍යතාන්ත්‍රික මලු යැවීම, විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාල මගින් එවන ලද රාජ්‍යතාන්ත්‍රික මලු එක්රැස් කිරීම හා ඒවායේ ඇති අයිතම අමාත්‍යාංශයේ අදාළ අංශ වෙත බෙදාහැරීමට කටයුතු කරන ලදී. තවද අමාත්‍යාංශය විසින් කාලෝචිත පදනමින් පිරිවැය කපාහැරීමට හා වේගවත්ව තැපැල් මලු බෙදාහැරීම තහවුරු කිරීම පිණිස තෝරාගත් දූත මණ්ඩලවල රාජතාන්ත්‍රික මලු යැවීමට බාර ගැනීම සඳහා කුරියර් සමාගම් යැවීමට කටයුතු කර ඇත.

## 6. තොරතුරු තාක්ෂණ අංශය

තොරතුරු තාක්ෂණ අංශය මගින් දෛනිකව විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාල හා ශ්‍රී ලංකාවේ විදේශයන්හි පිහිටි අනෙකුත් සංවිධාන හා ආයතන මගින් ලැබෙන ෆැක්ස් හා විද්‍යුත් තැපැල් ලිපි 600-700 ක් අතර ප්‍රමාණයක් පාලනය කරනු ලැබේ. තොරතුරු තාක්ෂණ අංශය සතියේ දින හතක් හා පැය විසිහතර පුරාවටම වැඩකරන අතර කාර්ය මණ්ඩලය සේවා වාර පදනම මත සේවයේ යොදවනු ලැබ සිටිති.

## 7. ප්‍රගති වාර්තාව හා වාර්ෂික කාර්යය සාධන වාර්තාව හා දූත මණ්ඩල නාමාවලිය පිළියෙල කිරීම

විදේශ දූත මණ්ඩල අංශය අනෙක් අංශ සමග සම්බන්ධීකරණ කරමින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා 2017 තුන්වන කාර්තුවේ කාර්යසාධන වාර්තාව හා වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කර ඇත. පසුගිය වර්ෂයේදී කරන ලද පරිදි 2017/2018 සඳහා යාවත්කාලීන කළ දූත මණ්ඩල නාමාවලිය සකස් කොට ඇත.

## 8. මානව සම්පත් කළමනාකරණය

විදේශයන්හි දූත මණ්ඩල/දූත කාර්යාල වලට අනුයුක්ත කර ඇති මානව සම්පත් කළමනාකරණය කිරීම විදේශ දූත මණ්ඩල පාලන අංශයේ කටයුතුවල ප්‍රධාන කොටසකි. කාලසීමාව තුළදී ක්‍රියාකාරකම්වල විශේෂ අවස්ථා කිහිපයක් පහත දැක්වේ :-

අ) **ඩිජිටල්කරණය කරන ලද මානව සම්පත් තොරතුරු පද්ධතිය**

කාර්ය මණ්ඩල සම්බන්ධීකරණය හා පරිපාලන කටයුතුවලට පහසුකම් සැලසීම සඳහා අමාත්‍යාංශය තුළ හා විදේශයන්හි දූත මණ්ඩල/ දූත කාර්යාල ඩිජිටල්කරණය කළ මානව සම්පත් කළමනාකරණ පද්ධතියක් ඇරඹීමේ ක්‍රියාවලිය විදේශ දූත මණ්ඩල පාලන අංශය විසින් නිමාකරන ලදී.

ආ) **බඳවා ගැනීම**

විභාග දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව දූත මණ්ඩලවල ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් බඳවා ගැනීම සඳහාත්, අපගේ විදේශ දූත මණ්ඩලවල සේවය කිරීම සඳහා රජයේ කළමනාකරණ සහකරුවන් හා පුද්ගලික සහකරුවන් තෝරාගැනීම සඳහාත්, විදේශ දූත මණ්ඩල පාලන අංශය මගින් විවෘත තරග විභාග පවත්වනු ලබයි.

ලංකා විදේශ සේවයේ III ශ්‍රේණියට නව නිලධාරීන් කණ්ඩායමක් බඳවාගැනීම සඳහා, ශ්‍රී ලංකා විදේශ සේවා විභාගයක් පැවැත්වීමේ කටයුතු විදේශ දූත මණ්ඩල පාලන අංශය මගින් සම්බන්ධීකරණය කරන ලදී. ලංකා විදේශ සේවයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2017 පෙබරවාරි/මාර්තු මාසවලදී පවත්වන ලදී. තව ද කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2018 වර්ෂයේ පසුභාගයේ දී නැවත වරක් පැවැත්වීමට ගැසට් නිවේදන පළ කිරීම සඳහා කටයුතු පිළියෙල කර ඇත. තව ද ලංකා විදේශ දූත මණ්ඩලවල සහායක නිලධාරීන් වශයෙන් සේවය කිරීම සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් බඳවා ගැනීමේ විභාගය පැවැත්වීම සඳහා ද ගැසට් නිවේදන පළ කර ඇත. 2017 සමාලෝචනයට භාජනය වූ කාලය තුළ රාජ්‍ය කළමනාකරණ සහායක නිලධාරීන් 98 දෙනෙකු බඳවාගෙන ඇත.

ඇ) **නව දූත මණ්ඩල ප්‍රධානීන් හා රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් පත් කිරීම.**

මෙම කාලසීමාව තුළදී දූත මණ්ඩල/ප්‍රධානීන් හා දූත කාර්යාල ප්‍රධානීන් 7 දෙනෙකු පත් කරන ලදී. තවද ලංකා විදේශ සේවයෙන්, ආරක්ෂක සේවයෙන්, වාණිජ දෙපාර්තමේන්තුවෙන්, විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් හා අමාත්‍ය මණ්ඩලය මගින් රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් 53 දෙනෙකු පත් කරන ලදී.

ඈ) **විදේශ දූත මණ්ඩල සඳහා සහායක කාර්ය මණ්ඩල පත්කිරීම.**

ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩල සේවය කිරීම සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් 98 දෙනෙක්, පුද්ගලික සහායකයන් 44 දෙනෙක්, සහ සන්ධාන සහායකයන් 1 අයකු පත්කරන ලදී.

**මානව සම්පත් සංවර්ධන අංශය**

1. ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන්ට අදාළ මානව සම්පත් විෂයයේ දිගුකාලීනව ඇතිවූ අවශ්‍යතාවයන්ට අවධානය යොමු කිරීම සඳහා 2016 ජනවාරි 25 වැනි දිනැති ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය ප්‍රතිව්‍යූහගත කිරීම සම්බන්ධයෙන් වූ වාර්තාව තුළ සිදුකළ නිර්දේශ පදනම් කරගෙන 2016 පෙබරවාරි 15 වැනි දින මානව සම්පත් සංවර්ධන අංශය හඳුන්වා දෙන ලදී.

2. ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන්ට අදාළ මානව සම්පත් පිළිබඳව සෑම පැතිකඩක්ම අමාත්‍යාංශයේ එක් අංශයක් මගින් පාලනය වන බව තහවුරු කර ගැනීම මෙම අංශයේ අරමුණයි.

3. එමෙන්ම පොදුවේ පුහුණු කිරීම ප්‍රකාරව පහත ක්‍රියාමාර්ග විදේශ දූත මණ්ඩල පාලන අංශයේ අධ්‍යක්ෂ ජනරාල් යටතේ ක්‍රියාත්මක මානව සම්පත් අංශය මගින් පාලනය කරනු ලැබීය.

අ. ශ්‍රී ලංකා විදේශ සේවය සඳහා පුහුණුව

i. විදේශ කටයුතු අමාත්‍යාංශයට අදාළ සියලු විෂයයන් සම්බන්ධයෙන් සියලුම ජාතික පුහුණු හා වැඩමුළු සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන් නම් කිරීම සම්බන්ධී කරණය කිරීම. විවිධ ජාතික පුහුණු ආයතන මගින් ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන් සඳහා ආසන්න වශයෙන් ජාතික පුහුණු අවස්ථා පහක් (5) පිරිනමන ලදී.

ii. විදේශ කටයුතු අමාත්‍යාංශයට අදාළ සියලුම විෂයයන් සම්බන්ධයෙන් ජාත්‍යන්තර පුහුණු හා වැඩමුළු සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන් නම් කිරීම සම්බන්ධී කරණය කිරීම දකුණු ආසියාව, යුරෝපය, නැගෙනහිර ආසියා හා ඇමරිකානු කලාපවල විවිධ රටවලින් පුහුණු අවස්ථාවන් 44 ක් ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන්ට පිරිනමන ලදී.

iii. හිටපු විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයාගේ මාර්ගෝපදේශකත්වය යටතේ තාවකාලික සැසි ලෙස දිවා ආහාරය අතරතුර මසකට වරක් කාලීන හා අදාළ මාතෘකා සම්බන්ධයෙන් නිළ නොලත් දේශන මාලාවක් අරඹන ලදී.

iv. විදේශ කටයුතු අමාත්‍යාංශයේ හා වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා 2017 වර්ෂයේ මාර්තු සිට අගෝස්තු දක්වා සජීවී ආර්ථික උපායමාර්ගික පාඨමාලා පැවැත්වීම සඳහා හාවඩ් විශ්ව විද්‍යාලය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකරන ලදී. ඒ පිළිබඳ අවසන් වාර්තාව 2017 අගෝස්තු 20 වැනි දින හාවඩ් විශ්ව විද්‍යාලයේ දේශීය සම්බන්ධීකාරක විසින් බාරදෙනු ලැබේ.

v. ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කණ්ඩායමක් සමගින් 2015 ශ්‍රී ලංකා විදේශ සේවා නිලධාරීන් සඳහා ජාත්‍යන්තර දේශපාලන ගැටළු සම්බන්ධයෙන් සැසි කිහිපයක් පැවැත්විණි.

vi. බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජතාන්ත්‍රික පුහුණු ආයතනයේ සහයෝගය ඇතිව 2017 ජූනි 15-16 යන දිනයන්හිදී පුද්ගල ජාවාරමට මැඩපැවැත්වීම පිළිබඳව පළමු පුහුණු වැඩසටහනක් පැවැත්වුණි.

vii. 2017 ජූලි 27 සිට 28 දක්වා සිංගප්පූරුවේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ කණ්ඩායමක් විසින් දෙදින පුහුණුවක් පැවැත්වීම සඳහා කරුණු සම්බන්ධීකරණය කරන ලදී.

viii. විදේශ කටයුතු අමාත්‍යාංශයේ හා ඉන් පිටතින් හඳුනාගත් සම්පත් දායකයන් සමඟ 2017 අගෝස්තු 8 සිට 10 දක්වා නම්කළ තානාපතිවරුන්/කොන්සල් ජනරාල්වරුන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වුණි.

**ආ ශ්‍රී ලංකා විදේශ සේවයේ නොවන අය සඳහා පුහුණුව**

i. 2017 අප්‍රේල් 24-28 දක්වා විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාලවල සේවය කිරීම සඳහා තරඟ විභාගයක් ඔස්සේ තෝරාගන්නා ලද පුද්ගලික සහායකයන් සඳහා සමාරම්භක වැඩසටහනක් පැවැත්වුණි.

ii. 2017 අප්‍රේල් 24 සිට 28 දක්වා ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයේදී රජයේ භූමිකාව පිළිබඳව මොඩියුලය මැයෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවය සඳහා පස් දින සමාරම්භක පුහුණු වැඩසටහන සැලසුම් කිරීම.

iii. 2017 සැප්තැම්බර් 18-21 දක්වා විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/ දූත කාර්යාලවල සේවය කිරීම සඳහා තරඟකාරී විභාගයක් ඔස්සේ තේරීපත්වූ රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා සමාරම්භක වැඩසටහනක් පැවැත්වුණි.

**ඇ දූත මණ්ඩල/තනතුරුවල කාර්යය සාධනය පිළිබඳව ඇගයීම**

i. මානව සම්පත් අංශය විසින් දූත මණ්ඩල/ දූත කාර්යාල හා අමාත්‍යාංශයේ අනෙකුත් අංශ සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකරන අතර 2016 වර්ෂයේ වාර්ෂික කාර්යය සාධන වාර්තාව නිමාවට පත් කරන ලදී.

ii. 2017 වර්ෂය සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම අන්තර්ගත කරමින් ලේඛනයක් මානව සම්පත් අංශය විසින් නිම කරන ලදී.

iii. ඉහත ලිපි ලේඛනවලින්, මානව සම්පත් අංශය මගින් 2017 මාර්තු මාසයේදී දූත මණ්ඩලවල/ දූත කාර්යාලවල ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කිරීමට හා ඇගයීම සඳහා ක්‍රමයක් යෝජනා කරන ලදී. නිශ්චිත ප්‍රතිඵල කරා ළඟාවීම සඳහා දූත මණ්ඩලවල/ දූත කාර්යාලවල ක්‍රියාකාරීත්වය ඇගයීමට ලක් කළ හැකි පියවරවලින් මෙම සූත්‍රය සමන්විත වෙයි.

**ඈ පැවැත්වූ දිවා ආහාරය අතර සැසි**

1. 2017 පෙබරවාරි 2 වන දින සංසන්දනාත්මක ආකාරයෙන් ශ්‍රී ලංකාව - චීනය අතර ආර්ථික සබඳතා වර්ධනය සඳහා විපුල අවස්ථාවක්.

2. 2017 මාර්තු 20 වන දින ස්නිඩ් සමාගමේ ගිණුම් කළමනාකරු සබීර් සිකන්ඩර් මහතා විසින් සිදුකරන ලද ඉදිරිපත් කිරීමත් සමඟ විදේශ කටයුතු අමාත්‍යාංශයේ මානව සම්පත් පද්ධතිය හඳුන්වාදීම සඳහා කටයුතු සංවිධානය කර ඇත.

3. ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ ජනරාල් (පොදු රාජ්‍ය මණ්ඩලය, යුරෝපා සංගමය, බහු පාර්ශවයීය ගිවිසුම්), ඒ.එල්.ඒ.අසීස් මහතා විසින් 2017 මාර්තු 18 වැනි දින කරන ලද ඉදිරිපත් කිරීමකින් "ජී. එස්. පී + ක්‍රියාවලියේ ප්‍රතිලාභ - ලංකාවට ලැබෙන වාසි" යන සැසිය ආරම්භ කරන ලදී.

4. 2017 ජූලි 24 වන දින ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ ආචාර්ය ගනේෂන් විග්නරාජ් විසින් ගැටළු ගවේෂණය කරමින් ඉදිරිපත් කළ ශ්‍රී ලංකාවේ වාණිජ රාජ්‍යතාන්ත්‍රික කටයුතු යන දේශනය පවත්වන ලදී.

5. 2017 අගෝස්තු 22 වන දින මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ අතිරේක ලේකම් මාපා පතිරණ මහතා විසින් ඉදිරිපත් කරන ලද දේශගුණික විපර්යාස පිළිබඳ සැසිය.

****

# විදේශගත ශ්‍රී ලාංකිකයන් පිළිබඳ අංශය

**විදේශගත ශ්‍රී ලාංකිකයන් පිළිබඳ අංශය**

අමාත්‍යාංශයේ විදේශගත ශ්‍රී ලාංකිකයන් පිළිබඳ අංශය මගින් පහත කාර්යයන් සිදු කෙරේ.

i. විදේශගතව සිටින ශ්‍රී ලාංකික ප්‍රජාව සමඟ සම්බන්ධවීම හා පහසුකම් සැළසීම (විදේශයන්හි ශ්‍රී ලංකා ජාතික නේවාසිකයන් සහ ශ්‍රී ලාංකික සම්භවයක් ඇත්තවුන්/උරුමයක් ඇති පුද්ගලයින්)

ii. පහත දැක්වෙන හේතු මත එම සාමාජිකයින්ට ශ්‍රී ලංකාවට පැමිණීමට සහයවීම

- වසර ගණනාවක් විදේශගත වී සිටීමෙන් පසු නැවත සම්බන්ධවීම.
- පළමුවතාවට පැමිණීම සඳහා (ශ්‍රී ලාංකිකයන්ගේ 2 වන හා 3 වන පරම්පරාව)
- ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධන ප්‍රයත්නයන් හා වැඩසටහන් උදෙසා සහයෝගය ලබාදීම
- සංහිඳියා ප්‍රයත්නයන් උදෙසා දායකත්වය ලබාදීමට ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා එම සාමාජිකයන්ට සහාය දැක්වීම.

iii. ශ්‍රී ලංකාවට පැමිණීම සඳහාත් අත්දැකීම් ලබාගැනීම සඳහාත් විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන්ට සහය දැක්වීමට හා උදව් කිරීම හා සම්බන්ධවූ වැඩසටහන් හා සංවිධානවලට සහයෝගය පළකිරීම.

iv. ශ්‍රී ලංකාවේ ඩයස්පෝරාව ආශ්‍රිත අධ්‍යයන/පර්යේෂණ/වැඩසටහන් හා සම්බන්ධ රාජ්‍යනොවන සංවිධාන සහ පර්යේෂණ සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

v. විවිධ ක්ෂේත්‍රයන්හි සැලකියයුතු දායකත්වයක් සිදුකළ විශේෂඥයන්, වෘත්තිකයන්, විද්‍යාඥයන්, විද්‍යාර්ථයන්, ව්‍යවසායකයන්, කලාකරුවන් හා විවිධ පුද්ගලයන් ඇතුලුව විදේශගත ප්‍රමුඛපෙළේ ශ්‍රී ලාංකිකයන්/ශ්‍රී ලාංකික සම්භවයක් සහිත පුද්ගලයන් ගේ දත්ත පදනමක් සම්පාදනය කර පවත්වාගෙන යයි.

vi. ශ්‍රී ලංකාවේ සංවිධාන/වැඩසටහන් සමඟ කටයුතු කරන විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයන් සඳහා වීසා පහසුකම් සැළසීම.

**1. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ කටයුතු කිරීම**

(අ) විදේශගත ශ්‍රී ලාංකිකයන් සිටින ප්‍රධාන ස්ථානවල සම්බන්ධීකරණ කටයුතු කිරීම සඳහා නිලධාරියෙක් නම්කිරීම සඳහා ශ්‍රී ලංකා දූත මණ්ඩලවලින් ඉල්ලීම් සිදුකර ඇත.

(ආ) ශ්‍රී ලංකාවේ සමාජ සහ ආර්ථික සංවර්ධනය, සංහිඳියාව හා ඒකාබද්ධතා ප්‍රයත්නයන්ට දායකත්වය ලබාදෙන විදේශයන්හි සිටින ශ්‍රී ලාංකික කණ්ඩායම්/සංගම්වලට සහය දැක්වීම හා එක්ව කටයුතු කිරීමට දූත මණ්ඩලවලින් ඉල්ලීම් සිදුකර ඇත.

(ඇ) දින නියම කිරීමකින් තොරව දූත මණ්ඩල/කාර්යය මණ්ඩල ප්‍රධානී මුණගැසීම සඳහා විදේශගත ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සාමාජිකයන් සඳහා සතියේ එක් දිනයක් ප්‍රකාශයට පත්කර ඇත.

(ඈ) දූත මණ්ඩල මඟින් විදේශයන්හි සිටින ශ්‍රීලාංකික ප්‍රජාවගේ විවිධ උත්සව පිළිබඳව දැනුවත්බව ඇතිකිරීම හා පුද්ගලික අංශයේ කණ්ඩායම්/සංවිධාන සමඟ අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි යම්යම් අංශ හඳුනා ගැනීම.

(ඉ) යම් යම් අංශ ක්ෂේත්‍රවල ශ්‍රී ලාංකික විදේශගත වූවන්ගේ ලැයිස්තුව නියමාකාරයෙන් යාවත්කාලීන කිරීමට හා සම්පාදනය කිරීමටත් ඒ පිළිබඳව අමාත්‍යාංශයට දැනුම්දීමටත් දූත මණ්ඩල වලින් ඉල්ලා ඇත.

**2. රාජ්‍යආයතන/නියෝජිතායතන සමඟ කටයුතු කිරීම**

(අ) ශ්‍රී ලංකාවේ කටයුතු කරන විදේශයන්හි ශ්‍රී ලාංකිකයන්ගේ සංවිධානවලට සහයෝගය ලබාදීම සඳහා විදේශගත ශ්‍රී ලාංකිකයන් පිළිබඳව අංශය මගින් ජාතික සංහිඳියා සමඟි කාර්යාලය සමඟ සමීපව කටයුතු කරන අතර ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශගත ශ්‍රී ලාංකික ප්‍රජාව සමඟ සම්බන්ධවීමට හා හවුල් සංවිධාන සොයාගැනීම සඳහා භාවිත කරන ප්‍රධාන කොටස්කරුවා ජාතික සමගිය හා සංහිඳියා කාර්යංශයයි.

(ආ) සමාජ ආර්ථික වැඩසටහන් වලට සහයෝගය දැක්වීමට හා කටයුතු කිරීමට ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශගත ශ්‍රී ලාංකික සාමාජිකයන් හා ස්වේච්ඡා සාමාජිකයන් සඳහා ප්‍රධාන ධාරාවේ වීසාපත් සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමඟ සමීප සහයෝගීතාවය මෙම අංශය විසින් පවත්වාගෙන යයි.

(ඇ) විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ වීසා ආශ්‍රිත ගැටළු වලට සහයවීම හා ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා විදේශ ගත ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රශ්න සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකාරකයෙකු නම්කර ඇත.

2017 ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා කාලසීමාව සඳහා මෙම අංශය විසින් පහත ක්‍රියාකාරකම් සිදුකළේය.

i. ''සංවර්ධනය සඳහා කොටස්කරුවන් ලෙස විදේශගත ශ්‍රී ලාංකිකයන්''වටමේස සාකච්ඡාව - 2017 අප්‍රේල්

(අ) 2017 අප්‍රේල් 20-22 දක්වා විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ විශේෂඥයන්, ස්වේච්ඡා සේවකයන්, සංවිධානවල අවශ්‍යතාවයන්ට ගැළපෙන නියමු පළාත් හතරක සංවර්ධන ව්‍යාපෘති සාකච්ඡා කිරීමට හා සම්පාදනය කිරීම සඳහා පළාත් සභා හා විවිධ කොටස්කරුවන්ගේ සහභාගීත්වයෙන් 'සංවර්ධනයේ කොටස්කරුවන් ලෙස විදේශගත ශ්‍රී ලාංකිකයන්'යන මාතෘකාව යටතේ 2017 අප්‍රේල් 20-22 දක්වා

වටමේස සාකච්ඡාවක් සංවිධානය කිරීමට දිළිඳු භාවය විශ්ලේෂණය කිරීමේ(CEPA) මධ්‍යස්ථානය නැමැති පර්යේෂණ ආයතනය සමඟ සහයෝගයෙන් කටයුතු කළේය.

(ආ) නියමු පළාත් හතරක 2017 වර්ෂය සඳහා ව්‍යාපෘති 10-15 ක් ආරම්භ කිරීම හා අනුග්‍රාහකත්වයක් හා මුදල් යෙදවීම හඳුනාගැනීම සඳහා ව්‍යාපෘතිය හා වැඩසටහන් වල ප්‍රමුඛතා ලැයිස්තුවක් සකස් කරන ලදී.

ii. විදේශගත ශ්‍රී ලාංකික වෛද්‍ය වෘත්තියවේදීන්ගේ සහයෝගයෙන්, ගංවතුරට හසුවූවන් සඳහා ආධාර - 2017 ජූලි

(අ) සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහභාගීත්වයෙන් විදේශගත ශ්‍රී ලාංකික ඩයස්පෝරාව හා ශ්‍රීලංකාවේ සිටින්නවුන් අතර විශ්වාසය ගොඩනැගීමේ පියවරක කොටසක් ලෙස අමාත්‍යාංශය විසින් සර්වෝදය හා ගෝලීය දෙමළ සංසදයේ ඒකාබද්ධ වැඩසටහනට පහසුකම් සැලසීමට සහාය දැක්වූ අතර මෑතකදී සිදුවූ ගංවතුරෙන් අනතුරට පත්වූවන්ට සහය ලබාදීම සඳහා දේශීය වෛද්‍යවරුන් සමඟ කටයුතු කිරීමට දින 10 ක කාලසීමාවක් සඳහා වෛද්‍ය කඳවුරක් පිහිටුවීමට ස්වෙච්ඡා සේවකයන් ලෙස 18 දෙනෙකුගෙන් යුත් වෛද්‍ය වෘත්තිකයන් කණ්ඩායමක් ශ්‍රී ලංකාවට පැමිණියේය.

(ආ) මෙම වෛද්‍ය වෘත්තිකයන් එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, නෝර්වේ, එක්සත් ජනපදය, ප්‍රංශය, බහරේන් සහ ජර්මනිය යන රටවලින් පැමිණි අතර කළුතර පිහිටි ගම්මාන හා ගංවතුර සහන කඳවුරු වල ජූලි මස 2 සිට 7 දක්වා සේවයේ නිරත වූ අතර ජූලි 7 සිට 10 දක්වා මාතර සේවයේ නිරත විය.

(ඇ) ළමා හා අනාථ නිවාස ඇතුලුව ආසන්න වශයෙන් රෝගීන් 780 කට වෛද්‍ය, දන්ත හා අක්ෂි ප්‍රතිකාර ලබාදුනි.

(ඈ) වෛද්‍යවරුන් විසින් මහජනතාව වෙත ඇස් කණ්නාඩි හා අව්කණ්නාඩි යුගල 300 ක් පරිත්‍යාග කළේය.

(ඉ) දින 10 ක කාලසීමාවක් සඳහා ගංවතුරෙන් බලපෑමට ලක්වූ දිස්ත්‍රික්කවල දේශීය වෛද්‍යවරුන් සමඟ වැඩ කිරීමට ශ්‍රී ලංකාවට පැමිණ සිටි ගෝලීය දෙමළ සංසදයේ ශිෂ්‍යයන් සහ වෛද්‍ය වෘත්තිකයන්ට හා සර්වෝදය සංවිධානයට 2017 ජූලි මස 11 වන දින අමාත්‍යාංශයේ පැවත උත්සවයේදී විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් ඇගයීමට ලක්කිරීම සිදු කළේය.

(ඊ) විපක්ෂ නායක ගරු ආර්. සම්බන්ධන්, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු වෛද්‍ය රාජිත සේනාරත්න, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යය ගරු මංගල සමරවීර, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. ඒ. සුමන්තිරන්, සර්වෝදය මහලේකම් ආචාර්ය වින්‍යා ආරියරත්න හා ඔහුගේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය සමඟ විදේශයන්හි සිටින ශ්‍රී ලාංකික ප්‍රජාව, තෝරාගත් රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල සාමාජිකයන් මෙම අවස්ථාවට සහභාගී විය.

# ප්‍රතිපත්ති සැලසුම් අංශය

## ප්‍රතිපත්ති සැලසුම් අංශය

1. 2016 ජනවාරි 25 දිනැති 'ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ වාර්තාවේ' දක්වා ඇති නිර්දේශ පදනම් කර ගනිමින් විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සැලසුම් අංශය පෙබරවාරි 15 වැනි දින ස්ථාපනය කරන ලදී. කාර්ය මණ්ඩලය පත් කිරීමත් සමගම 2017 මැද භාගයේදී මෙම අංශය සිය කාර්ය කටයුතු ආරම්භ කෙරිණ.

2. ප්‍රතිපත්ති සැලසුම් ක්ෂේත්‍රය විදේශ කටයුතු අමාත්‍යාංශය තුළ මෙතෙක් විශේෂ අවධානයක් යොමු නොවූ ක්ෂේත්‍රයකි. පර්යේෂණ සිදුකිරීම, ගෝලීය වශයෙන් වැදගත් කමක් ඇති නූතන ගැටළු පිළිබඳ විශ්ලේෂණ සිදු කිරීම ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ විශේෂිත පැතිකඩවල් පිළිබඳව ප්‍රතිපත්තිමය වශයෙන් කරුණු පැහැදිළි කිරීම් සැකසීම හා කරුණු සැකසීම හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ දිගුකාලීන උපායමාර්ගික සැලසුම් සඳහා දායකත්වය ලබා දෙන දැනට පවත්නා ප්‍රතිපත්ති පිළිබඳ තක්සේරු කිරීම සිදු කිරීම මෙවැනි අංශය ස්ථාපනය කිරීමේ අරමුණ වෙයි.

3. ගෝලීය මෙහෙයුම් පරිසරය පිළිබඳව විදේශ ප්‍රතිපත්ති වෘත්තිකයන්ට අවබෝධයක් ලබාගැනීම සඳහා පහසුකම් සැලසීම හා නූතන හා විදේශීය ප්‍රතිපත්ති තීරණ සැකසීම හැකිතාක් දුරට ශක්‍යතා සාක්ෂි පදනම් කරගත් පර්යේෂණ හා දූරදර්ශී ක්‍රමවේදයන් මත පදනම් වන බව තහවුරු කිරීම මෙම අංශයෙන් අපේක්ෂාවෙයි. විදේශ ප්‍රතිපත්ති තීරණ සැකසීම සඳහා යොදාගන්නා තොරතුරු හුදෙක් මතවාදයන්ට වඩා මනාව සැකසූ පර්යේෂණ මත පදනම් වන ඒවා බවට තහවුරු කරලීම මෙහි අරමුණයි. එහෙයින්, තර්කාන්විත විශ්ලේෂණයට අනුව පවත්නා සාක්ෂි මගින් ප්‍රතිපත්ති ස්ථාවරයන් හොඳින් දැනුවත් වන පරිදි වඩාත් තාර්කික ඉතා නිවැරදි හා ක්‍රමවත් ප්‍රවේශයක් සැකසීමට මෙම අංශය ප්‍රයත්න දරයි.

   අමාත්‍යාංශය තුළ සාක්ෂි පදනම් කරගත් පරිචයන් සැකසීම හා මෙහෙයවීම සැකසිය යුතු බවට මෙම අංශය දිරිමත් කරයි. ප්‍රායෝගික අරමුණු රැසක් ඉටුකර ගැනීම සඳහා ප්‍රතිපත්ති සකසා ගැනීම සහ යම් යම් ප්‍රතිපත්ති රජයේ දැක්ම අනුව හා ජනතාවගේ අභිලාෂය පරිදි සකසන හෙයින් එම ප්‍රතිපත්ති සැකසීමේදී පර්යේෂණ හා තීරණ පමණක් පදනම් කරගත නොහැකි බව සැළකියයුතු මනාය.

   සමාලෝචනයට බඳුන්වන කාලසීමාව තුළදී මෙම අංශය පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කටයුතු කර තිබේ.

   - ප්‍රතිපත්ති සැලසුම් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මෙම අංශය 2018-2022 කාලසීමාව සඳහා සමාරම්භක විදේශ ප්‍රතිපත්ති උපායමාර්ගයක්/ශ්‍රී ලංකාව සඳහා ධවල පත්‍රිකාවක් සැකසීම පිළිබඳව සෑම වසර 4/5 කදී ඉදිරිපත් කිරීම සඳහා සහ අනුයාත උපාය මාර්ගවලට අවශ්‍යවන ක්‍රියාමාර්ග/සම්පත් ලබාදීම පිළිබඳව සැළකිල්ල යොමු කළයුතු බවට මෙම අංශය යෝජනාකර තිබේ. මෙම අංශය මගින් සකසන ලද සමාරම්භක ධවල පත්‍රිකාව සඳහා කෙටුම්පත් කාර්යය නිර්දේශය සලකා බැලීම සඳහා ලේකම්/විදේශ කටයුතු වෙත ඉදිරිපත් කරන ලදී.

- සාගර කටයුතු, උපාය මාර්ගික ආරක්ෂාව, දේශගුණික විපර්යාස හා ප්‍රතිපත්ති සැලසුම් යන අංශ සම්බන්ධයෙන් සහ ක්‍රියාවන් වර්ධනය කිරීමේ අරමුණින් විදේශ රටවල පිහිටි අපගේ දූත මණ්ඩල හරහා ජාත්‍යන්තර මට්ටමිනුත්, දේශීය මට්ටමිනුත් අදාළ විද්වත් මණ්ඩල, පාර්ශ්වකරුවන් හා ආයතන සමඟත් සබඳතා ඇතිකර ගැනීමේ ක්‍රියාවලියෙහි ද මෙම අංශය නියැලී සිටියි.

****

# සන්ධාන අංශය

## සන්ධාන අංශය

**1.** **සන්ධාන අංශයේ කාර්ය කටයුතු පහත දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපය යටතේ වර්ග කළ හැකිය.:-**

i. සැමරුම් උත්සව පැවැත්වීම

ii. විදේශීය රාජ්‍යතාන්ත්‍රික නියෝජන එක්සත් ජාතීන්ගේ සංවිධාන හා එහි විශේෂිත නියෝජිතායතන හා ශ්‍රී ලංකාවට අක්තගන්වා ඇති ජාත්‍යන්තර සංවිධානවලට පිරිනමා ඇති රාජ්‍යතාන්ත්‍රික වරප්‍රසාද හා විනිර්මුක්තීන්වලට අවශ්‍ය පහසුකම් සැලසීම හා නිරික්ෂණය කිරීම.

iii. ශ්‍රී ලංකාවට අක්තගන්වා ඇති (කොළඹ පිහිටි දූත මණ්ඩලවල ප්‍රධානීන් හා වෙනත් දූත මණ්ඩලවලින් සමගාමීව අක්තගන්වන ලද) දූත මණ්ඩලවල ප්‍රධානීන් සඳහා පහසුකම් සැලසීම.

iv. ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ජාත්‍යන්තර සමුළු සඳහා සැපයුම් සේවා සහ සන්ධාන කටයුතු ඉටුකිරීම.

**2.** **උත්සව අවස්ථා**

සමාලෝචනයට බඳුන්වන කාලසීමාව තුළදී මෙම අංශය මගින් සම්බන්ධීකරණය කරන ලද අවස්ථා.

(අ) **ශ්‍රී ලංකාවේ සංචාරවල නියැලෙන අතිශයින් වැදගත් පුද්ගලයන්ගේ/ඉතා වැදගත් පුද්ගලයන්ගේ සංචාර පිළිබඳව කටයුතු කිරීම**

| | | | |
|---|---|---|---|
| i. | රාජ්‍ය නායකයින්/ආග්‍රාමාත්‍යවරුන් | - | 04 |
| ii. | විදේශ අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය විදේශ අමාත්‍යවරුන් | - | 07 |
| iii. | එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හා වෙනත් ජාත්‍යන්තර සංවිධානවල සම්භාවනීය පුද්ගලයන් | - | 05 |
| iv. | මාර්ගස්ථ සංචාර | - | 03 |
| v. | වෙනත් විදේශීය සම්භාවනීය පුද්ගලයන් | - | 28 |
| vi. | රැස්වීම්/සමුළු සඳහා නියෝජිත කණ්ඩායම් | - | 14 |

(ආ) ශ්‍රී ලාංකික අතිශයින් වැදගත් පුද්ගලයන්ගේ සංචාර

| | | | |
|---|---|---|---|
| i. | අතිගරු ජනාධිපතිතුමාගේ රාජ්‍ය සංචාර | - | 07 |
| ii. | ගරු අග්‍රාමාත්‍යතුමාගේ සංචාර | - | 08 |
| iii. | ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාගේ සංචාර | - | 12 |

(ඇ) වරප්‍රසාද හා විනිර්මුක්ති

සමාලෝචනයට බඳුන්වල කාලය තුළදී සන්ධාන අංශයේ වරප්‍රසාද හා විනිර්මුක්ති පිළිබඳ ඒකකය විසින් ඉටුකරන ලද කාර්ය කටයුතු මෙසේය:-

i. නිෂ්කාශන සහතිකපත් නිකුත් කිරීම 1,800

ii. ශ්‍රී ලංකාවේ පිහිටි විදේශීය දූත මණ්ඩල සඳහා සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් ශ්‍රී ලංකාවට පැමිණෙන විට හා ශ්‍රී ලංකාවෙන් නික්මයන අවස්ථාවලදී පිරිනමා ඇති රේගු පහසුකම් 150

(ඈ) රාජ්‍යතාන්ත්‍රික වාහන

| | | |
|---|---|---|
| i. | වාහන විකිණීම | 312 |
| ii. | වාහන ලියාපදිංචිය | 108 |
| iii. | ආදායම් බලපත්‍ර නිකුත්කිරීම | 890 |
| iv. | රියදුරු බලපත්‍ර නිකුත් කිරීම | 260 |
| v. | පැට්රෝල් කූපන් පොත් නිකුත් කිරීම | 586 |

(ඉ) වීසා බලපත් (විදේශීය දූත මණ්ඩල සඳහා - 1,868 ක් හා එක්සත් ජාතීන්ගේ සංවිධාන සඳහා 625 ක්)

| | | | | |
|---|---|---|---|---|
| i. | විදේශීය දූත මණ්ඩල සඳහා වීසා බලපත් | | | |
| | - ප්‍රවේශ වීසා | - | 959 | 4487 |
| ii. | විදේශීය දූත මණ්ඩල සඳහා වීසා | - | 1528 | |
| iii. | ජාත්‍යන්තර සංවිධාන සඳහා වීසා බලපත් | | | |
| | - ප්‍රවේශ වීසා | - | 414 | 951 |
| iv. | ජාත්‍යන්තර සංවිධාන සඳහා වීසා බලපත් | | | |
| | - වාස වීසා | - | 537 | |

(විස්තර මීට යා කොට ඇත)

(ඊ) ගුවන්තොටුපළ අවසරපත් - ගුවන්තොටුපල අවසරපත් නිකුත් කිරීම

| | | | | | |
|---|---|---|---|---|---|
| i. | ස්ථිර | - | පළමු නිකුතුව | 65 | 79 |
| ii. | තාවකාලික | - | පළමු නිකුතුව | 14 | |
| iii. | ස්ථිර | - | අලුත් කිරීම් | 77 | 114 |
| iv. | තාවකාලික | - | අලුත් කිරීම් | 27 | |

(උ) ඉතා වැදගත් පුද්ගලයන්ගේ පිළිසුම සඳහා අවසරපත් - 13150

(ඌ) රාජ්‍ය තාන්ත්‍රික නිෂ්කාශන (විදේශීය ගුවන් යානා 238 සහ නැව් 82 - 320

(එ) අනන්‍යතා පත්‍ර

රාජ්‍ය තාන්ත්‍රික හා වෙනත් 214 - 706

3. **අක්තගැන්වීම**

ශ්‍රී ලංකාවට අක්තගන්වා ඇති විදේශීය තානාපතිවරුන් / මහකොමසාරිස්වරුන් වෙත අක්තපත්‍ර පිළිගැන්වීම සඳහා වන උත්සව සංවිධානය කිරිමේ සහ ශ්‍රී ලංකාව නේවාසික දූත මණ්ඩල පිහිටුවා ඇති රටවලට පත්කරනු ලබන ශ්‍රී ලංකා තානාපතිවරුන් මහකොමසාරිස්වරුන් සඳහා අදාළ රටවලින් පිරිනමන පිළිගැනීමේ ලිපිය ලබාගැනීමේ වගකීම පැවරෙන්නේ සන්ධාන අංශයටය. ලංකාවේ නිර්වේතනික කොන්සල්වරුන් පත්කිරිම හා ශ්‍රී ලංකාවේ සිටින වෙනත් රටවල නිර්වේතනික කොන්සල්වරුන් පත්කිරිම පිළිබඳ වගකීම මෙම අංශය වෙත පැවරේ. සමාලෝචනයට බඳුන්වන කාලය තුළදී මෙම අංශය විසින් පවත්වන ලද උත්සව අවස්ථා මෙසේය,

i. ශ්‍රී ලංකාව සඳහා විදේශීය දූත මණ්ඩලවල ප්‍රධානීන්ගේ පත් කිරිම් - 20

ii. විදේශීය රටවල සිටින ශ්‍රී ලංකා නිර්වේතනික හා කොන්සල්වරුන්ගේ පත්කිරීම්

| | | |
|---|---|---|
| නව පත් කිරීම් | - | 13 |
| සේවා කාලය දීර්ඝ කිරිම | - | 21 |

ii. ශ්‍රී ලංකාවේ සිටින නිර්වේතනික කොන්සල්වරුන්ගේ පත් කිරිම් - 01

4. **මෙම අංශය විසින් සම්බන්ධීකරණ කටයුතු සඳහා පවත්වන ජාත්‍යන්තර සමුළු**

ජාත්‍යන්තර සමුළු පැවැත්වීම සඳහා සිත්ගන්නාසුළු ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරිමෙහිලා සන්ධාන අංශය මූලික කාර්යභාරයක් ඉටු කරයි. මේ සම්බන්ධයෙන් මෙම අංශය අදාළ රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සමග සමීපව කටයුතු සම්බන්ධීකරණය කරයි.

එවැනි ජාත්‍යන්තර සමුළුවලට අදාළ වන සන්ධාන සහ සැපයුම් කටයුතු ඉටුකිරීම සඳහා අදාළ රේඛීය නියෝජිතායතනවල කාර්ය මණ්ඩල සාමාජිකයන්ට අවශ්‍ය සහාය හා මාර්ගෝපදේශ ලබා දෙනුයේද මෙම අංශය විසිනි.

i. 69 වැනි නිදහස් දින සැමරුමට සමගාමීව 2017 පෙබරවාරි 2 සිට 3 දක්වා අනේවාසික දූත මණ්ඩල ප්‍රධානීන් හා ආරක්ෂක අනුයුක්තිකයන් උපදේශකයන් සඳහා හඳුනාගැනීමේ වැඩසටහනක් (පොළොන්නරුව) මෙම අංශය විසින් සංවිධානය කෙරින.

ii. සංක්‍රමණික සෞඛ්‍ය පිළිබඳ 02 වන ගෝලීය සාකච්ඡාව 2017 පෙබරවාරි මස 21 සිට 23 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේදී පැවැත්විණි.

iii. ජාත්‍යන්තර වෙසක් දින උත්සවය 2017 මැයි 12-14 දිනවල ශ්‍රී ලංකාවේදී පවත්වන ලදී.

iv. සාර්ක් අභ්‍යන්තර කටයුතු/ ස්වදේශ කටයුතු අමාත්‍යවරුන්ගේ 08 වන රැස්වීම 2017 ජූලි 11-13 දිනවල දී ශ්‍රී ලංකාවේදී පවත්වන ලදී.

v. සාර්ක් සෞඛ්‍ය අමාත්‍යවරුන්ගේ 6 වන රැස්වීම 2017 ජූලි 27-29 දිනවල දී ශ්‍රීලංකාවේදී පවත්වන ලදී.

vi. දුරස්ථ දිවයින් වලට ප්‍රතිචාරත්මකව එක්සත් ජාතීන්ගේ මතද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ සංවිධානය මගින් අතිශයින් වැදගත් සිද්ධීන් කළමනාකරණය කිරීම පිළිබඳ කලාපීය රැස්වීම 2017 අගෝස්තු 21-22 දිනවල පැවැත්විණ.

vii. දෙවන ඉන්දියන් සාගර සම්මේනය 2017 අගෝස්තු 31 සිට සැප්තැම්බර් 01 දක්වා කාලය තුළදී ශ්‍රී ලංකාවේදී පවත්වන ලදී.

viii. අතිරේක ලේකම්ට සමාන තරාතිරමක් දරන ජෝර්ජියාවේ විදේශ කටයුතු අමාත්‍ය ඩේවිඩ් ජලගැත්යා මහතා 2017 සැප්තැම්බර් 15-18 කාලය තුළ ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

ix. 2017 නගර ජාල සමුළුව 2017 නොවැම්බර් 5-8

x. 2017, 7 වන බෞද්ධ මහා සම්මේලනය 2017 නොවැම්බර් 2-5 දිනවල පවත්වන ලදී.

xi. සාර්ක් කථානායකවරුන්ගේ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ රැස්වීම 2017 ඔක්තෝබර් 4-6 දින වල පවත්වන ලදී.

xii. 14 වන සාර්ක් නීති සම්මේලනය හා 11 වන සාර්ක් අග්‍ර විනිශ්චය කාරවරුන්ගේ රැස්වීම් 2017 ඔක්තොම්බර් 27-29 දින වලදී කොළඹදී පැවැත්වින.

xiii. බහු ආංශික තාක්ෂණික සහයෝගිතා පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල සංවිධානයේ තාක්ෂණ හුවමාරු පහසුකම් පිළිබඳ විශේෂඥයින් හුවමාරු කර ගැනීමේ 6 වන රැස්වීම 2017 නොවැම්බර් 21-22 දිනවල පැවැත්වින.

xiv. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ 10 වන සම්මන්ත්‍රණය 2017 දෙසැම්බර් 4-8 දින වලදී කොළඹදී පැවැත්වින.

xv. බෝනොවෙන රෝග පිළිබඳ වාර්ෂික රැස්වීම 2017 දෙසැම්බර් 09-10 දින වලදී පැවැත්වින.

## 5. ශ්‍රී ලංකා සංචාර

### (අ) රාජ්‍ය ප්‍රධානීන්ගේ /අමාත්‍යවරුන්ගේ ශ්‍රී ලංකා සංචාර

i. 2017 මැයි මස 11-12 දක්වා වෙසක් උත්සවය සම්බන්ධයෙන් ඉන්දීය අග්‍රාමාත්‍ය ගරු නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ සංචාරය

ii. 2017 මැයි 14 වැනි දින ෆෙඩරල් නේපාල ජනරජයේ ජනාධිපතනි ගරු බිද්‍යා දේවී බන්ඩාරිගේ සංචාරය

iii. 2017 පෙබරවාරි 25 වන දින සීෂෙල්ස් ජනාධිපති අතිගරු ඩැනී රොලන් පවුරිගේ සංචාරය

iv. මැලේසියාවේ ජනාධිපති ගරු දාතො ශ්‍රී හජී මොහොමඩ් නජීබ් බිංතුන් හජි අබ්දුල් රසාක් මැතිතුමා 2017 දෙසැම්බර් 18-19 වන දිනවල කළ සංචාරය.

**(ආ) ශ්‍රී ලංකාවේ සංචාරයේ නිරත වූ විදේශ අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන්**

i. 2017 මාර්තු මස 16-18 දක්වා කොරියානු ජනරජයේ විදේශ කටයුතු අමාත්‍යවරයාගේ සංචාරය

ii. 2017 මැයි මස 31 වැනි දින මාලදිවයිනේ ජනාධිපතිගේ විශේෂ නියෝජිත, මාලදිවයිනේ විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය මොහොමඩ් අසීන්ගේ සංචාරය

iii. 2017 ජූලි මස 24-28 දක්වා නේපාල විදේශ කටයුතු අමාත්‍ය ගරු ආචාර්ය ප්‍රකාශ් ෂර්මා මහතාගේ සංචාරය

iv. 2017 ජූලි මස 17-24 දක්වා සිංගප්පූරු විදේශ කටයුතු අමාත්‍ය (පා.ම.) ගරු ජූලියා බිෂොප් මැතිණියගේ සංචාරය

v. ඕස්ට්‍රේලියාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු ජූලි බිෂොප් මැතිතුමා 2017 ජූලි 19-20 දිනවල කළ සංචාරය

vi. කටාර්හි ආර්ථික හා වාණිජ්‍ය අමාත්‍ය ගරු ෂෙයිඩ් අහ්මඩ් බින් ජාසම් අල්තානි මැතිතුමා 2017 ඔක්තොම්බර් 29-31 දිනවල කළ සංචාරය

vii. එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ විදේශ කටයුතු අමාත්‍ය එච්. එම්.ෂෙයික් අබ්දුල්ලා බින් සෙයිඩ් අල් නයිසාන් මැතිතුමා 2017 නොවැම්බර් 15 දින කළ සංචාරය

**(ඇ) එක්සත් ජාතීන්ගේ හා අනෙකුත් ජාත්‍යන්තර සංවිධානවල සම්භාවනීය පුද්ගලයන්**

i. 2017 පෙබරවාරි මස 10 වන දින ලෝක ආහාර වැඩ සටහනේ විධායක අධ්‍යක්ෂගේ හා ආසියා පැසිෆික් කලාපයේ අධ්‍යක්ෂගේ සංචාරය

ii. 2017 පෙබරවාරි මස 6-7 දක්වා සාර්ක් සංවිධානයේ මහලේකම් අර්ජුන් බහදූර් තාපාගේ සංචාරය

iii. 2017 මාර්තු 19-22 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කළමනාකාර අධ්‍යක්ෂගේ සංචාරය

iv. 2017 මැයි මස 29-30 දක්වා සාර්ක් මහ ලේකම්වරයාගේ ශ්‍රී ලංකා සංචාරය

v. එක්සත් ජාතීන්ගේ සත්‍යය, යුක්තිය, හානි පූර්ණය සහ නැවත සිදුනොවන බවට සහතික වීම සම්බන්ධ විශේෂ වාර්තාකරු පබ්ලෝ ද ග්‍රීෆ් මහතා 2017 ඔක්තෝබර් මාසයේ 10-23 දිනවල කළ සංචාරය

vi. එක්සත් ජාතීන්ගේ දේශපාලන කටයුතු පිළිබඳ යටත් රාජ්‍ය ලේකම් තෝමස් ඒ ශනෝන් මහතා 2017 නොවැම්බර් 06-07

(ඈ) **මාර්ගස්ථ සංචාර**

i. දකුණු අප්‍රිකානු ජනාධිපති අතිගරු ජාකොබ් සුමා මැතිතුමා 2017 සැප්තැම්බර් 01-02 දිනවල සහ 05-06 දිනවල කළ සංචාර

ii. තිගාර් ජන රජයේ ජනාධිපති අතිගරු මහමාඩො ඉසව්ෆො මැතිතුමා 2017 ඔක්තෝබර් 17 වන දින කළ සංචාරය

(ඉ) **අනෙකුත් විදේශීය සම්භාවනීය පුද්ගලයන්**

i. 2017 ජනවාරි මස 02-03 දක්වා ඉන්දීය රජයේ කෘෂිකර්ම හා සුභසාධන අමාත්‍ය ගරු ශ්‍රී රාධා මොහාන් සිංගේ මැතිතුමාගේ සංචාරය

ii. 2017 ජනවාරි මස 02-08 දක්වා ලන්ඩනයේ පිහිටි ශ්‍රී ලංකා සර්වපාක්ෂික පාර්ලිමේන්තු කණ්ඩායමේ සභාපති ගරු ලෝඩ් නස්බිගේ සංචාරය

iii. 2017 ජනවාරි මස 07-08 දක්වා ඉන්දියාවේ අන්ද්‍රා ප්‍රදේශ ප්‍රධාන අමාත්‍ය ගරු චන්ද්‍රාබාබු නයිදු මැතිතුමාගේ සංචාරය

iv. 2017 පෙබරවාරි මස 11-19 දක්වා ව්‍යවස්ථා සභාවේ සභාපති ගරු ලෝරන්ට් ෆේබියස් මැතිතුමාගේ සංචාරය

v. 2017 මාර්තු මස 13-14 දක්වා යුරෝපා සංගම් ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිසම යටතේ පාලනය නීතියේ ආධිපත්‍යය හා මානව හිමිකම් සම්බන්ධ කෘත්‍යාධිකාරි කණ්ඩායමේ සංචාරය.

vi. 2017 මාර්තු මස 27-29 දක්වා සෞදි අරාබි රාජධානියේ ශූරා සභාවේ කතානායක ආචාර්ය අබ්දුල්ලාහ් බින් මොහොමඩ් බින් ඊබ්‍රහිම් අල්ෂෙයික්ගේ සංචාරය

vii. 2017 පෙබරවාරි මස 18-21 දක්වා ඉන්දීය විදේශ කටයුතු ලේකම් ආචාර්ය ජයිෂංකර්ගේ සංචාරය

viii. එක්සත් ජනපද කොංග්‍රස් නියෝජිත පිරිසගේ සංචාරය

ix. 2017 ජූලි මස 04 දින සෞදි අරාබියේ අල්වලීඩ් බින් තලාල් කුමරුගේ සංචාරය

x. චීන මහජන දේශපාලන උපදේශන සමුළුවේ සභාපති ගරු ෂෙන්ග්සෙන්ගේ සංචාරය

xi. 2017 අප්‍රේල් මස 2-5 දක්වා ජර්මානු බන්ඩෙස්ටෑග් සභාපති මහාචාර්ය නොර්බට් ලැම්බර්ට්ගේ සංචාරය

xii. 2017 අප්‍රේල් 21 වන දින පළමු ශ්‍රී ලංකා-පලස්තීන දේශපාලන සාකච්ඡා

xiii. ජර්මානු විදේශ කාර්යාලයේ රාජ්‍ය ලේකම් ආචාර්ය මාර්කුස් එඩර්ගේ සංචාරය

xiv. 2017 අප්‍රේල් මස 15-19 දක්වා කැබිනට් ලේකම් කාර්යාලයේ සභාපති ගරු ජේ. මන්ක්බට්ගේ ප්‍රධානත්වයෙන් මොන්ගෝලියානු නියෝජිත පිරිසගේ සංචාර.

xv. පලස්තීනයේ සමාජ කටයුතු හා සෞඛ්‍ය අමාත්‍ය ගරු පිර්කෝ මුටිලා මැතිතුමාගේ සංචාරය

xvi. 2017 මැයි මස 01-04 දක්වා සිංගප්පූරු විදේශ ලේකම් ඇල්බට් චාගේ සංචාරය

xvii. චෙක් ජනරජයේ විදේශ කටයුතු කනිෂ්ඨ නියෝජ්‍ය අමාත්‍ය ගරු ඉමාන් ජන්කාරෙෂ්ගේ සංචාරය

xviii. 2017 මැයි මස 29-31 දක්වා සාර්ක් සංවිධානයේ මහලේකම් ගරු අම්ජාඩ් හුසේන් බී සියල්ගේ සංචාරය.

xix. 2017 අගෝස්තු මස 04-11 දක්වා තුර්කි ජනරජයේ හිටපු අග්‍රාමාත්‍ය ගරු මහාචාර්ය අහමඩ් ඩවුටෝග්ලු මැතිතුමාගේ සංචාරය.

xx. 2017 සැප්තැම්බර් මස 01-08 දක්වා එක්සත් රාජධානියේ අභ්‍යන්තර විහාර සංගමයේ භාණ්ඩාගාරික ඩේවිඩ් පිට්ටාවේ මහතාගේ සංචාරය.

xxi. 2017 අගෝස්තු මස 21-24 දක්වා කොළොම්බියානු නිලධාරීන් (විශේෂඥයන්) ගේ සංචාරය.

xxii. 2017 සැප්තැම්බර් මස 19-21 දක්වා යුරෝපියානු කොන්සර්වේටිව් හා ප්‍රතිසංස්කරණවාදීන්ගේ සංචාරය.

xxiii. යුරෝපා සංගමයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නියෝජන කණ්ඩායමක් ඔක්තෝබර් 29-30 දිනවල කළ සංචාරය.

xxiv. ඉන්දුනීසියාවේ පුඩුචෙරි කථානායක ගරු වර්තිලිංගම් මහතාගේ 2017 නොවැම්බර් 8-9 දිනවල කළ සංචාරය.

xxv. තායිලන්තයේ ආචාර්ය චුලාභෝත් මහිදොල් රජ කුමරිය 2017 නොවැම්බර් 25-30 දිනවල කළ සංචාරය.

xxvi. යුරෝපා සංගමයේ කොන්සවටිව් පක්ෂයේ සාමාජිකයින් සහ ප්‍රතිසංස්කරණවාදීන් 2017 සැප්තැම්බර් 9-22 වන දිනවල සිදු කළ සංචාරය.

xxvii. ඉන්දියාවේ විදේශ ලේකම් ආචාර්ය එස්.ජයශංකර් මැතිතුමාගේ 2017 නොවැම්බර් 18-19 දින සංචාරය.

**6. විදේශයන්හි සිදුකළ සංචාර**

**(අ)** අතිගරු ජනාධිපතිවරයා විසින් සිදුකළ විදේශ සංචාර

| | | |
|---|---|---|
| ඉන්දුනීසියාව | ඉන්දීය සාගර වටද්දර සංගමය | 2017 මාර්තු මස 06-08 |
| රුසියාව | රාජ්‍ය සංචාරය | 2017 මාර්තු මස 22-24 |

| | | |
|---|---|---|
| ඕස්ට්‍රේලියාව | රාජ්‍ය සංචාරය | 2017 මැයි මස 23-26 |
| බංග්ලාදේශය | රාජ්‍ය සංචාරය | 2017 ජූලි මස 13-15 |
| ඇමරිකා එක්සත් ජනපදය (නිව්යෝර්ක්) | රාජ්‍ය සංචාරය | 2017 සැප්තැම්බර් 17-25 |
| කටාර් | රාජ්‍ය සංචාර | 2017 ඔක්තෝබර් 24-26 |
| දකුණු කොරියාව | රාජ්‍ය සංචාර | 2017 නොවැම්බර් 28-30 |

**(ආ) ගරු අග්‍රාමාත්‍යවරයාගේ විදේශ සංචාර**

i. 2017 ජනවාරි මස 16-22 දක්වා ස්විස්ටර්ලන්තයේ, ඩාවෝස් හි පැවති ලෝක ආර්ථික සංසදය.

ii. 2017 පෙබරවාරි මස 13-17 දක්වා ඕස්ට්‍රේලියාවේ නිල සංචාරය.

iii. 2017 අප්‍රේල් මස 10-14 දක්වා ජපානයේ නිල සංචාරය.

iv. 2017 අප්‍රේල් මස 15-19 දක්වා වියට්නාමයේ නිල සංචාරය.

v. 2017 අප්‍රේල් මස 25-27 දක්වා ඉන්දියාවේ නිල සංචාරය.

vi. 2017 මැයි මස 13 සිට 17 දක්වා චීන නිල සංචාරය. (එක් තීරයක් එක් මාවතක් සංසදය)

vii. 2017 ඔක්තෝබර් 5-12 දක්වා ජර්මනියේ සහ පින්ලන්තයේ කළ නිල සංචාරය.

viii. 2017 නොවැම්බර් 21-24 දිනවල ඉන්දියාවේ කළ නිල සංචාරය.

**(ඇ) විදේශ කටයුතු අමාත්‍ය තිලක් මාරපන මැතිතුමාගේ සංචාරය**

| | | |
|---|---|---|
| i. | ඉන්දියාවේ | 2017.09.08 – 2017.09.10 |
| ii. | බ්‍රසල්ස් බොස්නියාව සහ හර්සගෝවිනා | 2017.09.24 – 2017.10.03 |
| iii. | දකුණු අප්‍රිකාව | 2017.10.17 - 2017.10.23 |
| iv. | තායිලන්තය | 2017.10.25 - 2017.10.27 |
| v. | චීනය | 2017.10.29 - 2017.11.04 |
| vi. | දකුණු කොරියාව | 2017.11.26 - 2017.12.01 |

**(ඈ) විදේශ කටයුතු අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමා**

| | | | |
|---|---|---|---|
| i. | ඉතියෝපියාව | - | 2017.01.30 - 2017.02.04 |
| ii. | මාලදිවයින | - | 2017.02.08 - 2017.02.09 |
| iii. | ජිනීවා | - | 2017.02.26 - 2017.03.08 |
| iv. | රුසියාව | - | 2017.03.22 - 2017.03.26 |

**(ඉ) විදේශ කටයුතු අමාත්‍ය ගරු රවි කරුණානායක මැතිතුමාගේ සංචාර**

| | | | |
|---|---|---|---|
| i. | ඉන්දියාව | - | 2017.06.06 - 2017.06.07 |
| ii. | ස්විස්ටර්ලන්තය හා කටාරය | - | 2017.07.06 - 2017.07.10 |

**(ඊ) විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානායක මැතිතුමාගේ සංචාර**

| | | | |
|---|---|---|---|
| i. | රොමේනියාව | - | 2017.06.28 - 2017.07.04 |
| ii. | නේපාලය | - | 2017.08.10 - 2017.08.13 |
| iii. | බීරූට් | - | 2017.08.16 - 2017.08.20 |
| iv. | ස්ලෝවේනියාව | - | 2017.08.29 - 2017.09.06 |
| v. | ඉන්දියාව | - | 2017.09.24 - 2017.09.25 |
| vi. | කටාර් | - | 2017.09.25 – 2017.09.26 |
| vii. | කෙන්යාව | - | 2017.11.28 – 2017.11.30 |

****

# පොදු සන්නිවේදන අංශය

## පොදු සන්නිවේදන අංශය

පොදු සන්නිවේදන අංශය මෙහෙයුම් අංශයක් වන අතර තොරතුරු බෙදාහැරීම හා විදේශ රටවලදී ලංකාවේ ප්‍රතිරූපය විදහා දැක්වීම සඳහා ලංකා රජය හා බාහිර ක්‍රියාකාරීන් අතර සම්බන්ධතා පවත්වා ගෙන යාම එම අංශය මගින් සිදුකරනු ලැබේ. ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය හා ජාත්‍යන්තර සබඳතා සම්බන්ධයෙන් අමාත්‍යාංශය තුළ හා පොදුවේ ලංකාව තුළ සිද්ධීන්/අවස්ථා ආවරණය කරනුයේද මෙම අංශයයි.

**1. ප්‍රධාන ක්‍රියාකාරකම්:**

i. විදේශ රටවල පිහිටි ලංකා දූත මණ්ඩල සමඟ කටයුතු සම්බන්ධීකරණය කිරීම තුළින් විදේශ රටවලදී ලංකාවේ ප්‍රතිරූපය ප්‍රවර්ධනය කිරීම.

ii. විදේශ රටවල පිහිටි ලංකා දූත මණ්ඩලවලට තොරතුරු/ප්‍රචාරක ද්‍රව්‍ය බෙදා හැරීම හා මාධ්‍ය නිවේදන/රජයේ ප්‍රකාශ හරහා දූත මණ්ඩල හා මුළුමහත් ජනතාව දැනුම්වත් කිරීම;

iii. අමාත්‍යාංශයට අදාළවන විවිධ පැතිකඩවල් පිළිබඳව හා ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය/ජාත්‍යන්තර සබඳතා වලට අදාළ කටයුතු පිළිබඳව මාධ්‍ය නගන ප්‍රශ්නවලට පිළිතුරු ලබාදීම;

iv. සංචාරක කටයුතු, වෙළඳාම හා ආයෝජන ප්‍රවර්ධනය කළ හැකි තොරතුරු ආදිය දූත මණ්ඩල හා පාර්ශ්වකරුවන් අතර බෙදාහැරීම.

v. දේශීය හා විදේශීය මාධ්‍ය සමඟ අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම.

vi. දේශපාලන අංශ සමඟ සාකච්ඡා කිරීමෙන් මාධ්‍ය නිවේදන සැකසීම හා නිකුත් කිරීම.

vii. ලංකාවට පැමිණෙන විදේශීය මාධ්‍ය අංශ සඳහා මාධ්‍ය කටයුතු සිදුකරගෙන යාම සඳහා අවසරය ලබාදීම;

viii. ලංකාවේ තිබෙන විදේශීය ලිපි ලේඛනවල හා ලංකාව පිළිබඳව පළවන වාර්තා වල ගොනු පවත්වාගෙන යාම;

ix. සියලුම දූත මණ්ඩල හා නිලධාරීන් සඳහා දේශීය මුද්‍රිත මාධ්‍ය සමාලෝචනයක් වන දෛනික තොරතුරු ප්‍රකාශනයක් (DIB) සම්පාදනය කිරීම හා අමාත්‍යාංශ වෙබ් අඩවියට ඇතුළත් කිරීම සඳහා විදේශීය හා දේශීය මාධ්‍යවල පළවන ලංකාවට වැදගත් වන ප්‍රවෘත්ති වාර්තා තේරීම;

x. සමාජ මාධ්‍යජාලයන් (මුහුණුපොත, ට්විටර්, යුටියුබ්, ඉන්ස්ටග්‍රෑම් හා සවුන්ඩ් ක්ලවුඩ්) ඇතුළුව අමාත්‍යාංශ වෙබ් අඩවිය පවත්වාගෙන යාම;

xi. ලංකාවේ පවත්වනු ලබන චිත්‍රපට උළෙලවල්, මාධ්‍ය වැඩමුළු හා සමුළු ප්‍රවර්ධනය කිරීම හා ඒවාට පහසුකම් සැලසීම;

2. **විදේශීය මාධ්‍යවේදීන්ගේ හා චිත්‍රපට කණ්ඩායම්වල සංචාර**

ප්‍රවෘත්ති ආවරණය කිරීම සඳහා සහ සංචාරක කටයුතු වලට හා සංස්කෘතියට අදාළවන චිත්‍රපට හා රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදනය කිරීම සඳහා ලංකාවට පැමිණෙන විදේශීය මාධ්‍යවල සංචාරකයින් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමේ හා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීමේ හා ඔවුන්ට මාධ්‍යකටයුතු සිදුකරගෙන යාම සඳහා තාවකාලික අවසරය ලබාදීමේ කර්තව්‍යයෙහි නියැලෙන්නේ මෙම අංශයයි. 2017 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල සීමාව තුළදී තාවකාලික මාධ්‍ය අවසරපත් 282ක් නිකුත් කොට ඇති අතර මීට චිත්‍රපට ව්‍යාපෘති 23ක් ඇතුළත් විය.

3. **මාධ්‍ය නිවේදන නිකුත් කිරීම**

මෙම අංශය අමාත්‍යාංශයේ, දූත මණ්ඩලවල හා ලංකා රජයේ කාර්ය කටයුතු සම්බන්ධයෙන් දූත මණ්ඩල හා දේශීය/විදේශීය මාධ්‍ය සඳහා මාධ්‍ය නිවේදන 350ක් නිකුත් කොට තිබේ.

4. **විදේශීය අතිශයින් වැදගත් පුද්ගලයන්ගේ / ඉතා වැදගත් පුද්ගලයන්ගේ ලංකා සංචාර හා මාධ්‍ය කටයුතු ආවරණය කිරීම**

i. ප්‍රංශයේ ව්‍යවස්ථා සභාවේ සභාපති හා ප්‍රංශයේ හිටපු අග්‍රාමාත්‍ය ගරු ලෝරන්ට් ෆැබියුස් මැතිතුමා 2017 පෙබරවාරි 14 වන දින ජාත්‍යන්තර සබඳතා හා ක්‍රමෝපායික අධ්‍යයන සඳහා ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේදී "යුරෝපය හා ජාත්‍යන්තර සාමය" යන මැයෙන් පැවැත්වූ දේශනය සඳහා මාධ්‍ය ආවරණය.

ii. 2017 මාර්තු 15 වැනි දින පැවති කොරියානු සමූහාණ්ඩුවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු යුන්-බියුන්-සේ මැතිතුමාගේ නිල සංචාරය.

5. **ඡායාරූප ගැනීමේ අවස්ථාව සහ මාධ්‍ය වාර්තාකරණය**

i. මරණයට පත් ලාංකික සංක්‍රමණික සේවකයන්ගේ පවුල්වලට හා ආබාධිත තත්ත්වයට පත්වූ සේවකයන්ට අමාත්‍යාංශයේ දී වන්දි මුදල් ගෙවීම, 2017 මාර්තු 16 වැනි දින.

ii. සෝමාලියානු මුහුදු කොල්ලකරුවන් විසින් ලාංකික යාත්‍රාව පැහැරගනු ලැබීම පිළිබඳව නියෝජ්‍ය විදේශ කටයුතු අමාත්‍යවරයා, අධ්‍යක්ෂ ජනරාල් (කොන්සියුලර් අංශය) හා නාවික හමුදා මාධ්‍ය ප්‍රකාශකවරයා විසින් අමාත්‍යාංශයේදී පවත්වන ලද ප්‍රවෘත්ති සාකච්ඡාව - 2017 මාර්තු 17 වන දින.

iii. ජී.එස්.පී + සම්බන්ධයෙන් විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයා පැවැත්වූ මාධ්‍ය සාකච්ඡාව

iv. සිංගප්පූරු විදේශ කටයුතු අමාත්‍ය ගරු ආචාර්ය විවියන් බාල ක්‍රිෂ්ණන් මැතිතුමාගේ ලංකා නිල සංචාරය- 2017 ජූලි 18.

v. ඕස්ට්‍රේලියානු විදේශ කටයුතු ඇමතිනී ගරු ජූලී බිෂොප් මැතිණියගේ ලංකා නිල සංචාරය - 2017 ජූලි 19 වන දින.

****

# දකුණු ආසියා හා සාර්ක් අංශය

## දකුණු ආසියා හා සාර්ක්

### 1.ඇෆ්ගනිස්ථානය

i. ඇෆ්ගනිස්ථාන මුද්‍රණාලය යළිත් නගා සිටුවන ලෙස එම රජය විසින් කරන ලද ඉල්ලීම සම්බන්ධයෙන් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කරමින් සිටියි.

ii. යුනෙස්කෝ ශිෂ්‍යත්ව වැඩසටහන හා ජනාධිපති ශිෂ්‍යත්ව ඇතුළු ශිෂ්‍යත්ව වැඩසටහන් යටතේ ඇෆ්ගනිස්ථාන ජාතිකයින්ට ශිෂ්‍යත්ව කීපයක් පිරිනැමීමට අවශ්‍ය පහසුකම් ජනාධිපති කාර්යාලය විසින් සපයන ලදී.

iii. ''විවෘත ආකාශ" (Open Sky) ප්‍රතිපත්තිය කෙරෙහි අවධානය යොමු කරමින් හා ගුවන් ගමන් කේන්ද්‍රස්ථානයක් ලෙසද ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කරමින්, ශ්‍රී ලංකා එයාර්ලයින්ස් හා ගිවිසුම්ගත කිරීම සඳහා ගමනාන්තයක් ලෙස කාබුල් නුවර සංචාරක නියෝජිතයින් අතර ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම දූතමණ්ඩලය විසින් පහසුකම් සලසන ලදී. ඇෆ්ගනිස්ථාන බලධාරීන්ගෙන් ලද ගුවන් සේවා ගිවිසුමේ කෙටුම්පත ශ්‍රී ලංකාවේ අදාළ බලධාරීන් වෙත යොමු කරන ලදී.

iv. ඇෆ්ගනිස්ථානයේ බාමියන් බුද්ධ ප්‍රතිමාව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා දෙපාර්මේන්තුවේ සහාය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා දූත මණ්ඩලය කාබුල් හි පිහිටි යුනෙස්කෝ කාර්යාලය හා ඇෆ්ගනිස්ථානයේ සංස්කෘතික අමාත්‍යාංශය සමඟ සමීපව කටයුතු කර තිබේ. පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා නුදුරු අනාගතයේදී මෙම ස්ථාන නැරඹීම සඳහා එහි යාමට එකඟ වී තිබේ.

v. 2017.10.16 දින මත්ද්‍රව්‍ය හා අපරාධ සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ ජාතික වැඩසටහන් සම්බන්ධීකාරක නිලධාරීන් ගරු තානාපතිවරයා හමුවූ අතර පොපි ගොවීන් වෙනුවෙන් ලංකාවේ කෘෂිකාර්මික හා කුඩා කර්මාන්ත හිමියන්ට දැකබලා ගැනීමේ අවස්ථා ලබා ගැනීමේ හැකියාව සාකච්ඡා කළේය.

vi. ආරාධනයකට අනුව, ගරු තානාපතිවරයා ඇෆ්ගනිස්ථානයේ ගුවන් විදුලි හා රූපවාහිනී ආයතනයේ සංචාරය කළේය. මෙම සංචාරයේදී, ජනමාධ්‍ය ඔස්සේ අන්‍යෝන්‍ය පුද්ගල සබඳතා ඉහළනංවා ගැනීම සඳහා ඇෆ්ගනිස්ථාන රූපවාහිනිය හා ලංකා රූපවාහිනී සංස්ථාව අතර බැඳීම් ඇති කර ගැනීමේ වැදගත්කම මෙම ආයතනය විශේෂයෙන් දක්වා සිටියේය.

### 2. බංග්ලාදේශය

#### අ. බංග්ලාදේශයේ නියැලුණු සංචාර

i. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා 2017 ජූලි 13-15 දිනවලදී බංග්ලාදේශයේ රාජ්‍ය සංචාරයක නියැලුණි. මෙම සංචාරය අතරතුරදී දෙරට අතර අවබෝධතා ගිවිසුම් 13 කටත් සාම ගිවිසුමකටත් අත්සන් තබන ලදී. තවද මෙහිදී එරට අග්‍රාමාත්‍යතුමා, ජනාධිපතිතුමා, කථානායකතුමා, විපක්ෂනායකතුමා, විද්‍යා කටයුතු අමාත්‍යතුමා හා සෞඛ්‍ය අමාත්‍යතුමා සමඟ අතිගරු ජනාධිපතිතුමා ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීය. අතිගරු

ජනාධිපතිතුමා සමඟ මෙම සංචාරයට එක්වූ ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමත් මෙම රාජ්‍ය සංචාරයට සමගාමීව පැවති ව්‍යාපාරික සංසඳයකට සහභාගී විය.

ii. ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු ලේකම් ඇසල වීරකෝන් මහතා, 3 වැනි විදේශ කාර්යාල උපදේශන සැසිය සඳහා 2017 ජූලි 03 වැනි දින බංග්ලාදේශයේ සංචාරයක නියැලිණි.

iii. බංග්ලාදේශ ජාත්‍යන්තර හා ක්‍රමෝපායික අධ්‍යයන ආයතනය විසින් කරන ලද ආරාධනයකට අනුව, හිටපු ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය 2017 මැයි 21-24 දිනවලදී ඩකාහි සංචාරයක නියැලුණාය.

iv. කර්මාන්ත හා වාණිජ අමාත්‍ය ගරු රිෂාඩ් බදියුදීන් මැතිතුමා ඩකාහි පැවති UNESCAP ආසියා පැසිෆික් සංසදයට සහභාගී වීම සඳහා 2017 පෙබරවාරි 08-10 දිනවලදී බංග්ලාදේශයේ සංචාරයක නියැලිණි.

v. නාගරික සැලසුම් රාජ්‍ය අමාත්‍ය ගරු වෛද්‍ය එස්. ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය 2017 අගෝස්තු 07-11 දිනවලදී ඩකාහි සංචාරයක නියැලුණාය.

vi. කථානායක ගරු කරු ජයසූරිය මැතිතුමා ඩකාහි පැවති 136 වැනි අන්තර් පාර්ලිමේන්තු සංගමයට (IPU) සහභාගී වීම සඳහා 2017 මාර්තු මස 30-අප්‍රේල් 06 දිනවලදී බංග්ලාදේශයේ සංචාරයක නියැලිණි.

vii. 2017 මාර්තු 11-14 දිනවලදී ඩකාහි පැවති ''ප්‍රචණ්ඩකාරී අන්තවාදය හා දේශ සීමා ඉක්මවා සිදුකරනු ලබන අපරාධ මැඬ පැවැත්වීමෙහි ලා කලාපීය සහයෝගීතාව" පිළිබඳව දකුණු ආසියාවේ හා අසල්වැසි රටවල පොලිස් ප්‍රධානීන්ගේ සමුළුවට පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා සහ නියෝජ්‍ය පොලිස්පති එල්. කේ. පී. පීරිස් මහතා සහභාගී වූහ.

viii. නාගරික සැලසුම් හා ජලාපවහන අමාත්‍ය ගරු රාවුෆ් හකීම් මැතිතුමා 2017 ජූලි 29-30 දෙදින තුලදී ඩකාහි පැවති ජල සමුළුවට සහභාගී විය.

ix. බංග්ලාදේශ බුද්ධා ක්‍රිස්ටි ප්‍රාචාර් සංඝා සංවිධානය මගින් සංවිධානය කරන ලද බංග්ලාදේශයේ පැවති අටීෂ ඩිපන්කර් සාම රන් සම්මාන උළෙලට සහභාගීවීම සඳහා බුද්ධශාසන අමාත්‍යාංශයේ ලේකම් චන්ද්‍රප්‍රේම ගමගේ මහතා 2017 පෙබරවාරි 22-25 දිනවලදී ඩකාහි සංචාරයක නියැලිණි.

x. මෙම කමිටුවේ නියෝජ්‍ය සභාපති, පා.ම., ගරු අමීර්තනාදන් අඩෛයිකලනාදන්ගේ මූලිකත්වයෙන් යුත් නියෝජිත පිරිසක් 2017, නොවැම්බර් මස 4 - 8 දක්වා ඩකා හී පැවැති 63 වැනි පොදුරාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සමුළුවට සහභාගි වූහ.

xi. ප්‍රසම්පාදන අධ්‍යයනයකට සහභාගිවීම සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිසමේ ත්‍රිපුද්ගල නියෝජිත පිරිසක් 2017 නොවැම්බර් 20-24 දක්වා බංග්ලාදේශයේ ඩකා නුවර සංචාරයක නියැලුණෝය.

xii. ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ආර්ථික කටයුතු හා වෙළඳ (කලාපීය හා තාක්ෂණික සහයෝගිතාවය) අංශයේ අධ්‍යක්ෂ ජනරාල් සෝබිනි ගුණසේකර මිය හා සාගර කටයුතු, උපායමාර්ගික ආරක්ෂාව, දේශගුණික විපර්යාස හා ප්‍රතිපත්ති සැලසුම් අංශයේ අධ්‍යක්ෂ ජනරාල් ශෂිකලා ප්‍රේමවර්ධන මිය, 2017 නොවැම්බර් මස 22 -23 දක්වා බිම්ස්ටෙක් සහයෝගිතා (BIMSTEC) සංවිධානය මගින් සංවිධානය කළ ඩකා හි පැවැති නීල ආර්ථිකය සම්බන්ධයෙන් ජාත්‍යන්තර වැඩමුළුවට සහභාගි විය.

**ආ. ශ්‍රී ලංකාවේ නියැලුණු සංචාර**

i. සාර්ක් කථානායකවරුන්ගේ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමයේ පැවති සමුළුවට සහභාගීවීම සඳහා ගරු අචාර්ය ෂිරින් ෂාමින් චෞද්රි මහතා 2017 ඔක්තෝබර් 03-06 දිනවලදී ශ්‍රී ලංකාවට පැමිණියේය.

ii. 2017 අගෝස්තු 31- සැප්තැම්බර් 02 දිනවලදී ශ්‍රී ලංකාවේ පැවති 2 වැනි ඉන්දියානු සාගර සමුළුවට වාණිජ අමාත්‍ය ගරු ටොෆේල් අහමඩ් මහතා සහභාගී විය.

iii. බංග්ලාදේශ පාර්ලිමේන්තුවේ ශ්‍රී ලංකා - බංග්ලාදේශ පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය යළි පණ ගන්වන ලදී. දූත මණ්ඩලය මේ සම්බන්ධයෙන් බංග්ලාදේශ පාර්ලිමේන්තුව සමඟ ඉතා ක්‍රියාශීලීව කටයුතු කළේය.

iv. මහ කොමසාරිස් කාර්යාලය විසින් 2012 සිට අක්‍රිය තත්ත්වයේ පසුවන ශ්‍රී ලංකා බංග්ලාදේශ වාණිජ හා කර්මාන්ත මණ්ඩලය (SLCCI) යළි පණගන්වන ලදී.

v. ශ්‍රී ලාංකික ආයෝජකයින් බංග්ලාදේශයේදී මුහුණපාන ගැටලුවලට විසඳුම් ලබාදීමේදී සහයවීමට ශ්‍රී ලාංකික නිලධාරියෙකු බංග්ලාදේශ ආයෝජන සංවර්ධන අධිකාරියේ තැබීමට මෙම මහ කොමසාරිස් කාර්යාලයට හැකි වී තිබේ.

vi. මෙම මහකොමසාරිස් කාර්යාලය විසින්, ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ පුද්ගලයන් ලවා දේශන පවත්වමින් ඩකාහි සිටින ශ්‍රී ලංකික ප්‍රජාව සඳහා මානව සම්පත් සංවර්ධන වැඩසටහන් දියත් කරන ලදී.

**3. භූතානය**

i. කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් යුතුව අමාත්‍යාංශයීය සත් සාමාජික නියෝජිත කණ්ඩායමක් භූතානයේ අධ්‍යයන චාරිකාවක නියැලිණි.

ii. ශ්‍රී ලංකා රජය විසින් කරන ලද ආරාධනයකට අනුව ඩෝජි ලොපේන් කින්ලේ උතුමාණන්ගේ නායකත්වයෙන් යුතු සත් සාමාජික බෞද්ධ ආගමික නියෝජිත කණ්ඩායමක් 2017 මැයි 12-14 දිනවලදී කොළඹ පැවති ජාත්‍යන්තර වෙසක් උළෙලට සහභාගී විය.

iii. ශ්‍රී ලංකාව-භූතානය අතර ගුවන් සේවා ගිවිසුම පිළිබඳ වැඩකටයුතු අවසන් කරමින් සිටින අතර 2017 දෙසැම්බර් 04-08 දිනවලදී කොළඹදී පැවැත්වීමට නියමිත ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සාකච්ඡාමය සමුළුවේදී (ICANC) ඊට අත්සන් තැබීමට නියමිතය.

iv. ආෂි ඩොර්ජි වැන්ග්මෝ වැන්ග්චුක් රැජිනගේ මුලිකත්වයෙන් යුත් දස සාමාජික භූතාන නියෝජිත පිරිසක් 2017 දෙසැම්බර් 28 සිට 2018 ජනවාරි 06 දින දක්වා වන්දනා චාරිකාවක් සඳහා ලංකාවේ සංචාරයක් සිදු කළේය.

4. **ඉන්දියාව**

**ද්විපාර්ශ්වික සබඳතා**

ධීවර කටයුතු පිළිබඳ ශ්‍රී ලංකා- ඉන්දියා ඒකාබද්ධ කණ්ඩායමේ දෙවැනි රැස්වීම 2017 අප්‍රේල් 07 වැනි දින ශ්‍රී ලංකාවේදී පවත්වන ලදී.

අ. **ඉන්දියාවේ නියැලුණු සංචාර**

i. ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා 2017 අප්‍රේල් 25-30 දිනවලදී ඉන්දියාවේ සංචාරයක නියැලිණි. මෙහිදී දෙරට අතර "ආර්ථික ව්‍යාපෘති සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමට" අත්සන් තබන ලදී.

ii. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක ගරු ආර්. සම්බන්දන් මැතිතුමා 2017 මාර්තු 13-15 දිනවලදී ඉන්දියාවේ සංචාරයක නියැලිණි.

iii. ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු රවි කරුණානායක මැතිතුමා 2017 ජූනි 06-07 දිනවලදී ඉන්දියාවේ සංචාරයක නිරතවිය.

iv. ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු තිලක් මාරපන මැතිතුමා 2017 සැප්තැම්බර් 08-10 දිනවලදී ඉන්දියාවේ සංචාරයක නිරත විය.

v. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍ය ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා ලෝක CSR දිනයේදී ප්‍රධාන දේශනය කිරීම සඳහා 2017 පෙබරවාරි 17-18 දිනවලදී මුම්බායි බලා පිටත් විය. එතුමා 2017 මැයි 15-16 දිනවලදී යළිත් වරක් ඉන්දියාව බලා පිටත් විය.

vi. මාර්තු මස පැවති නීති විශේෂඥයන් පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේ ප්‍රධාන දේශනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ අග්‍රවිනිශ්චයකාර ප්‍රියසාත් ඩෙප් මැතිතුමා මුම්බායි බලා පිටත් විය.

vii. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක ගරු කරු ජයසූරිය මැතිතුමා, අනගාරික ධර්මපාල 153 වැනි ගුණානුස්මරණ සංවත්සරයට සහභාගීවීම සඳහා ඉන්දියාවේ සංචාරයක නියැලිණි.

viii. ශ්‍රී ලංකාවේ සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය ගරු ජෝන් අමරතුංග මැතිතුමා බැංගලෝරයේ සංචාරයක නියැලිණි.

ix. ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය ගරු දයා ගමගේ මැතිතුමා කේරළ ප්‍රාන්තයේ සංචාරයක නිරත විය.

x. ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍ය ගරු සරත් ෆොන්සේකා මැතිතුමා 2017 ජනවාරි 16-18 දිනවලදී ඉන්දියාවේ සංචාරය කළේය.

xi. සංවර්ධන උපායමාර්ගික හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍ය ගරු මලික් සමරවික්‍රම මැතිතුමා 2017 ජනවාරි 31 - පෙබරවාරි 02 දක්වා වූ දිනවලදී ඉන්දියාවේ සංචාරයක නියැලිණි.

xii. නීතිය හා සාමය දක්ෂිණ සංවර්ධන අමාත්‍ය ගරු සාගල රත්නායක මැතිතුමා 2017 මාර්තු 14-15 දිනවලදී ඉන්දියාව බලා පිටත්විය.

xiii. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මැතිතුමා 2017 මාර්තු 15-16 දිනවලදී ඉන්දියාවේ සංචාරය කළේය.

xiv. නිවාස සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍ය ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා 2017 මාර්තු මස 27-29 දිනවලදී ඉන්දියාව බලා පිටත්විය.

xv. මුදල් අමාත්‍ය ගරු රවි කරුණානායක මැතිතුමා 2017 අප්‍රේල් 02-03 දිනවලදී ඉන්දියාවේ සංචාරයක නියැලිණි.

xvi. උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා 2017 අප්‍රේල් 15-17 දිනවලදී ඉන්දියාවේ සංචාරයක නිරත විය.

xvii. සංවර්ධන උපායමාර්ගික හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍ය ගරු මලික් සමරවික්‍රම මැතිතුමා 2017 අප්‍රේල් 19 වැනිදා හා 2017 අප්‍රේල් 25-27 දිනවලදී ඉන්දියාවේ සංචාරයක නියැලිණි.

xviii. ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය ගරු චන්දිම වීරක්කොඩි මැතිතුමා 2017 අප්‍රේල් 19 වැනි දින ඉන්දියාවේ සංචාරයක නියැලිණි.

xix. පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ගරු ෆයිසර් මුස්තාපා මැතිතුමා 2017 මැයි 09-10 දෙදින තුළදී ඉන්දියාවේ සංචාරයක නිරත විය.

xx. කර්මාන්ත හා වාණිජ අමාත්‍ය ගරු රිෂාද් බදියුදීන් මැතිතුමා 2017 මැයි 16-17 දිනවලදීත් 2017 අගෝස්තු 31 - සැප්තැම්බර් 05 දිනවලදීත් ඉන්දියාවේ සංචාරයක නියැලිණි.

xxi. රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය ගරු කබීර් හෂීම් මැතිතුමා 2017 ජූනි 07 වැනි දින ඉන්දියාව බලා පිටත්විය.

xxii. විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍ය ගරු හරින් ප්‍රනාන්දු මැතිතුමා 2017 ජූනි 29 වැනි දින ඉන්දිවේ සංචාරයක නියැලිණි.

xxiii. විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානායක මැතිතුමා 2017 ඔක්තෝබර් 2-4 දක්වා ඉන්දියාවේ සංචාරයක් සිදුකළේය. මෙම සංචාරයේදී,

රාජ්‍ය අමාත්‍යාවරයා විසින් ස්පාඤ්ඤය, ඊශ්‍රාලය, බ්‍රූනේ, දරුසලම් හි දූත මණ්ඩල ප්‍රධානියා සමගින්, ලක්සම්බර්ග් නියෝජ්‍ය තානාපතිවරයා සමගින් රැස්වීම් පැවැත්වූහ.

xxiv. නව දිල්ලියේ පැවැති 2017 සයිබර් අවකාශය සම්බන්ධයෙන් වූ 5 වැනි ගෝලීය සමුළුවට සහභාගි වීම සඳහා ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා 2017 නොවැම්බර් 22 - 24 දක්වා ඉන්දියාවේ සංචාරයක නියලුණේය. මෙම සංචාරයේ දී ගරු අග්‍රාමාත්‍යතුමා විසින් අතිගරු ඉන්දීය ජනාධිපති, ගරු ඉන්දීය අග්‍රාමාත්‍ය, ඉන්දියාවේ හිටපු ජනාධිපති ප්‍රනාබ් මුකර්ජී මැතිතුමා සහ ඉන්දිය ජාතික කොංග්‍රසයේ සභාපති ගරු සෝනියා ගාන්ධි මැතිණිය සමඟ සාකච්ඡා පැවැත්වූහ.

xxv. ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා වාණිජ අමාත්‍ය ගරු රිෂාඩ් බදුයුඩීන් මැතිතුමාගේ මූලිකත්වයෙන් යුත් නියෝජිත පිරිසක් විසින් 2017 නොවැම්බර් 03 දින නව දිල්ලියේ විග්‍යන් බවන් හිදී පැවැති ලෝක ඉන්දියානු ආහාර - 2017 සඳහා සහභාගි වූහ.

xxvi. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සමඟ නිෂ්පාදන හා අපනයන සමාගම් පහක මූලිකත්වයෙන් යුත් සය සාමාජික නියෝජිත පිරිසක් 2017 දෙසැම්බර් 4 - 7 දක්වා වන දිල්ලියේ පැවැති ජාත්‍යන්තර ආරෝග්‍යා 2017 ට සහභාගිවූහ.

xxvii. මහ කොමසාරිස් කාර්යාලය, ඉන්දීය බලධාරීන් (බුද්ධි නිලධාරීන් ඇතුලුව) සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කළ අතර දෙරට අතර අන්‍යෝන්‍ය වේතනික සහයෝගය යටතේ මෙම ප්‍රශ්නය පිළිබඳ පරීක්ෂණයක් සම්බන්ධයෙන් 2017 නොවැම්බර් 26 - 28 දක්වා මුම්බයි හා තානේ නුවරට ශ්‍රී ලංකාවේ මූල්‍ය අපරාධ පරීක්ෂණ කොට්ඨාශයේ නිලධාරීන් දෙදෙනෙකුගේ සංචාරය ලබාගත් හ.

**මෙරට සිදුකල සංචාර**

i. ඉන්දියාවේ අග්‍රාමත්‍ය ගරු නරේන්ද්‍ර මෝදි මැතිතුමා ජාත්‍යන්තර වෙසක් උළෙලට සහභාගීවීම සඳහා 2017 මැයි 11-12 දිනවලදී ශ්‍රී ලංකාවට පැමිණියේය.

ii. ඉන්දියාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු සුෂ්මා ස්වරාජ් මැතිණිය දෙවැනි ඉන්දියානු සාගර සමුළුවට සහභාගී වීම සඳහා 2017 අගෝස්තු 31- සැප්තැම්බර් 01 දිනවලදී ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලුණාය.

iii. අන්ද්‍රා ප්‍රදේශයේ ප්‍රධාන අමාත්‍ය ගරු චන්ද්‍රභානු නායිදු මැතිතුමා 2017 ජනවාරි 07-08 දිනවලදී ශ්‍රී ලංකාවට පැමිණියේය.

iv. 2017 ඔක්තෝම්බර් 24 - 30 දක්වා පැවැති කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර තාක්ෂණික ප්‍රදර්ශනය - 2017 ට සහභාගි වීම සඳහා සමාගම් දෙකේ නියෝජිතයන් ලංකාවේ සංචාරයක නියලුණෝය.

**(ආ) බහුපාර්ශ්වීය සබඳතා**

ත්‍රස්තවාදය මැඩපැවැත්වීමේ සමුළුව (2017 මාර්තු 14-16), සාගර සංවාදය (2017 අප්‍රේල් 19-21), ගෝලීය ව්‍යාපාරික සමුළුව (2017 මාර්තු 27-28) බෞද්ධ සම්ප්‍රදායන්, මතවාදයන් හා විසම්මුතිය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (2017 සැප්තැම්බර් 07-08), කාන්තා ව්‍යවසායකත්ව හා නිපුණතා සංවර්ධනය පිළිබඳ ඉන්දියානු සාගර අවට රටවල සංවිධානයේ වැඩමුළුව (2017 සැප්තැම්බර් 27) යන සමුළු ඉන්දියාවේ පවත්වන ලද අතර නවදිල්ලි නුවර පිහිටි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය විසින් ශ්‍රී ලංකාවේ සහභාගීත්වය තහවුරු කරමින් අදාළ බලධාරීන් සමඟ අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.

**(ඇ)** සයිෆයි : පැසිෆික් හා ඉන්දීය සාගරයේ පාළම සම්බන්ධයෙන් අවධානය යොමු කළ සම්මන්ත්‍රණයක්, හා තාක්ෂණය, ආරක්ෂාව හා සමාජය සම්බන්ධයෙන් ඉන්දීය සමුළුව 2017 ඔක්තෝබර් 26 දින ඉන්දියාවේ දී පවත්වන ලදී. ශ්‍රී ලාංකික සහාභාගීත්වය තහවුරු කරමින් නව දිල්ලියේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය මගින් අදාළ බලධාරීන් සම්බන්ධීකරණය සිදු කරන ලදී.

**(ඈ) ආර්ථික සබඳතා හා විදේශ ආයෝජන**

නවදිල්ලිය, චෙන්නායි හා මුම්බායි හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලය විසින් වෙළෙඳ හා සංචාරක වෙළෙඳපලවල්, වීදි දර්ශන, සමුළු ආදිය සඳහා අවශ්‍ය පහසුකම් සලසා ඒවාට සහභාගි වී නගන ලද වෙළෙඳ හා අයෝජන ප්‍රශ්නවලට පිළිතුරු ලබාදී වෙළඳ මණ්ඩල හා ඉන්දියානු ආනයනකරුවන් හා ව්‍යාපාරිකයින් සමඟ කටයුතු කරන ලදී. ශ්‍රී ලංකාවට ආයෝජන ආකර්ෂණය කර ගැනීමේදී වැදගත් වන ඉන්දියානු ආයෝජකයන් සමඟ හමු පවත්වන ලදී.

i. මැණික්, තොරතුරු තාක්ෂණය, කුළුබඩු, මොටර් රථ උපාංග සහ සෞඛ්‍ය විසඳුම්, ආත වෙළඳ මණ්ඩල හා කර්මාන්ත සංගම්වල සාමාජිකයන් සමඟ ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික රැස්වීම් පිළියෙල කරන ඉන්දීය සමාගම් 16 කට සහය ලබා දුනි.

ii. 2017 ඔක්තෝබර් 30 වන දින T-සංගමයේ සාමාජිකයන් සඳහා ලංකා තේ ප්‍රවර්ධන වැඩසටහන සංවිධානය කළේය. මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් විසින් තේ රස බැලීමේ සැසියක් මගින් ලංකාවේ විශේෂිත තේ සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීමක් සිදුකළේය.

iii. චෙන්නායි හා කොචින් හි රඳවාගත් නෞකා රාශියක් (නිරෝධායක නිශ්කාෂණය/ තීරුබදුරහිත බාධක) නිෂ්කාශනය කිරීම සඳහා ක්‍රියාකාරීව සම්බන්ධවී පහසුකම් සැලසීය.

iv. ශ්‍රී ලංකාවේ ආයෝජන මණ්ඩල නිළධාරීන් හා අනෙකුත් අදාළ ආයතන සමග පැවැති රැස්වීම් සඳහා පහසුකම් සැලසීය.

v. ඉන්දියාව හා ආසියාන් සංවිධානයේ සහයෝගිත්වයෙන්, ශ්‍රී ලංකාවේ වාණිජ හා කාර්මාන්ත මණ්ඩලය මගින් එම මණ්ඩලයේ සාමාජිකයන් දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ වෙළඳ හා ආයෝජන අවස්ථා සම්බන්ධයෙන් සම්මන්ත්‍රණයක් සංවිධානය කළේය.

vi. මුම්බයි හි පිහිටි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයේ සහයෝගිත්වයෙන්, 2017 නොවැම්බර් 16-18 දක්වා ලෝක තේ හා කෝපි ප්‍රදර්ශනයේ 5 වන කලාපයේදී සහභාගිත්වය සංවිධානය කළේය.

**ඈ. සංස්කෘතික සබඳතා**

ප්‍රදර්ශන, සමුළු හා උළෙලවල් ඇතුළු විවිධ සංස්කෘතික අවස්ථාවලට නවදිල්ලි, චෙන්නායි හා මුම්බායි හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල අවශ්‍ය පහසුකම් සලසා ඒවාට සහභාගිවී ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා පළාත් පාලන හා මධ්‍යම ආණ්ඩු හා සංවිධාන සමග අවශ්‍ය කටයුතුවල නියැලිණි.

නවදිල්ලියේ ඉන්දිරා ගාන්ධි ජාතික කලා මධ්‍යස්ථානයේ දී, දෙසැම්බර් 8 - 10 දක්වා නවදිල්ලියේ විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් "බෝධි පර්වඃ බිම්ස්ටෙක් බෞද්ධ උරුම උත්සවය " සංවිධානය කරන ලදි. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ නිලධාරීන් හා ශ්‍රී ලංකා මහ කොසාරිස් කාර්යාලයේ නිලධාරීන් සමාරාම්භක උත්සවයට සහභාගි විය.

**ඉ. අධ්‍යාපනය, තාරුණ්‍යය, විද්‍යාව හා තාක්ෂණය**

**ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින්,**

i. විද්‍යුත් කාර්යාල ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ හා විදුලි උපකරණ අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් සිදුකිරීමට පහසුකම් සලසන ලදී.

ii. ශ්‍රී ලංකාව හා ඉන්දියාව (අයුෂ් අවබෝධතා ගිවිසුම) අතර දැනට අවසානයට එළඹ ඇති, සාම්ප්‍රදායික ඖෂධ අවබෝධතා ගිවිසුම පිළිබඳ කරුණු සම්බන්ධීකරණය කරන ලදී.
ඉන්දියානු විශ්ව විද්‍යාල සඳහා ශ්‍රී ලාංකික සිසුන්ට ප්‍රවේශය ලබා ගැනීමට සහයෝගය ලබා දී පහසුකම් සැලසීම.

iii. සලීම් හි පිහිටි ඉන්දියානු හස්ත යන්ත්‍ර තාක්ෂණික ආයතනයේ සහයෝගිත්වයෙන්, ශ්‍රී ලාංකික තාක්ෂණ ශිල්පීන් සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන්, සංවිධානය කළ අතර, මෙම වැඩසටහන් 2017 අගෝස්තු හා දෙසැම්බර් මාසයේදී පවත්වන ලදී.

**ඊ. කම්කරු සුභ සාධනය හා අනෙකුත් සේවාවන්**

ශ්‍රී ලංකා ධීවරයින් 17 ක් නිදහස් කිරීමට හා නැවත ශ්‍රී ලංකාවට එවීමට, ශ්‍රී ලාංකික සරණාගතයින් 1,030 ක් ස්වේච්ඡාවෙන් ශ්‍රී ලංකාවට එවීමට හා

ජනාධිපති අරමුදල යටතේ ප්‍රතිකාර ලබන රෝගීන්ගේ කොන්සියුලර් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය පහසුකම් චෙන්නායි පිහිටි ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය හරහා සලසන ලදී.

චෙන්නායි පිහිටි දූත මණ්ඩලය මගින් ධීවරයන් නව දෙනෙක් හා ධීවර යාත්‍රා අටක් නිදහස් කර ගැනීමේ දී සහය ලබා දෙන ලදී.

i. සිවිල් ලිපි ලේඛන නිකුත් කිරීම සඳහා තමිල්නාඩු සරණාගත කඳවුරේ සිටින ශ්‍රී ලාංකිකයන් ස්වේච්ඡාවෙන් ආපසු ගෙන්වා ගැනීම සඳහා විශේෂ කොන්සියුලර් වැඩසටහන් සේවා පනස් දෙකක් (52) ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය මගින් පවත්වන ලදී. සරණාගතයින් සිය රටට ගෙන්වා ගැනීමේ වැඩසටහන (සරණාගතයින් සිය රටට ගෙන්වා ගැනීමේ විදේශ ගුවන්ගමන් බලපත්‍ර 1950) යටතේ උප්පැන්න සහතික හා විදේශ ගුවන් ගමන් බලපත්‍ර 3522 ක් නොමිලේ නිකුත් කරන ලදී. 2017 දෙසැම්බර් දක්වා ශ්‍රී ලංකාවට සරණාගතයින් 1513 ක් ආපසු පැමිණ සිටියෝය.

ii. ජනාධිපති අරමුදල යටතේ ශ්‍රී ලාංකික රෝගින් (49) ට පහසුකම් සැලසීම.

iii. පුද්ගලයන් 125 දෙනෙකු සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් පහසුකම් සලසා සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

## 5. මාලදිවයින

### ද්විපාර්ශ්වික සබඳතා

#### අ. එරට සිදුකළ සංචාර

i. අධ්‍යාපන අමාත්‍ය ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා 2017 මාර්තු මස 09-12 දිනවලදී මාලදිවයිනේ සංචාරය කළේය.

ii. 2017 පෙබරවාරි 08-09 දිනවලදී මාලේහිදී පැවති මාලදිවයින් - ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිෂන් සභාවේ තෙවැනි සැසිවාරයට සහභාගීවීම සඳහා විදේශ කටයුතු අමාත්‍ය ගරු මංගල සමරවීර මහතා මාලදිවයිනේ සංචාරයක නිරතවිය.

iii. සිරකරුවන් හුවමාරු කර ගැනීමේ ගිවිසුම යටතේ, ශ්‍රී ලාංකික සිරකරුවන් 14 දෙනෙකුගෙන්, ශ්‍රී ලංකාවට මාරුකරන ලද සිරකරුවන් 12 දෙනෙකුට දඬුවම් ලබා දීමට හැකිවන පරිදි දෙවෙනි භාෂාවෙන් ලියවුණ වැරදි කරුවන් බවට පත්කිරීමේ නියෝගවල ඉංග්‍රීසි භාෂා පරිවර්තනය ලබා ගැනීමට මෙම දූත මණ්ඩලය සහයෝගය ලබා දුන්හ.

#### ආ. ශ්‍රී ලංකාවේ නියැලුණු සංචාර

මාලදිවයිනේ විදේශ ආමාත්‍ය ගරු ආචාර්ය මොහොමඩ් අසීම් මැතිතුමා ශ්‍රී ලංකාවේ ගංවතුරෙන් විපතට පත්වූ ජනතාවට මූල්‍ය ආධාර පරිත්‍යාග ලබාදීම සඳහා 2017 මැයි 30 - ජූනි 03 යන කාලයේදී ශ්‍රී ලංකාවට පැමිණියේය.

ඈ. **බහුපාර්ශ්වික සබඳතා**

සෞඛ්‍ය අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මහතා 2017 සැප්තැම්බර් 06-10 දිනවලදී මාලදිවයිනේදී පැවති අග්නිදිග ආසියාව සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ කලාපීය කමිටුවේ 70 වැනි සැසිවාරයට සහභාගි විය.

ගිණිකොණ දිග ආසියාවේ ලෝක සෞඛ්‍ය සංවිධාන කලාපීය කමිටුවේ දාහත්වන සැසිය 2017 සැප්තැම්බර් 6 - 10 දක්වා මාලදිවයිනේ දී පවත්වන ලදී. ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිලධාරීන් සමග ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශ ගරු රාජිත සේනාරත්න මැතිතුමා මෙම කමිටුවට සහභාගි විය.

ඇ. **ආර්ථික සබඳතා හා විදේශ ආයෝජන**

i. 2017 අගෝස්තු 8-10 දිනවලදී මාලේහිදී පැවති ආහාර හා ආගන්තුක සත්කාර පිළිබඳ ආසියා මාලදිවයින් ප්‍රදර්ශනය හා ජාත්‍යන්තර ඉවුම් පිහුම් අභියෝගය 2017 සඳහා ප්‍රධාන ආරාධිතයා ලෙස ශ්‍රී ලංකා තනාපතිවරයා සහභාගි විය.

ii. ලංකා වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද 2017 ශ්‍රී ලංකා ආයෝජන හා ව්‍යාපාරික හමුව 2017 මැයි 30- ජූනි 01 දිනවලදී පවත්වන ලදී.

iii. මෙම දූත මණ්ඩල මගින් 2017 කොළඹ ආරක්ෂක සම්මන්ත්‍රණය සඳහා වූ ආරාධනාවක් (2017 අගෝස්තු 28 - 29 දක්වා පවත්වන ලදී), සමමිතික යුද පාඨමාලාව - 2018, ක්‍රියාන්විත දියකාව ප්‍රහාරය - 2017, ඒකාබද්ධ විශේෂ බලකා බහුජාතික ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන (2017 සැප්තැම්බර් 3 - 25 දක්වා) සහ කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව - 2017 (2017 අගෝස්තු 3 සහ 4 වැනි දිනයන් හිදී පැවැත්විය.)

iv. මාලදිවයිනේ බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයේ ජ්‍යේෂ්ඨ නිලධාරීන් විසින් තානාපතිවරයා මුණ ගැසු අතර අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් හා වාසි සහගත විෂයන් සම්බන්ධයෙන් බුද්ධිමය හුවමාරු කර ගැනීම, මාලදිවයින් පොලිස් සේවය හා ශ්‍රී ලංකා පොලිස් සේවය අතර පවතින අවබෝධතා ගිවිසුම අළුත් කිරීමත්, මාලදිවයින් පොලිස් නිලධාරීන් සඳහා විශේෂිත පුහුණු වැඩසටහන් ඇතුලුව ද්විපාර්ශවීය සහයෝගිතාවයට අදාළ ගැටළු සාකච්ඡා කරන ලදී.

v. සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහාත්, විදේශ ආයෝජන ලබා ගැනීම සඳහාත්, මාලදිවයිනේ පැවැති වෙළඳ ප්‍රදර්ශන හා ව්‍යාපාරික කව කිහිපයකදී මෙම දූත මණ්ඩල ප්‍රධානියා නියෝජනය කළ අතර සැපයුම් හා ඖෂධ ක්ෂේත්‍රයන්හි ශ්‍රී ලාංකික සමාගම් විසින් මුහුණදුන් වෙළඳ ආරවුල් /

අපහසුතා කිහිපයක් නිරාකරණය කර ගැනීමට මෙම දූත මණ්ඩලය සම්බන්ධීකරණය සිදුකරන ලදී.

vi. උපාධි අධ්‍යයනය (නම්කිරීම් පහක්), සාර්ක් කලාපයේ ශිෂ්‍යයන් සඳහා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ ශිෂ්‍යත්ව (නම් කිරීම් හතරක්), විදේශීය රාජ්‍යතාන්ත්‍රිකයන් සඳහා තාක්ෂණික සහයෝගිතා වැඩසටහන - 2017 (නම් කිරීම් 1 ක්) (2017 සැප්තැම්බර් 18 - 29 දක්වා බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රිකයන් පුහුණු කිරීමේ ආයතනයේදී පවත්වන ලදී) සහ අන්ත්‍ර සම්බන්ධව චිකිත්සක ප්‍රතිකාර හෙද ඩිප්ලෝමාව සඳහා ජනාධිපති ශිෂ්‍යත්ව පිරිනැමීම වෙනුවෙන් මෙම දූත මණ්ඩලය විසින් අයදුම්පත් කැඳවන ලදී. ශ්‍රී

vii. මාලදිවයින තුළ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සේවා ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයට මෙම දූත මණ්ඩලය පහසුකම් සලසන ලදී.

## 6. නේපාලය

### අ. මෙරට නියැලුණු සංචාර

i. ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලෙන ලෙස නේපාල විදේශ අමාත්‍යවරයාට ආරාධනයක් කර තිබේ.

ii. මහනුවර පැවති එක්සත් ජාතීන්ගේ අවසන් වෙසක් දින සැමරුමෙහි ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී වීම සඳහා පැමිණි නේපාල ජනපති අතිගරු ජනාධිපතිතුමා හමුවී ද්වි පාර්ශ්වික කරුණු පිළිබඳව සාකච්ඡා පවත්වන ලදී.

iii. නේපාල - ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ වෙළෙඳ නියෝජිත කණ්ඩායමක් 2017 පෙබරවාරි 21-25 දිනවලදී ශ්‍රී ලංකාවට පැමිණියේය.

iv. 2017 අගෝස්තු 31 - සැප්තැම්බර් 03 දක්වා වූ දිනවලදී කොළඹදී පැවති මැණික් හා ස්වර්ණාභාරණ ප්‍රදර්ශනයට සහභාගී වීම සඳහා නේපාලයේ අත්කම් සංගම් බලමණ්ඩලයේ හා නේපාලයේ මැණික් හා ස්වර්ණාභරණ සංගමයේ නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණියේය.

v. විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධයෙන් කෙටුම්පත් ගිවිසුමද, ලංකාව හා නේපාලය අතර සංචාරක සහයෝගිතාවය සම්බන්ධයෙන් ගිවිසුම ද, සංස්කෘතික සහයෝගිතාවය සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුම අළුත්කිරීම සම්බන්ධයෙන් වැඩිදුර සාකච්ඡා කිරීම සඳහා ඔක්තෝබර් මාසයේදී අදාළ නිලධාරීන් සමඟ දූත මණ්ඩල ප්‍රධානියා හමුවක් සිදුකරන ලදී.

vi. නේපාලය තුළ වෙළඳාම ප්‍රවර්ධනය කිරීමටත්, ජල විදුලිබලය, උසස් අධ්‍යාපනය, හා සෞඛ්‍ය අංශ හා සංචාරක කර්මාන්තයේ ආයෝජනය

සිදුකිරීමේ හැකියාව සොයා බැලීම සඳහා ඔක්තෝබර් හා නොවැම්බර් මාසවලදී නේපාලයේ වාණිජ මණ්ඩලයේ, බලශක්ති සංවර්ධන කවුන්සිලයේ හා අධ්‍යාපන උපදේශන සංගමයේ නේපාලයේ සම්භාවනීය අමුත්තන් සමඟ දූත මණ්ඩල ප්‍රධානියා හමුවක් පවත්වන ලදී.

vii. සංචාරක කටයුතු මෙහෙයවන්නන් හා අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීම සඳහා දෙසැම්බර් 4 වන දින සංචාරක කටයුතු මෙහෙයවන්නන්ගෙන් සමන්විත නේපාල සංචාරක මණ්ඩලය හා සංචාරක හා සංචාරක නියෝජිතයන්ගේ ලංකා සංචාරයට මෙම දූත මණ්ඩලය පහසුකම් සලසන ලදී.

viii. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය මගින් සැපයු පහසුකම් සහ සරණාගතයින් ලංකාවට ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් ලංකා සරණාගතයින්ගෙන් තානාපති කාර්යාලයට පැමිණිලි ලැබී ඇති බැවින්, ලාංකික සරණාගතයින්ගේ සුභසාධනය සහ ඔවුන්ගේ අවශ්‍යතාවයන් සාකච්ඡා කිරීම සඳහා දෙසැම්බර් මස 06 වැනි දින එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ නියෝජිතයා සමඟ හමුවක් දූත මණ්ඩල ප්‍රධානියා විසින් පවත්වන ලදී.

**ආ. නේපාලයේ නියැලුණු සංචාර**

i. නේපාලයේ යුධ හමුදා මාණ්ඩලික ප්‍රධානී ජනරාල් රාජේන්ද්‍ර චෙට්ට්‍රි මැතිතුමාගේ ආරාධනයකට අනුව ශ්‍රී ලංකා යුද හමුදාපති ලුතිනන් ජනරාල් ක්‍රිෂාන්ත ද සිල්වා මහතා, 2017 මාර්තු 15 වැනි දින නේපාලයේ සංචාරයක නියැලුණේය.

ii. ශ්‍රී ලංකාවේ පොලිස්පතිතුමා 2017 ජනවාරි 17-21 දිනවලදී නේපාලයේ සංචාරයක නියැලුණේය.

iii. ජනාධිපති නීතීඥ ශ්‍රී ලංකාවේ අග්‍රවිනිශ්චයකාර ප්‍රියසාත් ඩෙප් මැතිතුමා 2017 අගෝස්තු 16-20 දිනවලදී කත්මණ්ඩුහි පැවති සයිබර් අපරාධ හා විද්‍යුත් සාක්ෂි පිළිබඳ අධිකරණමය වැඩමුළුවට සහභාගී විය.

iv. විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානායක මැතිතුමා 2017 අගෝස්තු 11 වැනි දින නේපාලයේ කත්මණ්ඩු නුවර පැවති පහළොස් වැනි BIMSTEC අමාත්‍ය මට්ටමේ රැස්වීමට සහභාගි වූ අතර එහිදී නේපාලයේ අග්‍රාමාත්‍යවරයා ඉන්දියාවේ විදේශ කටයුතු අමාත්‍යවරයා, නේපාලයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍යවරයා සහ විදේශ කටයුතු අමාත්‍යවරයා හා භූතානයේ විදේශ කටයුතු අමාත්‍යවරයා හමුවිය.

v. 2017 මාර්තු මස කත්මණ්ඩු නුවර පැවති නේපාල ආයෝජන සමුළුවට සහභාගීවීම සඳහා FCCISL හි ශ්‍රී ලාංකික නියෝජිත පිරිසක් නේපාලය බලා පිටත්විය. මෙම සමුළුවේදී නේපාලයේ විවිධ අංශවල ඇ.ඩො. 500,000

ක් ආයෝජනය කරන බවට ශ්‍රී ලාංකික ආයෝජකයින් විසින් සහතික වී තිබේ.

සමාලෝචනයට බඳුන්වන කාලසීමාව තුළදී සහයෝගීතාව පිළිබඳ පහත සඳහන් අවබෝධතා ගිවිසුම්වලට අත්සන් තබන ලදී.

නේපාලයේ නේපාල ලෝක තතු කවුන්සිලය හා ජාත්‍යන්තර සබඳතා හා උපායමාර්ගික අධ්‍යයන සඳහා ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය අතර - 2017 සැප්තැම්බර් 14 වැනි දින සහ 2017 පෙබරවාරි මස ශ්‍රී ලංකාවේ වාණිජ හා කර්මාන්ත මණ්ඩලය අතර වෙළඳ සබඳතා ශක්තිමත් කිරීමේ අරමුණින් -

i. නේපාල රජය ගංවතුරෙන් විපතට පත් ශ්‍රී ලාංකික ජනතාව වෙනුවෙන් ඇ.ඩො. 50,000 ක මුදල් පරිත්‍යාගයක් ලබාදෙන ලදී.

ii. නේපාලයේ ගංවතුරෙන් විපතට පත් ජනතාව වෙනුවෙන් මානුෂීය ආධාර ලෙස ශ්‍රී ලංකාවද ඇ.ඩො. 50,000 ක මුදල් පරිත්‍යාගයක් ලබාදී තිබේ.

iii. සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් තානාපති කාර්යාලය විසින් නේපාලයේ සංචාරක නියෝජිතයන්ට සංචාර මෙහෙයවන්නන්ට ශ්‍රී ලංකාව පිළිබඳව විස්තර ඉදිරිපත් කර නේපාල ජාතිකයින් වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට එවීමට ඔවුන්ව දිරිමත් කරන ලදී.

iv. බන්ධනාගාරයේ රඳවාගෙන සිටින ශ්‍රී ලාංකික ජාතිකයෙකුට හා මිනිස් ජාවාරමේ වින්දිතයන් බවට පත්වී ඇති කත්මණ්ඩු හි අතරමංවී සිටින ශ්‍රී ලාංකික සරණාගතයින් දෙදෙනෙකුට මෙම දූත මණ්ඩලය විසින් කොන්සියුලර් හා නෛතික සහාය ලබාදෙන ලදී.

v. ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලයේ කරන ලද ඉල්ලීමකට අනුව නේපාලයෙන් ශ්‍රමිකයින් බඳවාගැනීමට මෙම දූත මණ්ඩලය සහාය වී තිබේ.

**7. පාකිස්ථානය**

**අ. ද්විපාර්ශවිය සබඳතා**

දක්වා ඇති කාලසීමාව තුළදී පහත සඳහන් නිලධාරීන් පාකිස්ථානයේ නියැලුණු සංචාරවලට පහසුකම් සලසන ලදී.

i. ශ්‍රී ලංකා නාවික හමුදාපතිවරයා 2017 පෙබරවාරි 10-17 දිනවලදී පාකිස්ථානයේ සංචාරයක නියැලිණි.

ii. නාගරික සංවර්ධන හා ජලාපවහනය පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිණිය හා ඛණිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු අනෝමා ගමගේ මැතිණිය කාන්තා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කාර්යභාරය පිළිබඳ සමුළුවට සහභාගීවීම සඳහා 2017.03.11 දින පාකිස්ථානය බලා පිටත් වූහ.

iii. ශ්‍රී ලංකා යුධ හමුදාපති හා නියෝජිත කණ්ඩායමක් 2017 මැයි 02-07 දිනවලදී පාකිස්ථානය බලා පිටත්විය.

iv. ග්‍රාමීය ආර්ථික අමාත්‍ය ගරු පී. හැරිසන් මැතිතුමා සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්, ආර් එච්.එස්. සමරතුංග මැතිතුමා පාකිස්ථාන රජය විසින් ශ්‍රී ලංකා රජයට ලබාදීමට නියමිත ඇ.ඩො. මිලියන 200 ක ණය පහසුකම පිළිබඳ ඒකාබද්ධ සම්බන්ධීකරණ කමිටුවේ රැස්වීම සඳහා 2017 මැයි මස 09 වන දින පාකිස්ථානය බලා පිටත් වූහ.

v. කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ ලේකම් ඩී.එස්. ලොකුහෙට්ටි මහතා සහ නියෝජිත කණ්ඩායම 2017 ජූලි 09-14 දිනවලදී ඉස්ලාමාබාද්හි සංචාරයක නිරත විය.

vi. පාකිස්ථානයෙන් ශ්‍රී ලංකාවට ලබාදීමට පොරොන්දු වී ඇති ඇ.ඩො. මිලියන 200 ක ණය පහසුකම පිළිබඳව සාකච්ඡා පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා ඒකාබද්ධ සම්බන්ධීකරණ කමිටුවට පාකිස්ථානයට පැමිණීමට අවශ්‍ය පහසුකම් සලසන ලදී. ඉස්ලාමාබාද්හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරියෙකු ඉහත රැස්වීම සඳහා සහභාගී විය.

vii. සාර්ක් නීති රීති පිළිබඳව 25 වැනි සංවත්සරයට සහභාගිවීම සඳහා ගරු ශ්‍රී ලංකා අගවිනිසුරුවරයා ඔක්තෝබර් මාසයේදී කරච්චි නුවර සංචාරය කළේය.

**ආ. ආර්ථික සබඳතා**

i. වාණිජ අමාත්‍යාංශයේ ලේකම් සහ සතොස සභාපතිවරයා සහභාගීත්වයෙන් පාකිස්ථානයෙන් බාස්මතී සහල් මෙට්‍රික් ටොන් 2000ක් මිලදී ගැනීම සඳහා ඉස්ලාම්බාද් වාණිජ අමාත්‍යංශ නිලධාරීන් සමඟ සාකච්ඡාවක් පවත්වන ලදී.

**ඇ. ව්‍යාපාරික සංචාර/ වෙළඳ නියෝජිත පිරිස් :**

i. අපනයන සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පාකිස්ථානයේ ලාහෝර් නුවරදී පැවැති ක්ෂේත්‍ර වෙළඳපල අධ්‍යයනය සඳහා ශ්‍රී ලංකා දූත මණ්ඩල පහසුකම් සලසන ලදී.

ii. පාකිස්ථානයේ තේ ලෝලීන්ගේ සහභාගීත්වයෙන් 2017 ජූලි 06 වැනි දින "ගෝලීය තේ සාදය" මෙම මහ කොමසාරිස් කාර්යාලය මගින් සංවිධානය කරන ලදී.

iii. පාකිස්ථානය තුළ ශ්‍රී ලංකා වෙළඳාම ආයෝජන හා සංචාරක කර්මාන්තරය ප්‍රවර්ධනය කිරීම සඳහා "එක්ස්පෝ 2017 සහ මාර්ගල උත්සවය 2017 ට මෙම දූත මණ්ඩලය සහභාගි විය."

iv. ශ්‍රී ලංකා පාකිස්ථානු ද්විපාර්ශවීය වෙළඳ සබඳතා ප්‍රවර්ධනය හා සොයා බැලීමටත් පකිස්ථානය ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ පවතින විෂමතා සාකච්ඡා කිරීමටත්, 2017 දෙසැම්බර් 15 සිට 19 දක්වා කරච්චිහි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල්වරයා විසින් ඉස්ලාම්බාද් හි වෙළඳ ප්‍රවර්ධන සංචාරයක් සිදුකළේය.

****

# එක්සත් ජාතීන් හා මානව හිමිකම් අංශය

## එක්සත් ජාතීන් හා මානව හිමිකම් අංශය

**(අ) එක්සත් ජාතීන්ගේ මහා සභා රැස්වීම-(72 වන සැසිය නිව්යෝර්ක් නුවර)**

1. නිව්යෝර්ක් නුවරදී, 2017 සැප්තැම්බර් හිදී එක්සත් ජාතින්ගේ මහා සභා රැස්විමේ 72 වැනි සැසියේ ඉහළ මට්ටමේ හමුව සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් යුත් ශ්‍රී ලංකා නියෝජිත පිරිසගේ සහභාගීත්වය සඳහා නීත්‍ය සහ සැපයුම් පිළියෙල කිරිම.

2. මෙම රැස්වීම අතරතුරදී, අනෙකුත් ඉහළ මට්ටමේ අවස්ථාවන් අතර එක්සත් ජනපදයේ ජනාධිපති අතිගරු ඩොනල්ඩ් ට්‍රම්ප් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් එක්සත් ජාතීන්ගේ ඉහළ මට්ටමේ අවස්ථාවේදී අතිගරු ජනාධිපතිතුමා සහභාගී වූ අතර ලෝක නායකයන් සමඟ ද්විපාර්ශ්වීය සාකච්ඡා පවත්වන ලදී. එතුමන් විසින් එක්සත් ජාතීන්ගේ මහලේකම් ඇන්ටෝනියෝ ගුටරස් සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් සෙයිද් රාද් අල් හුසේන් මහතා හමු විය.

3. එක්සත් ජාතීන්ගේ මහ සභා රැස්වීමේ ප්‍රධාන නිත්‍ය කමිටු 6 වැඩකටයුතු සඳහා ශ ශ්‍රී ලංකාවේ සපලදායි සහභාගීත්වය සහ දායකත්වය වෙනුවෙන් නිත්‍ය කෙටි සටහන් පිළියෙළ කරන ලදී.

4. එක්සත් ජාතීන්ගේ මහා සභා රැස්වීමේ විසඳුම් යෝජනාවලියට සම අනුග්‍රාහකත්වය ලබාදීම සඳහා කරන ඉල්ලීම් සම්බන්ධයෙන් නිව්යෝර්ක් හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලය සඳහා උපදෙස් ලබාදීමෙන් අනෙකුත් එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් සමඟ ශ්‍රී ලංකාවේ සබඳතාවයන්ට දායකත්වය සපයන ලදී.

**(ආ) සංහිඳියාව සහ මානව හිමිකම්**

5. දේශීය කොටස්කරුවන් හා ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ එක්ව, 'ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම හා මානව හිමිකම් කවුන්සිලයේ විසඳුම් යෝජනාවලි 30/1(2015) සහ 34/1(2017) යේදී, ශ්‍රී ලංකාව විසින් ලබාදුන් පොරොන්දු ඉටුකිරීම සම්බන්ධයෙන් ප්‍රගතියක් සිදුවී ඇත. ප්‍රගතිය විමසීම සඳහා දෛනිකව රැස්වෙන අමාත්‍යාංශ කමිටුව යටතේ විසඳුම් යෝජනා සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගරු අග්‍රාමාත්‍යතුමාගේ සහභාගීත්වය යටතේ නව අන්තර් අමාත්‍ය කමිටුවක් පිහිටුවන ලදී.

6. ජිනීවාහි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ සැසිවලදී ශ්‍රී ලංකාවේ සහභාගීත්වය වෙනුවෙන් නිත්‍ය සහ සැපයුම් සූදානම් කිරීම. මෙහිදී 34 වැනි සැසිය (2017 පෙබරවාරි 17 සිට 24), 35 වැනි සැසිය (2017 ජූනි 06-23), සහ 36 වැනි සැසිය (2017 සැප්තැම්බර් 11-29)

7. 34 වැනි සැසියේදී, ඒකමතිකව 2017 මාර්තු මස 23 වන දින එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය මගින් පිළිගත් ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම මැයෙන් වූ විසඳුම් යෝජනා සම්මුතිය 34/1 සඳහා ශ්‍රී ලංකාව සම අනුග්‍රාහකත්වය ලබාදුන්හ. මිත්‍රශීලී රටවල් සහ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයේ සහයෝගයෙන්, 2015 දරන විසඳුම් යෝජනා සම්මුති 30/1 ක්‍රියාත්මක කිරීම සඳහා වසර දෙකක කාලරාමු දිගුවක් ලබාගැනීමට ශ්‍රී ලංකාවට හැකිවිය.

8. මානව හිමිකම් කවුන්සිලයේදී විසඳුම් යෝජනා සම්මුතියේ සහ අනුග්‍රාහකත්වය සඳහා වූ ඉල්ලීම සම්බන්ධයෙන් ජිනීවා හි ශ්‍රී ලංකා දූත මණ්ඩලය වෙත උපදෙස් ලබාදීමෙන් අනෙකුත් එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් සමග ශ්‍රී ලංකාවේ සබඳතාවයක් සඳහා දායකත්වය ලබාදුන් අතර විශ්වකාලීන විමසුමේදී විමසුම සිදුකරන අවස්ථාවන්හිදී මිත්‍රශීලි රටවල් සහයෝගීත්වය පිළිබඳ ප්‍රකාශ සිදුකිරීම.

9. ශ්‍රී ලංකා විශ්ව කාලීන විමසුමේ තෙවන වටය 2017 නොවැම්බර් 15-17 දක්වා පවත්වන ලදී. ශ්‍රී ලංකාවට සිදුකල නිර්දේශ 230 න්, 177 ක් පිළිගත් අතර, 53 කට සටහන් තබන ලදී. මෙම විමසුමේදී ශ්‍රී ලංකාව විසින් ස්වෙච්ඡා ප්‍රතිඥ 12 ක් සිදුකරන ලදී. මෙම විශ්ව කාලීන විමසුමේ 3 වැනි වටය සඳහා ශ්‍රී ලංකාවේ ජාතික වාර්තා පිළියෙල කර ඉදිරිපත් කරන ලදී. මෙම විශ්ව කාලීන විමසුමේ 3 වැනි වටය සඳහා ශ්‍රී ලංකාවේ ජාතික වාර්තාව පිළියෙල කර ඉදිරිපත් කරන ලදී. කොළඹ, මහනුවර, ගාල්ල, යාපනය හා කල්මුණේ හිදී මහජන සාකච්ඡා පැවැත්වීම සම්බන්ධයෙන් ජාතික වාර්තාව ඉදිරිපත් කරන ලදී .

10. ශ්‍රී ලංකාව යනු එක්සත් ජාතීන්ගේ මහලේකම් කාර්යාලයේ සාමය ගොඩනැංවීමේ අරමුදලේ ප්‍රතිලාභයෙකි. මෙලෙස අදාළ කොටස්කරුවන් සමඟ සාකච්ඡාකර ජාතික සාමය ගොඩනැංවීමේ ප්‍රමුඛතා සැලැස්මක් වැඩිදියුණු කරන ලදී. සාමය ගොඩනැංවීමේ අරමුදල මගින් අරමුදල් ලබාදුන් ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා සාමය ගොඩනැංවීමේ මණ්ඩලයක් ස්ථාපනය කර ඇත. 2017 වර්ෂයේදී දෛනික වැඩමුළු රැස්වීම් පවත්වන ලදී. සාමය ගොඩනැංවීමේ මණ්ඩලයෙන් අරමුදල් ලබන එක් එක් ව්‍යාපෘතීන් සඳහා එම මණ්ඩලය මගින් පාලන කමිටු පිහිටුවීමේ ක්‍රියාවලියක නිරතව සිටියි.

11. අමාත්‍ය මණ්ඩලය විසින් පිහිටුවන ලද මානව හිමිකම් සම්බන්ධයෙන් අන්තර් අමාත්‍ය කමිටුවේ රාමුව තුළ ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මේ (NHRAP) 2017-2021 අමාත්‍යවරුන් සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් සකස් කිරීමේ, අවසන් කිරීමේ සහ අනුමැතිය ලබාගැනීමේ ක්‍රියාවලියට සහයෝගය ලබාදුනි. මෙම ක්‍රියාකාරී සැලැස්ම, 2017 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තු පරිශ්‍රයේදී පැවති උත්සවයකදී අග්‍රාමාත්‍යවරයා විසින් සියලුම භාෂා ත්‍රිත්වයෙන්ම (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) නිල වශයෙන් එළිදක්වන ලදී.

12. 2017 දෙසැම්බර් 05 වන දින එක්සත් ජාතීන්ගේ ප්‍රධාන කාර්යාලය සමග වදහිංසා පිටුදැකීමේ සම්මුතිය සහ විකල්ප සන්ධානයට එකතුවීමේ නෛතික ලේඛනය ශ්‍රී ලංකාව විසින් බාර දෙන ලදී.

13. 2017 නොවැම්බර් මස 20 වන දින, පළමුවතාවට ශ්‍රී ලංකාව විසින් ශ්‍රී ලංකාවේ සාමය ගොඩනැංවීමේ ගමන සම්බන්ධයෙන් එක්සත් ජාතින්ගේ සාමය ගොඩනැංවීමේ කොමිසමේ සාමාජිකයන්ට කරුණු පැහැදිලි කරන ලදී. තිරසර සාමයක් සඳහාත්, ප්‍රචණ්ඩත්වය නැවත සිදුවීම වැළැක්වීම සඳහාත් අවශ්‍ය විස්තීර්ණ ප්‍රතිසංස්කරණ ඇතුලුව සාකල්‍ය ප්‍රවේශයක් සම්බන්ධයෙන් මෙම ඉදිරිපත් කිරීම මගින් අවධානය යොමු කළේය.

**(ඇ) එක්සත් ජාතින්ගේ සාමරක්ෂක මෙහෙවර සඳහා ශ්‍රී ලංකාවේ දායකත්වය**

1. එක්සත් ජාතින්ගේ සාමරක්ෂක මෙහෙවර සඳහා හමුදා සහ පොලිස් භට පිරිස් යෙදවීම සම්බන්ධීකරණාව කළ අතර, 2017 දෙසැම්බර් 31 දින වන විට, හයිටි (මිනුස්ටා), මධ්‍යම අප්‍රිකානු ජනරජය (මිනුෂ්කා), දකුණු සූඩානය (අන්මිස්), ලෙබනනය (යුනිෆිල්) කොන්ගෝ (මොනුෂ්කෝ), සහ බටහිර සහරාව (මිනුර්ෂෝ), ඇබ්සෙයි (යුන්ෂ්ෆා), සහ මාලි (මිනුෂ්මා) ආදි එක්සත් ජාතීන්ගේ සාමාරක්ෂක මෙහෙවර 08 ක හමුදා, ගුවන් හමුදා, සහ පොලිස් භට පිරිස් 696 ක් සේවයේ යොදවා ඇත. බටහිර සහරාව (මිනුර්ෂෝ)-1, දකුණු සූඩානය (අන්මිස්)-(1), සහ මධ්‍යම අප්‍රිකානු ජනරජය (මිනුෂ්කා)-(3) හි සේවය කරමින් සිටින කාන්තා හමුදා නිලධාරිණියන් 5 දෙනෙකු මෙයට අයත් වේ. හමුදා නිලධාරීන් දෙදෙනෙකු නිව්යෝර්ක් හි පිහිටි එක්සත් ජාතින්ගේ ප්‍රධාන කාර්යාලයේ සාමාරක්ෂක මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ සේවය කරමින් සිටිති.

2. 2017 වර්ෂයේදී දකුණු සූඩානයේ 11-මට්ටමේ යුද හමුදා රෝහලක් (UNMISS) පිහිටුවීම සඳහා ශ්‍රී ලංකාව අඛණ්ඩව සහයෝගය ලබාදෙන ලදී. එක්සත් ජාතීන්ගේ මහ සභා රැස්වීමේදී 2015 සැප්තැම්බර් මාසයේදී සාමාරක්ෂාව සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සමුළු තුළදී අතිගරු ජනාධිපතිතුමා විසින් කරන ලද ප්‍රතිඥාවට එකඟතාවය පළකරමින් මෙම සංවිධානයට අයත් රටවල් සඳහා ශ්‍රී ලංකාවෙන් සටන් ආරක්ෂක බලකා සාමාජිකයන් 200 ක් ද, සාමාරක්ෂකයන් 150 ක් ද සේවයේ යොදවන ලදී. 2017 දෙසැම්බර් 25 දින මාලි (MINUSMA) හි එක්සත් ජාතීන්ගේ බහුමාන සමෝධන ස්ථායිකරණ මෙහෙවරෙහි ස්වයං තිරසර උපකරණ යොදවන ලදී.

3. එක්සත් ජාතීන්ගේ අදාළ බලධාරීන් විසින් ඇඟයීමට ලක්කර පිළිගත් ශ්‍රී ලාංකික සාමාරක්ෂකයන්ගේ විෂමාචාර පිළිබඳ චෝදනා විභාග අවසන් කිරීමට පියවර ගන්නා ලදී. ශ්‍රී ලාංකික සාමාරක්ෂකයන් සම්බන්ධයෙන් යම් යම් මාධ්‍යයන් හි පළවූ වැරදි තොරතුරු හා චෝදනාවන්ට එරෙහිව වහාම ක්‍රියාකිරීමට පියවර ගන්නා ලදී.

4. 2017 සැප්තැම්බර් මාසයේදී, එක්සත් ජාතීන්ගේ සාමාරක්ෂක මෙහෙවර ඇතුලුව එක්සත් ජාතින්ගේ සංවිධානය තුළ ලිංගික සූරාකෑම හා අපයෝජන මුලිනුපුටා දැමීම සඳහා ගිවිසුමක් අත්සන් කරමින්, ශ්‍රී ලංකාව විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම් වරයාගේ වැඩපිළිවෙලට සම්බන්ධ විය. ස්ථිර කැපකිරීම පෙන්නුම් කරමින් මහලේකම් වරයාගේ එක්සත් ජාතීන්ගේ මෙහෙයුම්වල ලිංගික සූරාකෑම සහ අපයෝජනය වැලැක්වීම සහ ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් වූ නායකත්ව කවයට ශ්‍රී ලංකාවද සම්බන්ධ වූ අතර වින්දිතයන් සඳහා වූ මහලේකම්වරයාගේ භාරකාර අරමුදලට දායකත්වය ලබාදුන්හ. 2017 නොවැම්බර් මාසයේදී ළමා සොල්දාදුවන් බඳවාගැනීම හා භාවිතය වැලැක්වීම සහ සාමාරක්ෂාව සම්බන්ධයෙන් වැන්කුවර් මූලධර්මයන්ට ශ්‍රී ලංකාව අනුමැතිය ලබාදුන්හ.

**(ඈ) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ විසඳුම් යෝජනා සම්මුතින්,**

5. එක්සත් ජාතින්ගේ ආරක්ෂක කවුන්සිල් විසඳුම් යෝජනා සම්මුතීන් ක්‍රියාත්මක කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් වගකීමට එකඟතාවය පළකරමින්, ශ්‍රී ලංකාව තුළ කොරියානු සමූහාණ්ඩුව සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිල් යෝජනා සම්මුතින් පැනවීම සඳහා 1968 අංක 45 දරන එක්සත් ජාතින්ගේ පනත යටතේ අදාළ දේශීය රෙගුලාසීන් කෙටුම්පත් කර ගැසට් පත්‍රයෙහි පළකරන ලදී. 2017 ඔක්තෝබර් මාසයේදී මෙම රෙගුලාසි පාර්ලිමේන්තුවේ සභාගත කළ අතර එමගින් රෙගුලාසි බලාත්මක වන අතර ඉන් අනතුරුව පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය පරිදි ජාත්‍යන්තර සබඳතා සම්බන්ධයෙන් ආංශික පාලන කමිටුව ඉදිරියට ගෙන එන ලදී. රෙගුලාසි ක්‍රියාත්මක කිරිමට සහ අධීක්ෂණය කිරීම සඳහා ශක්තිමත් බලධාරියෙක් (ආරක්ෂක අමාත්‍යාංශය) පත්කරන ලදී.

6. 2017 දෙසැම්බර් මාසයේදී, විදේශීය ත්‍රස්තවාදී සටන්කරුවන් (ආපසු පැමිණියවුන් සහ ප්‍රතිස්ථානගතවූවන්) සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව විසින් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිල් විසඳුම් යෝජනා සම්මුතියට සම-අනුග්‍රාහකත්වය ලබාදෙන ලදී.

7. එක්සත් ජාතීන්ගේ ත්‍රස්ත විරෝධි විධායක අධ්‍යක්ෂවරයාගේ සහයෝගයෙන්, අදාළ රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල ප්‍රතිලාභය උදෙසා, 2017 ජූනි මාසයේදී එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල විසදුම් යෝජනා සම්මුතින් සම්බන්ධයෙන් වැඩමුළුවක් කොළඹදී සංවිධානය කරන ලදී.

**(ඉ) ත්‍රස්තවාදි විරෝධය/න්‍යෂ්ටික අවි ව්‍යාප්තිය වැළැක්වීම සහ නිරායුධකරණය**

8. ශ්‍රී ලංකාව විසින් එක්සත් ජාතීන්ගේ ත්‍රස්ත විරෝධී විධායක අධ්‍යක්ෂවරයා සමඟ ඉතාමත් හිතෛෂී සබඳතා පවත්වාගෙන යයි. එක්සත් ජාතින්ගේ ත්‍රස්ත විරෝධී විධායක

අධ්‍යක්ෂවරයාගේ ඉල්ලීම පරිදි, 2017 ජූනි මාසියේදී කොළඹදී දකුණු ආසියානු රටවල් වෙනුවෙන් විනිශ්චයකරුවන්, අභිචෝදකයන් සහ පොලිස් නිලධාරීන් සඳහා ඵලදායිතාව ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීම සම්බන්ධයෙන් 12 වැනි කලාපීය වැඩමුළුවට ශ්‍රී ලංකාව සත්කාරකත්වය ලබාදෙන ලදී.

9. මත්ද්‍රව්‍ය සහ අපරාධ සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ ඉල්ලීම පරිදි, 2017 දෙසැම්බර් මාසයේදී ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූහ විනාශකාරී අවි ව්‍යාප්තිය වැළැක්වීම සම්බන්ධයෙන් කොළඹ දී පැවති වැඩමුළුවට ශ්‍රී ලංකාව සත්කාරකත්වය ලබාදෙන ලදී.

10. 2017 දෙසැම්බර් 13 වැනි දින එක්සත් ජාතීන්ගේ මහලේකම් කාර්යාලය සමඟ පුද්ගල නාශක බිම්බෝම්බ භාවිතය, සංචිත තබාගැනීම, නිෂ්පාදනය සහ හුවමාරු කරගැනීම තහනම් කිරීම සහ ඒවා විනාශකර දැමීම සම්බන්ධයෙන් සම්මුතියට එකතුවීමේ ලේඛනය ශ්‍රී ලංකාව විසින් බාරදෙන ලදී.

11. 2017 ජූලි මාසයේදී න්‍යෂ්ටික අවි තහනම් කිරීම සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ගිවිසුමට පක්ෂව ශ්‍රී ලංකාව විසින් සම අනුග්‍රාහකත්වය ලබාදී ඡන්දය ලබාදෙන ලදී.

**(ඊ) එක්සත් ජාතීන්ගේ ගිවිසුම් ආයතනය හා අනෙකුත් එක්සත් ජාතීන්ගේ යාන්ත්‍ර සහ ශ්‍රී ලංකාවේ වාර්තා කිරීමේ වගකීම්**

12. පහත සම්මුතීන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ කාලීන වාර්තා විභාග කිරීම සඳහා නිත්‍ය කරුනු සපයන ලදී.

(i) වාර්ගිකව වෙනස්කොට සැලකීම තුරන් කිරීම සම්බන්ධයෙන් සම්මුතිය.
(ii) සංක්‍රමණික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් සම්මුතිය.
(iii) වදහිංසා පිටුදැකීමේ සම්මුතිය.
(iv) කාන්තාවන්ට එරෙහිව සියලුම ආකාරයේ වෙනස් කොට සැලකීම තුරන් කිරීම සම්බන්ධයෙන් සම්මුතිය.
(v) ආර්ථික, සටන් හා සංස්කෘතික අයිතීන් සම්බන්ධයෙන් ජාත්‍යන්තර ගිවිසුම.
(vi) වදහිංසා පිටුදැකීමේ සම්මුතිය සහ ළමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් සම්මුතිය යටතේ වාර්තා/උපග්‍රන්ථ ඉදිරිපත් කිරීම.

13. ශ්‍රී ලංකාවේ වගකීම් පරිදි මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයේ/විශේෂ පරිපාටි ලිපිලේඛන හුවමාරුව සඳහන් පැමිණිලි පරිපාටි ලේකම් කාර්යාලයටත් නිතිපතා ප්‍රතිචාර ලබාදෙන ලදී.

**(ඔ) එක්සත් ජාතීන්ගේ සම්භාවනීයන්ගේ සංචාර**

14. පහත සඳහන් එක්සත් ජාතීන්ගේ සම්භාවනීයන්ගේ ශ්‍රී ලංකාව සංචාරවලට අදාළ නිත්‍ය හා සැපයුම් ස්වරූපයන්,

(i) එක්සත් ජාතීන්ගේ උප මහලේකම් (දේශපාලන කටයුතු) ජෙෆ්රි ෆෙල්ට්මන් (2017 ජූලි 19-21)

(ii) ත්‍රස්වාදයට එරෙහිව මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් විශේෂ නියෝජිත, බෙන් එමර්සන් මහතා (2017 ජූලි 9-15)

(iii) සංක්‍රාන්තික යුක්තිය හා සංහිඳියා ක්‍රියාවලිය සඳහා තාක්ෂණික සහයෝගය ලබාදීමට කොලොම්බියාවෙන් පැමිණි විශේෂඥ කමිටුව (2017 අගෝස්තු 21-25)

(iv) සත්‍ය, යුක්තිය, හානිපූරණය සහ නැවත සිදුනොවීම පිළිබඳ වගකීම් සම්බන්ධයෙන් විශේෂ නියෝජිත (2017 ඔක්තෝබර් 10-23)

(v) 2017 ඔක්තෝබර් 23 සිට නොවැම්බර් දක්වා සංහිඳියා යාන්ත්‍රණය වෙනුවෙන් ධාරිතාවය ගොඩනැංවීමේ හා පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම සඳහා ජපානයේ ශ්‍රේෂ්ඨ මහජන අභිචෝදක කාර්යාලයේ අභිචෝදක, මොටෝ නුගුඩි මහතා මෙරටේ සිය තෙවන සංචාරය සිදුකළේය.

(vi) අත්තනෝමතික රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් කෘත්‍යාධිකාරි කණ්ඩායම (2017 දෙසැම්බර් 4-15)

**(ඕ) එක්සත් ජාතීන්ගේ ආයතන සඳහා ඡන්දය විමසීම**

15. නිව්යෝර්ක් හි පැවති ජාත්‍යන්තර සමුළුව සඳහා වූ රාජ්‍ය පාර්ශවයන්ගේ 8 වැනි රැස්වීම අතරතුරදී 2017 ජූනි 28 වැනි දින පැවති ඡන්ද විමසීමේදී 2018-2021 කාලය සඳහා සියලුම සංක්‍රමණිකයන් හා ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කමිටුවට විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්-ප්‍රසාද් කාරියවසම් මහතා නැවත තෝරාපත් කරගැනීම සඳහා වූ ඡන්ද ව්‍යාපාරය සාර්ථක විය.

16. 2017 ජූනි මාසයේදී එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයාගේ තාරුණ්‍ය පිළිබඳ නියෝජිතවරිය ලෙස ජයත්මා වික්‍රමනායක මිය පත්කරන ලදී.

17. සිය අපේක්ෂකත්වයන් වෙනුවෙන් ඡන්දය විමසීමේදී ශ්‍රී ලංකාවේ ඡන්ද හුවමාරු කරගැනීමේදී ඔවුන්ට සහයෝගය ලබාදීමෙන්, අනෙකුත් එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් සමඟ ශ්‍රී ලංකාවේ සබඳතාවන්ට දායකත්වය ලබාදීම සහ එක්සත් ජාතීන්ගේ ආයතන සඳහා ඡන්ද විමසීමේදී ශ්‍රී ලංකාවේ ඡන්ද රටාව සම්බන්ධයෙන් දත්ත පදනමක් පවත්වාගෙන යෑම.

**(ඕ) ජාත්‍යන්තර/කලාපීය සමුළු/වැඩමුළු**

18. රේඛීය අමාත්‍යාංශ/ආයතනවල සහයෝගයෙන් පහත අවස්ථාවන් සංවිධානය කිරීමට පහසුකම් සලසන ලදී.

(i) සංක්‍රමණිකයන්ගේ සෞඛ්‍ය සම්බන්ධයෙන් 2 වන ගෝලීය සාකච්ඡාව (2017 පෙබරවාරි)

(ii) 14 වැනි එක්සත් ජාතීන්ගේ වෙසක් දිනයේ ජාත්‍යන්තර සැමරුම (2017 මැයි)

(iii) දකුණු ආසියාතික රටවල විනිශ්චයකරුවන්, අභිචෝදකයන්, හා පොලිස් නිලධාරීන් සඳහා එළදායී ලෙස ත්‍රස්තවාදයට විරුද්ධව සටන්කිරීම සම්බන්ධයෙන් වැඩමුළුව. (2017, ජූනි)

(iv) න්‍යෂ්ටික බලශක්ති වැඩසටහන සඳහා I වන අදියරේ අදාළ ගැටළු සම්බන්ධයෙන් JAEA කලාපීය වැඩමුළුව (2017 ජූනි)

(v) ශ්‍රී ලංකාවේ සමෝධාන න්‍යෂ්ටික ආරක්ෂණ සහයෝගී සැලැස්ම විමසුමට ලක්කිරීම සඳහා JAEA මෙහෙවර.

(vi) ගිවිසුම් ආයතන වාර්තාකරණය සම්බන්ධයෙන් පුහුණුකරුවන් පුහුණු කිරීම (2017 මැයි/ජූනි)

(vii) සමූහ විනාශකාරී අවි ව්‍යාප්ත කිරීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සම්බන්ධයෙන් කලාපීය වැඩමුළුව. (2017 දෙම්බර්)

**(ඕ) බහුපාර්ශවීය සංසඳවලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම**

19. ජාත්‍යන්තර සමුළුවලදී ශ්‍රී ලංකා නියෝජනය/ සහභාගීත්වයට පහසුකම් සැලසීම, පරිසරය, සමාජ ආර්ථික ගැටළු, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ළමා ගැටළු, නිරායුධකරණය ආදිය ඇතුලුව ගැටළු පරාසයක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට වැදගත් කරුණු සම්බන්ධයෙන් ස්ථාවරයක් සම්බන්ධීකරණය හා පිළියෙල කිරීමේදී සහයෝගය ලබාදුනි. මෙම රැස්වීමේදී ශ්‍රී ලංකාවේ සහභාගීත්වය වෙනුවෙන් අක්තපත්‍ර ලිපි 28 ක් පිළියෙල කරන ලදී.

**(උ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සමඟ නියං/ගංවතුර සහන සැලසීමට එක්ව කටයුතු කිරීම**

20. රටතුළ නියං/ගංවතුර තත්ත්වය තුළදී විදේශ ආධාර/සහන ලබාගැනීම ආත කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පිහිටි විදේශීය දූත මණ්ඩල රේඛීය අමාත්‍යාංශ, රාජ්‍ය නොවන සංවිධාන සහ දානපතියන් සමඟ එක්ව කටයුතු කිරීම.

**(ඩ) විසා, බලපත්‍ර හා රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම් සැකසීම**

21. මෙම වර්ෂය මුළුල්ලේ ලංකාව තුළ පැවති සමුළු, වැඩමුළු, රැස්වීම්, සම්මන්ත්‍රණ සඳහා වීසා බලපත්‍ර නිකුත් කිරීමට පහසුකම් සලසන ලදී. රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය මගින් මෙම අමාත්‍යාංශයේ සහයෝග ඉල්ලා සිටි අවස්ථාවන්හිදී රාජ්‍ය නොවන සංවිධාන හා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සලසන ලදී. 2017 ජනවාරි 01 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා මෙම අංශය මගින් වීසා බලපත්‍ර 3908 ක් නිකුත් කර ඇත.

**(ඪ) එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ආත නියෝජිතායතන සඳහා ශ්‍රී ලංකාවේ දායකත්වය.**

22. ශ්‍රී ලංකාවේ සාමාජිකත්වය වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සඳහා සිදුකරන අදාළ ගෙවීම් සම්බන්ධයෙන් අදාළ රාජ්‍ය අමාත්‍යාංශ හා ආයතන මෙම අංශය මගින් සම්බන්ධීකරණය කරයි.

****

# ඇමරිකා එක්සත් ජනපද හා කැනඩා අංශය

## ඇමරිකා එක්සත් ජනපද හා කැනඩා අංශය

1. **ඇමරිකා එක්සත් ජනපදය**

**වර්තමාන අක්තගැන්වීම්:** වොෂිංටන් ඩී.සී. මෙක්සිකෝව, ට්‍රිනිඩෑඩ් හා ටොබැගෝ.

අ. **ද්විපාර්ශ්වීය සබඳතා**

i. දෙවන හවුල්කාරිත්ව කතිකාවත 2017 නොවැම්බර් මාසයේදී සිදුකිරීමට නියමිතය. එක්සත් ජනපද හා ශ්‍රී ලංකා සහයෝගිතාවය සඳහා මූලිකාංගයන් එමගින් ගොඩ නගා ව්‍යාප්ත කරනු ලබයි.

ii. 2016 දෙසැම්බර් මාසයේදී, සහස්‍රක අභියෝගතා සමායතනයේ සංයුක්ත වැඩසටහන සඳහා තෝරාගැනීමේ සිට, සහස්‍රක අභියෝගතා සමායතනය විසින් සිදුකළ ආර්ථික වර්ධනයට පැවති බාධක විශ්ලේෂණය පදනම් කරගෙන, එම සහස්‍රක අභියෝගතා සමායතනය හා ශ්‍රී ලංකා රජය විසින් දැනට ප්‍රවාහන හා ඉඩම් ක්ෂේත්‍රයන් හා ඉදිරි ව්‍යාපෘති සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරමින් සිටිති. ආර්ථික සංවර්ධන හා ජාතික ප්‍රතිපත්ති නියෝජ්‍ය අමාත්‍ය ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා විසින් ජුනි මාසයේදී වොෂිංටන් ඩී. සී. හි සිදුකළ සිය සංචාරයේදී සහස්‍රක අභියෝගතා සමායතන කණ්ඩායම හමුවිය.

iii. නිර්දේශ හා තොරතුරු හුවමාරු කරගැනීම ඔස්සේ 2017 වසරේදී පුද්ගල ජාවාරම් වැලැක්වීමේ වාර්තාවේ ශ්‍රී ලංකාව ලැයිස්තුගත ස්ථානය 2 වන ස්ථානය දක්වා ඉහළයෑම සම්බන්ධයෙන් දෛනිකව රාජ්‍ය දෙපාර්තමේන්තුව සමඟ තානාපති කාර්යාලය එක්ව කටයුතු කරයි.

iv. සෙනෙට් විසර්ජන කමිටුවේ (කමිටු සභාපති ලින්ඩ්සේ ග්‍රැහැම් යටතේ සිටින) ප්‍රධාන රිපබ්ලිකන් කාර්ය මණ්ඩල සාමාජික පෝල් ග්‍රෑ විසින් ශ්‍රී ලංකාවට එක්සත් ජනපද විදේශ ආධාර ලබාදීම පිළිබඳ තක්සේරු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

v. 2017 පෙබරවාරි 20 සිට 24 දක්වා රිපබ්ලිකන් පක්ෂයේ පීටර් රොස්කාන්ගේ නායකත්වයෙන් යුත් එක්සත් ජනපද මන්ත්‍රණ සභාවේ ප්‍රජාතන්ත්‍රවාදි හවුල්කාරිත්ව නියෝජිත පිරිසගේ සංචාරය. මෙම සංචාරයේදී, නියෝජිත පිරිස විසින් ජනාධිපතිවරයා, අග්‍රාමාත්‍යවරයා, ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා, ආරක්ෂක ප්‍රධානීන්, පාර්ලිමේන්තු කථානායක, විපක්ෂ නායකවරයා හා ඇමරිකානු ව්‍යාපාරික නියෝජිතයන් අතර රැස්වීම් පැවැත්වීය.

vi. 2017 පෙබරවාරි 23 සිට 25 දක්වා එක්සත් ජනපද නියෝජිත සෙනෙට් සභාවේ සභාපති බොබ් ගුඩ්ලැට් නායකත්වයෙන් යුත් එක්සත් ජනපද කොංග්‍රසයේ නියෝජිත පිරිසගේ සංචාරය.

vii. 2017 මැයි 21 සිට 23 දක්වා දකුණු හා මධ්‍යම ආසියා සඳහා වූ සහකාර රාජ්‍ය ලේකම්, තනාපති විලියම් ඉ. ටොඩ්ගේ සංචාරය.

viii. මැයි මාසයේදී රිපබ්ලිකන් සභික බිල් ජොන්සන් කොළඹ හා යාපනයේ සංචාරයක නිරත විය. පසුගිය දෙවසර තුළ ශ්‍රී ලංකා රාජ්‍ය වෙත ඉතාමත් ධනාත්මක හා සතුටුදායක ප්‍රවේශයක් ඔහු විසින් ගෙන ඇත.

ix. රිපබ්ලික් සභික, මන්ත්‍රණ සභාවේ විසර්ජන කමිටු සභාපති රොඩ්නි ෆොරෙලින්ශ්හියුසෙන් මහතා සහ කමිටු සාමාජික රිපබ්ලිකන් සභික හෙන්රි කුයිලර් මහතා විසින් අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

x. රිපබ්ලිකන් හා ඩිමොක්‍රටික් කමිටු නායකත්වය නියෝජණය කරමින් විදේශ කටයුතු කමිටුවේ නියෝජිත කණ්ඩායමක් අගෝසතු මාසයේදී ලංකාවට පැමිණියේය.

xi. එක්සත් ජනපද නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ විසර්ජන කමිටුවේ සභාපති රොඩ්නි ප්‍රෙලින්ග්හුසෙන් මහතාගේ නායකත්වයෙන් යුතු එක්සත් ජනපද කොංග්‍රස් නියෝජිත කණ්ඩායමකගේ සංචාරය - 2017 අගෝසතු 9-11

xii. 2017 අගෝස්තු 30 දින සිට සැප්තැම්බර් 02 දක්වා දකුණු හා මධ්‍යම ආසියානු කටයුතු සඳහා වූ වැඩබලන සහකාර රාජ්‍ය ලේකම් හා ඇෆ්ගනිස්ථානය හා පාකිස්ථානය සඳහා වූ වැඩ බලන විශේෂ නියෝජිත තානාපති ඇලිස් ජී. වෙල්ස් මැතිනියගේ සංචාරය. මෙම සංචාරයේදී ඇය විසින් අතිගරු ජනාධිපතිවරයා, ගරු අග්‍රාමාත්‍යවරයා, දෙමළ ජාතික සන්ධානය හා සිවිල් සමාජය ඇතුළු රජයේ නියෝජිතයන් හමුවිය. ඇය විසින් ඉන්දියානු සාගර සමුළුවට සහභාගී වූ අතර, විශේෂ සැසියක් ඇමතීය. සෑම ශ්‍රී ලාංකිකයකු සඳහාම සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම, ආර්ථික සංවර්ධනය හා සමාන අයිතිවාසිකම් සඳහා ශ්‍රී ලංකා රජයේ ප්‍රයත්නයට ඇමරිකා එක්සත් ජනපද සහයෝගය තානාපති වෙල්ස් මැතිනිය අවධාරණය කළේය.

xiii. 2017 මාර්තු මාසයේදී එක්සත් ජනපද යුද නෞකාවක් වන USS Comstock නෞකාව කොළඹ වරායට පැමිණියේය.

xiv. නව නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේදී ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වූ මන්ත්‍රී මණ්ඩලයේ කොන්ග්‍රස් දේශපාලන බලමණ්ඩලය පුළුල් කිරීමට ශක්තිමත් කිරීම සඳහා වොෂිංටන් ඩී. සී. හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මඟින් කොන්ග්‍රස් සාමාජිකයන් කිහිපදෙනකුට දන්වා ඇත. එමනිසා, රිපබ්ලිකන් මන්ත්‍රී ඩිනා ටයිටස් මැතිණිය විසින් දේශපාලන බල මණ්ඩලයේ ඩිමොක්‍රටික් සම සභාපතීත්ව තනතුරේ නියැළීමට එකඟතාවය පළ කළේය.

xv. මෙම වසරේ සැප්තැම්බර් 25-29 දක්වා ගරු කථානායකවරයා විසින් වොෂින්ටනය වෙත පැමිණෙන බහුපාර්ශ්වික පාර්ලිමේන්තු නියෝජිත පිරිසට නායකත්වය ලබාදෙයි.

xvi. 2017 පෙබරවාරි 1 සිට 06 දක්වා විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා හා කෘෂිකර්ම අමාත්‍ය ගරු දුමින්ද දිසානායක

මැතිතුමා විසින් 65 වන වාර්ෂික ජාතික උදේ ආහාර යාඥාවට සහභාගීවීම සඳහා වොෂිංටන් ඩී. සී. හි සංචාරයක නිරත විය.

xvii. වසර 4 ක් ගතවීමෙන් පසු එක් ජ්‍යේෂ්ඨ ශ්‍රී ලාංකික නාවුක නිලධාරියෙකු 2017 මුල් භාගයේදී නාවුක යුධ විද්‍යාලයට බැඳුණි.

xviii. යුධ හමුදා අංශ සම්බන්ධයෙන් ලද වඩාත්ම වැදගත් ජයග්‍රහණය වනුයේ, ජූනි මාසයේදී රාජ්‍ය ලේකම් විසින් ජාත්‍යන්තර යුධ හමුදා අධ්‍යාපන පුහුණුව සඳහා අරමුදල් පැවරීම අත්සන් තැබීම. මෙම වසරේ ජූලි මාසයට කලින් සිට පාඨමාලාවක් ලබාදෙයි.

xix. නාරා ආයතනය හා නෝට්රි ඩෑම් විශ්ව විද්‍යාලය අතර අත්සන් කළ අවබෝධතා ගිවිසුම යටතේ, 2018 ජූනි මාසයේදී ශ්‍රී ලංකා ජලය තුළ එක්සත් ජනපද යාත්‍රා මගින් සාගර විද්‍යාත්මක පර්යේෂණ සිදුකරනු ලබයි.

xx. 2017 ජනවාරි 09 වැනි දින, කොළඹදී ආරක්ෂක අමාත්‍යාංශය හා එක්සත් ජනපද තානාපති කාර්යාලය අතර අත්පත් කර ගැනීමේ හා අන්තර් සේවා ගිවිසුම අත්සන් කරන ලදී.

xxi. ආරක්ෂක අමාත්‍යාංශය හා එක්සත් ජනපද තානාපති කාර්යාලය අතර 2017 අගෝස්තු 04 වැනි දින කොළඹ දී දෙරට අතර ද්‍රව්‍ය හුවමාරු කර ගැනීම පිළිබඳ ගිවිසුමට (ACSA) අත්සන් තබන ලදී.

xxii. එක්සත් ජනපදය සමඟ හත්වන නිදහස් ගුවන් අයිතිවාසිකම් අත්සන් කිරීම සඳහා අභ්‍යන්තරික ක්‍රියා පිළිවෙත සාකච්ඡාවට ලක්කරනු ලැබේ.

xxiii. ආරක්ෂක නියෝජ්‍ය සහකාර ලේකම් ගරු ජෝශප් ෆෙල්ටර් මැතිතුමාගේ දකුණු අග්නිදිග ආසියානු සංචාරය - 2017 ඔක්තෝබර් - 13

xxiv. 2017 ඔක්තෝබර් 10-15 දිනවලදී පැවති IMF/ලෝක බැංකු වාර්ෂික රැස්වීම්වලට හා 2017 ඔක්තෝබර් 16 වැනි දින නිව්යෝර්ක් නුවර පැවති " ලංකාවේ ආයෝජනය කරන්න" යන ආයෝජන සංසදයට සහභාගි වීම සඳහා ලංකා මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා වොෂිංටන් ඩී.සී. බලා පිටත්ව ගියේය.

xxv. මුදල් හා ජන මාධ්‍ය අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමාගේ නායකත්වයෙන් යුතු ලාංකික නියෝජිත කණ්ඩායමක්, 2017 ඔක්තෝබර් 09-15 දක්වා දිනවලදී වොෂිංටන් ඩී.සී. හිදී පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ( IMF /ලෝක බැංකුව - WB) " ස්ප්‍රින්ග් " රැස්වීම් හා 24 කණ්ඩායමේ නියෝජ්‍ය අමාත්‍ය හා බැංකු අධිපතිවරුන්ගේ රැස්වීම් සඳහා සහභාගි විය. මෙම සංචාරය අතරතුරදී ගරු. මංගල සමරවීර මැතිතුමා, වොෂිංටන් ඩී.සී. හි දේශපාලන කටයුතු පිළිබඳ රාජ්‍ය උප ලේකම්, තානාපති තෝමස් ෂැනන් මැතිතුමා හමුවිය.

xxvi. 2017 ඔක්තෝබර් 24 වැනි දින පැවති වොෂිංටන් ඩී.සී.හි පත් ගල

සොයාගැනීමේ 20 වැනි සංවත්සරයේදී එක්සත් ජනපදයේ පිහිටි "මාෂල් ලිගාසි" ආයතනය විසින් ලංකා යුධහමුදාවේ බිම් බෝම්බ සොයාගැනීමේ සුනඛ (MDD) කණ්ඩායමක් පිදුම් ලැබීය.

xxvii. මැතිවරණ සාධාරණය පිළිබඳ ගෝලීය ජාලයට හා 2017 නොවැම්බර් 11 දින පැවති "ඉබිරෝ" ඇමරිකානු සමුළුවට සහභාගි වීම සඳහා අග්‍රවිනිශ්චකාර ගරු ඩබ්. පී. සි. ඩෙප් මැතිතුමා මෙක්සිකෝව බලා පිටත්විය.

xxviii. එක්සත් ජනපදයේ දේශපාලන කටයුතු පිළිබඳ රාජ්‍ය උප ලේකම්වරයාගේ සංචාරය.

xxix. ලංකාව හා එක්සත් ජනපදය, 2017 නොවැම්බර් 6 වැනි දින කොළඹ දී දෙවැනි හවුල්කාරිත්ව සංවාදය කැඳවිය. මෙම රැස්වීමේ ප්‍රධානත්වය දරන ලද්දේ ලංකා විදේශ ලේකම් ප්‍රසාද් කාරියවසම් හා දේශපාලන කටයුතු පිළිබඳ එක්සත් ජනපද රාජ්‍ය උප ලේකම් තෝමස් ෂැනන් යන මහත්වරුන් විසිනි. එක්සත් ජනපදය හා ලංකාව අතර සහයෝගිතාව ශක්තිමත් කිරීම හා ක්‍රමවත් හා ඵලදායි ලෙස කටයුතු කිරීම තුළින් පුළුල් ලෙස ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීම හා වැඩි දියුණු කිරීම මෙම සංවාදයේ අරමුණ විය. තානාපති ෂැනන් මැතිතුමා මෙම සංචාරයේදී ගරු අග්‍රාමාත්‍යවරයා, ගරු විදේශ අමාත්‍යවරයා හා විදේශ කටයුතු ලේකම්වරයා හමුවිය.

**2. බහුපාර්ශ්වීය සබඳතා**

i. 2017 මාර්තු 8 සිට 11 දක්වා ජාතික ප්‍රජාතාන්ත්‍රික ආයතනයේ සභාපති කෙන් වොලැක් මහතාගේ සංචාර හා ඔහු විසින් ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා හමුවිය.

ii. වොෂිංටන් ඩී. සී. හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ඇමරිකානු රාජ්‍යයන්ගේ (OAS) සම නිරීක්ෂකයකු ලෙස සබඳතා පවත්වාගෙන යන අතර එහි සාමාජික රාජ්‍යයන් එම සංවිධානයේ රාමුව සමඟ අනුකූල වන අතර එම සංවිධානය සම්බන්ධ අදාළ තොරතුරු විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත දන්වා යවයි. එම සංවිධානයේ රැස්වීම්වල නිත්‍ය නිරීක්ෂකයකු ලෙස තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලංකාව නියෝජනය කරයි.

**3. ආර්ථික සබඳතා හා විදේශ ආයෝජන**

i. වොෂින්ටන් ඩී.සී.හි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල්/ලෝක බැංකු ප්‍රධාන කාර්යාලයේදී 2017 අප්‍රේල් 17 සිට 23 දක්වා පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදල්/ලෝක බැංකු වසන්ත කාලයේ රැස්වීම් සඳහා සහභාගී වූ ගරු මුදල් අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් ශ්‍රී ලංකා නියෝජිත පිරිසට වොෂින්ටන් ඩී.සී හි ශ්‍රී ලංකා තානාපති කාර්යාල පිරිසට වොෂින්ටන් ඩී.සී හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් පහසුකම් සපයන ලදී.

ii. දෙරට අතර විද්‍යාත්මක සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන්

නොට්රිසෑම් විශ්වවිද්‍යාලය හා නාරා ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම සඳහා 2017 මාර්තු 23 සිට 25 දක්වා නෝට්රිසෑම් විශ්වවිද්‍යාලයේ හා නාරා ආයතනයේ සංචාරයක නිරත විය.

iii. 2017 ඔක්තෝබර් 5 වැනි දින ලෝස් ඇන්ජලීස්හි බෙවර්ලි හිල්ස්හිදී පැවති Sri Lanka Tourism මගින් සංවිධානය කරන ලද ලංකා සංචාරක මාර්ග දර්ශනයට අවශ්‍ය පහසුකම් සලසන ලදී.

iv. ගරු මුදල් අමාත්‍යවරයා 2017 ඔක්තෝබර් 12 වැනි දින IMF මූලස්ථානයේ දී, ගිවිසුම් මෙහෙයුම් කටයුතු පිළිබඳ සහශ්‍ර අභියෝග සංස්ථා දෙපාර්තමේන්තුවේ යුරෝපය, ආසියාව, ශාන්තිකරය හා ලතින් ඇමරිකාව සඳහා කළාපී නියෝජ්‍ය උප ජනාධිපති ෆැට්මා ඉසෙඩ් සූමා මැතිනිය හමුවිය.

v. 1985 න් පසුව ලංකාවට ප්‍රථම වතාවට පැමිණි USS Nimzt " Nimitz Carrier Strike කණ්ඩායම 2017 ඔක්තෝබර් 28 වැනි දින සැලසුම් වරායට සේන්දු වී යාමක් සඳහා ලංකාවේ කොළඹට පැමිණියේය. මෙයට the USS Nimizt , the cruiser USS Princeton, and destroyers USS Howard , USS Shoup, USS Pinckney, and USS Kidd ඇතුලත් විය.

**4. සංස්කෘතික සබඳතා**

**i. ශ්‍රී ලංකාවේ 69 වැනි නිදහස් දින සංවත්සර සැමරුම.**

2017 පෙබරවාරි 04 වන දින, බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා ක්‍රිස්තියානි භක්තිකයන් නියෝජනය කරමින් ආගමික සම්භාවනීයන් හා ශ්‍රී ලාංකික ප්‍රජා නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් පැවැත් වූ බහු භක්තිකයන් සඳහා ශ්‍රී ලංකාවේ 69 වැනි නිදහස් දින සංවත්සරය සනිටුහන් කිරීම සඳහා තානාපති කාර්යාලය විසින් තානාපති කාර්යාලයේදී සැමරුම් උත්සවයක් සංවිධානය කළේය. වොෂින්ටන් ඩී සී හි සංචාරයක නිරත වූ ගරු විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යවරයා මෙම අවස්ථාවේ ප්‍රධාන ආරාධිත අමුත්තා විය.

වොෂිංටන් ඩී සි හි පිහිටි ලංකා තානාපති කාර්යාලය වොෂිංටන් ඩී.සි. හි ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානයේ දී දෙසැම්බර් 6 වැනි දින පැවති "Annual Winternational Embassy Showcase" සඳහා සහභාගී විය.

**ii. වෙසක් උත්සවය සැමරීම**

ඩී සී හා මැරිලන්ඩ් හි බෞද්ධ පූජකවරුන්ගේ සහභාගීත්වයෙන් 2017 වෙසක් උත්සවය සැමරීම සඳහා තානාපති කාර්යාලයේදී 2017 මැයි මස 16 වන දින ආමිස පූජාවක් තානාපති කාර්යාලය විසින් සංවිධානය කළේය. වෙසක් පහන් කූඩු හා තොරණ වලින් තානාපති කාර්යාල භූමිය ඒකාලෝක විය.

**iii. 'සිහිනයකි රෑ' රූපවාහිනී වැඩසටහන**

(අ) 2017 ජූනි 10 වන දින ශ්‍රී ලාංකික ඇමරිකානු ප්‍රජා සාමාජිකයන්ගේ

සහභාගීත්වයෙන් තානාපති කාර්යාල එළිමහන් භූමියේදී ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා ශ්‍රී ලංකා රංග කලා කවය විසින් සංවිධානය කළ ඒකාබද්ධ 'සිහිනයකි රෑ' සංගීත වැඩසටහන පටිගත කිරීම සඳහා තානාපති කාර්යාලය විසින් පහසුකම් සලසන ලදී.

(ආ) 2017 ජූලි 09 වන දින ශ්‍රී ලංකා ඇමරිකානු ප්‍රජා සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් මැරිලන්ඩ් බෞද්ධ විහාරයේදී තානාපති කාර්යාලය විසින් ප්‍රජා හා ආගමික උත්සවයට සහභාගී විය.

(ඇ) 2017 අගෝස්තු 20 වන දින තානාපති කාර්යාලය විසින් වොෂින්ටන් බෞද්ධ විහාරයේදී ශ්‍රී ලංකා ආහාර උත්සවයක් සංවිධානය කළ අතර ඒ සඳහා ශ්‍රී ලාංකික හා විදේශීය ජාතිකයන් සහභාගී විය.

(ඈ) 2017 සැප්තැම්බර් 10 වන දින ශ්‍රී ලාංකික ඇමරිකානු ප්‍රජා සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් වොෂිංටන් ඩී.සී. හි දී ශ්‍රී ලංකා ඇමරිකානු සංගම් විසින් ඒකාබද්ධව සංවිධානය කළ ශ්‍රී ලංකා දිනයට තානාපති කාර්යාලය සහභාගී විය. මෙම උත්සවය කෙටිප්මිල් එස්ටේට් පාර්ක්, 1120 ක්ලේ බ්‍රෝර්ක් ඩ්‍රිසවු, සිල්වර් ස්ප්‍රින්ග්, එම්ඩී 20902 හිදී පැවැත්විය.

(ඉ) කම්කරු සුභසාධනය

එක්සත් ජනපදයේ වෙසෙන  ලාංකික ප්‍රජාවට තම සේවාවන්ට අදාළ කටයුතු සඳහා වොෂිංටන් ඩී.සී. හි SLEMB අවශ්‍ය පහසුකම් සැළසීය.

(2) කැනඩාව

**1. ද්විපාර්ශවීය සබඳතා**

i. ශ්‍රී ලංකාවේ සංහිඳියා ක්‍රියාවලින් වැදගත් ප්‍රවණතාවයන් හා රජය විසින් ගත් ප්‍රධාන මූලෝපායන් සම්බන්ධයෙන් විවිධ මට්ටම්වල ජ්‍යෙෂ්ඨ කැනේඩියානු දේශපාලකයන්ට ඔටාවා හි ශ්‍රී ලංකා මහකොමසාරිස්වරයා සහ ටොරොන්ටෝ හි කොන්සාල් ජනරාල් විසින් විවිධත්ව කරුණු පැහැදිලි කරයි.

ii. මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අධ්‍යාපන වැඩසටහනක් පැවැත්වීම සඳහා 2017 පෙබරවාරි 19-27 දක්වා ඇබර්ටා හි ලේක්ලෑන්ඩ් විද්‍යාලයේ සිසුන් හා සිය සාමාජිකයන් කණ්ඩායමක් විසින් ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය.

iii. පසුගිය වසරේ ටොරොන්ටෝහි රාජකීය ඔන්ටාරියෝ කෞතුකාගාරයේ නිලධාරීන් සමඟ ශ්‍රී ලංකා මහකොමසාරිස්වරයා රැස්වීම් පැවැත්වූ අතර, ප්‍රදර්ශන භාණ්ඩ ණයට ගැනීම ඇතුලුව රෝයල් ඔන්ටාරියෝ කෞතුකාගාරය හා කොළඹ කෞතුකාගාරය අතර සහයෝගීතාවයෙන් පසු පැවති පසුවිපරම් සාකච්ඡාද, පැවැත්වුණි.

iv. 2017 අගෝස්තු 7 වැනි දින පැවති 50 වැනි ආසියාන් අමාත්‍යවරුන්ගේ රැස්වීම හා පිලිපීනයේ මැනිලා නුවරදී පැවති 24 වැනි ආසියානු කලාපීය අමාත්‍යවරුන්ගේ රැස්වීම හා පිලිපීනයේ මැනිලා නුවරදී පැවති 24 වැනි ආසියානු කලාපීය අමාත්‍යවරුන්ගේ සංසඳයේ දී විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානයක මැතිතුමා විසින් කැනඩා විදේශ කටයුතු අමාත්‍ය ගරු ක්‍රිස්ටියා ලෑන්ඩ් මැතිණිය හමුවිය.

v. 2017 මැයි 21 සිට 25 දක්වා රාජකීය කැනේඩියානු නෞකාව ලංකාවට පැමිණියේය. මෙය වසර දහයකට පසු සිදුකළ සංචාරයකි.

vi. ගුවන් සේවා ගිවිසුම යටතේ සේවා සැපයීම සඳහා ගුවන් සේවාවක් ලෙස නම් කළ ශ්‍රී ලංකා ගුවන් සේවා සඳහා පටිපාටිමය ගැටළු විසඳීමේ ක්‍රියාවලියේ ශ්‍රී ලංකා ගුවන් සේවය හා ප්‍රවණතා හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය නියැළී සිටිති.

vii. කොළඹ සිටින කැනඩා මහකොමසාරිස් අතිගරු ෂෙලී වයිටින් මැතිතුමා 2017 ජුනි 09 වන දින විදේශ කටයුතු අමාත්‍ය ගරු රවි කරුණානායක මැතිතුමා බැහැ දැකීය.

viii. පොදු රාජ්‍ය මණ්ඩලයීය පාර්ලිමේන්තු සංගමයේ කැනඩා අංශයේ නියෝජිත කණ්ඩායමක් 2017 නොවැම්බර් 8-12 දිනවලදී ලංකාවේ සංචාරයක නියැලිණි. අපගේ පොදුරාජ්‍ය මණ්ඩලයීය පාර්ශවකරුවා සමඟ ඇති බැඳීම් ශක්තිමත් කිරීම හා අන්‍යෝන්‍යවශයෙන් වැදගත්කමක් උසුලන අදහස් හුවමාරු කිරීම මෙම ලංකා සංචාරයේ අරමුණ වෙයි. මෙම සංචාරයේදී, නියෝජිත කණ්ඩායම, ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා පාර්ලිමේන්තු මන්ත්‍රී හා කථානායක ගරු කරු ජයසූරිය මැතිතුමා, පලාත් පාලන හා පළාත් සභා අමාත්‍ය ගරු ෆයිසර් මුස්තාෆා මැතිතුමා හා පාර්ලිමේන්තු මන්ත්‍රී, ව්‍යවස්ථාදායක සභාවේ මෙහෙයුම් කමිටුවේ සාමාජික ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මැතිතුමා හමුවිය.

ix. ආරක්ෂක අමාත්‍යාංශයේ ලංකා නියෝජිත කණ්ඩායමක්, 2017 නොවැම්බර් 14-15 දිනවලදී පැවති එක්සත් ජාතීන්ගේ ආරක්ෂක අමාත්‍ය සමුළුවට සහභාගී වීම සඳහා කැනඩාවේ සංචාරයක නියැලිණි.

x. 2017 දෙසැම්බර් 11-12 දිනවලදී පැවති "One Planet Summit" සඳහා සහභාගි වීම සඳහා මුදල් පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා පැරීසිය බලා පිටත් විය.

**2. බහු පාර්ශ්වික සබඳතා**

i. 2021-2022 වාරය සඳහා එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ කැනඩා අපේක්ෂකත්වයට සහයෝගය ලබාදීම සඳහා ශ්‍රී ලංකාව තීරණය කළේය.

ii. 2017 ජුනි මාසයේදී යුනිස්කෝ අන්තර් රාජ්‍ය සාගර භූ විද්‍යා කොමිසමේ 29 වන සැසියේදී පැවති ඡන්ද විමසීමකදී 2017-2019 කාලය සඳහා විධායක

කවුන්සිලය සඳහා වූ කැනඩා අපේක්ෂකත්වයට සහයෝගය ලබාදීම ශ්‍රී ලංකාව විසින් තහවුරු කළේය.

iii. ඔටාවා හි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය මගින් මොන්ට්‍රියල් හි ප්‍රධාන කාර්යාලයේ ඇති ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය ආශ්‍රිත කරුණුවලට පහසුකම් සලසයි.

iv. 2017-2020 කාලය සඳහා විවෘත රාජ්‍ය පාලන කමිටුවේ ශ්‍රී ලංකා අපේක්ෂකත්වය සඳහා මහකොමසාරිස් කාර්යාලය විසින් කැනඩාවේ සහයෝගය ලබාගත්තේය.

### 3. ආර්ථික සබඳතා හා විදේශ ආයෝජන

i. කොන්සල් ජනරාල්වරයාගේ සහයෝගයෙන් මහකොමසාරිස් කාර්යාලය විසින් සංහිඳියාව, ව්‍යාපාර සංවර්ධනය හා විදේශ සෘජු ආයෝජන ප්‍රවර්ධනය සඳහා වූ වැඩසටහනේ කොටසක් ලෙස 2017 මාර්තු 10-18 දක්වා කැනඩා-ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව කණ්ඩායමේ සභාපති ගරු යස්මින් රටන්සී (පා.ම) ගේ ප්‍රධානත්වයෙන් දේශපාලන/ආර්ථික නියෝජිත කණ්ඩායමේ ශ්‍රී ලංකා සංචාරයට කටයුතු සැළසුම් කිරීම.

ii. ටොරොන්ටෝ නගරාධිපති, අතිගරු ජෝන් ටොරි මහතා සහ ව්‍යාපාරික නියෝජිත පිරිසක් විසින් 2017 මාර්තු 18 සිට 20 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. ඔහුගේ සංචාරයේ අරමුණ වූයේ හවුල්කාරිත්වය ශක්තිමත් කිරීම හා දකුණු ආසියාවේ ආර්ථික අභිලාෂයන් වැඩිදුරටත් පවත්වාගෙන යෑමයි. මහකොමසාරිස්වරයා, කොන්සල් ජනරාල්වරයා/ ආයෝජන මණ්ඩලය සමඟ පැවති රැස්වීම්වලට අනුව, ස්ථිර සෘජු රැකියා, අවස්ථා 100 ක් නිර්මාණය කෙරෙන කැනඩා ඩොලර් මිලියන 20 ක පිරිවැයක් දරා යාපනයේ හෝටලයක් ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘතියකට අනාගත ආයෝජකයෙක් කැමැත්ත පළකළේය.

iii. 2017 ජූලි මාසයේදී ටොරන්ටෝ හිදී සංවිධානය කළ ගෝලීය සිලෝන් තේ සාද සැමරුම ඔස්සේ ජාලගතවීමේ අවස්ථාවකදී තේ වෙළඳුන් හා අනෙකුත් පුද්ගලයන් අතර පුළුල් දැනුවත් වීමක් නිර්මාණය විය. මෙම අංශය තුළ අනාගත ආනයන සළකා බැලීම සඳහා කැනඩා සමාගම් 31 ක් සම්බන්ධ කරගැනීමට මහකොමසාරිස් කාර්යාලයට හැකි වූ අතර සිය නිෂ්පාදන සඳහා ශ්‍රී ලංකා අපනයනකරුවන්ට සහයෝගය හා ගැණුම්කරුවන්ගේ විස්තර සපයන ලදී.

iv. කොන්සල් ජනරාල් විසින් රේඛීය අමාත්‍යාංශ හා නියෝජිතායතන සම්බන්ධීකරණය කළ අතර 2017 මැයි මාසයේදී ටොරොන්ටෝ හීදී පැවති SIAL කැනඩා ජාත්‍යන්තර ප්‍රදර්ශනය 2017 ට ශ්‍රී ලංකා සහභාගීත්වය සඳහා කටයුතු සූදානම් කළේය. ශ්‍රී ලංකා ජාතික මණ්ඩප ද්විත්වයක් මගින් ශ්‍රී ලාංකික සමාගම් 13 කින් වටිනාකම් එකතු කළ ආහාර නිෂ්පාදන හා වටිනාකම් එකතු කළ සිලෝන් තේ ප්‍රදර්ශනයට තබා තිබුණි. ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායමක් විසින්

දෙදින වෙළඳපළ ඉලක්ක වැඩසටන් හා වෙළෙඳපළ හඳුනාගැනීමේ සංචාර හා කැනඩා වෙළෙඳපළ සම්බන්ධයෙන් තොරතුරු සැසියකට සහභාගී විය.

v. සංචාර හා සංචාරක කර්මාන්තය නියෝජනය කරමින් ප්‍රදර්ශනයන් 400 ක් ඇතුළත් ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය හා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සහයෝගයෙන් 2016 ඔක්තෝබර් මාසයේදී මොන්ට්‍රියල් හිදී පැවති ජාත්‍යන්තර සංචාරක හා ගමන් ප්‍රදර්ශනය 2016 සඳහා ඔටාවා හි පිහිටි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය සහභාගී විය. ගුවන් සේවාවන් කිහිපයක් සමග පැවති සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස, ඒකාබද්ධ සංචාරක ස්ථාන ප්‍රවර්ධනය කිරීම උදෙසා සහයෝගීතාවයකට දූත මණ්ඩල එකඟ වී ඇත.

vi. කැනඩානු විදේශීය සේවා ආයතනයේ ( CFSI ) සහාය ඇතිව BIDTI පුහුණු ධාරිතාව වැඩිදියුණු කිරීම.

**4. සංස්කෘතික සබඳතා**

i. ඔටාවා හි ජාතික දින සැමරුම, සිංහල, දෙමළ, අළුත් අවුරුදු සැමරුම, ඔටාවා හි හිල්ඩා ජයවර්ධනාරාමයේ වාර්ෂික වෙසක් උත්සවය, ටොරොන්ටෝ හි ශ්‍රී ලංකා-කැනඩා සංගමය විසින් සංවිධානය කළ 49 වැනි වාර්ෂික සිංහල සහ දෙමළ අළුත් අවුරුද්ද සැමරීම, TD දකුණු ආසියානු උත්සවය - 2017, දකුණු ආසියානු කලා ප්‍රදර්ශන මංගල්‍යය හා නගර ශාලාවේ පැවති දකුණු ආසියානු උත්සවය වැනි වැඩසටහන් ඔටාවා හි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය විසින් සැලසුම්කර/ සහයෝගය දක්වා/ සම්බන්ධීකරණ කටයුතු සිදුකරයි.

ii. ඊස්කාබරෝ හී පෙරිය සිවම් කෝවිලේ නව අවුරුද්ද, අතිගරු ජනාධිපතිවරයාගේ 2 වර්ෂ පදවිප්‍රාප්ති උත්සවය, ජාතික දින සැමරුම, ටොරොන්ටෝ හි කැනඩා-ශ්‍රී ලංකා සංගමයේ 49 වැනි සිංහල හා දෙමළ නව අවුරුදු සැමරීම හා ටොරොන්ටෝ කළාපයේ ප්‍රධාන බෞද්ධ පන්සල් හතරක් හා සිංහල සංගමය සමඟ වෙසක් දින සැමරුම, ටොරොන්ටෝ හි සංචාරයක නියැලුණු ගාල්ල බිෂොප්වරයා විසින් පැවැත්වූ ශ්‍රී ලංකාවේ ගංවතුරට බිලිවූවන් සඳහා විශේෂ දේව මෙහෙය, ශ්‍රී වරපති හින්දු කෝවිල සහ චන්ද්‍රමෞලීෂ්වර සිවලාසම් කෝවිලේ රිය මංගලයය, කැනඩාවේ ශ්‍රී ලංකා මුස්ලිම් සංගමය සමඟ ඉෆ්තාර් වැඩසටහන, කැනඩා-ශ්‍රී ලංකා මැලේ රංගකලා හා සංස්කෘතික මධ්‍යස්ථානය සමඟ මැලේ සංස්කෘතික වැඩසටහන, කැනඩා-ශ්‍රී ලංකා මැලේ සංගමය සමඟ ඊද් සැමරුම, රාජකීය පොදු රාජ්‍ය මණ්ඩලය විසින් පොදු රාජ්‍ය මණ්ඩලීය දින සැමරුම, කැනඩා ශ්‍රී ලංකා කතෝලික සංගමය සමඟ මිඩ්ලෑන්ඩ් හි මරියා දෙව්මැදුරේ ශ්‍රී ලංකා දින දේව මෙහෙය සහ කැනඩාවේ සිංහල සංගමය විසින් සිදුකළ බසක වරුණ ආදී වැඩසටහන්වලට ටොරොන්ටෝ හි කොන්සල් ජනරාල් විසින් සහයෝගය ලබා දුනි.

**5. කම්කරු සුභසාධනය**

i. තමාට ලැබුණු රැකියා අර්පණයන්ගේ සද්භාවය සත්‍යාපනය කරමින් නියෝජිතයන් හරහා කැනඩාවේ රැකියා අවස්ථා සොයා බලන ශ්‍රී ලාංකිකයන්ට මහකොමසාරිස් කාර්යාලය හා කොන්සල් ජනරාල්වරයා විසින් සහයෝගය ලබාදෙති.

ii. සුභසාධනය සම්බන්ධයෙන් කැනඩා සමාගම් විසින් සේවයේ යෙදවූ බොහොමයක් ශ්‍රී ලාංකිකයන්ට කොන්සල් ජනරාල් විසින් සහයෝගය ලබාදුන් අතර ඉදිරි සේවා යෝජකයන් හා රැකියා අවස්ථා සඳහා පහසුකම් සපයන්නන් අතර දැනුවත්භාවය ඇති කිරීමට අන්තර් ක්‍රියාකාරකම් පවත්වාගෙන යයි.

****

# බටහිර අංශය

## බටහිර අංශය

දේශපාලන කටයුතු අංශය (බටහිර) භූගෝලීය කලාප ත්‍රිත්වයකින් සමන්විත වන අතර යුරෝපය, ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු රාජ්‍ය මණ්ඩලය, කැරිබියාව හා ලතින් ඇමරිකාවේ පිහිටි රටවල් සමඟ ලංකාවේ ද්විපාර්ශ්වීය සබඳතාවයන්ට අදාළ කටයුතු ආවරණය කරයි. ලංකා රජයේ විදේශ ප්‍රතිපත්ති අරමුණු මගින් මෙම අංශයේ කාර්යය විෂය පථය සඳහා මඟ පෙන්වන අතර පහතින් පුළුල් ලෙස දැක්වෙයි.

i. දේශපාලන, ආර්ථික, සමාජ, ආරක්ෂණ හා සංස්කෘතික කරුණු සම්බන්ධයෙන් සහයෝගීතාව ආවරණය කරමින් ද්විපාර්ශ්වීය බැඳීම් ප්‍රවර්ධනය හා නඟා සිටුවීම.

ii. සෘජු විදේශ ආයෝජන ගලා ඒම වැඩි කිරීම සඳහා ආර්ථික උපාය මාර්ග ප්‍රවර්ධනය කිරීම.

iii. විදේශයන්හි ලංකාවේ ප්‍රතිරූපය හා අභිලාෂයන් ප්‍රවර්ධනය කිරීම.

iv. සංහිඳියා ක්‍රියාවලිය සඳහා සංවර්ධන ආධාර ලබාගැනීම.

v. යුරෝපා සංගමයේ හා අනෙකුත් බහු පාර්ශ්වීය හා කලාපීය සංසදයන්හි ලංකාවේ අභිලාෂයන් ප්‍රවර්ධනය කිරීම සඳහා ද්විපාර්ශවීය සහයෝගයට උරදීම.

vi. ලංකාවේ සම්භවයක් සහිත ඩයස්පෝරා ප්‍රජාව සමඟ යහපත් සබඳතා ප්‍රවර්ධනය කිරීම.

vii. දකුණු හා මධ්‍යම ඇමරිකාව සහ කැරිබියාවේ පිහිටි රටවල් සමඟ උසස් සබඳතා ප්‍රවර්ධනය කිරීම.

viii. ලතින් ඇමරිකානු සහ කැරිබියානු කලාපය තුළ ලංකාවේ ප්‍රතිරූපය සහ අභිලාෂයන් ප්‍රවර්ධනය කිරීම.

ix. එක්සත් ජාතීන්ගේ සහ අනෙකුත් කලාපීය සංසදයන්හි ලංකාවේ අභිලාෂයන් ප්‍රවර්ධනය කිරීම සඳහා ද්විපාර්ශවීය සහයෝගය වැඩිදියුණු කිරීම.

x. දකුණු සහයෝගිතාවය ඇතුලුව පොදු අභිලාෂයන් ප්‍රවර්ධනය කිරීම සඳහාත්, දිළිඳුභාවය, දේශගුණික විපර්යාස, වෙළඳ අසමතුලිතතාවයන් සහ ආහාර සුරක්ෂිතභාවය වැනි පොදු අභියෝගයන්ට විසඳුම් ලබා දීමටත්, එක්සත් ජාතීන්ගේ 77 කණ්ඩායමේ රටවල් හා චීනය තුළත්, නොබැඳි ව්‍යාපාරයේ සාමාජිකයන් වන කලාප දෙකෙහි රටවල් සමඟ සහයෝගය ඇති කර ගැනීම.

### අ. යුරෝපය

**දේශ භූමි ආවරණය : 43**

ඇල්බේනියා, ඇන්ඩෝරා, ඔස්ට්‍රියා, බෙල්ජියම, බොස්නියාව හා හර්සගොවිනා, බල්ගේරියාව, ක්‍රොයේෂියාව, සයිප්‍රසය, චෙක් ජනරජය, ඩෙන්මාර්කය, එස්තෝනියාව, පින්ලන්තය, ප්‍රංශය, ජෝර්ජියාව, ජර්මනිය, ග්‍රීසිය, හන්ගේරියාව, අයිස්ලන්තය, අයර්ලන්තය, ඉතාලිය, ලැට්වියාව, ලිච්ටන්සයින්, ලිතුවේනියාව, ගන්සන්බර්ග්,

මැසිඩෝනියාව, මෝල්ටාව, මොනාකෝ, මොන්ටෙනීග්‍රෝ, නෝර්වේ, පෝලන්තය, පෘතුගාලය, රුමේනියාව, සැන් මැරිනෝ, සර්බියාව, ස්ලෝවේකියාව, ස්පාඤ්ඤය, ස්වීඩනය, ස්විස්ටර්ලන්තය, වතිකානුව, නෙදර්ලන්තය, එක්සත් රාජධානිය, තුර්කිය.

**නේවාසික දූත මණ්ඩල ගණනඃ 13**

ඔස්ට්‍රියාව, බෙල්ජියම, ප්‍රංශය, ජර්මනිය (බර්ලින් සහ ෆ්රැන්ක්ෆර්ට්), ඉතාලිය (රෝමය සහ මිලාන්), නෝර්වේ, පෝලන්තය, ස්වීඩනය, නෙදර්ලන්තය, එක්සත් රාජධානිය, තුර්කිය.

**සමගාමී අක්ත ගැන්වීම් ගණනඃ 25**

බොස්නියාව හා හර්සගොවිනා, සර්බියාව, ස්ලෝවැකියාව, වියනා සිට ස්ලෝවේනියාව දක්වා; බ්‍රසල්ස් සිට ලක්සම්බර්ග් දක්වා; පැරිසියේ සිට ස්පාඤ්ඤය; බර්ලිනයේ සිට ස්විස්ටර්ලන්තය, ක්‍රොයේෂියාව, මැසිඩෝනියාව, මොන්ටිනීග්‍රෝ, පිනීවා, ඇල්බේනියාවේ සිට වතිකානුව දක්වා; රෝමයේ සිට සයිප්‍රසය, ග්‍රීසිය, මෝල්ටා, සැන් මැරිනෝ දක්වා; වෝර්සෝ සිට රුමේනියා දක්වා; ඩෙන්මාර්ක්; ස්ටොක්හෝම් සිට එස්තෝනියාව, ලැට්වියාව, ලිතුවේනියාව දක්වා; ඔස්ලෝ සිට පින්ලන්තය, අයිස්ලන්තය දක්වා; අන්කාරා සිට ජෝර්ජියාව දක්වා; සහ ලන්ඩන් සිට අයර්ලන්තය දක්වා.

## 1. බෙල්ජියම

i. 2016 ඔක්තොම්බර් 10-22 දක්වා ගරු අග්‍රාමාත්‍යවරයාගේ බෙල්ජියම් සංචාරයට පසු විපරමක් ලෙස, මුදල් අමාත්‍ය ගරු රවි කරුණානායක හා සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය ගරු මලික් සමරවික්‍රම විසින් 2017 ජනවාරි 19-20 දක්වා බෙල්ජියමේ සංචාරය කළ අතර බෙල්ජියමේ මුදල් අමාත්‍යවරයා හා විදේශ වෙළඳ රාජ්‍ය ලේකම්වරයා හමුවිය.

ii. කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා යුරෝපියානු ආයෝජන බැංකුව සමඟ මූල්‍ය ගිවිසුම අත්සන් කරන ලදී. යුරෝපානු ආයෝජන බැංකුව විසින් ලෝක බැංකුව සමඟ සම-මූල්‍ය සැලසීමකින් ලංකාව වෙත යුරෝ මිලියන 50ක සහනදායී ණයක් පිරිනමන ලදී. බෙල්ජියමේ 'ප්ලාන්ඩර්ස්' ආයෝජන හා වෙළඳ ශ්‍රවණාගාරයේ දී ගරු මුදල් අමාත්‍ය හා ගරු සංවර්ධන උපායමාර්ගික හා බ්‍රිතාන්‍ය වෙළඳ අමාත්‍යවරුන් විසින් එහි පැවති ආයෝජන ප්‍රවර්ධන සම්මන්ත්‍රණයකට සහභාගී විය.

iii. සංවර්ධන උපායමාර්ගික හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය ගරු මලික් සමරවික්‍රම මැතිතුමා විසින් 2017 මාර්තු 12 සිට 13 දක්වා බෙල්ජියමේ සංචාරය කරන ලදී. යුරෝපානු සංගමයෙන් ද්වීපාර්ශ්වීය වෙළඳ හා ආයෝජන වැඩිකර ගැනීමේ අරමුණින් ගරු සමරවික්‍රම මැතිතුමා විසින් බ්‍රසල්ස්හි යුරෝපා කොමිසමේ දී යුරෝපානු වෙළඳ කොමසාරිස්වරයා හමුවිය.

iv. කෝප් කමිටුවේ සභාපති, ගරු සුනිල් හඳුන්නෙත්ති (පා.ම.) නායකත්වයෙන් සංචාරයක නිරත වූ ලංකා පාර්ලිමේන්තු නියෝජිත පිරිසක් විසින් 2017 අප්‍රේල් 26 වන දින

බෙල්පියන් ෆෙඩරල් පාර්ලිමේන්තුවේ කතානායක හා පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සෙයිග්ප්‍රීඩ් බ්‍රේක් මැතිතුමා බැහැදකින ලදී.

v. ලංකා - බෙල්පියම් පාර්ලිමේන්තු මිත්‍රත්ව කණ්ඩායම නැවත සක්‍රීය කරන ලදී.

vi. විදේශ කටයුතු අමාත්‍ය ගරු තිලක් මාරපන මැතිතුමා විසින් 2017 සැප්තැම්බර් 24 සිට 26 දක්වා බෙල්පියමේ සංචාරයක නිරත වූ අතර 2017 සැප්තැම්බර් 26 වන දින බෙල්පියම් රාජධානියේ නියෝජ්‍ය අග්‍රාමාත්‍ය හා විදේශ කටයුතු අමාත්‍ය ඩිඩියර් රේන්ඩර්ස් මැතිතුමා සමඟ ද්විපාර්ශ්වීය රැස්වීම් පැවැත්විය. එමෙන්ම, ගරු අමාත්‍යවරයා විසින් විදේශ කටයුතු හා ආරක්ෂක ප්‍රතිපත්තිය පිළිබඳව යුරෝපා සංගමයේ ඉහළ නියෝජිත අතිගරු ෆෙඩ්රිකා මොගිරිනී මෙනෙවිය, යුරෝපානු කොමසාරිස් අතිගරු ක්‍රිස්ටෝෆ් ස්ටයිලියන්ඩස්, යුරෝපා පාර්ලිමේන්තුවේ ලංකා - බෙල්පියම් පාර්ලිමේන්තු මිත්‍රත්ව කණ්ඩායම සමඟ 2017 සැප්තැම්බර් 25 වන දින සාකච්ඡා පැවැත්විය.

vii. ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානායක මැතිතුමා විසින් 2017 දෙසැම්බර් 13 - 18 දක්වා බෙල්පියම, ලක්සම්බර්ග් හා යුරෝපා සංගමයේ නිල සංචාරයක නිරත විය.

- මෙම සංචාරයේදී, ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා විසින් යුරෝපා පාර්ලිමේන්තුවේ දකුණු ආසියා නියෝජිත පිරිසේ සභාපතිවරයාත්, යුරෝපා පාර්ලිමේන්තුවේ ලංකා කණ්ඩායමේ මිතුරන්ගේ සාමාජිකයන් හා සභාපතිවරයන්, යුරෝපා පාර්ලිමේන්තුවේ අනෙකුත් සාමාජිකයන් කිහිපදෙනෙකුත් හමුවිය.

- තවද ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා විසින් ස්ට්‍රෙස්බර්ග්හි යුරෝපා කවුන්සිලයේ නියෝජ්‍ය මහ ලේකම්වරයා හමුවිය.

- 2017 දෙසැම්බර් 18 දින බ්‍රසල්හි පිහිටි ආසියානු අධ්‍යයනයන් පිළිබඳ යුරෝපානු ආයතනය මගින් සත්කාරකත්වය ලබා දුන් "නව ආර්ථික අවස්ථා හා නව දැක්ම ශ්‍රී ලංකා" සම්බන්ධයෙන් පැවැති සම්මන්ත්‍රණයේදී ගරු රාජ්‍ය අමාත්‍යවරයා විසින් ප්‍රධාන අමුත්තාගේ කථාව සිදුකරන ලදී.

- ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයාගේ බෙල්පියම් නිල සංචාරයේදී, බෙල්පියම් ෆෙඩරල් පාර්ලිමේන්තුවේ නියෝජිත මණ්ඩලයේ සභාපති, බෙලිපියම් විදේශ වෙළඳාම සඳහා රාජ්‍ය ලේකම්, සහ බෙල්පිම් ෆෙඩරල් පාර්ලිමේන්තුවේ බෙල්පියම් ලංකා පාර්ලිමේන්තු මිත්‍ර කණ්ඩායමේ සාමාජික හා සභාපති සෙයිග්ෆරයිඩ් බේරේක් මහතා හමුවිය.

- ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා සහ බෙල්පියම් විදේශ කටයුතු අමාත්‍යංශයේ මහ ලේකම්වරයා විසින් 2017 දෙසැම්බර් 18 වැනි දින බෙල්පියම සහ ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යංශ අතර ද්විපාර්ශවීය උපදේශනය සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුම අත්සන් කළේය.

viii. බෙල්ජියමේ පිහිටි ලංකා තානාපති කාර්යාලය මගින් 2017 දෙසැම්බර් 07 වැනි දින බෙල්හි දී සංචාරක, මැණික් හා ස්වර්ණාභරණ, තේ සහ කුළුබඩු ප්‍රවර්ධන උත්සවයක් සංවිධානය කළේය.

ix. බෙල්ජියම් හි පිහිටි ලංකා තානාපති කාර්යාලය මගින් 2017 දෙසැම්බර් 07 වැනි දින බ්‍රසල්හි සංචාරක කටයුතු මෙහෙයවන්නන්/හෝටල්කරුවන්ගේ සහභාගිත්වයෙන් සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කළේය. මෙම වැඩසටහන් සඳහා ලංකාවේ සංචාරක ආකර්ෂණය, තේ රස බැලීම, ආහාර පිසීම සහ සාරි ප්‍රදර්ශන සහ සංස්කෘතික ප්‍රදර්ශනයක් සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීමක් ඇතුළත්ය.

**2. බොස්නියාව හා හර්සගොවිනා**

ලංකාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු තිලක් මාරපන මැතිතුමා විසින් 2017 සැප්තැම්බර් මස 27 සිට 30 දක්වා බොස්නියාව හා හර්සිගොවිනාවේ නිළ සංචාරයක නිරතවූ අතර, එරට විදේශ කටයුතු අමාත්‍ය ගරු අයිගෝ නඩක් හා නියෝජ්‍ය විදේශ කටයුතු අමාත්‍ය ගරු ජොසිබ්කික් මැතිවරුන් සමඟ නිල සාකච්ඡා පැවැත්වීය. සාකච්ඡා මගින් දෙරට අතර දේශපාලන, වෙළඳ, සංස්කෘතික සබඳතා හා පුද්ගල - පුද්ගල සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමට හා පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කළේය. තවද ලංකාවේ ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් ලංකාවේ පාර්ලිමේන්තුව තුළ, බොස්නියා - ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව කණ්ඩායමක් ස්ථාපිත කිරීම තහවුරු කරන ලදී.

**3. බල්ගේරියාව**

බල්ගේරියාවේ නවදිල්ලි නේවාසික තානාපති අතිගරු පෙට්කෝ ඩොයොකෝව් විසින් 2017 ජූලි 26-28 දක්වා ලංකාවේ සංචාරයක නිරත වූ අතර විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා සමඟ රැස්වීමක් පැවැත්විණි. 2017 වර්ෂයේ දී දෙරට විසින් රාජතාන්ත්‍රික සබඳතා පිහිටුවීමේ 55 වැනි සංවත්සරය සනිටුහන් කිරීමක් ලෙස මෙම සංචාරය මඟින් ද්වීපාර්ශ්වීය සබඳතාවයන්ගේ වැදගත් සන්ධිස්ථානයක් සලකුණු කරයි.

**4. සයිප්‍රස්**

i. 2017 මැයි මාසයේ දී ලංකා වෙත මානුෂීය ගංවතුර සහනාධාර ලෙස සයිප්‍රස් රජය විසින් යුරෝ 5,000/-ක් පරිත්‍යාග කළේය.

ii. සයිප්‍රසයේ සිටින ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් වඩාත් හොඳින් ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම සඳහා සයිප්‍රසයේ, නිකෝෂියා හි නේවාසික කොන්සල් ජනරාල් කාර්යාලයක් පිහිටුවීමේ කටයුතු ලංකාව විසින් සිදු කරමින් පවතියි.

iii. ලාංකික පුහුණු සහ අර්ධ පුහුණු ශ්‍රමිකයන් සඳහා ඉහළ රැකියා අවස්ථා ලබාගැනීමේ අරමුණින් '' ලාංකික මිනිස් බල රැකියා ක්ෂේත්‍රයේ ගිවිසුම'' දෙරට විසින් සාකච්ඡා කරමින් පවතියි. ආසන්න වශයෙන් 5,700ක් පමණ වූ වර්තමාන ලාංකික සංක්‍රමණික ශ්‍රම බලකාය ගෘහස්ථ උදව්කරුවන් ලෙස ප්‍රධාන වශයෙන් සේවයේ නිරතව සිටින අතර අනෙකුත් ශ්‍රමිකයන් හෝටල්, ආපනශාලා, ඉදිකිරීම්, කෘෂිකාර්මික සහ නිෂ්පාදන අංශයන්හි සේවයේ නිරතව සිටිති.

5. **චෙක් ජනරජය**

i. නවදිල්ලියේ නේවාසිකව සිටින ලංකාවේ චෙක් ජනරජ තානාපති අතිගරු මිලාන් හොවොර්කා විසින් 2017 පෙබරවාරි 02-07 දක්වා ලංකාවේ සංචාරයක නිරතවූ අතර සංවර්ධන උපායමාර්ගික හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය, ගරු මලික් සමරවික්‍රම මැතිතුමා, ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍ය, ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා, තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍ය ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා සහ මුදල් අමාත්‍ය ගරු රවි කරුණානායක යන මැතිවරුන් සමග රැස්වීම් පැවැත්විය.

ii. නවදිල්ලියේ නේවාසික චෙක් ජනරජයේ තානාපති අතිගරු මිලාන් හොවොර්කා විසින් කැටුව පැමිණි චෙක් ජනරජයේ කනිෂ්ඨ නියෝජ්‍ය විදේශ කටයුතු අමාත්‍ය ගරු ඉවාන් ජන්කාරෙක් සහ මූල්‍ය සේවා, නිෂ්පාදන, යටිතල පහසුකම් සංවර්ධනය හා කෝඩා ඩුෂන් බලශක්ති, එස්.ආර්.ඕ. ආකෝන් ෆ්ලෝ සිස්ටම් වැනි බලශක්ති ව්‍යාපෘති, චෙක් අපනයන බැංකුව හා ඊ.එස්.එම්.එස්.ඒ හි නියැළෙන බැංකු හා සමාගම් නියෝජනය කරමින් ව්‍යාපාරික නියෝජිත පිරිසක් 2017 මැයි 5 වන දින ලංකාවේ සංචාරයක නිරත විය. වෙළඳාම, ආයෝජන, සංචාරක, සංස්කෘතික හා අධ්‍යාපනය යන ක්ෂේත්‍රයන් හි සම්බන්ධතාවය ඉහළ නැංවීම සම්බන්ධයෙන් ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ග්‍රේස් ආශීර්වාදන් මහත්මිය සමග ඔහු විසින් ද්විපාර්ශ්වීය රැස්වීමක් පැවැත්විය. තවද, නව දිල්ලියේ පිහිටි චෙක් ජනරජ තානාපති කාර්යාලය සහ චෙක් වාණිජ මණ්ඩලයේ හවුල්කාරීත්වය ඇතිව කොළඹ පිහිටි චෙක් ජනරජ නිර්වේතනික කොන්සල් කාර්යාලය මගින් සංවිධානය කළ 2017 මැයි 04 වැනි දිනැති චෙක් - ලංකා ව්‍යාපාර සංසඳයට චෙක් නියෝජිත පිරිස සහභාගී වූහ.

මෙම දූත මණ්ඩල සංචාරය තුළදී, බලශක්ති අංශය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ක්ෂේත්‍රයන් රාශියක ද්විපාර්ශ්වීය වෙළඳ හා අයෝජන සබඳතා වැඩි දියුණු කිරීමේ මාධ්‍යයන් හා ආකාර ගවේෂණය කිරීම සඳහා අදාළ ලාංකික කොටස්කරුවන් සමඟ චෙක් ව්‍යාපාරික නියෝජිත පිරිස රැස්වීම් පවත්වනු ලැබීය.

iii. ලංකාවේ ගං වතුර සහන කටයුතු සඳහා මානුෂීය ආධාරවලට පහසුකම් සැලසීම සඳහා 2017 අගෝස්තු මාසයේ දී ලංකාව හා චෙක් ජනරජය විසින් අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

iv. මාතර පිහිටි ගුරු පුහුණු විද්‍යාලයක් සඳහා ජාත්‍යන්තර රතු කුරුස ෆෙඩරේෂනය ඔස්සේ චෙක් රජය විසින් යුරෝ 100,000 ක් පරිත්‍යාග කළේය.

6. **ඩෙන්මාර්කය**

i. මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමාගේ මූලිකත්වයෙන් යුත් අමාත්‍යාංශ නියෝජිත පිරිසක් විසින් 2017 ජූනි 06 සිට 07 දක්වා ඩෙන්මාර්කයේ සංචාරය කළෝය. ලංකාවේ මහ කොළඹ මහනගර සංවර්ධන ව්‍යාපෘතිය තුළ ඩෙන්මාර්ක් ආයෝජකයන් සඳහා ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ඩෙන්මාර්ක් කර්මාන්ත සම්මේලනයේ දී 2017 ජූනි 06 වැනි දින පැවති ඉහළ මට්මටමේ වට මේස රැස්වීමට නියෝජිත පිරිස සහභාගී විය.

ii. අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය ගරු වී.එස්.රාධක්‍රිෂ්නම්ගේ ආරාධනයෙන් 2017 අගෝස්තු 02 සිට 09 දක්වා ඩෙන්මාර්ක් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ට්‍රෙලෙස්රාවන් මැතිතුමා ලංකාවේ සංචාරයක නිරත විය. මෙම සංචාරයේ දී, ගරු ට්‍රෙලෙස්රාවන් මැතිතුමා විසින් ලංකාවේ ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා සමඟ රැස්වීමක් පැවැත්වීය.

## 7. පින්ලන්තය

i. තොරතුරු සන්නිවේදන තාක්ෂණය, පවිත්‍රතා තාක්ෂණය, අධ්‍යාපන, සෞඛ්‍ය, ජල සැපයුම හා සනීපාරක්ෂාව, බලශක්තිය හා පතල් කැණීම ආදිය නියෝජනය කරමින් පින්ලන්ත ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමක් කැටුව ලංකාවට අක්ත ගැන්වූ දකුණු ආසියාව සඳහා පින්ලන්ත සංචාරක තානාපති අතිගරු රවුලී සුයිකමෙන් විසින් 2017 පෙබරවාරි 03-07 දක්වා ලංකාවේ සංචාරයක නිරත විය. මෙම සංචාරයේ දී, නියෝජිත කණ්ඩායම විසින් ගරු අග්‍රාමාත්‍යවරයා හා ගරු ලංකාවේ මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යවරයා සමඟ රැස්වීමක් පැවත්විණි.

ii. පින්ලන්ත සෞඛ්‍ය අංශයේ ව්‍යාපාරික නියෝජිත පිරිසක් කැටුව පින්ලන්තයේ සමාජ කටයුතු හා සෞඛ්‍ය අමාත්‍ය ගරු පිර්කෝ මැටිලා මෙනෙවිය විසින් 2017 අප්‍රෙල් 27-29 දක්වා ලංකාවේ සංචාරයක නිරතවිය. ඇය විසින් ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමා සමඟ රැස්වීමක් පැවැත්වූ අතර රාජ්‍ය - පුද්ගලික සහභාගීත්වය ඔස්සේ ලංකාවේ සෞඛ්‍ය අංශය සංවර්ධනය කිරීම සඳහා ආධාර පිරිනැමීම තහවුරු කළේය.

iii. පින්ලන්තයේ අග්‍රාමාත්‍ය ගරු ජුහා සිපිලා මැතිතුමාගේ ආරාධනයකට අනුව ඔක්තොබර් මස 8 - 11 දක්වා ලංකාවේ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා පින්ලන්තයේ නිල සංචාරයක නිරත විය. කැබිනට් අමාත්‍යවරුන් දෙදෙනෙක් සහ දස සාමාජික මාධ්‍ය කණ්ඩායමක් ඇතුලුව සාමාජිකයන් විසිපස් දෙනෙකුගෙන් යුතු නියෝජිත පිරිසක් මෙම සංචාරයේදී ගරු අග්‍රාමාත්‍යවරයා කැටුව යන ලදී. මෙය ලාංකික නායකයකු විසින් පින්ලන්තයේ සිදුකරන පළමු සංචාරයයි.

iv. මෙම සංචාරයේදි, බල ශක්ති අංශයේ සහයෝගිතාවය සම්බන්ධයෙන් ඒකාබද්ධ ප්‍රකාශනයක් නිකුත් කරන ලදී. පින්ලන්තයේ රාජ්‍ය අංශයේ ආයෝජන පහසුකම යටතේ, සහනදායි ණය සම්බන්ධයෙන් ද්විපාර්ශවීය ගිවිසුමක් ලංකාව හා පින්ලන්තය විසින් අත්සන් කරන ලදී.

v. මෙම ද්විපාර්ශවීය රැස්වීම්වලදී, අන්‍යෝන්‍ය සහයෝගය උදෙසා, බලශක්ති, සෞඛ්‍ය, වෘත්තිය අධ්‍යාපනය සහ ඩිජිටල් කරණයේ සහයෝගය ශක්තිමත් කිරීමට හා ඉහළ නැංවීමට එකඟතාවය පළ කලේය.

## 8. ප්‍රංශය

i. ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය (AFD) ඔස්සේ ප්‍රංශ රජය මඟින් ලංකාවේ අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා යුරෝ මිලියන 52ක සහනදායී ස්වාධීන ණය මුදලක් පිරිනැමීමට යෝජනා කර ඇත. ඉහත සහනදායී ණය පහසුකම පිරිනැමීම

මෙහෙයවීමේ ක්‍රියාවලියේ ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය කටයුතු කරයි.

ii. අනෙක් රාජ්‍ය තුළ එක් එක් රාජ්‍යයේ නිල දූත මණ්ඩලවල නියෝජිතයන්ගේ පවුලේ සාමාජිකයන් සඳහා වැටුප් ලබන රැකියාවල නියැළීම සඳහා බලය පැවරීම සම්බන්ධයෙන් වූ ගිවිසුමකට ලංකාව හා ප්‍රංශය එළඹී ඇත.

iii. ඛනිජතෙල් සම්පත් නියෝජ්‍ය අමාත්‍ය ගරු අනෝමා ගමගේ මැතිණිය කැටුව ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය ගරු දයා ගමගේ මැතිතුමා 2017 ජනවාරි 07 සිට 13 දක්වා ප්‍රංශයේ සංචාරයක නිරත විය.

iv. ප්‍රංශයේ ව්‍යවස්ථා සභාවේ සභාපති ගරු එච්.ඊ.ලෝරන්ට් ෆැබියස් මැතිතුමා 2017 පෙබරවාරි 13-14 දක්වා ලංකාවේ සංචාරයක නිරත විය. ලංකාවේ ගරු කථානායකවරයා, ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා හා අනෙකුත් සම්භාවනීයන් සමග රැස්වීම් පැවැත්විණි. ගරු එච්.ඊ.ලෝරන්ට් මැතිතුමා විසින් ''යුරෝපය හා ජාත්‍යන්තර සාමය, බ්‍රිතාන්‍ය යුරෝපා සංගමයෙන් ඉවත්වීමෙන් පසු තත්ත්වය'' සම්බන්ධයෙන් 2017 පෙබරවාරි 14 දින ජාත්‍යන්තර සබඳතා හා උපායමාර්ගික අධ්‍යයන පිළිබඳව ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ දී දේශනයක් සිදු කරන ලදී.

v. ප්‍රංශ - ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව කණ්ඩායමේ සභාපතිනී මාරියා ක්‍රිස්ටිනි බැලන්ඩින් මහත්මියගේ මූලිකත්වයෙන් ප්‍රංශයේ සෙනෙට් නියෝජිත පිරිසක් 2017 පෙබරවාරි 26 දින සිට මාර්තු 03 දක්වා ලංකාවේ සංචාරයක නිරත විය. ලංකාවේ ගරු කතානායකවරයා ඇතුලු ඉහළ පෙළේ සම්භාවනීය අමුත්තන් සමග රැස්වීම් පවත්වන ලදී.

vi. ප්‍රංශ රජය විසින් 2017 ජූනි මාසයේ දි ලංකාව වෙත මානුෂීය ගංවතුර ආධාර ලෙස සෙල්ලම් භාණ්ඩ, ඇඳුම් හා සපත්තු කිලෝග්‍රෑම් 848ක් පරිත්‍යාග කළේය.

vii. ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය (AFD) හා ලංකාව අතර සිව්වැනි වාර්ෂික උපදේශනය පැරිසියේ පිහිටි ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනයේ දී 2017 ජුලි 10-12 දක්වා පැවැත්වුණි. සාමාජිකයන් 12 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත කණ්ඩායම සඳහා භාණ්ඩාගාර ලේකම්වරයා නායකත්වය ලබාදෙන ලදී.

viii. ප්‍රංශයේ පිහිටි ලංකා තානාපති කාර්යාලය මගින් 2017 දෙසැම්බර් 12 වන දින ප්‍රංශයේ පැවැති එක් පෘතුවියක් මැයෙන් වු සමුළුවේදී, මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු එරාන් වික්‍රමරත්න මැතිතුමාගේ නායකත්වයෙන් යුත් ලංකා නියෝජිත කණ්ඩායමේ සහභාගීත්වයට පහසුකම් සැලසන ලදී.

ix. ප්‍රංශයේ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සහයෝගීත්වයෙන් ලංකාවේ මධ්‍යම සංස්කෘතික අරමුදලින් සංරක්ෂකයන් තිදෙනෙකු සඳහා පුහුණු වැඩසටහනකට කටයුතු පිළියෙල කිරීම සඳහා සම්බන්ධීකරණය සිදුකරන ලදී.

x. ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු සුජීව සේනසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ලාංකික සමාගම් 8 ක හා ප්‍රංශයේ හවුල්කරුවන් 20 කට අධික ප්‍රමාණයක

සහභාගීත්වයෙන් " ලංකා - ප්‍රංශ ව්‍යාපාරික සංසදය" 2017 ඔක්තෝබර් 11 වැනි දින පැරිස් හි පිහිටි ජාත්‍යන්තර ප්‍රංශ ව්‍යාපාරික සම්මේලනයේ දී පැවැත්වුණි.

xi. ලංකාවේ කිරි පට්ටි කර්මාන්තය සංවර්ධනය සඳහා ( ලංකාව තුළ කුඩා කිරි පට්ටි ව්‍යාපෘති හයක් සංවර්ධනය කිරීම) සහනදායි ණය ලෙස යුරෝ මිලියන 13.9 ක් (ආසන්න වශයෙන් රු. මිලියන 2,514) සැපයීම සඳහා ප්‍රංශ ජනරජයේ රජය එකඟ විය. ලංකාවේ මුදල් සහ ජන මාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය ආර්.එච්.එස්. සමරතුංග මහතා ලංකා රජය වෙනුවෙන් අදාළ ගිවිසුමට අත්සන් තබන ලදී.

xii ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මගින් 2017 ඔක්තෝබර් මස 3 - 6 දක්වා, ප්‍රධාන නගරයක් හිදී එනම් ලයින්, මාර්සෙයිලි, විලචිස් හා බොඩියුක්ස් යන නගර වලදී මාර්ග ප්‍රදර්ශන පවත්වන ලදී. ලාංකික සංචාරක සමාගම් 17 ක් ප්‍රංශ මාර්ග ප්‍රදර්ශන මාලාවට සහභාගි විය.

xiii මෙම තානාපති කාර්යාලයේ සහයෝගය ඇතිව ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මගින් 2017 දෙසැම්බර් 4 - 7 දක්වා කැනස් හදී ICTM සංචාරක වෙළඳපළේ ලංකාවේ සහභාගීත්වය සංවිධානය කළේය.

**9. ජෝර්ජියාව**

i. ජෝර්ජියාවේ නියෝජ්‍ය විදේශ කටයුතු අමාත්‍ය ගරු ඩේවිඩ් ජලගානියා මැතිතුමා විසින් 2017 සැප්තැම්බර් 15 සිට 18 දක්වා ලංකාවේ සංචාරයක නිරත වූ අතර ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා, සංචාරක හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, එවකට සිටි විදේශ කටයුතු අමාත්‍යාංශයේ වැඩ බලන ලේකම්වරයා සමඟ රැස්වීම් පැවැත්වීය. මෙම සංචාරයේ දී ලංකාවේ වාණිජ හා කර්මාන්ත මණ්ඩල ෆෙඩරේෂණය හා ජෝර්ජියාවේ වාණිජ හා කර්මාන්ත මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

ii. ලංකාව හා ජෝර්ජියාව අතර රාජ්‍ය තාන්ත්‍රික හා රාජකාරී/සේවා විදේශ ගුවන් ගමන් බලපත්‍ර හිමියන් වෙනුවෙන් වීසා බලපත්‍ර නිදහස් කිරීම සම්බන්ධයෙන් ගිවිසුම 2017 වර්ෂයේදී අපරානුමත කරන ලදී.

**10. ජර්මනිය**

i. ලංකාව හා ජර්මනිය අතර ද්විපාර්ශවීය දේශපාලන සාකච්ඡාවන්ගේ පළමු සැසිය 2017 අප්‍රේල් 06 වන දින කොළඹ දී අවසන් කළේය.

ii. බර්ලින් හි විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී 2018 පැවැත්වීමට නියමිත ''රාජ්‍ය තාන්ත්‍රිකයන් සඳහා වූ විධායක සම්මන්ත්‍රණය''ට සහභාගීවීම සඳහා ජර්මන් ෆෙඩරල් ජනරජ ආණ්ඩුව විසින් තරුණ ලාංකික විදේශ සේවා නිලධාරීන් 15 දෙනෙකුට ආරාධනය කර ඇත. ඉහත වැඩසටහන සඳහා ලාංකික රාජතාන්ත්‍රිකයන් 15 දෙනෙකු සහභාගී වීම සම්බන්ධයෙන් සියලුම වියදම් ජර්මන් ෆෙඩරල් ජනරජය විසින් දරනු ලබයි.

iii. ජර්මන් රජය විසින් යුරෝ මිලියන 13ක් දක්වා වූ අරමුදල් සහයෝගය තහවුරු කර ඇති අතර 2004 දෙසැම්බර් මාසයේ ඉන්දියානු සාගර සුනාමියෙන් විනාශයට පත්වුණ ගාල්ලේ පිහිටි මාතෘ රෝහල සාදා නිමකිරීම සඳහා ඒකාබද්ධ වැඩසටහනක් සිදුකරගෙන යයි. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ප්‍රමාණවත් මාතෘ ආරක්ෂණ සේවා ලබාදීම, සෞඛ්‍ය යටිතල පහසුකම් මෙන්ම ලංකාවේ දකුණු පළාතේ ජීවත්වන මහජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය වැඩි දියුණු කිරීමය.

iv. ජර්මන් රජය විසින් ජර්මන් වාණිජ මණ්ඩලයේ කාර්යාලයක් කොළඹ දී විවෘත කිරීමට යෝජනා කර ඇත. අදාළ රටවල නව ව්‍යාපාරික හා ආයෝජන අවස්ථාවන් හඳුනාගැනීමට මෙමඟින් පහසුකම් සැළසේ.

v. ෆෙඩ්රිච් ඊබර්ට් පදනම නැවත පිහිටු වීමට හා ලංකාවේ එහි ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට ජර්මන් රජය විසින් යෝජනා කර ඇත.

vi. නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ හා දක්ෂිණ සංවර්ධන අමාත්‍ය ගරු සාගල රත්නායක මැතිතුමා විසින් ජාත්‍යන්තර ප්‍රජාතාන්ත්‍රික සංගම් සංසඳයට සහභාගීවීම සඳහා 2017 ජනවාරි 14 සිට 18 දක්වා ජර්මනියේ මියුනිච් හි සංචාරයක නිරත විය.

vii. කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත අලුවිහාරේ මැතිතුමා විසින් බර්ලින් හි පැවති ආහාර හා කෘෂිකර්ම ගෝලීය සංසඳයට සහභාගීවීම සඳහා 2017 ජනවාරි 18 සිට 25 දක්වා ජර්මනියේ සංචාරයක නිරත විය.

viii. රෝගීන්ගේ ආරක්ෂාව සම්බන්ධ 2 වන ගෝලීය අමාත්‍ය සමුළුවට සහභාගීවීම සඳහා 2017 මාර්තු 29 සිට 31 දක්වා සෞඛ්‍ය, පෝෂණ හා ස්වදේශීය වෛද්‍ය අමාත්‍ය ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමා හා නියෝජිත පිරිස ජර්මනියේ සංචාරයක නිරත විය. ගරු අමාත්‍යවරයා විසින් හේඩ්ල්බර්ග් විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ නිළධාරීන් හමු වූ අතර වෛද්‍ය ක්ෂේත්‍රය, විශේෂයෙන්ම පිළිකා පර්යේෂණ, ධාරිතාව ඉහළ දැමීම, පුහුණු කිරීම් ක්ෂේත්‍රයන්හි සහයෝගීතාවය ඉහළ නැංවීම සම්බන්ධයෙන් අභිමතාර්ථ ලිපියක් පහත රැස්වීමේ දී අත්සන් තබන ලදී.

ix. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව සලකා බලන කළ හේඩ්ල්බර්ග් විශ්වවිද්‍යාලයේ දකුණු ආසියා ආයතනයේ (SAI) සභාපතිත්වය 2017 පෙබරවාරි මස දී ලංකාවට හිමිවිය. මේ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහයෝගය ලැබුණි. ලංකාවට මෙහි සභාපතිත්වය හිමිවීමත් සමඟම, ලංකාව හා හේඩ්ල්බර්ග් විශ්වවිද්‍යාලය අතර අධ්‍යයන, පර්යේෂණ සහයෝගීතාව මෙන්ම ශිෂ්‍ය ශිෂ්‍යාවන් හුවමාරු කරගැනීම වැඩි දියුණුකර ගැනීමට වැඩි ඉඩ ප්‍රස්ථාවක් උදාවිණි.

x. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ජර්මානු අධ්‍යයන හුවමාරු සේවය (DAAD) අතර අධ්‍යයන සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලබමින් සිටියි.

xi. ලංකා පාර්ලිමේන්තුවේ ගරු කතානායකවරයාගේ ආරාධනයකට අනුව ජර්මන් පාර්ලිමේන්තුවේ සභාපති මහාචාර්ය ආචාර්ය නෝර්බට් ලැම්මර්ට් මහතා සහ පාර්ලිමේන්තු

නියෝජිත කණ්ඩායමක් 2017 අප්‍රේල් 03-05 දිනවලදී ලංකාවට පැමිණියේය. එතුමා ලංකාවේ අතිගරු ජනාධිපතිතුමා හා ගරු අග්‍රාමාත්‍යතුමා බැහැදුටුවේය.

xii. ගරු මහාචාර්ය නෝර්බට් ලැම්මර්ට් මැතිතුමා ''ජාත්‍යන්තර සබඳතාවලදී ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ අනාගතය'' මැයෙන් දේශනයක් 2017 අප්‍රේල් 04 වැනි දින ජාත්‍යන්තර සබඳතා හා ක්‍රමෝපායික අධ්‍යයන සඳහා ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ දී (LKIIRSS) පැවැත්විය.

xiii. කොළඹ පිහිටි ජර්මානු තානාපති කාර්යාලය විසින් 2017 අප්‍රේල් මස කොළඹ දී '' කලාපීය ජර්මානු තානාපතිවරුන්ගේ සමුළුව'' පවත්වන ලදී.

xiv. ෆෙඩරල් විදේශ කාර්යාලයේ රාජ්‍ය ලේකම් ආචාර්ය මාකස් එඩෙරේ මහතා සහ තානාපති, අප්‍රිකා, ආසියා, ලතින් ඇමරිකා සහ මැද පෙරදිග සඳහා අධ්‍යක්ෂ ජනරාල් සබින් ස්පාවස්සර් මහතා, 2017 අප්‍රේල් 05-07 දිනවල කොළඹ දී පැවති ජර්මානු කලාපීය තානාපතිවරුන්ගේ සමුළුවට සහභාගිවීම සඳහා ලංකාවට පැමිණියහ.

xv. ලංකාවේ ගුවනින් හා ගොඩබිමෙන් ගිලන්රථ සේවා ඇතුළුව හදිසි වෛද්‍ය ප්‍රතිකාර සේවා ක්‍රියාත්මක කිරීම සඳහා ජර්මානු රජයෙන් සහාය ලබාගැනීමේ අරමුණින්, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමාගේ නායකත්වයෙන් යුතු නියෝජිත කණ්ඩායමක් 2017 මැයි 14-19 දිනවලදී ජර්මනිය බලා පිටත් විය.

xvi. ජර්මානු ෆෙඩරල් ජනරජයේ දි වෘද්ධ චිකිත්සක හෙදියන් ලෙස පුහුණු කිරීම සඳහා පුද්ගලයන් සාධාරණ ලෙස බඳවාගැනීමේ මූලධර්ම පිළිබඳ ඒකාබද්ධ අභිප්‍රා ප්‍රකාශයකට 2017 ජුනි මස දී ලංකාව සහ ජර්මනිය අත්සන් තැබූහ. මෙම වැඩසටහන මඟින් ලාංකික සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ට ජර්මනියේ වෘද්ධ පුද්ගලයන් රැකබලා ගැනීමේ කාර්යයෙහි නියැලීමට හැකි වනු ඇත.

xvii. ලාංකික පාර්ලිමේන්තුවේ කථානායක ගරු කරු ජයසූරිය මැතිතුමාගේ නායකත්වය යටතේ වූ ලංකා පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායම, ආගන්තුකයන් සඳහා වූ වැඩසටහනකට සහභාගීවීමට 2017 ජුනි 25-30 දිනවලදී ජර්මනියේ සංචාරයක නියැලිණි. ලංකා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම්වරයා, සංක්‍රමණික සංවර්ධනය පිළිබඳ 10 වැනි ගෝලීය සංසදයට (GFMD) සහභාගීවීම සඳහා 2017 ජනවාරි මස ජර්මනිය බලා පිටත්විය. ලංකාවේ විදේශ අමාත්‍යාංශය හා ජර්මනියේ විදේශ කටයුතු සඳහා ෆෙඩරල් අමාත්‍යාංශය අතර, ජර්මානු ෆෙඩරල් ජනරජයෙහි වෘද්ධ චිකිත්සක හෙදියන් ලෙස පුහුණු කිරීම සඳහා පුද්ගලයන් සාධාරණ ලෙස බඳවාගැනීමේ මූලධර්ම පිළිබඳ ඒකාබද්ධ අභිප්‍රා ප්‍රකාශයට 2017 ජූලි 27 වන දින, සංක්‍රමණ සංවර්ධනය පිළිබඳ 10 වැනි ගෝලීය සංසදයට සමගාමීව අත්සන් තබන ලදී.

xviii. ෆ්රැන්ෆර්ට් හි ලංකා කොන්සියුලර් ජනරාල්වරයා විසින් 2017 නොවැම්බර් 16 වන දින හේඩ්ල්බර්ග් විශ්ව විද්‍යාලයේ දකුණු ආසියා ආයතනයේ ද " ලංකා සන්ධ්‍යාව" මැයෙන් සංචාරක ප්‍රවර්ධන වැඩ සටහනක් සංවිධානය කළේය.

xix. ෆ්රැන්ෆර්ට් හි ලංකා කොන්සියුලර් ජනරාල්වරයා විසින් 2017 ඔක්තෝබර් මස 07 - 11 දක්වා කොපේන් හි පැවැති ආහාර පාන සඳහා වු අනුංගා ජාත්‍යාන්තර වෙළඳ ප්‍රදර්ශනයට සංවර්ධන උපායමාර්ගික හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය ගරු සුජීව සේනසිංහ මැතිතුමාගේ සංචාරයට පහසුකම් සලසන ලදි. ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ තේ මණ්ඩලය මගින් කදිම ආහාර සහ උණුසුම් පාන අංශයන්හිදී වෙන වෙනම ලංකා මණ්ඩප සංවිධාන කළේය. මෙම වෙළඳ ප්‍රදර්ශනයේදී ලාංකික ප්‍රදර්ශකයන් 52 ක් සහභාගි විය.

xx. ෆ්රැන්ක්ෆර්ට් හි ලංකා කොන්සියුලර් ජනරාල් විසින් ෆ්රැන්ක්ෆර්ට් හි මැණික් හා ස්වර්ණාභරණ සඳහා වු මුනිච් වෙළඳ ප්‍රදර්ශනය සහ ආහාර අඩංගුකාරක පිළිබඳ යුරෝපා වෙළඳ ප්‍රදර්ශනයේදී ලාංකික ප්‍රදර්ශකයන්ගේ සහභාගිත්වයට පහසුකම් සපයන ලදී.

**11. අයර්ලන්තය**

අයර්ලන්ත රජය විසින් මානුෂීය ගංවතුර ආධාර පරිත්‍යාග කරන ලදී.

**12. ඉතාලිය**

i. ඉතාලි රජය, ලංකාවේ ග්‍රාමීය/ කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා යුරෝ මිලියන 20ක් අනුග්‍රාහක මෘදු ණය පහසුකමක් ප්‍රදානය කර තිබේ. ඉහත මෘදු ණය පහසුකම් ප්‍රදානය භාවිතා කිරිමේ දී අනුගමනය කළ යුතු යෝජිත වැඩපිළිවෙල හා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා විදුලි තාක්ෂණික කණ්ඩායමක් 2017 වසරේ දී, ලංකාවට පැමිණීමට නියමිතය.

ii. ලංකාව හා ඉතාලිය අතර රාජ්‍ය තාන්ත්‍රික, කොන්සියුලර්, පරිපාලන හා තාක්ෂණික කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ පවුල්වල සාමාජිකයින්ගේ වේතන ලබන කටයුතු පිළිබඳ ගිවිසුමක කටයුතු අවසන් කර ඇති අතර එයට අත්සන් තැබීමට නියමිතය. මෙම ගිවිසුම මගින්, රාජ්‍යතාන්ත්‍රික දූතමණ්ඩලවල හා කොන්සියුලර් කාර්යාලවල සියරට පේරු පදනමින් බඳවාගනු ලැබූ කාර්ය මණ්ඩලයේ පවුල්වල සාමාජිකයින්ට ලැබුම්කාර හා යැපුම්කාර රාජ්‍යවලදී ස්වයං රැකියාවක් කිරීමට හෝ වැටුපක් ලබන කාර්යයක නිරත වීමට අවසර ලබාදෙයි.

iii. සුනාමි ව්‍යසනයෙන් පසුව යටිතල පහසුකම් හා නිවාස සංවර්ධන වැඩසටහන් සඳහා ඉතාලි රජය විසින් ලංකාවට ප්‍රදානය කරන ලද යුරෝ 7,671,459.65 ක ණය මුදල අවලංගු කිරීමක් ප්‍රදානය කර තිබේ. මෙම දිනවලදී ණය මුදල අවලංගු කිරීම සක්‍රිය කිරීමේ කාර්යයෙහි රටවල් දෙකම නිරත වී සිටිති.

iv. 2011 දී අත්සන් තබන ලද ඉතාලිය හා ලංකාව අතර රියැදුරු බලපත්‍ර අන්‍යෝන්‍ය වශයෙන් පිළිගැනීම සඳහා වූ ද්විපාර්ශ්වික ගිවිසුම 2017 මාර්තු 04 වැනි දින බලාත්මක විය.

v. සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය ගරු ජෝන් අමරතුංග මැතිතුමා, 2017 අප්‍රේල් 02-04 දිනවලදී මිලාන් හි දී පැවති BIT සංචාරක වෙළඳපළට සහභාගීවීම සඳහා ඉතාලියේ සංචාරයක නියැලිණි.

vi. ලංකාවේ භාණ්ඩාගාර හා මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා 2017 ජූනි 24-26 දිනවලදී ඉතාලියේ සංචාරයක නියැලිණි. මෙම සංචාරයේ දී කෘෂිකාර්මික සංවර්ධනය සඳහා

ජාත්‍යන්තර අරමුදල (IFAD) හා ලංකා රජය අතර ඇ.ඩො. මිලියන 33.7ක වටිනාකමකින් යුතු ''කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාරික පාර්ශ්වකාරිත්ව (SAP)'' මූල්‍ය ගිවිසුමකට අත්සන් තබන ලදී.

vii. කෘෂිකර්ම අමාත්‍ය ගරු දුමින්ද දිසානායක මැතිතුමා, 2017 ජූලි 03-08 දිනවලදී රෝමයේ පැවති ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ 40 වැනි සමුළුවට සහභාගිවීම සඳහා ඉතාලිය බලා පිටත් විය.

viii. අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලංකා රාජ්‍ය නැටුම් කණ්ඩායම, 2017 අගෝස්තු 28 සිට අගෝස්තු 28 දිනවලදී පැවති ''ෆෙස්ටිවල්ස් සර්කිට්'' සඳහා රැඟුම් ඉදිරිපත් කිරීමට ඉතාලිය බලා පිටත් විය.

ix. ලංකාව හා ඉතාලිය අතර රාජතාන්ත්‍රික, කොන්සියුලර්, පරිපාලන සහ තාක්ෂණික කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ වේතනික ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ද්විපාර්ශවීය ගිවිසුම 2017 නොවැම්බර් මස 27 වැනි දින රෝමයේ පිහිටි විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී අත්සන් කරන ලදී.

x. උතුරු ඉතාලියේ බ්‍රිසියාහි බෞද්ධ විහාරයේ 2017 ඔක්තෝබර් මස 01 දින පැවැති විශේෂ බෞද්ධ ආගමික උත්සවයක් සඳහා අධිකරණ හා බුද්ධ සාසන නියෝජ්‍ය අමාත්‍ය ගරු සාරතී දුෂ්මන්ත මැතිතුමා ඉතාලියේ සංචාරයක නියළිණි.

xi. FAO, IFAD, WFP හා ICCROM ආදි රෝමයේ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන ආත වැඩ කටයුතු/ රැස්වීම් සම්බන්ධීකරණය සිදු කළේය. 2018 - 2022 කාලය සඳහා වු ලංකාවේ WFP මෙරට උපායමාර්ගික සැලස්ම නොමැම්බර් මස 15 වන දින අනුමත කරන ලදී. මෙම උපායමාර්ගික සැලස්මේ මුළු වටිනාකාම එක්සත් ජනපද ඩොලර් මිලියන 46.8 කි. වසරක කාලයක් සඳහා ලංකාවේ ළමයින් 2000 ක් සඳහා පාසල් ආහාර සැපයීමේ අරමුදලින් නොවැම්බර් මස 18 වැනි දින පැවැති රෝම ජාත්‍යන්තර රොටරි සමාජය ඔස්සේ WFP හි අරමුදල වැඩිකර ගැනීමේ වැඩසටහනට මෙම තානාපති කාර්යාලයද සහභාගි විය. තවද, කොළඹ නියෝජිත පිරිසක් සමගින් නොවැම්බර් 29 සිට දෙසැම්බර් 01 දක්වා ICCROM හි මහසභා රැස්වීමේ 30 වැනි සැසියටත්, දෙසැම්බර් 4 - 8 දක්වා පැවැති 150 වැනි FAO කවුන්සිලයටත් ලංකාව සහභාගි විය.

xii. ලංකාවේ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු සුජීව සේනසිංහ මැතිතුමා 2017 ඔක්තෝබර් 09 - 17 දක්වා ඉතාලියේ සංචාරයක නියලුණේය. 2017 ඔක්තෝබර් 16 - 17 දක්වා වෙළඳාම සහ ආයෝජනය ප්‍රවර්ධනයට කිරීම සඳහා මිලාන් හි වාණිජ මණ්ඩල සමඟ පැවැති ව්‍යාපාරික රැස්වීම් සඳහාත්, ලංකා ව්‍යාපාරික සංසඳයටත් ගරු රාජ්‍ය අමාත්‍යවරයා සහභාගි විය. වාණිජ අමාත්‍යවරයා කැටුව මිලාන් හි AICE මණ්ඩලයේ ආචාර්‍යය පියරන්ටෝෆියෝ කැන්ටෝනි මහතා විසින් 2017 නොවැම්බර් මස 27 දින කොළඹ දී ගරු ජාත්‍යාන්තර වෙළඳාම පිළිබඳ රාජ්‍ය අමාත්‍යවරයා සමඟ රැස්වීමක් පවත්වන ලදී. "ඉතාලියේ වෙළඳපලට ප්‍රවේශවන ආකාරය" මැයෙන් සම්මන්ත්‍රණයක් 2017 නොවැම්බර් මස 27 දින EDB සමඟ ඒකාබද්ධව සංවිධානය කරන ලදී. මේ සඳහා 120 කට අධික පිරිසක් සහභාගි විය. යුරෝපයට අපනයන

කිරීම් සම්බන්ධයෙන් අපනයනකරුවන් 2000 වැඩසටහන යටතේ, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය 10 ක් සඳහා පුහුණු කිරීමේ වැඩසටහනක් ද EDB හිදී ආචාර්ය පියරන් ටෝනියෝ කැන්ටොෆි විසින් පවත්වන ලදී.

xiii. සංචාර සහ විනෝදගමන් මෙහෙය වන්නන් 16 දෙනෙකු සමඟින් 2017 ඔක්තෝම්බර් 21 - 14 දක්වා ඉතාලියේ රිමිනි හි පැවැති 54 වැනි TTG සංචාරක ප්‍රදර්ශනයට ලංකාව සහභාගී විය. ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සහ තානාපති කාර්යාලය විසින් මෙය ඒකාබද්ධව සංවිධානය කරන ලදී.

xiv. ලංකාවේ ගරු ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ රාජ්‍ය අමාත්‍යවරයාගේ සංචාරයේදී, මිලාන් හිදී 2017 ඔක්තෝබර් 13 වැනි දින ලංකා ව්‍යාපාර සංසඳයක්, රෝමයේ ලංකා තානාපති කාර්යාලය සමඟ මිලාන් හි ලංකා කොන්සියුලර් ජෙනරාල් කාර්යාලය විසින් සංවිධානය කළේය. මේ සඳහා ප්‍රමුඛ පෙළේ ඉතාලි ව්‍යාපාරිකයන්/ ආයෝජකයන් සහභාගි විය.

xv. මිලාන් හි ලංකා කොන්සියුලර් ජනරාල් කාර්යාලය විසින් 2017 ඔක්තෝබර් 16 වන දින මිලානයේ කුඩාකර්මාන්ත සංගමයේ සභාපති ඩැනියෙලා කවන්ග්නා සහ ලංකාවේ ගරු ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමා සමඟ ව්‍යාපාරික ප්‍රජා රැස්වීමක් පවත්වන ලදී.

xvi. මිලාන්හි කොන්සියුලර් ජනරාල් කාර්යාලයෙ මගින් 2017 ඔක්තෝබර් මස 01 වන දින විදේශයන්හි වසන ළමුන් අතර සංස්කෘතික වටිනාකම් වැඩිදියුණු කිරීම සඳහා සිංහල සාහිත්‍ය කලා සමාජය සමඟ සිංහල සාහිත්‍ය කලා උත්සවයක් සංවිධානය කළේය.

xvii. මිලාන් හි ලංකා කොන්සියුලර් ජනරාල් කාර්යාලය මගින් 2017 ඔක්තෝබර් 02 දින බ්‍රිසියා බෞද්ධ විහාරයේ නව පරිශ්‍රය විවෘත කිරීමේදී නියෝජ්‍ය බුද්ධශාසන අමාත්‍යවරයාගේ සංචාරයට පහසුකම් සැලස්වීය.

**13. හංගේරියාව**

i. හංගේරියානු රජය, 2017 මැයි මස ලංකාවේ ඇති වූ ගංවතුරින් විපතට පත්වූවන් සඳහා හංගේරියානු ෆොරින්ට් 1,500,000/- ක් පරිත්‍යාග කළේය.

ii. ලංකාව හා හංගේරියාව අතර ආර්ථික සහයෝගීතාව පිළිබඳ ගිවිසුමකට අත්සන් තැබීම සඳහා එහි කටයුතු නිමකොට තිබේ. මෙම ගිවිසුම මගින් දෙරට අතර ආර්ථික වෙළඳ සහයෝගීතාව තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

iii. 2017 දෙසැම්බර් 15 වන දින ලක්සම්බර්ග් හි සිදුකල නිල සංචාරයේදී, ලංකා විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානායක මැතිතුමා විසින් ලක්සම්බර්ග් මණ්ඩලයේ සභාපති සහ ලක්සම්බර්ග් හි සමාජ ආරක්ෂණ, සංවර්ධන සහයෝගිතා, මානුෂීය කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යවරයා හමුවිය.

iv. වෙළඳාම හා ආයෝජන ක්ෂේත්‍රයන්හි ලක්සම්බර්ග් හා ලංකාව අතර ශක්තිමත් සබඳතාවයක් සඳහා අදහස් සාකච්ඡා කර ගැනීමට ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා විසින් ලක්සම්බර්ග් හි වාණිජ මණ්ඩල සමාජිකයන් මුණගැසුණි.

v. ගුවන් සේවා ගිවිසුමකට එළඹීම සඳහා ලක්සම්බර්ග් වලින් කරන ලද ඉල්ලීම සම්බන්ධයෙන්, බෙල්ජියම් හි  ලංකා තානාපති කාර්යාලය මගින් සාකච්ඡා ආරම්භ කිරීම සඳහා සූදානම් වීමේ මූලික සාකච්ඡා, සඳහා මුලපුරණ ලදී. මෙම ගිවිසුමට එළඹීමේ අරමුණ වනුයේ ලංකාවට නිතිපතා කාගෝලුක්ස් ගුවන් ගමන් වලට පහසුකම් සැලසීමයි. ලක්සම්බර්ග් යනු යුරෝපයේ ප්‍රධාන සැපයුම් කේන්ද්‍රස්ථානයක් වන බැවින්, කාගෝලුක්ස් ගුවන්ගමන් මගින් ලක්සම්බර්ග් හරහා යුරෝපයට  ලංකාවෙන් සිදුකරන අපනයන වලට පහසුකම් සලසයි.

**14. ලිතුවේනියාව**

2014 මැයි මස ලංකාවේ ඇති වූ ගංවතුර ආපදාවේ දී ලිතුවේනියා රජය මානුෂීය ආධාර වශයෙන් යුරෝ 10,000/- ක්  ලංකාවට ප්‍රදානය කළේය.

**15. ලක්සම්බර්ග්**

ලංකාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු තිලක් මාරපන මැතිතුමා 2017 සැප්තැම්බර් 27 වැනි දින ලක්සම්බර්ගයේ නිල සංචාරයක නියැලුණ අතර මෙහිදී ලක්සම්බර්ග් හි විදේශ කටයුතු අමාත්‍ය ගරු ජීන් ඇසෙල්බෝන් මැතිතුමා සමඟ ඵලදායි ද්විපාර්ශ්වික රැස්වීමක් පැවැත්වීය. 1972 වසරේදී දෙරට අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීමෙන් අනතුරුව  ලාංකික විදේශ අමාත්‍යවරයෙකු ලක්සම්බර්ග් හි නියැලුණ ප්‍රථම සංචාරය මෙය විය. ආර්ථික ඉඩ ප්‍රස්ථා පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමට අමාත්‍ය දෙපළ මෙහිදී එකඟ වූහ. 2018 වසරේ දී  ලාංකික ව්‍යාපාරික නියෝජිත කණ්ඩායමක් ලක්සම්බර්ග් හි සංචාරයක නිතර කරවීමට ද අමාත්‍ය දෙපළ එකඟ වූහ. ලංකාවේ ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා, අවස්ථාව ලද විටෙක  ලංකාවේ සංචාරයක නිරතවන ලෙස ලක්සම්බර්ග් විදේශ අමාත්‍ය ඇසෙල්බෝර්න් මැතිතුමාට ආරාධනා කළේය.

**16. නෙදර්ලන්තය**

2017 ජූලි මසදී "KRO NCRV" රූපවාහිනී කණ්ඩායම (වාර්තාමය) සඳහා FAM මාධ්‍යයටත් අගෝස්තු මසදී ඕලන්ද ජාතික TV BNNVARA (වාර්තාමය) සඳහාත් අගෝස්තු මසදී NPO Public ගුවන්විදුලි සමාගම (ස්වභාව ධර්මය හා වනජීවී) ටත් අවශ්‍ය පහසුකම් තානාපති කාර්යාලය විසින් සලසන ලදී.

i. නෙදර්ලන්තයේ  ලංකා තානාපති කාර්යාලය මගින් 2017 ඔක්තෝබර් 24 - 28 දක්වා නෙදර්ලන්ත රජයේ ආරාධනයක් මත පශු සම්පත් හා ග්‍රාමීය ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු පී. හැරිසන් මැතිතුමාගේ නෙදර්ලන්ත සංචාරයට පහසුකම් සලසන ලදී.

ii. නෙදර්ලන්ත  ලංකා තානාපති කාර්යාලය මගින් තවද 2017 නොවැම්බර් 27 සිට දෙසැම්බර් 03 දක්වා ප්‍රසිද්ධ ප්‍රචාරකවේදී බිඑන්එන් වාරා මාධ්‍ය ආයතනයේ මාධ්‍ය කණ්ඩායම් සාමාජිකයන් දෙදෙනෙකු විසින් සිදුකල  ලංකා සංචාරයට පහසුකම් සලසන ලදී.

**17. නෝර්වේ**

i. ලංකාව හා නෝර්වේ අතර ධීවර ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ ගිවිසුම්වලට 2017 මාර්තු මසදී ලංකා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ දී අත්සන් තබන ලදී.

ii. නෝර්වේ විදේශ කටයුතු අමාත්‍යාංශය හා ලංකා ආණ්ඩුව අතර ලංකාව සඳහා නව ධීවර හා ජලජීවී ප්‍රතිපත්තියක් සැකසීම පිළිබඳ ආධාර ප්‍රදාන ගිවිසුම.

iii. නෝර්වේජියානු විදේශ කටයුතු අමාත්‍යාංශය හා ලංකා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය අතර ලංකාව සඳහා නව ධීවර හා ජලජීවී ප්‍රතිපත්තියක් සැකසීම පිළිබඳ ආයතනික සහයෝගීතා ගිවිසුම.

iv. දෙරට අතර ධීවර ක්ෂේත්‍රයේ සහයෝගීතාව යටතේ නෝර්වේහි ආචාර්ය ෆිරිඩ්ජොෆ් නැන්සෙන් කරදිය පර්යේෂණ යාත්‍රාව (ඉතාලියේ රෝමයේ ආහාර හා කෘෂිකර්ම සංවිධාන මූලස්ථානයේ ධීවර දෙපාර්තමේන්තුව සතුවූ) යොදා ගනිමින් අනන්‍යතා කලාපයේ ඇති ලංකාවේ මත්ස්‍ය සම්පත් පිළිබඳ සමීක්ෂණයක් පැවැත්වීමට ආහාර හා කෘෂිකර්ම සංවිධානය හරහා ලංකාවට සහය ලබාදෙන බවට නෝර්වේ රජය සහතික විය. ලංකාවේ දී පරිපූර්ණ ජාතික ධීවර ප්‍රතිපත්ති රාමුවක් සැකසීම සඳහා නෝර්වේ රජයේ සහාය ලබාදෙන බවට සහතික විය.

v. ලංකා රජය කළ ඉල්ලීමකට අනුව, නෝර්වේ රජය විසින් 2017 අගෝස්තු මාසයේ දී උමා ඔය බහුකාර්යය ව්‍යාපෘතියේ ප්‍රධාන උමං මාර්ගයේ වූ කාන්දුවීමට හේතු සොයා බැලීම සඳහා සහ එමඟින් පැනනඟින ගැටලුවලට විද්‍යාත්මක විසඳුම් ලබාදීමට බෙන්ට් ආගාර්ඩ් මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු තාක්ෂණ විශේෂඥ කණ්ඩායම විසින් සම්පාදනය කරන ලද අතුරු වාර්තාව ලංකා අතිගරු ජනාධිපතිතුමාට භාර දෙන ලදී.

vi. ධාරිතා සංවර්ධනය සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) සඳහා නායයෑම් වැළැක්වීම විශ්ලේෂණය හා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති සඳහා දියුණු උපකරණ ලබාදීම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) හා නෝර්වේජියානු භූ තාක්ෂණික ආයතනය (NGI) අතර දැනට පවත්නා තාක්ෂණික සහයෝගීතාව සඳහා කොළඹ පිහිටි නෝර්වේජියානු තානාපති කාර්යාලය අරමුදල් සපයමින් සිටියි.

vii. නෝර්වේජියානු රජය විසින් සංවිධානය කරන ලද අධ්‍යයන වැඩ සටහනකට සහභාගීවීම සඳහා ලංකා පාර්ලිමේන්තුවේ කාන්තා කෝංග්‍රසයේ පහත දැක්වෙන සාමාජිකාවෝ 2017 මාර්තු 26-අප්‍රේල් 01 දිනවලදී නෝර්වේ බලා පිටත් වූහ.

   i. ගරු චන්ද්‍රානි බණ්ඩාර, පා.ම., කාන්තා හා ළමා කටයුතු ඇමතිනී
   ii. ගරු තලතා අතුකෝරල, පා.ම., විදේශ රැකියා ඇමතිනී
   iii. ගරු සුමේධා ජී. ජයසේන, පා.ම., තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය ඇමතිනී
   iv. ගරු (ආචාර්ය) අනෝමා ගමගේ, පා.ම., ඛනිජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය ඇමතිනී
   v. ගරු විජයකලා මහේෂ්වරන්, පා.ම., ළමා කටයුතු පිළිබඳ රාජ්‍ය ඇමතිනී
   vi. ගරු යානි විජේවික්‍රම, පා.ම.
   vii. ගරු (ආචාර්ය) තුසිතා විජේමාන්න, පා.ම.

viii. වයඹ පළාතේ ධීවර අමාත්‍ය ගරු වර්ණකුලසූරිය ජූඩ් මාල් තිසේරා මැතිතුමා, 2017 මැයි 29- ජුනි 02 දිනවල නෝර්වේ, ඔස්ලෝහි පැවති නීත්‍යානුකූල නොවන වාර්තා නොකළ හා නියාමනය නොකළ ධීවර කටයුතු පිලිබඳ ආහාර හා කෘෂිකර්ම සංවිධාන රැස්වීමට සහභාගී විය.

ix. ව්‍යවහාරික විද්‍යා පිළිබඳ බටහිර නෝර්වේ විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය සමඟ ධාරිතා සංවර්ධනය හා පිරිසිදු බලශක්තිය සඳහා නැනෝ තාක්ෂණය යොදාගැනීම පිළිබඳ පර්යේෂණ කොන්සෝටියමක් ස්ථාපනය කිරීම පිළිබඳව සහයෝගීතා ගිවිසුමකට 2017 ජූලි 07 වැනි දින අත්සන් තබන ලදී. මෙහි වටිනාකම වසර තුනක කාලසීමාවක් සඳහා නෝර්වේජියානු ක්‍රෝනර් මිලියන 6.2 ( ලං.රු. මිලියන 112) කි.

x. නෝර්වේජියානු රජය විසින් එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) හා ජාත්‍යන්තර රතු කුරුස බල මණ්ඩලය (IFRC) හරහා ලංකාවේ ගංවතුර ආපදා තත්ත්වයේ දී නෝර්වේජියානු ක්‍රෝනර් මිලියන 10ක ( ලං.රු. මිලියන 180/ඇ.ඩො. මිලියන 1.2) මානුෂීය ආධාර පරිත්‍යාග කරන ලදී.

xi. විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, ප්‍රසාද් කාරියවසම් මහතා සහ සහකාර නීති උපදේශිකා තිලානි ද සිල්වා මහත්මිය විසින් 2017 දෙසැම්බර් 11 - 12 දක්වා ලංකා නොර්වේ අතර විදේශ කාර්යාල සාකච්ඡාවන්ගේ පළමු වටයට ඔස්ලෝහි සංචාරයක නිරත විය. අමාත්‍යාංශය ලේකම් කාරියවසම් මහතා නොර්වේජියානු විදේශ අමාත්‍යාංශයේ මහ ලේකම් වේගර් ස්ට්‍රෙමෙන් මහතා හමුවිය. ඔවුන් විසින් ද්විපාර්ශවීය සබඳතාවයන්ගේ තත්වය සහ නොර්වේ සහයෝගයෙන් ලංකාවේ සිදුකරන ව්‍යාපෘතීන් විමසුමට ලක් කළේය. දෙරට අතර සබඳතා පුළුල් කිරීමේ සහ ශක්තිමත් කිරීමේ ආකාරයන් හා මාධ්‍යයන් පිළිබඳ ලේකම්වරුන් දෙපළ සාකච්ඡා කළේය.

xii. නෝර්වේජියානු විදේශ අමාත්‍යාංශයේ නීති අංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ පැවැති රැස්වීමේදී, මහද්වීපික තටාක සීමා කිරීම් සම්බන්ධයෙන් කොමිසමේ මුහුදු නීතිය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සම්මුතිය යටතේ, ලංකාවේ ප්‍රකාශය ලංකා නියෝජිත පිරිස විසින් ඉදිරිපත් කළේය. මෙම ක්ෂේත්‍රය පිළිබඳ ලංකාවේ විශේෂඥ නීති සහයෝගය සඳහා නොර්වේ පෙනී සිට ඇත.

xiii. නොර්වේ හි ලංකා තානාපති කාර්යාලය මගින් ඔස්ලෝහි දූත මණ්ඩලයේ දී 2017 නොවැම්බර් 22 වන දින සංචාරක ප්‍රවර්ධන වැඩසටහනක් සංවිධානය කළේය. ප්‍රමුඛ පෙළේ සංචාරක නියෝජිතයන්, සංචාරක මෙහෙය වන්නන්, සුප්‍රකට සංචාරක ලේඛකයන් හා සංචාරක මාධ්‍ය වේදීන්, ලංකාවේ ප්‍රධාන ගුවන් සමාගම් සේවාවන්හි නියෝජිතයින් ඉහත වැඩසටහනට සහභාගි විය.

xiv. ප්‍රධාන පෙළේ සංචාරක සඟරා කතෘ ටර්ජි මයික්ල් බොස්ට්මහාතගේ ලංකා සංචාරයක් මෙම දූත මණ්ඩලය විසින් සැලසුම් කළේය. "සැගිරාල් හෝටලය,හම්බන්තොට" සම්බන්ධයෙන් වාර්තාවක්, "ග් ලෝසි සඟරාවේ" විශිෂ්ට හෝටලය සහ ආහාර (2018) යටතේ කතුවරයා විසින් පලකර ඇත.

18. මෝල්ටාව

i. "අවසරය ලබාදීමකින් තොරව පුද්ගලයන් නැවත භාරගැනීම පිළිබඳ යුරෝපා ප්‍රජාව හා ලංකා රජය අතර ගිවිසුම'' ක්‍රියාත්මක කිරීම පිළිබඳව ලංකාව හා මෝල්ටාව අතර සන්ධානයට අත්සන් තැබීම සඳහා අවශ්‍ය කටයුතු නිමකොට තිබේ.

ii. මෝල්ටා හි 2017 ඔක්තෝම්බර් 5 - 6 දක්වා පැවැති 4 වැනි "අපේ ජාත්‍යන්තර සාගර සමුළුව" සඳහා ලංකා විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානායක මැතිතුමා ලංකා නියෝජිත පිරිසට නායකත්වය ලබා දුන්හ. තිරසර කටයුතු ප්‍රවර්ධනය කිරීම සමුද්‍ර දූෂණය අඩු කිරීම සහ වෙරළබඩ ප්‍රජාවන් ආරක්ෂා කිරීම සඳහා ලබා දුන් පොරොන්දු ක්‍රියාත්මක කිරීම සඳහා ලංකාව විසින් ගන්නා ලද වැදගත් පියවර විශේෂණය කරමින් මෙම සමුළුවේදී රාජ්‍ය අමාත්‍ය සේනානායක මැතිතුමා ප්‍රධාන ප්‍රකාශනය සිදු කරන ලදී.

iii. මෙම සමුළුව අතරවාරයේදී, රාජ්‍ය අමාත්‍ය සේනානායක මැතිතුමා විසින් මෝල්ටාහි විදේශ කටයුතු අමාත්‍ය කාර්මෙලේ ආබෙලා හමුවු අතර දෙරට අතර ද්විපාර්ශවීය සබඳතා විමසුමට ලක් කළේය. අමාත්‍යවරුන් දෙපල විසින් යුරෝපා සංගමය සහ ලංකාව ගිවිසුමට ඇතුලත්වීම සඳහා ක්‍රියාත්මක කිරීමේ සන්ධානය අත්සන් කරන ලදී.

19. පෝලන්තය

i. 2017 ජනවාරි - අප්‍රේල් කාල සීමාව තුළදී පෝලන්තයේ ෆෘක්ටෝ ෆ්රෙෂ් සමාගමට (Fructo Fresh Company) ලාංකිකයින් 20 දෙනෙකු බඳවාගැනීම සඳහා අවශ්‍ය පහසුකම් වෝර්සෝ හි ලංකා දූතමණ්ඩලය විසින් සලසන ලදී.

ii. ලංකාව හා පෝලන්තය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපනය කිරීමේ 60 වැනි සංවත්සරය වෝර්සෝ විශ්වවිද්‍යාලය සමඟ එක්ව 2017 ජුනි 06 වැනි දින පෝලන්තයේ දී සමරන ලදී. පෝලන්ත රජයේ ගරු නියෝජ්‍ය විදේශ කටයුතු අමාත්‍යවරයා හා සියයකට අධික අමුත්තන් පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

iii. පොලන්තයේ ලංකා තානාපති කාර්යාලය විසින් 2017 ඔක්තෝබර් මස 20 - 22 දක්වා පැවැති PTAK වෝර්ෂෝ වෙළඳ ප්‍රදර්ශනයේදී 2 වන ජාත්‍යන්තර සංචාරක වෙළඳපළටත්, ලෝක සංචාරක දැක්මටත් සහභාගි විය.

iv. ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සංවිධානයෙන් පෝලන්තයේ ලංකා තානාපති කර්යාලය, වෝර්ෂෝ හි සංස්කෘතිකහ හා විද්‍යා මන්දිරයේදී 2017 නොවැම්බර් 23 - 25 දක්වා පැවැති 25 වැනි ජාත්‍යන්තර සංචාරක දැක්ම TT වොර්ෂෝ 2017 ට සහභාගි විය.

v. පෝලන්තයේ ලංකා තානාපති කාර්යාලය මගින් වෝර්ෂෝ හි හිල්ටන් හෝටලයේදී පැවැති පළමු ලංකා ආහාර උත්සවය සංවිධානය කළේය.

vi. පෝලන්තයේ ලංකා තානාපති කාර්යාලය මගින් H.B.T Int. ප්‍රවාහන ස්පසුයි හා පෝලන්තයේ එම්පොලෝයි හවුස් S.A. අතර සාකච්ඡා පහසුකම් සැලසු අතර ලංකාවෙන් පුහුණු ශ්‍රමිකයන් බඳවා ගැනිම සම්බන්ධයෙන් ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය අතර සම්බන්ධීකරණය.

vii. පෝලන්තයේ ලංකා තානාපති කාර්යාලය මගින් ලංකාවෙන් පුහුණු ශ්‍රමිකයන් බඳවා ගැනීම සම්බන්ධයෙන් 2017 වර්ෂයේදී ඇග්‍රිසෝල් ජාත්‍යන්තර RO SRL, ෆැබ්රික්වා ද කරෝසිරි SLR, රොජොබ්ස් සෙලෙක්ට් S I රෙක්රූටර් SRL, රාමානියාවේ ද රොට්ජොබ් ග්ලෝබල් බඳවාගැනීම, සහ ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය සිදු කිරීම.

**20. රොමේනියාව**

විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානායක මැතිතුමා ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීම සඳහා 2017 ජුනි 28-ජුලි 02 දිනවලදී රොමේනියාවේ සංචාරයක නියැළිණි. ගරු රාජ්‍ය අමාත්‍යවරයා රොමේනියාවේ බලශක්ති වෙළෙඳ හා කම්කරු නියෝජ්‍ය අමාත්‍යවරුන් සමඟ හමු පැවැත්විය. ගරු රාජ්‍ය අමාත්‍යවරයා, 2017 ජුනි 29 දින බුඩාපෙස්ට් හි පැවති ව්‍යාපාරික සංසදයකට ලාංකික ව්‍යාපාරික නියෝජිතයින් දස දෙනෙකු සමග සහභාගී විය. ගරු රාජ්‍ය අමාත්‍යවරයා, බ්‍රාසෝව් හි ට්‍රාන්සිල්වනියා විශ්වවිද්‍යාලයට ගිය අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් එම විශ්වවිද්‍යාලය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර අධ්‍යාපනික හුවමාරු ශක්තිමත් කර ගැනීමට ඉඩප්‍රස්ථාව උදාවිය. ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයේ එක් නිලධාරියෙකුට තෝරාගත් අධ්‍යයන ක්ෂේත්‍රයක ශාස්ත්‍රපති හෝ ආචාර්ය උපාධියක් ලබාගැනීමට අවශ්‍ය පහසුකම් ට්‍රාන්සිල්වේනියා විශ්වවිද්‍යාලය මගින් ප්‍රදානය කරන බව විශ්වවිද්‍යාල ප්‍රධානී අබිරුඩන් මහතා මෙම සාකච්ඡාවලදී දන්වා සිටියේය. රොමේනියාව හා ලංකාව අතර රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර හිමියන් වීසා බලපත් ලබාගැනීමෙන් නිදහස් කිරීම පිළිබඳ ගිවිසුමකට ද අත්සන් තබන ලදී.

**21. ස්ලෝවේනියාව**

i. විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානායක මැතිතුමා 12 වැනි බ්ලෙඩ් උපායමාර්ගික සංසදය 2017ට සහභාගීවීම සඳහා 2017 අගෝස්තු 30- සැප්තැම්බර් 05 දිනවලදී ස්ලෝවේනියාවේ සංචාරයක නියැලිනි. ''යථාර්ථවාදී අපේක්ෂාව - කෙනෙකු සිතනවාට වඩා වේගයෙන් පරිවර්තනය සිදුවන්නේ කෙසේද'' පිළිබඳ කණ්ඩායම් සාකච්ඡාවකට හා අන්තර් ක්‍රියාකාරිත්ව සැසිවාරයේ සාකච්ඡාවලට රාජ්‍ය අමාත්‍යවරයා සහභාගී විය. එතුමා බ්ලෙඩ් සංසඳය අතරතුරදී ස්ලෝවේනියාවේ අග්‍රාමාත්‍ය මිරෝසරාර් මැතිතුමා හා සර්බියාවේ අග්‍රාමාත්‍ය ඇනා බ්රිනාබික් මැතිතුමා හමුවිය.

ii. මෙම සංචාරයේ දී ගරු රාජ්‍ය අමාත්‍ය වසන්ත සේනානායක මැතිතුමා ස්ලෝවේනියාවේ විදේශ කටයුතු පිළිබඳ රාජ්‍ය ලේකම් අන්ඩ්‍රිජ් ලෝගාර් මැතිතුමා සමඟ සාකච්ඡා පැවැත්වූ අතර දැනට ද්විපාර්ශ්වික සහයෝගීතාව පවත්වාගෙන යන ක්ෂේත්‍ර පිළිබඳව සමාලෝචනයක යෙදිනි. ස්ලෝවේනියාවේ ආර්ථික සංවර්ධන (සංචාරක) හා තාක්ෂණික අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම් ඊවා ස්ට්‍රාවිස් පොඩ්ලොගර් මහත්මිය, යටිතල පහසුකම් හා බලශක්ති අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම් ක්ලෙමෙන් පොස්ට්සෙක් මහතා, පිරාන් පීටර් බොස්මාන්නෑන්ඩ් හා නගරාධිපති ආචාර්ය අර්නස්ට් පෙට්‍රික් මහතා සහ ජාත්‍යන්තර කටයුතු හා ජාත්‍යන්තර නීතිය පිළිබඳ ජනාධිපති උපදේශකවරයා සමඟ ද රාජ්‍ය අමාත්‍යවරයා ද්විපාර්ශ්වීය සාකච්ඡා පැවැත්වීය.

iii. ස්ලෝවේනියා රජය, ලංකාවේ ගංවතුරින් විපතට පත් ප්‍රදේශ වෙනුවෙන් ජාත්‍යන්තර රතු කුරුස බලමණ්ඩලය හරහා යුරෝ 30,000ක පරිත්‍යාග කළේය.

**22. ස්වීඩනය**

i. ස්වීඩනයේ විදේශ කටයුතු අමාත්‍ය ගරු මාග්‍රට් වෝල්ස්ට්‍රෝට් මැතිණියගේ ආරාධනයකට අනුව විදේශ අමාත්‍ය ගරු මංගල සමරවීර මහතා 2017 ජනවාරි 17-18 දිනවල ස්වීඩනයේ නිල සංචාරයක නිරත විය. එම සංචාරය අතරතුර දී ස්වීඩන විදේශ කටයුතු අමාත්‍ය ගරු මාග්‍රට් වෝල්ස්ට්‍රෝට් මැතිණිය නියෝජ්‍ය අග්‍රාමාත්‍ය සහ ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතා හා දේශගුණික කටයුතු අමාත්‍ය ගරු ඉසබෙලා ලෝවින් මැතිණිය, යුරෝපා සංගම් (EU) කටයුතු සහ වෙළඳ අමාත්‍ය ගරු ඈන් ලින්ඩේ මැතිණිය, කතානායක අර්බන් අහ්ලින් මහතා සහ ස්වීඩන පාර්ලිමේන්තුවේ තෝරාගත් සාමාජිකයන් කිහිපදෙනෙකු හමුවීමේ අවස්ථාව විදේශ කටයුතු අමාත්‍යවරයාට ලැබිණි.

ii. ස්වීඩනයේ ආරක්ෂක සහ සංවර්ධන ප්‍රතිපත්ති පිළිබඳ ආයතනයේ (ISDP) දී ගරු අමාත්‍යවරයා '' ලංකාවේ වර්තමාන දේශපාලනික ප්‍රවණතා සහ සංහිඳියා යාන්ත්‍රණය'' යන මැයෙන් දේශනයක් ඉදිරිපත් කළේය. ස්ටොක්හෝම්ස් ජොස්ටාඩ්හි හැමර් හිදී ස්වීඩන ප්‍රසිද්ධ සමාගම්/ආයෝජකයිනගේ සහභාගීත්වයෙන් යුතුව ''ස්මාට් නගර සහ තිරසාර සංවර්ධනය'' තේමාව යටතේ පැවැත්වුණු වටමේස සාකච්ඡාවටද එතුමා සහභාගී විය.

iii. ලංකාවේ අනාගත ආයෝජන පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීම සඳහා 2017 පෙබරවාරි 20-23 යන දිනවල IKEA නියෝජිත කණ්ඩායමක් ලංකාවේ සංචාරයක නිරත විය.

iv. මහනගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා 2017 ජූනි මස 08-09 දිනවල ස්වීඩන සංචාරයක නියැලුණේය. 2017 ජූනි 08 වැනි දින ස්වීඩනයේ, ගොතෙන්බර්ග් ව්‍යාපාරික කලාපයේ පැවති, ලංකාවේ මහනගර ව්‍යාපෘතිවල ආයෝජන ඉඩප්‍රස්ථා ඉලක්ක කරගත් වැඩමුළුවේදී ස්වීඩන ජාතික වෙළඳ නියෝජිතයින් සමග හමුවීමේ අවස්ථාව එතුමාට ලැබිණි.

v. ලංකාවේ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමඟ එක්ව ස්විඩනයේ ලංකා තානාපති කාර්යාල මගින් 2017 සැප්තැම්බර් මාසයේදී කොළඹ දි පැවැති FACET මැණික් හා ස්වර්ණාභරණ වෙළඳපළේ දී වැඩමුළුවක් පැවැත්වීම සඳහා ස්වීඩනයේ මැණික් විශේෂඥ ජොහානැස් ඕර්ස්ටාඩියස් මහතාගේ සහභාගිත්වයට පහසුකම් සලසන ලදී.

vi. ලංකාවේ වානිජ දෙපාර්තමේන්තුව හා එක්ව ස්වීඩනයේ ලංකා තානාපති කාර්යාලය මගින් 2017 නොවැම්බර් 15 - 16 දක්වා ස්වීඩනයේ, මල්මෝහිදී පැවැති "ස්කැන්ඩිනේවියානු ස්වභාවික නිෂ්පාදන 2017 " වෙළඳ ප්‍රදර්ශනයේදී ලංකා මණ්ඩපය පිළියෙල කරන ලදී.

vii. ස්විඩනයේ, උප්සලා විශ්ව විද්‍යාලයේ, ඇන්ග්සට්‍රොං රසායනාගරයේ මහාචාර්‍ය්‍ය වර්නන් කුරේ සමඟ පැවැති සාකච්ඡාවෙන් ස්වීඩනයේ ලංකා තානාපති කාර්යාලය මගින් ලංකාවේ තරංග බලශක්තිය හඳුන්වාදීමේ හැකියාව සොයා බැලීම සඳහා 2018 මැයි මස 15 වන දින දකුණු ස්වීඩනයේ ලෙසිකිල් හී තරංග බලශක්ති බලාගාරය නැරඹීම සඳහා විදුලිබල

මණ්ඩලයේ ( ලංකාවේ විදුලිබල හ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් නම් කළ) නියෝජිතයෙක් සඳහා කටයුතු සැලසුම් කරන ලදී.

**23. ස්විට්සර්ලන්තය**

i. සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුභසාධනය හා ආරක්ෂාව ඉලක්ක කරගත් සංක්‍රමණික සේවකයින් සුරක්ෂිත කිරීමේ වැඩසටහනක් ලංකාවේ ඇති කිරීම සඳහා ස්විට්සර්ලන්ත රජය ආධාර ලබාදෙයි. මෙම වැටසටහන ලංකා ආණ්ඩුව හා සමග ජාත්‍යන්තර සංවිධානවල කාර්මික සහයෝගය සහ සිවිල් සමාජයීය සංවිධානවල හවුල්කාරිත්වය මත ක්‍රියාත්මක වේ. සමාජයීය, මනෝසමාජයීය හා ආර්ථික වියදම් අවම කරමින් සංක්‍රමණික ශ්‍රමිකයන්ට වැඩි ප්‍රතිලාභ අත්කර දීමේ අරමුණ ඇතිව, සංක්‍රමණික ශ්‍රමිකයන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ආරක්ෂිත සංක්‍රමණික තොරතුරු සහ අදාළ සේවාවන් සපයාදීම මෙම ව්‍යාපෘතියේ පරමාර්ථයයි.

ii. සංක්‍රමණික කරුණු පිළිබඳව දෙරට විසින් එළැඹි ද්විපාර්ශ්වික සහයෝගීතා ගිවිසුම යටතේ '' ලංකාවත් ස්විට්සර්ලන්තයත් අතර පැවැත්වෙන විද්වත් උපදේශනවල පළමු වටය'' 2017 අප්‍රේල් 04 දින කොළඹ දී පැවැත්වීය.

iii. 2017 ජනවාරි 16 දින සිට 22 දින දක්වා ස්විට්සර්ලන්තයේ ඩාවෝස් හි පැවති ''ලෝක ආර්ථික සංසඳය''ට ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහභාගී විය.

iv. විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා 2017 ජනවාරි 31 සිට පෙබරවාරි 09 දින දක්වා ජිනීවා හි නිල සංචාරයක නිරතවිය. එම සංචාරයේ දී ලංකාවේ විද්‍යාත්මක ප්‍රජාවන් න්‍යෂ්ඨික පර්යේෂණ සඳහා යුරෝපා සංවිධානය අතර High Energy Physics සහයෝගීතාව පිළිබඳ ජාත්‍යන්තර සහයෝගිතා ගිවිසුමකට එළැඹිණ.

v. ''පුනරුත්ථාපනය 2030 ක්‍රියාත්මක වෙමු'' මැයෙන් පැවති WHO හමුවට සහභාගී වීමට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය රාජිත සේනාරත්න මහතා 2017 පෙබරවාරි 06-07 දිනවල ජිනීවා හි සංචාරයක නිරත විය.

vi. 2017 මැයි 02-08 විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා ජිනීවා හි සංචාරය කළේය.

vii. 2017 මැයි 22-31 පැවති 17 වැනි ලෝක සෞඛ්‍ය හමුවට සහභාගිවීමට සෞඛ්‍ය අමාත්‍ය ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමා සහ එම අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍ය ගරු එම්.සී.එම්. ෆයිසාල් යන මහත්වරුන් සහභාගී වූහ.

viii. ජාත්‍යන්තර කම්කරු සම්මන්ත්‍රණයට සහභාගීවීමට කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගරු ඩබ්.ඩී.ජේ. සෙනෙවිරත්න මැතිතුමා 2017 ජූනි 05-16 දිනවල ස්විට්සර්ලන්තයේ සංචාරය කළේය.

ix. වරාය හා නාවික කටයුතු අමාත්‍ය ගරු මහින්ද සමරසිංහ මැතිතුමා 2017 සැප්තැම්බර් 05-14 දිනවල ජිනීවාහි සංචාරය කළේය.

x. ශ්‍රී ලංකාව හා ස්විට්සර්ලන්තය අතර විදේශ කාර්යාල සාකච්ඡා පිළිබඳ සැසිය, කොළඹ පිහිටි විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී 2017 නොවැම්බර් 15 වන දින කැඳවන ලදී. විදේශ කටයුතු පිලිබඳ ෆෙඩරල් දෙපාර්තමේන්තුවේ ආසියා පැසිපික් අංශයේ ප්‍රධානි හා සහකාර රාජ්‍ය ලේකම් තානාපති ජොහනස් මැට්සි මහතා විසින් ස්විස් නියෝජිත පිරිසේ නායකත්වය දැරූ අතර, යුරෝපා සංගමය, පොදු රාජ්‍ය මණ්ඩලය සහ බහු පාර්ශවීය ගිවිසුම්, දේශපාලන කටයුතු (බටහිර) අංශයේ අතිරේක ලේකම් ඒ.එල්.ඒ. අසීස් මහතා විසින් ලංකා පාර්ශවයේ නායකත්වය දරණ ලදී.

**24. තුර්කිය**

i. ශ්‍රී ලංකා විදේශ අමාත්‍යවරයාගේ ආරාධනයකට අනුව හිටපු තුර්කි අග්‍රාමාත්‍ය ගරු අහමට් ඩව්ටොග්ලු මැතිතුමා 2017 අගෝස්තු 04-11 දිනවල ලංකාවේ සංචාරය කළේය. එහිදී එතුමා ගරු විදේශ කටයුතු අමාත්‍යවරයා හමුවිය. ඩව්ටොග්ලු මැතිතුමා නැසීගිය දේශමාන්‍ය මොහොමඩ් බාකීර් මාකාර් මහතාගේ වාර්ෂික ගුණසමරු දේශනය පැවැත්වූයේය.

ii. 2017 අගෝස්තු 13-19 දිනවල ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍ය ගරු සුජීව සේනසිංහ මැතිතුමා තුර්කියේ සංචාරය කළේය. අමාත්‍යවරයා සමග ලංකා ආයෝජන මණ්ඩල, අපනයන සංවර්ධන මණ්ඩල සහ ලංකා ඒකාබද්ධ ඇගළුම් සංගම් සංසඳ නියෝජිතයෝ ද සහභාගී වූහ.

iii. තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2017 ජුනි මස 17 වැනි දින පැවැති තුර්කි අපනයන කරුවන්ගේ රැස්වීමේ 24 වැනි මහා සභා රැස්වීමට සහභාගි විය.

iv. තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය 2017 අගෝස්තු 13 - 19 දක්වා පැවැති ඉස්මීර් ජාත්‍යන්තර වෙළඳපලට සහභාගි විය.

v. තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් 2017 සැප්තැම්බර් 07 - 10 දක්වා පැවැත්වූ ඉස්තාම්බුල් ලෝක ආහාර ප්‍රදර්ශනයේ දී ලංකා සහභාගීත්වය සඳහා පහසුකම් සලසන ලදී.

vi. 2017 වර්ෂයේ සංචාරක ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව සහ "ලංකා තේ " ප්‍රවර්ධනය කිරීම සඳහා අංකාරා හි ස්විස් හෝටලයේ පැවැති වැඩසටහනක් තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් සංවිධානය කළේය.

vii. 2017 වර්ෂයේ දී ඉස්තාම්බුල් තේ උත්සවයට තුර්කියේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහභාගි විය.

viii. "ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික සහ ආයෝජන අවස්ථා" සම්බන්ධයෙන් සම්මන්ත්‍රණයක් 2017 වර්ෂයේදී සංවිධානය කරන ලදී.

ix. කර්මාන්තවේදී ව්‍යාපාරික කතුන් හා ව්‍යාපාරික පිරිමින්ගේ සම්මේලනයේ සහයෝගිත්වයෙන් 2017 වර්ෂයේදී පැවැති ශ්‍රී ලංකා ව්‍යාපාරික හා ආයෝජන සංසඳය.

x. සංචාරක ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා “චමත්කාර දූපත” මැයෙන් 2017 අගෝස්තු 23 දින තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ඡායාරූප ප්‍රදර්ශනයක් සංවිධානය කළේය.

xi. “චමත්කාර දූපත” මැයෙන්වූ ඡායාරූප ප්‍රදර්ශනයේ දෙවන අදියර තුර්කියේ, අන්ටල්යා, මුරට්පාසා, හි සෙබිනෙම් බහර් කලාසන සැලසුම් ගැලරියේදී 2017 නොවැම්බර් මස 01 - 03 දක්වා පවත්වන ලදී.

xii. එර්සුරුම් හි කර්මාන්ත හා වාණිජ මණ්ඩලයේදී 2017 දෙසැම්බර් 18 වැනි දින තුර්කියේ ලංකා තානපති කර්යාලය මගින් ශ්‍රී ලංකා ප්‍රවර්ධන දිනයක් සංවිධානය කළේය. මේ සඳහා ශ්‍රී ලංකා ඡායාරූප ප්‍රදර්ශනයක් හා වෙළඳ ප්‍රවර්ධන සම්මන්ත්‍රණයක් ඇතුලත්ය.

xiii. අන්කාරා හි ස්විස් හෝටලයේ දී ශ්‍රී ලංකික සාම්ප්‍රදායික නැටුම් රංගනයකට තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය පහසුකම් සැළසීය.

xiv. අන්කාරා හි ස්විස් හෝටලයේ දී ශ්‍රී ලංකික ආහාර පිසීමේ දැක්මක් සඳහා තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය පහසුකම් සැලසීය.

xv. අන්කාරා හි මැද පෙරදිග තාක්ෂණික විශ්ව විද්‍යාලයේ දී “අනාගතය සඳහා ඓතිහාසික සබඳතා ඔස්සේ තුර්කි හා ශ්‍රී ලංකිකයන්” මැයෙන් සමුළුවක් සංවිධානය කළේය.

xvi. ඉස්මීර් හි ශ්‍රී ලංකාවේ ගරු කොන්සාල්වරයාගේ බිරිඳ වන නස්ලි අකුරා මහත්මිය විසින් ලියන ලද “ශ්‍රී ලංකායි කෙස්ෆඩින් ( ලංකාවේ සොයා ගැනිම්)” මැයෙන් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් තුර්කි භාෂාවෙන් ලියන ලද පළමු ග්‍රන්ථය ප්‍රකාශයට පත් කරන ලදී.

**25. එක්සත් රාජධානිය (UK)**

i. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වෙමින් පවතින සංහිඳියා යාන්ත්‍රණය, යහ පාලනය සහ සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ යාන්ත්‍රණය ආදිය සම්බන්ධයෙන් දළ අවබෝධයක් ලබාගැනීමට 2017 ජනවාරි 01-09 දිනවල ශ්‍රී ලංකාවට අදාළ සියලු පාර්ශ්වයන්ගේ පාර්ලිමේන්තු කණ්ඩායම් (APPG) සභාපති ගරු ලෝඩ් නැසෙබි ශ්‍රී ලංකාවට පැමිණියේය.

ii. 2017 ජනවාරි 10-15 දිනවල එක්සත් රාජධානියේ සංචාරයක විදේශ කටයුතු අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමා නිරත විය. දෙරට අතර වෙළඳ හා ආයෝජන වැඩි දියුණු කිරීම ඇතුළු ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීම අරභයා විදෙස් හා පොදු රාජ්‍ය මණ්ඩල කටයුතු පිළිබඳ රාජ්‍ය ලේකම් ගරු බොරිස් ජොන්සන් මැතිතුමා හා අමාත්‍යවරයා හමුවිය. සංචාරය අතරතුර අමාත්‍යවරයා ලන්ඩනයේ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ රෝයල් ආයතනයේ චැතැම් හවුස් හි දී ශ්‍රී ලංකාවේ සාමය හා සංහිඳියාව ඉදිරියට පවත්වාගැනීමට රජය ගන්නා ප්‍රයත්න'' මැයෙන් විශේෂ දේශනයක් පැවැත්වීය.

iii. එක්සත් රාජධානියේ අධ්‍යාපනය පිළිබඳ රාජ්‍ය ලේකම් ගරු ජස්ටින් ග්‍රීනින් මහතාගේ ආරාධනයකට අනුව අධ්‍යාපන ලෝක සංසඳයට සහභාගීවීම සඳහා අධ්‍යාපන අමාත්‍ය ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා 2017 ජනවාරි 21-25 දිනවල ලන්ඩනයේ සංචාරයක නිරතවිය.

iv. 2017 ජනවාරි 22-23 කුසලතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍ය ගරු මහින්ද සමරසිංහ මහතා එක්සත් රාජධානියේ සංචාරය කළේය.

v. 2017 මාර්තු 27-31 දක්වා ලන්ඩනයේ පැවති ජාතික ආරක්ෂාව හා සයිබර් ආරක්ෂක දිනය පිළිබඳ ජාත්‍යන්තර පාර්ලිමේන්තු සම්මේලනයට නීතිය, සාමය හා දක්ෂිණ සංවර්ධන අමාත්‍ය ගරු සාගල රත්නායක මැතිතුමා, ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ගරු රුවන් විජේවර්ධන මැතිතුමා, විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍ය ගරු හරින් ප්‍රනාන්දු හා පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කෙහෙලිය රඹුක්වැල්ල යන අය සහභාගී වූහ.

vi. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු මයන්ත දිසානායක මැතිතුමා සහ ගරු රොෂාන් රණසිංහ මැතිතුමා ලන්ඩනයේ වෙස්ට්මිනිස්ටර් හි දී 2017 අප්‍රේල් 26-28 දිනවල පැවති නවීන වහල්භාවය පිළිබඳ ආසියා-පැසිපික් කලාපීය වැඩමුළුවට සහභාගී වූහ.

vii. ''ආරක්ෂක සහ ත්‍රස්තවාදය මර්දනය කිරීමේ කොංග්‍රසය සහ ප්‍රදර්ශනය 2017''ට සහභාගීවීමට රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍ය ගරු සුසන්ත පුංචිනිලමේ මැතිතුමා 2017 මැයි 03-04 දිනවල ලන්ඩනයේ සංචාරය කළේය.

viii. 2017 මැයි 21-24 දිනවල ලන්ඩනයේ පැවති "Going Global Conference – 2017" සඳහා උසස් අධ්‍යාපන හා මහාමාර්ග රාජ්‍ය අමාත්‍ය ගරු මොහාන් ලාල් ග්‍රේරු මැතිතුමා සහභාගී විය.

ix. Inner Temple හි ගරු කටයුතු සමාජයේ භාණ්ඩාගාරික ඩේවිඩ් පිට්ටාවේ QC 2017 සැප්තැම්බර් 01-08 දක්වා ලංකාවේ සංචාරය කළේය. එතුමා ශ්‍රී ලංකාවේ අධිකරණ ගරු අමාත්‍යවරයා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් සහ අනෙක් අධිකරණ නිලධාරීන් හමුවිය.

x. ශ්‍රී ලංකා ගරු කථානායක කරු ජයසූරිය මහතා එක්සත් රාජධානියේ නිල සංචාරයක නියැලෙමින් 2017 සැප්තැම්බර් 11-14 දිනවල දී වෙස්ට්මිනිස්ටර් පදනමේ 25 වාර්ෂික සැමරුමට සහභාගී විය.

xi. එක්සත් රාජධානියේ විදේශ හා පොදු රාජ්‍ය මණ්ඩල කාර්යාලයේ, දකුණු ආසියා ද්විපාර්ශවීය අංශයේ ප්‍රධානී, නික් මෙලර්ස් මහතා 2017 නොවැම්බර් 7 දින ශ්‍රී ලංකාවේ සංචාරය කළ අතර අමාත්‍යාංශයේදී ගරු විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා හමු විය.

xii. විදේශ සහ පොදු රාජ්‍ය මණ්ඩල කාර්යාලයේ නියෝජ්‍ය රාජ්‍ය ලේකම් සහ එක්සත් රාජධානියේ ආසියා පැසිපික් කලාපය සඳහා අමාත්‍ය ගරු මාර්ක් ෆීල්ඩ් මැතිතුමාගේ පළමු ශ්‍රී ලංකා නිල සංචාරයේදී 2017 ඔක්තෝම්බර් මස 05 වන දින අමාත්‍යාංශයේදී ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යවරයා හමු විය.

xiii. දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය ගරු ෂාන් විජයලාල් මැතිතුමා සමඟින් මෙම පළාත් සභාවේ නිලධාරීන් පස් දෙනෙකු 2017 දෙසැම්බර් 17 - 24 දක්වා අධ්‍යයන චාරිකා වැඩ සටහනකට සහභාගි වීම සඳහා එක්සත් රාජධානියේ සංචාරයක නිරත විය.

**ආ. ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු රාජ්‍ය මණ්ඩල (CIS)**

**රටවල් සංඛ්‍යාව - 11**

ආමේනියාව, අසර්බයිජානය, බෙලරුස්, කසකස්ථානය, කිර්ගිස්ථානය, මෝල්දෝවාව, රුසියාව, තජිකිස්ථානය, ටර්ක්මේනිස්ථානය, යුක්රේනය, උස්බෙකිස්ථානය

**නේවාසික දූත මණ්ඩල 01**

මොස්කව්

**සමගාමී අක්තගැන්වීම් සංඛ්‍යාව : 09**

ආමේනියාව, බෙලරුස්, මෝල්දෝවාව, උස්බෙකිස්ථානය, අසර්බයිජානය, ටෙහෙරාන් හි සිට, ටර්ක්මේනිස්ථානය, මොස්කව් සිට කිර්ගිස්ථානය,ඉස්ලාමාබාද් සිට තජිකිස්ථානය, සහ අන්කාරා සිට යුක්රේනය

**1. රුසියානු සමූහාණ්ඩුව**

i. කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශ ජ්‍යෙෂ්ඨ නියෝජිත පිරිසක් රුසියානු සමූහාණ්ඩුවේ නිල සංචාරයක නිරත වෙමින් රුසියානු සමූහාණ්ඩුවේ කම්කරු හා සමාජ සබඳතා ඇකඩමිය සහ ශ්‍රී ලංකාවේ කම්කරු අධ්‍යයන පිළිබඳ ජාතික ආයතනය (NILS) අතර 2017 ජනවාරි 26 වැනි දින රුසියාවේ කම්කරු හා සමාජ සබඳතා ඇකඩමියේ දී අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබිණ.

ii. වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු නවීන් දිසානායක මැතිතුමා සහ ව්‍යාපාරික නියෝජිත පිරිසක් 2017 පෙබරවාරි 05-11 දිනවල රුසියාවේ සංචාරයක නිරත වෙමින් 2017 පෙබරවාරි 06-10 දිනවල මොස්කව් නුවර පැවති “Food Expo” නම් ආහාර පාන ප්‍රදර්ශනයට සහභාගී විය.

ගරු අමාත්‍යවරයා රුසියානු සමූහාණ්ඩුවේ කෘෂිකර්ම අමාත්‍යවරයා, වාණිජ මණ්ඩලයේ සහ කර්මාන්තයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් පිරිසක් සමග සාකච්ඡා පැවැත්වීය. මොස්කව් නුවර පැවති “ලංකා තේ ජාලකරණ රාත්‍රී භෝජනය” ට ද අමාත්‍යවරයා සහභාගී විය.

iii . රුසියානු සමූහාණ්ඩුවේ ජනාධිපති අතිගරු විලැඩිමීර් පුටින් මහතාගේ ආරාධනයකට අනුව 2017 මාර්තු 22-24 දිනවල අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා රුසියාවේ නිල සංචාරයක නිරත විය. මෙය 1974 සිට රුසියානු රජ්‍ය නායකයෙකු විසින් කරන ලද ආරාධනයකට අනුව ශ්‍රී ලාංකික නායකයෙකු එහි සංචාරය කළ ප්‍රථම අවස්ථාවයි. අතිගරු ජනාධිපතිතුමා, රුසියානු ජනාධිපති, අග්‍රාමාත්‍යතුමා සහ ජ්‍යෙෂ්ඨ දේශපාලනික නායකයන් කිහිප දෙනෙකු හමුවිය.

iv . පහත සඳහන් අවබෝධතා ගිවිසුම්වලට එම සංචාරය අතරතුර දෙරට අත්සන් තැබීය.

1. ධීවර ක්ෂේත්‍රයේ සහයෝගීතාව පිළිබඳ ගිවිසුම
2. විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන ක්ෂේත්‍රයේ සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම
3. සංචාරක ක්ෂේත්‍රයේ සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම
4. සංස්කෘතික සහයෝගීතාව පිළිබඳ සන්ධානය

v . රුසියානු අභ්‍යාවකාශ සංස්ථාව (ROSCOSMOS) සමග අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා 2017 මාර්තු 29 දින රුසියාවේ සංචාරය කළේය. මෙම සංචාරය අතරතුර සාමකාමී අරමුණ උදෙසා ගවේෂණ පැවැත්වීම සහ පිටස්තර අභ්‍යාවකාශය භාවිතා කිරීමේ ක්ෂේත්‍රයේ සහයෝගීතාව පිළිබඳ නවීන තාක්ෂණ සඳහා වන ආතර් සී ක්ලාක් ආයතනයක් ROSCOSMOS ත් අතර අවබෝධතා ගිවිසුමට අත්සන් තැබිණ.

vi . විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා 2017 ජුනි 19-21 රුසියාවේ පැවති IX වැනි ජාත්‍යන්තර පරමාණුක ප්‍රදර්ශන සංසදයට සහභාගී විය. එතුමා එහිදී ROSATOM රාජ්‍ය පරමාණුක බලශක්ති සංස්ථාවේ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාද හමු විය.

vii. ක්‍රීඩා අමාත්‍ය ගරු දයාසිරි ජයසේකර මැතිතුමා ප්‍රමුඛ නියෝජිත පිරිසක් 2017 ජුලි 13-15 දිනවල කසාන් හි පැවති ශාරීරික අධ්‍යයන සහ ක්‍රීඩා පිළිබඳ ඇමතිවරුන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ 6 වැනි ජාත්‍යන්තර සම්මේලනයට සහභාගී වූහ.

viii.2017 අගෝස්තු මස ඇති වූ ගංවතුර සහ නායයෑම් වලින් පීඩාවට පත්වූවන් හට මානුෂීය ආධාර සැපයීමට රුසියානු සමූහාණ්ඩුව පියවර ගත් අතර එම භාණ්ඩ අතර විදුලි ජනක යන්ත්‍ර 02ක් ටෙන්ට් 200ක් සහ මුළුතැන්ගෙයි උපකරණ කට්ටල 4,000ක් විය.

ix. විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍ය ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමා ප්‍රමුඛ නියෝජිත කණ්ඩායමක් 2017 සැප්තැම්බර් 04-08 දිනවල රුසියාවේ ඩබ්නා හි දී පැවති "පරමාණුක පර්යේෂණ සහ ජාත්‍යන්තර පුහුණු පාඨමාලා සඳහා තෙවැනි ඒකාබද්ධ ආයතනය" සඳහා සහභාගීවීමට රුසියාවට පැමිණියේය.

x. ශ්‍රී ලංකාවේ තැපැල්පතිවරයා 2017 සැප්තැම්බර් 17-19 දිනවල මොස්කව් හි පැවති "දෙවන විශ්ව තැපැල් වෘත්තීය සමිති ලෝක CEO සංසදය 2017" සඳහා සහභාගී විය.

xi. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කතානායක ගරු කරු ජයසූරිය මැතිතුමා සහ නියෝජිත පිරිසක් 2017 ඔක්තෝම්බර් 14 - 18 දක්වා පැවැති 137 වැනි අන්තර් පාර්ලිමේන්තු සංගමයේ මහාසභා රැස්වීමට සහභාගි වීම සඳහා රුසියාවේ ශාන්ත පීටර්ස්බර්ග් හි නිල සංචාරයක් සිදු කළේය.

xii අන්තර් පාර්ලිමේන්තු සංගම් මහාසභා රැස්වීමේ රාමුව තුළදී, ගරු කතානායක තුමා විසින් ශාන්ත පීටර්ස්බර්ග් හි උප ආණ්ඩුකාර, ෆෙඩරල් සභාවේ සහ රුසියානු ෆෙඩරේෂනයේ පහළ මන්ත්‍රණ සභාවේ උප සභාපතිවරුන් ඇතුලුව රුසියානු නිලධාරීන් සමග සාකච්ඡා මාලාවක් පවත්වන ලදී.

xiii. "තිරසර සංවර්ධනයේ ප්‍රධාන සාධක වන "සමාජ වගකීම සහ වැඩකරන පරිසරය" : මැයෙන් වූ ජාත්‍යන්තර සමුළුවල සහභාගි වීම සදහා මොස්කව් හි වෘත්තීය සංගම් ෆෙඩරේෂනයේ පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් වැලැදිමියර් බොග්ඩසින් මහතාගේ ආරාධනයකට අනුව 2017 ඔක්තෝබර් මස 9 වැනි දින ශ්‍රී ලංකාවේ නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍ය ගරු චන්දිම වීරක්කොඩි මැතිතුමා මොස්කව් කරා පැමිණියේය.

xiv. රුසියානු ෆෙඩරේෂනයේ අධ්‍යාපන හා විද්‍යා අමාත්‍යංශයෙන් සිදුකරන ලද ආරාධනයකට අනුව තරුණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තරුණයන්ගේ ලෝක උත්සව සහ සිසුන් පිළිබඳ වගකියන ඉහළ පෙළේ නිලධාරීන්ගේ අමාත්‍ය රැස්වීමට සහභාගී වීම සඳහා 2017 ඔක්තෝබර් 11 - 17 දක්වා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු නිරෝෂණා පෙරේරා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් ශ්‍රී ලංකික නියෝජිත පිරිසක් රුසියාවේ සංචාරයක නිරත විය.

xv. රුසියාවේ සෝචි හිදී 2017 ඔක්තෝබර් 14 - 22 දක්වා පැවැති XIX ලෝක තරුණ හා සිසුන්ගේ උත්සවයේදී ලංකා සහභාගීත්වයට රුසියාවේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය පහසුකම් සැලසීය.

xvi. 2017 නොවැම්බර් 16 - 17 දක්වා රුසියානු සමූහාණ්ඩුවේ මොස්කව් හි පැවැති තිරසර සංවර්ධන යුගයක ක්ෂය රෝගය තුරන් කිරීමට බහු පාර්ශවීය ප්‍රතිචාරයක් මැයෙන් වූ පළමු ලෝක සෞඛ්‍ය සංවිධානය ගෝලීය අමාත්‍යංශ සමුළුවට සහභාගී වීම සඳහා 2017 නොවැම්බර් 16 - 18 දක්වා ගරු දොස්තර රාජිත සේනාරත්න මැතිතුමා සහ නියෝජිත පිරිස රුසියාවේ සංචාරයක නියලුණෝය.

xvii 2017 ලෝක ආහාර ලංකාවේ සහභාගීත්වයට රුසියවේ ලංකා තානාපති කාර්යාල සහභාගීත්වයට රුසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් පහසුකම් සැලසීය. මේ සඳහා ඉදිරිපත් වූ අංශ අතර මුහුදු ආහාර, කුළුබඩු, පොල් හා රසකැවිලි ආදිය විය. පොල් හා කුළුබඩු නිෂ්පාදන අංශයන්හි රුසියානු ව්‍යාපාරික පාර්ශව 45 කට වැඩි සහභාගීත්වයෙන් 2017 ලෝක ආහාර වැඩසටහන සමගාමීව ව්‍යාපාරික ජාලකරණ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

xviii . විවිධ රාජ්‍ය සංවිධානවල විශේෂඥ නිලධාරීන් 14 දෙනෙකුගේ ශ්‍රී ලාංකික නියෝජිත පිරිසක් ක්‍රිසෝටයිල් ඇස්බැස්ටෝෂ් ආරක්ෂාකාරී කර්මාන්ත භාවිතය සම්බන්ධයෙන් තාක්ෂණික මට්ටමේ සාකච්ඡා සඳහා 2017 දෙසැම්බර් 24-29 දක්වා මොස්කව් හා එක්ටරිබර්ග්හි සංචාරයක් සිදුකළේය.

xix .සන්නද්ධ සේවාවන්හි පරිබාර නිලධාරීන්ගේ මොස්කව් සංගමය සඳහා ශ්‍රී ලංකා තේ රසබැලීමේ උත්සවයක් 2017, නොවැම්බර් මස 30 වැනි දින රුසියාවේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් සංවිධානය කළේය. මොස්කව් හි විදේශීය දූත මණ්ඩල 30 කට වැඩි ප්‍රමාණයක් නියෝජනය කරමින් රාජතාන්ත්‍රික හා සන්නද්ධ බලකාවන් විසින් මෙම වැඩසටහනට සහභාගී විය.

x. රුසියාවේ NTV නාලිකාවේ රූපවාහිනී මාධ්‍ය කණ්ඩායමක සාමාජිකයන් පස්දෙනෙක් ශ්‍රී ලංකා තේ සම්බන්ධයෙන් වාර්තාමය චිත්‍රපටයක් සකස්කිරීම සඳහා 2017 දෙසැම්බර් 17-25 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. රුසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ තේ ප්‍රවර්ධන ඒකකයේ සම්බන්ධීකරණයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් මෙම රූපවාහිනී මාධ්‍ය කණ්ඩායමේ සංචාරය සංවිධානය කරන ලදී.

x. වෙළඳාම , ආර්ථික , විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගිතාවය සම්බන්ධයෙන් රුසියා " ශ්‍රී ලංකා අන්තර් රාජ්‍ය කොමිසමේ දෙවැනි සැසිය 2017 ඔක්තෝබර් 24-26 දක්වා පවත්වන ලදී.

xi. 2017 දෙසැම්බර් 18 වැනි දින සිට තේ ඇතුලුව ලංකාවේ සියලුම කෘෂි නිෂ්පාදන ආනයනය කිරීම් සම්බන්ධයෙන් රුසියාව විසින් තාවකාලික තහනමක් පනවන ලදි. ශ්‍රී ලංකාවේ තේ බහාලුමක අසුරනය තුළ කප්රා කුරුමිණිය, නැමැති පළිබෝධකයෙක් නිරීක්ෂණය වීම සම්බන්ධයෙන් මෙම තහනම පනවන ලදී.

xii . එදිනම, මෙම තහනම ඉවත්කරගැනීම සඳහා ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමා විසින් රුසියානු සමූහාණ්ඩුවේ අතිගරු ජනාධිපතිවරයාගෙන් විශේෂ ඉල්ලීමක් සිදු කළේය. මේ අතර ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ඇතුලු විශේෂ කණ්ඩායමක් සාකච්ඡා සිදුකිරීම සඳහා රුසියානු සමූහාණ්ඩුවේ සංචාරයක නිරත විය. සාකච්ඡා වට කිහිපයකින් පසු, 2017 දෙසැම්බර් 30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි රුසියානු බලධාරීන් විසින් තහනම ඉවත්කරන ලදී.

xiii . ශ්‍රී ලංකාව සහ රුසියාව අතර රාජතාන්ත්‍රික සබඳතා පිහිටුවීමේ 60 වැනි සංවත්සරය නිමිති කොටගෙන 2017 දෙසැම්බර් 18 වැනි දින රුසියාව විසින් සමරු මුද්දරයක් නිකුත් කළේය.

**2. යුක්රේනය**

i . 2017 මැයි 17-21 දක්වා කියිව් හි පැවති "ගෝලීය නීතිකරණ සම්මේලනය" ට සහභාගී වීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක ගරු කරු ජයසූරිය මැතිතුමා යුක්රේනය බලා පිටත් විය. එතුමා සමග ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා සහ සන්ධාන ප්‍රධානී ද සංචාරයට එකතු විය.

ii . 2017 සැප්තැම්බර් මස නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරි මට්ටමේ නියෝජිත පිරිසක් යුක්රේනයේ සංචාරය කළේය.

iii. තුර්කියේ ලංකා තානාපති කාර්යාලය විසින් 2017 යුක්රේන සංචාරක කර්මාන්ත වෙළඳපලට ශ්‍රී ලංකා සහභාගීත්වයට පහසුකම් සලසන ලදී.

iv . "චමත්කාර දූපතක්" මැයෙන් ඡායාරූප ප්‍රදර්ශනයේ 3 වැනි අදියර යුක්රේන පාර්ලිමේන්තුවේ පවත්වන ලදී.

**3. ටර්ක්මේනිස්ථානය**

ගරු දයාසිරි ජයසේකර මැතිතුමා, 2017 සැප්තැම්බර් මස 17-27 දිනවල පැවති 5 වැනි ආසියානු ගෘහස්ථ මාර්ෂල් ආර්ට්ස් තරගාවලියේ ආරම්භක උත්සවයට සහභාගීවීමට ටර්ක්මේනිස්ථානයට පිටත්ව ගියේය.

**උ. ලතින් ඇමරිකානු රටවල්**

රටවල් සංඛ්‍යාව 33

කියුබාව , ආජන්ටිනාව, ඇන්ටිගුවා සහ බාබියුඩා, බහමාස්, බාබඩෝස්, බෙලිස්, බොලිවියා, චිලී, කොලොම්බියා, කොස්ටරිකා, ඩොමිනිකා, ඩොමිනිකන් ජනරජය, ඉක්වදෝරය, එල් සැල්වදෝරය, ග්‍රෙනඩාව, ගෝතමාලාව, ගයනාව, හයිටි, ජැමෙයිකාව, මෙක්සිකෝව, නිකරගුවාව, පැනමාව, පැරගුවේ, පේරු, ශාන්ත කිට්ස් සහ නෙවිස්, ශාන්ත වින්සන්ට් සහ ග්‍රෙනඩීන්ස්, ශාන්ත ලුසියා, හොන්ඩුරාස්, සුරිනාම්, ට්‍රිනිඩෑඩ් සහ ටොබාගෝ, උරුගුවේ, වෙනිසියුලාව

**නේවාසික දූත මණ්ඩල : 02**

කියුබාව, බ්‍රසීලය

**සමගාමී අක්තගැන්වීම් සංඛ්‍යාව : 08**

වෙනිසියුලාව, ජැමෙයිකාව, එල් සැල්වදෝරය, ඩොමිනිකන් ජනරජය, ඉක්වදෝරය, හවානා සිට ආජන්ටිනා, කොලොම්බියාව, බ්‍රසීලයේ සිට සුරිනාම්

**1. ආජන්ටිනාව**

කම්කරු, වෘත්තීය සමිති හා සබරගමුව සංවර්ධන අමාත්‍ය ගරු ඩබ්ලිව්. ඩී.ජේ. සෙනවිරත්න මැතිතුමා 2017 නොවැම්බර් මස 13-20 දක්වා තිරසර ළමා ශ්‍රමය මුලිනුපුටා දැමීම සම්බන්ධයෙන් සිව් වැනි ගෝලීය සමුළුවට සහභාගීවීම සඳහා ආජන්ටිනාවේ බුවනෝස් ඒරිස් හී සංචාරයක නිරත වියි.

**2. බ්‍රසීලය**

I UNESCO ප්‍රධානත්වයෙන් 2017 මාර්තු 21-24 දිනවල පැවති "පරිසර පද්ධති වල සහ සමාජයන්හි ආරක්ෂාව සඳහා පරිසර හිතකාමී ජල විද්‍යාව" සම්මන්ත්‍රණයට වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය ගරු වි.එන්.පී. සේනානායක මැතිතුමා සහභාගී විය.

ii. "APAS වෙළඳ සැණකෙළියේ" ශ්‍රී ලංකා සහභාගීත්වය: 2017 මැයි 02-05 දිනවල සාඕ පෝලෝහි දි Expo Centre Norte හි පැවති APAS වෙළඳ ප්‍රදර්ශනයට බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා එක්ව ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කළහ. වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍ය ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මැතිතුමා විසින් ශ්‍රී ලංකා නියෝජිත පිරිසේ නායකත්වය හෙබවීය.

iii . ශ්‍රී ලංකාවේ ලංකා රබර් කර්මාන්තය සමඟ හවුල්කාරීත්වය සහ ආයෝජන පවත්වාගැනීමේ හැකියාව විමසා බැලීමට "රබර් අංශයේ වෙළඳ මෙහෙයුම් පිළිබඳ CRT වෙළඳපොළ" අවස්ථාවට බ්‍රසීල රාජ්‍යයේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නියෝජිතයන්ගෙන් සැදුම් ලත් කණ්ඩායමක් සහ නිල නියෝජිත පිරිසක් 2017 අගෝස්තු 11-13 දිනවල ලංකාවේ සංචාරය කළේය. ඔවුහු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා සමග සාකච්ඡා පැවැත්වූ අතර රබර් පර්යේෂණ ආයතනයේ සංචාරයක ද නිරත විය.

iv . ශ්‍රී ලංකා නාවික හමුදාපති වයිස් අද්මිරාල් ආර්.සී. විජේගුණරත්න මහතා ලතින් ඇමෙරිකානු ගුවන්යානා අවකාශය හා ආරක්ෂාව පිළිබඳ (LAAD – 2017 ) 11 වන ප්‍රදර්ශනය සඳහා බ්‍රසීලයේ රියෝ ද ජැනෙයිරෝ නගරයෙහි සංචාරය කළේය.

v. 2017 නොවැම්බර් 13-17 දින වල පැවැති සමුද්‍රීය ජාත්‍යන්තර පොලිස් සහයෝගිතා වැඩසටහනට සහභාගිවීම සඳහා පොලිස් මූලස්ථානයේ නියෝජිත පිරිසක් බ්‍රසීලයේ සබාපෝලෝහි සංචාරයක නිරත විය.

vi . රියෝද ජනෙයිරෝ හි හමුදා යුක්ති කාර්යාලයයේ අධිචෝදක ආචාර්ය ඔටාවියෝ ඔගස්කො ද කස්ත්‍රෝ බ්‍රාවෝ මහතා 2017 ඔක්තෝබර් 30 වන දින සිට නොවැම්බර් 04 දින දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ හමුදා යුක්තිය පිළිබඳ අධ්‍යයනයක නිරත විය.

vii . බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් 2017 නොවැම්බර් 22 වන දින බ්‍රසීලයේ ඇරා පොලිස් ගොයිආස් හි වෙළඳ ප්‍රවර්ධන වැඩ සටහනක් පවත්වන ලදී.

**3. කොළොම්බියාව**

කොළොම්බියාවේ උප ජනාධිපති අතිගරු ෂට්ටි ලොන්ඩොනෝ 2017 මාර්තු 28-30 දිනවල ශ්‍රී ලංකාවේ සංචාරය කළේය. එහි අරමුණ වූයේ ද්විපාර්ශ්වික සබඳතා පුළුල් කිරීමේ අරමුණෙන් දෙරටට බලපාන කාරණා පිළිබඳ සාකච්ඡා කිරීම සහ කෙටුම්පත් කරන ලද ගිවිසුම් දෙකක් සම්බන්ධයෙන් සාකච්ඡා සම්පූර්ණ කිරීමත්ය.

**4. කියුබාව**

ශ්‍රී ලංකාවත් කියුබාවත් අතර අත්සන් තැබුණු විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමෙන් අනතුරුව, කියුබාව විශිෂ්ට ප්‍රවීණතාවක් දක්වන ජෛවතාක්ෂණය, නැනෝ තාක්ෂණය සහ වසංගත රෝග විද්‍යාව, වෛද්‍ය විද්‍යාව යන ක්ෂේත්‍රවලින් ලංකාවට වාසිදායක ප්‍රතිලාභ අත්වන ලෙස කාර්මික සහාය ලබාගැනීම සඳහා සහයෝගීතාව ශක්තිමත් කිරීම අවශ්‍ය බව ශ්‍රී ලංකාව අවබෝධ කර ගෙන ඇත.

**5. මෙක්සිකෝව**

ආපදා කළමනාකරණ අමාත්‍ය ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා 2017 මැයි 22-26 දිනවල මෙක්සිකෝ හි සංචාරය කරමින් කැන්කුන් හි පැවති "ආපදා අවදානම අවම කිරීමේ 5 වැනි ගෝලීය වේදිකාව" සඳහා සහභාගී විය.

**6. කියුබා**

i ශ්‍රී ලංකාවත් කියුබාවත් අතර අත්සන් තැබුණු විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමෙන් අනතුරුව, කියුබාව විශිෂ්ට ප්‍රවීණතාවක් දක්වන ජෛවතාක්ෂණය, නැනෝ තාක්ෂණය සහ වසංගත රෝග විද්‍යාව, වෛද්‍ය විද්‍යාව යන ක්ෂේත්‍රවලින් ලංකාවට වාසිදායක ප්‍රතිලාභ අත්වන ලෙස කාර්මික සහාය ලබාගැනීම සඳහා සහයෝගීතාව ශක්තිමත් කිරීම අවශ්‍ය බව ශ්‍රී ලංකාව අවබෝධ කර ගෙන ඇත.

# විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල / දූත කාර්යාල



## 2017.01.01 දින සිට 2017.12.31 දක්වා එක් එක් දූත මෙහෙයන් විසින් එක් රැස් කරගත් ආදායම (. ල. රු.)

| දූත මණ්ඩලය | ආදායම් කේතය | | | | | | | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2002-01-01 | 2002-02-99 | 2003-02-07 | 2003-02-13 | 2003-02-99 | 2003-99-00 | 2004-01-00 | 2004-02-00 | 2006-02-00 | |
| කැන්බරා | - | 19,268 | 18,730,030 | - | 5,889,185 | 3,079,860 | 181,248 | - | - | 27,899,592 |
| සිඩ්නි | - | 10,840 | 27,126,078 | - | 7,969,837 | 1,891,061 | 130,715 | 21,126 | - | 37,149,657 |
| කයිරෝ | - | 49,296 | 2,243,340 | - | 229,036 | 150,404 | 70,785 | - | - | 2,742,861 |
| පැරිස් | - | 21,276 | 133,091,447 | 561,193 | 13,281,732 | 4,381,397 | 265,772 | 78,962 | - | 151,681,779 |
| හේග් | - | 2,920 | 12,360,504 | - | 2,458,085 | 96,316 | 108,589 | - | - | 15,026,413 |
| ටෝකියෝ | - | 33,717 | 19,041,552 | - | 11,976,012 | 6,324,003 | 123,140 | 18,199 | - | 37,516,622 |
| අම්මාන් | - | 8,357 | 5,904,899 | - | 420,889 | 2,506,304 | 59,419 | - | - | 8,899,867 |
| කත්මණ්ඩු | - | 6,020 | 3,470,375 | - | 21,153 | 1,601,520 | 80,918 | - | 7,045,650 | 12,225,637 |
| බර්ලින් | - | 36,208 | 31,160,709 | - | 2,994,066 | 859,283 | 109,393 | 23,451 | - | 35,183,111 |
| වියානා | - | 32,703 | 2,942,189 | - | 453,558 | 948,598 | 136,706 | - | - | 4,513,755 |
| බීජිං | - | 15,823 | 12,578,227 | - | 4,451,788 | 1,378,427 | 238,651 | 19,025 | - | 18,681,941 |
| හවානා | - | 4,938 | 59,549 | - | 197,096 | 92,844 | 57,215 | 12,909 | - | 424,552 |
| ක්වාලාලම්පූර් | - | 9,553 | 18,713,647 | - | 2,411,582 | 5,020,707 | 219,635 | - | - | 26,375,124 |
| සිංගප්පූරුව | - | 28,963 | 7,693,005 | - | 4,363,257 | 2,194,109 | 174,486 | - | 201,430 | 14,655,251 |
| නිව්යෝර්ක් | 23,123 | 51,230 | 10,390,889 | - | 2,465,278 | 655,074 | 313,870 | - | - | 13,899,464 |
| වොෂින්ටන් | - | 21,945 | 27,052,496 | - | 4,733,383 | 1,706,645 | 402,579 | - | - | 33,917,048 |
| ලොස්ඇන්ජලීස් | - | 13,339 | 13,780,824 | - | 1,151,084 | 106,533 | 96,300 | - | - | 15,148,080 |
| ඩකා | - | 4,129 | 14,163,269 | - | 669,709 | 403,241 | 72,330 | - | 158,410 | 15,471,087 |

| දූත මණ්ඩලය | ආදායම් කේතය | | | | | | | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **2002-01-01** | **2002-02-99** | **2003-02-07** | **2003-02-13** | **2003-02-99** | **2003-99-00** | **2004-01-00** | **2004-02-00** | **2006-02-00** | |
| මුම්බායි | - | 458 | 1,755,870 | - | 1,304,060 | 162,144 | 117,712 | - | 1,207 | 3,341,453 |
| නයිරෝබි | - | 20,388 | 1,303,237 | - | 166,740 | 118,400 | 72,079 | 17,191 | - | 1,698,036 |
| යැන්ගුන් | 33,337 | 14,581 | 1,474,107 | - | 32,301 | 560,779 | 105,268 | 15,434 | - | 2,235,807 |
| ස්ටොක්හෝම් | - | 13,597 | 13,394,084 | - | 1,861,198 | 779,173 | 161,442 | - | - | 16,209,494 |
| බැංකොක් | - | 25,430 | 6,466,334 | - | 1,108,386 | 4,281,332 | 201,484 | 16,912 | - | 12,099,877 |
| බ්‍රසල්ස් | - | 21,962 | 3,773,420 | - | 375,680 | 670,931 | 186,155 | - | - | 5,028,148 |
| චෙන්නායි | - | 18,580 | 8,037,186 | - | 14,184,666 | 315,710 | 350,636 | 23,209 | 81,261 | 23,011,247 |
| ජකාර්තා | - | 22,583 | 1,981,413 | - | 257,607 | 907,193 | 132,540 | - | - | 3,301,337 |
| මාලේ | - | 21,746 | 2,142,906 | - | 1,442,153 | 825,037 | 57,988 | 23,308 | - | 4,513,137 |
| ජිනීවා | - | 16,534 | 44,771,806 | - | 13,953,794 | 8,035,527 | 448,949 | 21,557 | - | 67,248,167 |
| අබුඩාබි | - | 19,960 | 18,001,018 | - | 2,298,836 | 16,897,450 | 153,596 | 17,552 | - | 37,388,412 |
| ඩුබායි | - | 46,472 | 59,102,231 | - | 10,877,810 | 3,718,863 | 212,144 | - | - | 73,957,520 |
| ලන්ඩන් | - | 67,309 | 60,655,417 | 1,001 | 68,386,567 | 1,325,305 | 372,280 | 6,769 | - | 130,814,648 |
| නවදිල්ලිය | 15,061 | 32,668 | 3,137,138 | - | 3,699,277 | 3,431,569 | 341,762 | 42,213 | - | 10,699,688 |
| සෝල් | - | 24,870 | 31,521,024 | - | 8,181,597 | 12,835,268 | 353,469 | - | - | 52,916,228 |
| කුවේට් | - | 52,867 | 95,071,057 | - | 17,131,194 | 1,104,288 | 330,358 | - | 736,551 | 114,426,315 |
| රියාද් | - | 21,424 | 69,549,533 | - | 2,765,786 | 4,660,651 | 293,589 | - | 363,163 | 77,654,145 |
| මොස්කව් | - | 28,195 | 1,290,749 | - | 480,670 | 2,311,830 | 99,451 | 18,658 | - | 4,229,554 |
| ඔටාවා | - | 8,130 | 25,399,431 | - | 2,369,311 | 2,405,678 | 169,852 | 39,569 | - | 30,391,970 |

| දූත මණ්ඩලය | ආදායම් කේතය | | | | | | | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **2002-01-01** | **2002-02-99** | **2003-02-07** | **2003-02-13** | **2003-02-99** | **2003-99-00** | **2004-01-00** | **2004-02-00** | **2006-02-00** | |
| බැග්ඩෑඩ් | - | 337 | 583,121 | 2,150 | 152,144 | 125,761 | 28,049 | 17,704 | - | 909,265 |
| රෝමය | 432,148 | 16,009 | 93,205,834 | - | 21,493,235 | 4,318,231 | 235,990 | - | - | 119,701,447 |
| ඕමානය | 7,315 | 40,830 | 9,481,541 | - | 3,710,273 | 276,454 | 241,874 | 10,962 | 443,137 | 14,212,386 |
| ඉස්ලාමාබාද් | - | 2,133 | 2,633,655 | - | 292,434 | 2,107,918 | 152,068 | 23,479 | 44,696 | 5,256,383 |
| කරච්චි | - | 13,062 | 2,900,131 | - | 193,647 | 130,793 | 76,585 | 21,785 | - | 3,336,002 |
| ජෙඩා | - | 14,056 | 25,194,161 | - | 1,725,138 | 187,833 | 107,776 | - | - | 27,228,962 |
| කටාර් | - | 69,327 | 57,489,806 | - | 17,412,288 | 5,214,508 | 136,147 | - | - | 80,322,077 |
| ප්‍රිටෝරියා | - | 5,660 | 3,291,907 | - | 511,575 | 1,960,340 | 169,489 | - | - | 5,938,970 |
| බීරූට් | - | 32,065 | 6,928,190 | - | 419,137 | 599,199 | 139,002 | 27,579 | - | 8,145,173 |
| ටෙහෙරාන් | - | 14,041 | 1,624,461 | 1,065 | 100,398 | 85,726 | 46,814 | 5,943 | - | 1,878,448 |
| මැනිලා | - | 25,733 | 3,398,668 | - | 670,116 | 15,732,854 | 137,700 | - | 30,440 | 19,995,512 |
| වෝර්සෝ | - | 4,040 | 667,757 | - | 460,229 | 1,989,143 | 15,055 | 16,755 | - | 3,152,980 |
| ඔස්ලෝ | - | 16,615 | 9,577,420 | - | 556,089 | 175,894 | 44,599 | 41,098 | 268,437 | 10,680,152 |
| ෆ්‍රැන්ක්ෆර්ට් | - | 12,510 | 39,934,089 | - | 1,540,337 | 455,371 | 160,742 | - | - | 42,103,050 |
| ටෙල්අවීව් | - | 4,705 | 12,782,138 | - | 1,376,469 | 1,841,612 | 101,303 | - | - | 16,106,227 |
| ටොරොන්ටෝ | - | 32,699 | 92,660,217 | - | 5,310,873 | 846,181 | 163,241 | - | - | 99,013,211 |
| බ්‍රසීලය | - | 10,681 | 224,151 | - | 75,882 | 216,894 | 110,594 | 12,543 | - | 650,745 |
| වියට්නාමය | - | 10,315 | 2,087,931 | - | 808,417 | 961,658 | 127,040 | 23,093 | - | 4,018,454 |
| රාමල්ලා | - | 1,743 | 45,713 | - | - | 84,222 | 18,045 | - | - | 149,723 |

| දූත මණ්ඩලය | ආදායම් කේතය | | | | | | | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **2002-01-01** | **2002-02-99** | **2003-02-07** | **2003-02-13** | **2003-02-99** | **2003-99-00** | **2004-01-00** | **2004-02-00** | **2006-02-00** | |
| ෂැංහයි | - | 11,607 | 4,644,894 | - | 345,571 | 528,068 | 69,734 | - | - | 5,599,874 |
| අන්කාරා | - | 17,759 | 342,073 | - | 363,399 | 144,070 | 165,278 | - | - | 1,032,579 |
| ගුවැංශු | - | 6,000 | 1,356,025 | - | 290,182 | 47,161,583 | 85,125 | - | - | 48,898,915 |
| මෙල්බර්න් | - | 864,474 | 57,064,325 | - | 14,554,768 | 2,231,146 | 123,281 | - | - | 74,837,995 |
| බහරේන් | - | 11,035 | 9,030,211 | - | 1,605,398 | 142,957 | 116,232 | 18,834 | - | 10,924,668 |
| නයිජීරියාව | - | 9,231 | 4,879,658 | - | 10,478 | 84,222 | 94,683 | - | - | 5,078,272 |
| සීෂෙල්ස් | - | 1,512 | 1,068,692 | - | 338,457 | 102,220 | 16,986 | - | - | 1,527,867 |
| ඇෆ්ගනිස්ථානය | - | 323 | 416,537 | - | - | 84,226 | 14,983 | - | - | 516,069 |
| මිලාන් | - | 9,118 | 69,254,920 | - | 26,798,937 | 1,267,086 | 99,073 | - | - | 97,429,135 |
| අඩිස්අබාබා | - | 9,888 | 410,284 | - | 158,716 | 2,499,623 | 75,223 | - | - | 3,153,734 |
| **මුළු එකතුව** | **510,983** | **2,115,789** | **1,322,509,500** | **565,409** | **318,288,951** | **190,299,249** | **10,075,218** | **635,819** | **9,374,381** | **1,854,375,299** |

ආදායම් කේත

2002-01-01 රජයේ ගොඩනැගිලි හා නිවාස කුළී
2002-02-99 වෙනත්
2003-02-07 ගමන් බලපත්‍ර ගාස්තු, වීසා හා ද්විත්ව පුරවැසිභාවය
2003-02-13 විභාග හා වෙනත් ගාස්තු
2003-02-99 කොන්සියුලර් ගාස්තු
2003-99-00 වෙනත් ලැබීම්
2004-01-00 සමාජ ආරක්ෂණ දායකත්වය - (මධ්‍යම රජය)
2004-02-00 සමාජ ආරක්ෂණ දායකත්වය - (පළාත් සභා)
2006-02-00 ප්‍රාග්ධන වත්කම් අලෙවිය

## විදේශ රටවල පිහිටි ලංකා දූත මණ්ඩල මගින් සිදු කළ කොන්සියුලර් කාර්යයන්

2017 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා

| රට | | රැකියා කොන්ත්‍රාත්තු | නිකුත් කළ වීසා | නිකුත් කළ ගමන් බලපත්‍ර | යන්ත්‍ර මඟින් කියවිය හැකි ගමන් බලපත්‍ර | නිකුත් කළ අනන්‍යතා සහතික පත්‍ර | විදේශ ගමන් බලපත්‍ර සටහන් කිරීම | විදේශ ගමන් බලපත්‍ර අලුත් කිරීම | ආපසු සියරට පැමිණීම | උපත් ලියාපදිංචි කිරීම | විවාහ ලියාපදිංචි කිරීම | මරණ ලියාපදිංචි කිරීම | ලේඛන සහතික කිරීම | පොලිස් නිෂ්කාශන සහතික | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඇෆ්ගනිස්ථානය | කාබුල් | 0 | 35 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| ඔස්ට්‍රේලියාව | කැන්බරා | 0 | 191 | 740 | 6 | 103 | 4 | 0 | 0 | 247 | 0 | 8 | 247 | 225 | 0 |
| ඔස්ට්‍රේලියාව | මෙල්බර්න් | 0 | 979 | 2,046 | 204 | 0 | 59 | 8 | 0 | 524 | 0 | 3 | 2,873 | 291 | 1454 |
| ඔස්ට්‍රේලියාව | සිඩ්නි | 0 | 785 | 779 | 63 | 92 | 16 | 0 | 0 | 198 | 0 | 4 | 1,551 | 214 | 0 |
| ඔස්ට්‍රියාව | වියනාව | 0 | 309 | 29 | 6 | 0 | 1 | 0 | 1 | 6 | 0 | 0 | 109 | 3 | 0 |
| බහරේන් | මැනමා | | 118 | 643 | 30 | | | 3 | 63 | 83 | 4 | 5 | 325 | 13 | 1380 |
| බංග්ලාදේශය | ඩකා | | 4008 | 53 | 4 | 0 | 4 | 0 | 0 | 12 | 0 | 1 | 192 | 5 | 5 |
| බෙල්ජියම | බ්‍රසල්ස් | 0 | 439 | 41 | 0 | 9 | 0 | 0 | 3 | 8 | 0 | 0 | 84 | 0 | 0 |
| බ්‍රසීලය | බ්‍රසීලියා | 0 | 10 | 0 | 0 | 0 | 0 | 3 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 25 |
| කැනඩාව | ටොරොන්ටෝ | 0 | 3,197 | 1863 | 146 | 68 | 53 | 4 | 0 | 226 | 0 | 10 | 1,533 | 176 | 502 |
| කැනඩාව | ඔටාවා | | | | | | | | | | | | | | |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| චීනය | බීජිං | 0 | 2,438 | 58 | 5 | 0 | 4 | 0 | 0 | 23 | 0 | 1 | 1,135 | 0 | 17 |
| චීනය | ගුවැන්ෂු | | 272 | | 6 | | | 1 | 1 | | | 1 | 97 | | |
| චීනය | ෂැංහයි | | | | | | | | | | | | | | |
| කියුබාව | හවානා | 0 | 5 | 1 | 2 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 50 | 0 | 0 |
| ඊජිප්තුව | කයිරෝ | 30 | 216 | 47 | 26 | 7 | 8 | 0 | 11 | 11 | 0 | 1 | 54 | 54 | 0 |
| ප්‍රංශය | පැරිසිය | | 1,085 | 3,775 | 90 | 54 | 328 | | 9 | 1,093 | 188 | 2 | 670 | 34 | 3,440 |
| ජර්මනිය | බර්ලින් | | 1,078 | 86 | 3 | 0 | 2 | 0 | 0 | 5 | 0 | 1 | 163 | 2 | 1 |
| ජර්මනිය | ෆ්‍රැන්ක්ෆර්ට් | | 1,384 | 1,224 | 41 | | 56 | | 26 | 117 | 2 | 1 | 107 | 2 | |
| ඉන්දියාව | නවදිල්ලිය | | 2,005 | 15 | 31 | | | 7 | 4 | 9 | | 27 | 1051 | 7 | |
| ඉන්දියාව | චෙන්නායි | 0 | 2,721 | 2,275 | 60 | 0 | 5 | 9 | 1513 | 3,520 | 17 | 13 | 0 | 0 | 0 |
| ඉන්දියාව | මුම්බායි | 0 | 1,291 | 12 | 7 | 0 | 0 | 6 | 4 | 5 | 1 | 1 | 355 | 2 | 7 |
| ඉන්දුනීසියාව | ජකර්තා | | 294 | 10 | 74 | | | | 71 | 7 | | | 24 | | |
| ඉරානය | ටෙහෙරාන් | 0 | 309 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 2 | 0 | 0 |
| ඉරාකය | බැග්ඩෑඩ් | 0 | 51 | 0 | 0 | 0 | 0 | 11 | 1 | 0 | 0 | 0 | 45 | 0 | 0 |
| ඊශ්‍රායලය | ටෙල් අවීව් | 1 | 10 | | 43 | | | 484 | | 31 | 4 | | | | 1,028 |
| ඉතාලිය | රෝමය | 0 | | 3471 | 301 | | 380 | | | 1,005 | 13 | 23 | 62 | 336 | 3,831 |
| ඉතාලිය | මිලාන් | | 11 | | 715 | | 435 | 2750 | | 855 | 53 | 45 | 2,019 | 445 | 622 |
| ජපානය | ටෝකියෝව | | 697 | 562 | 173 | 20 | 12 | | 18 | 189 | 44 | 5 | 970 | 20 | |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජෝර්දානය | අම්මාන් | 392 | 119 | 496 | 64 | 0 | 13 | 1 | 25 | 9 | 0 | 0 | 67 | 4 | 5 |
| කෙන්යාව | නයිරෝබි | 0 | 69 | 19 | 10 | 0 | 0 | 0 | 5 | 6 | 0 | 3 | 20 | 2 | 0 |
| කොරියාව | සියෝල් | 0 | 404 | 1,054 | 139 | 0 | 0 | 1 | 0 | 52 | 6 | 9 | 1,901 | 41 | 38 |
| කුවේට් | කුවේට් | | 1,564 | 6,197 | 6,165 | | 745 | 256 | 1,286 | 377 | 4 | 90 | 3,094 | 74 | 7,832 |
| ලෙබනනය | බීරූට් | 671 | 25 | 619 | 586 | 7 | 23 | 4 | 411 | 52 | 7 | 15 | 120 | 34 | |
| මැලේසියාව | ක්වාලාලම්පූර් | 40 | 156 | 118 | 143 | 0 | 0 | 0 | 11 | 9 | 2 | 6 | 46 | 0 | 0 |
| මාලදිවයින | මාලේ | | 181 | 112 | 26 | 0 | 9 | 0 | 14 | 7 | 2 | 2 | 369 | 5 | 0 |
| මියැන්මාරය | යැන්ගොන් | | 350 | 4 | 6 | | | | | 1 | | | 11 | | |
| නේපාලය | කත්මණ්ඩු | 0 | 889 | 4 | 7 | 0 | 1 | 3 | 2 | 1 | 1 | 3 | 4 | 0 | 0 |
| නෙදර්ලන්තය | හේග් | 0 | 829 | 66 | 16 | 5 | 0 | 0 | 5 | 31 | 0 | 0 | 312 | 0 | 3 |
| නයිජීරියාව | අබුජා | 0 | 898 | 5 | 5 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 |
| නෝර්වේ | ඔස්ලෝ | | 458 | 171 | 13 | | 2 | | 6 | 35 | | 1 | 56 | 1 | |
| ඕමාන් | මස්කට් | 5,171 | 133 | 608 | 123 | 0 | 35 | 0 | 91 | 61 | 1 | 2 | 957 | 18 | 0 |
| පාකිස්තානය | ඉස්ලාමාබාද් | 1 | 843 | 15 | 2 | 0 | 2 | 3 | 1 | 4 | 0 | 0 | 104 | 2 | 0 |
| පාකිස්තානය | කරච්චි | 0 | 836 | 14 | 7 | 0 | 3 | 0 | 0 | 3 | 0 | 0 | 27 | 1 | 1 |
| පිලිපීනය | මැනිලා | 0 | 736 | 34 | 6 | 0 | 3 | 9 | 0 | 21 | 2 | 0 | 111 | 3 | 64 |
| පෝලන්තය | වෝර්සෝ | 6 | 51 | 13 | 1 | 0 | 1 | 1 | 58 | 2 | 0 | 0 | 100 | 0 | 0 |
| පලස්තීන රාජ්‍යය | රමල්ලා නගරය | 0 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කටාර් | දෝහා | 19,856 | 77 | 4299 | 1150 | 0 | 239 | 6 | 0 | 319 | 8 | 3 | 1,710 | 17 | 0 |
| රුසියානු සමූහාණ්ඩුව | මොස්කව් | 0 | 187 | 8 | 5 | 0 | 0 | 1 | 0 | 6 | 0 | 0 | 491 | 5 | 0 |
| සවුදි අරාබිය | රියාද් | 268 | 394 | 3,302 | 4,791 | | 421 | 145 | 777 | 235 | 1 | 114 | 442 | 62 | |
| සවුදි අරාබිය | ජෙඩා | 3 | 629 | 1,225 | 2116 | | 25 | 10 | 52 | 113 | 1 | 10 | 241 | | |
| සීෂෙල්ස් | වික්ටෝරියා | 34 | 23 | 45 | 9 | | | 0 | 12 | 11 | | 2 | 26 | 4 | 0 |
| සිංගප්පූරුව | සිංගප්පූරුව | 575 | 246 | 237 | 86 | | 135 | 5 | 31 | 59 | 14 | 9 | 572 | 20 | 0 |
| දකුණු අප්‍රිකාව | ප්‍රිටෝරියා | 0 | 90 | 82 | 17 | 0 | 9 | 76 | 0 | 32 | 0 | 2 | 58 | 20 | 0 |
| ස්වීඩනය | ස්ටොක්හෝම් | 0 | 1,149 | 149 | 14 | 0 | 7 | 6 | 7 | 55 | 0 | 0 | 189 | 0 | 38 |
| තායිලන්තය | බැංකොක් | 0 | 1,122 | 23 | 34 | | 16 | 17 | 14 | 15 | 5 | 3 | 292 | 2 | 0 |
| තුර්කිය | අන්කාරා | 2 | 79 | 3 | | | | | 57 | 3 | | 2 | 99 | | |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | අබු ඩාබි | | 302 | 1,242 | 122 | | 90 | | | 139 | 27 | 3 | 351 | 22 | 189 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | ඩුබායි | 422 | 748 | 3,522 | 690 | | 374 | 59 | 84 | 441 | | 36 | 462 | 31 | 469 |
| එක්සත් රාජධානිය | ලන්ඩන් | | 2,906 | 2,496 | | | 328 | 575 | 109 | 917 | | 7 | | 139 | 1469 |
| එක්සත් ජාතීන් | ජිනීවා | 0 | 811 | 1147 | 89 | 0 | 136 | 0 | 190 | 314 | 1 | 6 | 721 | 2 | 0 |
| එක්සත් ජාතීන් | නිව්යෝක් | 0 | 219 | | | | | 301 | | 71 | | 2 | 0 | 6 | 178 |
| ඇමරිකා එක්සත් ජනපදය | වොෂින්ටන් | | 1204 | 728 | 65 | 15 | 20 | 0 | 15 | 212 | 0 | 2 | 457 | 23 | 346 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | ලොස් ඇන්ජලීස් | 0 | 344 | 285 | 96 | 0 | 9 | 0 | 1 | 53 | 0 | 8 | 97 | 0 | 209 |
| වියට්නාමය | හැනෝයි | 0 | 349 | 8 | 2 | 0 | 5 | 0 | 2 | 7 | 0 | 0 | 280 | 2 | 0 |